වීරකැටිය - කොටබෝ හංදිය (මී. 450)	38	√	√			

මාර්ගය / මාර්ග කොටස	කැබලි ගණන	ඉඩම් අමාත්‍යාංශය විසින් 2, 38 (A) වගන්තිය යටතේ නිවේදනය / ගැසට් නිවේදනය පළකිරීම		2015 තුළ නිමකළ අත්පත් කර ගැනීම් (කැබලි ගණන)	2014 දෙසැම්බර් දක්වා ගෙවීම් (රු)	2015 දෙසැම්බර් දක්වා ගෙවීම් (රු)
ගොන්නෝරුව - කෙළිය වලාන හංදිය (කි.මී 3+450)	130	√	√			
එකතුව	**3564**			**0**	**0.00**	**142,194,185.00**
දක්ෂිණ අධිවේගී මාර්ගය දිගු කිරීමේ ව්‍යාපෘතිය						
I - අදියර						
මාතර - බෙලිඅත්ත (කි.මී. 0+000-30+000)	3506	2742	2742			7,405,228.75
II - අදියර						
බෙලිඅත්ත - වැටිය (කි.මී.30+000-56+000)	2411	1681	1681			
III - අදියර						
වැටිය - අන්දරවැව මාර්ගය (කි.මී. 56+000-71+000)	2611	1375	1375			
IV - අදියර						
වරාය - ගුවන් තොටුපල (කි.මී. 56+000-71+000)	385	385	385			
එකතුව	**8913**			**0**	**0.00**	**7,405,228.75**
මධ්‍යම පළාත						
මහනුවර දිස්ත්‍රික්කය						
විලියම් ගොපල්ලව මාවත (කි.මී.2.1)	459	√	√			56,539,162.39
මහනුවර - කිරිමැටිය මාර්ගය (කි.මී. 7.591)	642	√	√			
මහයියාව උමග සිට කටුගස්තොට පාලම දක්වා (කි.මී. 1.502 - 2.250)	234	√	√			
ධර්මාශෝක මාවත (කි.මී. 0+000 - 1+000)	95	√	√			
ධර්මාශෝක මාවත (කි.මී. 1+000 - 3+400)	280	√	√			
මඩවල - දිගන මාර්ගය (කි.මී. 0+000 - 2+800)	260	√	√			
මඩවල - දිගන මාර්ගය (කි.මී. 2+800 - 8+300)	475	√	√			
කටුගස්තොට - මඩවල මාර්ගය (කි.මී. 0+000-0+260)	13	√	√			
කටුගස්තොට - මඩවල මාර්ගය (කි.මී. 0+260-3+620)	159	√	√			
කටුගස්තොට - මඩවල මාර්ගය ((කි.මී. 3+620-5+200)	32	√	√			
ලුවී පීරිස් මාවත (කි.මී. 0.6)	13	√				

මාර්ගය / මාර්ග කොටස	කැබලි ගණන	ඉඩම් අමාත්‍යාංශය විසින් 2, 38 (A) වගන්තිය යටතේ නිවේදනය / ගැසට් නිවේදනය පළකිරීම		2015 තුළ නිමකළ අත්පත් කර ගැනීම් (කැබලි ගණන)	2014 දෙසැම්බර් දක්වා ගෙවීම් (රු)	2015 දෙසැම්බර් දක්වා ගෙවීම් (රු)
පේරාදෙණිය - හල්ඔලුව මාර්ගය (කි.මී. 3+000 - 3+300)	10	√	√			
පේරාදෙණිය - හල්ඔලුව මාර්ගය (කි.මී. 3+300 - 10+040)	240	√	√			
පේරාදෙණිය - හල්ඔලුව මාර්ගය (කි.මී. 0+000 - 0+600)	76	√	√			
පේරාදෙණිය - හල්ඔලුව මාර්ගය (කි.මී. 0+000- 0+600)	36	√	√			
අස්ගිරිය අතුරු මාර්ගයසිට මහයියාව උමඟ දක්වා (කි.මී. 0.75)	62	√	√			
ගලගෙදර - රඹුක්කන මාර්ගය (කි.මී.10.5)	920	√	√			
අටබාගේ - දුනුගල්ල මාර්ගය (කි.මී. 3.9)	178	√	√			
මාබෙරිතැන්න ගුවන් තොටුපල	26	√	√			
මාබෙරිතැන්න ගුවන් තොටුපල සඳහා අතිරේක ඉඩම් අත්පත් කර ගැනීම	12	√	√			
එකතුව	**4222**			**0**	**0.00**	**56,539,162.39**
නුවරඑළිය දිස්ත්‍රික්කය						
තැන්නෙකුඹුර - රිකිල්ල ගස්කඩ මාර්ගය (කි.මී. 17.10)	1243	√	√			
තැන්නෙකුඹුර - රිකිල්ල ගස්කඩ මාර්ගය (55.68)km	2312	√	√			
කොටගල නගර සංවර්ධනය (හැටන් නුවරඑළිය මාර්ගයේ බෝක්කු	58	√	√			
(77/6 - 79/2) අතර	236	-	-			
එකතුව	**3849**			**0**	**0.00**	**0.00**
මාතලේ දිස්ත්‍රික්කය						
මාතලේ - උඩුපිහිල්ල (කි.මී.6)	577	√	√			0.00
මාතලේ - ඉල්ක්කුඹුර - ලග්ගල මාර්ගය (කි.මී.10)	907	√	√			0.00
මහනුවර - යාපනය මාර්ගය (කි.මී.25.3 - 27.3)	571	√	√			0.00
එකතුව	**2055**			**0**	**0.00**	**0.00**
වයඹ පළාත						
වයඹ පළාත - කුරුණෑගල හා පුත්තලම දිස්ත්‍රික්ක						
පන්නල අන්තර්ඡේදනය (මී.500)	64	√	√			62,140,000.00
නාරම්මල නගර සංවර්ධනය (මී. 750)	285	√	√			238,411,433

මාර්ගය / මාර්ග කොටස	කැබලි ගණන	ඉඩම් අමාත්‍යාංශය විසින් 2, 38 (A) වගන්තිය යටතේ නිවේදනය / ගැසට් නිවේදනය පළකිරීම		2015 තුළ නිමකළ අත්පත් කර ගැනීම් (කැබලි ගණන)	2014 දෙසැම්බර් දක්වා ගෙවීම් (රු)	2015 දෙසැම්බර් දක්වා ගෙවීම් (රු)
						.14
මහ වීදිය (මී. 500)	114	√	√		103,387,500.00	54,461,000.00
පලාවි - කල්පිටිය මාර්ගය (කි.මී.12)	528	√	√			
පලාවි - කල්පිටිය අතිරේක මාර්ගය (කි.මී.2)	127	√	_			
තල්ගොඩපිටිය මාර්ගය - රිදීගම (කි.මී. 5)	436	√	√			
තල්ගොඩපිටිය මාර්ගය - ඉඹබාගමුව (කි.මී. 5)	95	√	√			
තල්ගොඩපිටිය මාර්ගය - යටවත්ත (කි.මී. 5)	496	√	√			
තල්ගොඩපිටිය මාර්ගය - මාතලේ (කි.මී.5)	187	√	√			
මුත්තෙට්ටුගල - හිරිපිටිය මාර්ගය (කි.මී.5)	349	√	√			
මහව ගුවන් පාලම (මී.500)	222	√	√			
වැව රවුම මාර්ගය (කි.මී.2)	205	√	√			
කුරුණෑගල - මාදම්පේ මාර්ගය (කි.මී.5)	550	√	√			
විල්ලුව හංදිය (මී. 350)	7	√	√			
බෞද්ධාලෝක මාවත (කි.මී. 1)	69	√	_			
සේවා මාර්ගය (මී. 750)	19	√	√			
බෝගස් හංදිය (මී.500)	14	√	√			
නාරම්මල - ගිරිඋල්ල මාර්ගය (මී. 200)	10	√	√			107,374,100.00
උඩකැලේ - කඩිගමුව මාර්ගය (කි.මී. 3)	21	√	-			
එකතුව	**3798**			**0**	**103,387,500.00**	**462,386,533.14**
උතුරු පළාත						
යාපනය දිස්ත්‍රික්කය						
යාපනය - පන්නෙයි - කයිට්ස් මාර්ගය (කි.මී.	206	√	√	130	9,519,000.	
පරන්තන් - මුලතිවු මාර්ගය - ජලබස්නා කාණු බෝක්කු අංක 36/2	4	√	√	-		
මහනුවර - යාපනය මාර්ගයේ ඉයක්කච්චි වංගුව	1	√	-	-		
එකතුව	**211**				**9,519,000.00**	**3,299,250.00**
සබරගමුව පළාත						
රත්නපුර දිස්ත්‍රික්කය						
රත්නපුර අතුරු මාර්ගය (කි.මී.3.06)	208	√	√			
බණ්ඩාරනායක මාවත (කි.මී.0.114)	52	√	√			

මාර්ගය / මාර්ග කොටස	කැබලි ගණන	ඉඩම් අමාත්‍යාංශය විසින් 2, 38 (A) වගන්තිය යටතේ නිවේදනය / ගැසට් නිවේදනය පළකිරීම		2015 තුළ නිමකළ අත්පත් කර ගැනීම් (කැබලි ගණන)	2014 දෙසැම්බර් දක්වා ගෙවීම් (රු)	2015 දෙසැම්බර් දක්වා ගෙවීම් (රු)
රත්නපුර - පුලිඟුපිටිය වටරවුම (කි.මී.1.5)	237	√	√		4,495,500.	
මොරගහයට හංදිය (මී. 200)	82	√	√		19,000,95	
කුරුවිට නගර සංවර්ධනය (මී. 175)	44	√	√		9,695,400.	
තිරිවානාකැටිය - අගලවත්ත මාර්ගයේ අංක. 14/1, 21/3 පාලම්	20	√	√			
තිරිවානාකැටිය - අගලවත්ත මාර්ගයේ අංක 33/2 පාලම්	20	√	√			
රත්නපුර - පලාවෙල - කරවිට මාර්ගයේ අංක 10/1 බෝක්කුව	2	√	√			
රත්නපුර - පලාවෙල - කරවිට මාර්ගයේ අංක 17/9 බෝක්කුව	5	√	_			
කොළඹ - රත්නපුර - මඩකලපුව මාර්ගයේ - මොරගහයට අංක 99/6 පාලම්	5	√				
රත්නපුර - වැල්ලවාය මාර්ගයේ අංක 141/7 -141 බෝක්කු	5	√	√			
අයගම - ඉඩංගොඩ මාර්ගයේ (කි.මී. 6+259 - 6+541)	2	√	√			
කොළඹ - රත්නපුර - වැල්ලවාය මාර්ගයේ අංක 110/5 -110	1	√	√			
එකතුව	**683**				**33,191,850.00**	**40,417,500.00**
කෑගල්ල දිස්ත්‍රික්කය						
තල්දුව - මීවිටිගම්මන මාර්ගය (කි.මී.0.000-15+250)	88	√	√		317,000.00	1,918,550.00
තල්දුව - මීවිටිගම්මන මාර්ගය (කි.මී. 0.000-15+250)	113	√	√		2,125,000.00	3,160,000.00
කෑගල්ල අතුරු මාර්ගය II අදියර (කි.මී. 1+100)	109	√	√		14,087,000.00	14,087,000.00
කෑගල්ල අතුරු මාර්ගය II අදියර -අතිරේක (මී.30)	1	√	_			8,613,225.00
කෑගල්ල අතුරු මාර්ගය II අදියර පාලම් (මී. 80)	15	√	√			
කෑගල්ල අතුරු මාර්ගය III අදියර (කි.මී.2.5)	90	√	√		3,601,750.00	
කෑගල්ල අතුරු මාර්ගය III අදියර - අතිරේක (මී. 40)	5	√	_			14,000.00
වරකපොල අතුරු මාර්ගය (කි.මී.1.6)	145	√	√			
බුලත්කොහුපිටිය - කරවනැල්ල මාර්ගය (කි.මී. 24 - 27)	317	√	√			
කෑගල්ල අතුරු මාර්ගයේ III වන අදියරේ අතිරේක ඉඩම් අත්පත්කර ගැනීම	1	√	_			

මාර්ගය / මාර්ග කොටස	කැබලි ගණන	ඉඩම් අමාත්‍යාංශය විසින් 2, 38 (A) වගන්තිය යටතේ නිවේදනය / ගැසට් නිවේදනය පළකිරීම		2015 තුළ නිමකළ අක්පත් කර ගැනීම් (කැබලි ගණන)	2014 දෙසැම්බර් දක්වා ගෙවීම් (රු)	2015 දෙසැම්බර් දක්වා ගෙවීම් (රු)
මාවනැල්ල අතුරු මාර්ගය (ඉඩම් අක්පත්කර ගැනීම I,II,III) (මී 400)	108	√	√			3,497,991.98
බුලත්කොහුපිටිය - අලුත් හංදිය (කෑගල්ල නගරය)	7	√				
කොළඹ - මහනුවර මාර්ගය (කෑගල්ල නගරය)	8	√	_		1,618,000.00	
වේයන්ගොඩ - රුවන්වැල්ල මාර්ගය (මී. 240)	8	√				
ගුරුගොඩ - බෝයගොඩ මාර්ගය (මී. 342)	2	√	√			
එකතුව	**1017**				**21,748,750.00**	**31,290,766.98**
ඌව පළාත						
ඌව පළාත - බදුල්ල දිස්ත්‍රික්කය						
බදුල්ල - මහනුවර මාර්ගය (රජ මාවත) (කි.මී. 1.57 - 7.00)	417	√	√			
බිබිල - ඌරණිය මාර්ගයේ (කි.මී.12) අතර	202	√	√			
බුත්තල විකල්ප මාර්ගය (කි.මී. 1.112)	20	√	√			
කන්දෙහංදිය සිට රිකිල්ලගස්කඩට (කි.මී. 26+750 - 27 +315)	68	_	_			
බදුල්ල - කරමැටියාව - ආඳාඋල්පත මාර්ගය (කි.මී. 3+600 - 3+670)	1	√	_			
බදුල්ල - කරමැටියාව - ආඳාඋල්පත මාර්ගය (කි.මී. 2.2)	8	√	√			
හුලංදාව වටරවුම් මාර්ගය	10	√	√			
දෙමෝදර - ස්ප්‍රිංවැලි - බදුල්ල මාර්ගය (කි.මී. 20)	37	√	√			
එකතුව	**763**			**0**	**0.00**	**0.00**

3.9 පාරිසරික හා සාමාජීය ආරක්ෂණ පියවර ක්‍රියාත්මක කිරීම.

පාරිසරික හා සාමාජීය ආරක්ෂණ පියවරයන් මා.සං.අ.යේ පාරිසරික හා සමාජ සංවර්ධන අංශය තුලින් ක්‍රියාත්මක කෙරේ. නියෝජ්‍ය අධ්‍යක්ෂවරයාගේ හා සහාය කාර්ය මණ්ඩලයේ සහයෝගය ඇතිව, අතිරේක අධ්‍යක්ෂ ජනරාල් (ඉදිකිරීම් සැලසුම්) හා අධ්‍යක්ෂ (පාරිසරික හා සමාජීය සංවර්ධන) විසින් අධ්‍යක්ෂ ජනරාල්වරයාට ව්‍යක්තීයමය සහාය ලබා දෙනු ලැබේ.

පාරිසරික හා සමාජීය සංවර්ධන අංශය (පා.හා.ස.සං.) 2006 ජූලි මාසයේදි ඉඩම් අත්පත් කර ගැනීමේ හා ප්‍රතිස්ථාපන අංශය යටතේ පිහිටුවන ලදි. 2011 දී පා.හා ස.සං. අංශය සඳහා නව අධ්‍යක්ෂවරයෙකු පත්කළ අතර, දැනට මෙම අංශය තනි අංශයක් ලෙස මා.සං.අ. යේ පාරිසරික හා සමාජීය ආරක්ෂණ අංශය වශයෙන් ක්‍රියාත්මක වේ. ආ.සං.බැ. අරමුදල් යටතේ තාක්ෂණික සහාය ව්‍යාපෘතිය (TA 4736-ශ්‍රී) අනුව සපයන ලද ආරම්භක මාර්ගෝපදේශ අනුව මනාව ස්ථාපිත කරන ලද මෙම අංශය මාර්ග සංවර්ධන ව්‍යාපෘති, ඇස්පල්ට් යන්ත්‍රාගාර, ගල් ඇඹරුම් යන්ත්‍රාගාර පිහිටුවීමට සම්බන්ධ පාරිසරික හා සමාජීය ආරක්ෂණ පියවර ක්‍රියාත්මක කිරීමට සැලසුම් අංශය, මාර්ග සැලසුම් අංශය, ඉංජිනේරු සේවා අංශය, යාන්ත්‍රික අංශය හා මා.සං.අ. ප්‍රධානතම අංශවලට අඛන්ඩ සහාය ලබා දෙයි. තවද පා.හා ස.සං.අ. පාරිසරික කළමනාකරණ හා ආවේක්ෂණ සැලසුම් සඳහා මා.සං.අ.යේ ව්‍යා.ක.ඒ. පිහිටුවීමට හා එවැනි කළමනාකරණ හා ආවේක්ෂණ සැලසුම් ක්‍රියාත්මක කිරීමට සහාය ලබා දෙයි.

තවද, පා.හා ස.සං. අංශය, මධ්‍යම පරිසර අධිකාරිය, වෙරළ සංරක්ෂණ දෙපාර්තමේන්තුව, වන ජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව හා වනජීවී දෙපාර්තමේන්තුව ඇතුළු විවිධ රජයේ ආයතන විසින් පිහිටුවනු ලබන විවිධ තාක්ෂණික ඇගයීම් කමිටුවල ක්‍රියාකාරි ලෙස සහභාගි විය.

3.9.1 අංශයේ කාර්යයන් හා වගකීම්.

පා.හා ස.සං. අංශයේ කාර්යයන් වාර්තාකරණය හා ආරක්ෂණ ආවේක්ෂණ යනුවෙන් දෙවැදෑරුම් වේ. 2015 වර්ෂය තුළ පා.හා ස.සං. අංශය යෝජිත ගනේමුල්ල, පොල්ගහවෙල හා රාජගිරිය යන ස්ථානවල ගුවන් පාලම් සඳහා කඩිනම් පාරිසරික හා සාමාජීය තක්සේරු පිළියෙල කිරීමෙහි යෙදුණු අතර, පොල්ගහවෙල හා රාජගිරිය ගුවන් පාලම් සඳහා දැනටමත් මධ්‍යම පරිසර අධිකාරියේ අනුමැතිය ලබා ගෙන ඇත. පා.හා ස.සං. අංශය, දක්ෂිණ අධිවේගි මාර්ගය දිගුව ව්‍යාපෘතිය හා ග්‍රාමීය ආයෝජන මාර්ග ව්‍යාපෘතිය හා සාමාජීය ආරක්ෂණ අනුකූලතා පිළියෙල කිරීම හා උතුරු මාර්ග සම්බන්ධතා ව්‍යාපෘතියේ

අධීක්ෂණය කිරීමට අඛන්ඩව ක්‍රියා කරන ලදි. තවද, පා.හා ස.සං. අංශය විසින්, ආ.සං.බැ. උපදේශකයන් සමග එක්ව, ඒ.මා.ආ.වැ.ස. ව්‍යාපෘතිය සඳහා කොන්ත්‍රාත්කරුවන්ට පරිසර සංවේදී සැලසුම (CSD) පිළිබඳ පුහුණුව ලබා දෙන ලදි. පා.හා ස.සං. අංශය විසින් ඕනෑම බාහිර ආයතනයක් විසින් පිළියෙල කරන ලද පාරිසරික හා සමාජීය ආරක්ෂණ ලේඛන, සමාලෝචනය හා වැඩි දියුණු කිරීමට කටයුතු කරනු ලැබීය. පා.හා ස.සං. අංශය විසින් 2015 වර්ෂය තුළ මාර්ග අංශ සහායක ව්‍යාපෘතියේ සහ අධිවේගී මාර්ග සම්බන්ධතා වැඩි දියුණු කිරීමේ සැලසුම් ව්‍යාපෘතියේ පාරිසරික ආරක්ෂණ වාර්තා සමාලෝචනය කරනු ලැබීය.

මෙම කටයුතුවල සඵලදායිත්වයට රටේ ජෙව භූගෝලීය, සාමාජීය ආර්ථික තොරතුරු හා සමාජීය ආර්ථික දත්ත විශ්ලේශනය කිරීමට පා.හා ස.සං. අංශය විසින් වර්ධනය කරන ලද කළමනාකරණ තොරතුරු පද්ධතිය බොහෝ සේ සහාය විය.

පහත දැක්වෙනුයේ පා.හා ස.සං. අංශය විසින් පිළියෙල කරන හෝ සමාලෝචනය කරනු ලබන ප්‍රධාන පාරිසරික හා සාමාජීය ආරක්ෂණ අනුකූලතා ලේඛනයන්ය.

පාරිසරික ආරක්ෂණයන්:

- මූලික තොරතුරු ප්‍රශ්නාවලිය
- කඩිනම් පාරිසරික තක්සේරු පරීක්ෂා ලැයිස්තුව
- ව්‍යාපෘති පිළිබඳ පූර්ව ශක්‍යතා හා ශක්‍යතා වාර්තාවල සාමාජීය හා පාරිසරික පරිච්ඡේදයන්
- ආරම්භක පාරිසරික පරීක්ෂණ වාර්තා හා පාරිසරික බලපෑම් තක්සේරු වාර්තා.
- පාරිසරික බලපෑම් තක්සේරු වාර්තා
- පාරිසරික කළමනාකරණ හා පාරිසරික ආවේක්ෂණ සැලසුම්
- කොන්ත්‍රාත් ලංසු ලේඛනවල පරිසර ක්‍රියාකාරී සැලසුම් වගන්ති
- පාරිසරික ආරක්ෂණ අනුකූලතාව පිළිබඳ මාසික හා කාර්තුමය ආවේක්ෂණ වාර්තා

සාමාජීය ආරක්ෂණයන් :

- ආරම්භක දුගීභාවය හා සාමාජීය තක්සේරුව
- අනිජානුගත ප්‍රතිස්ථාපන පරීක්ෂා ලැයිස්තුව
- දේශීය ජනතාව පිළිබඳ සාරාංශ පරීක්ෂා ලැයිස්තුව
- ප්‍රතිස්ථාපන සැලසුම්
- ප්‍රතිස්ථාපන සැලසුම් පිළිබඳ වාර්තා ආවේක්ෂණය

3.9.2 2015 වර්ෂය තුල පා.හා සා.සං. අංශය විසින් නිම කරන ලද කටයුතු.

3.9.2.1 පාරිසරික මානයන්.

මා.සං.අ. යේ විවිධ අංශ හා ව්‍යාපෘතිවලට පාරිසරික මානයන් සම්බන්ධයෙන් දෙන ලද සහාය පිළිබඳ සාරාංශය පහත සඳහන් පරිදි වේ:

- දක්ෂිණ අධිවේගි මාර්ගය දිගු කිරීම පිළිබඳ පාරිසරික හා සාමාජීය ආරක්ෂණ අනුකූලතාවය ආවේක්ෂණය කිරීම
- දකුණු පළාතේ ඒකාබද්ධ ග්‍රාමීය මාර්ග ආයෝජන වැඩ සටහන් ව්‍යාපෘතියේ උපදේශන හා කොන්ත්‍රාත්කරුගේ ආරක්ෂණ කාර්ය මණ්ඩලයට ආරක්ෂණ අනුකූලතාව පිළිබඳ දැනුවත් කිරීමේ වැඩමුළුව පැවැත්වීම.
- ඒකාබද්ධ ග්‍රාමීය මාර්ග ආයෝජන වැඩ සටහන් ව්‍යාපෘතියේ පාරිසරික හා සාමාජීය ආරක්ෂණයන් ආවේක්ෂණය කිරීම
- ප්‍රා.ආ. උ.මා.ස.ව්‍යා.මා.ස.ව්‍යාපෘති මාර්ගවල පාරිසරික හා සාමාජීය ආරක්ෂණයන් අවේක්ෂණය කිරීම
- රාජගිරිය හා පොල්ගහවෙල ගුවන් පාලම් ඉදිකිරීම සඳහා පාරිසරික නිෂ්කාශන අනුමැතිය ලබා ගන්නා ලදි.
- දෙහිඕවිට - දැරණියගල - නූරි මාර්ගය (B093) සඳහා මධ්‍යම පරිසර අධිකාරියෙන් පාරිසරික අනුමැතිය ලබා ගනු ලැබීය.
- යෝජිත මහනුවර අතුරු මාර්ග උමග වෙනුවෙන් ම.ප.අ. යේ නිෂ්කාෂණය ලබා ගැනීම සඳහා ප්‍රමාණ බිල්පත් පිළියෙල කිරීම හා ඉදිරිපත් කිරීම
- වි.වි.ආ. ව්‍යාපෘතිය හා මා.ජා.වැ. ව්‍යාපෘතිය යටතේ වන ව්‍යාපෘති මාර්ග සඳහා ප්‍රමාණ බිල්පත් පිළියෙල කිරීම
- මා.ජා.වැ. ව්‍යාපෘතිය යටතේ වන යෝජිත ත්‍රිකුණාමලය පිටත වටරවුම් මාර්ගය සඳහා ම.ප.අ. යෙන් පාරිසරික අනුමැතිය ලබා ගැනීමට ම.ප.අ. යේ පාරිසරික ප්‍රශ්නාවලිය සම්පූර්ණ කිරීම හා අදාල කොටස්කරුවන් වෙතින් එකඟතාවය ලබා ගැනීම.
- වරකාපොල අතුරු මාර්ගය ඉදි කිරීම සඳහා ම.ප.අ. යේ පාරිසරික නිශ්කාශනය ලබා ගැනීමට මූලික පාරිසරික පරීක්ෂණ වාර්තාව පිළියෙල කිරීම.
- බදුල්ල-වෙංකලඩි-මඩකලපුව මාර්ගයේ (A005) බදුල්ල - වෙන්කලඩි කොටස පුනරුත්ථාපනය හා වැඩි දියුණු කිරීම සඳහා මධ්‍යම පරිසර අධිකාරියේ පාරිසරික නිෂ්කාශනය ලබා ගැනීමට ආරම්භක පාරිසරික පරීක්ෂණය පිළියෙල කිරීම.
- උ.මා.ස. ව්‍යාපෘතිය යටතේ දෙවැනි වාර්ෂික වාර්තාව පිළියෙල කිරීම නිම කරන ලදි.

- ඒ.ග්‍රා.මා.ආ. ව්‍යාපෘතිය යටතේ සබරගමුව පළාත සඳහා පාරිසරික පරීක්ෂා ලැයිස්තුව පිළියෙල කිරීම.
- මධ්‍යම අධිවේගී මාර්ගය සඳහා ව්‍යා.ක.ඒ. ට පාරිසරික තක්සේරු සමාලෝචන රාමුවක් පිළියෙල කිරීම.
- අධිවේගී සම්බන්ධතා වැඩි දියුණු කිරීමේ සැලසුම් ව්‍යාපෘතිය සඳහා පාරිසරික තක්සේරුව සමාලෝචනය.
- ද.අ.කොා.දෙ.ඉ. ව්‍යාපෘතිය යටතේ, කොට්ටාව / මාලපල්ල සිට කිඹුලාවල හංදිය දක්වා හා රාජගිරිය සිට ඔරුගොඩවත්ත දක්වා කොටස් සඳහා ම.ප.අ. යේ නිෂ්කාශන සමාලෝචනය කිරීම.
- කුවෙට් අරමුදල් සැපයීම යටතේ පාලම් 25 ක් සඳහා පාරිසරික නිෂ්කාශනය අළුත් කිරීම.
- මා.සං.අ. යටතේ ක්‍රියාත්මක ඇස්පල්ට් යන්තාගාර සඳහා පා.ආ.බ. අළුත් කිරීම හා එවැනි යන්ත්‍රාගාර ක්‍රියාකාරිත්වයට එරෙහිව මතුවූ මහජන පැමිණිලිවලට විසඳුම් දීම.
- නායයෑම් ආපදා ආරක්ෂණ ව්‍යාපෘතිය සඳහා පාරිසරික කළමනාකරණ ක්‍රියාකාරී සැලැස්ම සමාලෝචනය කරනු ලැබීය.
- ලෝක බැංකු අරමුදල් මත වන නිකාමාකෝ යටතේ වැඩි දියුණු කෙරෙන A003, A004 හා A018 මාර්ග සඳහා පිළියෙල කරන ලද මූ.පා.ප. සමාලෝචනය කරන ලදි.
- මා.සං.අ. සඳහා ඉඩම් අත්පත් කර ගැනීමේ කොරතුරු පද්ධතියක් වර්ධනය කිරීම.
- මහවැලි ගඟ හරහා හල්ලොලුව නව පාලම ඉදිකිරීම සඳහා ප්‍රමාණ බිල්පත් පිළියෙල කිරීම හා ඉදිරිපත් කිරීම.



ඒ.මා.සං. ව්‍යා. සඳහා දැනුවත් කිරීමේ වැඩ සටහන පවත්වමින්



ඒ.මා.සං. ව්‍යා. (දකුණු පළාත) ක්ෂේත්‍ර පරීක්ෂාව පවත්වමින්



පා.හා ස.සං. අංශය විසින් ශබ්ද මිනුම් ලබා ගනිමින්



උ.මා.සං.ව්‍යා. පිළිබඳ ආරක්ෂණ අනුකූලතාවය ආවෙක්ෂණය කරමින්

3.9.2.2. සාමාජීය මානයන්

සාමාජීය මානයන් සඳහා මා.සං.අ. යේ විවිධ ඒකකවලට ලබා දෙන සහාය පහත සාරාංශ ගතකර ඇත:

- විවිධ මාර්ග විකල්පයන් පරීක්ෂා කරමින් කොටස්කරුවන්ගේ අදහස් විමසන ලද අතර, ගනේමුල්ල, රාජගිරිය හා පොල්ගහවෙල ගුවන් පාලම් සඳහා සාමාජීය මානයන් පිළියෙල කරනු ලැබීය.
- අධිවේගි මාර්ග සම්බන්ධතා වැඩි දියුණු කිරීමේ සැලැස්ම යටතේ, වැඩි දියුණු කළ යුතු මාර්ග පිළිබඳ කොටස්කරුවන්ගේ රුස්වීම් වලට සහභාගි වූ අතර, රැස්වීමේදී මතුවූ ප්‍රධාන ගැටළු පිළිබඳව ව්‍යා.ක.ඒ. ට දැනුම් දීම.
- කැලණි ගඟ හරහා නව පාලම ඉදිකිරීමේ ව්‍යාපෘතිය ප්‍රතිස්ථාපන කටයුතු ක්‍රියාත්මක කිරීමට හා ආදායම් යළි ඇති කිරීමේ කටයුතු සඳහා මූලික සැලසුමට සහාය වීම.
- මධ්‍යම අධිවේගි මාර්ග ව්‍යාපෘතිය සඳහා ප්‍රතිස්ථාපන සැලැස්ම පිළියෙල කිරීම සහ අදහස් දැක්වීම සඳහා ආ.සං.බැ. වෙත ඉදිරිපත් කිරීම.
- ලෝක බැංකු අරමුදල් සැපයීම සඳහා A004 මාර්ගයේ අවිස්සාවේල්ල - පැල්මඩුල්ල කොටස, A003 මාර්ගයේ ජාඇල - පුත්තලම කොටස හා A018 මාර්ගයේ පැල්මඩුල්ල - පදලංගල කොටස සඳහා පිළියෙල කරන ලද සාමාජීය තක්සේරු කිරීම් හා ප්‍රතිස්ථාපන සැලසුම් සමාලෝචනය කිරීම.
- උතුරු අධිවේගි මාර්ගයේ 1, 2, 3, හා 4 අදියර සඳහා පිළියෙල කරන ලද ප්‍රතිස්ථාපන සැලසුම් සමාලෝචනය කිරීම.

- මාර්ග සම්බන්ධතා වැඩි දියුණු සැලැස්මේ ශක්‍යතා වාර්තාව සඳහා පිළියෙල කරන ලද සාමාජීය තක්සේරු සමාලෝචනය.
- කැලණි ගඟ හරහා නව පාලම ඉදිකිරීමේ ව්‍යාපෘතිය සඳහා යාවත්කාලීන කළ ප්‍රතිස්ථාපන සැලැස්ම සමාලෝචනය කිරීම.
- ප්‍රංශ සහාය මත උ.මා.ස.ව්‍යා. පිළියෙල කරන ලද සාමාජීය ආරක්ෂණය පිළිබඳ බාහිර ආවේක්ෂණ වාර්තාව සමාලෝචනය කිරීම.
- ජාතික මාර්ග ජාලයේ නායයෑම් ආපදා ආරක්ෂණ ව්‍යාපෘතිය සඳහා පිළියෙල කරන ලද ප්‍රතිස්ථාපන සැලැස්ම සමාලෝචනය කිරීම.



උ.මා.ස.ව්‍යා. සඳහා ආවේක්ෂණ සැසි පවත්වමින්



පා.හා ස.සං. අංශය මහජන අදහස් විමසමින්

3.9.2.3. කලමනාකරණ තොරතුරු පද්ධතිය

පෙර වර්ෂයේ මෙන්ම මෙම වර්ෂයේද ජෙව - භූගෝලීය හා සාමාජීය දත්ත හා තොරතුරු එක්රැස් කිරීමට කටයුතු කරන ලදි. මෙම තොරතුරු පාරිසරික හා සාමාජීය ආරක්ෂණ ලේඛන පිළියෙල කිරීම සඳහා ඵලදායි ලෙස භාවිතා කරනු ලැබීය. ක.තො. කණ්ඩායම විසින් පා.හා ස.සං. අංශය විසින් පිළියෙල කරන ආරක්ෂණ ලේඛන සඳහා සිතියම් පිළියෙල කිරීමට සහාය ලබාදෙන ලදි.

- ක.තො.ප. කණ්ඩායම විසින්, වාලුක්කයිආරු - පුන්ගුඩුතිවු - කුරිකට්ටුවාන් (AB39) මාර්ගය හා පේරාදෙණිය - බදුල්ල - වෙන්කලඩි මාර්ගයේ (A005) බදුල්ල - වෙන්කලඩි කොටස සඳහා භූ.ස්. ලක්ෂයන් රැස් කිරීම හා භූ.ස්. අනුරේඛනය සමඟ සම්පූර්ණ දිගැති වීඩියෝව නිෂ්පාදනයට ව්‍යාපෘති වලට සහාය ලබා දෙනු ලැබීය.

- මා.සං.අ. විසින් අත්පත්කර ගත් ඉඩම්වල තොරතුරු ගබඩා කිරීමට ඉඩම් අත්පත්කර ගැනීමේ තොරතුරු පද්ධතියේ ප.හා ස.සං. අංශයේ ක.තො.ඒ. විසින් සම්පාදනය කරන ලද අතර, මෙය අඛන්ඩ ක්‍රියාවලියක් ලෙස පා.හා.ස.සං. අංශය විසින්, මා.සං.අ. යේ සියලුම ව්‍යා.ක.ඒ. වලට තාක්ෂණික සහාය ලබා දෙමින්, පද්ධතිය දත්ත ගබඩාව සමඟ ස්ථාපිත කිරීමට අඛන්ඩව කටයුතු

කළ අතර, දත්ත ගබඩාවට කාර්ය මණ්ඩලය විසින් දත්ත ඇතුළු කිරීම ආවේක්ෂණය කරනු ලැබීය.

- පා.හා ස.සං. අංශයේ ක.තො.ප. කණ්ඩායම විසින් එදිනෙදා ලිපිලේඛන කළමනාකරණය සඳහා තොරතුරු පද්ධතියක් සම්පාදනය කරන ලදි.
- තවද, පා.හා ස.සං. අංශය විසින්, සියලු පොත් සහ විමර්ශන ලිපිද්‍රව්‍ය ලැයිස්තු ගත කරනු ලැබූ අතර, ලේඛන පහසු ලෙස විමර්ශනය හා කළමනාකරණය සඳහා පුස්තකාල පද්ධතියක් සම්පාදනය කරනු ලැබීය.

3.10 සැලසුම්කරණය හා වාර්තාකරණය

සැලසුම්කරණය හා වාර්තාකරණය, සැලසුම් අංශයේ සැලසුම්කරණ, සූත්‍රකරණය, වැඩ සටහන්කරණය හා ප්‍රගති ආවේක්ෂණය හු.තො.ප. ඒකකය යටතේ සිදු කෙරේ. මෙම සැ 2 උප අංශය අධ්‍යක්ෂ සැලසුම් යටතේ නියෝජ්‍ය අධ්‍යක්ෂ විසින් ප්‍රධානත්වය දරණු ලබයි. අතිරේක අධ්‍යක්ෂ ජනරාල් (ජාල සැලසුම්) හා අධ්‍යක්ෂ සැලසුම් නියෝජ්‍ය අධ්‍යක්ෂවරයාගේ හා සහාය කාර්ය මණ්ඩලයේ සහයෝගය ඇතිව, අධ්‍යක්ෂ ජනරාල්වරයාට වෘත්තීයමය සහාය ලබා දෙයි.

මා.සං.අ. යේ සැලසුම් අංශයට අයත්, ව්‍යාපෘති සූත්‍රකරණ හා ආවේක්ෂණ අංශය, මා.සං.අ. විසින් ක්‍රියාත්මක කරන ව්‍යාපෘතිවල ව්‍යාපෘති සංකල්පයේ සිට ක්‍රියාත්මක කිරීම දක්වා සියලු සැලසුම්කරණ කටයුතු පිළිබඳව වගකීම උසුලයි. සමස්ත සැලසුම්කරණයට, රජයේ ප්‍රතිපත්ති හා ප්‍රමුඛතාවයන් හා ජාතික භෞතික සැලසුම් පනිපත්තිය පදනම්ව අනාගත අවශ්‍යතා සැලකිල්ලට ගනිමින්, ජාතික මාර්ග ජාලය සංවර්ධනය හා ජාතික මාර්ග ජාලයේ සාර්ව සැලසුම්කරණය ඇතුළු සමස්ත සැලසුම්කරණය ඇතුළත් වේ.

මෙම ඒකකයේ ප්‍රධාන කාර්ය වන්නේ ජාලයේ අනාගත ඉල්ලුම ඉටු කිරීමට පවත්නා මාර්ග ජාලය ශක්තිමත් කිරීම සඳහා අනිමි වූ සම්බන්ධතා හා නව මාර්ග හඳුනා ගැනීම ඇතුළු මාර්ග ජාල සංවර්ධන අවශ්‍යතා සඳහා කටයුතු කිරීමයි. සැලසුම් ක්‍රියාවලියේදී ප්‍රධාන කාර්යයන් වන්නේ සංකල්ප වර්ධනය, මාර්ග හඳුනා ගැනීම, පූර්ව ශක්‍යතා හා ශක්‍යතා අධ්‍යයනය, රථවාහන ඉල්ලුම පුරෝකථනය හා අදාල ආර්ථික විශ්ලේෂණයවැනි සැලසුම්කරණ ක්‍රියාවලිය අයත් වේ. ඊට අමතරව, මාර්ග තත්ත්වය, ව්‍යාපෘති දත්ත හා පාලම් ලේඛන දත්ත වලට සම්බන්ධ දත්ත සහිත දත්ත ගබඩාව නඩත්තු කිරීම වේ. ව්‍යාපෘති සම්පාදන ක්‍රියාවලියේදී මා.සං.අ. යේ සැලසුම් අංශය විසින් නඩත්තු කරන මාර්ග ජාල තත්ත්ව දත්ත

ගබඩාව භාවිතා කරමින් පුනරුත්ථාපනය හා වැඩි දියුණු කිරීමේ ව්‍යාපෘති හඳුනාගනු ලැබේ.

ප්‍රමුඛතා පදනම මත පුනරුත්ථාපනය හා වැඩි දියුණු කිරීම සඳහා මාර්ග තෝරා ගැනීම HDM4 මාර්ග සංවර්ධන මාදිලිය භාවිතා කරමින් සිදුකෙරේ.

යෝජිත පුනරුත්ථාපන / වැඩි දියුණු කිරීමේ ව්‍යාපෘතිවල ආර්ථික ශක්‍යතාවය තහවුරු කිරීම සඳහා ශක්‍යතා අධ්‍යයන ක්‍රියාත්මක කරනු ලැබේ. නව ව්‍යාපෘති සම්බන්ධව ශක්‍යතා අධ්‍යයනයන්හිදී සියලු විකල්පයන් සැලකිල්ලට ගනු ලබයි. රථවාහන විශ්ලේෂණ ක්‍රියාත්මක කිරීමේදී ජජාසනි ගේ ස්ට්‍රාඩා පුරෝකථන මාදිලිය භාවිතා කර මාර්ගවල අනාගත රථවාහන තත්ත්වයන් පුරෝකථනය කරනු ලැබේ.

ව්‍යාපෘතිය ශක්‍යතාවයෙන් යුක්ත නම් හා ව්‍යාපෘතිය පාරිසරකමය වශයෙන් සංවේදී ප්‍රදේශය හරහා ක්‍රියාත්මක වන්නේ නම් මා.සං.අ. යේ පාරිසරික හා සමාජ සංවර්ධන අංශය විසින් ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමට පෙර, අදාල අධිකාරීන් වෙතින් පාරිසරික අනුමැතීන් ලබා ගැනීමට කටයුතු කරනු ලැබේ. මේ අතර, ව්‍යාපෘති සංකල්ප පත්‍රිකාවට රජයේ අනුමැතිය ලබා ගැනීම හා ජාතික සැලසුම් දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ. විදේශ අරමුදල් අවශ්‍ය කෙරෙන ව්‍යාපෘති සඳහා අරමුදල් අයදුම්පත් / ව්‍යාපෘති යෝජනා අරමුදල් සැපයුම පිළිබඳව ආ.සං.බැ., ජ.ජා.ස.නි., ලෝක බැංකුව, කො.ජා.සං.ආ., ඔපෙක්, යුරෝපීය සංගමය වැනි අරමුදල් ආයතන සමඟ ගිවිස ගැනීම සඳහා විදේශ සම්පත් දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කිරීම සඳහා පිළියෙල කරනු ලැබේ. ණය ගිවිස ගැනීම් වෙනුවෙන් අරමුදල් ආයතන සමඟ සම්බන්ධීකරණය හා විවිධ දූත කණ්ඩායම් සමඟ කටයුතු කිරීම හා ලේඛන පිළියෙල කිරීම මෙම ඒකකයට පවරා ඇති ප්‍රධාන කාර්ය භාරයක් වෙයි. ඊට අමතරව මෙම ඒකකය දැනටමත් ක්‍රියාත්මක කරන ලද ව්‍යාපෘති පශ්චාත් ඇගයීම් අධ්‍යයන ක්‍රියාවලියේදී විදේශ අරමුදල් දූත කණ්ඩායම් සමඟ සම්බන්ධීකරණය වෙයි. සැලසුම් අංශයේ මෙම ඒකකය විසින්, මාර්ග සංවර්ධන අධිකාරියේ වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම හා සංයුක්ත සැලැස්ම පිළියෙල කෙරේ. පළාත්භාර අධ්‍යක්ෂවරුන් හා වෙනත් අංශවල ප්‍රධානීන් සමඟ සාකච්ඡා කර ලබා ගන්නා තොරතුරු මත පදනම්ව සෑම වර්ෂයකම ආරම්භයේදී වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මට අනුව වැඩ සිදු කරනු ලැබේ. කෙසේ නමුත්, හදිසි අවශ්‍යතා සඳහා ප්‍රමුඛතාව ලබා දෙන අතර, මෙම අවශ්‍යතාවයට ඉඩ දෙනු සඳහා සෑම වර්ෂයකම මැදදී වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම සංශෝධනය කරනු ලැබේ. සංයුක්ත සැලැස්ම අවුරුදු 5 ක කාල පරිච්ඡේදයේ දිවෙන අතර පවත්නා වර්ෂය හා ඉතිරි කාල පරිච්ඡේදයට ඉඩ දෙනු සඳහා වාර්ෂිකව සමාලෝචනය කෙරේ. තවද මෙම ඒකකය සෑම වර්ෂයකම මාර්ග සංවර්ධන අධිකාරියේ සමස්ත කාර්ය සාධනය විස්තර කිරීම සඳහා මා.සං.අ. යේ වාර්ෂික වාර්තාව පිළියෙල කරනු ලැබේ. මහ බැංකුවේ වාර්ෂික වාර්තාව පිළියෙල කිරීම සඳහා මා.සං.අ. යේ වාර්ෂික වාර්තාව හා මා.සං.අ. යේ කාර්ය සාධන වාර්තාව සැකසීම සඳහා මහ බැංකුව වෙත යැවීම ඉන් කිහිපයකි. භූ විද්‍යා තොරතුරු පද්ධතිය යටතේ, ජාතික මාර්ග ජාලයට සම්බන්ධ

අවකාශ දත්ත සහිත පුළුල් දත්ත ගබඩාවක් නඩත්තු කරනු ලැබේ. විවිධ සිතියම් සම්පාදනය කිරීම සඳහා භූ තොරතුරු පද්ධති භාවිතා කරමින් නව මාර්ග අනු රේඛනයන් හඳුනා ගනු ලැබේ. අවශ්‍ය වන විට හා අවශ්‍ය පරිදි සියලුම මාර්ග ව්‍යාපෘති සඳහා භූ.තොරතුරු.ප. සිතියම් පිළියෙල කරනු ලැබේ. මා.සං.අ. වැඩ සඳහා අවශ්‍ය කෙරෙන අත්පොත් හා මාර්ගෝපදේශ, ප්‍රකාශයට පත් කිරීම ඒවා මා.සං.අ. යේ සේවකයන් අතර බෙදා හැරීම මෙහි වගකීම් යටතට ගැනේ.

3.10.1 වාර්තා ඉදිරිපත් කිරීම

2015 වර්ෂය තුල සැලසුම් අංශය පහත සඳහන් වාර්තා පිළියෙල කර ඉදිරිපත් කිරීමට කටයුතු කරන ලදි.

- අයවැය ප්‍රතිපාදන වලට අනුව 2015 ක්‍රියාකාරී සැලැස්ම පිළියෙල කර මා.සං.අ. යේ කළමනාකරණ මණ්ඩලය වෙත ඉදිරිපත් කරනු ලැබීය.

  වර්ෂය සඳහා සමස්ත අයවැය ප්‍රතිපාදන ප්‍රශස්ත ලෙස උපයෝජනය සඳහා මූල්‍ය රෙගුලාසි (FR) 66 ට අනුව අරමුදල් මාරු කිරීම සඳහා භාණ්ඩාගාරයෙන් අවශ්‍ය අනුමැතිය ලබා ගන්නා ලදි.
- 2015-2019 කාල සීමාව සඳහා සංයුක්ත සැලැස්ම යාවත් කාලීන කරනු ලැබීය.
- අමාත්‍යාංශය වෙත සියලුම ප්‍රගති වාර්තා ඉදිරිපත් කරන ලදි. (මාසික හා කාර්තුමය)
- මා.සං.අ. යේ කාර්ය සාධන වාර්තාව පිළියෙල කර මහ බැංකුව වෙත ඉදිරිපත් කරනු ලැබීය.
- ක්‍රියාත්මක වෙමින් පවතින හා නියම කරනු ලැබූ ව්‍යාපෘති ලැයිස්තු භූ.තොරතුරු.ප. සමඟ පිළියෙල කර අවශ්‍ය වූ විට කළමනාකාරිත්වයට ඉදිරිපත් කරන ලදි.
- මා.සං.අ. යේ 2014 වර්ෂයේ වාර්තාව පිළියෙල කරනු ලැබීය.

3.10.2 ව්‍යාපෘති යෝජනා පිළියෙල කිරීම.

විදේශ සම්පත් දෙපාර්තමේන්තුවට අවශ්‍ය වන පරිදි විවිධ අරමුදල් නියෝජිතායතන යටතේ පවතින ව්‍යාපෘති සම්බන්ධව පහත සඳහන් පරිදි අරමුදල් ප්‍රදාන අයදුම්පත් සඳහා ව්‍යාපෘති යෝජනා අයදුම්පත් පිළියෙල කිරීම.

ජ.ජා.ස.නි. සහාය.

- කිරුළපන හංදිය සිට කොළඹ - හොරණ මාර්ගය දක්වා බෙස්ලයින් මාර්ගය දිගු කිරීම අදියර 3 පිළිබඳ සැලසුම් සමාලෝචනය, ඉදිකිරීම හා ඉදිකිරීම් අධීක්ෂණ පිළිබඳ උපදේශක සේවා
- ශ්‍රී ලංකාවේ මාර්ග ජාලයේ තත්ත්වය නැංවීම සඳහා කෙටි කාලීන ජ.ජා.ස.නි. ස්ට්‍රාඩා මාදිලිය පිළිබඳ විශේෂඥවරයෙකු වෙනුවෙන් තාක්ෂණික සහයෝගිතාවය
- ජ.ජා.ස.නි.යේ ප්‍රධාන පාලම් ඉදිකිරීමේ වයාපෘතිය වෙනුවෙන් අතිරේක අරමුදල සඳහා ඉල්ලීම.

ආ.සං.ස.ආ. සහාය

- යෝජිත මහනුවර උමං මාර්ගය පිළිබඳ ශක්‍යතා අධ්‍යයනය සඳහා ව්‍යාපෘති පිළියෙල කිරීමේ සහාය.
- දැනුම බෙදා ගැනීමේ වේදිකාව - මහනුවර නගර ප්‍රවාහන ජාලය වැඩි දියුණු කිරීමේ ප්‍රතිපත්තිමය උපදේශනය

කො.ජා.ස.නි.

- ශ්‍රී ලංකාවේ නැණවත් ප්‍රවාහන පද්ධතියක් ස්ථාපිත කිරීම සඳහා මධ්‍ය සැලැස්ම සම්පාදනය

ආසියානු සංවර්ධන බැංකු (ආ.සං.බැ.) සහාය

- උස් කළ වරාය ප්‍රවේශ මාර්ගය ඉදිකිරීම.

3.10.3 විදේශ අරමුදල් සඳහා සංකල්ප පත්‍රිකා පිළියෙල කිරීම

මා.සං.අ. විසින් පහත සඳහන් ව්‍යාපෘති ජාලය සඳහා ජාතික සැලසුම් දෙපාර්තමේන්තුව වෙත සංකල්ප පත්‍රිකා ඉදිරිපත් කරනු ලැබිය.

- උස් කළ වරාය ප්‍රවේශ මාර්ගය ඉදිකිරීම
- බෙස්ලයින් මාර්ගයේ සිට රාජගිරිය දක්වා උස් කළ මාර්ගය ඉදි කිරීම
- ප්‍රංශ පාලම් ව්‍යාපෘතියේ ඉතුරුම් වලින් අතිරේක පාලම් තුනක් ඉදිකිරීම
- මීරිගම සිට කුරුණෑගල දක්වා මධ්‍යම අධිවේගී මාර්ගය සඳහා සූදානම් කිරීමේ කටයුතු සඳහා ආ.සං.බැ. වෙතින් අතිරේක අරමුදල් සඳහා ඉල්ලීම
- ගාල්ල - දෙනියාය - මාදම්පේ මාර්ගයේ (A017) දෙනියාය - රක්වාන කොටස පුළුල් කිරීම හා වැඩි දියුණු කිරීම

3.10.4 ශක්‍යතා හා රථවාහන අධ්‍යයන

- දක්ෂිණ මාර්ග සම්බන්ධතා ව්‍යාපෘතිය සඳහා රථවාහන අධ්‍යයනයන් සිදු කරන ලදි.
- පහත සඳහන් අධිවේගී මාර්ගයන් පිළිබඳව වෙනත් ආයතන විසින් සිදු කරන ලද ශක්‍යතා අධ්‍යයන සමාලෝචනය කරන ලදි.
    - මධ්‍යම අධිවේගී මාර්ග ව්‍යාපෘතිය
    - යෝජිත රුවන්පුර අධිවේගී මාර්ග ව්‍යාපෘතිය
- ජාතික මාර්ගවල වර්තමාන හා අනාගත රථවාහන පිළිබඳ තක්සේරු කිරීම සඳහා සාර්ව ආදර්ශ ආකෘති (ජජාසනී - ස්ට්‍රාඩා) යාවත්කාලීන කර භාවිතා කරන ලදි.

3.10.5 අධිප්‍රමාණ / අධිබර වාහන සඳහා විශේෂ බලපත්‍ර නිකුත් කිරීම.

- අධි මානයන්ගෙන් යුත්, භාණ්ඩ ප්‍රවාහනය කිරීම සඳහා අයදුම්පත්, ඇගයීමට ලක්කර බලපත්‍ර ලිපි නිකුත් කරන ලදි.
- අධි ප්‍රාමාණික වාහන තිස් දෙකක් ලියා පදිංචිය සඳහා නිර්දේශ කිරීම.
- වාහන ට්‍රේලර් නිෂ්පාදන සමාගම්වලට ජාතික මාර්ගවල බරවාහන ප්‍රවාහනය සඳහා නව ඇක්සල් ආකෘති ලක්ෂණ සහිතව වාහන නිපදවීම සඳහා මාර්ගෝපදේශ ලබා දෙනු ලැබීය.

3.10.7 භූ.තොර.ප. කාර්යයන්.

භූගෝලීය තොරතුරු පද්ධති ඒකකය යටතේ, ජාතික මාර්ග ජාලයට සම්බන්ධව මිනුම් දෙපාර්තමේන්තුවේ ආර්ක් (ජීඅයිඑස්) 10.2 හා 1:50000 පරිමාණයේ ඩිජිටල් ස්ථර භාවිතා කර භූ-අවකාශ දත්ත ගබඩාව වර්ධනය කර නඩත්තු කරනු ලැබීය. මූලිකව ඊට මාර්ග සම්බන්ධතා දත්ත, මාර්ග ව්‍යාපෘති විස්තර, අධිවේගී මාර්ග ජාලය, වා.දෛ.ර. හා ඇක්සල් බර සමීක්ෂණ ස්ථාන, සංඥාපිත මංසන්ධිවල පරිපාලන විස්තර (වි.ඉ., ප්‍ර.ඉ., ප.හා.අ. ආදිය) ඇතුළත් වේ. එය ජාතික මහාමාර්ග වලට සම්බන්ධ අංශය භූ.තොර.ප. දත්ත සපයමින්, වෙනත් මාර්ග දත්ත ගබඩා සමඟ (මා.සං.ක.-4, ස්ට්‍රාඩා) සහයෝගී විය.

2015 වර්ෂය තුළ, භූ.තොර.ප. විසින්, ව්‍යාපෘති යෝජනා, අරමුදල් අයදුම්පත්, ශක්‍යතා වාර්තා ගැසට් යන සැලසුම් අංශයට මෙන්ම ව්‍යාපෘති ආවේක්ෂණ ඒකකවලට අදාල සහ විශ්ව විද්‍යාල, උසස් අධ්‍යාපන හා මහාමාර්ග අමාත්‍යාංශය මා.සං.අ. යේ වෙනත් අංශ හා බාහිර ආයතන ජාතික මාර්ග ජාලය සම්බන්ධයෙන් වාර්තා 200ට අධික ස්ථාන සිතියම් හා විස්තරාත්මක සිතියම් පිළියෙල කරන ලදි.

2015 වර්ෂයේදී භූ.තොර.ඒ. විසින් පවත්නා හා යෝජිත මාර්ග පාලම් මාර්ග හා විකල්ප මාර්ග සඳහා ක්ෂේත්‍ර පරීක්ෂා සමඟ භූ.ස්.ස. සමීක්ෂණ ගණනාවක් සිදු කරන ලදි. එමෙන්ම භූ.තොර.ප. ඒකකය විසින්, ප්‍රශස්ත මාර්ග හා අතුරු මාර්ග හඳුනා ගැනීම මෙන්ම මාර්ග පුනරුත්ථාපනය හා ඉදි කිරීමේදී නියෝජිත මාර්ග හඳුනා ගැනීම සඳහා තීරණ ගැනීමට මහාමාර්ග ඉංජිනේරුවරුන්ට පහසුකම් සපයන ලදි.

තවද භූ.තොර.ප. ශ්‍රී ලංකා මාර්ග වත්කම් කළමනාකරණ පද්ධතියේ භූ.තොර.ප. සර්වරය හා භූ.තොර. ආදර්ශනය සඳහා ඇගයීම් කිරීමට හා පුහුණු කිරීමට ඉන්දියානු උපදේශ කණ්ඩායම සමඟ සම්බන්ධීකරණය කරන ලදි.

මීට අමතරව, භූ.තොර.ප. ලංකාව පුරා පවත්නා මාර්ග ජාලය 1:50,000 පරිමාණයට යාවත්කාලීන කිරීමට මිනුම් දෙපාර්තමේන්තුව සමඟ සහයෝගීව කටයුතු කරනු ලැබීය.

3.11 ශ්‍රී ලංකාව සඳහා රථවාහන පුරෝකථන මාදිලිය

ශ්‍රී ලංකාව සඳහා රථවාහන පුරෝකථන මාදිලිය සැලසුම් අංශයේ සැලසුම්කරණ, සූත්‍රකරණ, වැඩ සටහන්කරණ ප්‍රගති ආවේක්ෂණ හා භූ.තොර.ප. ඒකකය (P2) යටතේ ක්‍රියාත්මක කෙරේ.

සැලසුම්කරණ ක්‍රියාවලියේදී ජාතික මාර්ග පද්ධතියේ රථවාහන පුරෝකථනය වැදගත් වෙයි. රථවාහන පිළිබඳව රටේ අනාගත සංවර්ධන සැලසුම් සැලකිල්ලට ගෙන රථවාහන පුරෝකථන මාදිලිය භාවිතයට ගනිමින් සිදු කරන අතර, සැලසුම් අංශයේ PII ඒකකය විසින් ක්‍රියාත්මක කරනු ලබන ප්‍රවාහනයට සම්බන්ධ අධ්‍යයනයන් සඳහා මෙම දත්තයන් යොදා ගනු ලබයි. තවද මෙම ඒකකය ජාතික මාර්ග ජාලයේ තත්ත්වයන් හා වෙනත් ලක්ෂණ සම්බන්ධයෙන් විස්තීර්ණ දත්ත ගබඩාව නඩත්තු කරන අතර, මෙම දත්ත වෙනත් ආයතනවලට ඔවුන්ගේ ඉල්ලීම මත ලබා දෙනු ඇත.

3.11.1 රථවාහන පුරෝකථන මාදිලියක් සම්පාදනය කිරීම

ජාතික මාර්ග ජාලයේ රථවාහන ඉල්ලුම පිළිබඳ මාදිලියන් සම්පාදනය කිරීමට (ජජාසනි - ස්ට්‍රාඩා) ජ.ජා.ස.නි. සහිතව මා.සං.අ. යේ සැලසුම් අංශය විසින් මූලිකත්වය ගන්නා ලදි. මෙම ඉල්ලුම පුරෝකථන පද්ධතිය ශ්‍රී ලංකාවේ සියලු ඒ හා බී පංති මාර්ග හා අධිවේගී මාර්ග ආවරණය කරනු ලබයි. මෙම පද්ධතියේ ප්‍රධාන ලක්ෂණ පහත දැක්වෙන පරිදි සාරාංශ කළ හැකිය:

අ)	වර්තමාන මාර්ග ජාලය :	පුරෝකථන මාදිලිය ශ්‍රී ලංකාවේ ඒ, ඒබී හා බී පංතියේ ජාතික මාර්ග හා අධිවේගී මාර්ග (දළ වශයෙන් සම්බන්ධතා 2300 කි)
ආ)	කළාපකරණය :	කළාප 314 (ප්‍රා.ලේ.කොට්ඨාශ)
ඇ)	වාහන වර්ගය :	සියලුම වර්ගවල වාහන පස් වර්ගයක් ලෙස දිස්වෙයි. (ඒකක පදනම)
ඈ)	වර්තමාන මූ.ග. :	2007 මහාමාර්ග මධ්‍ය සැලැස්මේ විස්තර කර ඇති දිස්ත්‍රික් පදනම ටෙ.ඉ. තක්සේරු කළ අතර, 2010 ජනවාරි මාසයේදී නියැදි ටෙ.ඉ. සම්මුඛ සාකච්ඡා සමීක්ෂණ පවත්වන ලදි.
ඉ)	පැවරුම් ක්‍රමය :	භාවිතකරු තුලන පැවරුම් ක්‍රමය
ඊ)	පුරෝකථනය කළ වර්ෂය :	වර්ෂ 2012, 2017, 2022, 2027, 2032 සහ 2037

3.12 මාර්ග තත්ත්ව දත්ත රැස් කිරීම හා ඇගයීම

2012 වර්ෂයේ සැලසුම් අංශයේ, සැලසුම්කරණ, සූත්‍රකරණ, වැඩ සටහන්කරණ, ප්‍රගති සමාලෝචන හා භූ.තොා.ප. ඒකකය (P2) යටතේ පිහිටුවන ලද දත්ත සැලසුම් ඒකකය විසින් මාර්ග තත්ත්ව දත්ත රැස් කිරීම හා ඇගයීම සිදු කරන ලදි.

"ආසියාවේ ආශ්චර්යය", මාවත යන ශ්‍රී ලංකාවේ දැක්මට අනුව රටේ යටිතල ව්‍යුහයේ සංවර්ධනය එහි පරමාර්ථ ඉටුකර ගැනීම සඳහා අවශ්‍ය වෙයි. ශ්‍රී ලංකාවේ පෙර සිට බලපවත්නා මාර්ග ප්‍රවාහන පද්ධතිය මනා මෙහෙයුම් වේගය, අඩු ගමනාගමන කාලය, යටිතල ව්‍යුහවල මනා තත්ත්වය හා ප්‍රමාණවත් ධාරිතාව සහිතව සැහීමකට පත්විය හැකි ලෙස ඉහළ නැංවීම අවශ්‍ය කෙරේ. මෙම අරමුණු ජය ගැනීමට, වර්තමාන මාර්ග ජාලයේ චිත්‍රය අදාල මාර්ග දත්ත එකතු කර ගණනය කළ යුතු වේ. මෙම කාර්ය සාධනය කිරීම සඳහා සැලසුම් අංශය යටතේ ද.සැ.ඒ. පිහිටුවන ලදි.

ද.සැ.ඒ. ලෝක බැංකු ආධාර මාර්ග අංශ සහායක ව්‍යාපෘතිය යටතේ ලැබුණු බහුකාර්ය ජාල සමීක්ෂණ රථය හා පතිත බර උත්ක්‍රමණ මීටරය භාවිතා කර මාර්ග තත්ත්ව දත්ත රැස්කරන අතර, උපාය සැලසුම්කරණ, වැඩ සටහන්කරණ හා මහාමාර්ග ව්‍යාපෘති කළමනාකරණ ක්‍රියාවලිය තුළ නිමවුම් සඳහා මහාමාර්ග සංවර්ධන හා කළමනාකරණ (HDM – 4) මෘදුකාංග සම්පාදනය කරන ලදි. තවද එකතු කරන ලද දත්ත භාවිතා කර මාර්ග පුනරුත්ථාපනයේදී අදාල ක්ෂේත්‍රය හඳුනා ගැනීමට මහාමාර්ග තොරතුරු කළමනාකරණ පද්ධතිය (HIMS) හා මාර්ග තොරතුරු පද්ධතිය (RIS) නඩත්තු කරනු ලැබීය.


3.12.1 බහුකාර්ය ජාල සමීක්ෂණ රථය හා පතිත බර උත්ක්‍රමණ මීටරය.

වගු අංක 27: සමීක්ෂණ ප්‍රගතිය - බ.කා.ජා.ස.ර. හා ප.බ.උ.මී.


සමීක්ෂණ වර්ගය	සමීක්ෂණය කළ දුර (මංතීරු කි.මී.)	ජාලය (කි.මී.)	ව්‍යාපෘතිය (මංතීරු කි.මී.)	අධිවේගී මාර්ගයේ (මංතීරු කි.මී.)
බ.කා.ජා.ස.ර.	12051	5320.670	1395.98	1352(STDP/OCH/CKE)
ප.බ.උ.මී.	3839	1673.235	841.203	-

බහුකාර්ය ජාල සමීක්ෂණ රථය හා පතිත බර උත්ක්‍රමණ මීටරය යොදා ගනිමින්, දත්ත රැස් කිරීම දත්ත සැකසීමේ ඒකකය විසින් සිදු කරන ලදි.

සිතියම 4: බකාජාසර.යේ සමීක්ෂණ ප්‍රගතිය-2015



සිතියම 5: පබඋම් යේ සමීක්ෂණ ප්‍රගතිය - 2015



වගු අංක 28: බකාජාසර හා පබඋම් යේ 2015 වර්ෂයේ ආදායම

සමීක්ෂණ වර්ගය	ඉන්වොයිස් අංකය.	ඉල්ලා සිටින ලද්දේ	මුදල (රු.)
පබඋම්	RDA/P/FWD/114/15	ව්‍යාපෘති අධ්‍යක්ෂ (පි.ව.මා.ඉ.)	1,000,000.00
පබඋම්	RDA/P/FWD/115/15	ව්‍යාපෘති අධ්‍යක්ෂ (පි.ව.මා.ඉ.)	200,000.00
පබඋම්	RDA/P/FWD/116/15	ව්‍යාපෘති අධ්‍යක්ෂ (ද.මා.සං.ව්‍යා.)	3,300,000.00
බකාජාසර	RDA/P/MFNSV/115/15	ව්‍යාපෘති අධ්‍යක්ෂ (වි.වි.ආ.ව්‍යා.)	175,000.00
බකාජාසර	RDA/P/MFNSV/116/15	ව්‍යාපෘති අධ්‍යක්ෂ (පි.ව.මා.ඉ.)	525,000.00
බකාජාසර	RDA/P/MFNSV/117/15	ව්‍යාපෘති අධ්‍යක්ෂ (පි.ව.මා.- අදියර II)	175,000.00
බකාජාසර	RDA/P/MFNSV/118/15	ව්‍යාපෘති අධ්‍යක්ෂ (මා.අ.ස.ව්‍යා.)	175,000.00
බකාජාසර	RDA/P/MFNSV/119/15	ව්‍යාපෘති අධ්‍යක්ෂ (පි.ව.මා.- අදියර II)	175,000.00
බකාජාසර	RDA/P/MFNSV/120/15	ව්‍යාපෘති අධ්‍යක්ෂ (මා.අ.ස.ව්‍යා.)	175,000.00
බකාජාසර	RDA/P/MFNSV/123/15	ව්‍යාපෘති අධ්‍යක්ෂ (පි.ව.මා.ඉ.)	175,000.00

සමීක්ෂණ වර්ගය	ඉන්වොයිස් අංකය.	ඉල්ලා සිටින ලද්දේ	මුදල (රු.)
බකාජාසර	RDA/P/MFNSV/121/15	ව්‍යාපෘති අධ්‍යක්ෂ (පි.ව.මා.- අදියර II)	175,000.00
බකාජාසර	RDA/P/MFNSV/122/15	ව්‍යාපෘති අධ්‍යක්ෂ (පි.ව.මා.- අදියර II)	175,000.00
බකාජාසර	RDA/P/MFNSV/124/15	ව්‍යාපෘති අධ්‍යක්ෂ (උ.මා.ස.ව්‍යා.)	175,000.00
බකාජාසර	RDA/P/MFNSV/125/15	ව්‍යාපෘති අධ්‍යක්ෂ (ද.ප්‍ර.සං.ව්‍යා-අ.ස.වැ.ව්‍යා.)	700,000.00

2015 සඳහා සමස්ත ආදායම	=	**Rs. 7,300,000.00**
2014 සඳහා සමස්ත ආදායම	=	Rs. 9,680,000.00
2015.12.31 දක්වා සමස්ත ආදායම	=	**Rs. 16,980,000.00**

3.12.1.1 බකාජාසරය දත්ත සැකසුම් හා රළුකම් පිළිබඳව නිකුත් කළ දත්ත

- සමීක්ෂණය කරන ලද මාර්ග / කොටස්වල රළුකම් දත්ත සැකසීම නිම කෙරිණි.
- බ.කා.ජා.ස.ර. සමීක්ෂණය කරන ලද දක්ෂිණ අධිවේගි මාර්ගයේ දත්ත සැකසීම හා විශ්ලේෂණය.
- ඇතුල්කෝට්ටේ - කොහුවල - මිරිහාන (B120) මාර්ගයේ (කි.මී. 0+000 සිට 5+950 දක්වා) බ.කා.ජා.ස.ර. යේ සමීක්ෂණ වාර්තාව.
- පැලියගොඩ - පුත්තලම මාර්ගයේ (A3) (සීදුව සිට පුත්තලම දක්වා), කොළඹ - රත්නපුර - වැල්ලවාය - මඩකලපුව (A4) මාර්ගයේ බ.කා.ජා.ස.ර. යේ සමීක්ෂණ වාර්තාව (අවිස්සාවේල්ල සිට පැල්මඩුල්ල) සහ පැල්මඩුල්ල - ඇඹිලිපිටිය - රත්නපුර (A18) මාර්ගයේ (පැල්මඩුල්ල සිට පදලංගල දක්වා) බකාජාසර සමීක්ෂණ දත්ත.
- පි.ව.මා. අදියර II (කඩුවෙල සිට කඩවත දක්වා) බ.කා.ජා.ස.ර. සමීක්ෂණ වාර්තාව.
- පැලියගොඩ - පුත්තලම (A3) මාර්ගයේ (පැලියගොඩ සිට ජාඇල දක්වා) බ.කා.ජා.ස.ර. සමීක්ෂණ වාර්තාව.
- පි.ව.මා. අදියර II උතුරු කොටසේ බ.කා.ජා.ස.ර. සමීක්ෂණ (කඩුවෙල සිට කඩවත දක්වා) බ.කා.ජා.ස.ර. යේ සමීක්ෂණ වාර්තාව.
- කොළඹ - ගාල්ල - හම්බන්තොට - මඩකලපුව (A2) මාර්ගයේ බ.කා.ජා.ස.ර. සමීක්ෂණය (මැලිබන් හංදිය සිට නල්ලුරුව හංදිය දක්වා).
- පැලියගොඩ - පුත්තලම (A3) මාර්ගයේ බ.කා.ජා.ස.ර. සමීක්ෂණය (පැලියගොඩ සිට කි.මී. 32+500 දක්වා)

- පි.ව.මා. අදියර II බ.කා.ජා.ස.ර. සමීක්ෂණය (කි.මී. 16+140 සිට 17+500 දක්වා).
- පි.ව.මා. II වන අදියර (කි.මී. 10+000 සිට 18+000 දක්වා) බ.කා.ජා.ස.ර. සමීක්ෂණ වාර්තාව.
- වවුනියා - හොරොව්පතාන (A029) මාර්ගයේ (කි.මී. 24+000 සිට 34+950 දක්වා) බ.කා.ජා.ස.ර. සමීක්ෂණ වාර්තාව.
- ද.මා.ස.ව්‍යා. / අ.මා.වැ.ව්‍යා. (දක්ෂිණ මාර්ග සම්බන්ධතා ව්‍යාපෘතිය / අධිවේගී මාර්ග සම්බන්ධතා වැඩි දියුණු සැලැස්ම) යටතේ මා.සං.අ. යේ මාර්ග කොටස් 17 ක් හා ප.මා.සං.අ. යේ මාර්ග කොටස් 13 ක් පිළිබඳ බ.කා.ජා.ස.ර. සමීක්ෂණය. (සමස්ත දිග කි.මී. 250.88).

3.12.1.2 බ.කා.ජා.ස.ර. යේ දසුන් විශ්ලේෂණ වැඩ

- පවත්නා මහාමාර්ග තොරතුරුවල කළමනාකරණ පද්ධතිය (HIMS) තත්ත්වය නැංවීම සඳහා කි.මී. 1200 ක නියැදි (මී. 100 ක විරාම සහිතව) බ.කා.ජා.ස.ර. දසුන් විශලේෂණය කරන ලදි.
- කි.මී. 6950 (ජාලය) තත්ත්වමය දත්ත සඳහා දසුන් විශ්ලේෂණය නිම කරනු ලැබීය.

3.12.1.3 ප.බ.ළ. දත්ත වාර්තා.

- පැලියගොඩ - පුත්තලම (A3) මාර්ගයේ (සීදුව සිට පුත්තලම), කොළඹ - රත්නපුර -වැල්ලවාය - මඩකලපුව (A4) මාර්ගයේ (අවිස්සාවේල්ල සිට පැල්මඩුල්ල) හා පැල්මඩුල්ල - ඇඹිලිපිටිය - රත්නපුර (A18) මාර්ගයේ (පැල්මඩුල්ල සිට පදලංගල දක්වා) ප.බ.ළ.මී. දත්ත.
- පැලියගොඩ - පුත්තලම (A3) මාර්ගයේ (පැලියගොඩ සිට කි.මී. 32+500) ප.බ.ළ.මී. දත්ත.
- ද.මා.ස.ව්‍යා. / අ.මා.සං.ව්‍යා. (දකුණු මාර්ග සම්බන්ධතා ව්‍යාපෘතිය / අධිවේගී මාර්ග සම්බන්ධතා වැඩි දියුණු කිරීමේ සැලැස්ම) යටතේ මා.සං.අ. යේ මාර්ග කොටස් 17 ක් හා ප.මා.සං.අ. යේ මාර්ග කොටස් 13 ක් පිළිබඳ ප.බ.ළ.මී. සමීක්ෂණය (සමස්ත දිග කි.මී. 250.88 කි).

3.12.1.4 ප.බ.ළ.මී. දත්ත පදනම් වූ මතු ඇතුරුම් සැලසුම් වාර්තා

- කටුනායක - වේයන්ගොඩ (B208) මාර්ගයේ (කි.මී. 0+000 සිට 9+500 දක්වා) මතු ඇතුරුම් සැලසුම්.

3.12.1.5 ප.බ.ඵ.මී. වාර්ෂික සේවා චාරිකා.

කොන්ත්‍රාත් ගිවිසුමට අනුව, මා.සං.අ. සමඟ එකඟ වූ පරිදි සැපයුම්කරු විසින් යන්ත්‍රයේ නඩත්තුව හා අළුත්වැඩියාව සිදු කළ යුතු වේ. ස්විඩනයේ කේ.යු.ඒ.බී. සමාගමේ විශේෂඥයා ශ්‍රී ලංකාවට පැමිණි අතර, ඔහු විසින් අපගේ කාර්ය මණ්ඩලය සමඟ ප.බ.ඵ. යන්ත්‍රයේ ක්‍රමාංකනය, නඩත්තුව හා අළුත්වැඩියා කටයුතු සිදු කරන ලදි.

වගු අංක 29: ප.බ.ඵ.මී. නඩත්තු හා අළුත්වැඩියාවන්.

යන්ත්‍රයේ වර්ගය	*දිනය*	*සිදුකළ වැඩ*	*විශේෂඥයාගේ නම*	*සමාගමේ නම*
ප.බ.ඵ.මී	23.08.2015 සිට 02.09.2015	(අ) ප.බ.ඵ.මී. පූර්ණ පරීක්ෂාවට ලක් කර අවශ්‍ය නඩත්තු සිදු කරන ලදි. (ආ) සෙයිස්මෝ මීටරය පරීක්ෂා කර රබර් පරිමන්දක ප්‍රතිසම්පාදනය කරනු ලැබීය. (ඇ) පූර්ණ යන්ත්‍ර ක්‍රමාංකනය සිදු කරන ලදි. (ඈ) ප.බ.ඵ.මී. ද්‍රව පද්ධතිය හා යන්ත්‍රය හා පරිගණකය අතර සම්බන්ධය අළුත්වැඩියා කරන ලදි.	ඇෆ්ෂින් ලොට්හි මහතා	කේ.යු.ඒ.බී. සමාගම, ස්වීඩනය.

3.12.1.6 බහුකාර්ය ජාල සමීක්ෂණ රථයේ හා පතිත බර උත්ක්‍රමණ මීටරයේ වාර්ෂික නඩත්තු කොන්ත්‍රාත්තුව දීර්ඝ කිරීම.

- බ.කා.ජා.ස.ර. හා ප.බ.ඵ.මා 2010 වර්ෂයේදී ලෝක බැංකු අරමුදල් සැපයූ මාර්ග අංශ සහායක ව්‍යාපෘතිය යටතේ (කොන්ත්‍රාත් යෝජනාවලි -14) මිලදී ගන්නා ලදි.
- යන්ත්‍ර සැපයීමෙන් පසුව අවුරුදු 5 ක කාලයක් සඳහා වාර්ෂික නඩත්තු කොන්ත්‍රාත් ගිවිසුම් 2 ක් තුළට ඇතුළත් කරන ලදි. ඒ අනුව ලෝක බැංකු අරමුදල් සැපයූ මාර්ග අංශ සහායක ව්‍යාපෘතිය මඟින්, වාර්ෂික නඩත්තු ගාස්තු ගෙවීමෙන් පසුව ඔවුන්ගේ සේවය ලබා ගැණිනි.
- නඩත්තු කොන්ත්‍රාත්තුව 2015 ජූලි මාසයේදී අවසන් විය.
- එබැවින් මෙම යන්ත්‍ර දෙක සඳහා එකම සමාගමෙන් තවත් අවුරුදු 5 ක කාලයක් සඳහා නඩත්තු ගිවිසුම දීර්ඝ කිරීමට අධ්‍යක්ෂ ජනරාල්ගේ අනුමැතිය ලබා මිල ගණන් කැඳවනු ලැබීය. තාක්ෂණික ඇගයීම් වාර්තා සමඟ කෙටුම්පත් ගිවිසුම් දෙකක් පිළියෙල කරන ලදි.

3.12.2 මාර්ග සංවර්ධන හා කළමනාකරණ පද්ධතිය (HDM – 4) හා මාර්ග තොරතුරු පද්ධතිය යටතේ (RIS) මාර්ග සංවර්ධන හා කළමනාකරණ -4 තොරතුරු කළමනාකරණ පද්ධතිය (HIMS) යොදා ගනිමින් ක්‍රියාත්මක කරන ලද වැඩ.

3.12.2.1 මහාමාර්ග සංවර්ධන හා කළමනාකරණ (HDM – 4) යටතේ ඉටුකරන ලද වැඩ.

- පවත්නා මහාමාර්ග තොරතුරු කළමනාකරණ පද්ධති (HIMS) තත්ත්වය නැංවීම සඳහා උපදේශනය ලෝක බැංකු අරමුදල් සපයන මා.අ.ස.ව්‍යා. යටතේ, නවසීලන්තයේ HIMS සමාගමේ අනුබද්ධ සමාගමක් වන ඉන්දියානු සාට්‍රා යටිතල ව්‍යුහ කළමනාකරණ සේවා පුද්. සමාගම විසින් 2015 ජුනි මස අග දක්වා අඛන්ඩව සිදු කරගෙන යන ලදි.

  මෙම පද්ධතිය ශ්‍රී ලංකා මාර්ග වත්කම් කළමනාකරණ පද්ධති **(SLRAMS)** යනුවෙන් නම් කරන ලදි. එය සියලු මාර්ග වලට සම්බන්ධ පාදිකාව, බෑවුම්, මාර්ග දෙපස මාර්ග භාණ්ඩ, පාලම් හා භූ.තොා.ප. සම්බන්ධ වෙබ් අඩවිය පදනම් වූ විස්තීර්ණ බහුවිධ භාවිතාකරණයකි. මෙම පද්ධතිය ඉක්ටා (ශ්‍රී ලංකා තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ නියෝජිතායතනය) ට අයත් අතථ්‍ය සර්වරය මගින් පහසුකම් සලසා ඇත. .

- පද්ධතිය තුල පහත් සඳහන් ඒකක ඇතුළත් වේ:
  (1) මාර්ග තොරතුරු පද්ධතිය (RIS);
  (2) ස්ථාන යොමුවීම් කළමනාකරණ පද්ධතිය (LRMS);
  (3) පාදිකා කළමනාකරණ පද්ධතිය (PMS);
  (4) පාලම් කළමනාකරණ පද්ධතිය (BMS);
  (5) දෛනික නඩත්තු කළමනාකරණ පද්ධතිය (RMMS);
  (6) රථවාහන තොරතුරු පද්ධතිය (TIS);
  (7) හදිසි තොරතුරු කළමනාකරණ තොරතුරු පද්ධතිය (CIMS);
  (8) භාණ්ඩ කළමනාකරණ පද්ධතිය (FMS);
  (9) බෑවුම් කළමනාකරණ පද්ධතිය (SMS);
  (10) ආපදා සැලසුම් පද්ධතිය (DPS).
  (11) පද්ධති පරිපාලන ඒකකය
  (12) භූ.තොා.ප. ඒකකය

- මෙම උපදේශකත්වය යටතේ පහත දැක්වෙන වාර්තා පිළියෙල කරන ලදි.

- ආරම්භක වාර්තාව
- දෘඩාංග හා මෘදුකාංග පිළිබඳ වාර්තාව
- පද්ධති සැලසුම් හා භාණ්ඩ පිළිබඳ වාර්තාව
- එච්ඩිඑම් 4 ක්‍රමාංකනය
- අවසන් වාර්තාව

➢ ආරම්භක වාර්තාව හා පද්ධති සැලසුම් හා කාර්යාල භාණ්ඩ පිළිබඳව මා.සං.අ. යේ කළමනාකාරිත්වය හා සෙත්සිරිපාය මා.සං.අ. පර්ශ්‍රයේ කාර්ය මණ්ඩලය වෙත ගෙන හැර දැක්වීම් දෙකක් සිදු කරන ලදි.

➢ මා.සං.අ.විසින් නම් කරන ලද නියෝජ්‍ය අධ්‍යක්ෂවරුන්, ප්‍රධාන ඉංජිනේරුවරුන්, ඉංජිනේරුවන්, දත්ත ගබඩා පාලකයන් හා භූ.තොා.ප. විශ්ලේෂකයන් හා ප්‍රවාහන පද්ධති විශ්ලේෂකයන් ඇතුළු කාර්ය මණ්ඩලයේ 20 ක කණ්ඩායමක් පද්ධතිය පිළිබඳව පුහුණු කරන ලදි.

➢ සැලසුම් අංශයේ දත්ත සැකසුම් ඒකකය විසින් උපදේශකයන්ට බොහෝ මාර්ග වලින් සහාය වෙයි.

- පද්ධතියේ අවශ්‍යතාවට අනුව ජාතික මාර්ග ජාලයේ විවිධ වර්ගවල දත්ත සැපයුම (භූ විද්‍යා සම්බන්ධීකාරකයන්, මාර්ග ජ්‍යාමිතික දත්ත, මාර්ග රළුකම්, මාර්ග තත්ත්වය, මාර්ග උත්ක්‍රමණ දත්ත ආදිය)
- පළාත් කාර්ය මණ්ඩලය වෙනත් අංශ වැනි විවිධ පාර්ශවයන් සමඟ සමස්ත සම්බන්ධීකරණය (කළමනාකරණ හා අධිවේගී නඩත්තු ඒකකය, පාරිසරික සේවා අංශය, මා.අ.ස.ව්‍යා.), තොා.ස.තා.නි. කාර්ය මණ්ඩලය.
- අවශ්‍ය වූ විට උපදේශකයන්ට වීසා අනුමැතිය ලබා ගැනීමේ ක්‍රියාවලිය සඳහා සහාය දීම.
- තාක්ෂණික කමිටු රැස්වීම්, පරිගණක ගෙන හැර දැක්වීම් හා වැඩමුළු සංවිධානය කිරීම.

➢ මා.සං.අ. යේ සැලසුම් අංශයේ දත්ත සැකසුම් ඒකකය විසින්, 2015 ජූනි 18 දින, ශ්‍රී ලංකාවේ මාර්ග වත්කම් කළමනාකරණ පද්ධතිය අදාල නිලධාරීන්ට සෘජු පළපුරුද්දක් ලබා ගැනීම පිළිබඳව වැඩ මුළුවක් සංවිධානය කරන ලදි. උපදේශකයන් විසින්, පූර්ණ ක්‍රියාකාරී පද්ධතිය පිළිබඳව සජීවී නිරූපණයන් ඉදිරිපත් කරනු ලැබීය.



ශ්‍රී ලංකා වත්කම් කළමනාකරණ පද්ධතිය පිළිබඳව එක් දින වැඩ මුළුව 2015 ජූනි 18

3.12.2.2 එච්ඩිඑම්-4 හා සම්බන්ධිත වැඩ.

- ලෝක බැංකු අරමුදල් සැපයූ මා.අ.ස.ව්‍යා. යටතේ උපදේශකවරයෙකු විසින්, 2015 අගෝස්තු මස දත්ත රැස් කිරීමේ අත්පොත් සමාලෝචනය කිරීමේ උපදේශකත්වය නිම කරන ලදි.

- මා.සං.අ. යේ සෙත්සිරිපාය පරිශ්‍රයේදි මා.සං.අ. යේ කළමනාකාරිත්වය හා ප්‍රමුඛ කාර්ය මණ්ඩලයට ආරම්භක වාර්තාව හා අවසන් වාර්තා පිළිබඳ පරිගණකය ගෙන හැර දැක්වීමක් පවත්වන ලදි.

- අධිවේගි මාර්ග සම්බන්ධතා වැඩි දියුණු සැලසුම යටතේ උපදේශකයන් විසින් සිදු කරන ලද ආර්ථික විශ්ලේෂණ සමාලෝචනය කරනු ලැබීය.

- ප්‍රවාහන සම්බන්ධතා හා වත්කම් කළමනාකරණ ව්‍යාපෘතියේ විවිධ අංශ පිළිබඳව කටයුතුවල නිරත විය.

3.12.2.3 වෙනත් කරුණු.

- 2015 නොවැම්බර් මස සැලසුම් අංශය තුළ මහාමාර්ග තොරතුරු හා සංවර්ධන කළමනාකරණ පද්ධති අංශය යනුවෙන්, මාර්ග තත්ත්ව දත්ත රැස් කිරීම, HIMS හා HDM-4 මෘදුකාංග මගින්, දත්ත සැකසුම් කිරීම හා විශ්ලේෂණය කිරීම යන කාර්යයන් ඒකාබද්ධ කර නව අංශය පිහිටුවන ලදි.

3.13 රථවාහන දත්ත රැස් කිරීම

රථවාහන දත්ත රැස් කිරීම සැලසුම් අංශයේ දත්ත රැස් කිරීමේ හා ඇගයීම් ඒකකයට අයත් වේ. P1 උප අංශය අධ්‍යක්ෂවරයා යටතේ නියෝජ්‍ය අධ්‍යක්ෂවරයෙකු විසින් ප්‍රධානත්වය දරයි. අතිරේක අධ්‍යක්ෂ ජනරාල් හා අධ්‍යක්ෂ සැලසුම් විසින්, නියෝජ්‍ය අධ්‍යක්ෂවරයාගේ හා සහාය කාර්ය මණ්ඩලයේ සහයෝගය සහිතව අධ්‍යක්ෂ ජනරාල්වරයාට වෘත්තීය සහාය ලබා දෙයි.

මා.සං.අ. යේ සැලසුම් කාර්ය සඳහා රථවාහන දත්ත අත්‍යාවශ්‍ය යෙදවුමක් වේ. සැලසුම් අංශයේ උප අංශයක් වන දත්ත රැස් කිරීමේ හා ඇගයීමේ ඒකකය වෙත, රථවාහන දත්ත රැස්කිරීමේ නඩත්තු කිරීමේ හා මා.සං.අ. යේ රථවාහන දත්ත ගබඩාව නඩත්තු කිරීමේ වගකීම පවරා ඇත.


රථවාහන දත්ත, වාර්ෂික වැඩ සටහනට අනුව වර්ෂය පුරා රැස්කරනු ලබේ. දිනපතා සාමාන්‍ය රථවාහන ධාරිතාව, මිනිස් රථවාහන වර්ගීකරණ සංගණනය හා ඇක්සල් බර සංගණනය දෛනිකව සිදු කරනු ලැබේ. දෛනික වාර්ෂික සාමාන්‍ය රථවාහන හා මිනිස් රථවාහන වර්ගීකරණය සඳහා ස්ථිර ස්ථානයන් 190 ක්ද ඇක්සල් බර සමීක්ෂණ සඳහා තවත් ස්ථාන 28ක්ද හඳුනාගෙන තිබේ. ඉල්ලුම මත, හැරවුම් වලන (මංසන්ධිවල රථවාහන) සමීක්ෂණ, මුල් ස්ථාන සමීක්ෂණ, පදික සමීක්ෂණ, පෝලිම්වල දිග පිළිබඳ සමීක්ෂණ ආදිය ක්‍රියාත්මක කරනු ලැබේ.

3.13.1 2015 වර්ෂය සඳහා සමීක්ෂණ වැඩ සටහන පිළිබඳ සාරාංශය පහත දැක්වේ.

වගු අංක 30: 2015 වර්ෂය සඳහා රථවාහන ප්‍රමාණයකින් සමීක්ෂණ වැඩ සටහන පිළිබඳ සාරාංශය.

අංක	කාර්යය	මාසය												එකතුව
		ජනවාරි	පෙබරවාරි	මාර්තු	අප්‍රේල්	මැයි	ජූනි	ජූලි	අගෝස්තු	සැප්.	ඔක්.	නොවැ.	දෙසැ.	
1	දිනපතා සාමාන්‍ය රථවාහන ධාරිතාව	20	20	20	20	20	20	20	20	20	20	20	10	230
2	අත්කම් වර්ගීකරණ ගණනය	20	20	20	20	20	20	20	20	20	20	20	10	230
4	ඇක්සල් බර සමීක්ෂණ	1	1	1	1	1	1	1	1	1	1	1	1	12
5	හැරවුම් වලන සමීක්ෂණ	1	1	1	1	2	1	2	1	2	1	2	1	16
6	AA005 මාර්ගයේ 4 වැනි කි.මී. අසල වා.සා.දෙ.ර.වල මාසික විචලනය	1	1	1	1	1	1	1	1	1	1	1	1	12

3.13.1 සිතියම් අංක 6: රථවාහන සංඛ්‍යාව පිළිබඳව සමීක්ෂණ පැවැත්වූ ස්ථාන



3.13.2 2015 වර්ෂය තුල සිදුකළ රථවාහන සමීක්ෂණ පිළිබඳ සාරාංශය

වා.දෛ.ර. සමීක්ෂණ	165
වා.දෛ.ර. (මාසික විචලන සාධනය ආවේක්ෂණය කිරීම)	12
අත්කම් වර්ගීකරණ සංගණනය (MCC)	169
ඇක්සල් බර සමීක්ෂණ	17
හැරවුම් වලන සමීක්ෂණය (මංසන්ධි සමීක්ෂණ)	37
පදික සමීක්ෂණ	7
පෝලිම් ආවරණ සමීක්ෂණ	1
ධාවන කාල සමීක්ෂණ	6
ප්‍රමාද සමීක්ෂණ	8

3.14 මහාමාර්ග පවරා ගැනීම.

සැලසුම් අංශයේ දත්ත රැස් කිරීමේ හා ඇගයීමේ ඒකකය මාර්ග පවරා ගැනීම සම්බන්ධ කටයුතු පිළිබඳ වගකීම දරයි.

කි.මී. 1,16,000 ක් වන සමස්ත මාර්ග ජාලයෙන් කි.මී.12,379.63 වන ජාතික මහාමාර්ග හැර අනෙකුත් ද්විතීයික මාර්ග වන C, D හා E පංති මාර්ග අන්තර් පළාත් මාර්ග ලෙස සේවය සලසන අතර අනෙකුත් මාර්ග ප්‍රාදේශීය සභා විසින්ද පළාත්පාලන ආයතන විසින්ද වෙනත් අංශ වන ප්‍රධාන වශයෙන් වාරිමාර්ග, මහවැලි හා වතු මාර්ග වලින් යුක්ත වේ. වෙනත් කොන්දේසි වන මෙම මාර්ග පවරා ගෙන ජාතික මහාමාර්ග ලෙස ගැසට් මගින් ප්‍රකාශයට පත් කෙරේ.

2008 අංක 40 දරණ මංමාවත් ආඥා පණත (සංශෝධිත) 8 වගන්තිය අනුව ඕනෑම මාර්ගයක් ජාතික මාර්ගයක් ලෙස ගැසට් මගින් ප්‍රකාශයට පත් කිරීමට ඇමතිවරයා විසින් කටයුතු කරනු ලැබේ.

2015 වර්ෂය තුල පහත සඳහන් මාර්ග ජාතික මහාමාර්ග වශයෙන් ප්‍රකාශයට පත් කරන ලදි.

වගු අංක 31: 2015 වර්ෂය තුල පවරාගත් මාර්ග

මාර්ග අංකය	මාර්ගයේ නම	සිට (කි.මී.)	දක්වා (කි.මී.)	දිග (කි.මී.)
බස්නාහිර පළාත				
B641	**කඩවත අතුරු මාර්ගය**	0+000	1+800	1.80

3.15 මාර්ග ආරක්ෂාව හා රථවාහන කළමනාකරණය

මාර්ග ආරක්ෂාව හා රථවාහන කළමනාකරණය සැලසුම් අංශයේ රථවාහන කළමනාකරණ හා මාර්ග ආරක්ෂණ ඒකකය යටතේ ක්‍රියාත්මක කෙරේ. පි3 උප අංශයේ අධ්‍යක්ෂ යටතේ නියෝජ්‍ය අධ්‍යක්ෂ (සැලසුම්) යටතේ ක්‍රියාත්මක වේ. අතිරේක අධ්‍යක්ෂ ජනරාල් (ජාල සැලසුම්) හා අධ්‍යක්ෂ (සැලසුම්) නියෝජ්‍ය අධ්‍යක්ෂවරයාගේ සහාය ඇතිව අධ්‍යක්ෂ ජනරාල්වරයාට වෘත්තීය සහාය සපයයි.

මාර්ග ආරක්ෂාව නූතන ලෝකයේ ඇතිවූ වැදගත් සාධකයකි. ජාතික මාර්ග ජාලය තුල සිදුවන මාර්ග අනතුරු හේතුවෙන් සමාජය තුල මාර්ග ආරක්ෂාවට ප්‍රධාන සැලකිල්ලක් ලබා දී ඇත. මා.සං.අ. විසින් මාර්ග ජාලය ආරක්ෂණ උපද්‍රව වලින් තොරව යාමට සියලු උත්සාහ යොදන අතර, මගීන් හා වාර්තාකරුවන් යන දෙකොටසේම මාර්ග භාවිතකරුවන්ට ආරක්ෂාව වැඩි දියුණු කිරීම උත්සාහ දරයි. මාර්ග ආරක්ෂණ අංශයන් නව තාක්ෂණය හා බැඳුණු පුනරුත්ථාපන හා වැඩි දියුණු කිරීමේ ව්‍යාපෘති සමඟ ඒකාබද්ධ වී ඇත. නීති සැලසුම් ක්‍රියාත්මක කිරීම් මගින් ශ්‍රී ලංකාව වේගවත්, සංවර්ධනය නිසා මාර්ග ජාලය තුල සිදුවන හදිසි අනතුරු හා රථවාහන සංඛ්‍යාව ඉහළ යාම අවම කිරීමට මා.සං.අ. උත්සාහ දරයි.

මෙම අංශය ජාතික මහාමාර්ගවල රථවාහන කළමනාකරණ උපායන් මගින් මාර්ග ආරක්ෂාව හා රථවාහන තදබදය අඩුකිරීම සහතික කිරීමේ වගකීම දරයි.

3.15.1 ඒකකයේ මාර්ග ආරක්ෂාව හා රථවාහන කළමනාකරණය පිළිබඳ වැඩවල විෂය පථය:

3.15.1.1 මාර්ග ආරක්ෂාව

උපද්‍රව ස්ථාන වැඩි දියුණු කිරීම

- හඳුනා ගැනීම, ක්ෂේත්‍ර පරීක්ෂාව සහ දත්ත රැස් කිරීම
- වැඩි දියුණු කිරීම් සඳහා ආරක්ෂණ සැලසුම් පිළියෙල කිරීම

ආරක්ෂණ විගණනය

- පවත්නා මාර්ග ජාලය සඳහා ආරක්ෂණ විගණනය
- ක්‍රියාත්මක කෙරෙමින් පවතින ව්‍යාපෘති සඳහා ආරක්ෂණ විගණනය
- ඉහත සඳහන් විගණනයන් පිළිබඳ වාර්තා පිළියෙල කිරීම

නව සැලසුම්

- අප රටට ගැලපෙන නව ආරක්ෂණ පියවර සැලසුම් කිරීම.

3.15.1.2 රථවාහන කළමනාකරණය

රථවාහන සංඥා හා මාර්ග සලකුණු කිරීම්

- අධ්‍යක්ෂ මාර්ග සැලසුම් විසින් ඉදිරිපත් කරන ලද රථවාහන සංඥා හා මාර්ග සලකුණු ඇදීම් සැලසුම් නිර්මාණය
- පවත්නා මාර්ග කොටස් හා මංසන්ධි සඳහා රථවාහන සංඥා හා මාර්ග සලකුණු ඇදීම් පිළිබඳ සැලසුම් නිර්මාණය
- විදේශ අරමුදල් ව්‍යාපෘති සඳහා රථවාහන සංඥා හා මාර්ග සලකුණු කිරීමේ පරීක්ෂාව
- ව්‍යාපෘති සඳහා ආදර්ශ ඇදීම් පිළියෙල කිරීම

ධාරිතාව වැඩි දියුණු කිරීම

- මංසන්ධිවල ධාරිතාව වැඩි දියුණු කිරීම
- තදබදය සහිත මාර්ග කොටස්වල ධාරිතාව වැඩි දියුණු කිරීම

නගර වැඩි දියුණු කිරීම

- නාගරිකයන් සඳහා එක් දිශාවට මාර්ග ක්‍රමය ක්‍රියාත්මක කිරීම
- නාගරිකයන් සඳහා අතුරු මාර්ග යෝජනා කිරීම

රථවාහන බලපෑම් තක්සේරුවට සම්බන්ධ වැඩ

- ව්‍යාපෘති වලට අනුමැතිය ලබා දීම සඳහා නා.සං.අ. කැඳවනු ලබන රථවාහන කමිටුවලට සහභාගි වීම
- බාහිර පාර්ශවයන් විසින් නගන රථවාහන වලට සම්බන්ධ ප්‍රශ්න සඳහා නිර්දේශ ඉදිරිපත් කිරීම.

3.15.1.3 මංසන්ධි සංඥාපිත කිරීම

- රථවාහන සංඥා අළුතින් ස්ථාපනය කිරීම
- පවත්නා රථවාහන සංඥා යාවත්කාලීන කිරීම හා නඩත්තු කිරීම
- සංඥා වලට සිදුවන අනතුරුවලට සම්බන්ධ වැඩ ඉටු කිරීම

3.15.1.4 වෙනත් වැඩ

- ප්‍රාදේශීය රථවාහන කමිටු රැස්වීම් වලට සහභාගි වීම
- සංඥාපිත කිරීම සඳහා ප්‍රමාණ බිල්පත් හා ඇස්තමේන්තු පිළියෙල කිරීම
- ප්‍රදර්ශන සංවිධානය කිරීම
- මහජනයාගේ හා වෙනත් පාර්ශවයන්වල ආරක්ෂාව පිළිබඳ දැනුම වැඩි දියුණු කිරීම සඳහා සම්මන්ත්‍රණ හා වැඩ මුළු සංවිධානය කිරීම

3.15.2 2015 වර්ෂය තුල මාර්ග ආරක්ෂාව හා රථවාහන කළමනාකරණය ඒකකයේ කාර්ය සාධනය

3.15.2.1 මාර්ග ආරක්ෂාව

3.15.2.1.1.1 උපද්‍රව ස්ථාන වැඩි දියුණු කිරීම

මෙම විෂය යටතේ, උපද්‍රව ස්ථාන හඳුනා ගැනීම, ක්ෂේත්‍ර පරීක්ෂාව, දත්ත රැස් කිරීම හා ආරක්ෂණ සැලසුම් පිළියෙල කිරීම සැලකිල්ලට ගනු ලැබේ.

1. පාසල් ප්‍රදේශවල ආරක්ෂාව වැඩි දියුණු කිරීමේ වැඩ සටහන් සඳහා තොරතුරු රැස් කිරීම.
2. ප්‍රධාන දුම්රිය හරස් මාර්ග ලැයිස්තුව පිළියෙල කිරීම හා යාවත්කාලීන කිරීම
3. මහනුවර - යාපනය මාර්ගයේ [A09] හා යාපනය පේදුරුතුඩුව මාර්ගයේ [AB20] ආරක්ෂණ පියවරයන්
4. උතුරු කළුතර තොටුපල හංදියේ උපද්‍රව සහිත පදික මාරුව
5. වැලිසර ආරක්ෂණය වැඩි දියුණු කිරීම
6. කුරුදුගහ හැතැක්ම හංදියේ හදිසි අනතුරු දත්ත රැස් කිරීම සඳහා ඉල්ලීම
7. කොළඹ - මීගමුව මාර්ගයේ (කි.මී. 16 කණුව) අනතුරුදායක වංගුව දිගට මාර්ග ආරක්ෂණ පියවර ක්‍රියාත්මක කිරීම සඳහා ඉල්ලීම

3.15.2.1.2 ආරක්ෂණ විශ්ලේෂණය.

මාර්ග ආරක්ෂණ විශ්ලේෂණයේ අරමුණ මාර්ග අනතුරු අවම කිරීමට මාර්ග අනතුරු සඳහා හේතු හඳුනා ගැනීම හා එවැනි ස්ථාන වැඩි දියුණු කිරීම සඳහා අදාල පියවරයන් සොයා ගැනීමයි.

ඉහත සඳහන් විෂය යටතේ, වර්ෂය තුල පියවර ගණනාවක් ක්‍රියාත්මක කරන ලදි.

1. 2014.02.23 දිනැති දිගම්පතන අනතුර පිළිබඳ හදිසි අනතුරු විශ්ලේෂණ වාර්තාව
2. 2015.02.24 දිනැති කුරුවිට අනතුර පිළිබඳ හදිසි අනතුරු විශ්ලේෂණ වාර්තාව
3. ජාතික මහාමාර්ගවල අනාරක්ෂිත / ආරක්ෂිත නොවන ස්ථාන නිවැරදි කිරීමේ වැඩ සටහන.

3.15.2.2 රථවාහන කළමනාකරණය

3.15.2.2.1 රථවාහන සංඥා හා මාර්ග සලකුණු කිරීම්

3.15.2.2.1.1 රථවාහන සංඥා හා මාර්ග සලකුණු කිරීම් සඳහා සැලසුම් නිර්මාණය

අන්තර්මාරු, අන්තර්ඡේදන, මාර්ග, පාලම් හා ගුවන් පාලම් සඳහා සැලසුම් නිර්මාණය හා රථවාහන සංඥා හා මාර්ග සලකුණු කිරීම් පරීක්ෂා කිරීම හා සමාලෝචනය කිරීම සිදු කරන ලදි. ඉහත සඳහන් වැඩ පිළිබඳ විස්තර වගු අංක 32 දැක්වේ .

2015 වර්ෂය තුල කි.මී. 10.24 සඳහා රථවාහන සංඥා හා මාර්ග සලකුණු කිරීම්වල සැලසුම් නිර්මාණය කිරීම.

වගු අංක 32: 2015 වර්ෂය තුල ක්‍රියාත්මක කළ රථවාහන සංඥා හා මාර්ග සලකුණු කිරීමේ සැලසුම් නිර්මාණය කිරීම.

මාර්ග අංකය	මාර්ගයේ නම	දිග (කි.මී.)
ඒ 01	කොළඹ - මහනුවර මාර්ගයේ (A 01) කඩවත සිට නිට්ටඹුව දක්වා කි.මී. 16+940 - 21+940 දක්වා පුනරුත්ථාපනය හා වැඩි දියුණු කිරීම	5.0
ඒ 01	කොළඹ - මහනුවර මාර්ගයේ (A 01) කඩවත සිට නිට්ටඹුව දක්වා කි.මී. 21+700 - 25+740 දක්වා පුනරුත්ථාපනය හා වැඩි දියුණු කිරීම	4.04
	ආරක්ෂක මුලස්ථාන ව්‍යාපෘතියට සම්බන්ධ අකුරේගොඩ - දියවන්නාව උද්‍යාන මාර්ග ජාලය වැඩි දියුණු කිරීම.	0.6
	ආරක්ෂක මුලස්ථාන ව්‍යාපෘතියට සම්බන්ධ අකුරේගොඩ - උත්සව ප්‍රවේශ මාර්ග ජාලය වැඩි දියුණු කිරීම.	0.6

3.15.2.2.1.2 2015 වර්ෂය තුළ නිම කරන ලද මංසන්ධි හා අන්තර්ඡේදන 9 රථවාහන මාර්ග සලකුණු කිරීම සැලසුම් කිරීම.

1. කොළඹ - මහනුවර මාර්ගයේ කඩවත - නිට්ටඹුව - ඉඹුල්ගොඩ හංදිය දක්වා පුනරුත්ථාපනය හා වැඩි දියුණු කිරීම
2. කොළඹ - මහනුවර මාර්ගයේ කඩවත - නිට්ටඹුව - මුදුන්ගොඩ හංදිය දක්වා
3. වැලිසර ආරක්ෂණ වැඩි දියුණු කිරීම සඳහා සංඥා සහ සලකුණු කිරීම්
4. මහනුවර - යාපනය මාර්ගයේ (A 9) නාවක්කුලි හංදිය පුනරුත්ථාපනය හා වැඩි දියුණු කිරීම.
5. A 09 හා AB 20 හංදියේ අන්තර්ඡේදනය
6. A 9 මාර්ගයේ විශ්ව විද්‍යාල බස් නෙරුව කි.මී.244+960-245+180 දක්වා
7. බත්තරමුල්ල - පන්නිපිටිය මාර්ගයේ (B47), අකුරේගොඩ මාර්ගය හා සුනිල් මාවත අන්තර්ඡේදනය වැඩි දියුණු කිරීම.
8. පිළියන්දල අතුරු මාර්ගය (සංඥා පිරි සැලසුම) ඇතුළු පාමංකඩ සිට කැස්බෑව දක්වා B 84 (උතුරු) මාර්ග කොටස
9. රිකිල්ලගස්කඩ නගරය සහ රාගල හංදිය

3.15.2.2.1.3 අධිවේගී මාර්ග හා ජාතික මහාමාර්ග ඇතුළු ව්‍යාපෘතිවල රථවාහන සැලසුම් හා මාර්ග සලකුණු කිරීමේ සැලසුම් සමාලෝචනය 2015 වර්ෂය තුල කි.මී. 751.438 ක් නිම කෙරිණි.

වගු අංක 33: 2015 වර්ෂය තුළ රථවාහන සංඥා හා මාර්ග සලකුණු කිරීම් සැලසුම් සමාලෝචනය කිරීම

මාර්ග අංකය	මාර්ගයේ නම	දිග (කි.මී.)
A004	නුගේගොඩ සිට හෝමාගම දක්වා රථවාහන සංඥා හා මාර්ග සලකුණු කිරීම (කි.මී. 1+000 - 15+360 දක්වා - 1 වැනි සමාලෝචනය)	14.36
A005	වැලිමඩ - බදුල්ල මාර්ගයේ රථවාහන සංඥා හා මාර්ග සලකුණු කිරීම (කි.මී. 0+000 සිට 1+970 දක්වා - 1 වැනි සමාලෝචනය)	1.97

මාර්ග අංකය	මාර්ගයේ නම	දිග (කි.මී.)
A006	අඹේපුස්ස - කුරුණෑගල - ත්‍රිකුණාමලය මාර්ගය (A006)	34.39
A009	මහනුවර - යාපනය මාර්ගය වැඩි දියුණු කිරීම	27.6
A014	මැදවච්චිය - මන්නාරම - තලෙයිමන්නාරම මාර්ගයේ රථවාහන සංඥා හා මාර්ග සලකුණු කිරීම.	30.55
A017	ගාල්ල - දෙනියාය - මාදම්පේ මාර්ගයේ රථවාහන සංඥා හා මාර්ග සලකුණු කිරීම	13.93
A019	පොල්ගහවෙල - කෑගල්ල මාර්ගයේ -[පාලම් අංක.3.2] - රථවාහන සංඥා හා මාර්ග සලකුණු කිරීම (කි.මී.0+100 සිට 10+000 දක්වා - 1වැනි සමාලෝචනය)	9.9
A029	වවුනියා - හොරොව්පතාන මාර්ගයේ රථවාහන සංඥා හා මාර්ග සලකුණු කිරීම (කි.මී.16+000 - 22+000 දක්වා - 1වැනි සමාලෝචනය)	17.4
B047	කෝට්ටේ - බෝපේ හා බත්තරමුල්ල - පන්නිපිටිය මාර්ගයේ රථවාහන සංඥා සලකුණු කිරීම කි.මී. 0+000 - 3+500 දක්වා	3.5
B 527	බිබිල - පිටකුඹුර - නාමල්ඔය - ඉගිනියාගල මාර්ගය පුනරුත්ථාපනය හා තත්ත්වය නැංවීම කි.මී. 0+000 සිට 60+310 දක්වා	60.31
B 057	බිබිල - ඌරණිය - මහියංගනය මාර්ගය පුනරුත්ථාපනය හා තත්ත්වය නැංවීම කි.මී. 0+000 සිට 10+000 දක්වා	14.0
B 079	හලාවත - වාර්යපොල මාර්ග ව්‍යාපෘතිය (B079කි.මී. 0+000 සිට 29+400 දක්වා. 1 වැනි සමාලෝචනය	29.4
B 084	B084 ප්‍රධාන මාර්ග කොටස රථවාහන සංඥා හා මාර්ග සලකුණු කිරීම කි.මී. 4+100 සිට 10+600 දක්වා -1වැනි සමාලෝචනය	6.5
B 087	දම්බොක්ක - කටුපිටිය මාර්ගය පුනරුත්ථාපනය හා වැඩි දියුණු කිරීම (කි.මී. 0+000 – 8+580 දක්වා)	8.58
B 093	දෙහිඕවිට - දැරණියගල - තුරි B093 මාර්ගයේ රථවාහන සංඥා හා මාර්ග සලකුණු කිරීම (කි.මී. 10+940 සිට 13+780 දක්වා - 1වැනි සමාලෝචනය	5.0
B110	ඇහැළියගොඩ -දෙහිඕවිට මාර්ගයේ ඇහැළියගොඩ - දෙහිඕවිට කොටස	16.69
B114	ඇල්පිටිය - අවිත්තාව - ලෙව්වන්දුව මාර්ගයේ රථවාහන සංඥා හා මාර්ග සලකුණු කිරීම (කි.මී.9+340 සිට 19+860 දක්වා - 1වැනි සමාලෝචනය)	17.66
B127	ගලිගමුව - රුවන්වැල්ල - කරවනැල්ල මාර්ගයේ රථවාහන සංඥා හා මාර්ග සලකුණු කිරීම (කි.මී. 0+000 සිට 28+030 දක්වා)	28.03
B129	ගාල්ල - උඩුගම මාර්ගය පුනරුත්ථාපනය කිරීම (කි.මී. 20+000-24+800 දක්වා)	4.8
B 151	හැඳල - හූණුපිටිය මාර්ගය පුනරුත්ථාපනය හා වැඩි දියුණු කිරීම කි.මී. 0+000 – 4+020 දක්වා	4.02
B 153	හික්කඩුව සිට දක්ෂිණ අධිවේගී මාර්ගය දක්වා රථවාහන සංඥා හා මාර්ග සලකුණු කිරීම කි.මී. 0+000 සිට 7+400 දක්වා.	14.28
B 157	අලුත්ගම - දක්ෂිණ අධිවේගී මාර්ගය B157 (කි.මී. 42+600 සිට 53+670 දක්වා - 1වැනි සමාලෝචනය)	11.07
B190	කලුගමුව - විලාකටුපොත මාර්ගය (කි.මී. 0+000 සිට 21+180 දක්වා - 1වැනි සමාලෝචනය)	21.18
B207	නාගොඩ - නැබොඩ මාර්ගයේ කි.මී. 2+500 සිට 16+440 දක්වා - 2 වැනි සමාලෝචනය)	13.94
B211	කැබිතිගොල්ලෑව - පදවිය මාර්ගයේ රථවාහන සංඥා හා මාර්ග සලකුණු කිරීම	18.24
B 240	කෝට්ටේ - බෝපේ මාර්ගය පුනරුත්ථාපනය හා තත්ත්වය නැංවීම කි.මී. 0+000 – 3+700 දක්වා	3.7
B264	මල්ලවපිටිය - රම්බඩගල්ල - කැප්පිටිපොල මාර්ගයේ රථවාහන සංඥා හා මාර්ග සලකුණු කිරීම (කි.මී.0+000 සිට 10+000 දක්වා) - අදහස් සහිතව ආපසු යැවීම	10.0
B 272	B272 - මාරවිල - උඩුබද්දාව මාර්ගය (කි.මී. 0+000 සිට 19+540 දක්වා - 1වැනි සමාලෝචනය)	19.54
B283	මැදවච්චිය - කැබිතිගොල්ලෑව මාර්ගය රථවාහන සංඥා හා මාර්ග සලකුණු කිරීම (කි.මී. 0+020 සිට 7+900 දක්වා - 1 වැනි සමාලෝචනය)	25.362
B285	මීපේ - ඉංගිරිය මාර්ගයේ රථවාහන සංඥා හා මාර්ග සලකුණු කිරීම කි.මී. 0+000 සිට 18+130 දක්වා 1වැනි සමාලෝචනය	18.13

මාර්ග අංකය	මාර්ගයේ නම	දිග (කි.මී.)
B304	නාගොඩ - නැබොඩ මාර්ගයේ රථවාහන සංඥා හා මාර්ග සලකුණු කිරීම කි.මී. 2+500 - 16+400 දක්වා	13.9
B308	නාරම්මල - දංකොටුව මාර්ගයේ රථවාහන සංඥා හා මාර්ග සලකුණු කිරීම	24.0
B312	නාඋල - ඇලහැර - ලග්ගල - පල්ලෙගම - හෙට්ටිපොල මාර්ගයේ කි.මී . 0+000 - 8+300 දක්වා	10.4
B384	රඹුක්කන - කටුපිටිය මාර්ගයේ රථවාහන සංඥා හා මාර්ග සලකුණු කිරීම (කි.මී. 0+000 - 1+666 දක්වා)	9.8
B 390	රත්නපුර - පලාවෙල - කරවිට මාර්ගයේ පුනරුත්ථාපනය හා වැඩි දියුණු කිරීම කි.මී. 10+540 – 15+540 දක්වා	5.0
B 391	රත්නපුර - වේවැල්වත්ත මාර්ගය පුනරුත්ථාපනය හා වැඩි දියුණු කිරීම කි.මී. 10+000 - 16+000 දක්වා	6.0
B400	සීදුව - උඩුගම්පල මාර්ගයේ රථවාහන සංඥා හා මාර්ග සලකුණු කිරීම (කි.මී. 0+000 සිට5+280 දක්වා - 1වැනි සමාලෝචනය)	12.1
B408	තල්දුව - මීවිටිගම්මන මාර්ගයේ රථවාහන සංඥා හා මාර්ග සලකුණු කිරීම (කි.මී. 0+000 - 10+000 දක්වා)	10.0
B413	තැන්නෙකුඹුර - රිකිල්ලගස්කඩ - රාගල මාර්ගයේ රථවාහන සංඥා හා මාර්ග සලකුණු කිරීම.	1.9
B 419	තෝප්පුව - දංකොටුව - නාත්තණ්ඩිය - මාදම්පේ (B 419) මාර්ගයේ රථවාහන සංඥා හා මාර්ග සලකුණු කිරීම (කි.මී. 10+780 සිට 5+540 දක්වා)- මාර්ග කොටස 1වැනි සමාලෝචනය	5.24
B445	වේයන්ගොඩ - රුවන්වැල්ල මාර්ගය (B445) වැඩි දියුණු කිරීම හා පුනරුත්ථාපනය (කි.මී.. 25+500 සිට 31+940 දක්වා)	6.44
B 460	වත්තල - මහර මාර්ගය පුනරුත්ථාපනය හා වැඩි දියුණු කිරීම කි.මී. 0+000 සිට 7+240 දක්වා	7.24
B 469	වැලිකඩ - කොහිලවත්ත මාර්ගය පුනරුත්ථාපනය හා වැඩි දියුණු කිරීම කි.මී. 0+000 – 5+320 දක්වා	5.32
B 499	කිරින්ද - පලටුපාන - යාල මාර්ගයේ පුනරුත්ථාපනය හා වැඩි දියුණු කිරීම කි.මී. 0+000 - 12+500 දක්වා	12.5
B517	අලුත්ගම සිට දක්ෂිණ අධිවේගි මාර්ගය දක්වා රථවාහන සංඥා හා මාර්ග සලකුණු කිරීම (කි.මී. 42+600 සිට 53+670 දක්වා - 1 වැනි සමාලෝචනය)	11.07
B528	බෙද්දාගම - හම්බෙගමුව - කල්තොට මාර්ගයේ රථවාහන සංඥා හා මාර්ග සලකුණු කිරීම (කි.මී. 0+000 සිට 45+280 දක්වා)	45.28
B549	ඇඹිලිපිටිය - මොරකැටිය - කිරිඉඹ්බන්ආර - උඩමව්ආර මාර්ගය වැඩි දියුණු කිරීම හා පුනරුත්ථාපනය කි.මී. 6+000 - 14+260 දක්වා	8.62
B598	සීදුව - කටුනායක මාර්ගයේ රථවාහන සංඥා හා මාර්ග සලකුණු කිරීම (කි.මී. 0+000 සිට 3+760 දක්වා - 1වැනි සමාලෝචනය)	3.76
E 02	පිටත වටරවුම් මාර්ගය - I වැනි අදියර (ද.කොා.) (කොතලාවල අ.මා. 1වැනි සමාලෝචනය)	
E 02	පි.ව.මා. යේ රථවාහන සංඥා දකුණු කොටසේ අනුමැතිය	
	ලුනුගම්වෙහෙර - කතරගම මාර්ගයේ රථවාහන සංඥා හා මාර්ග සලකුණු කිරීම (කි.මී. 0+000 සිට 13+000 දක්වා -1වැනි සමාලෝචනය)	13.0
	මීගමජඳුර - කුමාරගම මාර්ගය වැඩි දියුණු කිරීම හා පුනරුත්ථාපනය කි.මී. 0+000 සිට 4+500 දක්වා 1 වැනි සමාලෝචනය	4.5
	උමාඔය බහුකාර්ය සංවර්ධන ව්‍යාපෘතිය රථවාහන සංඥා හා මාර්ග සලකුණු කිරීම (කි.මී. 0+000 - 1+976 දක්වා)	1.976
	තල්ගොඩපිටිය - යටවත්ත - දොඹවෙල මාර්ගය පුනරුත්ථාපනය හා වැඩි දියුණු කිරීම - කි.මී. 0+000 – 7+580 දක්වා -අනුමැතිය කි.මී. 0+080 සිට 3+760 දක්වා, කි.මී. 4+040 සිට 4+920 දක්වා සහ කි.මී. 5+060 සිට 7+720 දක්වා	10.18
	කටුවන - අලුපොත මාර්ගය පුනරුත්ථාපනය හා වැඩි දියුණු කිරීම කි.මී 0+000 - 8+300 දක්වා	8.3

මාර්ග අංකය	මාර්ගයේ නම	දිග (කි.මී.)
	බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන් තොටුපල සංවර්ධන ව්‍යාපෘතිය - II අදියර II පියවර 2 – 2 වැනි සමාලෝචනය	10.88
	අයි.ඩී.එච්. රෝහල මංසන්ධිය හා ශ්‍රී ජයවර්ධනපුර රෝහල මංසන්ධිය වැඩි දියුණු කිරීම	
	වේරහැර රියැදුරු පරීක්ෂණ ප්‍රදේශයේ රථවාහන සංඥා හා මාර්ග සලකුණු කිරීම	

2015 වර්ෂය තුල මාර්ග කි.මී. 751.438 ක රථවාහන සංඥා හා මාර්ග සලකුණු කිරීම් සැලසුම් සමාලෝචනය නිම කරන ලදි.

3.15.2.2.1.4 පාලම් ස්ථාන හා ගුවන් පාලම් සඳහා රථවාහන සංඥා හා මාර්ග සලකුණු සැලසුම් නිර්මාණය

නාරාහේන්පිට - නාවල - නුගේගොඩ මාර්ගයේ අංක 2/1 පාලම පුළුල් කිරීම (නාවල පාලම)

ඉහත සඳහන් රථවාහන සංඥා හා මාර්ග සලකුණු වලට අමතරව, වැඩබිමේ අවශ්‍යතාවයට අනුව, පහත සඳහන් ආදර්ශ සැලසුම් නිර්මාණය කර පරීක්ෂා කරන ලදි.

3.15.2.2.1.5 විස්තරාත්මක / පූර්ව දිසා සංඥා පුවරු සැලසුම් පිළියෙල කිරීම සැලසුම් සමාලෝචනය හා ආදර්ශ සැලසුම් පිළියෙල කිරීම.

1. කළුතර දිස්ත්‍රික්කය සඳහා පූර්ව දිසා සංඥා පුවරු
2. රදැල්ල කෙටි මාර්ගය ගැන අනතුරු හැඟවීමේ සංඥා පුවරු
3. දිවියන් පාර මාරුවන ස්ථාන පිළිබඳ සංඥා පුවරු
4. අවිත්තාව - ලෙව්වන්දුව මාර්ගය සඳහා පූර්ව දිසා සංඥා පුවරු
5. බස්නාහිර පළාත සඳහා පූර්ව දිසා සංඥා පුවරු
6. හික්කඩුව සිට බද්දේගම දක්වා පූර්ව දිසා සංඥා පුවරු
7. කලුගමුව - විලාකටුපොත මාර්ගය සඳහා පූර්ව දිසා සංඥා පුවරු

3.15.2.2.2 ධාරිතාව වැඩි දියුණු කිරීම

වැඩි දියුණු කිරීම සඳහා මංසන්ධි හඳුනා ගැනීම - A09 මාර්ගයේ මාම්පලම් මංසන්ධිය වැඩි දියුණු කිරීම.

3.15.2.2.3 රථවාහන බලපෑම් තක්සේරුවට සම්බන්ධ වැඩ.

නාගරික සංවර්ධන අධිකාරියේ රථවාහන කමිටු රැස්වීම්

නාගරික සංවර්ධන අධිකාරියේ රථවාහන කමිටු රැස්වීම් 29 ක් පවත්වන ලදි. සෑම රථවාහන බලපෑම් තක්සේරුවක් සඳහාම කමිටුව වෙත අප විසින් වාචික හා ලිඛිත නිර්දේශ ලබා දෙන ලදි.

3.15.2.2.4 මහජන ඉල්ලීම් ඉටු කිරීම.

1. පැලවත්ත මංසන්ධියේ ලවිම යේ පාලන මධ්‍යස්ථානයට ප්‍රවේශය සඳහා ඉල්ලීම.
2. බොරැල්ල හංදියේ බිලූ මවුන්ටන් ප්‍රධාන කාර්යාලයට ප්‍රවේශය සඳහා ඉල්ලීම

3. මොරටුව නගර මධ්‍යයේ පදික මාරුව සඳහා මහජන ඉල්ලීම්
4. ජා-ඇල - ඒකල මාර්ගයේ විශාඛාවත්ත දේවස්ථාන පාර සඳහා මධ්‍යයනය විවෘත කරන ලෙස ඉල්ලීම.
5. උතුරු පළාතේ දිස්ත්‍රික් පහ සඳහාම සංචාරක සංඥා පුවරු ස්ථාපනය සඳහා ඉල්ලීම
6. කොතලාවල ඕකිඩ්මෝ පෙර පාසල අසල පදික මාරුව සඳහා ඉල්ලීම
7. හොරණ - අඟුරුවාතොට මාර්ගයේ බස් නැවතුම ප්‍රතිස්ථාන ගත කිරීම සඳහා ඉල්ලුම
8. ඩාර්ටන්පිල්ඩ් හංදියේ හා නාගොඩ - කලවැල්ලාව - බැල්ලපිටිය මාර්ගයේ ඕමන්ත හංදියේ පදික මාරු සැපයීම සඳහා ඉල්ලීම
9. කළුබෝවිල රෝහල ප්‍රදේශය හා පිටවීම අසල මංසන්ධි කොටු සපයන ලෙස ඉල්ලීම
10. දෙහිවල දුම්රියපල පාර මංසන්ධිය ආසන්නයේ බස් නැවතුම ප්‍රතිස්ථානගත කරන ලෙස ඉල්ලීම
11. නාරාහේන්පිට බෝගස යට ත්‍රීරෝද රථ ගාලක් සඳහා ඉල්ලීම
12. දෙමටගොඩ ඩ්‍රයිව් ග්‍රීන් ස්ටේෂන් අසල ප්‍රවේශය සඳහා ඉල්ලීම
13. නාරාහේන්පිට පාසල් සෞඛ්‍ය මධ්‍යස්ථානය අසල ත්‍රීරෝද රථ ගාලක් සඳහා ඉල්ලීම
14. කොළඹ - මහනුවර මාර්ගයේ රම්මුතුගල බස් නැවතුම ප්‍රතිස්ථානගත කිරීම සඳහා ඉල්ලීම.
15. නුගේගොඩ පාසල් දරුවන් වෙනුවෙන් ආරක්ෂිත පදික මාරු පහසුකම් සඳහා ඉල්ලීම
16. මොරටුව - කටුකුරුන්ද හා එගොඩඋයන දුම්රිය ස්ථානය ඉදිරිපිට අසල ගාල් කිරීමේ පහසුකම් සඳහා ඉල්ලීම
17. මොරටුව - කටුකුරුන්ද (අංක 50/1 නව ගාලු පාරේ) ගාල් කිරීමේ පහසුකම් සඳහා ඉල්ලීම.
18. කොළඹ - මහනුවර මාර්ගයේ ලංගම ඩිපෝව සඳහා මධ්‍යයනය විවෘත කිරීම
19. මඩපාතගම හංදිය අසල පදික මාරුවක් සඳහා ඉල්ලීම
20. OKI ජාත්‍යන්තර පාසල ඉදිරිපිට පදික මාරුවක් සඳහා ඉල්ලීම
21. යාපනය හා මුලතිවු මාර්ග ආරක්ෂණය හා රථවාහන කළමනාකරණය පිළිබඳ ගැටළුව
22. කටුකුරුන්ද - මොරටුව ගාල් කිරීමේ නෙරුවක් සඳහා ඉල්ලීම.
23. එගොඩ උයන - මොරටුව ගාල් කිරීමේ නෙරුවක් සඳහා ඉල්ලීම.
24. වාද්දුව - බණ්ඩාරගම මාර්ගයේ දෙල්දුව තරුණ සේවා මාවත අසල පදික මාරුවක් සඳහා ඉල්ලීම.
25. වාද්දුව - බණ්ඩාරගම මාර්ගයේ ගෝනදුව ප්‍රාථමික විද්‍යාලය අසල බස් නැවතුම් දෙකක් සඳහා ඉල්ලීම

26. කොළඹ - මහනුවර මාර්ගයේ ඉඹුල්ගොඩ කන්දකැපු හංදිය නැවතුම් සංඥා සඳහා ඉල්ලීම
27. කොළඹ 06, වැල්ලවත්ත , විවේකානන්ද මාවත මහජන ආරක්ෂණය
28. දෙහිවල වැට ඉවත් කිරීම සඳහා ඉල්ලීම
29. දෙහිවන - මහරගම මාර්ගයේ (119 බස් මාර්ගය), බෙල්ලන්විල සිබ්‍රා පදික මාරුව.
30. කොළඹ - ගාල්ල මාර්ගයේ කි.මී. 39+780 බස් නෙරුව පිළිබඳ පැමිණිල්ල.
31. තලවතුගොඩ හංදිය ත්‍රිරෝද රථ ගාලක් සඳහා ඉල්ලීම.
32. A03 මාර්ගයේ ඔලියමුල්ල පදික මාරුව වෙනස් කිරීම සඳහා ඉල්ලීම.
33. ජා-ඇල දඹුගම වාහන පිවිසුම සඳහා ඉල්ලීම
34. කොටා පාර අංක 1586/10 ස්ථානයේ වාහන පිවිසුම සඳහා ඉල්ලීම.
35. කොහුවල හංදියේ සුමනදිසි බේකරියට වාහන පිවිසුම සඳහා ඉල්ලීම.
36. පිළියන්දල, බෝකුන්දර පදික මාරුවක් සඳහා ඉල්ලීම
37. ගාලුපාරේ, නව මොරටුව අතුරු මාර්ගයේ (AB11) මොරටුව එගොඩ උයන පදික මාරුව සඳහා ඉල්ලීම
38. බෙස්ලයින් මාර්ගයේ බ්‍රිතාන්‍ය පාසල අසල කිතුල්වල අතුරු මාර්ගය පුළුල් විවෘත කිරීමක් සඳහා ඉල්ලීම.
39. ජා-ඇල - මිනුවන්ගොඩ මාර්ගයේ අංක 150/1 අසල මධ්‍යයනය විවෘත කිරීම සඳහා ඉල්ලීම
40. B 84 මාර්ගයේ ගයිඩන්ස් එඩියුකේෂන් මධ්‍යස්ථානය අසල මධ්‍යයනය විවෘත කිරීම සඳහා ඉල්ලීම
41. කොළඹ 05, විජය කුමාරතුංග මාවත, අංක.23 පිවිසුම සඳහා ඉල්ලීම.
42. ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවතේ (විදේශ රැකියා කාර්යාංශය අසල) ත්‍රිරෝද රථ ගාලක් සඳහා ඉල්ලීම
43. කැස්බෑව - කිදෙල්පිටිය - බණ්ඩාරගම මාර්ගයේ ඉදිරිපිට පදික මාරුව ප්‍රතිස්ථානගත කිරීම සඳහා ඉල්ලීම.
44. A02 මාර්ගයේ මග්ගොන බස් නැවතුම ප්‍රතිස්ථානගත කිරීම සඳහා ඉල්ලීම
45. බත්තරමුල්ල, කොස්වත්ත, ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවතේ අංක 240/32/31A, ස්ථානයට පිවිසුම
46. බෙස්ලයින් මාවතේ සේන මිල්ස් වලට පිවිසුම
47. බත්තරමුල්ල - පන්නිපිටිය මාර්ගය පුනරුත්ථාපනය හා වැඩි දියුණු කිරීම සහ නෙරළු උයන මාවත සඳහා මධ්‍යයනය විවෘත කිරීම.
48. පාමංකඩ - කැස්බෑව මාර්ගයේ (ස්ථාන 5 ක) මධ්‍යයනය විවෘත කිරීම සඳහා ඉල්ලීම.

49. සදර්න් පෙට්‍රෝලියම් පුද්. සමාගම අසල 9 වැනි කි.මී. යේ පදික මාරුව ප්‍රතිස්ථානගත කිරීම සඳහා ඉල්ලීම.
50. මග්ගොන - කළුතර ගෑස් සාප්පුව ඉදිරිපිට කහ ඉර ඉවත් කිරීම සඳහා ඉල්ලීම.
51. කැස්බෑව - බණ්ඩාරගම මාර්ගයේ කඹුරුගොඩ හංදියේ පදික මාරුවක් ස්ථාපනය කිරීම සඳහා ඉල්ලීම.
52. හයිලෙවල් පාරේ MMC ව්‍යාපෘතිය ඉදිරිපිට පදික මාරුවක් හා රථ ගාල් කිරීම තහනම් කිරීම සඳහා ඉල්ලීම.
53. A02 මාර්ගයේ මැලිබන් හංදිය සිට කවුඩාන දක්වා මධ්‍යයනයක් හඳුන්වාදීම සඳහා ඉල්ලීම.

3.15.1.3 මංසන්ධි සංඥාපිත කිරීම.

3.15.1.3.1 රථවාහන සංඥා ස්ථාපිත කිරීම, යාවත්කාලීන කිරීම හා නඩත්තුව.

- රථවාහන සංඥා සාමාන්‍ය නඩත්තුව හා අළුත්වැඩියාව පරීක්ෂාව හා අධීක්ෂණය.
- රථවාහන සංඥා සැලසුම් ඇඳීම් සමාලෝචනය හා රථවාහන සංඥා ස්ථාපනය කිරීමට සම්බන්ධ වැඩ.
- නව මංසන්ධිවල සංඥා පිරි සැකසුම හා කුළුණු පිරි සැකසුම් සැලසුම් කිරීම
    1. දළදා වීදිය - යටිනුවර වීදිය
    2. දළදා වීදිය - කොටුගොඩැල්ල වීදිය
    3. යටිනුවර වීදිය - කොළඹ වීදිය
    4. හිල් වීදිය - ඩී.එස්. සේනානායක වීදිය
    5. බදුල්ල පෙලිකන් මාරුව
- රථවාහන සංඥා සැලසුම් සමාලෝනය හා සංඥා ස්ථාපනය අධීක්ෂණය කිරීම
    1. කොතලාවල අන්තර් ඡේදනය
    2. අතුරුගිරිය අන්තර් ඡේදනය
    3. බොරලැස්ගමුව මංසන්ධිය
    4. පන්නිපිටිය මංසන්ධිය
    5. පාලම් තුන මංසන්ධිය
    6. තලවතුගොඩ මංසන්ධිය
    7. බත්තරමුල්ල මංසන්ධිය
    8. පැපිලියාන මංසන්ධිය (සැලසුම් සමාලෝචනය පමණි)
- පහත සඳහන් ස්ථානවල රථවාහන සංඥා ස්ථාපනය සඳහා ඇස්තමේන්තු පිළියෙල කිරීම
    1. කළුතර පෙලිකන් මාරුව.
    2. අනුරාධපුර පෙලිකන් මාරුව.
    3. ශ්‍රී ල.තො.තා.ආ. පෙලිකන් මාරුව.
    4. බදුල්ල පෙලිකන් මාරුව

- රථවාහන සංඥා ස්ථාපනය
    1. දළඳා වීදිය - යටිනුවර වීදිය
    2. යටිනුවර වීදිය - කොළඹ වීදිය
    3. හිල් වීදිය - ඩී.එස්. සේනානායක වීදිය
    4. දළඳා වීදිය - කොටුගොඩැල්ල වීදිය
    5. බදුල්ල පෙලිකන් මාරුව
    6. අනුරාධපුර නගර සභාව ඉදිරිපිට පෙලිකන් මාරුව
    7. අනුරාධපුර බස් නැවතුම්පල ඉදිරිපිට පෙලිකන් මාරුව
    8. අනුරාධපුර ආලම්කුලම ඉදිරිපිට පෙලිකන් මාරුව
- අදියර පිළියෙල කිරීමේ සැලසුම, කාලගණය හා පරීක්ෂණ මෙහෙයුම්
    1. දළඳා වීදිය - යටිනුවර වීදිය
    2. දළඳා වීදිය - කොටුගොඩැල්ල වීදිය
    3. යටිනුවර වීදිය - කොළඹ වීදිය
    4. හිල් වීදිය - ඩී.එස්. සේනානායක වීදිය
    5. බදුල්ල පෙලිකන් මාරුව
    6. බොරලැස්ගමුව හංදිය
    7. පන්නිපිටිය හංදිය
- රථවාහන සංඥා පද්ධතිය වෙනස් කිරීම
    1. වැලිකඩ මංසන්ධිය
    2. මැලිබන් මංසන්ධිය
    3. ඔරුගොඩවත්ත මංසන්ධිය
    4. කළුතර පෙලිකන් මාරුව
- මංසන්ධිවල දින දර්ශන යාවත්කාලීන කිරීම හා කාලයක් වෙනස් කිරීම්.

  සමස්ත මංසන්ධි ගණන 13
- රා.සං. නී. සං විසින්, රථවාහන සංඥා ස්ථාපනය හා නඩත්තුව සඳහා ඉදිරිපත් කරන ලද බිල්පත් පරීක්ෂාව.

විස්තරය	ප්‍රමාණය	ගණන / රු.
නව ස්ථාපනයන්	6	34,785,545.96
ස්ථාවර පිරිවැය නඩත්තුව	10	
විචල්‍ය පිරිවැය නඩත්තුව	17	
හදිසි අනතුරු අළුත්වැඩියාව	8	

- රථවාහන කළමනාකරණය සඳහා වෙනත් ආයතන විසින් සූදානම් කරන ලද රැස්වීම් වලට සහභාගි වීම.

- කොළඹ නාගරික ප්‍රදේශය තුළ උසස් රථවාහන කළමනාකරණය සඳහා කොෝ.ජා.ස.ස. යේ තාක්ෂණික සහයෝගිතා ව්‍යාපෘතිය සම්බන්ධීකරණය කිරීම.

- උ.ර.ක.ප. ව්‍යාපෘතියේ ධාරිතා ගොඩ නැගීම සඳහා සහභාගිවන්නන් සූදානම් කිරීම

  සමස්ත ධාගොව්‍යා සංඛ්‍යාව දේශීය 2 විදේශීය 1

3.15.1.3.2 හදිසි අනතුරු වලට සම්බන්ධ සංඥා වැඩ ඉටු කිරීම.

- රථවාහන සංඥා පද්ධති වලට සිදුවන හදිසි අනතුරු පරීක්ෂාව හා හානි වූ වටිනාකම් අයකර ගැනීමට කටයුතු කිරීම.

  සම්පූර්ණ හදිසි අනතුරු ගණන : 15

3.15.1.4 වෙනත් වැඩ

1. ශ්‍රීලමාඅකප දත්ත ගබඩාව සඳහා දත්ත රැස් කිරීම
2. ශ්‍රීලමාඅකප දත්ත ගබඩාව සඳහා රථවාහන සංඥා මාර්ග සලකුණු හා උස් කරන ලද පදික වේදිකා සලකුණු පිළියෙල කිරීම.
3. තලංගම පොලිස් බල ප්‍රදේශය තුළ රථවාහන තදබදය අවම කිරීමේ පියවරයන් පිළිබඳ වාර්තාව පිළියෙල කිරීම (වාර්තාව 01)
4. ශ්‍රීලමාඅකප දත්ත ගබඩාව සඳහා අවසන් වාර්තාව පිළියෙල කිරීම.
5. නි.පොෝ.ප. (රථවාහන) ගේ ඉල්ලීමට අනුව, වේග සීමා පුවරු ස්ථාපනය කළ මාර්ග කොටස් සාරාංශයක් පිළියෙල කිරීම.
6. නුගේගොඩ නාගරික සීමාවේ පාසල් සඳහා ආරක්ෂිත පදික මාරු සඳහා ඉල්ලීම පිළිබඳ වාර්තාව පිළියෙල කිරීම.
7. ලාහුගල නාගරික ප්‍රදේශයේ (කොළඹ - රත්නපුර - වැල්ලවාය - මඩකලපුව -AA004 මාර්ගයේ) ජාතික මහාමාර්ගවල වේග සීමා සවි කිරීම පිළිබඳව උපදෙස්.
8. නි.පොෝ.ප. වෙත වේග සීමා පුවරු සවි කළ මාර්ග කොටස් විස්තර ලබා දීම.
9. වැය ශීර්ෂ අංක 117-02-4-21-2014-(11) යටතේ, රථවාහන කළමනාකරණය වැඩි දියුණු කිරීම හා මාර්ග ආරක්ෂණය විෂයාංකයන් පිළිබඳ ව්‍යාපෘති අධ්‍යක්ෂ වෙතින්, ක්‍රියාකාරී සැලැස්ම.
10. සියලුම ප.හා.අ.වරුන් වෙත වේග සීමා පුවරු ස්ථාපනය කළ මාර්ග කොටස් විස්තර යවන ලෙස ඉල්ලා සිටින ලදි.
11. මාර්ග ආරක්ෂාව හා රථවාහන කළමනාකරණය සඳහා 2016 වර්ෂය වෙනුවෙන් ක්‍රියාකාරී සැලැස්ම පිළියෙල කිරීම සඳහා යෝජනා රැස් කිරීම.
12. නි.පොෝ.ප. (රථවාහන) ගේ ඉල්ලීම අනුව, යාවත් කාලීන කරන ලද වේග සීමා ස්ථාපනය කරන ලද මාර්ග කොටස් පිළිබඳ විස්තර සාරාංශ කිරීම.
13. වේග සීමා ස්ථාපනය කරන ලද මාර්ග කොටස් පිළිබඳ 2015 දක්වා ප්‍රගතිය - නි.පොෝ.ප. රථවාහන වෙත ලබාදීම.

3.16 නඩත්තු කළමනාකරණ තොරතුරු පද්ධතිය

නඩත්තු කළමනාකරණ තොරතුරු පද්ධතිය සැලසුම් අංශයේ කළමනාකරණ තොරතුරු පද්ධති ඒකකය (P4) යටතේ ක්‍රියාත්මකය. අධ්‍යක්ෂ සැලසුම් යටතේ නියෝජ්‍ය අධ්‍යක්ෂ විසින් P4 උප අංශයේ ප්‍රධානත්වය දරයි. නියෝජ්‍ය අධ්‍යක්ෂවරයා සහ සහාය කාර්ය මණ්ඩලයේ සහයෝගය ඇතිව, අතිරේක අධ්‍යක්ෂ ජනරාල් (ජාල සැලසුම්) හා අධියක්ෂ සැලසුම් අධ්‍යක්ෂ ජනරාල් වෙත වෘත්තීය සහාය ලබා දෙයි.

මා.සං.අ. යේ ප්‍රධාන සර්වරය හා විද්‍යුත් තැපැල් සර්වරය ස්ථාපිතය හා නඩත්තුව ප්‍රධාන කාර්යාලයේ ප්‍රාදේශීය ජාලය ස්ථාපිත කිරීම, අන්තර් ජාල හා විද්‍යුත් තැපැල පහසුකම් සැපයීම, මා.සං.අ. යේ වෙබ් අඩවිය වර්ධනය කිරීම හා නඩත්තුව මා.සං.අ.යේ වෙබ් පිටුව, ශ්‍රී ලංකා රාජ්‍ය ව්‍යවසාය ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාවේ වෙබ් අඩවිය තුළ පළ කිරීම හා නඩත්තු කිරීම, මහාමාර්ග තොරතුරු කළමනාකරණ පද්ධතිය ව්‍යාපෘති දත්ත ගබඩාව නඩත්තු කිරීම මගින් මා.සං.අ. විසින් ක්‍රියාත්මක කරන ව්‍යාපෘති සඳහා ව්‍යාපෘති ආවේක්ෂණ පද්ධතිය සංවර්ධනය හා නඩත්තුව, මා.සං.අ. යේ වැඩ කාර්ය මණ්ඩලයේ තො.තා. දැනුම වැඩි දියුණු කිරීම සඳහා පුහුණු වැඩ සටහන් පැවැත්වීම, මා.සං.අ. යේ අතුරු ජාලය සංවර්ධනය කිරීම හා නඩත්තු කිරීම මා.සං.අ. යේ කළමනාකරණ තොරතුරු පද්ධතිය විසින් ක්‍රියාත්මක කරනු ලබයි.

3.16.1 ජාල පරිපාලනය.

මා.සං.අ. යේ ප්‍රධාන කාර්යාලය සතුව පරිගණක 390 කින් යුත් පරිගණක ජාලයක් හා බල ප්‍රදේශ සර්වර් දෙකක් (මුදල් අංශය සඳහා වෙනම සර්වරයක් හා අනෙකුත් අංශ සඳහා වෙනම සර්වරයක් වශයෙනි) හා තැපැල් සර්වරයක් සෙත්සිරිපාය ගොඩනැගිලි පරිශ්‍රයේද පිහිටුවා ඇත. පරිගණක 390 න් 190 ක් සඳහා විද්‍යුත් තැපැල් හා අන්තර්ජාල පහසුකම් සපයා ඇත. මෙම සියලුම පරිගණක රැහැන් රහිත ප්‍රාදේශීය ජාලයකට අන්තර් සම්බන්ධ වී තිබේ. මෙම පරිගණක ජාල බල ප්‍රදේශයට නව පරිගණක හා ග්‍රාහකයන් එකතු කිරීම හා බල ප්‍රදේශයෙන් පරිගණක හා ග්‍රාහකයන් ඉවත් කිරීම සහ වෙනස් කිරීම අඛන්ඩව සිදු කිරීම අවශ්‍ය කෙරේ.

සියලුම අංශවලට ප්‍රධාන ගොනු සර්වරයේ පොදු ගොනුවක පහසුකම් ලබා ගැනීමේ හැකියාව ඇත. සෑම අංශයකම ග්‍රාහකයන්ට විවිධ මට්ටම්න් ප්‍රධාන සර්වරයට ප්‍රවේශ වීමේ වරප්‍රසාදය තිබේ. ජාලය තුළ භාවිතකරු සංලක්ෂණ හා ඔවුන්ගේ වරප්‍රසාද අඛන්ඩව ආවේක්ෂණය කරනු ලැබේ. සෑම හා සියලුම

අංශවලට ඔවුන්ගේ අංශයන් තුළ යොදා ගන්නා මුද්‍රණ යන්ත්‍ර පවතී. ප්‍රධාන කාර්යාලයේ තෝරාගත් කාර්ය මණ්ඩලයට අන්තර්ජාල පහසුකම් සපයා ඇත.

3.16.2 විද්‍යුත් තැපැල් පහසුකම් හා තැපැල් සර්වරය.

දැනට මා.සං.අ. යේ සර්වරය විසින් ප්‍රධාන කාර්යාලය හා ප්‍රාදේශීය කාර්යාල සඳහා දළ වශයෙන් විද්‍යුත් තැපැල් ගිණුම් 230 ක් පමණ පවත්වාගෙන යන අතර ව්‍යාජ විද්‍යුත් තැපැල් පණිවුඩ පෙරීමේ පහසුකම් සහිත මෘදුකාංග විසින් ව්‍යාජ විද්‍යුත් තැපැල් ශෝදනය හා පද්ධතියට අනවසර ඇතුළුවන්නන් අවහිර කිරීම් සිදු කරනු ලබයි.

මා.සං.අ. විද්‍යුත් තැපැල් සර්වරය විසින් සෑම පළාතකම කාර්ය මණ්ඩලය සඳහා නවතම විද්‍යුත් තැපැල් ගිණුම් පවත්වා ගෙන යන අතර ඔවුන් බොහෝ දෙනෙකුට විද්‍යුත් තැපැල් පරීක්ෂා කිරීමට බ්‍රෝඩ්බෑන්ඩ් සම්බන්ධතා ඇත.

3.16.3 මාර්ග සංවර්ධන අධිකාරියේ වෙබ් අඩවිය පවත්වා ගෙන යාම.

ක.තොෙ.ඒ. විසින් මා.සං.අ. යේ වෙබ් අඩවිය නඩත්තු කිරීම හා යාවත්කාලීන කිරීම සිදු කරනු ලබයි. මා.සං.අ. යේ වෙබ් අඩවියේ ප්‍රධාන යාවත්කාලීන කිරීම් / ප්‍රකාශනයන් වන්නේ, ලංසු ආරාධනයන්, දැන්වීම්, ක්‍රියාත්මක වෙමින් පවතින ව්‍යාපෘතිවල ඡායාරූප සහිත ප්‍රගති වාර්තා, අධිවේගී මාර්ග විස්තර, සිතියම්, ප්‍රසම්පාදන විස්තර හා මා.සං.අ. යේ පුහුණු අංශය විසින්, පවත්වනු ලබන පුහුණු වැඩ සටහන් වෙයි.

3.16.4 රජයේ තොරතුරු මධ්‍යස්ථානය නඩත්තු කිරීම (GIC – 1919) වෙබ් අඩවිය.

ක.තොෙ.ප. ඒකකය විසින් මහජනයාට අදාල තොරතුරු සහිතව රජයේ තොරතුරු මධ්‍යස්ථානයක් (GIC – 1919) වෙබ් අඩවියේ (www.gic.gov.lk) මා.සං.අ. වෙබ් පිටුව පවත්වා ගෙන යනු ලබයි.

3.16.5 ජාල ආරක්ෂාව ආවේක්ෂණය

පරිගණක ජාලයේ ජාල ආරක්ෂාවට එරෙහි තර්ජන වැළැක්වීමක් වශයෙන්, ක.තොෙ.ප. ඒකකය විසින්, ෆයර්වෝල් හා එන්ටර්ප්‍රයිසස් සංස්කරණයෙන් යුත් ප්‍රති වෛරස් මෘදුකාංගවලියක් සපයා ඇත. මෙම ප්‍රති වෛරස් මෘදුකාංගවලිය පරිගණක 230 කින් යුත් ජාලයක් ස්ථාපනය කර තිබේ. විද්‍යුත් තැපැල් හා අන්තර් ජාල පහසුකම් සහිත ග්‍රාහකයන්, ජාල ප්‍රහාරයකට හෝ අනවසර ඇතුළුවීමකට ලක් විය හැකි බැවින් ඔවුන් සඳහා ප්‍රමුඛත්වය ලබා දී ඇත.

3.16.6 මුදල් අංශයේ මූල්‍ය භාවිත මෘදුකාංගාවලිය

දැනට මා.සං.අ. මුදල් අංශයේ පරිගණක ජාල සංලක්ෂණ සේවා දායක පරිගණක 75 සමඟ වෙනම සර්වරයකින් හා බල ප්‍රදේශ සර්වර ව්‍යුහයක් මත පදනම් වී ඇත. මා.සං.අ. යේ මුදල් අංශය එදිනෙදා

මූල්‍ය කටයුතු සඳහා ප්‍රධාන ව්‍යවහාරික මෘදුකාංගාවලි දෙකක් භාවිතා කරනු ලබයි. ප්‍රධාන මෘදුකාංගාවලිය වැටුප් මෘදුකාංගාවලිය වන අතර, අනෙක අවන් ගිණුම් මෘදුකාංගාවලියයි.

3.16.7 ඇඟිලි සළකුණු පැමිණීමේ සටහන් පද්ධතිය

දැනට මා.සං.අ. යේ සැලසුම් අංශයේ ක.තො.ප. ඒකකය කාර්ය මණ්ඩලය විසින්, පැමිණීමේ දත්ත බාගෙන වාර්තා කිරීම සඳහා සැකසීම් කරනු ලබන අතර, ඇඟිලි සළකුණු පැමිණීමේ සටහන් පද්ධතියට අවශ්‍ය ජාලමය සහාය ලබා දෙයි. වර්තමානයේ මා.සං.අ. ප්‍රධාන කාර්යාල පරිශ්‍රයේ ඇඟිලි සලකුණු පැමිණීමේ සටහන් යන්ත්‍ර 12 ක් පවතී.

3.16.8 ඊ - පුස්තකාලය

මා.සං.අ. යේ සැලසුම් අංශයේ ක.තො.ඒ. විසින් දැනට ඊ - පුස්තකාලය ඇරඹීම සඳහා මා.සං.අ. ට අවශ්‍ය සහාය ලබා දෙයි. වෙබ් අඩවි ලිපිනය. http://www.elibrary.rda.gov.lk/

3.16.9 පුහුණු වැඩ සටහන් පැවැත්වීම

ක.තො.ප. විසින් මා.සං.අ. යේ කාර්ය මණ්ඩලයේ ඉල්ලීම මත තො.තා. දැනුම වර්ධනය කිරීම සඳහා වරින්වර පුහුණු අංශයේ පුහුණු වැඩ සටහන් පවත්වනු ලබයි.

3.17 අධිවේගී මාර්ග කළමනාකරණය

මාර්ග සංවර්ධන අධිකාරියේ අධිවේගී මාර්ග මෙහෙයුම් නඩත්තු හා කළමනාකරණ අංශය විසින් ශ්‍රී ලංකාවේ අධිවේගී මාර්ග මෙහෙයුම් නඩත්තුව හා කළමනාකරණය සිදු කරනු ලබයි. මෙම අංශය අධ්‍යක්ෂ ජනරාල්වරයා යටතේ පවතින අතර අංශයේ ප්‍රධානියා වන්නේ අධ්‍යක්ෂවරයායි. මෙම අංශයට නියෝජ්‍ය අධ්‍යක්ෂ, ප්‍රධාන ඉංජිනේරු හා ක්ෂේත්‍ර නවයකට විශේෂිත ඉංජිනේරුවන් හා කාර්ය මණ්ඩලයේ සහාය ලැබේ.

පිටත වටරවුම් මාර්ගයේ කොතලාවල - කඩවත කොටස හා අතුරුගිරිය - කඩුවෙල - කඩවත අන්තර් මාරු 2015 සැප්තැම්බර් 17 දින උත්සවාකාරයෙන් විවෘත කිරීමෙන් පසුව, අධිවේගී මාර්ගය ඉහත කී කොටස් පහසු ලෙස ක්‍රියාත්මක කිරීම සඳහා මෙහෙයුම්, නඩත්තුව හා කළමනාකරණය ක්‍රියාත්මක කිරීමේ කටයුතුද දක්ෂිණ අධිවේගී මාර්ගයේ, කොළඹ - කටුනායක අධිවේගී මාර්ගයේ හා පිටත වටරවුම් මාර්ගයේ කොට්ටාව - කොතලාවල කොටසේ කටයුතු වලට අමතරව මෙහෙයුම්, නඩත්තු හා කළමනාකරණය අ.මා.මෙ.න. හා ක. අංශයට පවරන ලදි.

3.17.1 අංශයේ ප්‍රධාන වගකීම්

- අයවැයකරණ විගණනය සමඟ අධිවේගී මාර්ගවල රථවාහන කටයුතු මෙහෙයවීම, ගාස්තු කටයුතු හා නඩත්තු කටයුතු මූලික සැලසුම්කරණය, කළමනාකරණය හා මෙහෙයවීම.
- භාවිතකරු ගාස්තු මෙහෙයුම, රථවාහන මෙහෙයුම සැලසුම් කිරීම හා නඩත්තුව සඳහා මූලික සැලසුම්කරණය.
- භාවිතකරු ගාස්තු, රථවාහන, නඩත්තුව, පරිපාලනය හා මුදල් අංශවලට අනුයුක්ත කරන නව කාර්ය මණ්ඩලය පුහුණු කිරීම.
- රථවාහන කළමනාකරණය, ගාස්තු මෙහෙයවීම මෙන්ම නඩත්තු වැඩ සඳහා ප්‍රමිති ස්ථාපිත කිරීම.
- රථවාහන අධ්‍යයනයන්, සහායක ගාස්තු අංශයට සම්බන්ධ අධ්‍යයනයක් මෙන්ම නඩත්තු වැඩ වලට සම්බන්ධ අධ්‍යයනයන් සිදු කිරීම.
- අධිවේගී මාර්ග පහසු ලෙස මෙහෙයවීම සඳහා රාජ්‍ය ආයතන හා වෙනත් ආයතන සමඟ සම්බන්ධීකරණය කිරීම.

තවද, මෙම අංශය දැනට ඉදිකිරීම් අදියරේ පවතින පිටත වටරවුම් මාර්ගයේ කඩවත - කෙරවලපිටිය කොටස, දක්ෂිණ අධිවේගී මාර්ගයේ දිගුව, වැනි බොහෝ අධිවේගී මාර්ග, අධිවේගී මාර්ග කළමනාකරණය සඳහා පවරා ගැනීමට සූදානමින් සිටී.

3.17.2 භාවිතකරු ගාස්තු ක්‍රියාත්මක කිරීම.

දක්ෂිණ අධිවේගි මාර්ගයේ, පිටත වටරවුම් මාර්ගයේ හා කොළඹ - කටුනායක අධිවේගි මාර්ගයේ භාවිතකරු ගාස්තු ක්‍රියාත්මක කිරීම වර්ෂයේ දින 365 - පැය 24 පැය 13 හා 12 වැඩමුර ක්‍රමය යටතේ සිදු කෙරෙන අඛන්ඩ මෙහෙයුමකි. මෙම මෙහෙයුම ප්‍රධාන වශයෙන් භාවිත ගාස්තු රැස් කිරීමේ අංශය, තො.තා. හා සන්නිවේදන අංශය හා විද්‍යුත් හා ඉලෙක්ට්‍රොනික අංශය ඉංජිනේරුවන්ගේ ප්‍රධානත්වයෙන් ක්‍රියාත්මක කෙරේ.

දක්ෂිණ අධිවේගි මාර්ගයේ භාවිත ගාස්තු එකතු කිරීම ජිපිආර්එස් ක්‍රමය තාප කඩදාසි ටිකට් ක්‍රමය භාවිතා කරමින්, විකුණුම් ලක්ෂයන් සහිත ක්‍රියාවලියකි. අතින් නිකුත් කරන ටිකට් භාවිතා කරනුයේ පද්ධතිය බිඳ වැටීමකදී අධිවේගි මාර්ගයේ භාවිතකරුවන්ට දුෂ්කරතා ඇතිවීම වැළැක්වීමටය. කෙසේ නමුත්, කොළඹ - කටුනායක අධිවේගි මාර්ගය ආරම්භයේදි අතින් භාවිත ගාස්තු එකතු කිරීමේ ක්‍රමය ක්‍රියාත්මක කරනු ලැබීය. පසුව 2015 ජූලි 09 දින ඉලෙක්ට්‍රොනික ගාස්තු කාඩ්පත් ක්‍රමය හඳුන්වාදුන් අතර, 2015 දෙසැම්බර් 31 දින වන විට ඉ.ගා.කා. භාවිතකරුවන් 5101 ක් ලියා පදිංචි වී තිබුනි. ඉ.ගා.කා. භාවිත කරන්නන් දිරි ගැන්වීම සඳහා 10 % ක වට්ටමක් හඳුන්වා දෙනු ලැබීය. ඉ.ගා.කා. ක්‍රමය ලංකා බැංකුවේ රැස් කිරීමේ ගිණුමක් මගින් පවත්වා ගෙන යනු ලබන අතර, පසුව එය මා.සං.අ. යේ ගිණුමකට මාරු කරනු ලැබේ. සෑම ගාස්තු කුටියකම ඉ.ගා.කා. සඳහා එක් මංතීරුවක් වෙන් කරන ලද අතර, කොන්ත්‍රාත්කරු හා සම්බන්ධීකරණය කර එය තව දුරටත් අදාල පහසුකම් වැඩි දියුණු කිරීමට කටයුතු සිදු කරමින් පවතී.





පහත සඳහන් සාධක සැලකිල්ලට ගෙන ඉ.ගා.කා. ක්‍රමය කළමනාකරණය සඳහා රඳවා ගැනීම නිර්දේශ කරනු ලැබේ.

- ඉ.ගා.කා. ක්‍රමය සජීවී පද්ධතියක් වන බැවින්, පහසු මෙහෙයුම සහතික කිරීම සඳහා හඳුනාගත් අසමත් වීම් යථාවත් කළ යුතු වේ.
- ටෙසොන්ට් සමාගමේ නීති රීති වලට අනුව, බාහිර පාර්ශවයකට වැඩ සටහන් මූලාශ්‍ර සංකේත පිටපත් කර ගත නොහැක. එබැවින්, පිටපත් කිරීමේ මෘදුකාංගයක් ස්ථාපනය කිරීම හෝ වෙනත් ලාංඡනයක් එකතු කිරීම සඳහා ටෙසොන්ට් සමාගමේ එකඟතාවය ලබා ගැනීම අනිවාර්ය වේ.
- උදාහරණ වශයෙන් මෑතකදී හඳුනාගත් විශාල මෘදුකාංගයක් විසින්, ඉ.ගා.කා. පාරිභෝගිකයන් 900 ගේ ශේෂයන් ශූන්‍ය අගයට ලබා ගනු ලැබීය. මා.සං.අ. යේ තාක්ෂණ කණ්ඩායම හා ටෙසොන්ට් ඉංජිනේරුවන් හා එක්ව, සෑම ගිණුමක්ම, එකක් බැගින් ගෙන මෙම ගැටළුව විසඳන ලදි.
- පාරිභෝගික මුදල් ආපසු ගෙවීමේදී ශේෂයන් පිළිබඳව ලංකා බැංකුව හා මා.සං.අ. අතර වෙනස්කම් පිළිබඳව ප්‍රශ්නයක් පැවතිණි. එම අවස්ථාවේදී ලංකා බැංකුවේ මෘදුකාංග පද්ධතිය ඉ.ගා.කා. පද්ධතිය දෝෂ සහගත ලෙස හඳුනාගෙන ක්‍රියාත්මක වී ඇත. මෙම ගැටළුව විසඳීම සඳහා ටෙසොන්ට් ඉංජිනේරුවන් විසින්, ඉ.ගා.කා. මෘදුකාංගයේ වෙනස්කම් සිදු කරන ලදි.
- ඉ.ගා.කා. පාරිභෝගික භාවිතය, වැඩවීම සමඟ ආයතනයේ දත්ත ගබඩාමය ප්‍රශ්න පැන නැගීම අපේක්ෂා කෙරේ.

ඉ.ගා.කා. ආදායම් ක්‍රමය යටතේ අයකැමිවරුන් විසින්, පිටවීමේ ගේට්ටුවේදී ගාස්තු අයකර භාවිත ගාස්තු එකතුව පරීක්ෂා කර අධීක්ෂණයන් විසින් කාර්යාලයට වාර්තා කිරීමෙන් පසුව දිනපතා බැංකු ගත කරනු ලැබේ.

අ.ගා.රෝ. මංතීරුවල රථවාහන තදබදය අඩු කිරීමට අතිරේක ගාස්තු මංතීරු ඉදි කිරීම.

කොළඹ - කටුනායක අධිවේගි මාර්ගයේ ඉ.ගා.රෝ. ක්‍රමය ආරම්භ කිරීමෙන් පසුව, අ.ගා.රෝ. ක්‍රමය වැඩි වූ රථවාහන ප්‍රමාණය අනුව අවශ්‍යතා ඉටු කිරීම සඳහා පවත්නා කවුළු ප්‍රමාණය ප්‍රමාණවත් නොවූ හෙයින්, ගාස්තු පිවිසුම්වල දිගු පෝලිම් ඇති විය. ජා-ඇල හා පැලියගොඩ අන්තර්මාරුවල ඉ.ගා.රෝ. භාවිතකරුවන්ට වඩා අ.ගා.රෝ. භාවිතකරුවන් සංඛ්‍යාව වැඩිවීම නිසා මෙම ගැටළුව පැන නැගුණි.

- පැලියගොඩ ගාස්තු කුටිය
- ජා-ඇල ගාස්තු කුටිය (කටුනායක දිශාවට බෑවුම සහිත පිටවීම A)
- ජා-ඇල ගාස්තු කුටිය (කොළඹ දිශාවට බෑවුම සහිත පිවිසුම D)

එබැවින් ඉහත සඳහන් ස්ථානවල අතිරේක ගාස්තු කවුළු ඉදි කිරීමට යෝජනා කරනු ලැබීය. කරුණු මෙසේ හෙයින්, ඉහත සඳහන් ස්ථානවල අතිරේක ගාස්තු කවුළු ඉදිකිරීම සඳහා මාර්ග සැලසුම් අංශය විසින් යෝජනාවක් ඉදිරිපත් කරන ලදි. එහි ප්‍රතිඵලයක් වශයෙන්, අතිරේක මංතීරු සඳහා පිරි සැකසුම් සැලසුම හා විස්තරාත්මක මට්ටමේ සැලසුම මාර්ග සැලසුම් අංශය විසින් ඉදිරිපත් කරන ලදුව, අතිරේක මංතීරු හා ගාස්තු කුටි සඳහා පිරිවැය

හා සැලසුම් යෝජනා ඉදිරිපත් කිරීමෙන් පසුව මා.සං.අ. යේ අධ්‍යක්ෂ ජනරාල් විසින්, ප්‍රධාන කොන්ත්‍රාත්කරුට ඉදිකිරීම් කොන්ත්‍රාත්තුව ප්‍රදානය කරනු ලැබිය.


3.17.2.1 අධිවේගී මාර්ගවල රථවාහන

3.17.2.1.1 දක්ෂිණ අධිවේගී මාර්ගය හා පිටත වටරවුම් මාර්ගය


වගු අංක 34: 2015 වර්ෂය තුල දක්ෂිණ අධිවේගී මාර්ගයේ හා පිටත වටරවුම් මාර්ගයේ සමස්ත රථවාහන සංඛ්‍යාව


මාසය	*රථවාහන සංඛ්‍යාව*
ජනවාරි	689,022
පෙබරවාරි	638,264
මාර්තු	708,108
අප්‍රේල්	768,127
මැයි	766,958
ජූනි	678,377
ජූලි	748,571
අගෝස්තු	841,731
සැප්තැම්බර්	884,120
ඔක්තොම්බර්	1,058,074
නොවැම්බර්	1,060,802
දෙසැම්බර්	1,281,218
එකතුව	***10,123,372***

පෙර වර්ෂවල රථවාහන සංඛ්‍යාවන් සංසන්දනය පහත දැක්වේ.


1400000
1200000
1000000
800000
600000
400000
200000
0
රථවාහන
ජනවාරි
පෙබරවාරි
මාර්තු
අප්‍රේල්
මැයි
ජූනි
ජූලි
අගෝස්තු
සැප්තැම්බර්
ඔක්තෝම්බර
නොවැම්බර්
දෙසැම්බර්
2011 - නොවැ.27-දෙසැ.31 18,168 269,509
2012 281,425 257,155 259,819 292,805 279,323 268,077 270,025 317,475 292,502 299,106 285,407 358,593
2013 349,504 314,979 347,588 370,581 344,053 317,677 333,405 384,631 345,141 363,466 361,081 451,763
2014 391,228 392,165 536,374 639,728 612,500 563,810 584,998 677,447 608,203 624,821 603,374 733,962
2015 689,022 638,264 708,108 768,127 766,958 678,377 748,571 841,731 884,120 1,058,07 1,060,80 1,281,21
මාසය
2011 - නොවැ.27- දෙසැ. 31
2012
2013
2014
2015

2015 වර්ෂයේ, දක්ෂිණ අධිවේගී මාර්ගයේ හා පිටත වටරවුම් මාර්ගයේ වාර්ෂික සාමාන්‍ය දෛනික රථවාහන සංඛ්‍යාව 27,735 කි. 2015 වර්ෂය තුළද දක්ෂිණ අධිවේගී මාර්ගයේ ධාවනය වූ සමස්ත වාහන වලින් 1 වැනි කාණ්ඩයේ වාහන ප්‍රමාණය 92% කි.






3.17.2.1.2 කොළඹ - කටුනායක අධිවේගී මාර්ගය

වගු අංක. 35: 2015 වර්ෂය තුල කොළඹ - කටුනායක අධිවේගී මාර්ගයේ අ.ගා.ර. රථවාහන සංඛ්‍යාව


මාසය	රථවාහන සංඛ්‍යාව
ජනවාරි	579,351
පෙබරවාරි	541,630
මාර්තු	601,901
අප්‍රේල්	581,935
මැයි	604,663
ජුනි	596,846
ජූලි	634,517
අගෝස්තු	641,363
සැප්තැම්බර්	607,457
ඔක්තොම්බර්	595,562
නොවැම්බර්	570,763
දෙසැම්බර්	704,721
එකතුව	*7,260,709*

2015 වර්ෂය තුල කොළඹ - කටුනායක මාර්ගයේ සාමාන්‍ය දෛනික අ.ගා.ර. රථවාහන සංඛ්‍යාව 19,892 කි.


පෙර වර්ෂවල රථවාහන සංඛ්‍යාව සංසන්දනය පහත සඳහන් වේ.



2015 වර්ෂයේ අ.ගා.රැ. වාහනවල සමස්ත සංයුතිය පහත දැක්වේ.




2015 වර්ෂය තුල අ.ගා.රැ. වාහනවල සමස්තය අන්තර් මාරු අතර බෙදීයාම පහත සඳහන් වේ.




වගු අංක 36: 2015 වර්ෂයේ කොළඹ - කටුනායක අධිවේගී මාර්ගයේ සමස්ත අ.ගා.ඍ. වාහන සංඛ්‍යාව

මාසය	රථ වාහන සංඛ්‍යාව
ජනවාරි	
පෙබරවාරි	
මාර්තු	
අප්‍රේල්	
මැයි	
ජූනි	120
ජූලි	5,649
අගෝස්තු	29,305
සැප්තැම්බර්	45,132
ඔක්තොම්බර්	53,652
නොවැම්බර්	54,832
දෙසැම්බර්	61,155
එකතුව	249,845


2015 වර්ෂයේ දෛනික සාමාන්‍ය ඉ.ගා.ඍ. රථවාහනවල විචල්‍යනය පහත සටහනින් දැක්වේ.



2015 වර්ෂයේ රථවාහන සංයුතිය පහත දැක්වේ.





2015 වර්ෂය තුල ඉ.ගා.රැ. වාහන අන්තර් මාරු අතර බෙදී යාම පහත සඳහන් වේ.



වගු අංක 37 : 2015 වර්ෂය තුල කොළඹ - කටුනායක මාර්ගයේ සමස්ත රථවාහන සංඛ්‍යාව

මාසය	රථවාහන සංඛ්‍යාව
ජනවාරි	579,351
පෙබරවාරි	541,630
මාර්තු	601,901
අප්‍රේල්	581,935
මැයි	604,663
ජුනි	596,966
ජුලි	640,166
අගෝස්තු	670,668
සැප්තැම්බර්	652,589
ඔක්තොම්බර්	649,214
නොවැම්බර්	625,595
දෙසැම්බර්	725,876
එකතුව	7,510,554




දෛනික සාමාන්‍ය රථවාහන (ADT)
25000
20000
15000
10000
5000
0
රථවාහන
2013
2014
2015
ජන. -00
මාසය


3.17.2.2 අධිවේගී මාර්ගවල ගාස්තු ආදායම

3.17.2.2.1 2015 වර්ෂයේ දක්ෂිණ අධිවේගී මාර්ගයේ හා පිටත වටරවුම් මාර්ගයේ ගාස්තු ආදායම්.

වගු අංක. 38 : 2015 වර්ෂය තුළ දක්ෂිණ අධිවේගී මාර්ගයේ හා පිටත වටරවුම් මාර්ගයේ ගාස්තු ආදායම

මාසය	ආදායම (රු. මිලියන)
ජනවාරි	223.86
පෙබරවාරි	210.17
මාර්තු	231.66
අප්‍රේල්	251.69
මැයි	244.72
ජුනි	217.26
ජූලි	240.32
අගොස්තු	267.61
සැප්තැම්බර්	269.23
ඔක්තොම්බර්	296.47
නොවැම්බර්	300.90
දෙසැම්බර්	374.21
එකතුව	*3,128.10*


2015 වර්ෂය තුල පිටත වටරවුම් මාර්ගයේ මාසික ගාස්තු ආදායම පෙර වර්ෂ සමඟ සැසඳීම පහත දැක්වෙන පරිදි රූ සටහනකින් දැක්විය හැක.



	ජනවාරි	පෙබරවාරි	මාර්තු	අප්‍රේල්	මැයි	ජූනි	ජූලි	අගෝස්තු	සැප්තැම්බර්	ඔක්තෝම්බර්	නොවැම්බර්	දෙසැම්බර්
2011 නොවැ. 27 - දෙසැම්.31											3.84	76.85
2012	82.59	76.71	77.26	87.91	81.42	78.26	80.29	92.63	87.64	88.88	81.07	104.48
2013	103.26	94.56	104.16	110.55	99.76	91.71	98.35	112.71	102.55	105.45	103.26	132.71
2014	125.62	116.21	157.36	166.55	177.87	185.14	182.16	215.89	195.36	197.27	192.99	239.85
2015	223.86	210.17	231.66	251.69	244.72	217.26	240.32	267.61	269.23	296.47	300.90	374.21

2015 වර්ෂය තුල දක්ෂිණ අධිවේගි මාර්ගයේ හා පිටත වටරවුම් මාර්ගයේ වාර්ෂික සාමාන්‍ය දෛනික ආදායම රු.මිලියන 8.57 කි.

2015 වර්ෂය සඳහා දක්ෂිණ අධිවේගි මාර්ගයේ හා පිටත වටරවුම් මාර්ගයේ අන්තරුමාරු අතර ආදායම බෙදී යාම පහත සඳහන් පරිදි දැක්විය හැකිය.




3.17.2.2.2 කොළඹ - කටුනායක අධිවේගි මාර්ගයේ ගාස්තු ආදායම


වගු අංක 39. : 2015 වර්ෂය තුල කොළඹ - කටුනායක මාර්ගයේ අ.ගා.රැ. අදායම

මාසය	ආදායම (රු.මිලියන)
ජනවාරි	167.62
පෙබරවාරි	157.07
මාර්තු	173.62
අප්‍රේල්	168.17
මැයි	174.20
ජුනි	172.43
ජුලි	184.23
අගෝස්තු	182.15
සැප්තැම්බර්	177.06
ඔක්තොම්බර්	173.66
නොවැම්බර්	166.31
දෙසැම්බර්	205.19
එකතුව	2101.71


2015 වර්ෂය තුල කොළඹ - කටුනායක අධිවේගී මාර්ගයේ වාර්ෂික සාමාන්‍ය අ.ගා.රැ. ආදායම රු.මිලියන 5.76 කි.



2015 වර්ෂය තුල කොළඹ - කටුනාකය අධිවේගී මාර්ගයේ කාණ්ඩ පදනමට අනුව අ.ග.රැ. ආදායම බෙදී යාම පහත දැක්වේ.



2015 වර්ෂය තුල කොළඹ - කටුනායක මාර්ගයේ අන්තර් මාරු අතර අ.ගා.ර. ආදායම බෙදීයාම පහත සඳහන් පරිදි රූ සටහනකින් දැක්විය හැකිය.




වගු අංක. 40 : 2015 වර්ෂය තුල කොළඹ - කටුනායක අධිවේගී මාර්ගයේ ඉ.ගා.ර. ආදායම

මාසය	*ආදායම (රු. මිලියන)*
ජනවාරි	
පෙබරවාරි	
මාර්තු	
අප්‍රේල්	
මැයි	
ජූනි	0.039
ජූලි	1.371
අගෝස්තු	6.929
සැප්තැම්බර්	11.034
ඔක්තොම්බර්	13.318
නොවැම්බර්	13.634
දෙසැම්බර්	15.289
එකතුව	61.615

2015 වර්ෂය තුල කොළඹ - කටුනායක අධිවේගී මාර්ගයේ දෛනික සමාන්‍ය අ.ගා.ර. ආදායම රු.මිලියන **0.17** කි.


2015 වර්ෂය තුල ඉ.ගා.රේ. මාසික සාමාන්‍ය විචලනය පහත දැක්වෙන පරිදි රූ සටහනකින් දැක්විය හැකිය.



වගු අංක .41 : කොළඹ - කටුනායක අධිවේගී මාර්ගයේ 2015 වර්ෂය තුල සමස්ත ගාස්තු ආදායම

මාසය	ආදායම (රු. මිලියන)
ජනවාරි	167.62
පෙබරවාරි	157.07
මාර්තු	173.62
අප්‍රේල්	168.17
මැයි	174.20
ජුනි	172.47
ජූලි	185.60
අගෝස්තු	189.08
සැප්තැම්බර්	188.09
ඔක්තොම්බර්	186.97
නොවැම්බර්	179.95
දෙසැම්බර්	220.48
එකතුව	2163.33

2015 වර්ෂය තුල කොළඹ - කටුනායක අධිවේගී මාර්ගයේ දෛනික සාමාන්‍ය ඉ.ගා.රේ. ආදායම රු.මිලියන 5.93 කි.



3.17.2.3 කො.කා., විදුලි සංදේශ වැඩ, විද්‍යුත් හා ඉලෙක්ට්‍රොනික වැඩ.

මෙම වැඩ අධිවේගී මාර්ගවල බාධාවකින් තොරව, ගාස්තු අය කිරීම සඳහා සන්නිවේදනය හා රථවාහන කළමනාකරණ පද්ධතිය ආවේක්ෂණය සහතික කිරීම බොහෝ සේ අවශ්‍ය වේ. මෙයට අධිවේගී මාර්ග කාර්යක්ෂම හා සඵලදායී මෙහෙයවීම සඳහා අවශ්‍යතා හඳුනා ගැනීම, සැලසුම් නිර්මාණය, පරිගණක හා පරිගණක ජාල පදනම් කරගත් පද්ධති හා භාවිතකරු ගාස්තු රැස් කිරීමේ පද්ධතිය, තෘප්ති කළමනාකරණ පද්ධතිය, වත්කම් කළමනාකරණ පද්ධතිය ආදිය ඇතුළත් වේ. ඉහත සඳහන් වගකීම් වලට අමතරව, මෙම අංශය, අවදානම් විශ්ලේෂණය, දත්ත පද්ධතියේ අසමත්වීම්, යථාවත් අවස්ථා කළමනාකරණය හා මෙහෙයුම් ආදිය සඳහා නව ජාල හා තොරතුරු පද්ධතිවල හා විද්‍යුත් හා ඉලෙක්ට්‍රොනික පද්ධති පිළිබඳ පර්යේෂණ හා සංවර්ධනයද මෙම අංශය විසින් මෙහෙයවනු ලබයි.

2015 වර්ෂය තුළ ක්‍රියාත්මක කරන ලද කාර්යයන් ;

- කොතලාවල - කඩවත කොටස විවෘත කිරීමත් සමඟ තත්ත්වය නංවන ලද ගාස්තු පද්ධතිය පහසු ලෙස ක්‍රියාත්මක කිරීම සහතික කිරීමට, අධිවේගී මාර්ග විවෘත කිරීමට සමාන්තරව, ප්‍රධාන සර්වරයේ ධාරිතාව ඉහළ නංවනු ලැබීය.
- අවසර පත්‍ර නිකුත් කිරීමේදී ඇතිවන ප්‍රමාදය අවම කිරීම සඳහා අවසර පත්‍ර භාවිතය වැඩි දියුණු කිරීම මෙන්ම ගාස්තු පද්ධති වාර්තා වැඩි දියුණු කිරීම

- නඩත්තු ගිවිසුම් කාලසීමාව තුල කොළඹ - කටුනායක අධිවේගි මාර්ගයේ ඉ.ගා.රැ. පද්ධතිය හා පාරිභෝගික සේවා මධ්‍යස්ථානයේ තාක්ෂණික දෝෂ පිළිබඳව කටයුතු කිරීම, දැනුම් දීම හා පරීක්ෂාව.
- විශේෂ ව්‍යාපෘති කළමනාකරන ඒකකය, ව්‍යාපෘති උපදේශක හා ජපාන රජයේ සහාය ඇතිව, දක්ෂිණ අධිවේගි මාර්ගයේ නැණවත් ප්‍රවාහන ක්‍රමයක් සඳහා සැලසුම් සමාලෝචන ක්‍රියාත්මක කිරීම, අධීක්ෂණය, මෙහෙයුම් හා නඩත්තු පුහුණුව.
- අධිවේගි මාර්ග ජාලය පුළුල් කිරීමත් සමඟම සිසිටිවි කැමරා පද්ධතිය, සිසිටිවි වීඩියෝ කළමනාකරණ මෘදුකාංග තත්ත්වය නැංවීමත් සමඟ පුළුල් කිරීම සහ IP දුරකථන පද්ධතිය පුළුල් කිරීම.
- නේවාසික තත්ත්වය ශක්තිමත් කිරීම හා ක්ෂණික සුළු මට්ටමේ අළුත්වැඩියාවල සිට මධ්‍යම මට්ටමේ අළුත්වැඩියා සහ ස්ථාපනය කිරීමේ වැඩ සඳහා ඉලෙක්ට්‍රොනික හා පරිගණක අළුත්වැඩියා ඒකකය ක්‍රියාත්මක කිරීම.
- සර්වර් කාමරය සඳහා මධ්‍ය අඛන්ඩ බලය සැපයුමේ බැටරි ධාරිතාමය පද්ධති විශ්වාසනීයත්වය වැඩි දියුණු කිරීම සහ කොටටාව අන්තයේ සිට 1969 හදිසි දුරකථන අංකය සඳහා අමතර සම්බන්ධතාවක් වර්ධනය කිරීම.
- උඩිස් දෘෂ්‍යය රැහැන් නඩත්තු වැඩ.
- ගාස්තුකරණ, ආවේශක හා සන්නිවේදන පද්ධති හා ඊට සම්බන්ධිත උප පද්ධති සඳහා නිවාරණ හා නිරවද්‍යකරණ සැසි පැවැත්වීම.
- වීදි ලාම්පු, යාන්ත්‍රික බාධක, රථවාහන සංඥා ආලෝක, විදුලි ජනක, කාර්යාල බල පද්ධති හා වායු සමීකරණ පද්ධතිවල සාමාන්‍ය නඩත්තුව





- අන්තර්ඡේදන හා පදික මාරු සහ වාහන උඩිස් මාර්ග, උමං මාර්ග හා පාලම් අසල වීදි ලාම්පුවල විදුලිමය නඩත්තුව.



වීදි ලාම්පු සවි කිරීම හා හදිසි අනතුරු නිසා හානියට පත් යාන්ත්‍රික බාධක ප්‍රතිසම්පාදනය කිරීම.


3.17.3 රථවාහන මෙහෙයුම.

දක්ෂිණ අධිවේගි මාර්ගයේ හා කොළඹ - කටුනායක අධිවේගි මාර්ගයේ රථවාහන මෙහෙයුම පැය 13-12 වැඩමුර ක්‍රමයන් යටතේ, පැය 24 පුරා දින 365 ක අඛණ්ඩ මෙහෙයුමකි. මෙය ප්‍රධාන වශයෙන්, අධිවේගි මාර්ගවල රථවාහන ආරක්ෂාව හා රථවාහන ප්‍රවාහයේ ප්‍රශස්ත තත්ත්වය සහතික කිරීම සඳහාය. රථවාහන පාලකවරුන්, පහත දැක්වෙන කාර්යයන් ඉටු කිරීම මගින්, අධිවේගි මාර්ගවල එදිනෙදා හා හදිසි තත්ත්වයන් යටතේ පරීක්ෂාවේ යෙදෙන පිරිසකි.

- රථවාහන මෙහෙයුම් මධ්‍යස්ථාන වලට නියම වේලාවට තොරතුරු සැපයීම මගින්, විවිධ හදිසි අනතුරු සඳහා ක්ෂණිකව ක්‍රියාත්මක වීම හා ඒවා ආරක්ෂිතව කළමනාකරණය කිරීම.
- අක්‍රීය වූ වාහන පිළිබඳව කටයුතු කිරීම හා හා අධිවේගි මාර්ගයේ හරවාගෙන යාම හෝ අධිවේගි මාර්ගයේ ආරක්ෂිතව ධාවනය කිරීම.
- අධිවේගි මාර්ගයේ බාධක ඉවත් කිරීම.
- අධිවේගි මාර්ගයේ ගමන් කරන්නන් හෝ වෙනත් පාර්ශවයන්වල නීති විරෝධී කටයුතු පරීක්ෂාව, ඒ පිළිබඳව පියවර ගැනීම.
- අධිවේගි මාර්ග ගොඩනැගිලි සංකීර්ණය තුල හෝ බාහිර ගොඩනැගිලිවල කවර හෝ අසාමාන්‍ය තත්ත්වයන් පවතින්නේ නම් හා එය අධිවේගි මාර්ග දේපල වලට හානිකර ලෙස බලපාන්නේ නම් පහසු මෙහෙයුම සඳහා පරීක්ෂා කිරීම.

අධිවේගී මාර්ගවල හදිසි සිදුවීම් කළමනාකරණයන් පහත දැක්වෙන පරිදි විස්තර කළ හැකිය.

හදිසි සිදුවීම් කළමනාකරණය



3.17.3.1 අධිවේගී මාර්ගයේ හදිසි අනතුරු දත්ත

වගු අංක. 42 : 2015 වර්ෂයේ සමස්ත හදිසි අනතුරු සාරාංශය - දක්ෂිණ අධිවේගී මාර්ගය

මාසය	බරපතල	වේදනාත්මක	වේදනාත්මක නොවන	දේපල හානි	සමස්ත හදිසි අනතුරු ගණන
ජනවාරි	0	3	4	50	57
පෙබරවාරි	1	0	5	52	58
මාර්තු	0	1	5	64	70
අප්‍රේල්	1	3	6	49	59
මැයි	0	5	6	75	86
ජූනි	0	1	3	76	80
ජූලි	0	1	7	83	91
අගෝස්තු	0	2	5	72	79
සැප්තැම්බර්	0	4	1	95	100
ඔක්තෝම්බර්	0	1	3	79	83
නොවැම්බර්	0	2	6	70	78
දෙසැම්බර්	1	0	6	94	101
සමස්ත සාරාංශය	3	23	57	859	942

වගු අංක. 43 : 2015 වර්ෂයේ සමස්ත හදිසි අනතුරු සාරාංශය - කොළඹ - කටුනායක අධිවේගී මාර්ගය

මාසය	මරපතල	වේදනාත්මක	වේදනාත්මක නොවන	දේපල හානි	සමස්ත හදිසි අනතුරු ගණන
ජනවාරි	0	2	0	17	19
පෙබරවාරි	0	0	0	13	13
මාර්තු	0	2	0	13	15
අප්‍රේල්	0	0	0	06	06
මැයි	0	0	0	13	13
ජුනි	0	1	0	16	17
ජුලි	0	0	0	17	17
අගෝස්තු	0	0	2	14	16
සැප්තැම්බර්	0	1	2	12	15
ඔක්තොම්බර්	0	0	1	15	16
නොවැම්බර්	0	0	1	18	19
දෙසැම්බර්	0	0	0	26	26
සමස්ත සාරාංශය	*0*	*6*	*6*	*180*	*192*

අධිවේගී මාර්ගවල හදිසි අනතුරු වලින් 90% කට වඩා අධික සංඛ්‍යාවක් **"දේපල හානි"** ගණයට අයත් වේ.

3.17.3.2 අධිවේගී මාර්ගවල වාහන ආපදාවට පත්වීම පිළිබඳ දත්ත

වගු අංක. 44 : 2015 වර්ෂය තුල දක්ෂිණ අධිවේගී මාර්ගයේ වාහන ආපදාවට පත්වීම පිළිබඳ සාරාංශය.

මාසය	තාපය	එංජින් ප්‍රශ්න	ටයර් සිදුරු වීම	ඉන්ධන ගැටළු	බැටර් හා ඉලෙක්ට්‍රොනික ප්‍රශ්න	පවි/රැහැන් හානිය	වෙනත්	සමස්ත ආපදා සංඛ්‍යාව
ජනවාරි	276	89	252	52	46	29	20	764
පෙබරවාරි	215	95	203	44	31	24	35	647
මාර්තු	185	143	156	86	58	36	31	695
අප්‍රේල්	295	145	271	82	32	30	13	868
මැයි	273	94	262	52	54	31	30	796
ජුනි	215	94	207	26	40	20	14	616
ජුලි	211	144	139	82	50	32	7	665
අගෝස්තු	275	95	247	64	42	47	19	789
සැප්තැම්බර්	235	150	141	72	47	28	5	678
ඔක්තොම්බර්	297	110	229	69	29	13	3	750
නොවැම්බර්	274	120	219	65	28	12	2	720
දෙසැම්බර්	385	179	211	162	43	26	8	1014
එකතුව	*3136*	*1458*	*2537*	*856*	*500*	*328*	*187*	*9002*

වගු අංක. 45 : 2015 වර්ෂය තුල කොළඹ - කටුනායක අධිවේගී මාර්ගයේ වාහන ආපදා සාරාංශය

මාසය	කාපය	එංජින් ප්‍රශ්න	ටයර් සිදුරු වීම	ඉන්ධන ගැටළු	බැටර් හා ඉලෙක්ට්‍රෝ-නික ප්‍රශ්න	පටි/රෙදැන් හානිය	වෙනත්	සමස්ත ආපදා සංඛ්‍යාව
ජනවාරි	30	63	30	13	6	7	2	151
පෙබරවාරි	35	67	20	8	4	2	3	139
මාර්තු	45	52	19	10	6	3	5	140
අප්‍රේල්	40	47	10	14	5	3	6	125
මැයි	49	58	16	6	7	4	6	146
ජූනි	38	46	13	14	6	3	5	125
ජූලි	39	58	23	12	6	4	4	146
අගෝස්තු	36	45	20	15	4	6	4	130
සැප්තැම්බර්	34	34	18	9	6	7	4	112
ඔක්තොම්බර්	43	61	25	16	3	5	3	156
නොවැම්බර්	38	47	31	11	2	7	3	139
දෙසැම්බර්	45	58	49	23	9	7	5	196
එකතුව	472	636	274	151	64	58	50	1705

3.17.4 අධිවේගී මාර්ග නඩත්තුව

අධිවේගී මාර්ග නඩත්තුව දක්ෂිණ අධිවේගී මාර්ගයේ (බණ්ඩාරගම - දොඩංගොඩ - මීගම හා උඩුකාව) උප ඒකක 5 ක් මගින් හා (කොළඹ - කටුනායක මාර්ගයේ) වෙඩිකන්ද කාර්යාලය මගින් ක්‍රියාත්මක කරනු ලැබේ. සෑම ඒකකයක්ම, නඩත්තු ඉංජිනේරුවන්ගේ මග පෙන්වීම යටතේ, කාර්මික සහකාර හා කාර්මික නිලධාරීන් විසින් අධීක්ෂණය කරනු ලබයි. 2015 ඔක්තෝම්බර් මස වන විට සමස්ත කම්කරු බලකාය 178 විය.

මෙම කම්කරුවන්, පැලෑටි පාලකයන්, පෑස්සුම්කරුවන්, වඩු කාර්මිකයන්, කම්හල්කරුවන් පෙදරේරුවන්, යාන්ත්‍රිකයන්, රථවාහන පාලක සහායකයන් ආදිහූ වෙති.

3.17.4.1 පැලෑටි පාලනය.

එදිනෙදා පැලෑටි පාලනය කඩවත - කොට්ටාව, කොට්ටාව - ගැලනිගම, ගැලනිගම - වැලිපැන්න, වැලිපැන්න - බද්දේගම, බද්දේගම - ගොඩගම, පැලියගොඩ නව කැලණි පාලම, කටුනායක ගුවන් තොටුපල අන්තය ප්‍රධාන අධිවේගී මාර්ගවල අධිවේගී මාර්ග ප්‍රවේශයන්, අන්තර්මාරු පරිශ්‍රයන්, ප්‍රධාන කාර්යාල පර්ශ්‍රය, මීගම නඩත්තු කාර්යාල පරිශ්‍රය හා පෝද්දල ගබඩා පරිශ්‍රයේ ක්‍රියාත්මක කරන ලදි. ප්‍රධාන අනුරේඛනයට වේදිකා අන්තය, මංතීරු 6 ක පුළුල් කිරීම් කොටස්, ඉවුරු බෑවුම්, කැපුම් බෑවුම් හා මධ්‍ය දූපත් (කොළඹ - කටුනායක අධිවේගී මාර්ගය හා පිටත වටරවුම් මාර්ගය පමණි) අයත්ය. තවද

ව්‍යුහයන්හි පැලෑටි පාලනයට හා කපා දැමීමෙන් පාලනය කල නොහැකි මානා හා ඉලුක් පැලෑටි උදුරා දැමීම කෙරේ විශේෂ අවධානය යොමු කරන ලදි.

කොට්ටාව භූමි අලංකරණ ප්‍රදේශය නවීකරණය කරන ලද අතර, නව ගස් වර්ග සිටුවා නඩත්තු කිරීම සිදු කරනු ලැබිය.

3.17.4.2 හදිසි අනතුරු හානි අලුත්වැඩියාව

හදිසි අනතුරු අලුත්වැඩියාව අ.මා.මෙ.න. හා ක. අංශයේ ආරක්ෂණ කටයුතුවල මග පෙන්වීම හා අධීක්ෂණය යටතේ කුලී කොන්ත්‍රාත්කරුවෙකු මගින් සිදු කරනු ලැබේ. දැනට හානි වලින් 60% ක් අලුත්වැඩියා කර ඇති අතර, ආරක්ෂණ වාහන හා අබන්ඩ වර්ෂාව වැඩවලට බාධා වී ඇත. හානි වූ සංඥා පුවරු වෙනුවට නව සංඥා පුවරු සවි කිරීම කොන්ත්‍රාත් මගින් නිර්මාණය කිරීමෙන් පසුව සෘජු කම්කරු ක්‍රමය යටතේ සිදුකරන ලදි.





3.17.4.3 කාණු නඩත්තුව.

මාර්ග භාවිතකරුවන්ගේ ආරක්ෂාව සහතික කිරීමට රථ මාර්ගයන් සහ බෑවුම්වලින් (කපන ලද බෑවුම් හා ඉවුරු) ගලා යන ජලය සඳහා ප්‍රමුඛත්වය දෙන ලදි.

රොන්මඩ තැන්පත් වූ බෝක්කු හා ඇල මාර්ග දෘෂ්‍යමාන පරීක්ෂනවලින් හා මහජන පැමිණිලිවලින් හඳුනා ගනු ලැබේ. මේවා කුලියට ලබාගත් කුඩා කැණීම් යන්ත්‍ර මගින් මෙන්ම මිනිස් ශ්‍රමයෙන්ද පිරිසිදු කරනු ලබයි. ඇතැම් විට වැඩවල ඵලදායිතාව වැඩි දියුණු කිරීමට පිරිසිදු කිරීමේ වැඩ අධිවේගී මාර්ග ප්‍රවේශයන්ගෙන් බැහැරව පුළුල් කරන අතර (මාර්ග අයිතියෙන් පිටතට) අධිවේගී මාර්ග දිගට ඇති කාණු කැණීම් යන්ත්‍ර හා කම්කරු බලකාය විසින් පිරිසිදු කරනු ලැබේ.

3.17.4.4 බෝක්කු හා වැට විවෘත වූ තැන් වසා දැමීම.

අධිවේගී මාර්ග ගොඩනැගිලි සංකීර්ණ පිටතට නිරාවරණය වූ බෝක්කු කටවල් වලින් සතුන් ඇතුළුවීම වැළැක්වීම සඳහා වසා දමනු ලබයි. මෙහි සුන්බුන් එකතු වීම නිසා බෝක්කු අවහිර වීම වැළැක්වීම සඳහා වානේ දැල් භාවිතා කර සිදුරු වසා දමනු ලබයි. එසේම වැට පතුල සිදුරු තුලින් සතුන් ඇතුළුවීම වැළැක්වීමට පාස්සන ලද පටි යොදා වසා දමනු ලැබේ.



තවද මාර්ග භාවිතාකරන්නන්ගේ ආරක්ෂාව සහතික කිරීමට අධිවේගී මාර්ග සීමාවට ඇතුළු වූ සුනඛයන් ආරක්ෂිතව ඉවත් කිරීම සඳහා සත්ත්ව වෛද්‍යවරයෙකුගේ සහාය ඇතිව පියවර ගන්නා ලදි.

3.17.4.5 ගාස්තු කවුළු බිම් හා සංඥා පුවරු පිරිසිදු කිරීම

ගාස්තු කවුළු බිම්වල දූවිලි හා තෙල් පැල්ලම් හැකිතාක් දුරට පිරිසිදු කරනු ලැබීය. කොට්ටාව හා පින්නදූව ගාස්තු කවුළු බිම්, කොන්ත්‍රාත්කරුවෙකු මගින් මසකට දෙවරක් පිරිසිදු කිරීම සිදු කරන ලදි.
අධිවේගී මාර්ගවල පැ.කි.මී. 100 හා කිලෝමීටර් ලකුණු කළ කණු හැර සියලුම සංඥා පුවරු 2015 වර්ෂය තුල දෙවරක් පිරිසිදු කරනු ලැබීය.





3.17.4.6 කවුළු මුදුන් මත මල් පැල නඩත්තු කිරීම

ගාස්තු කවුලු අසල මල් පැලවල මාසිකව වල් පැල ඉවත් කිරීම හා පොහොර යෙදීමේ නඩත්තුව සිදු කරන ලදි.

3.17.4.7 මධ්‍ය දූපත්වල පැලෑටි වලට ජලය යෙදීම හා නඩත්තු කිරීම

මාර්ග අයිතිය වැට අසල හා අන්තර්මාරුවල මධ්‍ය දූපත්වල පැලෑටි වලට ජලය යෙදීම, "ක්‍රිස්ටිනා" හා "බෝගන්විලා" පැලෑටි නඩත්තුව, මධ්‍ය දූපත් U – හැඩයේ කාණු පිරිසිදු කිරීම හා මා.අ. වැට අසල බාදනය වූ ස්ථානවල හා ඉවුරු හා බෑවුම්වල තණ පිඩැලි නොමැති තැන්වල කලුගල් ගොඩ ගැසීම හා තැලීම කොළඹ - කටුනායක අධිවේගි මාර්ගයේ සිදු කරන ලද ප්‍රධාන නඩත්තු කටයුතු කිහිපයකි.

3.17.4.8 දක්ෂිණ අධිවේගි මාර්ගයේ පාලම් තාප්ප දිගට ප්‍රතිබිම්බක ස්ථාපනය කිරීම

පාලම් තාප්ප දිගට ප්‍රතිබිම්බකයන් නොතිබීම නිසා සහ විදුලිය බිඳ වැටීම් නිසා එම ස්ථානයන් අඳුරු වීම සහ රථවාහන ආරක්ෂණ ගැටළු මතුවී තිබුණි. මෙම අවශ්‍යතාව සපුරාලීම සඳහා පාලම් තාප්පවල ප්‍රති බිම්බක සවි කරන ලදි.

3.17.4.9 පිටත වටරවුම් මාර්ගයේ අතුරුගිරිය - කඩවත කොටස සඳහා නව පූර්ව දිශා / තොරතුරු සංඥා පුවරු හඳුන්වා දීම.

මා.සං.අ. යේ සභාපතිවරයා සමඟ සිදු කරන ලද සාකච්ඡාවට හා ඇමතුම් මධ්‍යස්ථානයට ලැබුණු මහජන පැමිණිලි අනුව පිටත වටරවුම් මාර්ගයේ අතුරුගිරිය - කඩවත කොටස මෙන්ම දක්ෂිණ අධිවේගි මාර්ගය සඳහා පූර්ව දිශා / තොරතුරු සංඥා පුවරු කීපයක් හඳුන්වා දෙනු ලැබීය. ඇතැම් සංඥා පුවරු දැනටමත් නිම කර ඇති අතර, පි.ව.මා. යේ කොන්ත්‍රාත්කරු (II අදියර) ඒවා ස්ථාපනය කිරීමේ වැඩ ආරම්භ කරනු ලැබීය. වෙනත් සංඥා පුවරු පිළිබඳව සැලසුම් අංශය සමඟ සාකච්ඡා කර තීරණය කිරීමට ඇත.

3.17.4.10 මහජන පැමිණිලි පිළිබඳව කටයුතු කිරීම

ගොවිතැන්, ප්‍රවේශ මාර්ග ගැටළු, කාණු පිළිබඳ ගැටළු ආදිය පිළිබඳව මහජන පැමිණිලි වලට ප්‍රතිචාර දැක්වූ අතර ඒ පිළිබඳ නිතිපතා කටයුතු කරන ලදි.

3.17.4.11 ගොඩනැගිලි හා ප්‍රයෝජ්‍ය සේවා නඩත්තුව

බොහෝ ජනකායක් විසින් ගොඩනැගිලි විශාල ප්‍රමාණයක් භාවිතා කරන බැවින්, නිතිපතා ගොඩනැගිලි නඩත්තු වැඩ මනා අවධානයකින් යුක්තව සිදු කරනු ලැබේ.

අ.මා.මෙ.න.හා ක. අංශයේ ප්‍රධාන කාර්යාලයට යාබද ගොඩනැගිල්ල සම්පූර්ණ අළුත්වැඩියා කර අධ්‍යක්ෂ (අ.මා.මෙ.න. හා ක.), යාන්ත්‍රික කාර්ය මණ්ඩලය, විදුලිය නඩත්තු කාර්ය මණ්ඩලය හා සිවිල් නඩත්තු කාර්ය මණ්ඩලය එහි ස්ථානගත කරනු ලැබීය.

අන්තර්මාරු ස්ථානවල ගාස්තු කුටි හා කාර්යාල ගොඩනැගිලිවල පරෙවි කූඩු තැනීම වැළැක්වීම සඳහා විශේෂ අවධානය යොමු කරනු ලැබීය.

දොඩංගොඩ අන්තර්මාරුව වැනි ජලයේ ගුණාත්මක අගය පහළ අගයක් ගන්නා ස්ථානවල ජල අවශ්‍යතාවය සපුරාලීම සඳහා ළිං ඉදි කිරීම සිදු කරනු ලැබීය.





3.17.5 වත්කම් කළමනාකරණය

2011 වර්ෂයේදී ආ.සං.බැ. අරමුදල් මගින්, ද.ප්‍ර.සං.ව්‍යා. යටතේ වත්කම් කළමනාකරණය සඳහා ආයතනමය සංවර්ධනය හා ධාරිතාව ගොඩ නැගීම පිළිබඳ උපදේශන ව්‍යාපෘතියක් ක්‍රියාත්මක කරනු ලැබීය. උපදේශන ලේඛනයට අනුව අ.මා.මෙ.න.හා ක. අංශයේ වත්කම් කළමනාකරණ අංශයට පරීක්ෂාව, දත්ත රැස් කිරීම හා ඉන්පසුව කළමනාකරණ තොරතුරු පද්ධතිය පිළියෙල කිරීම සඳහා ඇතුරුම්, ව්‍යුහයන් හා භූ තාක්ෂණය පිළිබඳ විශේෂඥතාව ඇති, ඉංජිනේරුවන් සහිත කාර්ය මණ්ඩලයක් සිටිය යුතු වේ. මා.සං.අ. යේ විවිධ අංශවලින් (අ.මා.මෙ.න.හා ක., සැලසුම්, පාලම් සැලසුම් ආදි) මෙම වැඩ සටහනට සහභාගි වූ අතර, කෙසේ නමුත්, ඔවුන්ගේ සේවය දැනට මෙම අංශයට නොලැබේ.

ඇතුරුම් (ජලාපවහන හා මාර්ග හාණ්ඩ ඇතුළුව), හා බෑවුම්, වත්කම් කළමනාකරණ මාර්ගෝපදේශ සමාලෝචනය කිරීමට, සහාය කාර්ය මණ්ඩලයේ අධීක්ෂණයට ඇගයීමට සහ සාධාරණ ලෙස සැලකීමට, නියෝග දීම සඳහා කෙසේ හා කුමන දත්ත රැස්කළ යුතු දැයි පරීක්ෂාවන් සඳහා මග පෙන්වීමට පළපුරුදු විශේෂඥ කාර්ය මණ්ඩලයක් අවශ්‍ය කෙරෙන අතර, වත්කම් කළමනාකරණ අංශයේ මෙහෙයුම් කාර්යක්ෂමතාවය පවත්වා ගෙන යන ලදි.

ඉංජිනේරු හා තාක්ෂණික කාර්ය මණ්ඩලය විසින් ඇදීම් වලට හා වාරික පරීක්ෂා වලට අනුකූලව දැනට දත්ත රැස් කිරීම සිදු කරනු ලැබේ. ද.ප්‍ර.සං.ව්‍යා. යේ (කොට්ටාව සිට කුරුඳුගහ හැතැක්ම දක්වා), කොන්ත්‍රාත් ලේඛන වලට අනුව, කොන්ත්‍රාත්කරුවන් විසින් නිර්මාණය කරන ලද ව්‍යුහයන් සඳහා වන දෝෂ වගකීම් කාල සීමාව අවු. 03 කට පසුව ඉකුත්වී ඇත. එබැවින්, කොන්ත්‍රාත්කරු ද.ප්‍ර.සං.ව්‍යා. යේ හා අ.මා.මෙ.න.හා ක. කාර්ය මණ්ඩලය හා එක්ව පරීක්ෂාව සිදු කරන ලදි. ඒ අනුව පිපිරුම් අළුත්වැඩියා වැඩ හා වෙනත් යථාවත් කිරීමේ වැඩ, ව්‍යුහවල දෝෂ පිළිබඳ විශේෂඥ කමිටු වාර්තාව ලැබීමෙන් පසුව, අදාල කොන්ත්‍රාත් කරුවන් විසින් සිදු කරනු ලැබේ. අධිවේගි මාර්ගයේ ලෝහමය ආරුක්කු ව්‍යුහයන් පරීක්ෂාව පාලම් සැලසුම් අංශයේ ඉංජිනේරුවන් සමඟ එක්ව සිදු කරන ලදි.

3.17.6 දක්ෂිණ අධිවේගි මාර්ගයේ 114වැනි කි.මී. කණුව අසල වම්පස බෑවුම් අසාර්ථක වීම

3.17.6.1 පසුබිම

2015 වර්ෂයේ සැප්තැම්බර් 25 සිට 30 දක්වා කාලසීමාව තුල ලැබුණු තද වැසි වලට පසුව දක්ෂිණ අධිවේගි මාර්ගයේ කොක්මාදුව 114 කි.මී. කණුව අසල කපන ලද වම්පස විශාල බෑවුම අසාර්ථක වීමක් සිදු විය.

අධිවේගි මාර්ගයේ මාතර දෙසට වන්නට වම්පස මෙකී ස්ථානයේ අධිවේගි මාර්ගය ඉදි කිරීම සඳහා ගැඹුරු ලෙස මාර්ගය කැපීමක් සිදු කර තිබුණි. කපන ලද මෙම කොටසේ ගැටි තුනක් ඇති අතර දෙවැනි ගැටිය පස් තුල කුරු ගැසීම් වලින් හා කොන්ක්‍රීට් විදීම් තුලින් තරමක් දුරට වැර ගන්වන ලදි. ගැටි සහිත කාණු සඳහා ගැටි නිර්මාණය කරන ලද අතර, ඒවා ජල බස්නා කාණු වලට සම්බන්ධ කෙරිණි.

මී. 50 ක් උස හා මී. 200 ක් පමණ දිගැති බෑවුම් කොටස් ඉහළ මී.80 ක් පමණ දිගැති බෑවුමේ නායයෑමක් සිදු විය. පතුලේ ගැටියට හානි සිදුවී නොතිබුනි. මාර්ග අන්තය හා බෑවුම් කැපුමේ පාදිකාව අතර පරතරය මී.5 කට වඩා අඩු බවට තක්සේරු කර ඇත.



රූ සටහන් 1. – 2 , 3 හා 4 ගැටි අසාර්ථක වීම

රබර් වගාවක් පවතින ස්ථානයක ගැටි හරහා සහ බෑවුමේ මුදුන දිගට වටරවුම් ආකාරයට පැතිරෙන ලොකු කුඩා පීඩන ඉරිතැලීම් නිරීක්ෂණය විය. ගැටි ප්‍රදේශයේ විශාල ඉරිතැලීම් වර්ධනය වූ අතර, මී.1 සිට 2 දක්වා තිරස් විතැන්වීමක් නිරීක්ෂණය විය. කුරු ගැසීමෙන් ශක්ති ගන්වන ලද බෑවුම් ප්‍රදේශයේ කොටස බෑවුම් වලනය නිසා හානියට පත්වී තිබුණි. (රූ සටහන් අංක 3).



රූ සටහන් අංක 2 – සුන්බුන් වලින් ආවරණය වූ 4වැනි හා 2වැනි කොන්ක්‍රීට් විදින ලද ගැටිතිවල තිරස් විතැන් වීම



රූ සටහන් 3 – සුන්බුන් වලින් වැසී යාමට පෙර කොන්ක්‍රීට් විදින ලද ප්‍රදේශය

ගැටි මත වූ බොහෝ මතුපිට කාණු වලට කපන බෑවුමේ සිදුවූ වලන නිසා බරපතල ලෙස හානි සිදු විය. වෙනත් සමහරක් ස්ථානවල හා කොන්ක්‍රීට් විදින ලද අසාර්ථක වූ කොටසට ඉහළ පිහිටා ඇති ගැටිවල වූ කාණුවල ජලය රැඳී ඇත.

මා.සං.අ. යේ අධ්‍යක්ෂ ජනරාල්ගේ අනුමැති සහිතව, කෙටි කාලීන හා දිගු කාලීන පාලනය කිරීමේ පියවරයන් සඳහා ජාතික ගොඩනැගිලි පර්යේෂණ සංවිධානය උපදේශකයන් ලෙස පත් කරන ලදි..

<u>වර්තමාන තත්ත්වය.</u>

ප්‍රධාන අසාර්ථක වීම ඇරඹීමෙන් පසුව, බෑවුමේ නායයෑම ඉහළ බෑවුම දෙසට පැතිරුණු අතර තද බෑවුමට ඉහළින්, පීඩන ඉරිතැලීම් වර්ධනය විය. (රූ සටහන් 4 හා 5) පළමු වැටියේ දිගුව (නායයෑමට හරියටම පහළින්) ඉහළ අසාර්ථක වූ කොටසේ සිට සුන්බුන් ද්‍රව්‍ය ඇද වැටීම නිසා බාදනය හා අස්ථාවර විය. (රූ සටහන් 6 හා 7). වර්තමාන වැඩබිම් තත්ත්වය මත පදනම්ව, පහත සඳහන් භූ විද්‍යාත්මක, භූ අර්ථ විද්‍යාත්මක හා භූ තාක්ෂණික තත්ත්වයන් සැලකිල්ලට ගනිමින්, නිවැරදි කිරීම් පියවර යෝජනා කරනු ලැබේ.





ඡායාරූප 4 හා 5 – ප්‍රධාන බැවුමට ඉහළින් ඉරිතැලීම් වර්ධනය විය (ආරම්භක අවධිය)





ඡායාරූප 6 හා 7 – දකුණු පැත්තේ සිට ඉහළ සුන්බුන් ඇද වැටීම.



ඡායාරූප අංක 8 – වර්තමාන තත්ත්වය - මඩ හා සුන්බුන් ප්‍රවාහය සමඟ කොළඹ - ගාල්ල මංතීරුව වසා දැමේ. වැලි කොට්ට මගින්, සුන්බුන් අවහිර කරන ලදි

<u>කෙටි කාලීන පාලන පියවරයන්.</u>

කෙටි කාලීන පියවරයන් වලට අනුව, පෘෂ්ටයේ සිදුවිය හැකි නායයෑම් වලට වන ජල පීඩනය හා ප්‍රධාන බෑවුමට ඉහළින් රසායනික කළඟල් පිපිරවීම් වලට දැරීමට වන බර නිදහස් කිරීම සඳහා මී.30 ක් දිගැති මී.මී. 90 ක් වන විෂ්කම්භය සහිත තිරස් කාණු 45 ක් ස්ථාපිත කරන ලදි,



රූ සටහන් 9 – රසායනික කලුගල් පිපිරවීම

<u>දිගු කාලීන පියවරයන්.</u>

මා.සං.අ. යේ අධ්‍යක්ෂ ජනරාල්ගේ උපදෙස් වලට අනුව ජා.ගොා.ප.ආ. විසින් දිගු කාලීන ප්‍රතිකර්ම පියවර යෝජනාව සහ ප්‍රාථමික සැලසුම 2015 නොවැ. 12 දින හා විස්තරාත්මක අවසන් වාර්තාව 2015.12.28 දින ව්‍යාපෘති අධ්‍යක්ෂ (ද.ප්‍ර.සං.ව්‍යා.) වෙත ඉදිරිපත් කරනු ලැබීය.

3.17.7 දක්ෂිණ අධිවේගී මාර්ගයේ කි.මී. 42+500 අසල අසාර්ථක බෑවුම් නිවැරදි කිරීම.

3.17.7.1 පසුබිම

2012 නොවැම්බර් මස මුල, කළුතර, ගාල්ල හා මාතර දිස්ත්‍රික්කවල තද වැසි සමඟ බොහෝ නායයෑමේ අවස්ථාවන් පැන නැගුණි. කළුතර දිස්තික්කයේ එක් ස්ථානයක් වූයේ දක්ෂිණ අධිවේගී මාර්ගයේ කි.මී. 42+500 අසලය.



මෙම නායයෑම කොළඹ - ගාල්ල මංතීරුවේ මතුගම ප්‍රා.ලේ. කොට්ඨාශයේ යටදොල වත්තේ පිහිටි වැලිපැන්න විවේක ප්‍රදේශයේ මීටර් 400 කට පමණ සමීප මාර්ග ඉවුරුවල වම්පස නායයෑම හට ගැණුනි. එබැවින්, පාලන පියවර පිළියෙල කිරීම ජාතික ගොඩනැගිලි පර්යේෂණ ආයතනය වෙත පවරණ ලදි.





ජා.ගොෙ.ප.ආ. ඔරියන්ටල් කන්සල්ටන්ට් උපදේශකයන්ගේ විශේෂඥයෙකු සමඟ සහයෝගීව විමර්ශන පවත්වන ලද අතර පාලන පියවර පිළියෙල කරන ලදි. මේ අතර මා.සං.අ. ට ජජාසනි වෙතින් ව්‍යාපෘතිය සඳහා රු. මිලියන 275 ක ප්‍රදානයක් ලැබුනි.

ව්‍යාපෘතියේ තත්ත්වය.

ව්‍යාපෘතිය 2015.04.07 දින වන විට සැලකිය යුතු ප්‍රමාණයක් නිමකරන ලදි. ප්‍රමාදයන් සඳහා හේතු පහත දැක්වෙන පරිදි වර්ගීකරණය කළ හැකිය,

- අහිතකර කාලගුණික තත්ත්වයන්,
- අනපේක්ෂිත බාධාවන්,
- කොන්ත්‍රාත්කරුවන්ගේ සම්බන්ධීකරණය පිළිබඳ ගැටළු

කොන්ත්‍රාත් විස්තර

• උපදේශකයන්	-	ජා.ගොෙ.ප.ආ., ඔරියන්ටල් කන්සල්ටන්ට්ස් සමාගම
• කොන්ත්‍රාත්කරු	-	සොලිටෙක් ජේ.වී. සමාගම
• කොන්ත්‍රාත් මුදල	-	රු. මිලියන 206
• අපේක්ෂිත අවසන් ගිණුම	-	රු.මිලියන 217 (අවසන් ගිණුම් මෙතෙක් ඉදිරිපත් කර නොමැත)
• ආරම්භක දිනය	-	2014.02.14
• කොන්ත්‍රාත්තුව නිමකරන දිනය	-	2014.08.15
• ප්‍රාමාණිකව නිමකරන දිනය	-	2015.04.07





ක්‍රියාත්මක කිරීම සිදු කරන අතර ගන්නා ලද ඡායාරූප





ප්‍රමාණවත් නිම කිරීමෙන් පසුව පෙනුම

3.17.8 දෝෂ සඳහා වගකීම් කාලසීමාව තුලදී දෝෂ නිවැරදි කිරීමේ වැඩ

දක්ෂිණ අධිවේගි මාර්ගයත්, පිටත වටරවුම් මාර්ගයේ (I අදියර) හා කොළඹ - කටුනායක අධිවේගි මාර්ගයේ අදාල කොටස්වල කොන්ත්‍රාත්කරුවන් දෝෂ පිළිබඳ වගකීම් වලට අදාලව ව්‍යාපෘති අංශය, කොන්ත්‍රාත්කරුවන් හා අ.මා.මෙ.න.හා ක. අංශය හා එක්ව ඒකාබද්ධ පරීක්ෂාවලින් පසුව, අධිවේගි මාර්ග පථය, කාණු හා වෙනත් ව්‍යුහයන් නිම කිරීමේ ක්‍රියාවලිය සම්පූර්ණයෙන් නිම කරන ලදි. මෙම කාර්යයන් වලට ප්‍රධාන වශයෙන් මෘදු භූමි සැකසීමේ ස්ථානවල ඇස්පල්ට් පෘෂ්ඨ සැකසීම් {කොා.ක.මා. කි.මී. 05 + 300), ද.ප්‍ර.සං.ව්‍යා. (කි.මී. 46 + 600} හා ද.ප්‍ර.සං.ව්‍යා. {කි.මී. 23 + 500, කි.මී.. 24 + 300, කි.මී.. 46 + 600}, පාලම් ප්‍රවේශයන් අසල ඉරි තැලීම්, අළුත්වැඩියා වැඩ හා සම්බන්ධිත ගැටළු සහ අධිවේගි මාර්ග ව්‍යුහයන් හා දෝෂ හා අන්තර්ඡේදන ගොඩනැගිලිවල කල් ගත වූ වැඩ අඩංගුය.









3.18 වත්කම් කළමනාකරණය හා ආදායම් රැස් කිරීම

වත්කම් කළමනාකරණ හා ආදායම් අංශය, මාර්ග සංවර්ධන අධිකාරිය සඳහා එය සතු මූලාශ්‍රවලින් ආදායම් ඉපැදවීමේ අරමුණෙන් 2004 අගෝස්තු මාසයේදි පිහිටුවන ලදි. මෙම අංශය අධ්‍යක්ෂ නඩත්තු කළමනාකරණ හා ඉදිකිරීම් යටතේ නියෝජිතවරයෙකුගේ ප්‍රධානත්වයෙන් පාලනය වන අතර ඔහුට ඉංජිනේරුවරුන්ගේ හා සහාය කාර්ය මණ්ඩලයේ සහයෝගය ලැබේ.

වත්කම් කළමනාකරණ හා ආදායම් අංශය මාර්ග සංවර්ධන අධිකාරිය සඳහා එය සතු මූලාශ්‍රවලින් ආදායම් ඉපයීමේ අරමුණෙන්, 2004 අගෝස්තු මාසයේදි පිහිටුවන ලදි. මෙසේ උපයන ලද ආදායම් මා.සං.අ. යේ මෙහෙවර වන ශ්‍රී ලංකාවේ ජාතික මහමාර්ග ජාලයේ තත්ත්වය නැංවීම, නඩත්තුව හා ඉදිකිරීම ක්‍රියාත්මක කිරීමට භාණ්ඩාගාරයෙන් වාර්ෂිකව ලැබෙන අරමුදල් පරිපූර්ණය කෙරේ.

වත්කම් කළමනාකරණ හා ආදායම් අංශයේ ප්‍රචාරණ පුවරු, දැන්වීම් පුවරු, ප්‍රචාරණ තොරණ්, කැන්ටිලීවර්, දුරකථන කුටි, බස් ආවරණ, ලොතරැයි කුටි, වටරවුම්, රූපවාහිනී රැහැන්, කුලුණු සඳහා බදු අය කිරීම සහ යටිබිම් රැහැන්වලි සඳහා කුලී අයකිරීම ආදිය මගින් මා.සං.අ. සඳහා ආදායම් ජනනය කරනු ලබයි. වැඩිපුර ආදායම් ජනනය කිරීම සඳහා මා.සං.අ. යේ ඉඩම් හා ගොඩනැගිලි සංවර්ධනය කෙරෙහි සැලකිල්ල යොමු කර තිබේ.

මාර්ග රක්ෂිතය භාවිතා කරනට ප්‍රයෝජ්‍ය සේවා සපයන්නන්ගෙන් මුදල් අයකිරීමේ හැකියාව සොයා බැලීමට පියවර ගෙන තිබේ.

ව.ක.හා ආ. අංශය මා.සං.අ. යේ සේවකයන් යොදා ගනිමින්, වැදගත් ස්ථානවල පිහිටා ඇති මධ්‍ය දූපත්, වටරවුම් හා මාර්ග රක්ෂිතයන්වල අලංකරණ කටයුතු සිදු කරන අතර උනන්දුවක් දක්වා පුද්ගලික පාර්ශවයන් ඔවුන්ගේ නිෂ්පාදන ප්‍රචාරණය සඳහා මාධ්‍යයක් ලෙස අලංකරණ වැඩ සඳහා යොදා ගනු ලැබේ.

2013 සැප්තැම්බර් මස සිට ව.ක. හා ආ.අංශය, පාරිසරික අමාත්‍යාංශය හා මාර්ග දෙපස ගස් සිටුවීමේ වැඩ සටහනක් නිර්මාණය කර එය සම්බන්ධීකරණය කරන ලදි.

3.18.1 දැන්වීම් පුවරු / ප්‍රචාරණ පුවරු / මාර්ග තොරණ් පුවරු / කැන්ටි ලීවර් පුවරු සඳහා බලපත්‍ර නිකුත් කිරීම

දැන්වීම් පුවරු / ප්‍රචාරණ තොරණ් / කැන්ටි ලීවර් පුවරු / ධජ / බස් ආවරණ හා වෙනත් මාර්ග දෙපස වෙළඳ ප්‍රචාරණ උපකරණ / මෙවලම් සඳහා බලපත්‍ර නිකුත් කිරීම 2015 දෙසැම්බර් 31 දින දක්වා අබන්ධව සිදු කරන ලදි.

බලපත්‍ර නිකුත් කිරීමේදී මාර්ගෝපදේශ වලට අනුව එම අවස්ථාවේදීම අනුමත ප්‍රචාරණ පුවරු / ධජ පිළිබඳ විස්තර, විධායක ඉංජිනේරුවරුන්ට හා අදාල අංශ ප්‍රධානීන් වෙත යවන ලදි. ඊට අමතරව, විවිධ අනුමැතීන්වල සාරාංශයන් කලින් කලට යවනු ලැබේ.

ප්‍රචාරණ පුවරු / ප්‍රචාරණ තොරණ් / කැන්ටි ලීවර් පුවරු / ධජ / බස් ආවරණ / ලොතරැයි කුටි හා වෙනත් මාර්ග දෙපස ප්‍රචාරණ උපකරණ / මෙවලම් සඳහා බලපත්‍ර නිකුත් කිරීම 2015 ජනවාරි 1 දින සිට 2015 දෙසැම්බර් 31 දින දක්වා අඛන්ඩව සිදු කරනු ලැබීය.

සේවාවේ ස්වභාවය	2015 ජනවාරි සිට දෙසැම්බර් දක්වා එකතුව		
	නව අනුමැතීන්	අළුත්කිරීම්	සමස්ත අනුමැතීන්
ධජ	4357	-	4357
ධජ (නොමිලේ)	1000	-	1000
ප්‍රචාරණ පුවරු	401	618	1019
ප්‍රචාරණ පුවරු (නොමිලේ)	16	-	16
බස් ආවරණ	88	87	175
බස් ආවරණ (නොමිලේ)	70	-	70
ලොතරැයි කුටි	17	81	98
වටරවුම්	07	21	28
වෙළඳ කුටි	08	-	08
දෘෂ්‍ය රැහැන් කුළුණු	4897	9321	14218
ප්‍රචාරණ තොරණ් / කැන්ටි ලීවර් පුවරු	-	20	20
විවේක උද්‍යාන	-	02	02
ටෙලිකොම් කැබිනෙට්ටු	-	12	12

3.18.2 වානිජ පරමාර්ථ සඳහා මාර්ග රක්ෂිත කල්බදු දීම

2015 වර්ෂයේ නුවරඑළියේ මාර්ග රක්ෂිත කීපයක් වානිජ කටයුතු සඳහා තාවකාලිකව බදු දීමට මහජනතාවගෙන් ටෙන්ඩර් කැඳවන ලදි. 2015 අප්‍රේල් 1 දින සිට එක් මසක් තුල එයින් ලැබුණු ආදායම රු.2,725,163.25 කි.


3.18.3 2015 ආදායම් රැස් කිරීම.

ව.ක.හා ආ.අංශය මා.සං.අ. යේ වත්කම් කළමනාකරණය මගින් 2015.01.01 සිට 2015.12.31 දක්වා කාල පරිච්ඡේදය තුල විවිධ මූලාශ්‍ර වලින් උපයාගත් මුදල රු. 235,903,114.54 කි.

වගු අංක 46: 2012 සිට 2015 දක්වා ව.ක.හා ආ. අංශයේ ආදායම් රැස්කිරීම වර්ගීකරණය.

විෂයාංක විස්තරය	2012 වර්ෂයේ ආදායම (රු.ශක.)	2013 වර්ෂයේ ආදායම (රු.ශක.)	2014 වර්ෂයේ ආදායම (රු. ශක.)	2015 වර්ෂයේ ආදායම (රු. ශක)
ධජ	2,324,191.60	2,098,880.27	2,333,439.62	2,569,471.19
සාප්පු සංකීර්ණ කුලී	2,670,688.28	1,413,587.59	3,653,783.35	3,289,875.49
ප්‍රචාරණ පුවරු	41,541,548.75	35,209,815.92	30,622,475.79	43,848,720.89
බස් ආවරණ	3,497,141.60	2,074,285.43	1,817,766.73	2,889,287.44
ප්‍රචාරණ තොරණ් / කැන්ට් ලීවර් පුවරු	28,778,267.87	21,956,190.20	42,047,621.16	34,250,369.88
වෙළඳ හා ලොතරැයි කුටි	301,428.53	210,713.29	404,738.28	255,256.33
වටරවුම්, රථවාහන, දුපත් නඩත්තුව හා අලංකරණය	861,944.70	521,646.49	850,898.58	928,581.09
දෘෂ්‍ය රැහැන් කණ්ණු, රූපවාහිණී රැහැන් ජාලය හා දුරකථන භූවමාරුව	33,146,421.98	55,086,586.60	60,038,025.32	47,086,438.14
භූගත රැහැන් එළීම්		77,621,678.82	80,627,030.06	98,025,416.25
විවේක උද්‍යාන	134,285.12	34,286.26	81,679.94	34,534.59
නුවරඑළිය උත්සව සමයේ කළ වෙළඳ කුටි	1,763,257.12	2,025,714.29	2,251,142.85	2,725,163.25
එකතුව	**115,019,175.55**	**198,253,385.16**	**224,728,601.68**	**235,903,114.54**

රූ සටහන් 22: 2012 – 2015 කාලසීමාව තුල ආදායම් රැස් කිරීම



පාරිසරික අධිකාරීන් විසින්, ප්‍රචාරණ පුවරු, දැඩ හා කොඩි මාර්ග රක්ෂිතවල ප්‍රදර්ශනය කිරීම පිළිබඳව ඇති කරන ලද ඇතැම් සීමාවන් වලින් ආදායම් රැස් කිරීමේදී අහිතකර බලපෑම් සිදුවී ඇත.

බොරැල්ල සාප්පු සංකීර්ණයේ අංක. 01 හා 02 දරණ සාප්පු හිමියන්ට එරෙහිව නීතිමය පියවර ගනු ලැබීය. කුරුණෑගල සාප්පු සංකීර්ණය පිහිටි ස්ථානයට සම්බන්ධ මාර්ග සංවර්ධන වැඩ වර්ෂය තුළ ආරම්භ කරන ලදි. එබැවින්, කුරුණෑගල සාප්පු සංකීර්ණය සඳහා බදු ගිවිසුම් අළුත් නොකෙරිණි.

3.18.4 මාර්ග අලංකරණ වැඩ

මෙම ව්‍යාපෘතියේ ඉලක්කය වන්නේ, වැදගත් ස්ථානවල පිහිටා ඇති මධ්‍ය දූපත් හා වටරවුම් සහ මාර්ග රක්ෂිතයන් උනන්දුව දක්වන අනුග්‍රාහකයන් මගින්, අලංකරණය කිරීම හා නඩත්තු කිරීමයි. මෙය අනුග්‍රාහකයන්ට ඔවුන්ගේ කුඩා වෙළඳ ප්‍රචාරණ දැන්වීම් මා.සං.අ. අනුමත කළ මිල ගණන් යටතේ, මෙම ස්ථානවල ප්‍රදර්ශනය කිරීමට අවස්ථාව ලබාදීම මගින්, මා.සං.අ. සඳහා ආදායම් ඉපයීමේ මූලාශ්‍රයක් ලෙසද හඳුනාගෙන තිබේ. මෙම අලංකරණ වැඩ සඳහා අනුග්‍රාහකයින් ආකර්ෂණය කර ගැනීමට, මිල

ගණන් මෙන්ම, අදාල නීති රීතිද සංශෝධනය කරන ලදි. ඊට අමතරව, ච.ක.හා ආ. අංශය විසින්, දේවි බාලිකා විද්‍යාලය සිට ආයුර්වේද වටරවුම දක්වාත්, කොටා පාර හා පරණ කැස්බෑව පාරේ කට්ටිය හංදිය සිට නුගේගොඩ දුම්රිය ගේට්ටුව දක්වා කොටසත්, බත්තරමුල්ල - පන්නිපිටිය මාර්ගයේ පාර්ලිමේන්තු ප්‍රවේශ මාර්ගය දක්වාත් (සුනිල් මාවත) වටරවුම් හා මධ්‍ය දූපත් අලංකරණය හා නඩත්තුව සිදු කරන ලදි.



දේවි බාලිකා විද්‍යාලය ඉදිරිපිට මාර්ග කොටස අලංකරණය කිරීම



නුගේගොඩ පරණ කැස්බෑව මාර්ග කොටස අලංකරණය

3.18.5 මාර්ග අලංකරණ වැඩ සඳහා පැල තවාන

ච.ක.හා ආ. අංශය විසින් ක්‍රියාත්මක කෙරෙන අලංකරණ වැඩවල පැල අවශ්‍යතාවය සම්පූර්ණ කිරීම සඳහා හෝමාගම වැඩ ඒකකයේ මල් පැල තවානක් ස්ථාපනය කරනු ලැබීය. 2015 වර්ෂය අවසානයේ 7900 ක විදේශීය හා වෙනත් පැල තිබුණි. මෙයින් නා, නැඳුන්, පිහිඹියා, ගොරකා, කටු ආත්ත, මාදං, කොහොඹ, දිවුල්, අඹ, පේර, කරඳ, ගම්මාලු, රඹුටන්, සියඹලා යන "වන රෝපා" ගස් සිටුවීමේ වැඩ සටහන යටතේ, මහවැලි සංවර්ධන හා පාරිසරික අමාත්‍යාංශයන් හා වන සංරක්ෂණ දෙපාර්තමෙන්තුවෙන් ලැබුණු පැල වර්ග විය. ඇතැම් පැල ප්‍රභේදයන් (කොබෝනීල, එක්සෝරා, කැලණිතිස්ස) අලංකරණය සඳහා ච.ක.හා ආ. අංශය විසින් නිෂ්පාදනය කළ ඒවාය. මෙම කාලසීමාව තුල කෝට්ටේ - බෝපේ මාර්ගයේ බත්තරමුල්ල සෙත්සිරිපාය ඉදිරිපිට මධ්‍යයනය, පොල්දූව හංදිය, නුගේගොඩ පරණ කැස්බෑව පාර හා දේවි

බාලිකා හංදිය සිට කොටා පාරේ ආයුර්වේද හංදිය හා බත්තරමුල්ල - පන්නිපිටිය මාර්ගයේ පාර්ලිමේන්තු ප්‍රවේශ මාර්ගය (සුනිල් මාවත) යන ස්ථානවල පැල 4583 ක් සිටුවන ලදි.





වගු අංක 47: 2015 වර්ෂයේ අලංකරණ වැඩ නඩත්තු කිරීම

මාර්ග කොටස	කාර්යය
කොල්ලුපිටිය - ශ්‍රී ජයවර්ධනපුර මාර්ගයේ දේවි බාලිකා සිට ආයුර්වේද හංදිය / කොටා පාරේ මධ්‍යන්‍යය	අලංකරණ වැඩ, පෝර යෙදීම, ජලය යෙදීම, එක්සෝරා පැල කප්පාදුව, වල් නෙලීම හා තණකොල කැපීම
නුගේගොඩ පරණ කැස්බෑව පාරේ නුගේගොඩ දුම්රිය ගේට්ටුව සිට කට්ටිය හංදිය දක්වා වර්ග මීටර් 2900 ක ප්‍රමාණය	නඩත්තුව හා භූමි අලංකරණය, ජලය යෙදීම, තණකොල කැපීම, තණ පිඩැලි ඇතිරීම ආදිය.
රුක්රෝපණ වැඩ සටහන යටතේ බත්තරමුල්ල - පන්නිපිටිය මාර්ගයේ සිටුවන ලද "නා" පැල 400 සහ පාර්ලිමේන්තු ප්‍රවේශ මාර්ගයේ (සුනිල් මාවත) සිටුවන ලද "මී" පැල 80 නඩත්තු කිරීම.	නඩත්තුව, පොහොර යෙදීම, ජලය යෙදීම හා පිරිසිදු කිරීම් වැඩ ඉටු කිරීම.

3.18.6 මග දෙපස සෙවන දෙන රුක් රෝපණ වැඩ සටහන

මාර්ග සංවර්ධන අධිකාරිය විසින්, 2013 වර්ෂයේ සිට ජාතික රුක් රෝපණ වැඩ සටහනට සම්බන්ධිතව මාර්ග රක්ෂිතවල සෙවන දෙන රුක් රෝපණ වැඩ සටහන ක්‍රියාත්මක කරන ලදි. මෙම වර්ෂය තුල "වන රෝපා" නමින් හැඳින්වෙන එකී වැඩ සටහන ව.ක. හා ආ. අංශය විසින් සම්බන්ධීකරණය කරනු ලැබීය. සියලුම විධායක ඉංජිනේරුවන් වෙතින්, අදාල තොරතුරු රැස් කර ගන්නා ලදි.

- විධායක ඉංජිනේරු කාර්යාලවල අවශ්‍යතාවය අනුව "2015 වන රෝපා වැඩ සටහන" යටතේ පැල ලබා ගැනීමට මහවැලි සංවර්ධන පාරිසරික හා වන රක්ෂණ දෙපාර්තමේන්තුව සමඟ සම්බන්ධීකරණය කරන ලදි.
- සියලුම විධායක ඉංජිනේරුවන් සිය කොට්ඨාශවල මෙම වැඩ සටහන ක්‍රියාත්මක කළ යුතු බවට උපදෙස් දෙනු ලැබීය.
- මාර්ග දෙපස රක්ෂිතයේ රෝපණය සඳහා විධායක ඉංජිනේරු කොට්ඨාශ විසින් සිදු කරන ලද ඉල්ලීම පරිදි හෝමාගම පැල තවානෙන් වැඩුණු පැල 2450 ක් බෙදා හැරිණි.
- 2015 "වන රෝපා" සමාරම්භක උත්සවය ගරු උසස් අධ්‍යාපන හා මහාමාර්ග ඇමතිතුමාගේ උපදෙස් පරිදි තැන්නෙකුඹුර - පේරාදෙණිය - ගන්නෝරුව මාර්ගයේ සිදු කරන ලදි.

3.19 යාන්ත්‍රික අංශය

යාන්ත්‍රික සේවාවන් මා.සං.අ. යේ යාන්ත්‍රික අංශය විසින් ක්‍රියාත්මක කරන ලබයි. අධ්‍යක්ෂ (යාන්ත්‍රික) විසින් නියෝජ්‍ය අධ්‍යක්ෂ, යාන්ත්‍රික ඉංජිනේරුවන්, යන්ත්‍රාගාර ඉංජිනේරුවන් හා වෙනත් සහායක කාර්යය මණ්ඩලයේ සහයෝගය ඇතිව, අධ්‍යක්ෂ ජනරාල්වරයාට වෘත්තීමය සහාය සපයයි. අධ්‍යක්ෂ තනතුරු පුරප්පාඩුව පුරවා නොමැති බැවින්, නියෝජ්‍ය අධ්‍යක්ෂ (යාන්ත්‍රික) විසින් අධ්‍යක්ෂ තනතුරේ රාජකාරී ආවරණය කරනු ලැබේ. යාන්ත්‍රික අංශය, අධ්‍යක්ෂ කාර්යාලය, ප්‍රවාහන අංශය හා අඟුලාන හා අනුරාධපුර පිහිටි නඩත්තු කම්හල් වලින් සමන්විතය. තවද යාන්ත්‍රික අංශය විවිධ ස්ථානවල පිහිටි ඇස්පල්ට් පෙරමුසු යන්ත්‍රාගාර හා ගල් ඇඹරුම් යන්ත්‍රාගාර නඩත්තු කිරීම මෙහෙයවනු ලබයි.

යාන්ත්‍රික අංශය පවත්නා සම්පත් භාවිතා කරමින් මාර්ග ඉදිකිරීම, මාර්ග නඩත්තුව හා වැඩි දියුණු කිරීමේ කටයුතු පහසුවෙන් ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය වන වාහන, ඉදිකිරීම් යන්ත්‍ර හා උපකරණ ලොන්ච් හා පාරු සේවා හා සම්බන්ධිත සේවා සැපයීමේ වගකීම දරයි.

යාන්ත්‍රික අංශය ප්‍රධාන කාර්යාලයේ පිහිටි අධ්‍යක්ෂ කාර්යාල හා ප්‍රවාහන අංශය හා අඟුලාන හා අනුරාධපුර පිහිටි නඩත්තු වැඩපල වලින් සමන්විතය. තවද යාන්ත්‍රික අංශය මා.සං.අ. ක්‍රියාත්මක කරනු ලබන විවිධ ස්ථාන වලට ඇස්පෝල්ට් පෙරමුසු යන්ත්‍රාගාර, ගල් ඇඹරුම් යන්ත්‍රාගාර හා තාර මිශ්‍රණ යන්ත්‍රාගාර නඩත්තු කිරීමට සහභාගි වෙයි.

අංශය අධ්‍යක්ෂවරයාගේ ප්‍රධානත්වයෙන් පවතින අතර, ඔහුට නියෝජ්‍ය අධ්‍යක්ෂගේ යාන්ත්‍රික ඉංජිනේරුවන්ගේ හා සහාය කාර්ය මණ්ඩලයේ සහාය ලැබේ.

තවද යාන්ත්‍රික අංශය අඟුලාන පිහිටි වැඩපල හා සේවා ස්ථානය හා අනුරාධපුර වැඩපල පරිපාලනය කරන ලබයි. යාන්ත්‍රික අංශය, අධිවේගී මාර්ග මෙහෙයුම් නඩත්තු හා කළමනාකරණ අංශයේ හා ප. හා සං. පරිශ්‍රයේ පිහිටි ග්‍රාමීය පාලම් පුනරුත්ථාපන වැඩපලේ ප්‍රධාන යන්ත්‍ර අළුත්වැඩියා වැඩ හා මගනැගුම් මාර්ග ඉදිකිරීම් උපකරණ සමාගමෙන් ගන්නා ලද යන්ත්‍ර අළුත්වැඩියාව සඳහා අවශ්‍ය සහාය හා උපදෙස් ලබාදෙයි.

3.19.1 2015 වර්ෂය සඳහා වැඩ සටහන හා කාර්යයන්

2015 වර්ෂය සඳහා පහත සඳහන් වැඩ සටහන පිළියෙල කරන ලදි.

- බත්තරමුල්ල ඩෙන්සිල් කොඩිබෑකඩුව මාවතේ පිහිටා ඇති නව මහාමාර්ග ලේකම් කාර්යාලය වෙත කාර්යාලය ගෙන යාම.
- 2014 වර්ෂයේදී ඇනවුම් කළ අධිපීඩන ජල විදින ට්‍රක්රථ 2ක් භාර ගැනීම හා සේවයේ යෙදවීම.

- 2014 වර්ෂයේදී ඇනවුම් කළ තහඩු පීඩන යන්ත්‍ර 52 ක් ලබා ගැනීම හා සේවයේ යෙදවීම.
- මාර්ග නඩත්තු වැඩ සඳහා යෙදවීමට සැහැල්ලු පීඩන යන්ත්‍ර, ජල බවුසර හා තණකොළ කපනයන් ප්‍රසම්පාදනය කිරීම.
- අධිවේගී මාර්ග නඩත්තු වැඩ සඳහා වාහන හා යන්ත්‍ර සංචිතයක් ප්‍රසම්පාදනය කිරීම.
- කයිවිස් හා කරෙයිනගර් අතර මෙහෙයවන පාරු බෝට්ටුව අළුත්වැඩියා කිරීම.
- අවශ්‍යතාවය මතු වන්නේ නම් වාහන හා යන්ත්‍ර කුලියට ගැනීම.
- මාර්ග සංවර්ධන අධිකාරියට අයත් වාහන හා යන්ත්‍රවල අළුත්වැඩියා හා නඩත්තුව අඟුලාන වැඩපල, පුද්ගලික ගරාජ සහ මගනැගුම් වැඩපල මගින් ඉටු කිරීම.

3.19.2 2015 වර්ෂය තුල ප්‍රගතිය හා කාර්ය සාධනය.

- සැපයුම්කරු විසින් කම්පන තහඩු පීඩන යන්ත්‍ර 52 ක් මා.සං.අ. වෙත සපයන ලද අතර, ඒවා මාර්ග නඩත්තු වැඩ සඳහා විධායක ඉංජිනේරුවන් අතර බෙදා හරිනු ලැබීය.
- ලෝක බැංකු අරමුදල් සැපයූ මාර්ග අංශ සහායක ව්‍යාපෘතිය මගින්, අධි පීඩන ජල විදින ට්‍රක් රථ දෙකක් ප්‍රසම්පාදනය කරන ලද අතර, ඒවා බෝක්කු හා කාණු පිරිසිදු කිරීම සඳහා යොදවන ලදි.
- මා.සං.අ. යේ නිලධාරීන්ගේ හා වෙනත් අයගේ පාවිච්චිය සඳහා වාහන 12 ක් පිටතින් කුලීමත ලබාගත් අතර, 2015 වසර තුල ඒ සඳහා කුලී ගාස්තු රු. 5,760,000.00 කි.
- කාර්යාලය බත්තරමුල්ල ඩෙන්සිල් කොඩිබැකඩුව මාවතේ පිහිටි නව මහාමාර්ග ලේකම් කාර්යාලය වෙත ගෙන යනු ලැබීය.

3.20 මිනිස්බල සංවර්ධනය

මිනිස්බල සංවර්ධනය ක්‍රියාත්මක කරනු ලබන්නේ මා.සං.අ. යේ පුහුණු අංශය විසිනි. අතිරේක අධ්‍යක්ෂ ජනරාල් (පරිපාලන හා මූදල්) හා අධ්‍යක්ෂ (පුහුණු) නියෝජ්‍ය අධ්‍යක්ෂවරයාගේ හා සහාය කාර්ය මණ්ඩලයේ සහයෝගය ඇතිව, අධ්‍යක්ෂ ජනරාල්වරයාට ඍත්තීය සහාය සපයනු ලබයි.

මාර්ග සංවර්ධන අධිකාරිය රටේ ප්‍රධාන මහාමාර්ග පිළිබඳ අධිකාරිය වේ. ප්‍රමාණවත් පරිදි කුසලතා සහිත තෘප්තිමත් කම්කරු බලකායක් සිටීම, ගතික මහාමාර්ග ආයතනයක සංවර්ධනයට හා එය වෙත පවරණ ලද කාර්යයන් ඉටුකිරීම සඳහා අත්‍යාවශ්‍ය වේ. මා.සං.අ., ආයතනයේ වැදගත් කාර්යයක් හා ආයෝජනයක් වශයෙන් සලකන අතර, සංවර්ධනය වන තාක්ෂණික ලෝකයේ පරම අවශ්‍යතාවයකි. පුහුණු අංශයට ආයතනයේ පුහුණු කාර්යයන් ඉටු කිරීමේ වගකීම පවරා ඇත. පුහුණු අංශයේ ප්‍රධාන අරමුණ වන්නේ වැඩ කිරීමේදී කාර්යක්ෂමතාව හා සඵලදායිතාව වැඩි දියුණු කිරීමට සේවකයන්ගේ දැනුම නැංවීමට, ඔවුන්ගේ කුසලතා තත්ත්වය නැංවීමට හා සුදුසු ආකල්ප වර්ධනය කිරීමට සියලුම සේවකයන් වෙත පහසුකම් සැලසීමයි. මෙම අරමුණු සාමාන්‍යයෙන්, පුහුණු අවශ්‍යතා හඳුනා ගැනීමෙන් හා පුහුණු වැඩ සටහන් පිළියෙල කිරීමෙන් හා ක්‍රියාත්මක කිරීමෙන් සාධනය කරනු ලැබේ. පුහුණු වැඩ සටහන් සාමාන්‍යයෙන් දේශන, සම්මන්ත්‍රණ, වැඩමුළු හා නේවාසිකව සංවිධානය කළ ක්ෂේත්‍ර නිරූපණයන්ගෙන් සමන්විත වන අතර, සුදුසු අවස්ථා වලදී, වෙනත් ආයතනවල පැවැත්වෙන පුහුණු පාඨමාලා මගින් පරිපූරණය කෙරේ.

3.20.1 පුහුණු අංශයේ කාර්ය සාධනය

3.20.1.1 නේවාසික පුහුණු වැඩ සටහන්

2015 වර්ෂය තුල පුහුණු අංශයේ කාර්ය සාධනය පිළිබඳ සංක්ෂිප්ත විස්තරයක් වගු අංක 48 දැක්වේ.

වගු අංක 48: 2015 වර්ෂය තුල නේවාසික පුහුණු වැඩ සටහන්.

අංකය	පුහුණු විස්තරය	කණ්ඩායම් ගණන	කණ්ඩායමකට සහභාගි වන්නන් ගණන	කණ්ඩායමකට දින ගණන
01	කාර්මික සහකාර හා වැඩ පරිපාලකයන් සඳහා පරිගණක සහායක ඇදීම් (ඔටෝ කැඩ්)	1	17	05
02	ආධුනිකයන් සඳහා එක්සෙල් වැඩ සටහන	1	17	05
03	විධායක ඉංජිනේරුවන්ගේ කාර්ය භාරය පිළිබඳ වැඩ මුළුව	2	35	02
04	ධාරිතා සංවර්ධන වැඩ සටහන යටතේ, ජාතික මහාමාර්ග ජාලයේ ඉඩම් නායයෑම් ආපදා ආරක්ෂණ ව්‍යාපෘතිය පිළිබඳ වැඩමුළුව හා සංවර්ධනය - 3වැනි සම්මන්ත්‍රණය	1	41	1
05	පස් ස්ථායිකරණය, බාදනය හා විශේෂිත පාලන විසඳුම් පිළිබඳ දැන්වීම.	1	88	1
06	තද බෑවුම් ස්ථායී කිරීමට පසේ කටු ගැසීම පිළිබඳ එළි දැක්වීම	1	21	1/2
07	පාලම් සැලසුම් හා නඩත්තුව පිළිබඳ තාක්ෂණික සම්මන්ත්‍රණය	1	28	2 hrs
08	පාලම් කළමනාකරණය ධාරිතා නැංවීමේ ව්‍යාපෘතිය පිළිබඳ න්‍යායික හා ප්‍රායෝගික සම්මන්ත්‍රණය	1	22	4
09	අභ්‍යන්තර විගණන කාර්ය මණ්ඩලය සඳහා වැඩ මුළුව	1	17	3
10	අභ්‍යන්තර විගණක තනතුර සඳහා උසස් කිරීමේ පරීක්ෂණය	1	06	4
11	වැඩබිම් වාර්තා පවත්වා ගැනීම පිළිබඳ දේශන	2	38	1/2
12	විචල්‍යතා නියෝග පිළිබඳ දේශන	2	37	1/2
13	මහාමාර්ග ඉංජිනේරුවන් සඳහා මහාමාර්ග ව්‍යූහයන් තේරීම හා සැලසුම් නිර්මාණය	1	18	2
14	ඍත්තීයමය සෞඛ්‍ය පිළිබඳ සම්ප්‍රජානන වැඩ සටහන	1	33	1
15	එම්එස් එක්සෙල් පිළිබඳ අන්තර් මධ්‍ය මට්ටමේ පුහුණුව	1	17	4
16	නැණවත් ප්‍රවාහන පද්ධතියක් සඳහා රථවාහන වීඩියෝ මගින් සංඥානන හා ආවේක්ෂණ විසඳුම්	1	22	1
17	වැඩ සඳහා ප්‍රසම්පාදන ක්‍රියාවලිය	1	45	3
18	ඉංජිනේරුවන් සඳහා ස්වයංක්‍රීය පරිගණක ආධාරක ඇදීම් (ඔටෝ කැඩ්) සිවිල් ත්‍රිමාණ	1	27	5
19	මා.සං.අ. යේ 2015 – 2019 සංයුක්ත සැලසුම් පිළිබඳ වැඩ මුළුව	1	35	1
20	ජපානයේදී ජජාසනි යේ නැණවත් ප්‍රවාහන පද්ධතිය පිළිබඳ ලැබූ අත්දැකීම් පිළිබඳ දේශනය.	1	18	1/2
21	ප්‍රමාද විශ්ලේෂණය පිළිබඳ දේශන	2	34	1
22	රාජකාරී ලිපි හා වාර්තා සිංහල මාධ්‍යයෙන් පිළියෙල කිරීම.	1	34	1

අංකය	පුහුණු විස්තරය	කණ්ඩායම් ගණන	කණ්ඩායමකට සහභාගී වන්නන් ගණන	කණ්ඩායමකට දින ගණන
23	ඉලෙක්ට්‍රොනික ටැම් පරීක්ෂණ ක්‍රම හා පරීක්ෂණ ප්‍රතිඵල පැහැදිලි කිරීම පිළිබඳ වැඩ මුළුව.	1	40	1/2
24	තෙත්භූමි හරහා මහාමාර්ග ඉදි කිරීමට සම්බන්ධ ගැටළු පිළිබඳ වැඩ මුළුව	1	70	1
25	අ.මා.මෙ.න.හා ක. අංශයේ අයකැමිවරුන් සඳහා නිලාරම්භක පුහුණුව	1	95	5
26	යටිතල ව්‍යුහ ව්‍යාපෘති සඳහා බෙන්ටලි ව්‍යුහාත්මක විසඳුම් පිළිබඳ එළි දැක්වීම	1	25	1/2
27	තිරසාර ව්‍යුහයන් පිළිබඳ හොල්සිම් සම්මන්ත්‍රණය	1	50	1
28	ඉදිරිගාමී යථාර්ථ ආදර්ශනය, මාර්ග සැලසුම් හා ව්‍යාපෘති වත්කම් කළමනාකරණය පිළිබඳ එළි දැක්වීම.	1	35	1
29	ප්‍රංශ පාලම් නඩත්තු පුහුණු වැඩ සටහන	1	40	2
30	ඇස්පෝල්ට් ඇතුරුම් පරීක්ෂාව පිළිබඳ වැඩමුළුව	1	75	4
සමස්ත සහභාගිවන්නන් ගණන		**1083**		

3.20.1.2 බාහිර ආයතනවල පුහුණුව

ඉහත විස්තර කළ නේවාසික පුහුණු කටයුතු වලට අමතරව, පුහුණු අංශය විසින් පවත්වන ලද අදාල පුහුණු පාඨමාලා, සම්මන්ත්‍රණ සඳහා මා.සං.අ. යේ නිලධාරීන් **448** දෙනෙකු නම්කර යවන ලදි.

වගු අංක 49: 2015 වර්ෂයේ බාහිර ආයතනවල පුහුණු වැඩ සටහන්

අංකය	ආයතනවල නම්	පුහුණුව පිළිබඳ විස්තර	පුහුණු වූ නිලධාරීන් ගණන	දින ගණන
01	ඉදිකිරීම් උපකරණ පුහුණු මධ්‍යස්ථානය (CETRAC)	ගොඩනැගිලිවල "ගිනි ආරක්ෂණ පද්ධතිය" පිළිබඳ වැඩමුළුව	02	02
		රියැදුරන් සඳහා වැඩ මුළුව (සිංහල මාධ්‍යය)	10	01
		ප්‍රවාහන කළමනාකරණය පිළිබඳ වැඩ මුළුව	04	02
02	මොරටුව විශ්ව විද්‍යාලය	"යුරෝ කෝඩ් 2 - වැර ගැන්වූ කොන්ක්‍රීට් සැලසුම" පිළිබඳ වැඩ මුළුව	11	04
		"ඒකාබද්ධ ඉඩම් භාවිත ප්‍රවාහන ආදර්ශනය" පිළිබඳ වැඩ මුළුව.	02	01

අංකය	ආයතනවල නම්	පුහුණුව පිළිබඳ විස්තර	පුහුණු වූ නිලධාරීන් ගණන	දින ගණන
03	පේරාදෙණිය විශ්ව විද්‍යාලය	" ප්‍රායෝගික සීමිත මූලිකාංග විශ්ලේෂණ - සංකල්ප හා භාවිතය" පිළිබඳ වැඩ මුළුව	04	04
04	ශ්‍රී ලංකා ඉංජිනේරු ආයතනය (IESL)	"ජාතික ඉංජිනේරු සමුළුව - 2015"	09	01
		"වෘත්තිකයන් සඳහා ඉංග්‍රීසි" ආ.වෘ.සං. පාඨමාලාව	01	12
		"ව්‍යාපෘති කළමනාකරණය පිළිබඳ" ආ.වෘ.සං. පාඨමාලාව	02	2 ½ hrsx20d
		"ව්‍යාපෘති කළමනාකරණය පිළිබඳ" ආ.වෘ.සං. පාඨමාලාව	20	03
		"යාන්ත්‍රික ඉංජිනේරු පිළිබඳ" ආ.වෘ.සං. පාඨමාලාව	05	13
		"ඉංජිනේරුවන් සඳහා මූල්‍ය කළමනාකරණය පිළිබඳ" ආ.වෘ.සං. පාඨමාලාව	01	04
		ඉංජිනේරු වෘත්තිකයන් සඳහා ආයතනමය ආචාර විධි පිළිබඳ පාඨමාලාව.	03	01
		"ඉදිකිරීම් ඉංජිනේරු විද්‍යාව සඳහා ව්‍යාපාර සම්පත් සැලසුම්කරණය" පිළිබඳ ආ.වෘ.සං. පාඨමාලාව	13	04
05	වෘත්තීය පුහුණු හා සංවර්ධන ආයතනය	"ඉදිකිරීම් ආරක්ෂාව" පිළිබඳ සම්මන්ත්‍රණය	08	01
06	ශ්‍රී ලංකා පදනම් ආයතනය	ඉංග්‍රීසි පිළිබඳ ජාතික ඩිප්ලෝමාව	01	
07	හොල්සිම් ලංකා සමාගම	ව්‍යුහයන් සඳහා සිමෙන්ති භාවිතය පිළිබඳ සම්මන්ත්‍රණය	51	1/2
08	සොයිල් ටෙක් පුද්. සමාගම	"මාර්ග දෙපස බෑවුම් අසමත් වීම් පාලන පියවර" පිළිබඳ සම්මන්තණය	87	½
09	ප්‍රාග් ඉන්ස්ටිටියුට්	මහජන දේපල - පාඩුවීම්, හානි, සොරකම් හා හදිසි අනතුරු සඳහා පරිපාටිය පිළිබඳ සිංහල මාධ්‍ය සම්මන්ත්‍රණය	05	01
		"මූලික ප්‍රසම්පාදන පිළිවෙත" පිළිබඳ පුහුණු වැඩ සටහන	04	01
10	මානව සම්පත් සංවර්ධන ආයතනය, කොළඹ විශ්ව විද්‍යාලය	"ආකල්ප හා කුසලතා සංවර්ධනය" පිළිබඳ වැඩ මුළුව	02	01

අංකය	ආයතනවල නම්	පුහුණුව පිළිබඳ විස්තර	පුහුණු වූ නිලධාරීන් ගණන	දින ගණන
11	කුසලතා සංවර්ධන අරමුදල් (පුද්) සමාගම	" පරිපාලන නීතිය" පිළිබඳ සම්මන්ත්‍රණය	09	01
		"ලේකම් කටයුතු" පිළිබඳ වැඩ මුළුව	02	04
		"ඵලදායි කළමනාකරණ කුසලතා" පිළිබඳ වැඩමුළුව	03	02
		"රාජ්‍ය ආයතනවල විගණන විමසුම් අවම කරන්නේ කෙසේද"	02	02
		"අයකැමි / සරප් වරයාගේ කාර්ය භාරය හා වගකීම්" පිළිබඳ වැඩ මුළුව	01	01
		රියැදුරන් සඳහා වැඩ මුළුව	10	01
		ලේකම්වරුන් හා ඉහළ පෙළ නිලධාරීන් සඳහා "දුරකථන කුසලතා ආචාර විධි පුහුණුව හා පුද්ගලික විනීත භාවය"	06	02
		" කාර්යාල කළමනාකරණය හා කාර්යාල පරිපාටිය" පිළිබඳ සිංහල මාධ්‍ය පුහුණු වැඩ සටහන	17	02
12	ශ්‍රී ලංකා සංස්ථාපිත ඉංජිනේරු ආයතනය (IIESL)	" පසු කොන්ත්‍රාත් කළමනාකරණයට සම්බන්ධ ඉක්ටාඩ් / එස්බීඩි 02 හා ෆීඩික් මත පදනම් වූ කොන්ත්‍රාත් කොන්දේසි" අර්ථ කථනය හා හැඳින්වීම පිළිබඳ අ.වෘ.සං. . වැඩ සටහන	27	01
13	ශ්‍රී ලංකා පිරිස් පාලන ආයතනය (IPM)	" අධීක්ෂණ සංවර්ධනය" පිළිබඳ පුහුණු වැඩ සටහන	05	01
		"ජාතික මා.ස. සංවර්ධනය 2015"	05	02
14	සැපයුම් හා ද්‍රව්‍ය කළමනාකරණ ආයතනය (SMMI)	මිලදී ගැනීම පිළිබඳ සහතික පත්‍ර පාඨමාලාව - සිංහල මාධ්‍යය	05	12
		"ගබඩාකරණය" පිළිබඳ සහතික පත්‍ර පාඨමාලාව - සිංහල මාධ්‍යය	03	07
15	ආසියානු සංවර්ධන බැංකුව (ADB)	"ව්‍යාපෘති තාක්ෂණික සහාය, වාර්තා පිළියෙල කිරීම නිම කිරීම මගින් තක්සේරු ධාරිතාව සංවර්ධනය" පිළිබඳ වැඩමුළුව	02	03
16	ඉංජිනේරු තාක්ෂණික ආයතනය	"විද්‍යුත් සංචලතාව හා නාගරික ප්‍රවාහනය" පිළිබඳ ජාත්‍යන්තර සම්මන්ත්‍රණය	06	01
17	ශ්‍රී ලංකා විවෘත විශ්ව විද්‍යාලය	ජූම්ලා හා වර්ඩ්ප්‍රෙස් භාවිතා කරමින් වෙඩ් අඩවි සංවර්ධනය පිළිබඳ කෙටි කාලීන පාඨමාලාව	02	10

අංකය	ආයතනවල නම්	පුහුණුව පිළිබඳ විස්තර	පුහුණු වූ නිලධාරීන් ගණන	දින ගණන
18	මල්ටි ටෙක් සොලියුෂන් (පුද්) සමාගම	"රාජ්‍ය ප්‍රසම්පාදනය පිළිබඳ සහතික පත්‍ර පාඨමාලාව" පිළිබඳ පුහුණු වැඩ සටහන	30	03
19	දුරස්ථ අධ්‍යයන මධ්‍යස්ථානය	"ආසියාවේ යටිතල ව්‍යුහ මූල්‍යනය පුද්ගලික රාජ්‍ය හවුල්කරු ආදර්ශය" පිළිබඳ සිද්ධි අධ්‍යයනයට යොමු වූ මිශ්‍ර අධ්‍යාපන වැඩ සටහන	08	03
20	ශ්‍රී ලංකාවේ ඉදිකරන්නන්ගේ ආයතන (CIOB)	"2015 - 4 වැනි CIOB ලෝක ඉදිකිරීම් සම්මන්ත්‍රණය"	05	02
21	ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන අධිකාරිය (CIDA)	"ඉදිකිරීම් රක්ෂණය" පිළිබඳ සම්මන්ත්‍රණය	10	01
22	කම්කරු අධ්‍යයනය පිළිබඳ ජාතික අධ්‍යයන සමාගම(NILS)	සාප්පු හා කාර්යාල පණත පිළිබඳ පුහුණු වැඩ සටහන	09	01
23	වාණිජ නීතිය හා භාවිත සංවර්ධන ආයතනය (ICLP)	"ඉදිකිරීම් විනිශ්චය හා බේරුම්කරණය - 2015" පිළිබඳ පාඨමාලාව	07	05
24	ශ්‍රී ලංකා තක්සේරුකරු සංගමය	"5 වැනි අර්ධ වාර්ෂික ජාත්‍යන්තර සම්මන්ත්‍රණය"	03	02
25	භාෂා අධ්‍යයන හා පුහුණුව පිළිබඳ ජාතික ආයතනය	දෙමළ භාෂා පුහුණු වැඩ සටහන	02	12
26	තිරසාර ඉදිකිරීම් පරිසරය සඳහා ජාත්‍යන්තර මධ්‍යස්ථාන සමාගම	පරිමිත සංසටක විශ්ලේෂණය පිළිබඳ වැඩ සටහන (න්‍යාය හා භාවිතය)	01	04
27	ශ්‍රී ලංකා පදනම් ආයතනය	"ව්‍යාපෘති යෝජනා ලිවීම" පිළිබඳ වැඩ මුළුව	01	02
28	මධ්‍යම පරිසර අධිකාරිය	"තීව්‍ර පාරිසරික බලපෑම් තක්සේරුව" පිළිබඳ පුහුණු වැඩ සටහන	03	10
29	මොරටුව විශ්ව විද්‍යාලයේ සිවිල් ඉංජිනේරු දෙපාර්තමේන්තුව	"මහාමාර්ග ඉදිකිරීම් තාක්ෂණය" පිළිබඳ පාඨමාලාව	02	06
30	භාෂා අධ්‍යයන හා පුහුණුව පිළිබඳ ජාතික ආයතනය	"දින 12 දෙමළ භාෂා පුහුණු වැඩ සටහන"	12	12
31	ශ්‍රී ලංකාවේ LBR LBO පර්යේෂණායතනය	"2015 LBR LBO යටිතල ව්‍යුහ සමුළුව - කොළඹ ගෝලීය තරහකාරී නගරයක් බවට පත් කිරීම" පිළිබඳ පුහුණු වැඩ සටහන	03	02

අංකය	ආයතනවල නම්	පුහුණුව පිළිබඳ විස්තර	පුහුණු වූ නිලධාරීන් ගණන	දින ගණන
32	ජිඅයිඑස් සොලියුෂන් පුද්. සමාගම	ආර්ක් භූ.තොා.ප. භාවිතා කිරීම පිළිබඳ හැඳින්වීම් පාඨමාලාව	01	05
33	ශ්‍රී ලංකාවේ සැ.දා.හා. ප්‍රවාහනය පිළිබඳ ආයතනය	"සැ.දා.හා.ප්‍ර. පිළිබඳ ජාත්‍යන්තර සම්මන්ත්‍රණය"	01	01
සමස්ත සහභාගිවුවන් ගණන			448	

3.20.1.3 දේශීය විශ්ව විද්‍යාලවල / ආයතනවල දිගු කාලීය පාඨමාලා හැදෑරීමේ අවස්ථා

වගු අංක 50: 2015 වර්ෂයේ දේශීය විශ්ව විද්‍යාල / ආයතනවල දිගුකාලීන පාඨමාලා

දේශීය විශ්ව විද්‍යාල / ආයතනවල විද්‍යාපති / ඉංජිනේරුපති / පශ්චාත් උපාධි, ඩිප්ලෝමා / ඩිප්ලෝමා වැනි දිගු කාලීන පාඨමාලා හැදෑරීම සඳහා නිලධාරීන් (33) දෙනෙකු නම්කර යවන ලදි.

අංකය	සංවිධානය	පුහුණු විස්තර	නිලධාරීන් ගණන
01	ශ්‍රී ජයවර්ධන පුර විශ්ව විද්‍යාලය	භූ විද්‍යා හා පාරිසරික කළමනාකරණය පිළිබඳ විද්‍යාපති / ප.උ.ඩි. / ඩිප්ලෝමා පාඨමාලා	01
02	මොරටුව විශ්ව විද්‍යාලය	මහාමාර්ග හා රථවාහන ඉංජිනේරු විද්‍යාව පිළිබඳ විද්‍යාපති / ප.උ. / ඩිප්ලෝමා පාඨමාලා	05
		ප්‍රවාහනය පිළිබඳ විද්‍යාපති පාඨමාලාව	01
		"නිෂ්පාදන පද්ධති ඉංජිනේරු විද්‍යාව පිළිබඳ" ප.උ.ඩි.	01
03	පේරාදෙණිය විශ්ව විද්‍යාලය	භූ තාක්ෂණික ඉංජිනේරු විද්‍යාව හා ඉංජිනේරුමය භූ විද්‍යාව පිළිබඳ ප.උ. ඩි.	02
		මහාමාර්ග හා රථවාහන ඉංජිනේරු විද්‍යාව පිළිබඳ විද්‍යාපති / ප.උ.ඩිප්ලෝමා පාඨමාලාව	02
		ව්‍යුහ ඉංජිනේරු විද්‍යාව පිළිබඳ ප.උ. ඩිප්ලෝමා පාඨමාලාව	01
		"ඉංජිනේරු කළමනාකරණය" පිළිබඳ ප.උ. ඩිප්ලෝමාව	1
04	කොළඹ විශ්ව විද්‍යාලය	රාජ්‍ය පරිපාලන / රාජ්‍ය කළමනාකරණය පිළිබඳ ප.උ. ඩිප්ලෝමා පාඨමාලාව	03

අංකය	සංවිධානය	පුහුණු විස්තර	නිලධාරීන් ගණන
05	ජාතික ව්‍යාපාර කළමනාකාරිත්ව ආයතනය	මානව සම්පත් කළමනාකරණය පිළිබඳ උසස් ජාතික ඩිප්ලෝමාව	02
		"මූල්‍ය කළමනාකරණ ගිණුම්කරණය" පිළිබඳ ඩිප්ලෝමාව	10
06	වාණිජ නීතිය හා භාවිතය සංවර්ධනය සඳහා ආයතනය	"වාණිජ බෙරුම්කරණය" පිළිබඳ ඩිප්ලෝමාව	4
සහභාගිවූවන්ගේ මුළු ගණන			**33**

3.20.1.4 විදේශ පුහුණුව

මා.සං.අ. විසින් 2015 වර්ෂය තුල විදේශ පුහුණු පාඨමාලා, වැඩමුළු හා සම්මන්ත්‍රණ 24 කින් 14 ක් සඳහා පමණක් අනුමැතිය ලබාදුන් අතර, 28 දෙනෙකු ඊට සහභාගි විය.

වගු අංක 51: 2015 වර්ෂය තුල විදේශ පුහුණු වැඩ සටහන්

අංකය	රට	පුහුණු විස්තර	සහභාගි වූ නිලධාරීන් සංඛ්‍යාව	දින ගණන
01	ජපානය	"ජපන් වි.සං.ආ. ණය ආධාර ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සඳහා පාරිසරික හා සාමාජීය ක්‍රියාවලිය පරිපාලනය" පිළිබඳ පුහුණු වැඩ සටහන. 2015 මාර්තු 31 සිට අප්‍රේල් 15 දක්වා.	01	16
		"නැණවත් ප්‍රවාහන පද්ධතිය" පිළිබඳ වැඩ සටහන 2015 ජූලි 05 සිට අගෝස්තු 01 දක්වා	2	30
		"අධිවේගි මාර්ග ඉදිකිරීම, කළමනාකරණය, මෙහෙයවීම හා නඩත්තුව" පිළිබඳ පුහුණු වැඩ සටහන 2015 ඔක්. 12 සිට 31 දක්වා	2	21
		"GTC/RTC විස්තීර්ණ පාලම් ඉංජිනේරු විද්‍යාව පිළිබඳ වැඩ සටහන	2	60
		"GTC/RTC: විස්තීර්ණ නාගරික ප්‍රවාහන සැලසුම්කරණය" පිළිබඳ පුහුණු වැඩ සටහන 2015 ඔක්තොම්බර් 12 සිට දෙසැම්බර් 12 දක්වා	3	60
		"අධිවේගි මාර්ග ඉදිකිරීම, නඩත්තුව හා ගාස්තුකරණය පිළිබඳ ඉංජිනේරුවන් සඳහා විදේශ පුහුණු වැඩ සටහන" 2015 ඔක්තොම්බර් 15 සිට 30 දක්වා	7	14
		"KCCP : මාර්ග නඩත්තුව හා කළමනාකරණය" පිළිබඳ පුහුණු වැඩ සටහන 2015 ඔක්තොම්බර් 21 සිට දෙසැම්බර් 12 දක්වා.	1	60

අංකය	රට	පුහුණු විස්තර	සහභාගි වූ නිලධාරීන් සංඛ්‍යාව	දින ගණන
02	චීනය	"ශ්‍රී ලංකාව සඳහා යටිතල ව්‍යුහ ඉදිකිරීම හා සැලසුම් කරණය පිළිබඳ සම්මන්තණය චීනයේදි" 2015 මාර්තු 19 සිට අප්‍රේල් 7 දක්වා	01	20
		"සංවර්ධනය වන රටවල් සඳහා උමං මාර්ග ඉදිකිරීම හා කළමනාකරණය පිළිබඳ සම්මන්ත්‍රණය" 2015 අගෝස්තු 06 සිට 26 දක්වා.	2	30
		"යුරෝආසියා රටවල් සඳහා යටිතල ව්‍යුහ සැලසුම්කරණය" පිළිබඳ සම්මන්ත්‍රණය 2015 ජූලි 28 සිට අගෝස්තු 17 දක්වා	1	30
		"සංවර්ධනය වන රටවල උමං මාර්ග ඉදිකිරීම හා කළමනාකරණය" පිළිබඳ වැඩ මුළුව 2015 අගෝස්තු 6 සිට අගෝස්තු 26 දක්වා	2	30
03	කොරියාව	"යටිතල ව්‍යුහ සංවර්ධනය සඳහා ප්‍රවාහන ප්‍රතිපත්ති පිළිබඳ 2015 සාර්ක් විශේෂ පුහුණු වැඩ සටහන" 2015 සැප්තැම්බර් 3 සිට 26 දක්වා	1	1 month
04	ඕස්ට්‍රේලියාව	"28 වැනි ආසියානු නීති සම්මන්ත්‍රණය" 2015 නොවැම්බර් 06 සිට 09 දක්වා	1	3
05	සිංගප්පූරුව	"තිරසාර නාගරික ප්‍රවාහන සැලසුම්කරණය හා කළමනාකරණය" පිළිබඳ පුහුණු පාඨමාලාව	01	04
එකතුව			**28**	

3.20.1.5 වෘත්තීය පුනරීක්ෂණය සඳහා ඉංජිනේරුවන් පුහුණු කිරීම

සැලසුම් කාර්යාල පුහුණුව සඳහා ප්‍රමුඛතා ලේඛනය යටතේ, සැලසුම් කාර්යාල පුහුණුව සඳහා ඉංජිනේරුවන් නම් කර යැවීම පුහුණු අංශයේ අධීක්ෂණය යටතේ, හොඳින් ක්‍රියාත්මක වේ. 2015 වර්ෂය තුල පහත සඳහන් පරිදි සැලසුම් පුහුණුව සඳහා ඉංජිනේරුවන් තිස් හත් දෙනෙක් (37) නම් කර යවන ලදි.

වගු අංක 52: 2015 වර්ෂයේ ඉංජිනේරුවන් සඳහා සැලසුම් පුහුණු වැඩ සටහන

සැලසුම් කාර්යාලයේ නම	නම්කර යවන ලද ඉංජිනේරුවන් ගණන
මහාමාර්ග සැලසුම් කාර්යාලය	15
පාලම් සැලසුම් කාර්යාලය	9
මහනුවර සැලසුම් කාර්යාලය	7
රත්නපුර සැලසුම් කාර්යාලය	4
කුරුණෑගල සැලසුම් කාර්යාලය	2
එකතුව	**37**

3.20.1.6 උපාධි අපේක්ෂකයන් හා ආධුනිකයන් සඳහා පුහුණු අවස්ථා.

විශ්ව විද්‍යාල, කාර්මික විද්‍යාල හා වෙනත් ආයතනවල උපාධි අපේක්ෂකයන් හා ආධුනිකයන් සඳහා ජාතික ආධුනිකත්ව හා කාර්මික පුහුණු අධිකාරිය සමඟ සහයෝගීව මා.සං.අ. තුල ඔවුන්ගේ යන්ත්‍රාගාර පුහුණුව ලබා ගැනීමට අවස්ථාවක් ද සලසන ලදි.

වගු අංක 53: දේශීය විශ්ව විද්‍යාල / ආයතන වල උපාධි අපේක්ෂකයන් හා ආධුනිකයින් සඳහා පුහුණු අවස්ථා

අංකය.	දේශීය විශ්ව විද්‍යාල හා ආයතන	ශිෂ්‍යයන් සංඛ්‍යාව
1	පේරාදෙණිය විශ්ව විද්‍යාලයේ ඉංජිනේරු පීඨය	35
2	මොරටුව විශ්ව විද්‍යාලයේ ඉංජිනේරු පීඨය	6
3	රුහුණු විශ්ව විද්‍යාලයේ ඉංජිනේරු පීඨය	14
4	යාපනය විශ්ව විද්‍යාලයේ ඉංජිනේරු පීඨය	4
5	ගිණිකොනදිග විශ්ව විද්‍යාලය - ශ්‍රී ලංකා	13
6	තාක්ෂණික ජාතික ඩිප්ලෝමාව, මොරටුව විශ්ව විද්‍යාලය	3
7	කටුනායක ඉංජිනේරු තාක්ෂණ ආයතනය	10
8	කාර්මික විද්‍යාල	4
9	මොරටුව විශ්ව විද්‍යාලයේ ප්‍රවාහන හා සැපයුම් දාම කළමනාකරණ පීඨය	5
10	සර් ජෝන් කොතලාවල ආරක්ෂක විශ්ව විද්‍යාලය	2
11	තොරතුරු තාක්ෂණ ආයතනය (SLIIT)	4
12	තාක්ෂණ හා වෛද්‍ය විද්‍යාව පිළිබඳ දකුණු ආසියානු ආයතනය (SAITM)	3
13	අම්පාර, හාඩි උසස් තාක්ෂණ ආයතනය	1
සමස්ත පුහුණුකරුවන් ගණන		**104**

3.20.1.7 උසස් වීම සඳහා පරීක්ෂණ

වගු අංක 54: පුහුණු අංශය විසින් සංවිධානය කළ උසස් වීමේ පරීක්ෂණ

අංකය	පරීක්ෂණය	සහභාගි වූ නිලධාරීන් සංඛ්‍යාව
01	පර්යේෂණ සහකාරවරුන් ද්‍රව්‍ය ඉංජිනේරු තනතුරු වලට උසස් කිරීම සඳහා තරහ විභාගය	20
02	කාර්මික නිලධාරීන් සුදුසුකම් නොලත් ඉංජිනේරු තනතුරු වලට උසස් කිරීමේ තරහ විභාගයේ පුනරීක්ෂණය	10

3.21 නීති සේවා

මා.සං.අ. ප්‍රධාන කාර්යාලයේ නීති අංශය විසින් නීති සේවා ක්‍රියාත්මක කරනු ලැබේ. නීති අධ්‍යක්ෂ නීති අංශයේ ප්‍රධානියා වන අතර ඔහුට ජ්‍යෙෂ්ඨ නීති නිලධාරි, නීති නිලධාරීන් හා සහාය කාර්ය මණ්ඩලයේ සහයෝගය ලැබේ.

3.21.1 වගකීම්.

නීති අංශය මූලික වශයෙන් මා.සං.අ. යේ නීති කටයුතු වලට සම්බන්ධව ක්‍රියා කරයි. සාමාන්‍ය පරිදි උසාවිවල පෙනී සිටීමටඅමතරව, මෙම අංශයේ කාර්ය භාරය වන්නේ, නීතිමය කරුණු පිළිබඳව සභාපති, අධ්‍යක්ෂ ජනරාල්, අතිරේක අධ්‍යක්ෂ ජනරාල්වරුන්, අධ්‍යක්ෂවරුන්, ඉංජිනේරුවන් හා සියලුම කාර්ය මණ්ඩලයට නීති උපදෙස් ලබාදීම හා මා.සං.අ. යේ එදිනෙදා නීති කටයුතු ක්‍රියාත්මක කිරීමයි.

3.21.2 නීති අංශයේ කාර්ය භාරය හා කර්තව්‍යය.

- මාර්ග රක්ෂිතයේ හා ගොඩනැගිලි සීමාව තුල අනවසර ඉදිකිරීම් ඉවත් කිරීම සඳහා උසාවිවල නීති ක්‍රියා මාර්ග ගැනීම.
- මාර්ග භාවිතකරුවන් හා වෙනත් අය විසින්, මා.සං.අ. යේ වත්කම් වලට සිදු කරන අලාභ අයකර ගැනීමට, පිළියෙල කිරීම හා යැවීම.
- මා.සං.අ. වාහන, මාර්ග හා වෙනත් වත්කම් වලට සිදුවන අලාභ අයකර ගැනීමට දිස්ත්‍රික් උසාවිවල සිවිල් නඩු පැවරීම.
- බෙරුම්කරණ විනිශ්චය සභා වලදී මා.සං.අ. / ව්‍යාපෘති වෙනුවෙන් පෙනී සිටීම.

- උසාවිවල හා විනිශ්චය සභාවල ගොනු කිරීම සඳහා අවශ්‍ය නීතිමය ලේඛන පිළියෙල කිරීම.
- මා.සං.අ. වෙනත් පාර්ශවයන් සමඟ ගිවිසුම් වලට ඇතුළත් වීමේදි ගිවිසුම් / අවබෝධතා ගිවිසුම් කෙටුම්පත් කිරීම / අනුමත කිරීම.
- මා.සං.අ. ට එරෙහිව මූලික අයිතිවාසිකම් අයදුම්පත්, රිට් අයදුම්පත් හා වෙනත් සිවිල් නඩු ගොනු කිරීමේදි හා මා.සං.අ. විසින් නඩු ගොනු කිරීමේදි ඒවා සම්බන්ධව නීතිපතිවරයා සමඟ සම්බන්ධීකරණය කිරීම.
- නීති ගැටළු වලදී වෙනත් අමාත්‍යාංශ හා ආයතන සමඟ සම්බන්ධීකරණය.
- මානව හිමිකම් කොමිෂන්, පාර්ලිමේන්තු කමිටු හා වෙනත් පරීක්ෂණ කොමිෂන් සභා වලදී මා.සං.අ. නියෝජනය කිරීම.
- කම්කරු විනිශ්චය සභා, කාර්මික අධිකරණය හා කම්කරු කොමසාරිස්වරයාගේ පරීක්ෂණ වලදී නඩු මෙහෙයවීම.
- මා.සං.අ. යේ කාර්ය මණ්ඩල සාමාජිකයන්ට නීතිය පොදු මූල ධර්ම, මා.සං.අ. පණත, මංමාවත් ආඥා පණත පිළිබඳව පැහැදිලි කිරීම.
- කල්බදු ගිවිසුම් හා වෙනත් ගිවිසුම් පිළියෙල කිරීම.
- මා.සං.අ. අයත් නිල නිවාස / වත්කම්වල කල් ඉක්මවා රැඳී සිටින පුද්ගලයන් ඉවත් කිරීම සඳහා උසාවියේ නඩු පැවරීම.
- උසාවි නඩු පිළිබඳව කටයුතු කරන මා.සං.අ. යේ පිරිස් වලට නීතිමය උපදෙස් සැපයීම.
- අවශ්‍ය වූ විට මා.සං.අ. යේ අවශ්‍යතාවන් ආරක්ෂා කිරීම සඳහා නීති නිලධාරීන් උසාවියේ පෙනී සිටීම.
- මා.සං.අ. යේ දේපල සම්බන්ධව මහේස්ත්‍රාත් උසාවියේ රථ වාහන නඩු වලදී රථවාහන පොලීසියට සහාය වීම.

3.21.3 2015 වර්ෂය තුල කාර්යයන්ගේ ප්‍රගතිය.

නීති අංශයේ ඉලක්කය 2008 අංක 40 මංමාවත් පණතේ 42(1) හා 50(3) වගන්ති යටතේ නඩු වැඩි ගණනක් ගොනු කිරීමයි. නීති අංශය විසින් විවිධ පළාත්වල මහේස්ත්‍රාත් නඩු 248 ක් ගොනුකර මා.සං.අ.ට වාසි වන අයුරින් තීන්දු ලබා ගැනීමට හැකිවිය.

මෙය අනාගත සංවර්ධනය සඳහා මා.සං.අ. යේ මාර්ග රක්ෂිතයන් නිදහස් කර ගැනීමට හා ගොඩනැගිලි සීමා නිදහස් කර ගැනීමට උපකාරී වනු ඇත.

ප්‍රාදේශීය ලේකම්වරුන් විසින් අත්පත් කර ගත් ඉඩම්වල නිදහස් සන්තකයන් මාර්ග ඉදිකිරීම් සඳහා භාර දිය යුතුව ඇතත්, ඉඩම් හිමියන් සන්තකය භාරදීම ප්‍රතික්ෂේප කරන බැවින්, සේවාවේ හදිසි අවශ්‍යතාව මත නීති අංශය විසින් උසාවි කාර්යාවලිය මගින් ඉවත් කිරීමේ නියෝග ලබා ගනු ලැබේ.

නීති අංශය විසින් චීන ඔටෝ කයික් සමාගමේ නීතිඥවරුන් සමඟ ගිවිස ගැනීම් මගින් මා.සං.අ. විසින් සමාගමට ගෙවිය යුතු රු.12,600,979/= ක පොලී මුදල කපා හැරීමට හැකි විය.

3.21.4 2015 වර්ෂය තුල කාර්ය සාධනය

2015 වර්ෂය තුල කාර්ය සාධනය මාර්ග සංවර්ධන අධිකාරියට එරෙහිව පවරන ලද නඩු සහ මා.සං.අ. විසින් පවරන ලද නඩු පිළිබඳ සාරාංශයක් වගු අංක 55 දැක්වේ:

වගු අංක 55: 2015 වර්ෂය තුල මා.සං.අ. ට එරෙහිව පවරන ලද නඩු හා මා.සං.අ. විසින් පවරන ලද නඩු පිළිබඳ සාරාංශය.

විස්තරය	2014.12.31 දක්වා සමුච්චිත සංඛ්‍යාව	2015 වර්ෂය තුල මා.සං.අ. ට එරෙහිව පවරන ලද නඩු ගණන	2015 වර්ෂය තුල මා.සං.අ. විසින් බාහිර පාර්ශවයන්ට එරෙහිව පවරන ලද නඩු සංඛ්‍යාව	2015 තුල නිමකල නඩු ගණන	එකතුව
උපරිමාධිකරණය	06	07	01	04	10
අභියාචනාධිකරණය	26	23	-	03	46
ඉහළ උසාවිය	13	12	01	04	22
දිස්ත්‍රික් උසාවිය	98	99	03	09	191
මහේස්ත්‍රාත් උසාවිය	178	04	253	75	360
කම්කරු විනිශ්චය සභාව	01	03	-	01	03
කාර්මික අධිකරණය	-	-	-	-	-
මානව හිමිකම් කොමිෂන් සභාව		15	-	14	01

3.22 ප්‍රසම්පාදන සේවා

මා.සං.අ. යේ ප්‍රසම්පාදන අංශය විසින් ප්‍රසම්පාදන සේවා ක්‍රියාත්මක කෙරේ. අතිරේක අධ්‍යක්ෂ ජනරාල් (පරිපාලන හා මුදල්) හා අධ්‍යක්ෂ (ප්‍රසම්පාදන) විසින් සහාය කාර්ය මණ්ඩලයේ සහාය ඇතිව අධ්‍යක්ෂ ජනරාල්වරයාට වෘත්තීයමය සහාය සපයනු ලැබේ.

අංශය වෙත පවරා ඇති වගකීම වන්නේ, ශ්‍රීලංර යටතේ අරමුදල් සපයන මාර්ග හා පාලම් වැඩි දියුණු කිරීමේ වැඩ සඳහා ප්‍රසම්පාදන කටයුතු හා මා.සං.අ. සඳහා තොග වශයෙන්, ලිපිද්‍රව්‍ය හා භාණ්ඩ මිලදී ගැනීම මෙහෙයවීමය. මෙයට අයත් ප්‍රධාන කාර්යයන් වලට සැපයුම් දාම අවශ්‍යතාවට සහාය වන අතර, සංවර්ධන කාර්යයන් සඳහා ලංසු කැඳවීම, ඇගයීම හා කොන්ත්‍රාත් ප්‍රදානය කිරීම ඇතුළත් වේ.

3.22.1 ක්‍රියාත්මක කරන ලද වැඩ සටහන් සහ කටයුතු වල ප්‍රගතිය.

මාර්ග හා පාලම් ඉදිකිරීම වෙනුවෙන් ප්‍රසම්පාදන ක්‍රියාවලිය ඉටු කිරීමට මෙම අංශය වෙත යොමු නොකෙරිණි. පරිභෝජනය සඳහා රු.මි. 31.13 වටිනා පාරිභෝගික ද්‍රව්‍ය හා ලිපිද්‍රව්‍ය මිලදී ගන්නා ලදි.

වැඩ විෂය පථය පාරිභෝගික හා ලිපිද්‍රව්‍ය මිලදී ගැනීමට පමණක් සීමා විය. 2015 වර්ෂය තුල මෙහෙය වන ලද වැඩ සඳහා රු.මි. 31.13 ක් වූ අතර එය 2014 වර්ෂය හා සැසඳීමේදි රු.මි. 6.53ක වැඩ වීමකි.

3.23 පිරිස් කළමනාකරණය

ප්‍රධාන කාර්යාලයේ පිහිටි පරිපාලන අංශය විසින් පිරිස් කළමනාකරණ කටයුතු ක්‍රියාත්මක කරනු ලබයි. එය අතිරේක අධ්‍යක්ෂ ජනරාල් (මූදල් හා පරිපාලන) ගේ විෂය පථය යටතට ගැනෙන එක් අංශයකි. අධ්‍යක්ෂ පරිපාලන අංශයේ ප්‍රධානත්වය දරණ අතර ඔහුට නියෝජ්‍ය අධ්‍යක්ෂවරුන් දෙදෙනෙකුගේ හා පරිපාලන නිලධාරීන් 7 කගේ හා සහාය කාර්ය මණ්ඩලයේ සහයෝගය ලැබේ.

පරිපාලන අංශය මා.සං.අ. යේ සමස්ත පිරිස් කළමනාකරණ කාර්යයන් කෙරේ වගකීම දරයි. සේවක බඳවා ගැනීම්, සංවර්ධනය, උසස් කිරීම, විනය කාර්යයන්, පැමිණීම හා නිවාඩු කළමනාකරණය පරිපාලන අංශය විසින් ක්‍රියාත්මක කෙරේ.

වගු අංක 56 : 2015.12.31 වන විට මා.සං.අ. යේ සේවක බලකාය

අනු අංකය	තනතුර	අනුමත සේවක සංඛ්‍යා දර්ශකය	පවත්නා සේවක සංඛ්‍යා දර්ශකය	
			ස්ථිර	කොන්ත්‍රාත්
(i)	ජ්‍යෙෂ්ඨ කළමනාකරණ සේවය	86	80	-
(ii)	ඉංජිනේරු සේවය	593	548	115
(iii)	පරිපාලන නිලධාරී සේවය	19	27	-
(iv)	තොරතුරු තාක්ෂණ සේවය	19	12	-
(v)	ගණකාධිකාරී සේවය	29	30	-
(vi)	නීති නිලධාරී සේවය	06	05	-
(vii)	කණිෂ්ඨ පරිපාලන නිලධාරී සේවය	47	46	-
(viii)	ගිණුම් / විගණන සහකාර සේවය	70	74	-
(ix)	සම්බන්ධීකාරක සේවය	78	74	
(x)	තාක්ෂණික සේවය - I	103	54	
(xi)	තාක්ෂණික සේවය - II	952	815	59
	අතිරේක සේවා			
(xii)	කළමනාකරණ සහකාර සේවය	1,753	1,684	294
(xiii)	සහාය කාර්ය මණ්ඩලය	2,550	2,224	291
	උප එකතුව	**6,305**	**5,673**	**763**
(xiv)	කම්කරු (ස්ථිර)	4,024	4,203	50
(xv)	කම්කරු (අනියම්)			
	එකතුව	**10,329**	**9,886**	**813**

3.23.1 මානව සම්පත් / පිරිස් කාර්යයන්

සේවකයන් යනු ශ්‍රී ලංකාවේ මාර්ග ජාලය ඉහළ ගුණාත්මක තත්ත්වයකින් යුතුව වැඩි දියුණු කිරීමට අඛණ්ඩව කාර්යයන් ඉටු කිරීමට මා.සං.අ. ට දායකත්වය සපයන ප්‍රධාන සම්පතකි. 2015 වර්ෂය අවසාන වන විට, මා.සං.අ.ට සමස්ත සේවකයන් 10,669 කින් සේවකයන් 9,886 ක් හා කොන්ත්‍රාත් පදනම මත වැඩ කරන සේවකයන් 813 අයත් විය. ඒ අනුව පිරිස් කළමනාකරණය ආයතනයේ ප්‍රධානතම කාර්යයක් ලෙස සැලකේ. පරිපාලන අංශය විසින් පහත දැක්වෙන පිරිස් කාර්යයන් ඉටු කරනු ලබයි.

- මානව සම්පත් / උපායාත්මක සැලසුම්කරණය
- වැඩ අධ්‍යයනය / මානව සම්පත් සැලසුම්කරණය
- සේවක සංඛ්‍යා අවශ්‍යතාව අධ්‍යයනය හා තක්සේරුව
- බඳවා ගැනීමේ පරිපාටිය සම්පාදනය / සංශෝධනය කිරීම
- සම්මුඛ පරීක්ෂණ / විභාග පැවැත්වීම හා සුදුසු සේවකයන් තෝරා ගැනීම
- අයදුම්පත් කැඳවීම
- පුහුණු අවශ්‍යතා
- නවක සේවකයන් සඳහා නිලාරම්භක පුහුණුව
- සම්මුඛ පරීක්ෂණ මණ්ඩල පත් කිරීම
- අනුස්ථාපනය
- රාජකාරී ලැයිස්තු / රැකියා විස්තරය පිළියෙල කිරීම
- පැමිණීමේ හා නිවාඩු කළමනාකරණය
- කාර්ය සාධන කළමනාකරණය / සේවක කාර්ය සාධන ඇගයීම් ක්‍රමය පිළියෙල කිරීම හා ක්‍රියාත්මක කිරීම
- සේවකයන් සේවයේ යෙදවීම – සේවකයන් වැඩවල යෙදවීමට මූලිකත්වය ගැනීම
- සේවක බලකාය කළමනාකරණය – අතෘප්තියට පත් පුද්ගලයින් / සේවකයන් සම්බන්ධ ගැටළු ආමන්ත්‍රණය
- ව්‍යවස්ථාපිත අවශ්‍යතා, අවම වැටුප්, නිවාඩු හිමිකම් ආදිය
- පුහුණුව හා සංවර්ධනය
- සේවක අභිප්‍රේරණය - විශිෂ්ට කාර්ය සාධනය හා අතිරේක සුදුසුකම් සඳහා ත්‍යාග පිරි නැමීම, කාර්මික සබඳතා ආදිය.
- අනුප්‍රාප්තික සැලැස්ම සම්පාදනය - විශ්‍රාම ගැන්වීම, ඉල්ලා අස්වීම, රාජකාරී භාර ගැනීම, රාජකාරී භාරදීම.
- සේවක සුභසාධනය, වන්දි හා ප්‍රතිලාභ
- සේ.අ.අ. / සේ.හා.අ., පාරිතෝෂික ආදිය ගෙවීම.

- ප්‍රතිසංස්කරණ / ව්‍යුහාත්මක වෙනස්කම්

3.23.2 පරිපාලන කාර්යයන්

පිරිස් කළමනාකරණයට අයත් ආයතනමය කාර්යයන් යටතේ, පිරිස් හා කාර්යාල කළමනාකරණයට සම්බන්ධ ප්‍රතිපත්ති, නීති රීති, පරිපාටි, අත්පොත් හා උපදෙස් සම්පාදනය සිදු කරනු ලැබේ. තවද, නීතිරීති, පරිපාටි පැනවීම සඳහා වක්‍රලේඛ නිකුත් කිරීම මෙන්ම වක්‍රලේඛ ක්‍රියාත්මක කිරීම, සේවක පරිසරය වැඩි දියුණු කිරීම සඳහා පිරිස් කළමනාකරණය විසින් මෙහෙයවන වැදගත් කාර්යයන්ය.
පහත දැක්වෙන පරිපාලන කාර්යයන් පරිපාලන අංශය විසින් ක්‍රියාත්මක කරනු ලැබේ.


- පරිපාලන සැලසුම්කරණය
- ප්‍රතිපත්ති සම්පාදනය
- වක්‍රලේඛ / ස්ථාවර නියෝග නිකුත් කිරීම
- ප්‍රතිපත්ති, වක්‍රලේඛ හා නියෝග ක්‍රියාත්මක කිරීම
- විනය හා ආරක්ෂාව පවත්වා ගැනීම
- තැපෑල නඩත්තු කිරීම – නියමිත වේලාවට එන හා යන ලියුම් බෙදා හැරීම
- වත්කම් ප්‍රසම්පාදනය හා සියලුම වත්කම් නඩත්තුව
- වෙනත් අධිකාරීන් / ආයතන සමඟ සන්නිවේදනය පවත්වා ගැනීම
- ප්‍රලේඛනය නඩත්තුව
- විනය පරිපාටිය ක්‍රියාත්මක කිරීම
- යුක්තිය පසිඳලන ආයතන සමඟ නීතිමය කටයුතු මෙහෙයවීම
- ගොඩනැගිලි හා වෙනත් පහසුකම් නඩත්තුව
- රජය හා පළාත්පාලන ආයතන විසින් ප්‍රකාශයට පත් කෙරෙන සාමාජීය ආගමික කටයුතු වලට සහභාගි වීම
- හදිසි තත්ත්වයන් වලට අනුව ක්‍රියා කිරීම ආදිය
- වෙනත් ආයතන සමඟ ධනාත්මක සබඳතා පවත්වා ගෙන යාම
- ප්‍රවාහනය පවත්වා ගෙන යාම
- අවශ්‍ය වන ක්‍රියාකාරකම් සංවිධානය කිරීම
- ගබඩා ඇතුළු සැපයුම් දාම වැඩ මෙහෙය වීම
- පාර්ලිමේන්තු, පළාත්සභා මැතිවරණ රාජකාරි
- සංචාරක නිවාස, නිල නිවාස සේවා සැපයීම
- තොරතුරු හා දත්ත කළමනාකරණය
- අධිකාරියේ හා අමාත්‍යාංශ ප්‍රධානින්ගේ නියෝග ක්‍රියාවට නැගීම

3.23.3 2015 වර්ෂය තුල බඳවාගත් සේවකයන් පිළිබඳ විස්තර

2015.01.01 සිට 2015.12.31 දක්වා බඳවා ගැනීම්

තනතුර	සේවක සංඛ්‍යාව
කළමනාකරණ සහකාර	65
කාර්මික නිලධාරි	01
යාන්ත්‍රික අධිකාරි	01
කාර්යාල කම්කරු	04
සැහැල්ලු වාහන රියැදුරු	02
අයකැමි	108
මුර සංචාරක	02
සහායක	03
පර්යේෂණ සහකාර	06
ඉංජිනේරු	01
වැඩ පරිපාලක	02
පිළිගැනීමේ නිලධාරි	01
සැහැල්ලු උපකරණ ක්‍රියාකරු	17
උපදේශක	06
ජලනල කාර්මික	01
වායු සම්කරණ කාර්මික	01
ක්ෂේත්‍ර ආවේක්ෂණ නිලධාරි	01
කාර්යාල සේවක	20
ද්‍රව්‍ය ඉංජිනේරු	01
එකතුව	**243**

රූ සටහන් 23: 2010 – 2015 කාල පරිච්ඡේදය තුල බඳවාගත් සේවක සංඛ්‍යාව



3.23.4 පරිපාලන අංශයේ වාර්ෂික වැඩ සටහන

පරිපාලන අංශයේ මානව සම්පත් පිළිබඳ වාර්ෂික වැඩ සටහන බඳවා ගැනීමේ පරිපාටිය හා අනුමත සේවක සංඛ්‍යා දර්ශකයේ අවශ්‍යතා පදනම් කරගෙන පහත සඳහන් ක්ෂේත්‍ර පිළිබඳව තීරණය කෙරේ.

- බඳවා ගැනීම්
- උසස්වීම්

මා.සං.අ. යේ කාර්ය මණ්ඩලය සඳහා පුහුණු වැඩ සටහන් පිළියෙල කිරීම අධ්‍යක්ෂ (පුහුණු) හා සම්බන්ධීකරණය වෙමින් සිදු කෙරේ. අංශය විසින්, තෙවැනි භාෂාවන් ප්‍රවේශය සඳහා පියවර ගෙන තිබේ.

3.23.5 2015 වර්ෂය තුල කටයුතු වල ප්‍රගතිය

- අභ්‍යන්තර උසස්වීම් මගින් සේවකයන් 12 ක් බඳවා ගන්නා ලදි.
- නිලධාරීන් / සේවකයන් 434 ක් සඳහා අභ්‍යන්තර ස්වයංක්‍රීය උසස්වීම් පිරි නමනු ලැබීය.
- බඳවා ගැනීමේ පරිපාටියේ අවසන් කොටුම්පත 98% කින් නිම කෙරිණි.
- 2015 වර්ෂය තුල නිලධාරීන් 69 ක් සඳහා ශිෂ්‍යත්ව ප්‍රදානය කිරීමට, ගරු අග්‍රාමාත්‍යතුමාගේ හා විදේශ සම්පත් දෙපාර්තමේන්තුවේ අනුමැතිය ලබා ගන්නා ලදි.

- 2012 වර්ෂයේ වාර්ෂික වාර්තාව සිංහල හා දෙමළ භාෂාවලට පරිවර්තනය කර මහාමාර්ග අමාත්‍යාංශය වෙත යවන ලදි.
- වැඩබලන අධ්‍යක්ෂ (පාලන) ගේ ප්‍රධානත්වයෙන් කාර්ය මණ්ඩලය රැස්වීම් 4 ක් පවත්වනු ලැබීය.
- සියලුම තනතුරු සඳහා ඉලෙක්ට්‍රොනික මා.ස.ක. පද්ධතිය හා දත්ත යෙදවුම් සැකසීම පරීක්ෂා කෙරිණි.
- විදේශ රැකියා සඳහා නිලධාරීන් / සේවකයන් 5 දෙනෙකුට වැටුප් රහිත නිවාඩු ලබා දෙනු ලැබීය.
- සේවකයන් 117 ක් සඳහා රු..17,013,732.62 ක ස්වයං රක්ෂණ ප්‍රතිලාභ ගෙවන ලදි.
- සේවකයන් 114 දෙනෙකුට තම සේ.අ.අ. / සේ.හා.අ. ප්‍රතිලාභ ලබා ගැනීමට සහාය දෙනු ලැබිය.
- නිලධාරීන් / සේවකයන් 91 දෙනෙකුගේ විශ්‍රාම ගැන්වීම පිළිබඳව කටයුතු කරනු ලැබීය.
- එක් සේවකයෙකුට සේවය හැරයෑමේ නිවේදනය නිකුත් කරන ලදි.
- නිලධාරීන් / සේකයන් 7 දෙනෙකු සේවයෙන් ඉල්ලා අස්විය.
- චක්‍රලේඛ 4 ක් හා චක්‍රලේඛ ලිපි 95 ක් නිකුත් කෙරිණි.
- මහාමාර්ග, උසස් අධ්‍යාපන හා ආයෝජන ප්‍රවර්ධන අමාත්‍යාංශය වෙත බදු රහිත වාහන සඳහා අයදුම්පත් 11 ක් ඉදිරිපත් කරන ලදි.
- විනය පරීක්ෂණ 17 ක් නිමකල අතර 28 ක් ආරම්භ කරනු ලැබීය.
- රු. 70,409,872.00 ක පාරිතෝෂික මුදලක් සේවකයන් 114 දෙනෙකුට ගෙවනු ලැබීය.
- භාෂා දීමනාව සේවකයන් 10 කට ගෙවන ලද අතර, අතිරේක වැටුප් වර්ධක දීමනාව සේවකයන් 24 දෙනෙකුට ගෙවන ලදි. .
- සේවකයන් 504 දෙනෙකුට රු. 85,179,702/- මාස 10 ණය මුදල් ගෙවනු ලැබීය.
- සේවකයන් 64 දෙනෙකුට රු. 9,600,000/- මුදලක මෝටර් බයිසිකල් ණය මුදල් ගෙවනු ලැබීය.
- සේවකයන් 8 දෙනෙකුට රු. 80,000/- පාපැදි ණය ගෙවන ලදි.
- සේවකයන් 148 දෙනෙකුට දේපල ණය වශයෙන් රු.10,824,205/- සඳහා බැංකු ණය පහසුකම් සපයන ලදි.

- සේවකයන් 1310 ක් සඳහා රු. 5,240,000/- පොත් අත්තිකාරම් ණය අයදුම්පත් පරීක්ෂා කර අනුමත කරනු ලැබිණි.
- වෛද්‍ය නිවාඩු දීමනා හා දිරි දීමනා ගෙවීමට මා.සං.අ. සියලු සේවකයන්ගේ නිවාඩු විස්තර පරීක්ෂා කරන ලදි.
- වාහන මිලදී ගැනීම සඳහා සේවකයන් 308 දෙනෙකුට රු. 19,406,104/- වටිනා බැංකු ණය මුදල් සපයන ලදි.
- සේවකයන් 12 දෙනෙකුට වැඩ බැලීමේ දීමනාව ගෙවන ලදි.
- කළමනාකරණ සේවා චක්‍රලේඛ අංක 43 (i) අනුව සියලුම සේවකයන්ගේ වැටුප් පරිවර්තනය කරනු ලැබීය.
- කොන්ත්‍රාත් හා අනියම් සේවකයින් ස්ථිර සේවක සංඛ්‍යාවට අන්තර්ග්‍රහනය කරන ලදි.

3.24 මූල්‍ය කළමනාකරණය

ප්‍රධාන කාර්යාලයේ මුදල් අංශය විසින්, මූල්‍ය කළමනාකරණ කටයුතු ක්‍රියාත්මක කරනු ලැබේ. එය අතිරේක අධ්‍යක්ෂ ජනරාල් (මුදල් හා පරිපාලන) ගේ විෂය පථයට යටතට ගැනෙන එක් අංශයකි. මුදල් අංශය අධ්‍යක්ෂ මුදල් යටතේ පාලනය වන අතර ඔහුට නියෝජ්‍ය අධ්‍යක්ෂවරු දෙදෙනෙකුගේ, ගණකාධිකාරීන් කණ්ඩායමකගේ හා සහාය කාර්ය මණ්ඩලයේ සහාය ලැබේ. මීට අමතරව, ප්‍රාදේශීය ගණකාධිකාරීන් 10 දෙනෙකු හා සහාය කාර්ය මණ්ඩලය ප්‍රදේශ 10 ක සිටිති. ඔවුන් පරිපාලනමය වශයෙන් පළාත්භාර අධ්‍යක්ෂවරුන් යටතේ වෙයි.

මාර්ග සංවර්ධන අධිකාරියේ සමස්ත මූල්‍ය කළමනාකරණය මුදල් අංශය වෙත පවරා ඇත. එය මාර්ග ඉදිකිරීම හා නඩත්තුව සඳහා අමාත්‍යාංශයෙන් ලැබෙන අරමුදල් සහ විවිධ රජයේ පුද්ගලයන් හා හානි වූ මාර්ග ප්‍රතිසංස්කරණය කිරීම සඳහා ලැබෙන අරමුදල් කළමනාකරණය කරනු ලැබේ.

ග්‍රාමීය පාලම් ඉදිකිරීමේ ඒකකය, ඇස්පල්ට් පෙරමුසු යන්ත්‍රාගාර, නඩත්තු ඒකකවලට, අධිවේගී මාර්ග මෙහෙයුම් හා නඩත්තු අංශයට හා පර්යේෂණ හා සංවර්ධන අංශයට අනුයුක්ත ගණකාධිකාරීන් පරිපාලනමය වශයෙන් අදාල අංශයේ / ඒකකයේ අධ්‍යක්ෂවරයාට යටත්ය. ඊට අමතරව සියලුම ප්‍රධාන ඉංජිනේරුවරුන්, ඔවුන්ගේ සිවිල් වැඩ සහ පොදු කාර්ය වියදම් සඳහා මුදල් අංශයෙන් ලැබුණු අරමුදල් භාවිතා කරමින් සුළු ගෙවීම් කටයුතු සඳහා රාජකාරී බැංකු ගිණුම් පවත්වාගෙන යනු ලබයි. නිර්දේශ කරන ලද මුදල් සීමාවලට යටත්ව, ද්‍රව්‍ය හා සේවා මිලදී ගැනීමට ඔවුන්ට බලය පවරා ඇති හෙයින්, මෙය ප්‍රධාන ඉංජිනේරුවරුන් විසින් මෙහෙයවන නඩත්තු

වැඩ හා සංවර්ධන වැඩවල යහපත් කාර්ය සාධනයක් පෙන්වා ඇත.

3.24.1 මා.සං.අ. යේ මූල්‍ය කාර්ය සාධනය.

සමාලෝචනයට භාජනය වූ වර්ෂය තුල මා.සං.අ. යේ සමස්ත මූල්‍ය කාර්ය සාධනය හා මෙහෙයුම් පිරිවැය (පොදු කාර්ය වියදම්) විස්තර මීළඟ වගුවේ දැක්වේ.

වගු අංක 57: 2015 වර්ෂය තුල මා.සං.අ. යේ සමස්ත මූල්‍ය කාර්ය සාධනය

වර්ගය	ප්‍රතිපාදන (රු.මිලි.)	ලැබුණු අරමුදල් හා වියදම (රු.මිලි.)	සාධන ප්‍රතිශතය (%)
මාර්ග වැඩ	38,871.85	35,035.36	90.13
මා.සං.අ. යේ සාමාන්‍ය නඩත්තුව	6,000.00	6,000.00	100.0
එකතුව	44,871.85	41,035.36	91.45

වගු අංක 58: 2011 – 2015 කාලසීමාව තුල මූල්‍ය තත්ත්වයේ සාරාංශය

	2011 (රු.මිලි.)	2012 (රු.මිලි.)	2013 (රු.මිලි.)	2014 (රු.මිලි.)	2015 (රු.මිලි.)
වත්කම් හා වගකීම්					
ජංගම වත්කම්	12,550.81	15,364.93	16,504.76	25,615.10	25,440.81
ජංගම නොවන වත්කම්	1,810.33	81,465.98	162,165.72	280,350.56	293,244.95
සමස්ත වත්කම්	14, 361.14	96,830.91	178,670.48	305,965..66	318,685.76
ජංගම නොවන වගකීම්	437.51	8,940.25	37,689.4	112,434.04	130,979.84
ජංගම වගකීම්	17,032.95	18,535.20	16,428.5	22,897.90	26.296.37
සමස්ත වගකීම්	17,470.46	27,475.45	54,117.9	135,331.94	157,276.21
ශුද්ධ වගකීම්	(3,109.32)	69,335.46	124,552.57	170,633.72	161,409.55
ස්කන්ධ	2011 (රු.මිලි.)	2012 (රු.මිලි.)	2013 (රු.මිලි.)	2014 (රු.මිලි.)	2015 (රු.මිලි.)
ප්‍රාග්ධනය හා සංචිත	2,330.4	77,561.13	132,564.68	184,209.80	174,149.23
සමුච්චිත (හිඟය)	(5,439.78)	(8,205.67)	(8,012.31)	(13,576.08)	(12,739.68)
සමස්ත ස්කන්ධ	(3,109.32)	69,335.46	124,552.57	170,633.72	161,409.55

3.24.2 මා.සං.අ. යේ ආදායම.

මුදල් අංශයේ ආදායම් ඒකකයට ප්‍රචාරණ පුවරු මාර්ග තොරණ් ආදායම, යන්ත්‍ර හා උපකරණ කුලී ආදියෙන් වෙනත් ආදායම් වශයෙන් රු.මී. 901.77 ක සමස්ත ආදායමක් උපයා ගැනීමට හැකි විය. ආදායම වෙන් කිරීම මුදල් අංශයේ ආදායම් ඒකකය මගින් සිදුවන අතර, ඒකකය විසින් අරමුදල් කළමනාකරණය සිදු කරනු ලබයි. ඒකකය විසින් වර්ෂය තුල අරමුදල් කළමනාකරණය මගින් පොලිය ලෙස රු.මිලියන 214.5 උපයා ගනු ලැබීය.

3.24.3 මා.සං.අ. යේ සේවකයන්ගේ වැටුප්

මුදල් අංශයේ වැටුප් ඒකකය විසින්, සේවකයන් 6,262 ක් පමණ සඳහා වැටුප් පිළියෙල කරන අතර සේ.අ.අ. හා සේ.හා.අරමුදල් වාර්තා පවත්වාගෙන යනු ලබයි. තවද ඒකකය විසින් කාර්ය මණ්ඩල ණය ගෙවීම් හා අයකර ගැනීමේ ක්‍රියාවලියේද යෙදේ.

3.24.4 මා.සං.අ. යේ වත්කම් හා තොග

මුදල් අංශයේ වත්කම් හා ගබඩා ඒකකය විසින්, කාර්යාල උපකරණ හා ලිපිද්‍රව්‍ය ප්‍රධාන කාර්යාලයටද ඇතැම් විට ප්‍රාදේශීය කාර්යාලවලටද නිකුත් කරනු ලබයි. ඒකකය විසින්, වත්කම් හා වත්කම් පාලන පියවර අනුගමනය කරන අතර, කාර්යාල ලීබඩු, යන්ත්‍ර සූත්‍ර, ඉඩම් හා ගොඩනැගිලි ඇතුළුව මා.සං.අ. වත්කම් සඳහා වත්කම් ලේඛනයද නඩත්තු කෙරේ. ස්ථාවර වත්කම්වල තොග සමීක්ෂණය වාර්ෂිකව සිදු කරනු ලැබේ. 2015 වර්ෂය තොග සමීක්ෂණය 2015 ඔක්තෝම්බර් මස ආරම්භ කර නියමිත පරිදි නිම කරන ලදි. තොග / ලේඛනගත භාණ්ඩ භෞතික සමීක්ෂණය අවසානයේ ආරම්භ කර නිම කරනු ලැබීය. තවද, නිමකළ ව්‍යාපෘතිවල වත්කම් භාරගෙන බෙදා හැරීම හා ගර්භිත වත්කම් හා භාණ්ඩ ඉවත් කිරීමද මෙම ඒකකය විසින් සිදු කරන ලදි.

3.24.5 මා.සං.අ. මූල්‍ය ගිණුම් හා මූල්‍ය තොරතුරු

මුදල් අංශයේ අවසන් ගිණුම් ඒකකය මාසික ගිණුම්, වාර්ෂික මූල්‍ය ප්‍රකාශ හා වෙනත් මූල්‍ය තොරතුරු කළමනාකාරිත්වයට හා අධ්‍යක්ෂ මණ්ඩලය වෙත ඉදිරිපත් කිරීමේ වගකීම දරයි. තවද මෙම ඒකකය, ප්‍රාදේශීය ගිණුම් ඒකක හා මුදල් අංශයේ වෙනත් ගිණුම් ඒකක වලින් අදාල තොරතුරු ලබගෙන, පොදු ලෙජරය නඩත්තු කිරීමේ වගකීම දරයි.

ඊට අමතරව මෙම ඒකකයට විගණන විමසුම් හා විගණන වාර්තා වලට පිළිතුරු සැපයීම සඳහා කාර්ය අංශ වලින් ප්‍රධාන කාර්යාලයේ හා පළාත් කාර්යාල වලින් තොරතුරු රැස් කිරීමේ වගකීම පවරා ඇත.

3.24.6 මා.සං.අ. යේ ප්‍රාදේශීය ගිණුම් ඒකකය.

ප්‍රධාන කාර්යාලයේ ප්‍රාදේශීය ගිණුම් ඒකකය වැඩ හා පොදු කාර්ය පිරිවැය සඳහා මුදල් අග්‍රිමය මුදා හැරීම සඳහා පළාත්වල සියලුම ප්‍රාදේශීය ගණකාධිකාරිවරුන් සම්බන්ධීකරණය කරනු ලබයි.

3.24.7 මා.සං.අ. යේ ගෙවීම් ඒකකය.

මුදල් අංශයේ ගෙවීම් ඒකකය ප්‍රධාන කාර්යාලයේ අංශයන්ට සම්බන්ධ සියලු ගෙවීම් නිරවුල් කිරීමේ යෙදෙයි. (ඉදිකිරීම් අංශයේ ගණකාධිකාරි විසින් ගෙවීම් සිදු කරන ඉදිකිරීම් අංශයේ වැඩ බිල් හැර). එකී ගෙවීම් වලට සිවිල් වැඩ සඳහා ගෙවීම්, ඉන්ධන කාර්යාල උපකරණ නඩත්තුව, වාහන, ගොඩනැගිලි කුලී, කාර්යාල අවශ්‍යතා, කාර්ය මණ්ඩල වැටුප්, ණය ආදිය වේ.

3.24.8 මා.සං.අ. යේ අයවැය හා බදු ඒකකය

මා.සං.අ. යේ අයවැය හා බදු ඒකකය වෙත මා.සං.අ. යේ පොදු කාර්ය පිරිවැය, ඇස්තමේන්තුව, පිළියෙල කිරීමේ කාර්ය පවරා ඇත. මෙම ඒකකය මුදල් පණතට අනුව මා.සං.අ. යේ සමස්ත අයවැය පිළියෙල කිරීම හා අධ්‍යක්ෂ මණ්ඩලය වෙත ඉදිරිපත් කිරීම පිළිබඳ වගකීම දරයි.

ඊට අමතරව මෙම ඒකකය, මුදල් අංශයේ වෙනත් කාර්ය ඒකක වලින් හා ප්‍රාදේශීය කාර්යාල / අංශ වලින් තොරතුරු රැස් කිරීම මඟින්, බදු තත්ත්වයට අනුව වාරික බදු පිළියෙල කිරීම ගණනය කිරීම හා ආදායම් බදු දෙපාර්තමේන්තුව වෙත වාර්තා යැවීමේ වගකීම දරයි.

3.24.9 පරිපාලන ඒකකය

මුදල් අංශයේ පරිපාලන ඒකකය, මුදල් අංශයෙන් සේවකයන් 93 ගේ පරිපාලන කටයුතුවල යෙදීම මඟින් මුදල් අංශයට සහාය දෙයි. පුද්ගලික ලිපිගොනු, නිවාඩු වාර්තා නඩත්තුව, වාර්ෂික වැටුප් වර්ධක ප්‍රදානය, යන හා එන ලිපි ගැන කටයුතු කිරීම පරිපාලන ඒකකය විසින් ඉටු කරන කාර්යයන් කීපයකි.

3.25 අභ්‍යන්තර විගණන කාර්ය සාධනය

අභ්‍යන්තර විගණන අංශය විසින් විගණන කටයුතු ක්‍රියාත්මක කරනු ලබයි. මෙම අංශය මා.සං.අ. යේ සභාපතිවරයාගේ විෂය පථයට ගැනෙන අතර, අධ්‍යක්ෂවරයා අංශයේ ප්‍රධානත්වය දරයි. නියෝජ්‍ය අධ්‍යක්ෂ, අභ්‍යන්තර විගණන නිලධාරීන්, කාර්මික නිලධාරීන් හා සහාය කාර්ය මණ්ඩලයේ සහාය ඔහුට ලැබේ.

අභ්‍යන්තර විගණන අංශය විසින්, අධ්‍යක්ෂ මණ්ඩලය / අධිකාරිය අනුමත කළ වාර්ෂික අභ්‍යන්තර විගණන වැඩ සටහනට අනුව, අභ්‍යන්තර විගණන වැඩ ක්‍රියාත්මක කරනු ලැබේ. මෙම වැඩ සටහන සංවිධාන ව්‍යුහය ගිණුම් පද්ධතිය, අනුගමන විධීන්, පාලන හා අනුගමනය කරන ලද පරිපාටීන්, ගනුදෙනුවල පරිමාව, දිවයින පුරා මෙහෙයුම් හා මූල්‍ය කටයතු ආවරණය වීම සැලකිල්ලට ගෙන සැලසුම් කර ඇත.

3.25.1 අභ්‍යන්තර විගණන අංශය විසින් ක්‍රියාත්මක කරන වැඩ

- මා.සං.අ. යේ ප්‍රතිපත්ති අධිකාරිය තුල ඵලදායි ලෙස හා කාර්යක්ෂමව ක්‍රියාත්මක කරන අතර සාර්ථක ලෙස එහි අරමුණු ඉටු කිරීමට ඉහළ කළමනාකරණයට සහාය වීම.
- අභ්‍යන්තර විගණන අංශයේ වැඩ සැලසුම් කිරීම හා සම්බන්ධීකරණය කිරීම මෙන්ම, ආයතනයේ සමස්ත අරමුණු ඉතා කාර්යක්ෂමව හා සකසුරුවම් අයුරින් ළඟාකර ගන්නා බවට සහතික වීම.
- අභ්‍යන්තර පාලන මෙහෙයුම් පිළිබඳ ස්වාධීන ඇගයීම් සිදු කිරීම හා දෝෂයන් හා දුෂණ වැළැක්වීම සඳහා අභ්‍යන්තර පරීක්ෂාවන්වල නිවැරදිතාවය හා ප්‍රමාණාත්මකතාවය නිර්ණය කිරීම.
- ආයතනයේ පද්ධති පාලන හා පරිපාටීන් සමාලෝචනය හා පද්ධතිවල ඵලදායි මෙහෙයුම සහතික කිරීම.
- ආයතනයේ දුබලකම් හා අඩුපාඩු හඳුනා ගැනීම සහ පද්ධති පාලන හා පරිපාටි අනුකූලතාව / වැඩි දියුණු කිරීම් නිර්දේශ කිරීම.
- සංවර්ධන සැලසුම්වල සඳහන් විගණන වැඩ සටහන් ඇතුළු විගණන අවධානය අවශ්‍ය වන ක්ෂේත්‍රවල විගණන අරමුණු හා සම්බන්ධ විගණන තාක්ෂණ විධීන් වර්ධනය කිරීම හා මෙම අරමුණු හා තාක්ෂණ විධි පදනම් කරගත් විස්තරාත්මක විගණන වැඩ සටහන් පිළියෙල කිරීම.
- මා.සං.අ. විසින් නඩත්තු කෙරෙන වාර්තාවල නිරවද්‍යතාවය හා සම්පූර්ණ බව සහතික කිරීම හා මුදල් අංශය විසින්, සම්පාදනය කළ තොරතුරුවල නිරවද්‍යතාවය පරීක්ෂා කිරීම.
- කාර්ය මණ්ඩලයේ ගුණාත්මක කාර්ය සාධනය ඇගයීම හා ඔවුන් වෙත පවරණ ලද වගකීම් ක්‍රියාත්මක කරන්නේ දැයි සහතික කිරීම.
- ක්‍රියාත්මක කරන ලද සෑම විගණනයන් හා විමර්ශනයන් පිළිබඳවම සභාපතිවරයාට වාර්තාවක් ඉදිරිපත් කිරීම හා අභ්‍යන්තර විගණන අංශය මා.සං.අ. යේ අරමුණු සාධනයේදී ඵලදායි කළමනාකරණ උපකරණයක් වශයෙන් අභ්‍යන්තර විගණන අංශය භාවිතා කරන්නේ දැයි සහතික කිරීම.
- අභ්‍යන්තර හා බාහිර විගණන කාර්යයන් කාර්යක්ෂමව හා මා.සං.අ. යේ ප්‍රශස්ථ වුවමනාව වෙනුවෙන් කාර්යක්ෂම ලෙස ක්‍රියාත්මක වීම සහතික කිරීම සඳහා රජයේ විගණනයන් සමඟ සම්බන්ධීකරණය වීම.

- මා.සං.අ. යේ වත්කම් සියලුම වර්ගයේ පාඩු වලින් කොතරම් දුරට ආරක්ෂිත දැයි නිර්ණය කිරීම.
- රජය විසින් කලින් කලට නිකු කරනු ලබන මා.සං.අ. යේ පරිපාලන හා මූල්‍ය නීති හා වෙනත් අතිරේක උපදේ පිළිපදින්නේ දැයි නිර්ණය කිරීම.
- මා.සං.අ. යේ පරිපාලන, මූල්‍යනීති හා රජය විසින් කලින් කලට නිකුත් කරන වෙනත් පරිපූරක උපදෙස් අනුගමනය කරන්නේ දැයි නිර්ණය කිරීම.
- අභ්‍යන්තර විගණන අංශයේ වෘත්තීයමය භාවය හා ස්වාධීනත්වය පවත්වා ගෙන යාම.
- මා.සං.අ. යේ විගණන හා කළමනාකරණ කමිටුවට සම්බන්ධ කටයුතු සම්බන්ධීකරණය.
- ව්‍යාපෘති / නඩත්තු වැඩ, කම්කරු උපයෝගිතාව, තොග පාලනය ආදිය හා වංචාව හා නාස්තිය වැළැක්වීම සහාය වීම හා දක්නට ලැබුණු නාස්තිය හා දූෂණය වාර්තා කිරීම.

වගු අංක 59: 2015 වැඩ සටහනට අනුව ක්‍රියාත්මක කළ විගණන විමර්ශන

	වැඩ සටහන්වල විගණනන වාර්තා ගණන	*නිමකළ විගණන වාර්තා ගණන*	*ප්‍රතිශතය (%)*
පළාත්භාර අධ්‍යක්ෂ කාර්යාල	10	10	100%
ප්‍රධාන ඉංජිනේරු කාර්යාල	20	20	100%
විධායක ඉංජිනේරු කාර්යාල	29	29	100%
ක්ෂේත්‍ර විගණන - දිස්ත්‍රික්ක	09	09	100%
ප්‍රධාන ඉංජිනේරු ව්‍යාපෘති කාර්යාල	04	04	100%
ඇස්පල්ට් යන්ත්‍රාගාර	06	06	100%
දේ.බැ.අ. ව්‍යාපෘති	12	12	100%
අධිවේගී මාර්ග මෙහෙයුම් නඩත්තු හා කළමනාකරණ අංශය	12	12	100%
මා.සං.අ. යේ අංශ	08	08	100%
මූදල් අංශය	12	12	100%
විමර්ශන	-	14	-
එකතුව	*122*	*136*	

4 වැනි පරිච්ඡේදය
2015 වර්ෂය තුල ප්‍රගතියට බලපෑම්

රටේ ප්‍රමුඛ මහාමාර්ග අධිකාරිය හා ජාතික මහාමාර්ග ජාලය නඩත්තුව සංවර්ධන සහ පවත්නා මාර්ග ජාලය වර්ධනය කිරීමට නව මහාමාර්ග, පාලම් හා අධිවේගී මාර්ග සැලසුම් කිරීම හා ඉදිකිරීම පිළිබඳව වගකීම දරණ ආයතනය වශයෙන් මා.සං.අ. 2015 වර්ෂය තුල කාර්යයන් සාර්ථකව ඉටු කරන ලදි. මා.සං.අ. සිය පරමාර්ථ හා අරමුණු සම්පූර්ණ කරන අතර, අපේක්ෂිත ප්‍රගතියට එරෙහිව බලපෑම් කිහිපයක් පැවතුණි. 2014 වර්ෂය තුල පවා, ප්‍රමාදය ඉවත හැරීම් වැනි මා.සං.අ. යේ වාර්ෂික වැඩ සටහනේ ප්‍රගතියට පටහැනි බලපෑම් සිදු කෙරිණි.

මෙම බලපෑම් ස්වාභාවික තත්ත්වයන්, කාලගුණික තත්ත්වයන්, සාමාජීය තත්ත්වයන් හා මූල්‍ය තත්ත්වයන් වැනි වැළැක්වීම, කල් තබා වැළැක්වීම හෝ ප්‍රතිකර්ම පියවර මගින් සාර්ථකව පාලනය කළ හැකි හෝ නොහැකි හේතු කීපයක් නිසා නිර්මාණය විය.

4.1 මාර්ග හා පාලම් වැඩ ක්‍රියාත්මක කිරීම

4.1.1 මාර්ග හා පාලම් වැඩ ක්‍රියාත්මක කිරීමේදි පෙනී ගිය බලපෑම්.

මාර්ග හා පාලම් වැඩ ක්‍රියාත්මක කිරීමේදි පහත සඳහන් බලපෑම් වලට මුහුණ දීමට සිදුවිය;

- ප්‍රධාන බලපෑම වුයේ භාණ්ඩාගාරය විසින් මුදල් අග්‍රිමය නිදහස් කිරීමේ ප්‍රමාදයයි.එහි ප්‍රතිඵලයක් ලෙස කොන්ත්‍රාත්කරුගේ මාසික වැඩ බිල්පත්, නියමිත වේලාවට නිරවුල් කිරීමට මා.සං.අ. ට නොහැකි විය. මෙය ව්‍යාපෘතියේ වැඩ ප්‍රගතියට බලපෑ අතර, කොන්ත්‍රාත් මුදලේ වැඩි වීමට හේතු විය.
- ඉඩම් අත්පත්කර ගැනීමේදි අතිරේක කාලයක් ගතවීම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේදි අනවශ්‍ය ප්‍රමාදයට හේතු විය.
- ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේදි ප්‍රයෝජ්‍ය සේවාවන් ප්‍රතිස්ථානගත කිරීමේ ප්‍රමාදයන් ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේදි ප්‍රමාදයට හේතු විය.
- ප්‍රදේශයේ වෙනත් සංවර්ධන කටයුතුවල අවශ්‍යතාවයන්ට ඉඩදීමට පියවර ගැනීම නිසා වැඩ විෂය පථයේ සිදු කරන ලද වෙනස්කම්ද බලපෑමක් විය.
- වැඩබිම්වල අනපේක්ෂිත භූමි තත්ත්වයන් වැඩවල ප්‍රගතියට බලපෑවේය.
- අහිතකර කාලගුණික තත්ත්වයන්ද ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමට බලපානු ලැබීය.

4.1.2 අනුගමනය කරන ලද හා යෝජනා කරන ලද ප්‍රතිකර්ම පියවරයන්

කොන්ත්‍රාත් කොන්දේසිවල දක්වා ඇති විධි විධාන පදනම් කරගෙන, ව්‍යාපෘති නිම කිරීම සඳහා කොන්ත්‍රාත්කරුවන්ට කාලය ලබා දෙනු ලැබිය. කෙසේ නමුත්, කොන්ත්‍රාත්කරුට කාලය දිගු වීමේ පිරිවැය නොගෙවන ලදි.

4.2 ඉඩම් අත්පත් කර ගැනීම හා ප්‍රතිස්ථාපනය

4.2.1 2015 දී දක්නට ලැබුණු බලපෑම්.

මා.සං.අ. යේ සංයුක්ත සැලැස්මට අනුව රටේ ක්‍රියාත්මක කෙරෙමින් පවතින සංවර්ධනයේදි ඉඩම් අංශය තීරණාත්මක ක්‍රියා කලාපයක් ඉටුකරන නමුදු ක්‍රියාවලියේ සිරවීම් ඇති කරවන ඇතැම් අසාර්ථකවීම් ද නිරීක්ෂණය වේ. මෙම සාධකයන් ප්‍රධාන වශයෙන් ක්‍රියාවලියේ ඌනතා කාර්ය සාධනයක් නිර්මානය කරන අතර, පහත සඳහන් පරිදි සාකච්ඡා කළ හැකිය.

- මාර්ග අංශයේ වර්තමාන අවශ්‍යතාවලට අනුව පණත යාවත් කාලීන කිරීමේ නොහැකියාව.
- ක්‍රියාවලියට අයත් කටයුතු සමඟ සෘජුව ක්‍රියාකාරී වන ඉඩම් හා ඉඩම් සංවර්ධන අමාත්‍යාංශය, තක්සේරු දෙපාර්තමේන්තුව හා ප්‍රාදේශීය ලේකම් කාර්යාල වැනි කොටස්කරුවන්ගේ ප්‍රමුඛත්වයක් නොමැතිකම.
- අංශය තුල දත්ත පද්ධතියක් නඩත්තු කිරීම, මෙහෙයවීම හා ගවේෂණය සඳහා මැනවින් සැලසුම් කළ, පරිගණක පද්ධතියක් නොමැතිකම.
- වෙනත් දෙපාර්තමේන්තු හා ප්‍රාදේශීය ලේකම් කාර්යාල තුල ක්‍රියාවලියට දායක වීම සඳහා පළපුරුදු හා පුහුණු කාර්ය මණ්ඩලයක් නොමැතිකම.
- වන්දි ගෙවීම සඳහා අරමුදල් නොමැතිකම හා ඉඩම් අයිතියේ සංකීර්ණත්වය නිසා අයිතිය තීරණය කිරීමේදි නීතිමය ව්‍යංගත්වය හා උසාවි ක්‍රියාවලිය සමඟ කටයුතු කිරීමට සිදුවීම.

4.2.2 ගනු ලැබූ ප්‍රතිකර්ම පියවර.

තත්ත්වයන් අවම කිරීම සඳහා ඉඩම් අංශය විසින් පහත සඳහන් පියවර ගනු ලැබේ.

- වෙනත් දෙපාර්තමේන්තු හා ප්‍රාදේශීය ලේකම් කාර්යාල නිලධාරින් සමඟ මනා සම්බන්ධතාවයක් පවත්වා ගෙන යාම හා හැකි සෑම අවස්ථාවකම ඔවුන් වෙත සුදුසු දිරි දීමනා ක්‍රමයක් හා වෙනත් අවශ්‍ය සම්පත් සැපයීම.
- අදාල කොටස්කරුවන් සමඟ ප්‍රගති ආවේක්ෂණය හා පවත්වා ගෙන යාම (ප්‍රාදේශීය ලේකම්, තක්සේරු දෙපාර්තමේන්තුව, මිණුම් දෙපාර්තමේන්තුව වැනි)

- ඉඩම් අංශයේ කටයුතු මෙහෙයවීමේදී හා වාර්තා සොයා ගැනීමේදී පහසුවෙන් ප්‍රවේශවීම සඳහා පළාත් පාලන අධිකාරීන් සමඟ ශක්තිමත් හවුල්කාරකම මගින්, දත්ත ගබඩාවක් හා ඉඩම් අත්පත්කර ගැනීමේ තොරතුරු පද්ධතියක් පිළියෙල කිරීම.
- හිමිකම හඳුනා ගැනීමට හා අයිතිය මා.සං.අ. ට පැවරීමේ පියවර ගැනීමට වත්කම් අත්පොත (මා.සං.අ. භුක්ති විඳින ඉඩම්) යාවත්කාලීන කිරීම.
- අද දක්වා අත්පත්කර ගත් ඉඩම් සඳහා 44 වැනි වගන්තිය ප්‍රකාශයට පත් කිරීම.

4.2.3 ප්‍රතිකර්ම පියවර යෝජනා කිරීම

තවද, තත්ත්වය පිළිගත හැකි මට්ටමකට ගෙන ඒම සඳහා පහත සඳහන් පියවර යෝජනා කෙරේ.

- සියලුම මාර්ග ව්‍යාපෘතිවල ඉඩම් අත්පත්කර ගැනීම් කටයුතු මා.සං.අ. යේ අධීක්ෂණය හා ආවේක්ෂණය යටතේ සිදුකළ යුතුය.
- භූ.තොැ.ප. සමඟ ඒකාබද්ධ කිරීම වැළැක්වීමට අත්පත්කර ගත් සියලුම ඉඩම් සඳහා "මධ්‍යම දත්ත ගබඩාව හා ප්‍රබල ඉඩම් අත්පත්කර ගැනීමේ තොරතුරු පද්ධතියක්" ස්ථාපනය කිරීම.
- තොරතුරු තාක්ෂණ හැකියාවන් වැඩි දියුණු කිරීම.
- විශේෂයෙන්ම ඉඩම් නිලධාරීන් වැනි අවශ්‍ය සේවක සංඛ්‍යා සම්පූර්ණ කිරීම.
- වර්තමාන අවශ්‍යතාවන්ට අනුව ක්‍රියාවලිය කාර්යක්ෂම කිරීම.

4.3 මාර්ග තත්ත්ව දත්ත රැස්කිරීම හා ඇගයීම

4.3.1 බ.කා.ජා.ස.ර. හා ප.බ.ළ. සමීක්ෂණවලට සම්බන්ධ ගැටළු

බ.කා.ජා.ස.ර. හා ප.බ.ළ. සමීක්ෂණවලට සම්බන්ධ සමීක්ෂණ ප්‍රමාදයන්

4.3.1.1 බ.කා.ජා.ස.ර.

- ගෙවී යාම නිසා බ.කා.ජා.ස.ර. යේ ටයර් කට්ටලය ප්‍රතිසම්පාදනය කිරීමට සිදුවිය.
- වාරිකව නඩත්තු කිරීම සඳහා හඳුනා ගන්නා ලද කොටස් (ඔොකැබිසෝබරය, බ්‍රේක් පෑඩ්, බ්‍රේක් ඩිස්ක්, ශබ්ද විකාශන ආදිය) ඩිමෝ සමාගම විසින් ප්‍රති සම්පාදනය කිරීමට සිදු විය.
- බ.කා.ජා.ස.ර. යේ ආධාරක රථය නිතර ආපදාවට ලක් විය.

ප්‍රතිකර්ම පියවර.

- සමීක්ෂණ රථයට නව ටයර් කට්ටලයක් ප්‍රති සම්පාදනය.
- ධාරිතාව නඩත්තු කිරීම සඳහා හඳුනා ගන්නා ලද කොටස් (ෂොකැබ්සෝබරය, බ්‍රේක් පෑඩ්, බ්‍රේක් ඩිස්ක්, ශබ්ද විකාශන ආදිය) ඩිමෝ සමාගම විසින් ප්‍රති සම්පාදනය කරන ලදි.
- තාවකාලික අලුත්වැඩියාව සිදු කරන ලදි. කෙසේ නමුත් ආධාරක රථය ආපදාවට පත්වීම නිසා සමීක්ෂණය දින 46 ක් ප්‍රමාද විය.

4.3.1.2 ප.බ.උ.මී.

- ප.බ.උ.මී. හයිඩොලික් පද්ධතියේ, යන්ත්‍රයේ හා පරිගණකයේ සම්බන්ධතා දෝෂයකි.
- ප.බ.උ.මී. ඇදගෙන යන රථයේ දෝෂය හා තිරිංග සර්වෝ පද්ධතියේ දෝෂය

ප්‍රතිකර්ම පියවර

- අතිරේක ඩැම්පර් රථයක් සැපයුම්කරුගෙන් ඉල්ලා සිටින අතර ස්වීඩන සැපයුම්කරුගෙන් කොටස් ලබා ගැනීමට දින නවයක් ගතවිය.
- ප.බ.උ.මී.යේ ඇදගෙන යන රථයේ දෝෂය - තිරිංග සර්වෝ පද්ධතියේ දෝෂය - කීප වරක් අලුත්වැඩියා කරන ලද මුත්, ගැටළුව තවමත් පවතී.

<u>යෝජනා</u>

- දැනට සිටින කාර්ය මණ්ඩල කණ්ඩායම ස්ථාන මාරු / විශ්‍රාම ලබන අවස්ථාවක යෙදවීමට බ.කා.ජා.ස.ර. හා ප.බ.උ.මී. සඳහා අතිරේක සමීක්ෂණ කණ්ඩායමක් පුහුණු කිරීම.
- ප.බ.උ. යන්ත්‍රය ඇදගෙන යාම සඳහා සුදුසු වාහනයක් සැපයීම.
- බ.කා.ජා.ස.ර. සමීක්ෂණය සඳහා සුදුසු සහායක රථයක් සැපයීම.

4.3.1.3 දත්ත විශ්ලේෂණය හා කළමනාකරණයට සම්බන්ධ ගැටළු

- මා.සං.අ. යේ නව ගොඩනැගිල්ලේ ජාල ගැටළු නිසා සර්වර සේවා දායක වාතාවරණය තුල වැඩ කිරීමට නොහැකියාව.
- අන්තර් ජාල පහසුකම් නොමැතිකම නිසා අළුතින් ස්ථාපනය කරන ලද වෙඩ් අඩවිය පදනම් කරගත් ශ්‍රී ලං.මා. ව. ක. පද්ධතිය භාවිතා කිරීමේ දුෂ්කරතාව.
- කාර්ය මණ්ඩලය නොමැතිකම.
- නව ශ්‍රීලමාවක පද්ධතිය පිළිබඳ සේවා සපයන්නා සමඟ ගිවිසුමක් ඇතිකර ගැනීම.

ප්‍රතිකර්ම පියවරයන්

සැලසුම් අංශය කලින් කලට, මා.සං.අ. කළමනාකාරිත්වයෙන් අවශ්‍ය සම්පත් ඉල්ලා සිටින ලදි.

- ඒ අනුව, මා.සං.අ. ලෝක බැංකු අරමුදල් සහාය ඉල්ලා සිටි අතර, ලෝක බැංකුව වෙබ් අඩවිය මත පදනම් වූ සම්බන්ධ විස්තීර්ණ බහු භාවිත භූ.තොා.ප. දත්ත ගබඩාවට සම්බන්ධිත මාර්ග වත්කම් කළමනාකරණ පද්ධතියක් ඇති කිරීමට සහාය විය.
- මෙම උපදේශකත්වය යටතේ, සැලසුම් අංශයට දත්ත ගබඩා කිරීමට හා බෙදා හැරීමට පහත දැක්වෙන කොටස් ලැබුනි.

රාක්ක මත සවිකල හැකි NAS සර්වර්	1
4 TB NAS අනුව ධාවකය (අධිකව 1 තුල සංලක්ෂණය කර ඇත)	8
NAS පෙට්ටි	10
3TB සම්මත දෘඩ ධාවකය	10

- තවද, මා.අ.ස.ව්‍යා. හා සැලසුම් අංශයේ දත්ත සැකසුම් ඒකකය මගින්, පහත සඳහන් පරිගණක හා උපාංග ලැබුණි.

ද්විත්ව තිර පරිගණක අ.බ.ප. (UPS)	5
වර්ණ මුද්‍රණ පහසුකම් සහිත බහුකාර්ය පිටපත් යන්ත්‍ර	1
ඩෙස්ක්ටොප් පරිගණක	3
ලැප්ටොප් පරිගණක (ඒකක ප්‍රධානියාට)	1

- මා.සං.අ. කළමනාකාරිත්වය විසින්, දසුන් විශ්ලේෂණ වැඩ, ක්ෂේත්‍ර වැඩ සඳහා මෙම ඒකකයට නිලධාරීන් හතර දෙනෙකු (තාක්ෂණික සහකාර 1, රථවාහන සංගණන ශිල්පී 1 හා කළමනාකරණ සහකාරවරුන් දෙදෙනෙකු) යොදවන ලදි. එක් ජ්‍යෙෂ්ඨ රථවාහන සමීක්ෂකවරයෙකු නාලන්ද ව්.ඉං. කාර්යාලයට ස්ථාන මාරු කරන ලදි.

- සැලසුම් අංශය සේවා සපයන්නා වෙතින්, ශ්‍රී.ල.මා.ව.ක. පද්ධතිය නඩත්තු කිරීමට සහයෝගය සඳහා යෝජනාව මගින් ඉල්ලා සිටි අතර, එය අධ්‍යක්ෂ ජනරාල් විසින් පත්කළ තාක්ෂණික කමිටුව වෙත ඇගයීම සඳහා ඉදිරිපත් කරන ලදි.

4.3.1.4 ශ්‍රී.ලං.මා.ව.ක.ප. සාර්ථකව මෙහෙයවීම සඳහා යෝජනා.

- සාර්ථක වත්කම් කළමනාකරණයක් ක්‍රියාත්මක කිරීම සඳහා කැපවූ කාර්ය මණ්ඩලයක් සිටිය යුතුය. (සේවක සංඛ්‍යා අනුමැතිය සහිතව)
- ශ්‍රී.ලං.මා.ව.ක.ප. කාර්යක්ෂමව මෙහෙය වීම සඳහා මා.සං.අ. ප්‍රධාන කාර්යාලයේ ක්‍රියාත්මක පද්ධතියට අධිවේගී ජාල සම්බන්ධතාවයක් (ශ්‍රී ලංකා රජයේ ජාලය) අවශ්‍ය වේ.
- භාවිතකරු මට්ටමේ පද්ධතියට ප්‍රවේශය නිර්ණය කිරීම.
- රැස්කර ගත් මාර්ග ජාලයේ අවකාශ දත්තවල වලංගු භාවය පරීක්ෂා කර ශ්‍රී.ලං.මා.ව.ක. පද්ධතියේ ගබඩාකර තැබේ. (අදාල බලයලත්, භූ.තොර.ප. මෘදුකාංග මිලදී ගත යුතුය)
- .ලං.මා.ව.ක.ප. යේ සෑම ඒකකයක් සඳහාම දත්ත රැස්කිරීමේ මාර්ගෝපදේශක ප්‍රමුඛතාවයන් හා මූලයන් නිර්වචනය කිරීම.
- අදාල කාර්ය මණ්ඩලය දත්ත රැස්කිරීම, පද්ධති සක්‍රීය කිරීම හා සැකසීම, පිළිබඳව පුහුණු කිරීම.

4.4 කළමනාකරණ තොරතුරු පද්ධතිය නඩත්තු කිරීම

නඩත්තු කළමනාකරණ තොරතුරු පද්ධතිය තුල 2015 වර්ෂයේදී පහත බලපෑම් සිදුවිය.

- 2015 දී නව ප්‍රධාන කාර්යාලයට ස්ථානගත කිරීමේදී ජාල යටිතල ව්‍යුහය හා සර්වර කාමර කළමනාකරණය විධිමත් කිරීම දහා සැලකිය යුතු කාලයක් ගතවිය.
- සෑම අංශයකම තොර.තා. සම්බන්ධ එදිනෙදා ගැටළු සඳහා ග්‍රාහකයන්ගේ කැපවීමක් නොමැතිකම.
- පවත්නා ADSL විද්‍යුත් තැපැල් සර්වර සම්බන්ධතාවය දෘශ්‍ය රැහැන් සම්බන්ධතාවයක් ලෙස තත්ත්වය නැංවිය යුතුය. (මෙය විද්‍යුත් තැපැල් සර්වරයට www මඟින් පිවිසීමට පහසු වනු ඇත).

4.5 යාන්ත්‍රික සේවා

4.5.1 2015 වර්ෂයේ ප්‍රගතියට බලපෑම්.

- මාර්ග නඩත්තු වැඩ සඳහා නව උපකරණ මිලදී ගැනීමට ප්‍රමාණවත් ප්‍රතිපාදන නොමැති වීම.
- වාහන හා යන්ත්‍ර නඩත්තුව හා අළුත්වැඩියාවන් සඳහා ගෙවීම් වල ප්‍රමාදය
- වාහන හා යන්ත්‍ර 1500 කට වැඩි සංඛ්‍යාවක් අළුත්වැඩියාව හා නඩත්තු කටයුතු සඳහා ඉල්ලීම සපුරාලීමට පහත සඳහන් පහසුකම් ප්‍රමාණවත් නොවීම.
    - ඕවර්හෙඩ් ගැන්ට්‍රි දොඹකර, හයිඩ්‍රොලික් ඔසවනය, දෝෂ හඳුනා ගැනීමේ උපකරණ වැනි විශේෂිත උපකරණ.
    - කම්හල තුල ගබඩා පහසුකම්

- ප්‍රවාහන අංශයට අනුයුක්ත වාහනවල සුළු අලුත්වැඩියාවන් හා එදිනෙදා නඩත්තුව මෙහෙයවීම සඳහා යාන්ත්‍රික අධිකාරිවරයෙකු අවශ්‍ය වී ඇත.
- ප්‍රදේශවල ඇති පෙඩෙස්ට්‍රියන් තලනයන් වැනි සැහැල්ලු යන්ත්‍ර මෙහෙයවීම ක්‍රියාත්මක කිරීම සඳහා අනුයුක්ත කම්කරුවන්, නිතර වෙනස්වීම නිසා එය ඌණ භාවිතය හා අතිරේක අළුත්වැඩියාවන්ට හේතු විය.
- අඟුලාන වැඩපලේ, මළබැඳුණු යකඩ ඇද වැටීම නිසා කම්කරුවන් අනතුරුදායක තත්ත්වයක පසුවන අතර, අළුත්වැඩියා වැඩට බාධාවන හෙයින් එහි මහල අළුත්වැඩියා කිරීමට අවශ්‍යවී ඇත.

4.5.2 නුගමනය කරන ලද හා යෝජිත ප්‍රතිකර්ම පියවරයන්.

- මාර්ග නඩත්තු වැඩ හා අඟුලාන වැඩපලේ පහසුකම් නැංවීම සඳහා උපකරණ වෙනුවෙන්, උපකරණ ප්‍රසම්පාදනය සඳහා අයවැයට ප්‍රමාණවත් අරමුදල් ඉල්ලීම.
- මාර්ග නඩත්තු අරමුදලෙන් හා මාර්ග වැඩි දියුණු කිරීමේ අරමුදලෙන්, වාහන හා යන්ත්‍ර හා යන්ත්‍රාගාර අළුත්වැඩියාව හා නඩත්තුව සඳහා ගෙවීම් පිළිවෙත පහසු කිරීම
- අඟුලාන කම්හල ශක්තිමත් කිරීම සඳහා පහත සඳහන් කාර්ය මණ්ඩලය පත්කළ යුතුය.
    - ඉංගීසි යතුරු ලේඛක / පරිගණක ක්‍රියාකරු 01
    - යාන්ත්‍රික අධිකාරි 03
    - ගිණුම් සහකාර 01
    - කළමනාකරණ සහකාර 02
    - ගබඩා පාලක 01
    - යාන්ත්‍රික 05
    - වාහන විදුලි කාර්මික 01
    - සේවා කම්කරුවන් 02
    - යාන්ත්‍රික සහායක 05

- අනුරාධපුර කම්හලේ වැඩ ආරම්භ කිරීම සඳහා පහත සඳහන්, කාර්ය මණ්ඩලය පත්කළ යුතුය.
    - යාන්ත්‍රික ඉංජිනේරු 01
    - යාන්ත්‍රික අධිකාරි 02
    - යාන්ත්‍රික 06
    - විදුලි කාර්මික 02
    - සහායක 04

- ගබඩාකරු 01
- කළමනාකරණ සහකාර 02
- රියැදුරු 03
- යන්ත්‍රකරු / වැද්දුම්කරු 02

- අංශවල සැහැල්ලු උපකරණ ක්‍රියාකරවන කම්කරුවන් සඳහා ක්‍රියා කරවීම හා එදිනෙදා නඩත්තුව පිළිබඳ පූර්ණ පුහුණු වැඩ සටහනක් ක්‍රියාත්මක කිරීමට යෝජනා කරමු.

- ප්‍රවාහන අංශයේ සංචිත වාහනවල සුළු අළුත්වැඩියාවන් පිළිබඳ කටයුතු කිරීම සඳහා යාන්ත්‍රික අධිකාරිවරයෙකු පත් කිරීමට යෝජනා කෙරේ

- පළාත්වල වාහන හා යන්ත්‍ර අළුත්වැඩියාවන් හා වෙනත් කටයුතු සම්බන්ධව උනන්දුවක් දක්වන අවම වශයෙන් එක් කාර්මික සහකාරවරයෙකු යාන්ත්‍රික අංශය රත්මලාන කම්හල හා සම්බන්ධීකරණය කිරීමට සෑම පළාතකටම අනුයුක්ත කිරීම.

- ඇස්පල්ට් පෙරමුසු / කලුගල් ඇඹරුම් යන්ත්‍රාගාර සඳහා තවත් එක් යාන්ත්‍රිකයෙකු බැගින් සේවය කරන අතර, එකී යන්ත්‍රාගාරවල අමතර කාලයේදී කාර්යාලවලට බෙදා දී ඇති පිටුපසින් ගමන් කළ යුතු තලනයන්, තහඩු තලනයන්, රැටර් තලනයන්, තණකොළ කපන යන්ත්‍ර, චේන් කියත් ආදි සැහැල්ලු උපකරණ අළුත්වැඩියාව හා නඩත්තුව සඳහා යෙදීමටත් යෝජනා කෙරේ.

- මගනැගුම සමාගමෙන් උඩුකාව යාන්ත්‍රික වැඩපල ආපසු පවරා ගැනීම හා මා.සං.අ. විසින් අවශ්‍ය වන කාර්ය මණ්ඩලය යොදවා ක්‍රියාත්මක කිරීම.

- න.ක. අංශය හෝ ග්‍රා.පා.ඉ. ඒකකයට බාහිර පාර්ශවයක් මගින් අඟුලාන කම්හලේ වහලය අළුත්වැඩියා කිරීම.

4.6 පිරිස් කළමනාකරණය

4.6.1 ප්‍රගතියට බලපෑම්.

- වැටුප් හා සේවක සංඛ්‍යා කොමිසමේ අනුමැතිය ලබා ගැනීම දුෂ්කර වීම නිසා බඳවා ගැනීමේ පරිපාටිය සඳහා අනුමැතිය ලබා ගැනීම ප්‍රමාද විය.
- කෙටුම්පත් බඳවා ගැනීමේ පරිපාටිය සඳහා ව්‍යාත්තීය සමිතිවල විරෝධතා හේතුවෙන්, කෙටුම්පත් බඳවා ගැනීමේ පරිපාටිය තව දුරටත් ප්‍රමාද විය.
- මා.සං.අ. විසින් පාලනය කළ නොහැකි හේතු හා වාර්ෂික ස්ථාන මාරු ක්‍රියාත්මක කිරීමේ දුෂ්කරතාව.
- නම් යෝජනා කිරීම ප්‍රමාද වීම හේතුවෙන් විදේශ ශිෂ්‍යත්ව අයදුම්පත්, උසස් අධ්‍යාපන හා මහාමාර්ග අමාත්‍යාංශයට හා විදේශ සම්පත් දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කිරීමේ දුෂ්කරතාවය.
- භාරගන්නා අවසන් දිනයට පසුව අයදුම්පත් ලැබීම නිසා ඒවා විදේශ සම්පත් දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කිරීමේ දුෂ්කරතාවය.
- ගරු අග්‍රාමාත්‍යතුමාගෙන් ලැබෙන අනුමැතිය ප්‍රමාද වී ලැබීම නිසා අනියම් දීමනාව හා උණුසුම් ඇඳුම් දීමනාව ගෙවීමේ දුෂ්කරතාවය
- අවශ්‍ය තොරතුරු නොමැති වීම නිසා අයදුම්පත් නිර්දේශ කිරීම හා ඉදිරිපත් කිරීම ප්‍රමාද වීම.
- ධූරය හෙබවූ අධ්‍යක්ෂ පාලන විශ්‍රාම ගිය අතර 2015 වර්ෂය තුල අධ්‍යක්ෂ පාලන තනතුර නොපිරවන ලදි. ඒ වෙනුවට වැඩ බලන අධ්‍යක්ෂවරයෙකු පත්කළ අතර ඔහුට අංශ දෙකම මෙහෙයවීමට සිදු විය.

5 වැනි පරිච්ඡේදය

2015 වසර තුල ක්‍රියාත්මක කළ විදේශ අරමුදල් ව්‍යාපෘති

මාර්ග සංවර්ධන අධිකාරියේ සංවිධාන ව්‍යුහයට, විදේශීය නියෝජිතායතන විසින් ආයතනයේ දැක්ම, මෙහෙවර, පරමාර්ථ හා අරමුණු ඉටුකර ගැනීමට අරමුදල් සපයන වෙනම ව්‍යාපෘති මෙහෙයවන ව්‍යාපෘති කළමනාකරණ ඒකක අයත් වේ. ව්‍යාපෘති කළමනාකරණ ඒකක ජාතික මහාමාර්ග ජාලයේ රථවාහන ප්‍රවාහ තත්ත්වය නැංවීම සඳහා පවරණ ලද මාර්ග / පාලම් ව්‍යාපෘති පිළිබඳව කාර්යයන් සිදු කරනු ලැබේ.

ව්‍යාපෘති කළමනාකරණ ඒකක විශේෂිත ව්‍යාපෘති නිශ්චිත කාලයක් සඳහා අධිවේගී මාර්ග, මහාමාර්ග හා පාලම් විදේශීය ණය අරමුදල් යටතේ ඉදිකිරීමේ යෙදීම සඳහා තාවකාලිකව නිර්මාණය කරනු ලැබේ. සෑම ව්‍යාපෘති ඒකකයක්ම අධ්‍යක්ෂවරයෙකු විසින් ප්‍රමුඛත්වය දරණ අතර, ඒවා උසස් අධ්‍යාපන හා මහාමාර්ග අමාත්‍යාංශය යටතේ ස්වාධීන ව්‍යා.ක.ඒ. වශයෙන් ක්‍රියාත්මක වේ. ව්‍යාපෘතිය සාර්ථකව ක්‍රියාත්මක කිරීම සඳහා නියෝජ්‍ය අධ්‍යක්ෂවරුන්, ව්‍යාපෘති ඉංජිනේරුවන් හා සහාය කාර්ය මණ්ඩලය විසින් ව්‍යාපෘති අධ්‍යක්ෂවරයාට වෘත්තීයමය සහාය සපයනු ලැබේ.

ව්‍යා.ක.ඒ. ප්‍රධාන කටයුතු වන්නේ;


- ව්‍යාපෘති ණය හා ප්‍රදාන පිළිබඳව අදාල ප්‍රදාන ආයතන සමඟ කටයුතු.
- උපදේශක හා සිවිල් වැඩ කොන්ත්‍රාත්වලට සම්බන්ධ ප්‍රසම්පාදන කටයුතු.
- ඉඩම් අත්පත්කර ගැනීම හා ප්‍රතිස්ථාපනය.
- වන්දි හා ප්‍රතිස්ථාපන දීමනා ගෙවීම.
- වෙනත් අදාල ආයතන සමඟ සම්බන්ධීකරණය.
- කොන්ත්‍රාත්කරු හා උපදේශක සමඟ සම්බන්ධීකරණය.
- මධ්‍යම පරිසර අධිකාරියේ අවශ්‍යතාවන්ට අනුකූලව පාරිසරික පාලන පියවර ආවේක්ෂණය කිරීම.
- පාරිසරික ආවේක්ෂණ සැලසුම් පිළියෙල කිරීම.
- ව්‍යාපෘතිය සඳහා ප්‍රතිස්ථාපන ක්‍රියාකාරී සැලැස්ම පිළියෙල කිරීම.
- ප්‍රදේශයේ බලපෑමට ලක්වූ පදිංචිකරුවන් සඳහා සම්ප්‍රජානන වැඩ සටහන් ක්‍රියාත්මක කිරීම
- ව්‍යාපෘතියේ නියුක්ත අදාල පාර්ශවයන්ට සිදු කරන ගෙවීම් කළමනාකරණය.

- එක් එක් ව්‍යාපෘතිවල ඉවතයෑම්, ගැටළු හඳුනා ගනිමින්, කලින් කලට ප්‍රගතිය සමාලෝචනය කිරීම හා ඉහළ අධිකාරින්ගේ අදහස් විමසා විසඳුම් සඳහා පහසුකම් සැලසීම.
- තාක්ෂණික කාර්ය සාධනය වාර්තාකරණ පිළිවෙත ක්‍රියාත්මක කිරීම.
- ව්‍යාපෘති මූල්‍ය සැලැස්ම පිළියෙල කිරීම හා කළමනාකරණය.
- අයවැය ඇස්තමේන්තු, ඉංජිනේරුමය ඇස්තමේන්තු, මාසික ප්‍රගති වාර්තා හා අමාත්‍ය මණ්ඩල සංදේශ පිළියෙල කිරීම.
- උපදේශක සේවා ව්‍යාපෘති කළමනාකරණය හා ආවේක්ෂණය.
- ව්‍යාපෘතිවල සිවිල් වැඩ කොන්ත්‍රාත් කළමනාකරණය, ආවේක්ෂණය හා ගෙවීම් සහතික කිරීම.
- උපදේශක සේවා කොන්ත්‍රාත් ඇගයීම, සංශෝධනය හා දීර්ඝ කිරීම.
- සිවිල් වැඩ කොන්ත්‍රාත්වල පිරිවැය විචලනයන් හා අදාල කල් දිගු කිරීම් අනුමත කිරීම.
- ප්‍රධාන ආයතන, අයවැය දෙපාර්තමේන්තුව, විදේශ සම්පත් දෙපාර්තමේන්තුව හා ප්‍රයෝජ්‍ය සේවා සමඟ මාසික මෙහෙයුම් කමිටු රැස්වීම් සූදානම් කිරීම.
- ව්‍යා.ක.ඒ. මෙහෙයවන ව්‍යාපෘතිවල නීතිමය කරුණු හා මානව හිමිකම් නඩු වලට සහභාගි වීම.

5.1 දක්ෂිණ ප්‍රවාහන සංවර්ධන ව්‍යාපෘතිය

දක්ෂිණ ප්‍රවාහන සංවර්ධන ව්‍යාපෘතියට ආ.සං.බැ., ජ.ජ.ස.බැ., ජාසංඅ, එ.ජා.ස.නි. විසින් මූල්‍යයන කරන ලද ව්‍යාපෘති කොටස් ගණනාවකින් සමන්විතය. මෙම ව්‍යාපෘතියේ ප්‍රධාන අරමුණු කර්මාන්ත සංචරණය, ධීවර කර්මාන්තය හා කෘෂි කර්මාන්තය වර්ධනයට දිරි දීම මගින් දකුණු පළාතේ ආර්ථික සංවර්ධනයට සහාය වීමයි. මෙම ව්‍යාපෘතියේ ප්‍රධානතම නිෂ්පාදනය වන්නේ කොළඹට ආසන්න කොට්ටාවේ සිට දකුණු පළාතේ මාතර දක්වා දකුණු පළාතේ අගනුවර වන ගාල්ලට පිවිසුම සහිතව, පිවිසුම සීමා කරන ලද ලංකාවේ පළමුවැනි මහා මාර්ගය ඉදි කිරීමයි. ප්‍රධාන මහාමාර්ග / මාර්ග හරහා අධිවේගී මාර්ගය ගමන් කරන ස්ථානවල ස්ථාපිත කරන ලද අන්තර්මාර් එකොලහකින් පමණක් ඊට පිවිසිය හැක.

සිතියම් අංක 7: දක්ෂිණ අධිවේගී මාර්ගය



5.1.1 වර්තමාන තත්ත්වය

ව්‍යාපෘති කාර්යයන් ක්‍රියාත්මක කිරීමට 2003 ජනවාරි මස ආරම්භ විය. කොට්ටාව සිට පින්නදූව දක්වා කොටස හා (කි.මී. 95.3) හා ගාල්ල වරායට ප්‍රවේශ මාර්ගය (කි.මී.5.8) මෙහෙයුම් 2011 නොවැම්බර් 27 දින ආරම්භ විය.

මා.සං.අ. විසින් පින්නදූව සිට ගොඩගම දක්වා හා ගාලු වරාය ප්‍රවේශ මාර්ගයේ ඉතිරි වැඩ සඳහා කොන්ත්‍රාත්තුව 2010 ජූනි 11 දින චීන තාක්ෂණික ආනයන අපනයන සමාගමට කොන්ත්‍රාත් ප්‍රදාන දෙකක් යටතේ ප්‍රදානය කළ අතර, යෝජනාවලි 1 පින්නදූව සිට කෝදාගොඩ දක්වා කි.මී. 30+800 සිට 45+000 දක්වාද යෝජනාවලි 2 යටතේ කෝදාගොඩ සිට ගොඩගම දක්වා කි.මී. 45+000 සිට 61+050 සහ ගාල්ල වරාය පිවිසුම් මාර්ගය (කි.මී. 0.0 සිට 4.285) දක්වා චීන ආනයන හා අපනයන බැංකුව විසින් අරමුදල් සපයන ලදි. ආරම්භක ණය මුදල වූ කොන්ත්‍රාත් යෝජනාවලි 2 මුදලෙන් 85% 2014 දෙසැම්බර් 31 දින අවසන් වූ අතර, එය දැනට සම්පූර්ණ විය පැහැදම් සඳහා පහසුකම් සලසමින් 2015 දෙසැම්බර් 31 දක්වා දිගු කරන ලදි.

මෙම කොන්ත්‍රාත් යෝජනාවලි 2ට පින්නදූව සිට ගොඩගම දක්වා අර්ධ වශයෙන් නිම කරන ලද මංතීරු 2 අධිවේගී මාර්ගය හා මංතීරු 4 ගාල්ල වරාය ප්‍රවේශ මාර්ගය හා ආසන්න කි.මී. 28.8 ප්‍රාදේශීය මාර්ග වලට අයත් සිවිල් වැඩ හා සම්බන්ධිත අනෙකුත් වැඩ සියල්ල අයත් වේ.

කොන්ත්‍රාත්කරු විසින් 2014 මාර්තු 14 දින වැඩ නිමකළ අතර පින්නදූව සිට ගොඩගම දක්වා අධිවේගී මාර්ග කොටසේ මෙහෙයුම් 2014 මාර්තු 15 වැනි දින ආරම්භ විය.

කෝදාගොඩ සිට ගොඩගම දක්වා කොටස





මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමෙන් පසුව පහත සඳහන් අරමුණු ඉටුකර ගැනීමට අපේක්ෂා කෙරේ.

- දක්ෂිණ ප්‍රදේශයේ අනාගත සංවර්ධනය සඳහා වැඩි දියුණු කරන ලද ප්‍රවාහන පහසුකම්.
- ව්‍යාපෘති බලපෑම් ප්‍රදේශවල වර්ධනය වූ ආර්ථික කටයුතු
- ආර්ථික සංවර්ධනයේ ප්‍රතිඵල ලෙස දුගී බව අඩුවීම.
- බටහිර වෙරළේ ඇතිවිය හැකි සුනාමි බලපෑම් වලින් ආරක්ෂා වීම.
- A2 මාර්ගයේ බරපතල හා බරපතල නොවන හදිසි අනතුරු අවම කිරීම (බොහෝ චින්දිතයන් වන්නේ පදිකයින් හා පා/යතුරු පැදි කරුවන්ය).
- ගාල්ල වරාය සංවර්ධනය.

ඉදිකිරීම් කොන්ත්‍රාත්තු නිමවීමෙන් පසුව දක්ෂිණ අධිවේගී මාර්ගයට සෘජු හෝ වක්‍රව සබඳතා ඇති වෙනම ජාතික මහාමාර්ග පුනරුත්ථාපනය කිරීමට හා වෙනත් වැඩ වී.ජා.තා.ආ.අ. සමාගමේ කොන්ත්‍රාත්වල ඇස්තමේන්තු කළ ඉතුරුම් යොදා ගැනීමට මා.සං.අ. විසින් තීරණය කරන ලදි. අමාත්‍ය මණ්ඩලය පත්කළ ස්ථාවර ප්‍රසම්පාදන කමිටුව හා අමාත්‍යාංශ ප්‍රසම්පාදන කමිටුවේ අනුමැතිය ලබා ගැනීමෙන් පසුව, පහත සඳහන් වැඩ කොන්ත්‍රාත්කරුට ප්‍රදානය කරන ලදි.

- ජාතික මහාමාර්ග හයක් පුනරුත්ථාපනය කිරීම

මාර්ගයේ නම	මාර්ගයේ දින (කි.මී.)
වැලිගම - කණංකේ මාර්ගය (B465)	9.6
වැලිගම - තෙලිජ්ජවිල මාර්ගය (B466)	7.7
දොරපේ - හියාරේ මාර්ගය (B578)	8.7
ගොඩගම - තෙලිජ්ජවිල මාර්ගය (A24)	4.5
යක්කලමුල්ල - ඉමදුව මාර්ගය (B238)	6.2
ඉමදුව - අහංගම මාර්ගය	10

- AA024 මාර්ගයේ කි.මී. 0+000 to 0+440 කොටසේ මංතීරු 4 කොටස ප්‍රතිඵලකෙල්ල කිරීම.

- අහංගම - ඉමදුව මාර්ගය, දොරපේ - හියාරේ මාර්ගය, වැලිගම - කනංකේ මාර්ගය, වැලිගම - තෙලිජ්ජවිල මාර්ගය, ගොඩගම - තෙලිජ්ජවිල මාර්ගය දළ වශයෙන් කි.මී. 17.6, 4.4, 13.0, 10.3 හා කි.මී. 45.3 ප්‍රමාණයක සැපයුම් ජලනල ඇතිරීම හා ස්ථාපනය

කිරීම මාර්ග අතර ද.ප්‍ර.සං.ව්‍යා. යටතේ මාර්ගවල වර්තමාන හා අනාගත හානි පුනරුත්ථාපනය කරනු ලැබේ.

ප්‍රධාන සිවිල් වැඩ කොන්ත්‍රාත්වල තව දුරටත් වූ ඉතුරුම් නිසා මා.සං.අ. පහත සඳහන් අතිරේක වැඩ සඳහා ඇස්තමේන්තු කළ ඉතුරුම් යෙදවීමට මෙන්ම 2015 ප්‍රධාන කොන්ත්‍රාත්වල විවිධ්‍ය නියෝගයන් සඳහා යෙදවීමට තීරණය කරන ලදි. (යෝජනාවලි – 1 හා 2).

- මාතර - අකුරැස්ස මාර්ගයේ පාලම
- දොරපේ - හියාරේ මාර්ගයේ පාලම් අංක 5/2 ඉදිකිරීම
- කලුවැල්ල - කරාපිටිය - ලබුදුව නාගරික මාර්ගය (කි.මී. 5.6) සහ ලබුදුව - තලංගහ මාර්ගය (B248) (කි.මී. 2.2)
- වඳුරඹ - මාපලගම මාර්ගය (කි.මී. 14.1)
- යක්කලමුල්ල - ඉමදුව මාර්ගය (කි.මී. 1.735)



දොරපේ / හියාරේ මාර්ගයේ කි.මී. කි.මී. *3+880* අසල අංක 5/2 පාලම පුළුල් කිරීම



වැලිගම - කනංකේ මාර්ගය පුනරුත්ථාපනය *(B465)*

වගු අංක 60: ව්‍යාපෘති විස්තර

විස්තර	ජජාසනි යෝජනාවලි 1 කොටවාව සිට දොඩංගොඩ	ජජාසනි යෝජනාවලි 2 දොඩංගොඩ සිට කුරුදුගහහැකැක්ම	ආසංබැ කොටස කුරුදුගහ හැකැක්ම සිට පින්නදුව දක්වා	පින්නදුව සිට මාතර දක්වා දකුණු කොටස මාතර හා ගා.ව.ප්‍ර.මා.
ප්‍රදානකරු	ජජාසනි	ජජාසනි	ආසංබැ	චීන එක්සිම බැංකුව
දිග	කි.මී. 34.4	කි.මී. 31.6	කි.මී. 29.3	**කි.මී. 35.8**
මුල් මංතීරු ගණන	4	2	2	2
සංශෝධිත මංතීරු ගණන	4	4	4	4
කොන්ත්‍රාත්කරු	වයිනා හාබර් සමාගම	ටිසෙයි සමාගම	ගුමගායි ගුමි සමාගම	සිඑන්ටිඅයිසි (චීන ජාතික කාක්ෂණික ආනයන හා අපනයන සමාගම)
අධීක්ෂණ උපදේශක	ඔරියන්ටල් කන්සල්ටන්ස් ජපානය	ඔරියන්ටල් කන්සල්ටන්ස් ජපානය	එ.රා.රවුටන් සමාගම	ඒකාබද්ධ හා හවුල් ව්‍යාපාර උපදේශකයෝ
කොන්ත්‍රාත්තුව ආරම්භක දිනය	2005 සැප්. 19	2006 මාර්තු 24	2003 අප්‍රේල් 25	යෝජනාවලි 1,2 –2011 අප්‍රේල් 23 ගා.ව.ප්‍ර.මා – 2011 ජනවාරි 20
කොන්ත්‍රාත්තුව නිමකළ දිනය (මුල්)	2009 සැප්. 18	2010 මාර්තු 23	2006 අප්‍රේල් 25	යෝජනාවලි 1,2 –2013 අප්‍රේල් 22 ගාවප්‍රමා – 2011 ජුනි 30
සංශෝධිත කොන්ත්‍රාත් අක්සන් කළ දිනය	2009 අප්‍රේල් 29	2007 නොවැ. 22	2008 ජුනි 25	අදාල නොවේ
සංශෝධිත කොන්ත්‍රාත් ක්‍රියාත්මක දිනය	2007 දෙසැම්බර් 1	2007 සැප්තැම්බර් 7	2007 ජනවාරි 1	අදාල නොවේ
කොන්ත්‍රාත්තුව නිම කිරීම (ප්‍රමාණවත් නිම කිරීම)	2011 නොවැම්බර් 23	2011 නොවැම්බර් 23	2011 අගෝස්තු 11	යෝජනාවලි 1,2 –2014 මාර්තු 14 ගාවප්‍රමා –2011 නොවැම්බර් 26
මුල් කොන්ත්‍රාත් මුදල (ශ්‍රීලංරු බිලියන)	9.6	8.3	8.7	යෝජනාවලි 1 - 10.17 යෝජනාවලි 2 – 8.53
සංශෝධිත කොන්ත්‍රාත් මුදල (ශ්‍රීලංරු බිලියන)	21.97*	27.16	30.83	යෝජනාවලි 1 – 6.12 යෝජනාවලි 2 – 8.12
වර්තමාන ප්‍රගතිය	**100%**	**100%**	**100%**	යෝජනාවලි 1 – 100% ** යෝජනාවලි 2 – 100% ** ගාවප්‍රමා – 100%

** සංශෝධිත වැඩ සටහන (5 වන සංශෝධනය) පදනම් කර ගෙන ප්‍රගතිය ගණනය කරන ලදි.

වගු අංක **61:** ව්‍යාපෘති ප්‍රගතිය

අංක	මාර්ග කොටස	දිග (කිමී)	සමස්ත ඇස්තමේන්තු පිරිවැය (රු.මිලි.)	ආරම්භක දිනය	නිම කිරීමට අපේක්ෂිත දිනය	2014 දක්වා ප්‍රගතිය (%)	2014 දක්වා වියදම (රු.මිලි.)	2015 දෙසැම්බර් දක්වා ප්‍රගතිය (%)	2015 තුල වියදම (රු.මිලි.)
1	ජජසනී යෝජ. 1	34.4	54,922.11	2005.10.19	2011 නොවැ. 23	100	21,928.93	100	-
2	ජජසනී යෝජ. 2	31.61		2006.03.24	2011 නොවැ. 23	100	27,244.69	100	168.37
3	ආසංබැ කොටස	29.3	32,855.73	2003.04.25	2011 අගෝ. 10	100	34,617.87	100	-
4	දකුණු කොටස යෝජ.1	14.2	20,049.00	2011.04.20	2014 මාර්.තු 14	100	5,714.97	100	3,096.30
5	දකුණු කොටස යෝජ.2	20.35		2011.04.20	2014 මාර්.තු 14	100	4,902.49	100	1,216.69

1. ගොඩගම සිට කොට්ටාව දක්වා 2014 වර්ෂය තෙක් සහ 2015 වර්ෂය තුල ඉඩම් අත්පත්කර ගැනීම හා ප්‍රතිස්ථාපනය සඳහා වියදම පිළිවෙලින් රු මිලි. 5,101.90 සහ රු.මිලි. 19.19 (ශ්‍රී ලං ර අරමුදල්).

2. 2014 වර්ෂය දක්වා සහ 2015 වර්ෂය තුල ගාස්තු ගොඩනැගිලි, විදුලි ජනක, දෘෂ්‍ය කෙඳි රැහැන් හා කන්ටේනර් කැබින් හා දකුණු කොටසේ වෙනත් සුළු කොන්ත්‍රාත් සඳහා වියදම පිළිවෙලින් රු.පිලි. 3,241.30 හා රු.මිලි. 118.409 (ශ්‍රී ලං ර අරමුදල්).

5.1.2 අංශයේ වැඩ සටහන් හා කාර්යයන්

- ප්‍රදාන ආයතන සමඟ ව්‍යාපෘති ණය හා ප්‍රදාන පිළිබඳ කටයුතු.
- සිවිල් වැඩ කොන්ත්‍රාත් හා උපදේශනයට සම්බන්ධ ප්‍රසම්පාදන කටයුතු, ඇගයීම් කමිටු හා ටෙන්ඩර් මණ්ඩල වලට පහසුකම් සැපයීම හා කාර්යයන් සැලසුම් කළ ආකාරයට ක්‍රියාත්මක කිරීම සහතික කිරීම සඳහා කාර්යයන්වල ප්‍රගතිය ප්‍රසම්පාදන සැලසුම සමඟ ආවේක්ෂණය කිරීම.
- කොටස්කරුවන් සමඟ ව්‍යාපෘති මෙහෙයුම් කමිටුව කැඳවීම හා රැස්වීම් වාර්තා කිරීම සටහන් පිළියෙල කිරීම සහ බෙදා හැරීම.
- විවිධ ව්‍යාපෘති කර්තව්‍යයන් හා කටයුතු විස්තර කරමින් හා ව්‍යාපෘති මූලිකාංගයන් ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය සම්පත් හඳුනා ගනිමින්, වැඩ සැලැස්ම පිළියෙල කිරීමට පහසුකම් සැපයීම.
- ඉහළ අධිකාරියේ අදහස් විමසමින්, නිවැරදි කිරීමේ පියවර ගත හැකි වන පරිදි, ප්‍රක්ශේපණයන් සමඟ තථ්‍ය වර්ධනයක් සැසඳීමට හා විචල්‍යයන්ට හේතු නිර්ණය කිරීමට ප්‍රධාන ව්‍යාපෘති මූලිකාංග ආවේක්ෂණය.
- ව්‍යාපෘතියේ වෙනස්කම්, පාලනය හා පිරිවැය, ප්‍රතිලාභ හා තාක්ෂණික කාර්ය සාධනය එහි බලපෑම පිළිබඳ අවධානයෙන් සිටීම හා ඉහළ අධිකාරීන්ගේ අවධානය යොමු කිරීම.
- වෙනත් අදාල ආයතනවලින් ව්‍යාපෘති පිළිබඳ වාර්තා රැස් කිරීම හා තොරතුරු පද්ධතියක් හා ආවේක්ෂණ මෙවලමක් ලෙස පදනම් කරගත හැකි නිරන්තරව යාවත්කාලීන වන ඒකාබද්ධ ව්‍යාපෘති දත්ත බැංකුවක් ස්ථාපිත කිරීම.
- කොන්ත්‍රාත් වගකීම් වලට අනුව ඒවා සම්පූර්ණ කරන්නේ දැයි නිර්ණය කිරීම සඳහා ව්‍යාපෘතිවල නියුක්ත උපදේශකයන්ගේ කාර්ය සාධනය ආවේක්ෂණය කිරීම.
- ඉවතයෑම්, ප්‍රශ්න හඳුනා ගනිමින් වාරිකව ප්‍රගතිය ආවේක්ෂණය කිරීම හා ඉහළ අධිකාරීන්ගේ අදහස් විමසා විසඳුම් සඳහා පහසුකම් සැලසීම.
- ව්‍යාපෘතියේ වෙනත් කොටස්කරුවන් වන මුදල් අමාත්‍යාංශය සමඟ අන්තර් ක්‍රියා හා සම්බන්ධීකරණය සඳහා පරිපාටි ස්ථාපිත කිරීම.
- ව්‍යාපෘතියේ සිදුවූ වියදම, ආධාරවලින් විය පැහැදම් කළ ප්‍රමාණය, ඉක්මවූ පිරිවැය ඇතුළු මූල්‍ය තත්ත්වය පිළිබඳ අඛන්ඩව ආවේක්ෂණය සහ අවශ්‍ය විට ඉහළ අධිකාරීන්ට අනාවරණය කිරීම ඇතුළුව ව්‍යාපෘතියේ මූල්‍ය තත්ත්වය පිළිබඳ නිරන්තර ආවේක්ෂණය.
- ණය ගිවිස්නාවල ලැයිස්තු ගත කර ඇති ක්‍රියාකාරකම් නියමිත වේලාවේ අනුගමනය කරන්නේ දැයි නිර්ණය කිරීම සඳහා ආවේක්ෂණය කිරීම.

- ව්‍යාපෘති ආකෘතිය, ප්‍රසම්පාදනය, සිවිල් වැඩ හා වෙනත් අදාල කරුණු පිළිබඳව තත්ත්වයට නිතිපතා යාවත්කාලීන කරමින් නාලිකාව මගින් තොරතුරු සැපයීමට වෙබ් අඩවියක් නිර්මාණය කිරීම.

- අනුමත මාර්ගෝපදේශ වලට අනුව ප්‍රතිස්ථානගත ක්‍රියාකාරී සැලැස්ම ක්‍රියාත්මක කිරීම ඇතුළු ඉඩම් අත්පත්කර ගැනීම හා ප්‍රතිස්ථාපනය හා ව්‍යාපෘති නිසා බලපෑමට ලක්වූ පුද්ගලයන්ට වන්දි ගෙවීම් කටයුතු ක්‍රියාත්මක කිරීම හා ආවේක්ෂණය.

- ඉඩම් නායයෑම්, පාංශු ඛාදනය, භූගත ජලය හා මතුපිට ජලයට ව්‍යාපෘති බලපෑම පාලනය කිරීමේ පියවර ආවේක්ෂණය කිරීම.

- වැලිගම හා ඉමදුව අන්තර්මාරු ස්ථානවල ගාස්තු කවුළු හා ගාස්තු කාර්යාල ගොඩනැගිලි ප්‍රසම්පාදන / ඉදිකිරීමේ වැඩ.

- දොඩංගොඩ සිට කුරුදුගහහැතැක්ම දක්වා කොන්ත්‍රාත්තුව නිසා තායිසේ සමාගම විසින්, පූර්ණ හා අවසානාත්මකව ඉල්ලා සිටින ලද රු. මිලියන 9 ක විශේෂ වැට් බදු නිරවුල් කිරීම පිළිබඳ ඉල්ලීම් අමාත්‍යාංශය විසින් අනුමත කරනු ලැබීය.

- කුරුදුගහහැතැක්ම හා පින්නදුව අතර, ආ.සං.බැ. අරමුදල් සැපයූ කොටස සඳහා මා.සං.අ. හා කුමගායි ගුම් සමාගම අතර රු.බිලි. 7.35 ක විශේෂිත වැට් බදු ගෙවීම පිළිබඳ ඉල්ලිම නිරවුල් කිරීම සඳහා අමාත්‍ය මණ්ඩලයේ අනුමැතිය ලැබුණි.

- 2014 පෙබරවාරි 28 දින පවත්වන ලද අමාත්‍ය මණ්ඩල රැස්වීමේදි කොන්ත්‍රාත්කාර CNTIC සමාගමට, පින්නදුව සිට කෝදාගොඩ දක්වා (කි.මී.14.2) හා කෝදාගොඩ සිට ගොඩගම දක්වා (කි.මී. 16.05), දක්ෂිණ අධිවේගි මාර්ගය ඉදි කිරීම සඳහා සහ දක්ෂිණ අධිවේගි මාර්ගය කරා දිවෙන; i. වැලිගම - කනංකේ මාර්ගය – B465 (කි.මී. 9.6) ii. වැලිගම - තෙලිජ්ජවිල මාර්ගය – B466 (කි.මී. 7.7), හා iii. දොරපේ - හියාරේ මාර්ගය – B578 (කි.මී.8.7) ජාතික මහාමාර්ග 3 යටතේ කොන්ත්‍රාත්කරු වෙත ප්‍රදානය කරන ලද සිවිල් වැඩ කොන්ත්‍රාත් දෙකෙහි ඉතිරි කිරීම් යටතේ විචල්‍යයන් මගින් පුනරුත්ථාපනය කිරීමට අමාත්‍ය මණ්ඩලය විසින් අනුමැතිය ලබා දෙන ලදි.

කොන්ත්‍රාත් ඉතුරුම් යටතේ ප්‍රාදේශීය මාර්ග වැඩි දියුණු කිරීම

විස්තරය	මුදල (ශ්‍රී ලං රු)
වැලිගම - කනංකේ මාර්ගය පුනරුත්ථාපනය (කි.මී. 9.6)	973,528,081.20
වැලිගම - තෙලිජ්ජවිල මාර්ගය පුනරුත්ථාපනය (කි.මී.7.7)	641,051,316.44
දොරපේ - හියාරේ මාර්ගය පුනරුත්ථාපනය (කි.මී. 8.7)	579,823,632.24

- ඉහත සඳහන් විවලන නියෝග වලට අමතරව, ව්‍යා.ක.ඒ. විසින් පහත සඳහන් ප්‍රාදේශීය මාර්ග හා පාලම් පුනරුත්ථාපනය සඳහා තවත් ඉතුරුම් යොදවා ගැනීමට ලේකම්වරයා පත්කළ ප්‍රසම්පාදන කමිටු හා අමාත්‍යාංශ ප්‍රසම්පාදන කමිටුව වෙතින් අවශ්‍ය අනුමැතිය ලබා ගන්නා ලදි.

තව දුරටත් කොන්ත්‍රාත්තුවේ ඉතුරුම් යොදවා ප්‍රාදේශීය මාර්ග වැඩ දියුණු කිරීම.

විස්තරය	මුදල (ශ්‍රී ලං රු)
ගොඩගම - තෙලිජ්ජවිල මාර්ගය පුනරුත්ථාපනය (AA024) – (කි.මී.4.5)	293,986,700.51
යක්කලමුල්ල - ඉමදුව මාර්ගය පුනරුත්ථාපනය (B238) – (කි.මී. 6.2 සිට කි.මී. 6 සිට කි.මී. 12.2 දක්වා)	182,363,591.80
අහංගම - ඉමදුව මාර්ගය (කි.මී. 10.0) පුනරුත්ථාපනය	294,798,479.44
මාතර - අකුරැස්ස මාර්ගයේ (AA024) කි.මී. 4-. 0+000 to 0+400 දක්වා මාර්ගයේ මංතීර් 4 කොටස පුති එකෙල්ල කිරීම.	283,612,840.92
ප්‍රාදේශීය මාර්ගවල ජලනල හා වැද්දුම් සවි කිරීම	461,607,463.94
මාතර - අකුරැස්ස මාර්ගයේ පාලම් ඉදිකිරීම	184,361,906.54
දොම්පේ - හියාරේ මාර්ගයේ අංක.5/2 පාලම ඉදි කිරීම	14,737,775.08
කලුවැල්ල - කරාපිටිය - ලබුදුව නාගරික මාර්ග (කි.මී.5.6) හා ලබුදුව - තලන්ගහ මාර්ගය (B248) (කි.මී. 2.2) පුනර්ත්ථාපනය	669,745,029.51
වදුරඹ - මාපලගම මාර්ගය (කි.මී. 14.1)	350,076,469.60
යක්කලමුල්ල - ඉමදුව මාර්ගය (කි.මී.1.735)	62,723,383.06

- දේශිය මුදලින් ගෙවීමේදී එ.ජ. ඩොලර් අනුපාතය අධිප්‍රමාණ වූ බැවින්, සිවිල් වැඩ කොන්ත්‍රාත්වල තවත් ශ්‍රීලංරු.බිලි. 1.93 කොන්ත්‍රාත් ඉතුරුම් ලෙස සොයා ගනු ලැබීය. එබැවින්, ණය මුදලේ ප්‍රතිලාභ උපරිම කිරීම සඳහා කැබිනට් අනුමැතිය මඟින්, පහත සඳහන් අතිරේක වැඩ ඉටු කිරීමට ව්‍යා.ක.ඒ. විසින් අනුමැතිය ලබා ගනු ලැබීය.
- අ.මා.මෙ.න.හා ක. අංශයේ පාවිච්චිය සඳහා විශේෂිත වාහන 56 ක් මිලදී ගැනීම.
- ප්‍රාදේශීය මාර්ග හා පාලම් පුනරුත්ථාපනය
- කොක්මාදුව අන්තර්මාරුව අසල (කි.මී. 114) බැවුම් දෝෂ නිවැරදි කිරීම.
- එබැවින්, ව්‍යා.ක.ඒ. විසින් ඉහත සඳහන් අතිරේක වැඩ සඳහා ඉතුරුම් යොදා ගැනීමට ණය මුදලේ වලංගු කාලය 2015.12.31 සිට 2016.06.30 දක්වා දීර්ඝ කිරීමට චීන එක්සිම් බැංකුවෙන් ඉල්ලා සිටින ලදි.

5.1.3 2015 වර්ෂය තුල වැඩ සටහන් හා ක්‍රියාකාරකම්වල ප්‍රගතිය

යෝජනාවලි 1: පින්නදූව සිට කෝදාගොඩ දක්වා (කි.මී. 30+800 සිට කි.මී. 45+000 දක්වා)

විස්තරය	ප්‍රගතිය	
	සැලසුම් කළ	තථ්‍ය
භූමි වැඩ	100%	100%
පාදම් ස්ථරය	100%	100%
ඇතුරුම	100%	100%
ව්‍යුහයන්	100%	100%
සම්භාවිතාවන්	100%	100%

යෝජනාවලි 2: කෝදාගොඩ සිට ගොඩගම දක්වා (කි.මී.45+000 සිට කි.මී. 61+050)

විස්තරය	ප්‍රගතිය	
	සැලසුම් කළ	තථ්‍ය
භූමි වැඩ	100%	100%
පාදම් ස්ථරය	100%	100%
ඇතුරුම	100%	100%
ව්‍යුහයන්	100%	100%
සම්භාවිතාවන්	100%	100%

ද.ප්‍ර.සං.ව්‍යා. යටතේ 2015.12.31 දින දක්වා කොන්ත්‍රාත් විවලනයන්වල ප්‍රගතිය - දකුණු කොටසේ කොන්ත්‍රාත්

වි.නි. අංකය	ප්‍රාදේශීය මාර්ග / පාලම්වල නම	භෞතික ප්‍රගතිය (%)	
		සැලසුම් කළ	තථ්‍ය
P1/විනි-19	වැලිගම - කනංකේ මාර්ගය (B465)	100	99.9
P1/විනි-20	වැලිගම - තෙලිජ්ජවිල මාර්ගය (B466)	100	99.8
P1/විනි-28	දොරපේ - හියාරේ මාර්ගය (B578)	100	99.7
P/විනි-37	ගොඩගම - තෙලිජ්ජවිල මාර්ගය (A24)	100	99.8
P1/විනි-38	යක්කලමුල්ල - ඉමදූව මාර්ගය (B238)	100	99.7
P1/විනි-39	ඉමදූව - අහංගම මාර්ගය	100	100
P1/විනි-49	A24 මාර්ගය කි.මී. 0+000 සිට 0+440 දක්වා මංතීරු 4 කොටස ප්‍රතිඵලකෙල්ල කිරීම.	100	100
P1/විනි-52	ප්‍රාදේශීය මාර්ගවල පිවිසි හා ඩිඅයි ජල සැපයුම් නල සැලයුම, ඇතිරීම සවිකිරීම හා ජනතා අයිතියට පත් කිරීම	100	100
P1/විනි-66	දොරපේ - හියාරේ මාර්ගයේ කි.මී. 3+880 පාලම් අංක 5/2 පුළුල් කිරීම.	100	100
P1/විනි-50	A24 මාර්ගයේ කි.මී. 0+400 අසල පාලම ඉදි කිරීම.	100	91.97
P1/විනි-55	කලුවැල්ල - කරාපිටිය - ලබුදූව මාර්ගය (නාගරික මාර්ගය කි.මී.5.6) සමඟ ලබුදූව සිට තලගඟ මාර්ග කොටස පුනරුත්ථාපනය (B248 - කි.මී. 2.2) (එකතුව - දිග කි.මී. 7.8)	100	65.1
P1/විනි-68	වඳුරඹ - මාපලගම මාර්ගය පුනරුත්ථාපනය කිරීම (කි.මී. 14.1)	100	94
P1/විනි-69	යක්කලමුල්ල - ඉමදූව මාර්ගයේ කි.මී. 12 සහ 14 අතර කි.මී. 1.735 දුරක් පුනරුත්ථාපනය	100	90

5.1.4 ප්‍රගතියට බලපෑම්

(1) පින්නදූව සිට ගොඩගම දක්වා කොටස

(අ) කොන්ත්‍රාත්කරුට පළපුරුදු පිරිස් නොමැති වීම හා ප්‍රමාණවත් තරම් සම්පත් හා යන්ත්‍ර නොමැති වීම

(ආ) වැඩ විෂය පථය හා මූල්‍යමය කරුණු පිළිබඳව කොන්ත්‍රාත්කරු හා උප කොන්ත්‍රාත්කරුවන් අතර, එකඟතාවය නොමැතිකම හා දුර්වල සම්බන්ධීකරණය.

(ඇ) ද්‍රව්‍ය ප්‍රසම්පාදනය කඩිනම් කිරීමට, නව කාර්යයන් ආරම්භ කිරීමට හා ගැටළු පිළිබඳ නිවැරදි කිරීමේ පියවර ගැනීමට අවධානය නොමැතිකම.

5.1.5 අනුගමනය කරන ලද හා යෝජිත ප්‍රතිකර්ම පියවර

(1) **පින්නදූව සිට ගොඩගම දක්වා**

(අ) කොන්ත්‍රාත්කරුට ප්‍රමාණවත් පළපුරුද්ද සහිත පිරිස් නොමැති අතර, ප්‍රමාණවත් සම්පත් හා යන්ත්‍ර නොමැතිකම.

(i) විවිධ්‍ය පිළිබඳ රැස්වීම් වලදී ඔවුන්ගේ ධාරිතාව වැඩි කිරීමට කීප වරක් ඉල්ලා සිටිනු ලැබීය.

(ආ) වැඩ විෂය පථය හා මූල්‍යමය කරුණු වලදී කොන්ත්‍රාත්කරු හා උප කොන්ත්‍රාත්කරුවන් අතර එකඟතාවයක් නොමැතිකම හා දුර්වල සම්බන්ධීකරණය.

(i) ඔවුන්ගේ ගැටළු සාකච්ඡා කිරීම සඳහා සතිපතා රැස්වීම් පවත්වන ලදි.

(ii) සියලුම පාර්ශවයන් සමඟ සතිපතා වැඩබිම් පරීක්ෂා සිදු කරන ලදි.

(iii) උප කොන්ත්‍රාත්කරුවන්ගේ මූල්‍ය ධාරිතාව වැඩි දියුණු කිරීම සඳහා වැඩාරම්භක අත්තිකාරමක් ගෙවීම සලකා බලන ලදි.

(ඇ) ද්‍රව්‍ය ප්‍රසම්පාදනය කඩිනම් කිරීමට, නව කාර්යයන් ආරම්භ කිරීමට හා මුහුණ දෙන ගැටළු පිළිබඳ නිවැරදි කිරීමේ පියවර ගැනීමට අවධානය නොමැතිකම.

(i) ව්‍යාපෘතියේ ද්‍රව්‍ය අවශ්‍යතාවය හා වැඩ සැලසුම සමාලෝචනය කිරීමට බාහිර මූලාශ්‍රවලින්, ඕනෑම හිඟ ප්‍රමාණයක් ලබා ගැනීමට කොන්ත්‍රාත්කරුට උපදෙස් දෙන ලදි.

(ii) සැලසුම් දත්ත ක්ෂණිකව නිකුත් කිරීම හා ඇදීම් සඳහා අනුමැතිය

5.2 දක්ෂිණ අධිවේගි මාර්ගය දිගු කිරීමේ ව්‍යාපෘතිය (මාතර සිට හම්බන්තොට)

ජාතික මාර්ග මධ්‍ය සැලැස්ම (NRMP) විසින් 2007 – 2017 කාල පරිච්ඡේදය සඳහා ජාතික අධිවේගි හා ජාතික මහමාර්ග තත්ත්වය නැංවීමේ සැලැස්ම ස්ථාපිත කරන ලදි. දක්ෂිණ අධිවේගි මාර්ගය මාතර සිට හම්බන්තොට දක්වා කි.මී. 96 කින් දිගු කිරීම ක්‍රියාත්මක කිරීම ජා මා ම සැ විසින් හඳුනා ගන්නා ලදි.

5.2.1 ව්‍යාපෘති විස්තරය

දක්ෂිණ අධිවේගි මාර්ගය මාතර සිට හම්බන්තොට දක්වා දිගු කිරීම, හම්බන්තොට වරාය හා මත්තල ජාත්‍යන්තර ගුවන් තොටුපලට සම්බන්ධතා සහිතව, කි.මී. 96 දිගැති පහත සඳහන් කොටස් 4 කින් සමන්විතය:

- 1 කොටස මාතර සිට බෙලිඅත්ත දක්වා (කි.මී. 30)
- 2 කොටස බෙලිඅත්ත සිට වැටිය දක්වා (කි.මී. 26)
- 3 කොටස වැටිය සිට අන්දරවැව දක්වා (කි.මී. 15)
- 4 කොටස මත්තල සිට වැටිය හරහා හම්බන්තොට දක්වා (කි.මී. 25)

ද.අ.දි. ව්‍යා. ට සමස්ත කි.මී. 24.4 ක් හා අන්තර්මාරු 8 කින් යුක්ත වන අතර ඊට සෑම දිශාවකටම කි.මී. 3.6 කින් යුක්ත මංතීරු 2 ක් බැගින් වන මී. 2.0 මධ්‍යන්‍යායක් සහිත වේ. එහි හරස්කඩකට මධ්‍යන්‍යාය දෙපස අභ්‍යන්තර උරිස් මී. 0.75 ක පළලකින් යුක්ත වන අතර, රථ මාර්ගය දෙපස මධ්‍යන්‍යාය දෙපස හා දෘඩ උරිස් සහ අන්තය මී. 3.25 පළලකින් යුක්තය.

ව්‍යාපෘතියේ කොටස් 4 ක් ව්‍යාපෘති අධ්‍යක්ෂවරුන් 4 දෙනෙකු විසින් පාලනය කරනු ලබන අතර ජ්‍යෙෂ්ඨ ව්‍යාපෘති අධ්‍යක්ෂවරයෙකු විසින් සමස්ත අධීක්ෂණය කරනු ලැබේ. දැනට සමස්ත කාර්ය මණ්ඩලය 142 ක් වන අතර ඊට නියෝජ්‍ය අධ්‍යක්ෂවරුන් 3 ක්, ඉංජිනේරුවන් 10 ක් හා වෙනත් සහාය කාර්ය මණ්ඩලය අයත් වේ. ව්‍යාපෘති කළමනාකරණ කටයුතු වලට අමතරව අංශයේ වගකීම් වලට, ප්‍රදාන ආයතන හා භාණ්ඩාගාරය, මධ්‍යම පරිසර අධිකාරිය හා ප්‍රයෝජ්‍ය සේවා ආයතන වැනි කොටස්කරුවන් සමඟ සම්බන්ධීකරණය ඇතුළත් වේ.

කොටස් 4 සිවිල් වැඩ වෙනම කොන්ත්‍රාත් ගිවිසුම් යටතේ, කොන්ත්‍රාත්කරුවන් 3 දෙනෙකු වෙත ප්‍රදානය කර ඇත. 1, 3 හා 4 යන ව්‍යාපෘති කොටස්වල සිවිල් වැඩ සඳහා අරමුදල් සැපයීම සඳහා ණය ගිවිසුම ශ්‍රීලංර හා චීන එක්සිම් බැංකුව අතර අත්සන් තබන ලද 2 කොටස සඳහා ණය ගිවිසුම දැනට චීන එක්සිම් බැංකුව විසින් ඇගයීම් කෙරෙමින් පවතී.

ඉදිකිරීම් අධීක්ෂණය සඳහා උපදේශක සේවාව සැපයීමේ කොන්ත්‍රාත්තුව ප්‍රදානය කෙරිණි. උපදේශක සේවාවට අදාල ණය මුදල සඳහාද චීන එක්සිම් බැංකුව විසින් ඇගයීම් සිදු කෙරෙමින් පවතී.

ව්‍යාපෘතියට දැඩි කොන්දේසි යටතේ පාරිසරික නිශ්කාශන ලැබුණු අතර, ඒ අනුව දැඩි පාරිසරික ආරක්ෂණ අවශ්‍යතාවයන් පිළිපැදීම සිදු කෙරේ.

ව්‍යාපෘතියේ ප්‍රගතියට සිදුවී ඇති ප්‍රධානතම බලපෑම වන්නේ ඉඩම් අත්පත්කර ගැනීමේ ව්‍යවස්ථාපිත ක්‍රියාවලිය සඳහා දිගු කාලයක් ගත වීමයි. මෙය අනෙක් අතට ඉදිකිරීම් වැඩ ආරම්භ කිරීමට වැඩබිම කොන්ත්‍රාත්කරුට භාරදීම ප්‍රමාදයට හේතු වේ. වැඩවල ප්‍රගතියට බලපාන තවත් සාධකයක් වන්නේ, ව්‍යාපෘතියට වෙන්කළ ප්‍රතිපාදන සීමා සහිත වීමයි.

5.2.2 ව්‍යාපෘතියේ ප්‍රගතිය

දක්ෂිණ අධිවේගී මාර්ගය දිගු කිරීමේ ව්‍යාපෘතිය

විෂය අංකය	මාර්ගයේ නම / පාලම් අංකය	මාර්ගයේ දිග.	සමස්ත ඇස්තමේන්තු පිරිවැය (රු.බිලි.)	ආරම්භක දිනය	නිම කරන දිනය	2014 දක්වා සමුච්චිත ප්‍රගතිය	2014 දක්වා සමුච්චිත වියදම (රු.මිලි)	2015 සමුච්චිත භෞතික ප්‍රගතිය	2015 තුල වියදම (රුමිලි)
1	මාතර සිට බෙලිඅත්ත I – කොටස	30	103.28	2016.01.19	2019.07.18				15,492.00
2	බෙලිඅත්ත සිට වැටිය II – කොටස	26	55.20						-
3	වැටිය සිට අන්දරවැව III – කොටස	15	31.574	2016.01.25	2018.01.24				4,736.11
4	මත්තල සිට අන්දරවැව හරහා හම්බන්තොට IV – කොටස	25	52.15						5,215.62
	එකතුව								
	උපදේශකත්වය								24.84
	වැඩිවන පිරිවැය						64.5		143.76
	සේවා ප්‍රතිස්ථානගත කිරීම								
	ඉඩම් අත්පත් කර ගැනීම								43.20

කාර්යයන්වල ප්‍රගතිය

මාර්ගයේ නම	ප්‍රතිසංස්කරණය කළ දුර (කි.මී.)	සටහන් / තත්ත්වය
I කොටස – මාතර සිට බෙලිඅත්ත දක්වා		කුළුණු මහ සඳහා විස්තරාත්මක සමීක්ෂණ වැඩ, පස් පරීක්ෂණ, ටැම් පරීක්ෂණ නිම කරන ලදි. සේවා මාර්ගය ඉදි කිරීම සිදු කෙරෙමින් පවතී. ටැම් බැස්සීමේ වැඩ ආරම්භ කළ අතර කාර්යාලය ඉදි කිරීම හා පහසුකම් සැපයීම සිදු කෙරෙමින් පවතී.
II කොටස – බෙලිඅත්ත සිට වැටිය දක්වා		විස්තරාත්මක මිණුම් වැඩ නිම කෙරිණි. කාර්යාලය ඉදි කිරීම හා නවාතැන් පහසුකම් සැපයීම සිදු කෙරෙමින් පවතී.
III කොටස – වැටිය සිට අන්දරවැව දක්වා		විස්තරාත්මක මිණුම් වැඩ පාංශු විමර්ශනය නිම කෙරිණි. සැලසුම් වැඩ, කාර්යාලය ඉදි කිරීම හා නවාතැන් පහසුකම් සැපයීම සිදු කෙරෙමින් පවතී.
IV කොටස – මත්තල සිට අන්දරවැව හරහා හම්බන්තොට දක්වා		විස්තරාත්මක මිණුම් වැඩ හා පාංශු විමර්ශන සිදු කෙරෙමින් පවතී. සැලසුම් වැඩ, කාර්යාලය ඉදි කිරීම හා නවාතැන් පහසුකම් සැපයීම සිදු කෙරෙමින් පවතී.

කොටස් හතරක් සඳහා ඉඩම් අත්පත්කර ගැනීම ආරම්භ කරන ලද අතර, එහි වැඩ සිදු කෙරෙමින් පවතී.

සිවිල් වැඩ කොන්ත්‍රාත් පිළිබඳ සාරාංශය

අංකය.	කොන්ත්‍රාත් අංකය	අධිවේගී මාර්ග කොටසේ / මාර්ගයේ නම	කොටසේ දිග (කි.මී.)	කොන්ත්‍රාක්කරුගේ නම	කොන්ත්‍රාත් මුදල	කොන්ත්‍රාත් ගිවිසුම අත්සන් කළ දිනය	කාලසීමාව (මාස)
1	RDA/SEEP/CONT/S1	මාතර සිට බෙලිඅත්ත (කි.මී. 0.0 – 30.0) 1 කොටස	30	චයිනා නැෂනල් එයරෝ ටෙක්නොලොජි ඉන්ටර් නැෂනල් ඉංජිනියරින් සමාගම (CATIC – ENG)	103,280,000,000.00 (එ.ජ.ඩො. 804,110,868.89)	31.10.2013	42
2	RDA/SEEP/CONT/S2	බෙලිඅත්ත සිට වැටිය (කි.මී. 30.0 – 56.0) 2 කොටස	26	චයිනා ස්ටේට් ඉංජිනියරින් සමාගම.	55,200,000,000.00 (එ.ජ.ඩො. 423,875,233.25)	29.09.2014	36
3	RDA/RNIP/HH/01	හම්බන්තොට කේන්ද්‍රීය සංවර්ධන ව්‍යාපෘතිය යටතේ දි.ව්‍යා.ඉ. 1. වැටිය සිට අන්දරවැව දක්වා (දක්ෂිණ අධිවේගී මාර්ගයේ කොටස් 3 දිගු කිරීම) 2. සූරියවැව – ගල්වැව හංදිය – මොරකැටිය – ඇඹිලිපිටිය මාර්ගය (කි.මී. 18.5) 3. රන්න - වැටිය මාර්ගය (කි.මී. 18.0)	15	චයිනා ස්ටේට් කන්ස්ට්‍රක්ෂන් ඉංජිනියරින් සමාගම.	31,574,100,000.00 (එ..ජ.ඩො. 252,532,192.27)	23.08.2013	24
4	RDA/SEEP/CONT/S4	මත්තල සිට අන්දරවැව හරහා හම්බන්තොට (කි.මී.71.0 – කි.මී. 96.0) 4 කොටස	25	චයිනා හාබර් ඉංජිනියරින් සමාගම	52,156,184,936.52 (එ.ජ.ඩො. 412,432,270.57)	19.11.2013	36
සමස්ත කොන්ත්‍රාත් මුදල				රු.	242,210,284,936.52		
				එ.ජ.ඩො.	1,892,950,564.98		

5.2.3 ණය පිළිබඳ විස්තර හා තත්ත්වය

චීන එක්සිම් බැංකුව හා ශ්‍රී ලංකා රජය අතර හා ර.ස.ණ මුදල් 2 න් එක් ප්‍ර මි ණය මුදලක් සඳහා ණය ගිවිසුම් අත්සන් තබන ලදි. ණය විස්තර හා තත්ත්වය පිළිබඳ සාරාංශය මතු දැක්වෙන් වගුවේ දැක්වේ.

ණය විස්තර හා තත්ත්වය


විස්තරය	ණය අංකය	අත්සන් තැබූ දිනය	ශ්‍රී ලංකා රජයේ සහභාගය %	ණය සහභාගය %	මුදල
මාතර සිට බෙලිඅත්ත දක්වා I – කොටස	චීන එක්සිම් බැංකු ප්‍ර.වි.ණය අංක (2014)27 සමස්ත ගණන (321)	2014 දෙසැම්බර් 23	15%	85%	එ.ජ.ඩො. 683,494,300.00
බෙලිඅත්ත සිට වැටිය දක්වා II – කොටස	චීන එක්සිම් බැංකුවේ ඇගයීම යටතේ පවතී				
වැටිය සිට අන්දරවැව දක්වා III – කොටස	චීන එක්සිම් බැංකු ප්‍ර.වි.ණය අංක. (2014)17 සමස්ත ගණන. (520)	2014 සැප්තැම්බර් 16	-	100%	වියුවාන් 1555995249.00 (එ.ජ.ඩො. 2525321 සමාන
මත්තල සිට අන්දරවැව හරහා හම්බන්තොට දක්වා IV – කොටස	චීන එක්සිම් බැංකු ප්‍ර.වි.ණය අංක (2014)18 සමස්ත ණය.(521)	2014 සැප්තැම්බර් 16		100%	වියුවාන් 2528171834.05 (එ.ජ.ඩො. 412432270.57) සමාන
පොළී අනුපාතය	2%				
ර ස ණ	රාජ්‍ය සහනදායී ණය මුදල		03 කොටස 04 කොටස		
ප්‍ර මි ණ	ප්‍රමුඛතා මිලදී ගන්නාගේ ණය		01 කොටස		

කල්පිරෙන කාල සීමාව	අවුරුදු 20
සහන කාලය	අවුරුදු 05
ආපසු ගෙවන කාලසීමාව	අවුරුදු 15

උපදේශන සේවා

දක්ෂිණ අධිවේගී මාර්ගයේ අධීක්ෂණ උපදේශකත්ව වැඩ ක්‍රියාත්මක කිරීම සඳහා වයිනා රේල්වේ ෆස්ට් සර්වේ ඇන්ඩ් ඩිසයින් ඉන්ස්ටිට්යුට් ගෘෘප් සමාගම සමග ගිවිසුමකට එළඹුණි. මූල්‍යායනය සැකසීම සඳහා ගිවිසුම විදේශ සම්පත් දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබීය.


සිතියම 8: දක්ෂිණ අධිවේගී මාර්ගය දිගු කිරීමේ ව්‍යාපෘතිය (මාතර සිට හම්බන්තොට දක්වා)



5.3 කොළඹ - කටුනායක අධිවේගි මාර්ග ව්‍යාපෘතිය

කොළඹ - කටුනායක අධිවේගි මාර්ග ව්‍යාපෘතිය, කි.මී. 25.80 දිගකින් යුතු කොළඹ හා කටුනායක අන්තර්ජාතික ගුවන් තොටුපල යා කරමින්, කොළඹ- කටුනායක අධිවේගි මාර්ග ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේ වගකීම දරයි. චීන එක්සිම් බැංකුව හා ශ්‍රී ලං ර සපයන ලද අරමුදල් වලින් ඉදිකරන ලද කොං.ක.අ.මාර්ගය 2013 දී මහ ජනතාව සඳහා විවෘත කරන ලද අතර, එය කටුනායක ගුවන් තොටුපල සිට එන මගීන්ට කොළඹට පිවිසීමට පහසු ප්‍රවේශයක් සපයයි. ප්‍රධාන මාර්ග අධිවේගි මාර්ගයේ ගමන් කරන ස්ථානවල පිහිටි අන්තර්මාරු 4 ක් මගින් පමණක් අධිවේගි මාර්ගයට පිවිසිය හැකිය

සිතියම් අංක 9: කොළඹ - කටුනායක අධිවේගි මාර්ගය



5.3.1 2015 වර්ෂය තුල කාර්යයන්වල ප්‍රගතිය

- 2015 වන විට ඉඩම් අත්පත්කර ගැනීමේ හා ප්‍රතිස්ථානගත කිරීමේ වැඩවල රු.මිලි. 2,709.20 අගයකට සමුච්චිත ප්‍රගතිය 98.3% කි.
- කොළඹ - කටුනායක අධිවේගි මාර්ග ව්‍යාපෘතිය ඉදිකිරීම නිමකර 2013 ඔක්තොම්බර් 27 දින මහජනයා සඳහා විවෘත කෙරිණි.

  2015 වර්ෂය තුල වයිනා මෙටලජිකල් කෝපරේෂන් සමාගම කොළඹ - කටුනායක අධිවේගි මාර්ගයේ දෝෂයන් ආවේක්ෂණය හා ප්‍රතිකර්ම කිරීමේ යෙදුනි. දෝෂ පිළිබඳ වගකීම් කාලසීමාව තුල කොං.ක.අ.මා. දෝෂ නිවැරදි කිරීම සිදු කරන ලදි.

  ඉලෙක්ට්‍රොනික ගාස්තු රැස් කිරීමේ හා සන්නිවේදන පද්ධතිය ස්ථානගත කිරීම පිළිබඳ වැඩ නිමකළ අතර, ඉලෙක්ට්‍රොනික් ගාස්තු රැස්කිරීමේ (ඉ.ගා.රැ.) මෙහෙයුම් කෙරෙමින් පවතී.

  සිදුවේ කොං.ක.අ. මාර්ගයේ කාර්ය මණ්ඩලයේ නිල නිවාස පහසුකම් ඉදිකිරීම් නිමකර අධිවේගි මාර්ග මෙහෙයුම් නඩත්තු හා කළමනාකරණ අංශය වෙත භාරදෙන ලදි. පාරිභෝගික සේවා මධ්‍යස්ථානය සඳහා ගොඩනැගිල්ල පැලියගොඩ ඉදි කරමින් පවතී.

- 2015 වර්ෂය අවසානය වන විට මූල්‍ය වියදම රු.මිලි. 48,177.20 සහිතව සමස්ත භෞතික ප්‍රගතිය 100%කි.
- උපදේශයකයන් වන ඕස්ට්‍රෙලියානු ස්මෙක් ඉන්ටර්නැෂනල් සමාගම, සේව්‍යයාගේ නියෝජිතයා වශයෙන් උපදේශක සේවා කටයුතු සිදුකළ අතර, ගිවිසුමට අනුව උපදේශක වෙත පවරණ ලද කාර්යයන් නිම කරන ලදි.


වගු අංක 62: කොළඹ - කටුනායක ව්‍යාපෘතියේ ව්‍යාපෘති විස්තර

මාර්ගයේ / පාලමේ නම	දිග	කා.ඇ.ක.	ආරම්භක දිනය	**නිම කිරීමට අපේක්ෂිත දිනය	2014 දක්වා ප්‍රගතිය (%)	2015 දක්වා වියදම රු. මිලි.	2015 අවසානයේ ප්‍රගතිය (%)	2015 වර්ෂය තුල වියදම රු.මිලි.
කොළඹ - කටුනායක අධිවේගි මාර්ගය	කි.මී. 25.8	52,380	18.08.2009	30.09.2015	99.2%	45,143.70	100%	3,033.50

5.4 පිටත වටරවුම් මාර්ග ව්‍යාපෘතිය

පිටත වටරවුම් මාර්ග ව්‍යාපෘතිය කොළඹ නගරයට කි.මී. 20 ක් පමණ ඈතින් කොළඹ සිට දිවෙන සියලුම ඒ පංතියේ මාර්ග යා කරමින් ප්‍රවේශවීම් සීමාවන් සහිතව කි.මී. 29.20 දිගින් යුතු පිටත වටරවුම් මාර්ගය ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේ වගකීම දරයි. පි.ව.මා. දක්ෂිණ අධිවේගි මාර්ගයේ කොට්ටාවෙන් ආරම්භ වී මහරගම, කඩුවෙල, බියගම, මාතර හා වත්තල යන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ හරහා ගමන් කරමින්, කෙරවලපිටියෙන් අවසන් වේ. එය නගර මධ්‍යයේ සිට කි.මී. 10-15 දක්වා පැතිරී ඇත. එය කොළඹ නගරය වටා අධිවේගි මාර්ගයක් වශයෙන් උතුරු හා දකුණ සම්බන්ධ කරන අතර, ප්‍රමුඛ අරමුණ වන්නේ කොළඹ නාගරික ප්‍රදේශය රථවාහන තදබදයෙන් මුදවා ගැනීම මෙන්ම, ඊට සම්බන්ධිත ආර්ථික සහ සාමාජීය සංවර්ධනයයි. පි.ව.මා. මංතීරු 4 අධිවේගි මාර්ගයක් ලෙස ආරම්භයේදී ඉදිකරන ලද අතර රථවාහන ඉල්ලුම අනුව අනාගතයේදී එය මංතීරු 6 ක් දක්වා පුළුල් කෙරේ. පි.ව.මා. අදියර 3 ක් ලෙස අරඹන ලදී. I අදියර – පි.ව.මා. දකුණු කොටස, II අදියර – පි.ව.මා. උතුරු කොටස I හා III අදියර – පි.වට.මා. උතුරු කොටස II ව්‍යාපෘතිය වශයෙනි. අධිවේගි මාර්ගයට ප්‍රවේශ වන අන්තර්මාරු හයකි.

සිතියම් අංක 10: පිටත වටරවුම් මාර්ගය



5.4.1 පිටත වටරවුම් මාර්ගය අදියර 1

පි.ව.මා. 1 අදියරේ කි.මී. 11.00 සහිත කොට්ටාව සිට කඩුවෙල දක්වා කොටස ක්‍රියාත්මක කිරීමේ වගකීම දරයි. 1 අදියර ව්‍යාපෘති අධ්‍යක්ෂ විසින් ප්‍රධානත්වය දරණ අතර, ජඇාසනි විසින් අරමුදල් සපයන ලදි. මෙ කොටසේ ඉදිකිරීම් නිමකළ අතර 2014 මාර්තු මස මහජනයා සඳහා විවෘත කරන ලදි.







කි.මී. 11.00 ක් දිගැති කොට්ටාව සිට කඩුවෙල දක්වා පිටත වටරවුම් මාර්ගය ඉදි කිරීම 2014 දී නිමකළ අතර 2014 මාර්තු 15 දින එය මහජනයා සඳහා විවෘත කරන ලදි. ව්‍යාපෘතිය මෙහෙයවන ලද ව්‍යාපෘති කළමනාකරණ ඒකකය 2015 දෙසැම්බර් 31 දින අවසන් කරන ලදි.

5.4.2 පිටත වටරවුම් මාර්ගය 2 වන අදියර

පි.ව.මා. ව්‍යාපෘතියේ II වන අදියර කඩුවෙල සිට කඩවත දක්වා කි.මී. 8.90 කොටස ක්‍රියාත්මක කිරීමේ වගකීම දරයි. II වන අදියර ව්‍යාපෘති අධ්‍යක්ෂ (අදියර II) විසින් පාලනය කරනු ලබයි. මෙම කොටස දැනට ඉදි වෙමින් පවතින අතර , ජපාසනි අරමුදල් යටතේ 2015 ජනවාරි මස නිම කිරීමට නියමිතය. කඩුවෙල - කඩවත කොටස, කඩවත සහ කඩුවෙල අන්තර්මාරු 2 කින්, පාලම් හතකින් හා උඩිස් මාරු පහකින් යුක්තය. මෙම මාර්ගය ඉදිරියේදී මංතීරු 6 ක් දක්වා අනාගතයේ පුළුල් කිරීමට ඉඩ ඇතිව මංතීරු හතරකින් යුක්ත ගාස්තු මාර්ගයක් ලෙස ඉදි කෙරේ.

පිටත වටරවුම් මාර්ගය පූර්ණ ප්‍රවේශ පාලනය සහිතව, දක්ෂිණ අධිවේගි මාර්ගය සහ කොළඹ - කටුනායක අධිවේගි මාර්ගය යා කරන නව අධිවේගි මාර්ගයකි. එමෙන්ම එය කොළඹ නගරයේ සිට පැතිරෙන ජාතික මහා මාර්ග සම්බන්ධ කරයි.

පිටත වටරවුම් මාර්ගයේ II වන අදියර ව්‍යාපෘති අංශය පිටත අධිවේගි මාර්ගයේ කඩුවෙල (කි.මී. 8+648) සිට කඩවත (කි.මී..17+500)) දක්වා කොටස ඉදි කිරීමේ වගකීම දරයි. මෙම ඉදි කිරීමෙන් බාහිරව, කඩවත සිට කඩුවෙල දක්වා කි.මී. 8.ක අධිවේගි මාර්ගයක්, මංතීරු 04 ගාස්තු මාර්ගයක් වශයෙන් අනාගතයේ මංතීරු 06 ක් දක්වා පුළුල් කෙරෙන පරිදි ඉදිකිරීමේ වගකීම දරයි. තවද මෙම අංශය කඩවත හා කඩුවෙල අතර අන්තර් මාරු 2 ක් ඉදිකිරීමේ වගකීම දරයි. ඊට පාලම් 07 ක් උඩිස් මාරු 05 ක් හා උමංග මාර්ග දෙකක් අයත් වේ. මෙම ව්‍යාපෘතියේ සමස්ත ඇස්තමේන්තු පිරිවැය රු.බිලියන 44.88 ක් වන අතර ජපන් ජාත්‍යන්ත සහයෝගිතා නියෝජිතායතනය ව්‍යාපෘතිය සඳහා අරමුදල් සපයනු ලබයි.

පි.ව.මා. II අදියරේ සිවිල් (ඉදිකිරීම්) වැඩ 2011 නොවැම්බර් මස ජපන් තායිසේ සමාගමට ප්‍රදානය කෙරිණි. මෙම ව්‍යාපෘති අංශය අධිවේගි මාර්ගයේ මෙම කොටස අධීක්ෂක උපදේශකයන්ගේ සහාය ඇතිව (ඔරියන්ටන් කන්සල්ටන්ස් - ජපානය) 2012 ජනවාරි 9 සිට (රු.බිලියන 44.88) ඇස්තමේන්තු පිරිවැයකට නියම කරන ලද ප්‍රමිතීන්ට අනුව ඉදිකිරීමේ වගකීම දරයි.

ව්‍යාපෘති අධ්‍යක්ෂ හා අංශයේ කාර්ය මණ්ඩලය, මාර්ග අයිතිය තුල, හා ව්‍යාපෘති කාල රාමුව තුල සියලුම ඉඩම් අත්පත්කර ගැනීමේ වගකීම දරයි. එසේම මෙම වයාපෘතිය නිසා අවතැන් වූ පිරිස් ප්‍රතිස්ථාපනය කිරීම අවශ්‍ය වේ. ඉඩම් සඳහා පැහැදිලි අයිතීන් නොමැති පිරිස් අපට අයත් ප්‍රතිස්ථාපන වැඩ බිම්වල පදිංචි කරවනු ලබන අතර අත්පත් කර ගත් ඉඩම් සඳහා පැහැදිලි අයිතීන් ඇති පුද්ගලයන්ට ප්‍රතිස්ථාපනය සඳහා ඔවුන් කැමති පරිශ්‍ර සුදුසු ස්ථාන සොයා ගැනීමට හා ඔවුන්ගේ ජීවිතය නඟා සිටුවීමට සහාය දෙනු ලැබේ. තවද මෙම අංශය ව්‍යාපෘතියට ආසන්න සීමාව තුල සුදුසු පාරිසරික ආරක්ෂාව හා පාරිසරික ගැටළු විසඳීමේ වගකීම දරයි.

තවද මෙම අංශය සියලුම නිෂ්කාශණයන් හා ප්‍රයෝජ්‍ය සේවා ප්‍රතිස්ථානගත කිරීම සම්බන්ධීකරණය කළ අතර, ව්‍යාපෘතියේ සියලුම් ඉදිකිරීම් කටයුතු අධීක්ෂණය කරනු ලැබීය.

මෙම ව්‍යාපෘතියේ ඉදිකිරීම් වැඩ මුලින් 2015 ජනවාරි 08 නිම කිරීමට නියමිතව තිබිණි කෙසේ නමුත්, කොන්ත්‍රාත්කරුට කල් දිගුවක් ලබා දුන් අතර, එහි ප්‍රතිඵලයක් ලෙස නිම කිරීමේ දිනය 2015 ජූලි 18 දක්වා දිගු කරන ලදි.

කොන්ත්‍රාත්කරු විසින් මහා මාර්ගය 2015 ජූලි මස 18 දින නිම කරන ලද අතර පි.ව.මා. II අදියර කඩුවෙල සිට කඩවත දක්වා කොටස එය 2015 සැප්තැම්බර් 17 දින මහජනයා සඳහා විවෘත කෙරුණි.

- **භෞතික නිමවුම් වලට අනුව වර්ෂය තුල සිවිල් වැඩ වල ප්‍රගතිය**

විස්තරය	**2015** දෙසැම්බර් 31
සිවිල් වැඩවල ප්‍රගතිය	සමුච්චිත වැඩ ප්‍රගතිය
	100 %

- **භෞතික නිමවුම් වලට අනුව වර්ෂය තුල ඉඩම් අත්පත්කර ගැනීම් කටයුතු වල ප්‍රගතිය**

විස්තරය	2015 දෙසැම්බර් 31	**සටහන්**
ඉඩම් අත්පත් කර ගැනීම්	සමුච්චිත ප්‍රගතියේ ප්‍රතිශතය	ඉතිරි ප්‍රගති ප්‍රතිශතය උසාවිය විසින් ඉඩම් හිමිකම් නිරාකරණය කිරීමෙන් පසු ක්‍රමානුකූලව සාධනය වනු ඇත.
	98.76%	

- **පි.ව.මා. 2 අදියර ඉදිකිරීම් කටයුතුවල ප්‍රගතිය**

මාර්ගය / පාලමේ නම	**දිග**	**කා.ඇ.ක. රු.මිලි.**	**ආරම්භක දිනය**	***නිම කරන දිනය**	**2014 දක්වා ප්‍රගතිය %**	**2014 දක්වා වියදම (රු.මිලි.)**	**2015 අවසානයේ ප්‍රගතිය %**	**2015 අවසානයේ වියදම (රු.මිලි.)**
පිවමාවාසා අදියර (II)	කි.මී. 8.9	50,550	2012.01.09	2015.07.18	89.10%	38137.95 මිලි.	100%	7823.17



කඩුවෙල බෑවුමේ 4 වන ගාස්තු ගේට්ටුව



කඩවත බෑවුමේ 1 වන ගාස්තු ගේට්ටුව

5.4.3 පිටත වටරවුම් මාර්ගය - 3 අදියර

ශ්‍රී ලංකා රජය විසින් පිටත වටරවුම් මාර්ගයේ උතුරු කොටස II කෙරවලපිටිය සිට කඩවත දක්වා කි.මී. 9.32 ඉදි කිරීමට වීන එක්සිම් බැංකුවෙන් දිගු කාලීන ණය මුදලක් අයදුම් කරනු ලැබීය. පි.ව.මා. ව්‍යා. 3 අදියර ව්‍යාපෘති අධ්‍යක්ෂ (අදියර III) විසින් පි.ව.මා.ව්‍යා. 3 වන අදියරේ ප්‍රධානත්වය දරයි.

සිතියම 11: කොළඹ – පිටත වටරවුම් මාර්ගය 3 අදියර



5.4.3.1 හැඳින්වීම.

ශ්‍රී ලංකා රජය විසින් , පිටත වටරවුම් මාර්ගයේ උතුරු කොටස II කෙරවලපිටිය සිට කඩවත දක්වා කි.මී. 9.628 ක් ඉදි කිරීමට චීන එක්සිම් බැංකුවෙන් දිගු කාලීන ණය මුදලක් අයදුම් කරනු ලැබිය. .

පිටත වටරවුම් මාර්ගය, කොළඹ - කටුනායක අධිවේගී මාර්ගය, දක්ෂිණ ප්‍රවාහන සංවර්ධන ව්‍යාපෘතිය, උතුරු අධිවේගී මාර්ගය හා කොළඹ නගරයෙ සිට විහිදෙන වෙනත් ජාතික මහාමාර්ග යා කරමින්, දිවෙන නව අධිවේගී මාර්ගයකි. එය කොළඹ නගර මධ්‍යයේ සිට කි.මී. 10-15 ඈතින් පැතිරි ඇත. පි.ව.මා. සමස්ත දිග දළ වශයෙන් කි.මී. 29.53 වන අතර, එයින් කි.මී. 9.628 ක් පි.ව.මා. යේ C-11 කොටස යටතේ ඉදි කෙරිණි. එහි ස්ථානීය සිතියම මේ සමඟ අමුණා ඇත. එය වටරවුම් අධිවේග මාර්ගයක් ලෙස උතුර හා දකුණ යා කරන කොළඹ නාගරික ප්‍රදේශයේ රථවාහන තදබදය ලිහිල් කිරීමෙහි ප්‍රමුඛ අරමුණෙන් හා වෙනත් ආර්ථික සාමාජීය සංවර්ධනය සඳහා ඉදි කෙරේ. ආරම්භයේදි පි.ව.මා. මංතීරු 4කින් යුක්තව අනාගතයේ රථවාහන ඉල්ලුම මත මංතීරු 6 ක් දක්වා පුළුල් කිරීම සඳහා ඉදි කෙරේ.

මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේ ආයතනය උසස් අධ්‍යාපන හා මහාමාර්ග අමාත්‍යාංශය යටතේ පවතින මාර්ග සංවර්ධන අධිකාරිය වේ.

අ) පසුබිම

පි.ව.මා. ව්‍යාපෘතිය පි.ව.මා. අදියර I (දකුණු කොටස), පි.ව.මා. ව්‍යාපෘතිය - අදියර II (උතුරු කොටස I) හා පි.ව.මා ව්‍යාපෘතිය - අදියර III (උතුරු කොටස II වශයෙන් ක්‍රියාත්මක කෙරේ.

පි.ව.මා. - දකුණු කොටස

මෙම කොටස A4 ජාතික මහාමාර්ගය සමඟ කඩුවෙල සිට කොට්ටාව අන්තර් මාරුව දක්වා කි.මී. 11.0කි. ජපාසනි අරමුදල් සැපයූ මෙම කොටස 2014 මාර්තු මස මහජනයා සඳහා විවෘත කරන ලදි.

පි.ව.මා. - උතුරු කොටස I (OCH-NS I)

කඩවත සිට කඩුවෙල දක්වා මෙම කොටස කි.මී. 8.9 කි. ජපාසනි අරමුදල් සැපයූ මෙම කොටස 2015 සැප්තැම්බර් මාසයේදි මහජනයා සඳහා විවෘත කරනු ලැබිය.

පි.ව.මා. - උතුරු කොටස II (OCH-NS II)

මෙම කොටස කො.ක.අ. කෙරවලපිටිය අන්තර් මාරුවේ සිට කඩවත අන්තර් මාරුව දක්වා කි.මී.9.628කි. මා.සං.අ. විසින්, ව්‍යුහයන්, මෘදු බිම් සැකසීම හා ගාස්තු පද්ධතිය හැර විස්තරාත්මක ඉංජිනේරු සැලසුම් ක්‍රියාත්මක කරන ලදි. ව්‍යුහයන් වෙනුවෙන් මා.සං.අ. විසින්, සංකල්ප සැලසුම් පමණක් සිදු කරන ලදි. ශ්‍රී ලං ර විසින්, 2014 සැප්තැම්බර් 16 දින චීන එක්සිම් බැංකුව සමඟ සිවිල් වැඩ කොන්ත්‍රාත්තුව සඳහා ණය ගිවිසුම අත්සන් තබනු ලැබීය. පි.ව.මා. ව්‍යාපෘතියේ III අදියර ඉදි කිරීමේ සිවිල් වැඩ කොන්ත්‍රාත්තුව සඳහා අරමුදල් සැපයීමට ශ්‍රීලංර චීන මෙටලජිකල් කෝපරේෂන් සමාගම සමඟ සිවිල් වැඩ කොන්ත්‍රාත් ගිවිසුම 2013 පෙබරවාරි 22 දින අත්සන් තබන ලදි.

ව්‍යාපෘතියේ කොන්ත්‍රාත් මුදල රු. මිලියන 66.7 ක් වන අතර, ප්‍රමාණ ගණනය කර ගෙවීම් කිරීමේ පදනම මත ව්‍යාපෘතිය ක්‍රියාත්මක කෙරේ. ව්‍යාපෘති කාලසීමාව මාස 42 කි.

ඇ) සිවිල් වැඩ කොන්ත්‍රාත්තුව

කොන්ත්‍රාත්කරු වන චී.මෙ.කො. සමාගම 2014 අගෝස්තු මාසයේදි සම්පත් මෙහෙයවන ලදි. දැනට චී.මෙ.කො. සමාගම පහත සඳහන් වැඩවල නිරත වේ. ආරම්භක දිනය නිල වශයෙන් 2016.01.01 ලෙස දන්වනු ලැබීය.

- ව්‍යුහාත්මක සැලසුම්
- සේවා මාර්ගය ඉදිකිරීම
- කෙරවලපිටිය අන්තර් මාරු ප්‍රදේශය සඳහා වැඩ වේදිකාව පිළියෙල කිරීම
- කෙරවලපිටියෙහි ඉදිකිරීම් බොරලු සංයුක්ත කොට ගොනු කිරීම.

පි.ව.මා.-උ.කො. II ව්‍යාපෘතියේ ප්‍ර.බි. ගණනය හා ගෙවීම කරන වර්ගයේ කොන්ත්‍රාත්තුවකි. ව්‍යාපෘතිය FIDIC කොන්ත්‍රාත් කොන්දේසි (හතරවැනි මුද්‍රණය 1987) යටතේ ක්‍රියාත්මක කෙරේ.

ඇ) ඉදිකිරීම් අධීක්ෂණය

සීමාසහිත තරඟකාරී ලංසු කැඳවීම මගින් උපදේශකයන් තෝරා ගනු ලැබේ. තෝරාගත් උපදේශකයන් වන්නේ රිසෝස් ඩිවලොප්මන්ට් කන්සල්ටන්ට් (RDC) හා ඊසිඑල් - එම්ජී උපදේශක පුද්ගලික සමාගමයි. උපදේශක කොන්ත්‍රාත් මුදල රු.963,609,900.00 හා එ.ජ.ඩො.4,745,796.00 කි. කොන්ත්‍රාත්කරු විසින් 2014 ඔක්තොම්බර් මාසයේදි සම්පත් මෙහෙයවීම සිදු කරන ලදි. කෙසේ නමුත් 2014 හා 2015 වර්ෂවල සීමාසහිත කාර්ය මණ්ඩලයක් පමණක් මෙහෙය වන ලදි.

5.4.3.2 කාර්යයන්වල ප්‍රගතිය

අංකය	විස්තරය	ඇස්තමේන්තු පිරිවැය රු.මිලි.	2014 අවසානයේ සමුච්චිත වියදම රු.මිලි.	2014 දෙසැම්බර් වන විට භෞතික ප්‍රගතිය (%)	2015 ප්‍රතිපාදන රු.මිලි.	2015 වර්ෂයේ වියදම රු. මිලි.	2015 දෙසැම්බර් වන විට සමුච්චිත ප්‍රගතිය (%)
1	ඉඩම් අත්පත්කර ගැනීම	6500.0	3970.676	94.6	824.0	824.0	95.8
2	සිවිල් වැඩ කොන්ත්‍රාත්තුව	66690.0	0	0	12193.5	5321.219	0
3	අධික්ෂණ උපදේශකත්වය	1592.0	182.266	7.1	250	114.751	27.1
4	ව්‍යා.ක.ඒ. වියදම, මිණුම් ක්ෂේත්‍ර පරීක්ෂණ	1118.0	793.13	44.2	65.5	51.775	63.4
	එකතුව	**75900.0**	**4946.072**		**13,333.0**	**6311.745**	

5.4.3.3 සිවිල් වැඩ කොන්ත්‍රාත්තුවේ ප්‍රගතිය

මාර්ග කොටස කි.මී.	දිග කි.මී.	තා.ඇ.ක. රු.මිලි.	ආරම්භක දිනය	නිම කිරීමට අපේක්ෂිත දිනය	2014 දක්වා ප්‍රගතිය	2014 දක්වා වියදම	2015 අවසානයේ ප්‍රගතිය	2015 තුල වියදම රු.මිලි.
0-9.628	9.628	66,690	01.01.2016	30.06.2019	නොමැත	නොමැත	නොමැත	5321.219

5.4.3.4 සීමා කිරීම්

ව්‍යාපෘතියේ කොන්ත්‍රාත් මුදල එ.ජ.ඩො. **520.4** ක් වන අතර චීන එක්සිම් බැංකුවේ ණය මුදල එ.ජ.ඩො. මිලියන **494.04** කි. (කොන්ත්‍රාත් මුදලෙන් **95 %** කි).

අත්තිකාරම් වලින් ප්‍රථම භාගය කොන්ත්‍රාත්කරුට ගෙවීම (කොන්ත්‍රාත් මුදලින් **7.5 %**) 2015.12.30 දින සිදු කරන ලදි. ඉන්පසුව වැඩ ආරම්භ කිරීමේ දැන්වීම සේව්‍යයා විසින් 2016.01.01 දින නිකුත් කෙරිණි.

2015.12.31 දිනට දින ඇති ඉඩම් අත්පත් කර ගැනීමේ වවුචරපත් වල වටිනාකම රු.මී. **537.26** කි. ඉඩම් අත්පත්කර ගැනීම සඳහා 2016 වර්ෂයේ ප්‍රතිපාදන රු.මිලි. **1000.00** කි. අත ඇති වවුචරපත් වර්ෂයේ මුල්

කොටස තුල ගෙවිය හැකි වුවහොත්, මාර්ග කොටසේ 2 වන කොටස කොන්ත්‍රාත් ගිවිසුමට අනුව 2016.07.01 දිනට භාර දීමට හැකි වනු ඇත.



කෙරවලපිටිය අන්තර් මාරු
ප්‍රදේශයේ සංයුක්ත බොරලු ගොනු



4 වැනි කි.මී. යේ සේවා
මාර්ගයේ අලුත්වැඩියාවන්




කෙරවලපිටිය - අධි ශක්ති
කොන්ක්‍රීට් ටැම් බැස්සවීම.

5.5 මධ්‍යම අධිවේගී මාර්ග ව්‍යාපෘතිය

මධ්‍යම අධිවේගී මාර්ග ව්‍යාපෘතිය පිටත වටරවුම් මාර්ගයේ කඩවත සිට ගම්පහ, මීරිගම, පොතුහැර, කුරුණෑගල, මැල්සිරිපුර, ගලේවෙල සිට දඹුල්ල දක්වා යමින් පොතුහැර හරහා මහනුවරට අධිවේගී මාර්ග සම්බන්ධතාවය සහිතව රටේ උතුරු ප්‍රදේශයට අධිවේගී මාර්ග සබඳතාවය සපයනු ලබයි.

සිතියම 12: මධ්‍යම අධිවේගී මාර්ග ව්‍යාපෘතිය



5.5.1 විස්තරය

ආරම්භක අදියරේදී ශ්‍රී ලංකා රජය විසින් ශ්‍රී ලංකාවේ යෝජිත අධිවේගී මාර්ග ජාලයේ කොටසක් ලෙස උතුරු අධිවේගී මාර්ගය පිටත වටරවුම් මාර්ගයේ එඬේරමුල්ල පද්ධති අන්තර්මාරුව හා කොළඹ - කටුනායක අධිවේගී මාර්ගයේ සිට ගම්පහ, මීරිගම, පොතුහැර, කුරුණෑගල, මැල්සිරිපුර, ගලේවෙල සිට දඹුල්ල දක්වාද පොතුහැර, රඹුක්කන, ගලගෙදර හරහා මහනුවරට අධිවේගී සම්බන්ධතාවය සහිතව, උතුරු අධිවේගී මාර්ගය ඉදි කිරීමට තීරණය කරන ලදි. උතුරු අධිවේගී මාර්ගය ක්‍රියාත්මක කරනු සඳහා එය කොන්ත්‍රාත් යෝජනාවලි 10 ක බෙදන ලදි.

කෙසේ නමුත් ශ්‍රී ලංකා රජය මැතකදී, කොළඹ - මහනුවර විකල්ප මහා මාර්ගය සඳහා යෝජනා කළ පරිදි කඩවත පිටත වටරවුම් මාර්ගයෙන් ආරම්භ කිරීමට තීරණය කරනු ලැබීය. අළුතින් යෝජිත අධිවේගී මාර්ගය පූර්වයෙන් යෝජිත අධිවේගී මාර්ග දෙකක එකතුවකි. උදා: කඩවත සිට ගම්පහ දක්වා කොටස පූර්වයෙන් යෝජිත කොළඹ - මහනුවර විකල්ප මහා මාර්ගයේ එකම එකෙල්ල අනුගමනය කරන අතර, ගම්පහට ඔබ්බෙන් වූ මාර්ග පථය වූ උතුරු අධිවේගී මාර්ග පථයයි. මෙම නව මාර්ග ප්‍රවේශය මධ්‍යම අධිවේගී මාර්ගය ලෙස නම්කර තිබේ. (සිතියම බලන්න - 1 ඇමුණුම)

ශ්‍රී ලංකා රජයවිසින් කල් තබා ඉදිකිරීම් කිරීමට මූලික පියවර ගන්නා ලද අතර, වගු අංක 01 දැක්වෙන පරිදි විදේශ ආයෝජකයන් / ශ්‍රී ලංකා රජය අරමුදල්වල පැවැත්ම, ඉදිකිරීම් පිරිවැය, ඉදිකිරීම් සංකීර්ණතා හා මෙම කොටස්වල තාක්ෂණික කරුණු පදනම් කරගෙන අධිවේගී මාර්ග කොටස් 4කට බෙදන ලදි.

5.5.2 මාර්ග කොටසේ සාරාංශය

කොටස	විස්තරය	දම්වැල් ගණන	දිග / කි.මී.
I	කඩවත - මීරිගම	0+000 - 37+090	37
II	මීරිගම - කුරුණෑගල	37+090 - 76+810	40
III	පොතුහැර - ගලගෙදර	0+000 - 32+500	32.5
IV	කුරුණෑගල - දඹුල්ල	76+810 - 136+960	60

5.5.3 ව්‍යාපෘතියේ තත්ත්වය (පොදු) 2015 අවසානය වන විට

විෂය අංකය	විස්තරය	ප්‍රගතිය	සටහන්
1	ශක්‍යතා අධ්‍යයනය	ශක්‍යතා අධ්‍යයන දෙකක් ඒකාබද්ධ කිරීම (CKAH හා උ.අ.මා.) සිදු කරමින් පවතී. 2016.01.04 දින නිම කෙරේ.	මොරටුව විශ්ව විද්‍යාලය
2	පාරිසරික බලපෑම් තක්සේරුව	ම.අ.මා.යේ පූර්ව අධ්‍යයනයක් එක් කොට ප.බ.ක. යෙදීම අවශ්‍ය වේ. එය සිදු කෙරෙමින් පවතින අතර 2016.01.09 දින නිම කිරීමට නියමිතය.	ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලය
3	ප්‍රතිස්ථාපන ක්‍රියාකාරී සැලැස්ම	නිම කෙරිණි.	ප්‍රාථමික සැලසුම් පදනම්ව
4	ජල විද්‍යා අධ්‍යයනය	විස්තරාත්මක සැලසුම් 2016.04.15 දිනට නිම කිරීම සඳහා විස්තීර්ණ ජල විද්‍යා අධ්‍යයනයක් සිදු කෙරෙමින් පවතී. කෙසේ නමුත් තීරණාත්මක කොටස් සඳහා විස්තරාත්මක සැලසුම් වලට අවශ්‍ය සැලසුම් දත්ත හැකිතාක් ඉක්මනින් සපයනු ඇත.	ශ්‍රී ලංකා ඉඩම් ගොඩ කිරීමේ හා සංවර්ධන සංස්ථාව
5	ප්‍රාථමික සැලසුම්	නිම කෙරිණි	මා.සං.අ. යේ මහනුවර සැලසුම් කාර්යාලයේදි සිදු කරන ලදි.
6	විස්තරාත්මක සැලසුම්	සමස්ත ප්‍රගතිය (25%).	මා.සං.අ. යේ මහනුවර සැලසුම් කාර්යාලයේදි සිදු කෙරේ.
7	ඉඩම් අත්පත්කර ගැනීම්	සිදු කෙරෙමින් පවතී.	ප්‍රාථමික සැලසුම් මත පදනම්ව

5.5.3.1 යෝජනාවලි සාරාංශය II කොටස – මීරිගම - කුරුණෑගල (පොතුහැර - ගලගෙදර කි.මී.32.5)

පහත දැක්වෙන පරිදි ඉදිකිරීමේ පහසුව සඳහා මධ්‍යම අධිවේගී මාර්ගය කොටස් 4 කට බෙදන ලදි.

යෝජනාවලිය	දම්වැල් ප්‍රමාණය	විස්තර	දිග
I	37+090 – 49+04	මීරිගම - පැලවත්ත	11.95
II	49+04- 61+38-	පැලවත්ත - පොතුහැර	12.34
III	61+38-77+00	පොතුහැර - කුරුණෑගල	15.62
IV	0+00 - 9+300	අඹේපුස්ස සම්බන්ධතාව	9.3

II කොටස සඳහා ඉඩම් අත්පත් කර ගැනීම පිළිබඳ තත්ත්වය.

2015 අවසානය වන විට පොදුවේ ඉඩම් අත්පත් කර ගැනීම හා ප්‍රතිස්ථාපන වැඩ සිදු කෙරෙමින් පැවතිණි. පහත සඳහන් වගුව ම.අ.මා. II සඳහා ඉඩම් අත්පත් කර ගැනීමේ හා ප්‍රතිස්ථාපනය කිරීමේ තත්ත්වය පෙන්වා දෙයි.

අනු අංකය	කාර්යය	2015-12-15 දිනට ප්‍රගතිය (කි.මී.)
1	මාර්ග අයිතිය පිළිබඳ ඇදීම් පිළියෙල කිරීම (කි.මී.)	31.290
2	මිනුම් දෙපාර්තමේන්තුව විසින් අනුරේඛනය පිළියෙල කිරීම (කි.මී.)	9.80
3	2 කොටස	3.6
4	4 කොටසේ ක්‍රියාවලිය	3.6

5.5.3.2 යෝජනාවලි සාරාංශය - III කොටස - පොතුහැර - ගලගෙදර (කි.මී. 32.5)

පහත සඳහන් පරිදි මධ්‍යම අධිවේගී මාර්ගයේ 3 කොටස ඉදිකිරීමේ පහසුව සඳහා යෝජනාවලි 5කට බෙදන ලදි.

යෝජනාවලිය	දම්වැල් ගණන	විස්තරය	දිග
I	0+000 - 6+700	පොතුහැර - වල්ගම්මුල්ල	6.7
II	6+700 - 14+100	වල්ගම්මුල්ල - කොටවැල්ල	7.4
III	14+100-18+500	කොටවැල්ල - පරපේ	4.4
IV	18+500 - 6+900	පරපේ - ගලබාව	8.4
V	26+900 - 32+500	ගලබාව - ගලගෙදර	5.6

III කොටස සඳහා ඉඩම් අත්පත් කර ගැනීමේ තත්ත්වය.

පොදුවේ 2015 වර්ෂය අවසාන වන විට ඉඩම් අත්පත් කර ගැනීම හා ප්‍රතිස්ථාපන සිදු කෙරෙමින් පැවතිනි. පහත සඳහන් වගුව ම.අ.මා. III ඉඩම් අත්පත් කර ගැනීමේ හා ප්‍රතිස්ථාපනයේ ප්‍රගති තත්ත්වය පෙන්වා දෙයි.

අනු අංකය	කාර්යය	2015-12-15 වන විට ප්‍රගතිය (කි.මී.)
1	මා.අ. ඇදීම් පිළියෙල කිරීම (කි.මී.)	30.01
2	මිනුම් දෙපාර්තමේන්තුව විසින් අනුරේඛනය පිළියෙල කිරීම (කි.මී.)	24.66
3	2 කොටස	6.77
4	ඉඩම් අමාත්‍යාංශය විසින් 38 A වගන්තිය, ගැසට් නිවේදනය හා 5 වන වගන්ති ගැසට් නිවේදනය පළ කිරීම (කි.මී.)	1.40
5	ප්‍රා.ලේ. විසින් සන්තකය අත් කර ගැනීම (කි.මී.)	1.09
6	ප්‍රා.ලේ. විසින් 7 වන වගන්ති නියෝගය දැන්වීම (කි.මී.)	1.09
7	7 වන වගන්තිය අනුව ප්‍රා.ලේ. ගේ පරීක්ෂණය (හිමිකම් පරීක්ෂණය) හා අංක 10(I) නියෝගය නිකුත් කිරීම	0.00
8	තක්සේරු දෙපාර්තමේන්තුවේ තක්සේරු කිරීම.	0.00
9	17 නියෝගය නිකුත් කිරීම හා වන්දි ගෙවීම	0.00

5.5.4 2015 වර්ෂය සඳහා මධ්‍යම අධිවේගී මාර්ග ව්‍යාපෘතියේ ප්‍රගතිය පිළිබඳ සාරාංශය (පොදු)

අධිවේගී මාර්ගයේ නම	දිග / (කි.මී.)	තා.ඇ.ක. (රු.මිලියන)	ආරම්භක දිනය	නිම කිරීමට අපේක්ෂිත දිනය	2014 දක්වා ප්‍රගතිය	2015 දක්වා වියදම (රු.මිලි.)	2015 අවසානයේ ප්‍රගතිය	2015 තුල වියදම
මධ්‍යම අධිවේගී මාර්ගය III කොටස	32.5							
ව්‍යා.ක.ඒ. නඩත්තුව		1,327				95.852		57.574
ශක්‍යතා අධ්‍යයනය විදේශ උපදේශකයන් I, II, III හා IV වැනි කොටස්.		1,530	2012-09-10	2014-12-31	100%	1,327	100%	නැත
ශක්‍යතා අධ්‍යයනය (ටො.වි.), පා.බ.ක. (ජ වි) හා ජල විද්‍යා අධ්‍යයනය (ශ්‍රී.ලං.ඉ.ගො.සං.ස.)		90.5	2015-09-01	2016-03-15	0%	5.232	80%	5.232
III වන කොටසේ ඉඩම් අත්පත් කර ගැනීම හා ප්‍රතිස්ථාපනය		8,125	2015-01-01	2016-12-31	0%	30.885	7.5%	12.794
III කොටසේ සිවිල් ඉදි කිරීම		120,000	2016-04-01	2019-03-31	0%	නැත	0%	නැත
උපදේශකත්වය (ඉදිකිරීම් අධීක්ෂණය)		2,000	2016-03-14	2019-03-31	0%	නැත	0%	නැත

5.5.5 ප්‍රගතියට සීමාවන් හා අනුගමනය කරන ලද හා යෝජිත ප්‍රතිකර්ම පියවර.

5.5.5.1 II කොටසේ ප්‍රගතියට සීමාවන් හා අනුගමනය කරන ලද යෝජික ප්‍රතිකර්ම පියවර.

- 2016 ජනවාරි මාසයේ නිම කිරීමට නියමිතව තිබුණු ශකාාතා අධාායයන නිම කිරීමට පියවර ගන්නා ලදි.
- 2016 වර්ෂයේ මාර්තු මස පා.ඛ.ත. නිම කිරීමට පියවර ගන්නා ලදි.
- විස්තරාත්මක ජල විදාා අධාායනය 2016 අප්‍රේල් මස නිම කිරීමට පියවර ගනු ලැබිය.
- වර්තමාන වැඩ සටහනට අනුව ඉඩම් අත්පත්කර ගැනීමේ වැඩ 2016 දී 100 % නිම කිරීමට නියමිත අතර රු. බිලියන 12.5 අවශ්‍ය කෙරේ.

5.5.5.2.1 III කොටසේ ප්‍රගතියට සීමාවන් හා අනුගමනය කළ සහ යෝජිත ප්‍රතිකර්ම පියවර.

- 2016 ජනවාරි මස නිමකළ යුතු ශකාාතා අධාායනය නිම කිරීමට පියවර ගෙන ඇත..
- 2016 වර්ෂයේ මාර්තු මස පා.ඛ.ත. නිම කිරීමට පියවර ගන්නා ලදි.
- විස්තරාත්මක ජල විදාා අධාායනය 2016 අප්‍රේල් මස නිම කිරීමට පියවර ගනු ලැබිය.
- වර්තමාන වැඩ සටහනට අනුව 2016 වසරේ අවසානයේ 100 % ඉඩම් අත්පත් කර ගැනීමේ වැඩ නිම කළ යුතු අතර, වන්දි ගෙවීම සඳහා රු.බිලියන 8.2 ක් අවශ්‍ය කෙරේ. මධ්‍යම අධිවේගී මාර්ග II කොටසේ ඉඩම් අත්පත් කර ගැනීම වෙනුවෙන් 2016 ක්‍රියාකාරී සැලැස්මේ ඉඩම් අත්පත් කර ගැනීම සඳහා බිලියන 5.7 ක් ඇතුළත් කර තිබේ.

5.6 විශේෂ ව්‍යාපෘති කළමනාකරණය

විශේෂ ව්‍යාපෘති කළමනාකරණ ඒකකය, ජපන් ජාත්‍යන්තර සහයෝගිතා නියෝජිතායතනය හා අරාබි ආර්ථික සංවර්ධනය සඳහා කුවෙට් අරමුදල විසින් මූල්‍යයනය කරන ලද ව්‍යාපෘති ක්‍රියාත්මක කරනු ලබයි. දැනට වි.ව්‍යා.ඒ. විසින් බෙස්ලයින් මාර්ගයේ දක්ෂිණ දිගුව III වැනි අදියර) (කි.මී. 1), ජාතික මාර්ග ජාලයේ ප්‍රධාන පාලම් ඉදිකිරීමේ ව්‍යාපෘතිය, පාලම් 25 ක් ප්‍රතිනිර්මාණය කිරීමේ ව්‍යාපෘතිය හා ශ්‍රී ලංකාවේ අධිවේගි මාර්ග සඳහා නැණවත් ප්‍රවාහන පද්ධතියක් වර්ධනය කිරීමේ ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේ යෙදෙයි.

5.6.1 හැඳින්වීම

දැනට විශේෂ ව්‍යාපෘති කළමනාකරණ ව්‍යාපෘතිය විසින්, ජපන් ජාත්‍යන්තර සහයෝගිතා නියෝජිතායනය හා අරාබි ආර්ථික සංවර්ධනය සඳහා කුවේට් අරමුදල විසින් මූල්‍යයනය කරන ලද ව්‍යාපෘති ක්‍රියාත්මක කරනු ලබයි.

5.6.2 2015 වර්ෂය තුල විශේෂ ව්‍යාපෘති කළමනාකරණ අංශය විසින් මෙහෙයවන සහ ක්‍රියාත්මක කෙරෙමින් පවතින හා නිමකළ ව්‍යාපෘතීන්.

අ) 2015 වර්ෂය අවසාන වන විට ක්‍රියාත්මක වෙමින් පවතින මාර්ග හා පාලම් ව්‍යාපෘතීන්:

- බෙස්ලයින් මාර්ගයේ දකුණු දිගුව ඉදිකිරීම (III අදියර)
- ජපාසනි- ද.ප්‍ර.දි.ව්‍යා. ණය යටතේ ජාතික මාර්ග ජාලයේ ප්‍රධාන පාලම් ඉදිකිරීමේ ව්‍යාපෘතිය ව්‍යාපෘතිය
- අ.ස.ස.කු.අ. ණය යටතේ පාලම් 25 ක් ප්‍රතිනිර්මාණය කිරීම

ආ) 2015 වර්ෂය තුල නිම කළ ව්‍යාපෘති :

- ශ්‍රී ලංකාවේ අධිවේගි මාර්ග සඳහා නැණවත් ප්‍රවාහන පද්ධතියක් සංවර්ධනය කිරීමේ ව්‍යාපෘතිය

5.6.2.1 බෙස්ලයින් මාර්ගයේ දකුණු දිගුව ඉදිකිරීමේ ව්‍යාපෘතිය - III වන අදියර

යෝජිත මාර්ගය කි.මී. 0.86 ක් දිග කිරුළපන මංසන්ධියේ උඩිස් මාරුවක් හා බලපොකුණ මාර්ගයේ උමං මාර්ගයක් සහිතව, මංතීරු 3 ක ද්විත්ව මාර්ගයක් ලෙස ඉදි කෙරේ. මෙහි ඉඩම් අත්පත්කර ගැනීම මහනගර හා බස්නාහිර සංවර්ධන අමාත්‍යාංශයේ ඉල්ලීම මත 2015 සැප්තැම්බර් මස සිට අත්හිටුවා ඇත. ඉඩම් කට්ටි 146 ක් (දෙහිවල ප්‍රා.ලේ. කොට්ඨාශයේ 11 ක් හා තිඹිරිගස්යාය ප්‍රා.ලේ. කොට්ඨාශයේ 135) අත්පත්කර ගත යුතුව ඇති අතර, ඉඩම් කට්ටි 27 ක් දැනට අත්පත්කර ගෙන තිබේ.

ඉඩම් අත්පත්කර ගැනීමේ ප්‍රගතිය

1) තිඹිරිගස්යාය ප්‍රා.ලේ. කොට්ඨාශය :

දැනටමත් පවරාගෙන ඇති සංඛ්‍යාව	-	කට්ටි 11
සන්තකය මා.සං.අ. වෙත භාරදුන්	-	කට්ටි 16
38A වගන්තිය ප්‍රකාශයට පත්කළ	-	කට්ටි 108

2) දෙහිවල ප්‍රා.ලේ. කොට්ඨාශය

38 A වගන්තිය යටතේ ප්‍රකාශයට පත් කිරීමට ඇති සංඛ්‍යාව - කට්ටි 11

2015 වර්ෂය අවසාන වන විට ඉඩම් අත්පත් කර ගැනීම සඳහා ගෙවන ලද මුදල රු. 524.85 කි.

5.6.2.2 ජාතික මාර්ග ජාලයේ ප්‍රධාන පාලම් ඉදිකිරීම් ව්‍යාපෘතිය (ජජාසනි පියවර ණය)

ණය ගිවිසුම 2015 මාර්තු 14 වන දින අත්සන් තබන ලද අතර ණය මුදල ජපන් ජාත්‍යන්තර සහයෝගිතා නියෝජිතායතනයවිසින් සැපයූ අරමුදල ජපන් යෙන් මිලියන 12,381 කි..

2013 දෙසැම්බර් 19 දින සී/ස. කන්සල්ටිං ඉංජිනියර්ස් ආර්කිටෙක්ස් ඇසෝසියේෂන් සමාගම සම්බන්ධ කර ගනිමින්, මා.සං.අ. හා ඔරියන්ටල් කන්සල්ටන්ට් සමාගම සමඟ උපදේශක සේවා ගිවිසුම අත්සන් තබන ලදි.

යෝජනාවලි 1 විෂය පථය – දකුණු පළාතේ පාලම් 10 ක් යළි ඉදිකිරීම.

යෝජනාවලි 2 විෂය පථය – උතුරු පළාතේ පාලම් 08 ක් යළි ඉදිකිරීම.

ව්‍යාපෘතියේ නම / මා.සං.අ. අංශය	කොන්ත්‍රාත් අංකය	කොටස	අරමුදල් නියෝජිතායතනය	කොන්ත්‍රාත් අගය (රු.මිලි)	ආරම්භක දිනය	නිම කරන දිනය	අද දක්වා සමුච්චිත වියදම(රු.මි)	සමුච්චිත භෞතික ප්‍රගතිය
ජාතික මාර්ග ජාලයේ ප්‍රධාන පාලම් ඉදිකිරීමේ ව්‍යාපෘතිය ණය අංක: **SL-P1 08;** ණය මුදල ජපන් යෙන් මිලියන 12,381	**RDA/SPMU/MBCP/C1** (උපදේශක සේවාව)		ජපන් ජාත්‍යන්තර සහයෝගිතා නියෝජිත ආයතනය ණය අංක **SL-P108**				2,248.64	
	RDA/SPMU/MBCP/C2 (සිවිල් වැඩ - යෝජනාවලිය 1)	කොළඹෙ ගාල්ල- හම්බන්තොට-වැල්ලවාය මාර්ගයේ **(AA002)** අංක 148/1 පොල්අතුමෝදර පාලම		**1155 (JPY 611,176,800 482,688,000)**	දෙසැ. 13	නොවැ. 18		යෝජනාවලි 2 සඳහා එක් ලංසුවක් ලැබුනු අතර ලේ.ප.ප්‍ර.ක., තාඇක විසින් ඇගයීමෙන් පසුව ප්‍රතික්ෂේප කර යළි ලංසු කැඳවීම නිර්දේශ කරන ලදි. ඒ අනුව ලංසු කැඳවීම 2015 නොවැ. 15 ප්‍රසිද්ධ කල අතර ටෙන්ඩර් නිකුත් කිරීම 2015.11.16 දින ආරම්භ කර 2016 ජනවාරි 21 දින ලංසු භාර ගැනීම අවසන් කරන ලදි.
		කොළඹ - ගාල්ල - හම්බන්තොට-වැල්ලවාය මාර්ගයේ **(AA002)** අංක 148/2 පොල්අතුමෝදර පෙට්ටි පාලම		7098.09				කොන්ත්‍රාත් ගිවිසුම අත්සන් කිරීම 2015 පෙබ. 19 දින වැඩ ආරම්භ කිරීම 2015 මාර්තු 20 සමුච්චිත භෞතික ප්‍රගතිය 15.8%
		කොළඹ - ගාල්ල - හම්බන්තොට-වැල්ලවාය මාර්ගයේ **(AA002)** අංක 138/4 ගොයියාපාන පාලම						
		කොළඹ - ගාල්ල - හම්බන්තොට-වැල්ලවාය මාර්ගයේ **(AA002)** අංක 133/2 කහටුව (පොල් ඔය) පාලම						
		කොළඹ - ගාල්ල - හම්බන්තොට-වැල්ලවාය මාර්ගයේ **(AA002)** අංක 148/2 පොල්අතුමෝදර පෙට්ටි පාලම						
		පැලෑන-පොල්වත්ත අංක 1/1 පොල්වත්ත පාලම						
		කොළඹෙ ගාල්ල- හම්බන්තොට-වැල්ලවාය මාර්ගයේ **(AA002)** අංක 166/1 වැල්ලමඩම පාලම						
		වැලිගම - කනංකේ මාර්ගයේ **(B 465)** කොලේදුණ්ඩ පාලම						
		ගාල්ල-බද්දේගම මාර්ගයේ **(B 465)** කොලේදුණ්ඩ පාලම						
		ගාල්ල-බද්දේගම මාර්ගයේ **(B** 128) 15/2 කිහිඹුඇල පාලම						
		වැලිගම-තෙලිජ්ජවිල මාර්ගයේ (B 466) 4/1 දෙණිපිටිය පාලම						
		හක්මන-මීඇල්ල - තලගංවඩුව මාර්ගයේ (B 142) 4/1 දෙනගම පාලම						

5.6.2.3 පාලම් 25 ක් යළි ඉදිකිරීමේ ව්‍යාපෘතිය (අ.ස.ස.කු.අ. ණය)

2015 වර්ෂය තුල පහත සඳහන් වැඩ ඉටු කරන ලදි.

උපදේශක සේවා -

2015. ජූලි 10 දින මා.සං.අ. සහ කුවෙටිහි අබුල් ජෙබයින් කන්සල්ටිං ඔෆිස් සමාගම අතර ඉන්පොටෙක්ස් අයිඩියාස් පුද්. සමාගම නියෝජ්‍ය උපදේශකයන් වශයෙන් උපදේශක සේවා ගිවිසුම අත්සන් තබන ලදි. කොන්ත්‍රාත් අත්හිටුවීමේ නිවේදනය උපදේශකයන් වෙත නිකුත් කරන ලදි.

පාලම් 25 ක් යළි ඉදිකිරීමේ සිවිල් වැඩ කොන්ත්‍රාත්තුව යෝජනාවලි තුනකට බෙදනු ලැබීය. උදා: යෝජනාවලි 1,2 හා 3 වශයෙනි.

ව්‍යාපෘතියේ නම / මා.සං.අ. අංශය	කොන්ත්‍රාත් අංකය	කොටස	අරමුදල් නියෝජිතායතනය	කොන්ත්‍රාත් අගය (රු.මිලි)	ආරම්භක දිනය	නිම කරන දිනය	අද දක්වා සමුච්චිත වියදම (රු. මිලි)	සමුච්චිත භෞතික ප්‍රගතිය
පාලම් 25 ක් යළි ඉදිකිරීමේ ව්‍යාපෘතිය ණය අංක: 886 ණය මුදල කු.ඩී. මිලියන 10 කු.ඩී: කුවෙට දිනාර්							112.36	
	උපදේශක සේවා			**275.66**	ජූලි 15	2018 දෙසැ.		උපදේශක ගිවිසුම 2015 ජූලි 10 දින අත්සන් කරන ලදි.
	RDA/SPMU/KFAED/CW-P 1 (සිවිල් වැඩ - යෝජනාවලිය 1)	ගලගෙදර-හොරණ මාර්ග **(B123)** අංක 14/3 පාලම	අරාබි සංවර්ධනය සඳහා කුවෙට අරමුදල **(KFAED)** ණය අංක **KF-886**	987.16	මැයි 15	2017 මැයි		සිවිල් වැඩ යෝජනාවලි 1 2015 මාර්තු 26 දින ප්‍රදානය කරන ලදි. 2015 ජූලි 20 දින ගිවිසුම අත්සන් කරන ලදි. කොන්ත්‍රාත්කරු වැඩ බිමට සම්පත් මෙහෙයුම් කරන අතර ප්‍රාථමික වැඩ හා පිරි සැකසුම් සිදු කෙරෙමින් පවතී.
		ගලගෙදර-හොරණ මාර්ග **(B123)** අංක 14/8 පාලම						
		කෑගල්ල-බුලන්කොහුපිටිය-කරවනැල්ල මාර්ගයේ **(AA021)** අංක **11/4** පාලම						
		අම්පිලන්තුරේ-චිරමුනෙයි මාර්ගයේ **(B018)** අංක **10/2** පාලම						
		තංගල්ල-චිරකැටිය මාර්ගයේ **(B410)** අංක **2/2** පාලම						
		තංගල්ල-චිරකැටිය මාර්ගයේ **(B410)** අංක **2/3** පාලම						
		වෙයන්ගොඩ-රුවන්වැල්ල මාර්ගයේ **(B445)** අංක **32/1** පාලම						

5.6.2.4 ශ්‍රී ලංකාවේ අධිවේගී මාර්ග සඳහා නැණවත් ප්‍රවාහන පද්ධතියක් සංවර්ධනය කිරීම (ජපාසනි ප්‍රදානය)

2013 මාර්තු 18 දින ශ්‍රී ලංකා රජය සහ ජපන් රජය අතර ජපන් යෙන් මිලියන 940 ක් සඳහා වන ප්‍රදාන ගිවිසුම අත්සන් තබන ලදි.

උපදේශක සේවා ගිවිසුම, 2013 අප්‍රේල් 29 දින මා.සං.අ. සහ කොන්සෝටියම් ඔෆ් ඔරියන්ටල් කන්සල්ටන්ට් සහ නිපොන් එක්ස්ප්‍රෙස්වේ කම්පැනි ලිමිටඩ් අතර අත්සන් තබනු ලැබීය.

කොන්ත්‍රාත් ගිවිසුම මා.සං.අ. හා ජපන් මිට්සුබිෂි හෙවි ඉන්ඩස්ට්‍රීස් ලිමිටඩ් සමාගම අතර 2013 නොවැම්බර් 29 දින අත්සන් තබන ලදි.

ව්‍යාපෘති විෂය පථයට පිටත වටරවුම් මාර්ගයේ හා දක්ෂිණ අධිවේගී මාර්ගයේ කඩුවෙල සිට ගොඩගම දක්වා විවලා්‍ය පණිවුඩ සංඥා පුවරු වාහන ගණකයන්, වැසි මානක, සවි කිරීම අයත් වන අතර දකුණු අධිවේගී මාර්ගයේ සේවා ප්‍රදේශවල රථවාහන තොරතුරු පුවරු සවි කරන ලදි.

2015 වර්ෂය තුල ප්‍රගතිය :

ව්‍යාපෘතිය 2015 ජූලි මස නිම කරන ලදි (100%).

පහත සඳහන් උපකරණ ස්ථාපනය කරනු ලැබීය.

- විවලන පණිවුඩ සංඥා පුවරු (A වර්ගය) : 21
- විවලන පණිවුඩ සංඥා පුවරු (B වර්ගය) : 10
- රථවාහන ගණකයන් : 20
- වැසි මානක : 11
- ගැලනිගම රථවාහන පාලන මධ්‍යස්ථානයේ ආවේක්ෂණ උපකරණ.

ව්‍යාපෘතියේ නම	කොටස	අරමුදල් ආයතනය	කොන්ත්‍රාත් අගය (රු.මිලි.)	ආරම්භක දිනය	නිමකරන දිනය	අද දක්වා සමුච්චිත වියදම (රු.මිලි)	සමුච්චිත භෞතික ප්‍රගතිය
නැණවත් ප්‍රවාහන පද්ධතියක් සංවර්ධනය කිරීමේ ව්‍යාපෘතිය ප්‍රදාන ගිවිසුම අංකය : 1260740 ප්‍රදාන මුදල : ජ.යෙන් මිලියන 940	කොටටාව සිට ගෙඩගම දක්වා	ජපන් ජාත්‍යන්තර සහායෝගිතා නියෝජිත ආයතනය	900.20 (ජ.යෙ.මිලි. 818.37) 68.22 (ජ.යෙ.මිලි. 62.02)	නොවැ. 18	ජූනි 15	1094.78	100%



අධිවේගී මාර්ගය සඳහා විචලන පණිවුඩ සංඥ පුවරුව



ප්‍රවේශ මාර්ගය සඳහා විචලන පණිවුඩ සංඥා පුවරුව



රථවාහන ගණකය



රථවාහන කවුළුව සඳහා *CCTV* කැමරාව



වර්ෂාපතන මානකය



ගැලනිගම රථවාහන පාලන මධ්‍යස්ථානය

5.7 විවිධ විදේශාධාර ව්‍යාපෘතිය

විවිධ විදේශාධාර ව්‍යාපෘතිය බොහෝ විට ද්විපාර්ශවීය නියෝජිතායතන වන විදේශාධාර ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම සඳහා 2000 වර්ෂයේදී පිහිටුවන ලදි. ආරම්භයේදී පැවති අරමුදල් නියෝජිතායතනය වූයේ කුවෙට් අරමුදලයි. දැනට මෙම අංශය ජාත්‍යන්තර සංවර්ධනය සඳහා ඔපෙක් අරමුදල, සංවර්ධනය සඳහා සවුදි අරමුදල / කොරියානු ආර්ථික සංවර්ධන සහයෝගිතා අරමුදල යන ප්‍රදාන ආයතන අරමුදල් සැපයූ ව්‍යාපෘති හා ප්‍රංශ රජයේ මූල්‍ය යෝජනාවලිය යටතේ පාලම් 46 ක් යළි ඉදි කිරීමේ ව්‍යාපෘතිය මෙහෙයවනු ලබයි. වි.වි.ආ.ව්‍යා. අංශය රටේ මාර්ග අංශයේ යටිතල ව්‍යුහ සංවර්ධනය සඳහා මෙම අරමුදල් කාර්යක්ෂම හා ඵලදායි ලෙස භාවිතා කිරීම සඳහා වගකීම දරයි.

5.7.1 2015 වර්ෂය තුල වි.වි.ආ.ව්‍යා. විසින් මෙහෙයවන ලද ව්‍යාපෘති.

2015 වර්ෂය තුල වි.වි.ආ.ව්‍යා. විසින් හැටන් නුවරඑළිය මාර්ගය (A007) පුනරුත්ථාපනය කිරීම, ප්‍රංශ රජයේ මූල්‍ය යෝජනාවලිය යටතේ පාලම් 46 ක් යළි ඉදිකිරීම, සංවර්ධනය සඳහා සවුදි අරමුදල් යටතේ මාර්ග ජාල සංවර්ධන ව්‍යාපෘතිය, ජාත්‍යන්තර සංවර්ධනය සඳහා ඔපෙක් අරමුදල යටතේ අරමුදල් සැපයූ ජාතික මාර්ග වැඩි දියුණු කිරීමේ ව්‍යාපෘතිය, ජාත්‍යන්තර සංවර්ධනය සඳහා ඔපෙක් අරමුදල විසින් අරමුදල් සැපයූ කොළඹ ජාතික මහාමාර්ග ව්‍යාපෘතිය යටතේ, මාර්ග පුනරුත්ථාපනය හා වැඩි දියුණු කිරීම සහ කොරියානු ආ.සං.ස.අ. අරමුදල් සැපයූ පාලම් පුනරුත්ථාපනය / ප්‍රතිනිර්මාණ ව්‍යාපෘතිය යන ව්‍යාපෘති මෙහෙයවනු ලැබීය. තවද සාමාවච්චතිවු - මුනයිවෙනයි මාර්ගයේ පිහිටි තට්ටුතුරෙයි පාලම (බහු කුටිර නල බෝක්කුව) ඉදිකිරීම සඳහා සසංඅ විසින් සපයන ලද ණය ශේෂය භාවිත කරන ලදි.

5.7.1.1 හැටන් - නුවරඑළිය මාර්ගය වැඩි දියුණු කිරීම.

හැටන් - නුවරඑළිය මාර්ගයේ කි.මී. 72+000 – 115+567 කොටස වැඩි දියුණු කිරීමේ ව්‍යාපෘතිය සඳහා ආර්ථික සංවර්ධන සහයෝගිතා, අරමුදල විසින් අරමුදල් සපයනු ලැබේ. මෙම ව්‍යාපෘතිය යටතේ වැඩි දියුණු කෙරෙන කොටස කි.මී. 79+500 අසල කොටගල උමං මාර්ගය (මී. 75) වන කි.මී. 109+100 අසල නානුඔය උමං මාර්ගය ඇතුළත්ව කි.මී. 35.6 කි. පහත සඳහන් වන්නේ හැටන් - නුවරඑළිය මාර්ගයේ (A007) වැඩි දියුණු කිරීමේදී අපේක්ෂිත අරමුණු වේ.

- ප්‍රාදේශීය ආර්ථික සංවර්ධනයට සහාය වීම.
- ගමන් වේලාව අඩු කිරීම.
- මධ්‍යම කඳුකරයේ මාර්ග ජාල කේන්ද්‍රයක් නිර්මාණය කිරීම
- ප්‍රවාහන සේවාවල තත්ත්වය වැඩි දියුණු කිරීම
- ආරක්ෂාකාරී සංචරණය ඉහළ නැංවීම.

කොටගල උමං මාර්ගය සහ නානුඔය උමං මාරුව ඇතුළු මාර්ගයේ ඉදිකිරීම් වැඩ (මුල් විෂය කොටස) නිම කෙරිණි. මුල් කොන්ත්‍රාත්තුවේ ණය ශේෂයක් පවතින අතර මා.සං.අ. විසින් එයින් අවිස්සාවේල්ල - හැටන් මාර්ගයේ කි.මී. 68.5 සිට කි.මී. 72.0 දක්වා මාර්ග කොටස වැඩි දියුණු කිරීමට තීරණය කරනු ලදුව ප්‍රගතිය 92.4% ට ළඟාවී ඇත.

වැඩ විස්තරය	කොටස	අරමුදල් නියෝජිත ආයතනය	කොන්ත්‍රාත් අගය (රු.මිලි.)	ආරම්භක දිනය	නිම කරන දිනය	අද දින වන විට වියදම (රු.මිලි.)	භෞතික ප්‍රගතිය
හැටන් - නුවරඑළිය මාර්ගය වැඩි දියුණු කිරීමේ ව්‍යාපෘතිය	72+000-115+567	කොරියානු ආර්ථික සංවර්ධන සහයෝගිතා අරමුදල	5,685 සංශෝධිත මුදල 9,061.00	2011.12.01	2014.05.31 සංශෝධනය කෙරිණි 2015.03.02 සංශෝධනය කෙරිණි. 2015.12.31	5,970.00	100*
අවිස්සාවේල්ල - හැටන්- නුවරඑළිය මාර්ගය වැඩි දියුණු කිරීමේ ව්‍යාපෘතිය (A007)	68+500 – 72+000		598.60	2015.03.02	2015.12..31	349.00	92.54
*සංශෝධිත කාර්ය වැඩ සටහන අනුව							

ඉඩම් අත්පත්කර ගැනීම

මාර්ග අයිතිය කොන්ත්‍රාත්කරුට භාර දෙන ලදි. වන්දි ගෙවීම සිදු කෙරෙමින් පවතී.



හැටන් නුවරඑළිය මාර්ගයේ නිමකළ කොටසක්.



කොටගල උමං මාර්ගය *(කි.මී. 79+510)* අසල

5.7.1.2 ප්‍රංශ රජයේ මූල්‍ය යෝජනාවලිය යටතේ පාලම් 46 ක් යළි ඉදිකිරීම.

යුරෝ මිලියන 22.05 වියදමින් පාලම් 46 ක් යළි ඉදිකිරීම සිදු කරනු ලැබේ. එකලස් කරන ලද පාලම් හා ආශ්‍රිත සේවාවන් සැපයීම සඳහා ශ්‍රී ලංකා රජය වෙනුවෙන් මහාමාර්ග වරාය හා නාවික අමාත්‍යාංශය හා ප්‍රංශ කන්සෝටියම් මෙතියේ ඇන්ඩ් ඉංජේ කන්ස්ට්‍රක්ෂන් මෙටලික් සමාගම් අතර යුරෝ මිලියන 22.02 වෙනුවෙන් 2012 දෙසැම්බර් 12 දින කොන්ත්‍රාත් ගිවිසුම අත්සන් කෙරිණි. ගිවිසුමට අනුව, සැපයුම්කරුගේ වගකීම අනුව ඉදිකරනු ලබන පාලම් 6 හැර අනෙකුත් පාලම්වල, උප ව්‍යුහය ඉදිකිරීම, වානේ මතුපිට ව්‍යුහය ප්‍රවාහනය හා ස්ථාපනය කිරීම හා ආසන්න ප්‍රවේශයන් ඉදිකිරීම මාර්ග සංවර්ධන අධිකාරියේ වගකීම් වෙයි. පාලම් සැලසුම් නිර්මාණය ප්‍රංශ මතියේ ඇන්ඩ් චයිංජේ සමාගම හෝ මා.සං.අ. විසින් සිදු කරනු ලැබේ. කොන්ත්‍රාත්කරු තෝරාගැනීම දේශීය තරඟකාරී ලංසු කැඳවීම මගින් සිදු කෙරේ. සැපයුම් කොන්ත්‍රාත්තුව අත්සන් කිරීමෙන් පසුව, ප්‍රංශ රජයේ මූල්‍ය යෝජනාවලි යටතේ පාලම් 46 ක් ඉදිකිරීම ක්‍රියාත්මක කිරීම අධීක්ෂණය සඳහා ම.ව. හා නා. අමාත්‍යාංශය විසින් විවිධ විදේශාධාර ව්‍යාපෘතිය ස්ථාපිත කරනු ලැබීය. මා.සං.අ. යේ අධ්‍යක්ෂ ජනරාල් ව්‍යාපෘතියේ සේව්‍යයා වන අතර විවිධ විදේශාධාර ව්‍යාපෘති අධ්‍යක්ෂවරයා සේව්‍යයාගේ නියෝජිතයා වෙයි. නියෝජ්‍ය ව්‍යාපෘති අධ්‍යක්ෂවරයා ව්‍යාපෘතිය යටතේ ඉංජිනේරුවරයා වන අතර, ඉංජිනේරු නියෝජිතයා හා කාර්මික නිලධාරීන් පාලම් ව්‍යාපෘතිය අධීක්ෂණය කිරීම සඳහා ච.ව.ආ.ව්‍යා. විසින් පත්කර ඇත. 2015 වර්ෂය තුල පාලම් 12 ක් නිම කරන ලද අතර පාලම් 14 ක වැඩ සිදු කෙරෙමින් පවතී. පාලම් 5 ක් සඳහා භාර ගැනීමේ ලිපිය නිකුත් කෙරිණි. 2015 වර්ෂය තුල වියදම රු. 1,918,053,830. කි.



කටුකුරුන්ද - නැබඩ මාර්ගයේ *(B207)*
නිම කරන ලද අංක *12/3* පාලම



රත්නපුර - වේවැල්වත්ත මාර්ගයේ *(B391)*
නිම කරන ලද අංක *8/10* පාලම

ව්‍යාපෘතියේ නම :- ප්‍රංශ රජයේ මූල්‍ය යෝජනාවලිය යටතේ වානේ පාලම් 46 ඉදිකිරීම - 2015.දෙසැම්බර් 31 දක්වා ප්‍රගතිය

අනු අංකය	වැඩ විස්තරය	කොටස	කොන්ත්‍රාත් වටිනාකම (රු.මිලි.)	ආරම්භක දිනය	නිමකරන දිනය	අද දක්වා වියදම (රු.මිලි.)	2015 අවසානයේ භෞතික ප්‍රගතිය (%)
1	රත්නපුර - වේවැල්ලවත්ත මාර්ගයේ (A004) අංක 8/10 පාලම ඉදි කිරීම.	-	98	2013.06.14	2014.06.13	99.07	100.0
2	කොළඹ - වැල්ලවාය - මඩකලපුව මාර්ගයේ (A004) අංක . 194/6 පාලම ඉදි කිරීම	-	49.3	2013.05.31	2014.05.30	38.53	100.0
3	රත්නපුර - වේවැල්ලවත්ත මාර්ගයේ (A004) අංක . 204/6 පාලම ඉදි කිරීම	-	80.5	2013.05.31	2014.05.30	60.83	100.0
4	බදුල්ල - කරමැටිය මාර්ගයේ (B036) අංක. 17/5 පාලම ඉදි කිරීම.	-	99.5	2013.05.31	2014.11.30	84.19	100.0
5	වඳුරඹ - ඇතුමලේ - යක්කටුව (B454) මාර්ගයේ අංක. 24/3 පාලම ඉදිකිරීම	-	56.3	2013.06.11	2014.03.10	25.44	100.0
6	හංවැල්ල - පුගොඩ - ඌරාපොල මාර්ගයේ (B146) අංක. 11/2 පාලම ඉදිකිරීම	-	59.7	2013.07.06	2014.04.05	54.63	100.0
7	මාතලේ - ඉලුක්කුඹුර - පල්ලෙගම මාර්ගයේ (B274) අංක. 9/8 පාලම ඉදිකිරීම	-	80	2013.08.26	2014.08.25	61.27	100.0
8	මාතලේ - ඉලුක්කුඹුර - පල්ලෙගම මාර්ගයේ (B274) අංක. 2/8 පාලම ඉදිකිරීම	-	124	2013.08.26	2014.08.25	90.48	100.0

අනු අංකය	වැඩ විස්තරය	කොටස	කොන්ත්‍රාත් වටිනාකම (රු.මිලි.)	ආරම්භක දිනය	නිමකරන දිනය	අද දක්වා වියදම (රු.මිලි.)	2015 අවසානයේ භෞතික ප්‍රගතිය (%)
9	පේරාදෙණිය - බදුල්ල - වෙන්කලඩි මාර්ගයේ (A005) අංක. 182/6 පාලම ඉදිකිරීම.	-	50.5	2013.08.26	25-05-2014	37.80	100.0
10	පේරාදෙණිය - බදුල්ල - වෙන්කලඩි මාර්ගයේ (A005) අංක. 194/1 පාලම ඉදිකිරීම	-	52.4	2013.08.26	25-05-2014	45.71	100.0
11	පේරාදෙණිය - බදුල්ල - වෙන්කලඩි මාර්ගයේ (A005) අංක. 177/9 පාලම ඉදිකිරීම	-	51.4	2013.08.26	25-05-2014	46.21	100.0
12	කොළඹ - රත්නපුර - වැල්ලවාය - මඩකලපුව මාර්ගයේ (A004) අංක. 207/1 පාලම ඉදිකිරීම	-	102	2013.08.26	25-08-2014	79.08	100.0
13	බඩල්කුඹුර - බුත්තල - සෙල්ල කතරගම මාර්ගයේ (B035) අංක. 8/2 පාලම ඉදිකිරීම	-	73.8	2013.09.02	01-06-2014	64.66	100.0
14	තවලම - නෙලුව - බටුවන්ගල මාර්ගයේ (B411) අංක. 9/5 පාලම ඉදිකිරීම	-	86.8	2013.08.26	2014.08.25	68.03	100.0
15	හම්බෙගමුව - කල්තොට මාර්ගයේ (B528) අංක 41/1 පාලම ඉදිකිරීම	-	69.6	2013.08.26	2014.08.25	54.36	100.0
16	වත්තෙගම - කන්දෙනුවර - වාරියපොල මාර්ගයේ (B461) අංක. 28/2 පාලම ඉදිකිරීම	-	73	2014.01.04	2015.01.03	56.46	100.0
17	අවිස්සාවේල්ල - හැටන් - නුවරඑළිය මාර්ගයේ (A007) අංක 48/2 පාලම ඉදිකිරීම	-	65	2014.01.04	2015.01.03	-	-

අනු අංකය	වැඩ විස්තරය	කොටස	කොන්ත්‍රාත් වටිනාකම (රු.මිලි.)	ආරම්භක දිනය	නිමකරන දිනය	අද දක්වා වියදම (රු.මිලි.)	2015 අවසානයේ භෞතික ප්‍රගතිය (%)
18	ඇහැළියගොඩ - දෙහිඕවිට මාර්ගයේ (B110) අංක. 8/5 පාලම ඉදිකිරීම	-	74	2014.01.04	2015.01.03	43.96	100.0
19	මීගමුව - ගිරිඋල්ල මාර්ගයේ (B322) අංක. 32/2 පාලම ඉදිකිරීම	-	76.77	2014.01.04	2014.08.03	13.98	100.0
20	කටුකුරුන්ද - නෑබොඩ මාර්ගයේ (207) අංක. 12/3 පාලම ඉදිකිරීම	-	98.13	2014.01.04	2014.08.03	23.90	100.0
21	ඉංගිරිය - හල්වතුර - ඇඟල්ඔය මාර්ගයේ (B068) අංක. 5/4 පාලම ඉදිකිරීම	-	69.2	2014.01.04	2014.08.03	18.45	100.0
22	තිරිවානාකැටිය - අගලවත්ත මාර්ගයේ (B421) අංක 29/8 පාලම ඉදිකිරීම	-	88.2	2014.01.04	2014.12.31	20.31	100.0
23	මාකොල - උඩුපිල මාර්ගයේ (B262) අංක. 10/1 පාලම ඉදිකිරීම	-	79.3	2014.01.21	2014.08.18	12.16	100.0
24	දෙල්ගොඩ - දොම්පේ - ගිරිදර මාර්ගයේ (B095) අංක. 5/8 පාලම ඉදිකිරීම	-	102.9	2014.01.21	2014.08.14	28.75	100.0
25	කිරිඳිවිට - අස්වැන්නවත්ත මාර්ගයේ (B225) අංක. 1/1 පාලම ඉදිකිරීම	-	78.5	2014.07.29	2015.04.28	65.29	100.0
26	තුඩැල්ල - පමුණුගම - තලාහේන - මීගමුව මාර්ගයේ (B425) අංක 3/2 පාලම ඉදිකිරීම	-	124.6	2014.08.08	2015.08.07	101	82.5
27	ඇඹිලිපිටිය - පනාමුර - බුලුතොට මාර්ගයේ අංක 30/4 පාලම ඉදිකිරීම	-	56.2	2014.07.25	2015.04.24	38.02	99.0

අනු අංකය	වැඩ විස්තරය	කොටස	කොන්ත්‍රාක් වටිනාකම (රු.මිලි.)	ආරම්භක දිනය	නිමකරන දිනය	අද දක්වා වියදම (රු.මිලි.)	2015 අවසානයේ භෞතික ප්‍රගතිය (%)
28	දඹගහපිටිය - පින්නගොල්ල - අරුව - මීගහකිවුල මාර්ගයේ අංක 12/3 පාලම ඉදිකිරීම	-	59.8	2014.07.25	2015.07.24	29.02	94.5
29	ගාල්ල - දෙනියාය - මාදම්පේ මාර්ගයේ අංක 129/3 පාලම ඉදිකිරීම	-	103.83	2014.07.01	2014.09.30	-	100.0
30	බදුල්ල දුම්රියපල මාර්ගයේ අංක. 1/1 පාලම ඉදිකිරීම	-	179.09	2014.12.05	2015.12.04	54.16	91.0
31	පේරාදෙණිය - මඩකලපුව - චෙන්කලඩි මාර්ගයේ අංක. 145/3 පාලම ඉදිකිරීම	-	130.1	2014.12.05	2015.12.04	39.27	60.0
32	මීගමුව - ගිරිඋල්ල මාර්ගයේ අංක. 19/4 පාලම ඉදිකිරීම.	-	155.43	2014.12.05	2015.12.04	67.45	66.0
33	මීගමුව - ගිරිඋල්ල මාර්ගයේ අංක 34/2 පාලම ඉදිකිරීම	-	96.43	2014.11.13	2015.11.12	54.02	99.9
34	ගාල්ල - දෙනියාය - මාදම්පේ මාර්ගයේ අංක. 21/1 පාලම ඉදිකිරීම	-	88.79	2014.12.09	2016.03.05	52.89	55.0
35	වදුරඹ - ඇතුමලේ - යක්කටුව මාර්ගයේ 33/1 පාලම ඉදිකිරීම	-	63.85	2014.11.14	2015.11.13	44.63	100.0
36	කිරිමැටිය - යාල මාර්ගයේ අංක. 9/1 පාලම ඉදිකිරීම	-	211.61	2014.12.05	2015.12.04	91.23	88.0
37	නාඋල - ඇලහැර - පල්ලෙගම - හෙට්පොල මාර්ගයේ අංක. 5/3 පාලම ඉදිකිරීම	-	46.52	2015.07.10	2016.07.10	16.12	91

අනු අංකය	වැඩ විස්තරය	කොටස	කොන්ත්‍රාත් වටිනාකම (රු.මිලි.)	ආරම්භක දිනය	නිමකරන දිනය	අද දක්වා වියදම (රු.මිලි.)	2015 අවසානයේ භෞතික ප්‍රගතිය (%)
38	නාඋල - ඇලහැර - පල්ලෙගම - හෙට්ටිපොල මාර්ගයේ අංක. 24/3 පාලම ඉදිකිරීම	-	91.97	2015.07.21	2016.07.21	25.44	51
39	වලස්මුල්ල - කටුවන - මිද්දෙනිය මාර්ගයේ අංක. 4/5 පාලම ඉදිකිරීම	-	92.42	2015.07.10	2016.07.10	23.07	38
40	වලස්මුල්ල - කටුවන - මිද්දෙනිය මාර්ගයේ අංක. 16/1 පාලම ඉදිකිරීම	-	128.99	2015.07.21	2016.07.21	20.14	18
41	වල්පොල - මයිලවලාන මාර්ගයේ අංක. 9/3 පාලම ඉදිකිරීම	-	82.11	2015.07.10	2016.07.10	9.64	20
42	කැලණිය - පල්ලෙවෙල - මැදගම්පිටය මාර්ගයේ අංක. 4/3 පාලම ඉදිකිරීම	-	87.37	2015.07.10	2016.07.10	14.99	25
43	කටුකුරුන්ද - නැබොඩ මාර්ගයේ අංක. 10/3 පාලම ඉදිකිරීම	-	152.55	2015.07.21	2016.07.21	34.92	51
44	අම්පලන්තුරේ - වීරමුනේ මාර්ගයේ අංක 11/4 පාලම ඉදිකිරීම	-	109.45	2015.07.21	2016.07.21	12.23	12
45	ඇහැළියගොඩ - දෙහිඕවිට මාර්ගයේ අංක. 13/2 පාලම ඉදිකිරීම	-					100
46	ඇහැළියගොඩ - දෙහිඕවිට මාර්ගයේ අංක. 13/4 පාලම ඉදිකිරීම	-					85
47	අම්බල්ගොඩ - ඇල්පිටිය - පිටවුගල මාර්ගයේ අංක. 20/3 පාලම ඉදිකිරීම	-	58.77				


අනු අංකය	වැඩ විස්තරය	කොටස	කොන්ත්‍රාත් වටිනාකම (රු.මිලි.)	ආරම්භක දිනය	නිමකරන දිනය	අද දක්වා වියදම (රු.මිලි.)	2015 අවසානයේ භෞතික ප්‍රගතිය (%)
48	අම්බල්ගොඩ - ඇල්පිටිය - පිටවුගල මාර්ගයේ අංක. 25/7 පාලම ඉදිකිරීම	-	95.77				
49	හිනිදුම - ඕපාත - පිටබැද්දර මාර්ගයේ අංක. 4/8 පාලම ඉදිකිරීම	-	53				
50	පැලවත්ත - කන්කොටියාවත්ත - තිනියාවෙල - මොරවක මාර්ගයේ අංක. 12/6 පාලම ඉදිකිරීම	-	140.14				
51	කොළඹ - රත්නපුර - වැල්ලවාය - මඩකලපුව මාර්ගයේ අංක. 190/1 පාලම ඉදිකිරීම	-	179.82				

ඉඩම් අත්පත්කර ගැනීම

මාර්ග අයිතිය කොන්ත්‍රාත්කරුවන්ට භාර දෙන ලදි. වන්දි ගෙවීම අවසන් කිරීම සඳහා ඉඩම් අත්පත්කර ගැනීම සිදු කෙරෙමින් පවතී.

5.7.1.3 සවුදි සංවර්ධන අරමුදල විසින් අරමුදල් සපයන ලද මාර්ග ජාල සංවර්ධන ව්‍යාපෘතිය යටතේ මාර්ග පුනරුත්ථාපන හා වැඩි දියුණු කිරීම (SFD-1)

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය විසින්, විවිධ විදේශාධාර ව්‍යාපෘතිය සඳහා සවුදි රජයෙන් ණය පහසුකම් ලබා ගන්නා ලද අතර, එයින් කොටසක් ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කයේ සෝමවච්චාතිවු - මුලයිවේනි මාර්ගයේ (කි.මී. 0+240 සිට කි.මී. 1+117 දක්වා) පුනරුත්ථාපනය හා වැඩි දියුණු කිරීම සඳහා යෙදවීමට අදහස් කරනු ලබයි. උසස් අධ්‍යාපන හා මහාමාර්ග අමාත්‍යාංශය යටතේ මා.සං.අ. යේ වි.වි.ආ.ව්‍යා.ඒ. විසින් මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරනු ලබයි.



සෝමාවච්චතිවු - මුනයිවේනයි මාර්ගය (කි.මී. 0+780) නල පාලම ඉදිකිරීම.

ව්‍යාපෘතියේ නම/ මා.සං.අ. අංශය	වැඩ විස්තරය	අරමුදල් නියෝජිත ආයතනය	කොන්ත්‍රාත් අගය රු.මිලි.	ආරම්භක දිනය	නිම කරන දිනය	අද දින දක්වා වියදම රු.මිලි.	2015 අවසානයේ භෞතික ප්‍රගතිය
විවිධ විදේශාධාර ව්‍යාපෘතිය	සෝමාවච්චතිවු- මුනයිවේනයි මාර්ගය ඔස්සේ තඔලගමුව - කින්නියා මාර්ගයේ 12 වැනි කි.මී අසල නල පාලම ඉදිකිරීම	සංවර්ධනය සඳහා සවුදි අරමුදල	79.67	2015.06.29	2016.03.28	34.6	47

ඉඩම් අත්පත් කර ගැනීම.

මාර්ග අයිතිය කොන්ත්‍රාත්කරුට භාර දෙන ලදි. වන්දි ගෙවීම නිම කිරීම සඳහා ඉඩම් අත්පත්කර ගැනීමේ ක්‍රියාවලිය සිදු කෙරෙමින් පවතී.

5.7.1.4 සංවර්ධනය සඳහා සවුදි අරමුදල විසින් අරමුදල් සපයන ලද මාර්ග ජාල සංවර්ධන ව්‍යාපෘතිය යටතේ පුනරුත්ථාපනය හා වැඩි දියුණු කිරීම (SFD-2)

මෙම ව්‍යාපෘතියට සමස්ත දිග කි.මී.79.32 යුත් පහත සඳහන් මාර්ග 6 පුනරුත්ථාපනය හා වැඩි දියුණු කිරීම අයත්ය. මෙම සියලු මාර්ග මධ්‍යම, නැගෙනහිර, සබරගමුව හා බස්නාහිර පළාත්වල පැතිරී ඇත.

1. මහනුවර - යාපනය මාර්ගයේ (A-09) කටුගස්තොට - අලවතුගොඩ කොටස (කි.මී. 4.6 – 15.57)
2. මහනුවර - යාපනය මාර්ගයේ (A-09) අලවතුගොඩ - පලාපත්වල කොටස (කි.මී.15.57-32.54)
3. මහනුවර - යාපනය මාර්ගයේ (A-09) පලාපත්වල - නාවුල කොටස (කි.මී. 32.54-54.18)
4. තම්පලාගමුව කින්නියා මාර්ගයේ (B-541) තම්පලාගමුව - සුරංගල් මංසන්ධිය (කි.මී. 0.0 – 8.5)
5. දෙහිඕවිට - දැරණියගල - නුවර මාර්ගයේ (B-093) දෙහිඕවිට - දැරණියගල කොටස (කි.මී.0.00 – 14.00)
6. කොළඹ - මහනුවර මාර්ගයේ (A-01) පැලියගොඩ - කිරිබත්ගොඩ කොටස (කි.මී. 5.86 – 13.10)

දුගී බව තුරන් කිරීමේ රජයේ සැලසුම අනුව, යෝජිත ව්‍යාපෘතියේ අරමුණ, මාර්ග පුළුල් කිරීම, පුනරුත්ථාපනය, වැඩි දියුණු කිරීම හා පාලම් ඉදිකිරීම මගින්, ප්‍රවාහන අංශයේ වේගයෙන් වැඩිවන ඉල්ලුම සපුරාලීම සඳහා මාර්ග ජාල සම්බන්ධතාවය වැඩි දියුණු කිරීමයි. ව්‍යාපෘතිය විසින් මහාමාර්ග ධාරිතාව හා සේවා මට්ටම නැංවීමටත් එමගින්, ප්‍රදේශවල ආර්ථික කටයුතු නැංවීම හා සාමාජීය සංවර්ධනය අපේක්ෂා කෙරේ. මෙමගින් රටේ සාමාජීය ආර්ථික සංවර්ධනයට දායකවනු ඇත.



තම්පලාගම - කින්නියා මාර්ගයේ නිමකළ කොටස *(කි.මී.. 1+950)*



තම්පලාගම - කින්නියා මාර්ගයේ නිමකළ කොටස (කි.මී. *1+750*)

ව්‍යාපෘතියේ නම :- සංවර්ධනය සඳහා සවුදි අරමුදල විසින් අරමුදල් සැපයූ මාර්ග ජාල සංවර්ධන අරමුදල යටතේ, මාර්ග පුනරුත්ථාපනය හා වැඩි දියුණු කිරීම (SFD-2)

අනු අංකය	වැඩ විස්තරය	කොටස	අරමුදල් නියෝජිත ආයතනය	කොන්ත්‍රාත් අගය රු.මිලි.	ආරම්භක දිනය	නිම කරන දිනය	අද දක්වා වියදම (රු.මී.)	භෞතික ප්‍රගතිය (%)
1	මහනුවර - යාපනය මාර්ගයේ (A009) කටුගස්තොට සිට අලවතුගොඩ දක්වා කොටස පුනරුත්ථාපනය / වැඩි දියුණු කිරීම	4+600-15+570	සංවර්ධනය සඳහා සෞදි අරමුදල	767.04	2013.06.03	2014.06.02 සංශෝධිත දිනය 2014.08.12	751.92	100.00
2	මහනුවර - යාපනය මාර්ගයේ (A009) අලවතුගොඩ සිට පලාපත්වල දක්වා කොටස පුනරුත්ථාපනය / වැඩි දියුණු කිරීම	15+570 – 32+540		949.16	2013.06.03	2014.06.02 සංශෝධිත දිනය 2014.11.25	943.69	100.00
3	මහනුවර - යාපනය මාර්ගයේ (A009) පලාපත්වල සිට නාවුල දක්වා කොටස පුනරුත්ථාපනය / වැඩි දියුණු කිරීම	32+540-54+180		1330.61	2014.03.13	2015.03.12	761.96	100.00
4	තම්පලාගාමම - කින්නියා මාර්ගයේ (B541) කඹලගමුව - සුරංගල් මංසන්ධිය පුනරුත්ථාපනය / වැඩි දියුණු කිරීම.	0+000 – 8+500		875.85	2013.06.07	2014.12.06	806.69	96.43
5	දෙහිඕවිට - දැරණියගල - නුවර මාර්ගයේ (B093) දෙහිඕවිට සිට දැරණියගල දක්වා කොටස පුනරුත්ථාපනය / වැඩි දියුණු කිරීම	0+000 – 14+000		1092.57	2013.06.05	2014.12.04 සංශෝධිත දිනය 2015.12.20	1141.82	100.00
6	කොළඹ - මහනුවර මාර්ගයේ (A001) පැලියගොඩ සිට කිරිබත්ගොඩ දක්වා කොටස පුනරුත්ථාපනය / වැඩි දියුණු කිරීම	5+860 – 13+100		1939.93	2013.12.13	2014.12.12	1076.43	100.00

ඉඩම් අත්පත්කර ගැනීම

මාර්ග අයිතිය කොන්ත්‍රාත්කරුට භාර දෙන ලදි. වන්දි ගෙවීම නිම කිරීම සඳහා ඉඩම් අත්පත් කර ගැනීමේ කටයුතු සිදු කෙරෙමින් පවතී.

5.7.1.5 ජාත්‍යන්තර සංවර්ධනය සඳහා ඔපෙක් අරමුදල විසින් අරමුදල් සැපයූ ජාතික මාර්ග වැඩි දියුණු කිරීමේ ව්‍යාපෘතිය යටතේ මාර්ග පුනරුත්ථාපනය හා වැඩි දියුණු කිරීම (OFID-1)

ශ්‍රී ලංකා රජය විසින් ජාතික මාර්ග වැඩි දියුණු කිරීමේ ව්‍යාපෘතිය යටතේ, මාර්ග පුනරුත්ථාපනය හා වැඩි දියුණු කිරීම වෙනුවෙන්, ජාත්‍යන්තර සංවර්ධනය සඳහා ඔපෙක් අරමුදල චෙතින්, එ.ජ.ඩො. මිලියන 40ක් ලබාගනු ලැබීය. ව්‍යාපෘතියට සමස්ත දිග කි.මී. 36.57 යුත් පහත සඳහන් මාර්ග 3 පුනරුත්ථාපනය හා වැඩි දියුණු කිරීම සහ පොල්ගහවෙල - කෑගල්ල මාර්ගයේ මාඔය හරහා අංක.3/2 පාලම යළි ඉදිකිරීම අයත් වේ. යෝජිත පාලම මී. 120 කින් යුක්ත වන අතර, දෙපස පාගමන් පහසුකම් සහිත සම්මත මංතීරු 2ක් වෙයි. මෙම සියලු මාර්ග සබරගමුව, බස්නාහිර හා වයඹ පළාත්වල පැතිර ඇත.

1. ගාල්ල - දෙනියාය - මාදම්පේ මාර්ගයේ (A-017) රක්වාන - මාදම්පේ කොටස (කි.මී. 130.00 – 143.93)
2. A019 මාර්ගයේ අංක 3/2 කරඳන පාලම යළි ඉදිකිරීම (දිග මී. 120.0)
3. ඇහැළියගොඩ - දෙහිඕවිට මාර්ගයේ (B-110) ඇහැළියගොඩ - දෙහිඕවිට කොටස (කි.මී. 00.00-16.69)
4. ඇතුල්කෝට්ටේ - මිරිහාන - කොහුවල මාර්ගයේ (B-120) ඇතුල්කෝට්ටේ - කොහුවල කොටස (කි.මී. 0.00 – 5.95)

දුගී බව තුරන් කිරීමේ රජයේ සැලසුමට අනුව, යෝජිත ව්‍යාපෘතියේ අරමුණු, මාර්ග පුළුල් කිරීම, පුනරුත්ථාපනය, වැඩි දියුණු කිරීම හා පාලම් ඉදිකිරීම මගින්, ප්‍රවාහන අංශයේ වේගයෙන් වැඩිවන ඉල්ලුම සපුරාලීම සඳහා මාර්ග ජාල සම්බන්ධතාවය වැඩි දියුණු කිරීමයි. ව්‍යාපෘතිය මගින් මහාමාර්ග ධාරිතාව හා සේවා මට්ටම නැංවීමටත් එමගින්, ප්‍රදේශවල ආර්ථික කටයුතු නැංවීම හා සාමාජීය සංවර්ධනය අපේක්ෂා කෙනෙ අතර එමගින් රටේ ආර්ථික සාමාජීය සංවර්ධනය සඳහා දායකවනු ඇත.

.



ගාල්ල - දෙනියාය - මාදම්පේ මාර්ගයේ රක්වාන සිට මාදම්පේ දක්වා නිමකළ කොටස කි.මී. *136+450-136+600*



ඇහැළියගොඩ - දෙහිඕවිට මාර්ගයේ ඇහැළියගොඩ - දෙහිඕවිට කොටසේ පෘෂ්ඨ ස්ථරය *(කි.මී.: 4+050)*

ව්‍යාපෘතියේ නම :- ජාත්‍යන්තර සංවර්ධනය සඳහා ඔපෙක් අරමුදල් සැපයූ ජාතික මාර්ග වැඩි දියුණු කිරීමේ ව්‍යාපෘතිය යටතේ මාර්ග පුනරුත්ථාපනය හා වැඩි දියුණු කිරීම (OFID-1)

මාර්ග කොටස	දිග (කි.මී)	කා.ඇ.ක (රු.මිලි)	ආරම්භක දිනය	නිම කිරීමට අපේක්ෂිත දිනය	2014 දක්වා ප්‍රගතිය (%)	2014 දක්වා වියදම (රු.මිලි)	2015 දෙසැ. අවසානයේ ප්‍රගතිය (%)	2015 තුල වියදම (රු.මිලි)
පොල්ගහවෙල-කෑගල්ල මාර්ගයේ අංක 3/2 පාලම නැවත ඉදිකිරීම (කරදන පාලම)	0.125	247.66	21/06/2013	20/12/2014	83.5	120.92	100	35.33
ගාල්ල-දෙනියාය-මාදම්පේ මාර්ගයේ (A017) රක්වාන - මාදම්පේ කොටස (කි.මී. 130+000-143+930) පුනරුත්ථාපනය / වැඩි දියුණු කිරීම	13.93	2051.4	1/7/2013	31/12/2014	66	725.38	99.5	446.18
ඇහැලියගොඩ-දෙහිඕවිට මාර්ගයේ (B110) (කි.මී. 0+000-16+690) කොටස පුනරුත්ථාපනය / වැඩි දියුණු කිරීම.	16.96	1807.31	10/12/2013	9/6/2015	51.463	510.54	87.63	597.34
ඇතුල්කෝට්ටේ - මිරිහාන - කොහුවල B120 මාර්ගයේ ඇතුල්කෝට්ටේ සිට කොහුවල දක්වා (කි.මී. 0+000-5+950) කොටස පුනරුත්ථාපනය / වැඩි දියුණු කිරීම.	5.95	864.17	10/12/2013	9/9/2014	95	252.87	100	264.88

ඉඩම් අත්පත් කර ගැනීම.

මාර්ග අයිතිය කොන්ත්‍රාත්කරුට භාර දෙන ලදි. වන්දි ගෙවීම නිම කිරීම සඳහා ඉඩම් අත්පත්කර ගැනීමේ ක්‍රියාවලිය සිදු කෙරෙමින් පවතී.

5.7.1.6 ජාත්‍යන්තර සංවර්ධනය සඳහා ඔපෙක් අරමුදල විසින් අරමුදල් සපයන ලද කොළඹ ජාතික මහාමාර්ග ව්‍යාපෘතිය යටතේ මාර්ග පුනරුත්ථාපනය හා වැඩි දියුණු කිරීම (OFID -2)

මෙම කොන්ත්‍රාත් ව්‍යාපෘතිය යටතේ, කි.මී. 65.45 කින් යුත් මාර්ග 13 ක් පුනරුත්ථාපනය කිරීමට හා නාරාහේන්පිට - නාවල - නුගේගොඩ මාර්ගයේ පරායනය මී. 34.14 යුතු අංක. 2/1 පාලම පුළුල් කිරීමට තීරණය කරන ලදි.

නියමිත පරිදි නාරාහේන්පිට - නාවල - නුගේගොඩ මාර්ගයේ අංක 2/1 පාලම 2015.03.10 දින ප්‍රවේශ මාර්ගයක් ඇතුළුව පුළුල් කිරීම නිම කරනු ලැබීය. ජයවර්ධනපුර රෝහල් ප්‍රවේශ මාර්ගය දෙමටගොඩ - වැල්ලම්පිටිය මාර්ගය, කොළොන්නාව - යක්බැද්ද මාර්ගය, වැලිකඩ - කොහිලවත්ත මාර්ගය හා මධ්‍යම පාර වැඩ 2015 අවසානය වන විට සිදු කෙරෙමින් පැවතුනි.

නාරාහේන්පිට - නාවල - නුගේගොඩ මාර්ගයේ අංක 2/1 පාලම පුළුල් කිරීම සඳහා ඉඩම් අත්පත් කර ගැනීම

ඉඩම් අත්පත්කර ගැනීම නිම කෙරිණි. ඉඩම් සඳහා වන්දි ගෙවිය යුතුව තිබේ.

ව්‍යාපෘතියේ නම :- ජාත්‍යන්තර සංවර්ධනය සඳහා ඔපෙක් අරමුදල් සැපයූ කොළඹ ජාතික මහමාර්ග ව්‍යාපෘතිය යටතේ මාර්ග පුනරුත්ථාපනය හා වැඩි දියුණු කිරීම (OFID -2)

මාර්ග කොටස	දිග (කි.මී.)	කා.ඇ.ක (රු.මී.)	ආරම්භක දිනය	නිම කිරීමට අපේක්ෂිත දිනය	2014 දක්වා ප්‍රගතිය (%)	2014 දක්වා වියදම (රු.මිලි.)	2015 අවසානය වන විට ප්‍රගතිය (%)	2015 දක්වා වියදම (රු.මිලි.)
නාරාහේන්පිට - නාවල - නුගේගොඩ මාර්ගයේ අංක. 2/1 පාලම පුළුල් කිරීම	34.14 m	225.68	11/12/2013	10/3/2015	75.07	114.53	100	57.31
ශ්‍රී ජයවර්ධනපුර රෝහල ප්‍රවේශ මාර්ගය, දෙමටගොඩ - වැල්ලම්පිටිය මාර්ගය, කොලොන්නාව - යක්බැද්ද මාර්ගය, වැලිකඩ-කොහිලවත්ත මාර්ගය මධ්‍යම පාර වැඩි දියුණු කිරීම.	12.47	1575.08	23/12/2014	22/03/2016	-		70.41	609.42

කොන්ත්‍රාත් අංක .RDA/MFAP/ICB/OFID-2/A සඳහා ඉඩම් අත්පත්කර ගැනීම.

මධ්‍යම පාර ඉඩම් අත්පත්කර ගැනීම සිදු කරමින් පවතින අතර අනෙකුත් මාර්ග සඳහා අත්පත්කර ගැනීමක් නොමැත.





නාරාහේන්පිට - නාවල - නුගේගොඩ මාර්ගයේ පුළුල් කිරීම නිම කරන ලද අංක. *2/1* පාලම (නාවල පාලම)

5.7.1.7 අ.ආ.ස.කු.අ. අරමුදල් සැපයූ පාලම් පුනරුත්ථාපනය / යළි ඉදිකිරීමේ ව්‍යාපෘතිය.

අරාබි ආර්ථික සංවර්ධනය සඳහා කුවේට් අරමුදල පාලම් 32 ක් හා එක් අතුරු මාර්ගයක් වැඩි දියුණු කිරීමට කු.ඩි. 5,100,000.00 යුත් ප්‍රදාන ණය මුදල් 2ක් ලබා දී අත.

ඉහත කී ඉදිකිරීම් සිදු කිරීමෙන් පසුව, ඉතිරි වූ කු.ඩි. 256,224.426 ක මුදල කොන්ත්‍රාත් යෝජනාවලි 2 ක් යටතේ ගාල්ල - දෙනියාය - මාදම්පේ මාර්ගයේ අංක 1/3, 2/1 හා 51/1 යන පාලම් 3 යළි ඉදි කිරීමට තීරණය කෙරිණි.

මාර්ග කොටස	දිග (කි.මී.)	කා.ඇ.ක. (රු.මිලි.)	ආරම්භක දිනය	නිම කිරීමට අපේක්ෂිත දිනය	2014 දක්වා ප්‍රගතිය (%)	2014 දක්වා වියදම (රු.මිලි.)	2015 දෙසැම්බර් අවසානයේ ප්‍රගතිය (%)	2015 දක්වා වියදම (රු.මිලි.)
ගාල්ල-දෙනියාය-මාදම්පේ මාර්ගයේ අංක. 1/3 හා 2/1 පාලම් ඉදි කිරීම	1/3 පරායනය (මී.10.55) 2/1 පරායනය (මී.32.11)	138.25	1/1/2014	2014.09.30 සිට 2014.12.24 දක්වා දිගු කරන ලද	63	70.77	100	46.09
ගාල්ල-දෙනියාය-මාදම්පේ මාර්ගයේ අංක. 51/1 දරණ පාලම ඉදිකිරීම	පරායනය මී. 4.58	38.66	15/03/2014	15/12/2014	62	16.69	100	14.76



නිම කළ 51/1 පාලම




නිම කළ 1/3 පාලම

5.8 ලෝක බැංකු අරමුදල් සැපයූ මාර්ග අංශ සහායක ව්‍යාපෘතිය.

ලෝක බැංකු අරමුදල් සැපයූ මාර්ග අංශ සහායක ව්‍යාපෘති ඒකකය ලෝක බැංකු අරමුදල් ව්‍යාපෘති මෙහෙයවීම සඳහා පිහිටුවනු ලැබීය. මාර්ග අංශ සහායක ව්‍යාපෘතිය යටතේ, ජාතික මහාමාර්ග ජාලය වැඩි දියුණු කිරීම සඳහා ලෝක බැංකුව විසින් එ.ජ.ඩො. මිලියන 100 ක අතිරේක මූල්‍ය සහායක් ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය වෙත සපයනු ලැබීය.

සිතියම් අංක 13: ලෝක බැංකුව අරමුදල් සපයන ලද මාර්ග අංශ සහායක ව්‍යාපෘතිය



මාර්ග අංශ සහායක ව්‍යාපෘතිය යටතේ, ජාතික මහාමාර්ග ජාලය වැඩි දියුණු කිරීම සඳහා ලෝක බැංකුව විසින් එ.ජ.ඩො. මිලියන 100 ක අතිරේක මූල්‍ය සහායක් ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය වෙත සපයන ලදි.

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය විසින්, මාර්ග අංශ සහායක ව්‍යාපෘතියේ දෙවන අදියර අතිරේක මූල්‍යයනය යටතේ, මාර්ග වැඩි දියුණු කිරීමට හා පුනරුත්ථාපනය කිරීමට ජාත්‍යන්තර සංවර්ධන සංගමයෙන් එ.ජ.ඩො. මිලියන 100 ක ණය පහසුකමක් ලබාගත් අතර කොළඹ - ගාල්ල- හම්බන්තොට

මාර්ගයේ (A002) හා පැලියගොඩ - පුත්තලම මාර්ගයේ (A003) මාර්ග කොටස් දළ වශයෙන් කි.මී. 34.80 ක් පුනරුත්ථාපනය හා වැඩි දියුණු කිරීම සිදු කරන ලදි.

වැඩ විෂය පථයට අයත් වන්නේ:

- පවත්නා ඇතුරුම මත ඇස්පල්ට් මිශ්‍රණය ඇතිරීම.
- ප්‍රාදේශීයව අසාර්ථක වූ ස්ථාන යළි ඉදි කිරීම.
- ජලාපවහන පද්ධතිය වැඩි දියුණු කිරීම.
- පදිකයන්ගේ ආරක්ෂණ අංගයන් සඳහා ප්‍රධාන වැඩි දියුණු කිරීම
    - දෙපස පදික තීරු උස් කිරීම
    - වැඩි දියුණු කරන ලද දෘෂ්‍යතාවය හා ආලෝක සහිත පෙලිකන් හා අතිරේක පදික මාරු.
    - වැඩි දියුණු කරන ලද වීථි ආලෝක.
- ප්‍රධාන අන්තර් ඡේදනයන්හි ජ්‍යාමිතික වැඩි දියුණු කිරීම් හා අතිරේක සංඥාකරණය, නව මාර්ග සළකුණු කිරීම හා මාර්ග උපකරණ.
- මධ්‍යන්‍යය මාරු වැඩි දියුණු කිරීම.

5.8.1 ව්‍යාපෘතියේ විස්තර

A002 මාර්ගය (කි.මී.13+275 සිට කි.මී. 18+480 සහ කි.මී. 25+240 කි.මී. 30+300), AB011 මාර්ගයේ (කි.මී. 0+000 කි.මී. 6+780) හා A003 මාර්ගයේ (කි.මී. 0+600 සහ කි.මී. 18+310) මාර්ග කොටස් කොන්ත්‍රාත් යෝජනාවලි හතරක් සඳහා කැබලි හතරකට බෙදනු ලැබීය.

කොන්ත්‍රාත් 01 – 01 කොටස
A002 මාර්ගයේ මැලිබන් හංදිය සිට කුරුස හංදිය දක්වා (කි.මී.13+275 සිට කි.මී. 18+480) සහ AB011 මාර්ගයේ කුරුස හංදිය සිට පානදුර පාලම දක්වා (කි.මී. 0+000 – කි.මී. 0+080)

කොන්ත්‍රාත් 02- 02 කොටස
02 කොටස, A002 මාර්ගයේ පානදුර පාලම සිට නල්ලූරුව හංදිය දක්වා (කි.මී. 25+240 - කි.මී. 30+300) සහ AB011 මාර්ගයේ කුරුස හංදිය සිට පානදුර පාලම දක්වා (කි.මී. 0+080 – කි.මී. 6 +780)

කොන්ත්‍රාත් 03 - 03 කොටස
A003 පැලියගොඩ සිට මහබාගේ දක්වා (කි.මී. 0+600 – කි.මී. 9+000)

කොන්ත්‍රාත් 04 – 04 කොටස
A003 මාර්ගයේ මහබාගේ සිට ජාඇල දක්වා (කි.මී. 9+000 – කි.මී. 18+310)

කොන්ත්‍රාත් 05
උඩිස් පාලම ඉදිකිරීම හා A02 මාර්ගයේ බස් නැවතුම අසල සෝපා පෙළ හා සෝපානය සැපයීම, ස්ථාපනය හා මහජනයා සඳහා පැවරීම.

5.8.2 2015 අවසානයේ වැඩවල ප්‍රගතිය

ව්‍යාපෘතියේ නම/මාසංඥ අංශය	කොන්ත්‍රාත් අංකය	වැඩ විස්තරය	කොටස / පාලම	කොන්ත්‍රාත් වටිනාකම (රු.මිලි.) සංශෝධිත	ආරම්භක දිනය	නිම කරන දිනය	අද දක්වා වියදම (රු.මිලි)	භෞතික ප්‍රගතිය
ලෝක බැංකු අරමුදල් සැපයූ මාර්ග අංශ සහායක ව්‍යාපෘතිය දෙවන අතිරේක මූල්‍ය සැපයුම	WB/RSAP/II/WK/ ICB01-Lot 01	ගාලුපාර (A002) හා නව ගාලුපාර පුනරුත්ථාපනය හා වැඩි දියුණු කිරීම	ගාලුපාර (A002) මැලිබන් හංදිය සිට කුරුස හංදිය දක්වා (කි.මී. 13+275 – 18+480) සහ නව ගාලු පාර (AB011) කුරුස හංදිය සිට පානදුර පාලම දක්වා (කි.මී. 0+000 – 0+080)	1870.8	2013.07.07	2014.07.06	1,601,580	100%
	WB/RSAP/II/WK/ ICB01-Lot 02		නව ගාලු පාර (AB011) කුරුස හංදිය සිට පානදුර පාලම දක්වා (කි.මී. 0+080 – 6+780) හා ගාලුපාර (A002) පානදුර පාලම සිට නල්ලුරුව හංදිය දක්වා (කි.මී. 24+240 – 30+300)	2959.3	2013.07.07	2014.07.06	2,627,090	100%
	WB/RSAP/II/WK/ NCB/01		පානදුර පුද්ගලික බස් නැවතුම්පල අසල ගුවන් පාලම ඉදිකිරීම.සෝපාන පෙල හා සෝපානය සැපයීම ස්ථාපනය කිරීම හා ජනතා අයිතියට පත් කිරීම.	168.986	2013.12.20	2014.06.20	161,209	100%
	WB/RSAP/II/WK/ ICB01-Lot 03	පැලියගොඩ - පුත්තලම මාර්ගය (A003) පුනරුත්ථාපනය හා වැඩි දියුණු කිරීම	කි.මී. (0+660 – 9+000) දක්වා මාර්ග කොටස	1848.9	2013.07.07	2014.07.06	1,613,520	100%
	WB/RSAP/II/WK/ ICB01-Lot 04		කි.මී.(9+000 – 18+310) දක්වා මාර්ග කොටස	1690.8	2013.07.07	2014.07.06	1,458,160	100%

සටහන : සියලුම කොන්ත්‍රාත් දෝෂ වගකීම් කාලසීමාවටම යටත්ය.

5.8.3 ලෝක බැංකු අරමුදල් සැපයූ මාර්ග අංශ සහායක ව්‍යාපෘතිය විසින් මෙහෙයවන ලද වෙනත් ව්‍යාපෘති

ප්‍රවාහන සම්බන්ධතා හා වත්කම් කළමනාකරණ ව්‍යාපෘතිය (TC&AM)

ප්‍රවාහන සම්බන්ධතා ව්‍යාපෘතිය යටතේ නිමැවුම් පදනම් කරගත් සැලසුම් නිර්මාණය ඉදිකිරීම, නඩත්තුව, මෙහෙයවීම හා පැවරීමේ ක්‍රමවේදය අනුව කොන්ත්‍රාත් කාර්ය සාධන මාර්ග කොන්ත්‍රාත් ආකෘතියක් යොදා ගැනීමේ හැකියාව සොයා බැලීමට උසස් අධ්‍යාපන හා මහාමාර්ග අමාත්‍යාංශය සහ මාර්ග සංවර්ධන අධිකාරිය විසින් යෝජනා කෙරේ.

ලෝක බැංකුව, නව ණය මුදල ක්‍රියාත්මක වෙන තෙක් මාර්ග අංශ සහායක ව්‍යාපෘතිය IDA 4906 යටතේ උපදේශකයන් පත් කිරීම සඳහා විදේශ සහභාගය මූල්‍යයනය කිරීමට එකඟ වී ඇත.

ප්‍ර.ස.හා ව.ක. ව්‍යාපෘතියේ පහත සඳහන් පිළියෙල කිරීමේ වැඩ මා.අ.ස.ව්‍යා. යටතේ ක්‍රියාත්මක කරන ලදි.

- පාරිසරික බලපෑම් තක්සේරුව, සමාජීය බලපෑම් තක්සේරුව හා හඳුනා ගැනීම, මිනුම්කරණය හා ඉඩම් සිතියම් ගත කිරීම, වර්ෂා ජල කළමනාකරණය සඳහා උපදේශකයන් පත් කිරීම අවශ්‍ය කෙරේ.
- සංකල්ප සැලසුම් හා සිවිල් වැඩ කොන්ත්‍රාත් සඳහා ලංසු ලේඛන පිළියෙල කිරීම සඳහා උපදේශක සේවා.

5.8.4 සීමා කිරීම්

4.1 මධ්‍යන්‍යය විවෘත කිරීම් හා නැවතුම් නෙරු සඳහා මහජන ඉල්ලීම් ඉටු කිරීමට විවලනයන් හා සැලසුම් වෙනස්කම් විශාල සංඛ්‍යාවක් සිදු කරන ලදි.

4.2 ප්‍රදේශයේ ජල පවාහන ගැටළු විසඳීම සඳහා මහජන ඉල්ලීම් වලට ඉඩදීමේදි දුෂ්කරතා ඇති විය.

4.3 ප්‍රමාණවත් නොවන ධාරිතාව, බැහැර ගෙන යන කාණු නැතිකම හෝ අවහිර වීම නිසා ඇතැම් මාර්ග ජල ගැලීම් ගැටළු විසඳීමට නොහැකි විය.

4.4 A003 මාර්ගයේ ඉහළ ජල මට්ටම නිසා ඇතැම් කොටස්වල පලුදු මතු විය. මෙයට හේතුව මෙතෙක් තහවුරු කර නොමැත. එහෙත්, උප පෘෂ්ඨ කාණු ඉදිකිරීම මගින්, තත්ත්වය වැඩි දියුණු කර ඇත.

4.5 AB011 මාර්ගයේ වීදි ආලෝක සඳහා භාවිතා කරන ලද ද්‍රව්‍ය වෙරළබඩ පරිසරයට සුදුසු නොවන බව පෙනී ගිය අතර කෙටි කලකදී ඒවා සම්පූර්ණයෙන් මළ බැඳී තිබෙනු දක්නට ලැබුණි. ඒවා ප්‍රති සම්පාදනය කිරීම අවශ්‍ය වේ.

4.6 වීදි ආලෝක පද්ධතියේ විශාල ප්‍රමාණයක් දෝෂ දක්නට ලැබුණි.





මැලිබන් හංදිය



ගාලු පාර



පානදුර පදික උඩිස් පාලම



A033 මාර්ගය



A033 මාර්ගය

5.9 දේශගුණික ප්‍රත්‍යාස්ථිතිය වැඩි දියුණු කිරීමේ ව්‍යාපෘතිය (Crip)


5.9.1 හැඳින්වීම.

ලෝක බැංකුව ජා.සං.ස. යටතේ දේශගුණික අවදානම වැළැක්වීම වැඩි දියුණු කිරීම හා හදිසි ගංවතුර පාලනය හා ප්‍රත්‍යාස්ථිති වැඩ සඳහා එ.ජ.ඩො. මිලියන 110 ක් දේශගුණික ප්‍රත්‍යාස්ථිති ව්‍යාපෘතිය සඳහා මූල්‍යායනය කරනු ලබයි. මෙම ව්‍යාපෘතියේ අරවුණ වන්නේ දේශගුණික අවදානමට අනාවරණය වූ පුද්ගලයන්ගේ අනාරක්ෂිත තත්ත්වය අවම කිරීම හා ආපදා වලට මුහුණ දෙන ව්‍යාපෘති ලාභීන්ට ආපදා වලට සාර්ථක ලෙස ප්‍රතිචාර දැක්වීමේ හැකියාව වැඩි දියුණු කිරීමයි. මෙම ව්‍යාපෘතිය වාරි මාර්ග හා ජල සම්පත් කළමනාකරණ අමාත්‍යාංශය යටතේ වන ව්‍යා.ක.ඒ. මගින් ක්‍රියාත්මක කෙරේ.

පසුව රටේ මහාමාර්ග ජාලය සඳහා ක්‍රියාත්මක කිරීමේ ආයතනයක් ලෙස මාර්ග සංවර්ධන අධිකාරිය හඳුනාගත් අතර, ප්‍රවාහන මාර්ග සම්බන්ධතාවල මාර්ග යටිතල ව්‍යුහයන්වල ප්‍රත්‍යාස්ථිතිය වැඩි දියුණු කිරීම සහ ආපදා සමය තුල අඛන්ඩව ක්‍රියා කරවීම සහතික වීම හා හදිසි ප්‍රතිචාරවලට පහසුකම් සලසීම සඳහා එ.ජ.ඩො. මිලියන 36 ක් වෙන් කරනු ලැබීය. ප්‍රධාන ආයෝජනයන් මාර්ග යටිතල ව්‍යුහයන්, ප්‍රවේශයන් කාලගුණ ප්‍රත්‍යාස්ථිතිය විශේෂයෙන්ම, බෑවුම් ස්ථාවරකරණය හා ජලා පවාහන වැඩි දියුණු කිරීම කෙරෙහි අවධානය යොමු කරනු ඇත. පවත්නා දිය මංකඩ ස්ථානවල පාලම් ඉදි කිරීම මගින්, ප්‍රධාන අනාරක්ෂිත දිය මංකඩ මාරු ශක්තිමත් කරන ලැබේ.

5.9.2 ක්‍රියාත්මක කිරීමේ පිළිවෙල

ව්‍යා.ක.ඒ. විසින් ව්‍යාපෘති කටයුතු මෙන්ම ව්‍යාපෘතියේ සියලුම මූල්‍ය කළමනාකරණ අංශයන් සම්බන්ධීකරණය කරනු ලබයි. ව්‍යා.ක.ඒ. විසින් කොන්ත්‍රාත්කරුවන්ට ගෙවීම් කිරීම සඳහා අදාල ත්‍රි.නි. අරමුදල් මාරු කරයි. මා.සං.අ. ක්‍රියාත්මක කිරීමේ නියෝජිතායතනය වෙනුවෙන් සැලසුම් නිම කිරීම, ප්‍රසම්පාදන අධීක්ෂණ වැඩ සඳහා වගකීම දරයි.



5.9.3 ක්‍රියාත්මක වෙමින් පවතින ව්‍යාපෘති

අ) පාලම් යළි ඉදිකිරීම

අංකය	කොන්ත්‍රාත් යෝජනාවලිය	විස්තරය
1	CRIP/WORKS/RDA/NCB/300	දෙහිවල මහරගම මාර්ගයේ (B094) අංක 4/1 නැදිමාලේ පාලම යළි ඉදිකිරීම
2	CRIP/WORKS/RDA/NCB/302	මඩකලපුව - තිරිකොණ්ඩියාමඩු - ත්‍රිකුණාමලය මාර්ගයේ (A015) අංක 1/1 (කොඩ්ඩමුනායි) පාලම යළි ඉදි කිරීම
3	CRIP/WORKS/RDA/NCB/303	පොළොන්නරුව - තඹල - සුංගාවිල - සෝමාවතිය මාර්ගයේ (B488) අංක 4/3 හා 27/6 පාලම් පුළුල් කිරීම සහ අංක. 10/2 හා 10/6 පාලම් යළි ඉදිකිරීම
4	CRIP/WORKS/RDA/NCB/304	කොළඹ - රත්නපුර - වැල්ලවාය මාර්ගයේ (A04) අංක 53/1 පාලම
5	CRIP/WORKS/RDA/NCB/313	ගංගොඩවිල - බොරලැස්ගමුව මාර්ගයේ (B134) කටු ඇල හරහා පාලම
6	CRIP/WORKS/RDA/NCB/314	බෝගහවැව - පුල්මුඩේ මාර්ගයේ (B060) ජල පැන්නුම අංක 3/1 පාලම
7	CRIP/WORKS/RDA/NCB/315	කතරගම - සෙල්ල කතරගම මාර්ගයේ (B202) අංක 2/1 බෝක්කුව
8	CRIP/WORKS/RDA/NCB/316	ඇල්ල - කන්තලේ මාර්ගයේ (B010) අංක. 23/3 පාලම යළි ඉදි කිරීම
9	CRIP/WORKS/RDA/NCB/317	මාකඳුර - බඩල්ගම මාර්ගයේ අංක 3/3 පාලම

ආ) බැවුම් ස්ථායිකරණය

අංකය	කොන්ත්‍රාත් යෝජනාවලිය	විස්තරය
1	CRIP/WORKS/RDA/NCB/305	මහනුවර - පදියතලාව - මහියංගනය මාර්ගයේ (A026) අංක. 37/5 හා 41/10 බෝක්කු අතර අස්ථාවර බැවුම් කොටස් 7 නිවැරදි කිරීම
2	CRIP/WORKS/RDA/NCB/306	මහනුවර - මහියංගනය මාර්ගයේ (A026) අංක 43/04 හා 51/02 බෝක්කු අතර අස්ථාවර බැවුම් 4 නිවැරදි කිරීම
3	CRIP/WORKS/RDA/NCB/307	මහනුවර - මහියංගනය මාර්ගයේ (A026) අංක 55/03 හා 60 වන කි.මී. අතර අස්ථාවර බැවුම් 4 නිවැරදි කිරීම
4	CRIP/WORKS/RDA/NCB/308	පේරාදෙණිය - බදුල්ල මාර්ගයේ (A005) බෝක්කු අංක 75/10 හා 76/2 අතර හග්ගල අස්ථාවර බැවුම් නිවැරදි කිරීම.
5	CRIP/WORKS/RDA/NCB/309	කොළඹ - රත්නපුර - වැල්ලවාය මාර්ගයේ (A004) බෝක්කු අංක 185/6 හා 194/11 අස්ථාවර බැවුම් 2 ක් නිවැරදි කිරීම.
6	CRIP/WORKS/RDA/NCB/310	කෑගල්ල - බුලත්කොහුපිටිය - කරවනැල්ල මාර්ගයේ (A021) අංක 20/7- 20 හා 22/1-22/2 අස්ථාවර බැවුම් නිවැරදි කිරීම.
7	CRIP/WORKS/RDA/NCB/311	අවිස්සාවේල්ල - හැටන් - නුවරඑළිය මාර්ගයේ (A007) අංක. 48/2 පාලම අසල අස්ථාවර බැවුම නිවැරදි කිරීම.

5.9.4 2015 වර්ෂය අවසානයේ දේශගුණික ප්‍රත්‍යාස්ථායි වැඩි දියුණු කිරීමේ ව්‍යාපෘතිය හා ප්‍රවාහන අඛන්ඩතා අනු වැඩ සටහනේ ප්‍රගතිය (CRIP)

කොන්ත්‍රාත් අංකය	වැඩ විස්තරය	කොටස / පාලම	කොන්ත්‍රාත් අගය සංශෝධිත (රු.මිලි)	ආරම්භක දිනය	නිම කරන දිනය	2015 දෙසැ. දක්වා වියදම වැට රහිත (රු.මි)	2015 අවසානයේ භෞතික ප්‍රගතිය %
CRIP/WORKS/RDA/NCB/300	දෙහිවල - මහරගම මාර්ගය (B094) පාලම යළි ඉදිකිරීම	නැදිමාල පාලම අංක (4/1)	188.12	2014.11.26	2016.02.25	71,500	44.00%
CRIP/WORKS/RDA/NCB/303	පොළොන්නරුව - තඹල-සුංගාවිල-සෝමාවතිය මාර්ගයේ (B488) පාලම යළි ඉදි කිරීම හා පුළුල් කිරීම	අංක 4/3, 27/6 පාලම් යළි ඉදිකිරීම හා අංක 10/2, 10/6 පාලම් පුළුල් කිරීම.	196.75	2014.12.31	2016.06.29	99,100	68.00%
CRIP/WORKS/RDA/NCB/305	අස්ථාවර බෑවුම් නිවැරදි කිරීම	මහනුවර - මඟියංගනය මාර්ගයේ කි.මී. 29+050 හා අංක 42/08 බෝක්කුව අතර.	152.98	2014.12.30	2016.03.29	53,300	70.39%
CRIP/WORKS/RDA/NCB/306		මහනුවර - මඟියංගනය මාර්ගයේ අංක 43/04 හා 51/02 බෝක්කු අතර	183.45	2014.12.30	2016.03.29	66,100	58.74%
CRIP/WORKS/RDA/NCB/307		මහනුවර-මඟියංගනය මාර්ගයේ අංක 55/3 බෝක්කුව හා 60 වන කි.මී. අසල.	247.91	2014.12.30	2016.03.29	36,100	4.20%

5.9.5 ආරම්භ කිරීමට ඇති ව්‍යාපෘති පිළිබඳ වර්තමාන තත්ත්වය

1) මඩකලපුව - තිරිකොණ්ඩියාමඩු - ත්‍රිකුණාමලය මාර්ගයේ (A015) අංක 1/1 කොඩ්ඩමුනේ පාලම -
   කොන්ත්‍රාත්තුව රාසං හා නිනිස වෙත ප්‍රදානය කෙරිණි.
   ආරම්භ කිරීමේ දිනය 2015 දෙසැම්බර් 03

2) බෝගස්වැව - පුල්මුඩේ මාර්ගයේ (ජල පැන්නුම් මග) අංක 3/1 පාලම
   ලංසු ඇගයීම සිදු කෙරෙමින් පවතී.

3) ගංගොඩවිල - බොරලැස්ගමුව මාර්ගයේ කටුඇල හරහා පාලම.
   ලංසු ලේඛන පිළියෙල කෙරිණි. ප්‍රසම්පාදනය සිදු කෙරෙමින් පවතී.

4) කොළඹ - රත්නපුර - වැල්ලවාය මාර්ගයේ අංක 53/1 පාලම

සියලුම ජල විද්‍යා අධ්‍යයනයක් නිම කෙරිණි. සැලසුම් හා ඇස්තමේන්තු පිළියෙල කෙරෙමින් පවතින අතර එය 2016 ජනවාරි මස අවසානයේ නිම කෙරෙනු ඇත.

5) කතරගම - සෙල්ල කතරගම මාර්ගයේ (B202) අංක 2/1 පාලම
සැලසුම් හා ඇස්තමේන්තු පිළියෙල කෙරෙමින් පවතින අතර එය 2016 ජනවාරි මස අවසානයේ නිම කෙරේ.

6) පේරාදෙණිය - බදුල්ල මාර්ගයේ (A005) හග්ගල අංක 75/10 හා 76/2 බෝක්කු අතර අස්ථාවර බෑවුම් නිවැරදි කිරීම.
ජා.ගොා.ප.සං. විසින් ජනවාරි 31 වන විට සැලසුම් හා ඇස්තමේන්තු ඉදිරිපත් කෙරේ.
මූ.පා.ප. (මූලික පාරිසරික පරීක්ෂාව) 2016 මාර්තු වන විට සූදානම් කෙරෙනු ඇත.

7) අවිස්සාවේල්ල - හැටන් මාර්ගයේ (A007) ගිනිගත්හේන අංක 48/2 පාලම අසල අස්ථාවර බෑවුම් නිවැරදි කිරීම
2016 ජනවාරි 31 දිනට ජා.ගොා.ප.. විසින් සැලසුම් හා ඇස්තමේන්තු ඉදිරිපත් කරනු ඇත.

8) කොළඹ - රත්නපුර - වැල්ලවාය - මඩකලපුව මාර්ගයේ (A004) බෝක්කු 185/6 , 194/11 යන ස්ථානවල අස්ථාවර බෑවුම් නිවැරදි කිරීම හා කෑගල්ල - බුලත්කොහුපිටිය - කරවනැල්ල මාර්ගයේ (A021) 20 කි.මී. අසල අස්ථාවර බෑවුම නිවැරදි කිරීම.
ජා.ගොා.ප.ස. විසින් සැලසුම් හා සමීක්ෂණ ආරම්භ කළ යුතු වේ.

5.9.5 ප්‍රගතියට සීමාවන්

විෂය පථය වෙනස් වීම නිසා ඇතිවූ විචලනයන් (දේශගුණික වෙනස්කම්)



දෙහිවල - මහරගම මාර්ගයේ (B094) අංක 4/1 නැදිමාල පාලම.



පොළොන්නරුව - සෝමාවතිය මාර්ගයේ (B274) අංක 4/3, 10/2, 10/6, 27/6 පාලම්



මහනුවර - මහියංගනය - පදියතලාව මාර්ගයේ (A026) අංක 37/5 හා 41/10 දරණ බෝක්කු අතර පිහිටි අස්ථාවර බෑවුම් 7 ක් නිවැරදි කිරීම.



මහනුවර - මහියංගනය මාර්ගයේ (A026) අංක 55/03 දරණ බෝක්කුව හා 60 වන කි.මී. අසල අස්ථාවර බෑවුම් කොටස් 4 ක් නිවැරදි කිරීම.

5.10 ජාතික මහාමාර්ග ආංශික ව්‍යාපෘතිය

5.10 ජාතික මහාමාර්ග ආංශික ව්‍යාපෘතිය

ජාතික මහාමාර්ග ආංශික ව්‍යාපෘතිය ශ්‍රී ලංකාවේ ක්‍රියාත්මක කරන ලද ප්‍රථම ආංශික ණය මුදල් ව්‍යාපෘතියයි. ව්‍යාපෘතියේ අරමුණ වන්නේ, රටේ මහාමාර්ග ජාලයේ කාර්ය භාරය ඉහළ නැංවීම මගින්, ආර්ථික හා සාමාජීය සංවර්ධනය ප්‍රවර්ධනය කිරීමයි. දැනට ජා.ම.ආ.ව්‍යා. ව්‍යාපෘති 03 ක් ක්‍රියාත්මක කරනු ලබන අතර ඉන් දෙකකට අරමුදල් සපයනු ලබන්නේ ආ.සං.බැ. වන අතර, අනෙකට ජාත්‍යන්තර සංවර්ධනය සඳහා ඔපෙක් අරමුදල විසින් අරමුදල් සපයනු ලබයි.

5.10.1 ආ.සං.බැ. ණය මුදල් අංක. 2217 ශ්‍රී.

ආසියානු සංවර්ධන බැංකුව විසින්, ප්‍රතිසංස්කරණ වැඩ සටහනට සහාය දෙන ලද අතර, ජාතික මහාමාර්ග ජාලය වැඩි දියුණු කිරීම හා තත්ත්වය නැංවීමට මූල්‍ය සහාය ලබා දෙනු ලබයි. ආසියානු සංවර්ධන බැංකු අධ්‍යක්ෂ මණ්ඩලය 2005 දෙසැම්බර් 15 දින ජාතික මහාමාර්ග ආංශික ව්‍යාපෘතිය සඳහා මූල්‍ය සහාය ලබා දීමට එහි සාමාන්‍ය ප්‍රාග්ධනයෙන් ඩො.මිලියන 150 ණය මුදලක් අනුමත කරන ලදි. මෙය ලංකාවේ ආංශික ව්‍යාපෘතියකට දෙන ලද ප්‍රථම ණය මුදලයි. ණය මුදල සඳහා 2006 දෙසැම්බර් 14 දින කොළඹදී අත්සන් තබන ලද අතර, එය 2007 පෙබරවාරි 20 දින සිට ක්‍රියාත්මක විය.

ව්‍යාපෘතියේ නිමැවුම් වන්නේ:

(i) ප්‍රතිපත්ති හා ආයතනමය සහාය සඳහා සහභාගය.

මෙම ව්‍යාපෘතිය මහාමාර්ග හා මාර්ග සංවර්ධන අමාත්‍යාංශයට හා මාර්ග සංවර්ධන අධිකාරියට ප්‍රතිපත්ති හා ආයතනමය අංශ සඳහා උදා: මාර්ග අංශ මධ්‍ය සැලැස්ම, ප්‍රවාහන අංශ ප්‍රතිපත්තිය, නියාමන රාමුව, මාර්ග වර්ගීකරණය, මාර්ග ආරක්ෂාව හා බරවාහන පාලනය, සමාලෝචනය හා ක්‍රියාත්මක කිරීම වශයෙනි.

තවද ව්‍යාපෘතිය මා.සං.අ. යේ මානව සම්පත් සංවර්ධනය, ප්‍රතිපත්ති හා උපක්‍රම සමාලෝචනය හා වැඩි දියුණු කිරීම, වර්තමාන හා අනාගත වැඩ භාරය, සුදුසුකම් හා කුසලතා අවශ්‍යතා, කාර්ය මණ්ඩල හිඟ / අතිරික්තයන්, පුහුණු අවශ්‍යතා, බඳවා ගැනීමේ උපායන්, කාර්ය සාධන ඇගයීම් ක්‍රම හා වෘත්තීය සංවර්ධන වැඩ සටහන් තක්සේරු කිරීම ආදියයි.

ම හා මා සං අමාත්‍යාංශයට සහාය වීමට හා සියලුම ව්‍යාපෘතිවල ප්‍රගතිය පිළිබඳව විශේෂයෙන් විදේශ අරමුදල් ව්‍යාපෘති පිළිබඳව පරීක්ෂාවෙන් සිටීමට, ජාත්‍යන්තර ආයතනමය හා ප්‍රතිපත්ති සංවර්ධන උපදේශකයෙකු හා ජාතික ආයතනමය ප්‍රතිපත්ති සංවර්ධන උපදේශකයෙකු සේවයේ යොදවන ලදි.

(ii) ජාතික මහාමාර්ගවල තත්ත්වය නැංවීම හා කාර්ය සාධනය පදනම් වූ නඩත්තුව.

කොටසේ විෂය පථය - 2008 පෙබරවාරි මස ආ.සං.බැ. දූත කණ්ඩායම විසින්, මාර්ග පුනරුත්ථාපයන හා තත්ත්වය නැංවීම සමාලෝචනය කරන ලද අතර ව්‍යාපෘතිය යටතේ පවතින සීමිත අරමුදල් සැලකිල්ලට ගෙන බහුවිධ මිනුම් දඬු විශ්ලේෂණය එනම් (i) ආර්ථික ප්‍රතිලාභ, (ii) සමාජීය ප්‍රතිලාභ සහ (iii) මහාමාර්ග ජාලය සංවර්ධනය හා ආර්ථික සංවර්ධනය පිළිබඳ කාර්ය භාරය මගින්, විෂය පථය අඩු කිරීමට පහත සඳහන් මාර්ග මුල් ආයෝජන සැලැස්මෙන් තෝරා ගන්නා ලදි. තෝරා ගන්නා ලද මාර්ග (i) උතුරු - නැගෙනහිර - බටහිර මාර්ග ප්‍රවේශය, (ii) කඳුකර මාර්ග වේ.

අ) මහාමාර්ග තත්ත්වය නැංවීම.

සමස්ත කි.මී. 225.5 ක මාර්ග පහත සඳහන් පරිදි තෝරා ගන්නා ලදි:

මාර්ග කොටස	දිග (කි.මී.)
ICB-01: A- 012 පුත්තලම - නොච්චියාගම (කි.මී. 3.0 - කි.මී. 53)	83
ICB-02: A -026 උඩතැන්න - මහියංගනය (කි.මී. 31.2 - කි.මී. 72.2)	41
ICB-03: A -005 නුවරඑළිය - බදුල්ල (කි.මී. 75.5 - කි.මී. 133.0)	57.5
ICB-04: A -006 හබරණ - කන්තලේ (කි.මී. 113 - කි.මී. 157)	44
එකතුව	**225.5**

ඊළඟ අවුරුදු 20 තුල ප්‍රක්ෂේපනය කරන ලද රථවාහන ඉල්ලුම සැපිරීම සඳහා අවශ්‍ය පරිදි මාර්ග පුළුල් කිරීම තත්ත්වය නැංවීම හා එකෙල්ල කිරීම සිදු කරනු ලැබේ. මාර්ග පෘෂ්ඨ ඇතිරීම අවුරුදු 10 ක ජීවිත කාලයක් සඳහා වන අතර මනා නඩත්තුව හා ඇක්සල් බර පාලනය කිරීමෙන් වයස අවු. 15–20 කාලයක් දිගු කළ හැකිය. පාලම්, කාණු ව්‍යුහයන් හා බෝක්කු අවශ්‍ය පරිදි වැඩි දියුණු හා ප්‍රති සම්පාදනය කරනු ලැබේ. ව්‍යාපෘති මහාමාර්ගවල ඇක්සල් බර මිනුම් අවශ්‍යතා හඳුනාගනු ලබන අතර, සිවිල් වැඩ කොන්ත්‍රාත්වල කොටසක් ලෙස බර කිරුම් ස්ථාන සපයනු ඇත. ඉංජිනේරු සැලසුම්වලට මාර්ග ආරක්ෂණ විගණනය ගොඩ නගන අතර, ඉදිකිරීම් කාලය තුල එය අනුගමනය කරනු ලැබේ.

(ආ) කාර්යසාධන පදනම් වූ නඩත්තුව.

පහත සඳහන් ජාතික මහාමාර්ගවල කාර්ය සාධනය පදනම් වූ නඩත්තු නියමු වැඩ සටහනක් 2011.03.02 සිට 2012.09.01 දක්වා දේශීය පුද්ගලික කොන්ත්‍රාත්කරුවන් මගින් ක්‍රියාත්මක කරන ලද අතර එය සාර්ථකව නිම කෙරිණි.

- අවිස්සාවේල්ල - හැටන් මාර්ගය කි.මී. 72.0
- හෝමාගම - රත්නපුර මාර්ගය කි.මී. 72.2

ආසියානු සංවර්ධන බැංකුව ජාතික මහාමාර්ග ආංශික ව්‍යාපෘති ණය මුදලේ ඉතුරුම් එ.ජ.ඩො. මිලියන 4 යොදා ගනිමින්, බත්තරමුල්ල - ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවතේ මහාමාර්ග ලේකම් කාර්යාල ගොඩනැගිල්ලේ පළමු මට්ටම් තුන ඉදි කිරීමට තම එකඟතාවය පළ කරන ලදි.


දැන් මෙම ණය මුදල් අංක. 2767 ශ්‍රී අතිරේක මූල්‍යායන ණය මුදල ලෙස වෙනස් කරන ලද අතර, මහාමාර්ග ලේකම් කාර්යාල තට්ටු 10 ක් දක්වා නිම කිරීමට අවශ්‍ය කෙරෙන අතිරේක මුදල් සඳහා දේශීය අරමුදල් සපයා ගත යුතුව තිබේ.

2015 - වර්ෂය තුල කාර්යයන්හි ප්‍රගතිය ආ.සං.බැ. ණය අංක 2217 ශ්‍රී.

මාර්ග අංකය	මාර්ගයේ නම	ආරම්භක දිනය	ඉලක්කය නිම කරන දිනය	දිග (කි.මී.)	වැට රහිත කොන්ත්‍රාක් අගය (රු.මිලි)	අද දක්වා වැට සහිත වියදම (රු.මිලි.)	දෙසැ. වන විට භෞතික ප්‍රගතිය (%)	සටහන්
A012	පුත්තලම - අනුරාධපුර මාර්ගය පුනරුත්ථාපනය හා තත්ත්වය නැංවීම	2009.08.01	2012.08.31	00-830 හා 0-21= 85.1	4,849.3	4,880,371	100%	නිමකර මාසංඅ වෙත භාර දෙන ලදි.
A026	මහනුවර - මහියංගනය මාර්ගය පුනරුත්ථාපනය හා තත්ත්වය නැංවීම	2008.11.01	2012.02.29	31.3-72.1=40.8	5,360.2	5,434,870	100%	නිමකර මාසංඅ වෙත භාර දෙන ලදි.
A005	නුවරඑළිය -බදුල්ල මාර්ගය පුනරුත්ථාපනය හා තත්ත්වය නැංවීම	2008.12.01	2012.07.31	75.2-130.1=54.9	5,808.6	5,876,494	100%	නිමකර මාසංඅ වෙත භාර දෙන ලදි.
A006	හබරණ - කන්තලේ මාර්ගය පුනරුත්ථාපනය හා තත්ත්වය නැංවීම	2008.07.11	2010.08.28	113.0-156.6 = 43.6	2,407.9	2,705,274	99.7	නිමකර මාසංඅ වෙත භාර දෙන ලදි.
A004	නුගේගොඩ - හෝමාගම මාර්ගය පුනරුත්ථාපනය හා තත්ත්වය නැංවීම	2011.06.01	2013.02.26	1.4-15.5 = 14.1	1,413.8	1,583,456	99.7%	නිමකර මාසංඅ වෙත භාර දෙන ලදි.
	මහාමාර්ග ලේකම් කාර්යාලය ඉදි කිරීම	2010.11.04	2014.06.25 (සිවිල් වැඩ)	සම්පූර්ණ ගොඩනැගිල්ල	1,963.2	2,268.997	99.7%	අභ්‍යන්තර වැඩ සිදු කෙරෙමින් පවති
A004 හා A007	කාර්ය සාධනය පදනම් වූ නඩත්තු කොන්ත්‍රාත්තුව	2011.03.02	2012.09.01	60-96 කොර.ව.මා.මාර්ගය සහ 0-72 AHN = 108	294.9	323.317	100%	නිමකර මාසංඅ ට භාරදී ඇත

5.10.2 පරිපූරක ණය (ආ.සං.බැ. ණය අංක. 2767 ශ්‍රී)

සිතියම 14: පරිපූරක ණය යටතේ මාර්ග ව්‍යාපෘති (ආ.සං.බැ. ණය අංක. 2767 ශ්‍රී)



ආ.සං.බැ.වේ සාමාන්‍ය ප්‍රාග්ධන සම්පත්වලින් එ.ජ.ඩො. මිලියන 85 ක පළමු අතිරේක මූල්‍යාධාරය ජා.මා.ආ.ව්‍යා. යටතේ ගෙවීම 2011 අගෝස්තු 5 දින අනුමත කරන ලද අතර 2011 දෙසැම්බර් 14 දින අත්සන් තබන ලදුව, 2012 පෙබරවාරි 23 දින සිට ක්‍රියාත්මක කෙරිණි. පළමුවැනි අතිරේක මූල්‍යයනයට ජාතික මහාමාර්ග කි.මී. 62 පුනරුත්ථාපනය හා තත්ත්වය නැංවීම අයත් විය.

ජාතික මහාමාර්ග ආංශික ව්‍යාපෘතියේ පළමු අතිරේක මූල්‍යයනය මගින් බස්නාහිර පළාත් මාර්ග කි.මී. 31.60 බස්නාහිර පළාතේ කි.මී. 17.80 ක් ඇතුළු ජාතික මහාමාර්ග කි.මී. 49.4 වැඩි දියුණු කරන ලදි. මාර්ග සංවර්ධන ව්‍යාපෘතියේ ප්‍රතිලාභ දකුණු හා බස්නාහිර පළාත්වලට හිමි විය.

මෙම ව්‍යාපෘතියේ ප්‍රධාන නිමැවුම වූයේ කි.මී. 49.4 යුක්ත මාර්ග කොටස් හයක් පුනරුත්ථාපනය හා තත්ත්වය නැංවීම වන අතර ජා.මා.ආ.ව්‍යා. යේ පළමු අතිරේක මූල්‍යයනය යටතේ තෝරාගත් මාර්ග කොටස් මතු සඳහන් වගුවේ දැක්වේ.

ජා.මා.ආ.ව්‍යා. පළමු මූල්‍යායනය සඳහා තෝරාගත් මාර්ග කොටස්.

අංකය	මාර්ග කොටස	දිග (කි.මී.)
CP1	A024: මාතර - අකුරැස්ස මාර්ගය	3.4
CP2	B153: හික්කඩුව - දක්ෂිණ අධිවේගී මාර්ගය	14.4
CP3	B157: අළුත්ගම - දක්ෂිණ අධිවේගී මාර්ගය	10.9
CP4	B207: කටුකුරුන්ද - නැබොඩ මාර්ගය	2.7
CP5	A004: කිරුළපන - ගොඩගම මාර්ගය	5.3
CP7	B084: පිළියන්දල අතුරු මාර්ගය ඇතුළු පාමංකඩ - කැස්බෑව මාර්ගය	12.7
එකතුව		**49.4**

මෙම මාර්ග ප්‍රක්ෂේපනය කරන ලද අවු. 20 ක අනාගත රථවාහන ඉල්ලුම සැපිරීමට අවශ්‍ය ලෙස පුළුල් කර, තත්ත්වය නංවා, එකෙල්ල කෙරිණි. පෘෂ්ඨ ඇතුරුම අවුරුදු 10 ක ජීවිත කාලයක් සඳහා සැලසුම් කරන ලද අතර මනා නඩත්තුව මගින් එය අවු. 15-20 අතර කාලයක් දීර්ඝ කළ හැකිය. පාලම්, කාණු ව්‍යුහයන් හා බෝක්කු වැඩි දියුණු කළ අතර අවශ්‍ය පරිදි ප්‍රති සම්පාදනය කෙරිණි. මාර්ගයේ ඇක්සල් බර අවශ්‍යතාව හඳුනාගත් අතර, සිවිල් වැඩ කොන්ත්‍රාත්තුවට අනුව, බර කිරුම් ස්ථාන සපයනු ලැබේ. මාර්ග ආරක්ෂාව ඉංජිනේරු සැලසුම්වල ගොඩ නහා ඇති අතර ඉදිකිරීම් තුලදී එය අනුගමනය කෙරේ.

5.10.3 ජා.සං.ඔ.අ. - ණය අංක. 1355 පි.

ජාතික මහාමාර්ග ආංශික ව්‍යාපෘතිය යටතේ, කොළඹ - රත්නපුර - වැල්ලවාය - මඩකලපුව මාර්ගයේ විලාසිතා නිවස සිට හෝමාගම දක්වා කොටස පුනරුත්ථාපනය කිරීම ජාත්‍යන්තර සංවර්ධනය සඳහා ඔපෙක් අරමුදල විසින් අරමුදල් සපයනු ලැබිය. 2009 ඔක්තොම්බර් 22 පවත්වන ලද සමාලෝචන රැස්වීමේදී එ.ජ.ඩො. මිලියන 8 ක් ලබාදීම ඔපෙක් අරමුදලේ මහජන මෙහෙයුම් නිලධාරියා විසින් අනුමත කරන ලදි.

මෙම ඔපෙක් අරමුදල් කොළඹ - රත්නපුර - වැල්ලවාය - මඩකලපුව මාර්ගයේ විලාසිතා නිවස සිට නුගේගොඩ දක්වා (කි.මී. 7.5 – කි.මී. 9.4) සහ නුගේගොඩ සිට හෝමාගම දක්වා (කි.මී. 9.8 – කි.මී. 24.5) දක්වා කොටස සඳහා වේ. ව්‍යාපෘතිය විසින් කි.මී. 17.1 ජාතික මහාමාර්ග කොටස මංතීරු 4 ක මාර්ගයක් ලෙස තත්ත්වය නංවා මෙම ප්‍රවේශයේ රථවාහන තදබදය අඩු කිරීම සඳහා මෙහෙයුම් වේගය වැඩි කිරීමට කටයුතු කරනු ඇත.

2015 වර්ෂය තුල කටයුතුවල ප්‍රගතිය - (ආ.සං.බැ. ණය අංක. 2767 ශ්‍රී)

මාර්ග අංකය	මාර්ගයේ නම	ආරම්භක දිනය	ඉලක්කය නිම කරන දිනය	දිග (කි.මී.)	වැට රහිත කොන්ත්‍රාත් අගය (රු.මිලි)	අද දක්වා වැට සහිත වියදම (රු.මිලි.)	2015 දෙසැ. වන විට භෞතික ප්‍රගතිය (%)	සටහන්
A024	මාතර - ගොඩගම මාරගය පුනරුත්ථාපනය හා වැඩි දියුණු කිරීම	2013.05.15	2014.05.15	0.1-3.5= 3.4	754.9	684.888	100%	නිමකර මා.සං.අ. ට භාර දෙන ලදී
B153	හික්කඩුව දක්ෂිණ අධිවේගි මාර්ගය පුනරුත්ථාපනය හා වැඩි දියුණු කිරීම	2013.05.15	2015.08.31	0-14.34=14.34	1562.86	1325.712	100%	සැලකිය යුතු ප්‍රමාණයක් නිම කෙරිණි.
B157	අළුත්ගම දක්ෂිණ අධිවේගි මාර්ගය පුනරුත්ථාපනය හා වැඩි දියුණු කිරීම	2013.05.15	2015.08.31	42.6-53.67=11.07	2089.1	1835.576	100%	සැලකිය යුතු ප්‍රමාණයක් නිම කෙරිණි.
B207	කටුකුරුන්ද - නාගොඩ මාර්ගය පුනරුත්ථාපනය හා වැඩි දියුණු කිරීම	2012.05.25	2014.01.31	0-2.72=2.72	391.03	417.791	100%	නිමකර මා.සං.අ. ට භාර දෙන ලදී.
A004	කිරුළපන - ගොඩගම මාර්ගය පුනරුත්ථාපනය හා වැඩි දියුණු කිරීම	2013.12.09	2015.11.30	1-15.36=14.36	1246.68	934.831	100%	සංශෝධිත වැඩ සටහනට අනුව
B084	පාමංකඩ කැස්බෑව මාර්ගය පුනරුත්ථාපනය හා වැඩි දියුණු කිරීම	2013.03.28	2015.12.31	11-13.8=12.7	3322.6	2682.393	98.74%	සංශෝධිත වැඩ සටහනට අනුව කටයුතු කරමින් පවතී.

හික්කඩුව - දක්ෂිණ අධිවේගි මාර්ගයේ ප්‍රගතිය - ඡායාරූප







අළුත්ගම - දක්ෂිණ අධිවේගී මාර්ගය ප්‍රගතිය - ඡායාරූප



වැඩ නිම කළ කි.මී. 52 මාර්ග කොටස



වැඩ නිම කළ අංක 43/5 පාලම

කිරුලපන - ගොඩගම මාර්ගයේ ප්‍රගතිය - ඡායාරූප



කි.මී. 06+375 – කි.මී. 06+520 - දක්වා මහරගම නගරයේ මාර්ග සලකුණු කිරීම - වමපස



කි.මී. 09+970 නිම කළ පදික පාලම

පාමංකඩ - කැස්බෑව මාර්ගයේ ප්‍රගතිය - ඡායාරූප



කි.මී. 4+200~4+300 ප්‍රාථමික ස්ථරය [illegible] දකුණු පස



කි.මී. 4+300-4+400 ඇස්පල්ට් බයින්ඩර් සහ අතුරමින් - දකුණු පස

5.10.4 දක්ෂිණ මාර්ග සම්බන්ධතා ව්‍යාපෘතිය

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය විසින්, අධිවේගී මාර්ග සම්බන්ධතා ව්‍යාපෘතිය සඳහා ආසියානු සංවර්ධන බැංකුවෙන් ණය මුදලක් අයදුම් කරන ලද අතර එය අධිවේගී මාර්ග සම්බන්ධ කරන ජාතික මහාමාර්ග පුනරුත්ථාපනය / වැඩි දියුණු කිරීම සඳහා යොදා ගැනේ. මෙම අරමුදල් වලින් කොටසක් ව්‍යාපෘතියේ ඉදිකිරීම් අධීක්ෂණය හා කොන්ත්‍රාත් කළමනාකරණය සඳහා භාවිතා කළ යුතු වේ.

පුනරුත්ථාපන / වැඩි දියුණු කිරීම් වලට, සැකසීම්, භූමි වැඩ, මාර්ග පුළුල් කිරීම්, පාලම් හා බෝක්කු, තිරස් කාණු, රැඳවුම් තාප්ප, පුළුල් කිරීම, යළි ඉදිකිරීම හා කළුගල් පාදම, ඇස්පල්ට් මිශ්‍රණ ඇතිරීම, මාර්ග උරිස්, මාර්ග සලකුණු කිරීම් හා සංඥාකරණය අයත් වේ.

පහත සඳහන් වගුවේ දැක්වෙන මාර්ගයන් රටේ බස්නාහිර පළාතේ පිහිටා ඇත.

කොන්ත්‍රාත් යෝජනාවලිය	මාර්ග කොටස	දිග (කි.මී.)
CP1	මොරටුව - පිළියන්දල මාර්ගයේ (B295) කි.මී. 2+620 සිට කි.මී. 5+120, රත්මලාන - මිරිහාන මාර්ගයේ (B389) කි.මී. 5+700 සිට කි.මී. 7+840 දක්වා සහ කිරුලපන - ගොඩගම මාර්ගයේ (A004) (කි.ම. 00+130 – කි.මී. 01+000) සහ (කි.මී. 15+360 – කි.මී. 16+280)	6.43
CP2	කැස්බෑව - පොකුණුවිට මාර්ගය (B084) (දකුණ) කැස්බෑව සිට පොකුණුවිට දක්වා (කි.මී. 13+800 – කි.මී. 28+180)	14.38
CP3	දක්ෂිණ අධිවේගී මාර්ගයේ සිට මාදුරුගොඩ දක්වා (B157) (නැගෙනහිර) කි.මී. (42+372 - කි.මී. 30+000)	12.372

කි.මී. = කිලෝ මීටර්

5.10.4.1 2015 වර්ෂය තුල කාර්යයන්වල ප්‍රගතිය (දක්ෂිණ මාර්ග සම්බන්ධතා ව්‍යාපෘතිය)

මාර්ග අංකය	මාර්ගයේ නම	ආරම්භක දිනය	ඉලක්ක නිම කරන දිනය	කොටස (කි.මී.)	දිග (කි.මී.)	භෞතික ප්‍රගතිය (%)	සටහන්
B-295 හා B-389	ස වි 1 - පුනරුත්ථාපනය හා තත්ත්වය නැංවීම මොරවුව - පිළියන්දල B295 හා රත්මලාන මිරිහාන මාර්ග B389	2015.04.22	2016.10.14	2.62-5.12 5.70-7.84	4.64	11.9%	වැඩ ක්‍රියාත්මක වෙමින් පවතී
B-084 හා A-004	ස වි 2 - පුනරුත්ථාපනය හා තත්ත්වය නැංවීම - කැස්බෑව-පොකුණුවිට B084 හා කිරුලපන -ගොඩගම මාර්ග A004			13.80-21.10 0.13-1.00 15.36-16.28	9.09		ටෙන්ඩර් ලේඛන නිකුත් කරමින් පවතී
B-157	සවි 3 - පුනරුත්ථාපනය හා තත්ත්වය නැංවීම - දක්ෂිණ අධිවේගී මාර්ගය - මාදුරුගොඩ මාර්ගය **B157(E)**			42.372-30.00	12.37		ලංසු ප්‍රති ඇගයීම සිදු කරමින් පවතී

5.11 මාර්ග ජාල වැඩි දියුණු කිරීමේ ව්‍යාපෘතිය

මාර්ග ජාල වැඩි දියුණු කිරීමේ ව්‍යාපෘතිය විසින්, චීන අරමුදල් සැපයූ ප්‍රමුඛතා මාර්ග ව්‍යාපෘති (PRP 1, PRP 2 දකුණ සහ PRP 2 උතුර) සහ උතුරු මාර්ග පුනරුත්ථාපන ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරනු ලබයි.

මාර්ග ජාල වැඩි දියුණු කිරීමේ ව්‍යාපෘතිය සඳහා ව්‍යාපෘති කළමනාකරණ ඒකකය (PMU-RNIP) 2015 වර්ෂය තුල විදේශ අරමුදල් ව්‍යාපෘති 4 ක් ක්‍රියාත්මක කිරීමේ නිරත විය.

මෙම මාර්ග ජාල වැඩි දියුණු කිරීමේ ව්‍යාපෘතිය පහත දැක්වෙන පරිදි වෙනම ව්‍යාපෘති අධ්‍යක්ෂවරුන් සමඟ ජ්‍යෙෂ්ඨ ව්‍යාපෘති අධ්‍යක්ෂවරයෙකු විසින් මෙහෙයවනු ලබයි.

1. උතුරු මාර්ග පුනරුත්ථාපන ව්‍යාපෘතිය.
   1.1 ව්‍යාපෘති අධ්‍යක්ෂ (C1A & C1B)
   1.2 ව්‍යාපෘති අධ්‍යක්ෂ (C2 & C3)
   1.3 ව්‍යාපෘති අධ්‍යක්ෂ (C7)
   1.4 ව්‍යාපෘති අධ්‍යක්ෂ (C11A & C11B)

2. ප්‍රමුඛතා මාර්ග ව්‍යාපෘතිය 1
   ව්‍යාපෘති අධ්‍යක්ෂ (ප්‍රමාව්‍යා 1)

3. ප්‍රමුඛතා මාර්ග ව්‍යාපෘතිය 2
   ව්‍යාපෘති අධ්‍යක්ෂ (ප්‍රමාව්‍යා 2- උ ක)
   ව්‍යාපෘති අධ්‍යක්ෂ (ප්‍රමාව්‍යා 2 -ද ක)

4. ප්‍රමුඛතා මාර්ග ව්‍යාපෘතිය 3 – අදියර 1
   ව්‍යාපෘති අධ්‍යක්ෂ (ප්‍රමාව්‍යා 3) 1
   ව්‍යාපෘති අධ්‍යක්ෂ (ප්‍රමාව්‍යා 3) 2

ජ්‍යෙෂ්ඨ ව්‍යාපෘති අධ්‍යක්ෂ කාර්යාලය විසින් ක්‍රියාත්මක කරන ලද කාර්යයන් වූයේ සියලුම ගිණුම් කටයුතු ඒකීය ක්‍රමයකට අනුව සිදු කිරීම, කොන්ත්‍රාත් ආරවුල් හා ගෙවීම් ආරවුල් සමථයට පත් කිරීම, මහාමාර්ග අමාත්‍යාංශය, විදේශ සම්පත් දෙපාර්තමේන්තුව, මුදල් අමාත්‍යාංශය හා ප්‍රදාන ආයතන සමඟ සම්බන්ධීකරණය හා ලිපි ගනුදෙනු වේ. තවද ඒකියත්වය පවත්වාගෙන යාම සඳහා අමාත්‍යාංශයට හා වෙනත් නියෝජිතායතන සඳහා ප්‍රගති වාර්තා පිළියෙල කිරීම වේ.

ව්‍යාපෘති පිළිබඳ සංක්ෂිප්ත විස්තරයක් මීලඟ පිටුවල දැක්වේ.

5.12 උතුරු මාර්ග පුනරුත්ථාපන ව්‍යාපෘතිය

උතුරු මාර්ග පුනරුත්ථාපන ව්‍යාපෘතියට අරමුදල් සපයන ලද්දේ චීන එක්සිම් බැංකුව විසිනි. උතුරු පළාත මුදාගත් වහාම ශ්‍රී ලංකා රජය උතුරු පළාතේ වේගවත් සංවර්ධනය සඳහා විස්තීර්ණ වැඩ සටහනක් දියත් කරන ලදි. මෙම වැඩ සටහනේ වැදගත් ආංශික කොටසක් වූයේ පළාතේ ආර්ථික හා සාමාජීය සංවර්ධනය ප්‍රවර්ධනය කිරීමට හැකි වනු පිණිස ප්‍රදේශය පුරා ඇති වැදගත් උපායාත්මක මාර්ග සම්බන්ධතා පුනරුත්ථාපනයයි. මෙම ව්‍යාපෘති වැඩ වලට උතුරු පළාතේ මාර්ග කි.මී. 512 ක් පුනරුත්ථාපනය හා වැඩි දියුණු කිරීමට ඇතුළත් විය.

සිතියම 15: උතුරු මාර්ග පුනරුත්ථාපන ව්‍යාපෘති



උතුරු පළාත මුදාගත් වහාම ශ්‍රී ලංකා රජය උතුරු පළාතේ වේගවත් සංවර්ධනය සඳහා විස්තීර්ණ වැඩ සටහනක් දියත් කරන ලදි. මෙම වැඩ සටහනේ වැදගත් ආංශික කොටසක් වූයේ පළාතේ ආර්ථික හා සාමාජීය සංවර්ධනය ප්‍රවර්ධනය කිරීමට හැකිවනු පිණිස ප්‍රදේශය පුරා ඇති වැදගත් උපායාත්මක මාර්ග සම්බන්ධතා පුනරුත්ථාපනය හා වැඩි දියුණු කිරීමයි.

මෙම මූල් පිරුමට සහයෝගය සඳහා, උතුරු මාර්ග පුනරුත්ථාපන ව්‍යාපෘතිය යටතේ හඳුනාගත් මාර්ග පුනරුත්ථාපනය හා වැඩි දියුණු කිරීමට චීන එක්සිම් බැංකුව විසින් එ.ජ.ඩො. මිලියන 423.88 ක් සපයන ලදි. මෙම ව්‍යාපෘතිය යටතේ සිවිල් වැඩ කොන්ත්‍රාත් 7 ක් ප්‍රදානය කර නිම කරනු ලැබීය.

මෙම ව්‍යාපෘතියේ වැඩ වලට උතුරු පළාතේ මාර්ග කි.මී. 473.60 වැඩි දියුණු කිරීම හා පුනරුත්ථාපනය කිරීම ඇතුළත්ය. ව්‍යාපෘතියේ ප්‍රගතිය පිළිබඳ සියලු විස්තර පහත සඳහන් වගුවේ දැක්වේ. මෙම සියලුම වැඩි දියුණු කිරීම් ව්‍යාපෘති 2015 මාර්තු මස නිම කෙරිණි.

කොන්ත්‍රාත් අංකය	වැඩ විස්තරය	කොටස	මූල් කොන්ත්‍රාත් අගය (රු.මිලි)	සංශෝධිත කොන්ත්‍රාත් අගය (රු.මිලි)	ආරම්භක දිනය	ඉලක්කය නිම කරන දිනය	අද දක්වා සමුච්චිත වියදම (රු.මිලි)	සමුච්චිත භෞතික ප්‍රගතිය (%)
RDA/NRRP/ CGF/C1A	මහනුවර-යාපනය මාර්ගය (ගල්කුලම කි.මී. 230)	ගල්කුලම කි.මී. 230	9,592.08	9,810.00	2011.02.07	2013.08.06	9,802.96	100%
RDA/NRRP/ CGF/C1B	මහනුවර - යාපනය මාර්ගය (කි.මී.230 යාපනය)	යාපනය කි.මී.230	9,532.92	9,817.00	2011.02.22	2013.08.21	9,781.02	100%
RDA/NRRP/ CGF/C2	නාවක්කුලි - කාරතිවු-මන්නාරම මාර්ගය	කි.මී. 14.64-81.37	6,532.50	7,056.63	2011.11.10	2014.05.09	7,057.73	100%
RDA/NRRP/ CGF/C3	පුත්තලම-මරිච්කඩෙ - මන්නාරම මාර්ගය	කි.මී.0.0- 113.0	9,887.50	10,827.51	2012.08.24	2015.02.23	10,620.88	100%
RDA/NRRP/ CGF/C7	යාපනය - පේදුරුතුඩුව යාපනය -කන්කසන්තුරේ යාපනය -පලාලි පුත්තූර් - මීසලේ	කි.මී. 0.0-33.5 කි.මී. 0.0-18.5 කි.මී. 0.0-17.3 කි.මී.0.0-13.65	10,185.00	10,641.50	2011.06.09	2013.12.08	10,556.81	100%
RDA/NRRP/ CGF/C11A	මුලතිවු-කෝකිලාය්-පුල්මුඩෙ මාර්ගය	කි.මී.0.0-42.4	5,777.45	5,958.12	2011.02.14	2013.08.13	5,958.13	100%
RDA/NRRP/ CGF/C11B	ඔඩ්ඩුසුඩාන් -නැදුන්කර්නි - මුලතිවු - පුලියන්කුලම මාර්ගය	කි.මී.0.0-10.8 කි.මී.0.0-41.8	5,741.30	5,943.88	2011.08.15	2014.02.14	5,943.87	100%

චීන සංවර්ධන බැංකුව අරමුදල් සැපයූ ප්‍රමුඛතා මාර්ග ව්‍යාපෘතිය.

ශ්‍රී ලංකා රජය හා චීන සංවර්ධන බැංකුව සහායෝගිතා රාමුවක් ස්ථාපිත කිරීම සඳහා අවබෝධතා ගිවිසුමක් අත්සන් තබන ලද අතර, අවබෝධතා ගිවිසුමට අනුව ආර්ථික සංවර්ධනයට ප්‍රබල වැදගත්කමක් සහිත යටිතල ව්‍යුහ සංවර්ධනය සඳහා මූල්‍ය සහාය දීමට චීන සංවර්ධන බැංකුව එකඟ විය.


මෙම ව්‍යාපෘතියේ අරමුණ වන්නේ, රට පුරා පැතිර ඇති ජාතික මහාමාර්ගවල තෝරාගත් කොටස්, ප්‍රමුඛතා පදනම මත පුනරුත්ථාපනය කිරීම මගින් ජාතික මාර්ග ජාලයේ සංචලතාව වැඩි දියුණු කිරීමත්, එමගින් රටේ තීරණාත්මක සේවා වලට පිවිසීමට, ආර්ථික සංවර්ධන කටයුතු වලට දායක වීමෙන් පහසුකම් සැපයීමයි.

ප්‍රමුඛතා මාර්ග ව්‍යාපෘතිය නමින් හැඳින්වෙන ප්‍රමුඛතා ව්‍යාපෘති 1, ප්‍රමුඛතා ව්‍යාපෘති 2 සහ ප්‍රමුඛතා ව්‍යාපෘති 3 – අදියර 1 පිළිබඳ විස්තර ඊළඟ පරිච්ඡේදයේ දැක්වේ.

5.13 ප්‍රමුඛතා මාර්ග ව්‍යාපෘතිය - 1 (PRP-1)

චීන සංවර්ධන බැංකුව විසින්, ප්‍රමුඛතා මාර්ග ව්‍යාපෘතිය (අදියර 1) යටතේ හඳුනා ගන්නා ලද මාර්ග වැඩි දියුණු කිරීම හා පුනරුත්ථාපනය සඳහා 2010 වර්ෂයේදී එ.ජ.ඩො.මිලියන 152.80 මුදලක් සපයන ලදි. ව්‍යාපෘතියේ අරමුණ වන්නේ ඌව, සබරගමුව, බස්නාහිර, දකුණු හා උතුරු පළාත්වල ප්‍රමුඛතා පදනම යටතේ හඳුනා ගන්නා ලද ජාතික මහාමාර්ග කි.මී.178.97 ක තත්ත්වය වැඩි දියුණු කිරීමයි.

සිතියම 16: ප්‍රමුඛතා මාර්ග ව්‍යාපෘතිය – 1



අත්සන් තබන ලද අ ගි ට අනුව ප්‍රමුඛතා මාර්ග ව්‍යාපෘතියේ 1 අදියර ක්‍රියාත්මක කිරීම සඳහා වී.සං.බැ. එජඩො මිලියන 152.8 ක් සපයනු ලැබීය.


එහි සිවිල් වැඩ කොන්ත්‍රාත් 6 ක් යටතේ ක්‍රියාත්මක කෙරිණි. සියලුම සිවිල් වැඩ නිමවූ අතර එහි ප්‍රගතිය පිළිබඳ විස්තරාත්මක තොරතුරු ඊලඟ වගුවේ දැක්වෙයි.

වීන සංවර්ධන බැංකුව අරමුදල් සපයන ලද ප්‍රමුඛතා මාර්ග ව්‍යාපෘතිය-1 විස්තර :

කොන්ත්‍රාත් අංකය	වැඩ විස්තරය	කොටස	මුල් කොන්ත්‍රාත් අගය (රු.මිලි)	සංශෝධිත කොන්ත්‍රාත් අගය (රු.මිලි)	ආරම්භක දිනය	නිමකරන දිනය	අද දක්වා වියදම (රු.මිලි)	සමුච්චිත භෞතික ප්‍රගතිය (%)
RDA/RNIP/ PRP1/C1A	බෙලිඅත්ත - තංගල්ල මාර්ගය	කි.මී. 00-7.47	1350	1765	01.07.2011	2013.06.30	1,746.70	100%
	බෝපැලේ හංදිය - කිරිඉඛඩන්ආර - උඩමව්ආර මාර්ගය	කි.මී. 0.0-8.5						100%
	සිරිබෝපුර මංසන්ධියේ ගුවන් පාලම ඉදිකිරීම		2675	3250	01.07.2011	2013.10.31	3,187.74	100%
RDA/RNIP/ PRP1/C1A	පැලවත්ත - කංකොටියාවත්ත - තිනියාවල - මොරවක මාර්ගය	කි.මී. 0.0-35 කි.මී. 41.0-53.0	3900	--	2014.03.15	2014.03.15	3,707.30	100%
RDA/RNIP/ PRP1/C1A	තිරුවානාකැටිය - අගලවත්ත මාර්ගය	කි.මී. 0.0-33.45	2800	3200	15.07.2011	2014.07.15	3,115.33	100%
RDA/RNIP/ PRP1/C1A	මහනුවර - මහියංගනය - පදියතලාව මාර්ගය	කි.මී. 3.15 – 93.65	1550	--	2013.06.30	2013.06.30	1,486.68	100%
RDA/RNIP/ PRP1/C1A	කල්කුඩා මාර්ගය	කි.මී. 0.0-5.63	700	--	2012.06.30	2012..06.30	599.51	100%
	කල්කුඩා - වලව්වෙන මාර්ගය	කි.මී. 0.0-4.42						
RDA/RNIP/ PRP1/C1A	පරන්තන් - මුලකිවු මාර්ගය	කි.මී. 0.0-30.0 කි.මී. 30.0 – 52.6	5700	6096.30	2011.06.22	2013.12.21	6,075.14	100%

චීන සංවර්ධන බැංකු අරමුදල් සැපයූ ප්‍රමුඛතා මාර්ග ව්‍යාපෘතිය 2 (PRP-2)

සිතියම 17: ප්‍රමුඛතා මාර්ග ව්‍යාපෘතිය – 2



ප්‍රදාන ආයතනය	:	චීන සංවර්ධන බැංකුව ණය පහසුකම් මුදල : එ.ජ.ඩො. මිලියන 500.0
ශ්‍රීලංර දායකත්වය	:	එ.ජ.ඩො. මිලියන 56.0
කොන්ත්‍රාත්කරුවෝ	:	චයිනා නැෂනල් එයරෝ ටෙක්නොලොජී ඉන්ටර්නැෂනල් ඉංජිනියරින් කෝපරේෂන් (කැටික්-ඉං) ෂියැං ඩැගැං රෝඩ් බ්‍රිජ් ඉංජිනියරින් කම්පැණි, හුනාන් කන්ස්ට්‍රක්ෂන් ඉංජිනියරින් ගෲප් කෝපරේෂන්

අදියර 2 යටතේ ආරම්භ කරන ලද සිවිල් වැඩ කොන්ත්‍රාත් 19 ක් නිම කෙරිණි. මෙම කොන්ත්‍රාත් ප්‍රමුඛතා මාර්ග ව්‍යාපෘතිය 2 (දකුණ) හා ප්‍රමුඛතා මාර්ග ව්‍යාපෘතිය 2 (උතුර) යන භූගෝලිය ප්‍රදේශ 2 ක ක්‍රියාත්මක කරන ලදි.
ප්‍ර.මා.ව්‍යා. -2 (දකුණ) හා ප්‍ර.මා.ව්‍යා. 2 (උතුර) පිළිබඳ විස්තරාත්මක වාර්තා ඊලඟ පිටුවේ දැක්වේ.

5.14 ප්‍රමුඛතා මාර්ග ව්‍යාපෘතිය – 2 (දකුණ)

චීන සංවර්ධන බැංකුව අරමුදල් සපයන ලද ප්‍රමුඛතා මාර්ග ව්‍යාපෘතිය -2 (දකුණ) විස්තර:

කොන්ත්‍රාත් අංකය	වැඩ විස්තරය	කොටස	මුල් කොන්ත්‍රාත් අගය (රු.මිලි)	සංශෝධිත කොන්ත්‍රාත් අගය (රු.මිලි)	ආරම්භක දිනය	නිමකරන දිනය	අද දක්වා වියදම (රු.මිලි)	සමුච්චිත භෞතික ප්‍රගතිය (%)
RDA/RNIP/ PRP2/C1A	හොරවල - පැලවත්ත- පිටිගල මාර්ගය	කි.මී.0.0- 17.50	1,478.00	1,789.32	2011.12.06	2014.05.19	1,734.74	100%
RDA/RNIP/ PRP2/PkgC/ C4	තිරුවානාගැටිය අගලවත්ත මාර්ගය	කි.මී 33.45- 67.80	3,500.00	3,700.00	2011.12.12	2014.07.15	3,713.85	100%
	තිරුවානාකැටිය අගලවත්ත මාර්ගය	කි.මී 50.32.0	2,820.00	3,206.43	2011.12.12	2014.09.10	3,190.95	100%
	හොරවල - පැලවත්ත- පිටිගල මාර්ගය	කි.මී17.5 - 25.74	1,080.00	1,051.77	2011.12.12	2014.02.10	939.19	100%
RDA/RNIP/ PRP2/PkgC/ C9	හම්බන්තොට කේන්ද්‍රීය සංවර්ධනයේ මත්තල ගුවන් තොටුපල ප්‍රවේශ මාර්ග මංසන්ධියේ ගුවන් පාලම ඉදි කිරීම		3,090.00		2011.12.07	2013.03.25	3,173.51	100%
	හම්බන්තොට කේන්ද්‍රීය සංවර්ධනයේ අඩි 100 පාර හා අතුරු මාර්ග මංසන්ධියේ ගුවන් පාලම ඉදිකිරීම		2,890.00		2011.12.12	2013.11.07	4,400.76	100%
RDA/RNIP/ PRP2/PkgC/ C21	තිරුවානාකැටිය - අගලවත්ත මාර්ගයේ පාලම යළි ඉදි කිරීම / පුළුල් කිරීම	කි.මී 33.45 – 67.80	1,169.00		2011.12.06	2015.10.31	967.84	100%
RDA/RNIP/ PRP2/PkgC/ C24	හොරණ - අඟුරුවාතොට - අළුත්ගම මාර්ගයේ පාලම යලි ඉදි කිරීම/ පුළුල් කිරීම	කි.මී 5.0 – 32.0	350.00		2011.12.06	2014.08.04	369.75	100%
RDA/RNIP/ PRP2/PkgC/ C20	නාගොඩ - කලවැල්ලාව - බැල්ලපිටිය මාර්ගය	කි.මී 27.0 – 57.0	3,622.87		2012.03.20	2014.12.31	3,829.97	100%
RDA/RNIP/ PRP2/PkgC/ C10B	හුංගම - මිද්දෙනිය මාර්ගය	කි.මී 0.0 – 30.0	2,046.34		2012.04.07	2014.04.06	2121.46	100%
RDA/RNIP/ PRP2/PkgC/ C10A	නිහගොඩ - කඹුරුපිටිය - මාවරල කොටපොල මාර්ගය	කි.මී 23.0 – 67.0	3,609.15		2012.03.20	2014.03.19	4,862.97	100%

5.15 ප්‍රමුඛතා මාර්ග ව්‍යාපෘතිය – 2 (උතුර)

ඒ හා බී පංතියේ මාර්ග කි.මී.323.01 ක් වැඩි දියුණු කිරීම හා පුනරුත්ථාපනය කිරීම වැඩි දියුණු කරන ලද මතුපිට පෘෂ්ඨය කොන්ක්‍රීට් වලින් යුතු කි.මී. 8.05 දුරක් හැර ඇස්පල්ට් මිශ්‍රණයෙන් යුක්තය. ඊට අමතරව නුවරඑළිය දිස්ත්‍රික්කයේ පළාත් මාර්ග කි.මී. 97.30 පුනරුත්ථාපනය කරන ලදි.

චීන සංවර්ධන බැංකුව අරමුදල් සැපයූ ප්‍රමුඛතා මාර්ග ව්‍යාපෘති - 2 (උතුරු) පිළිබඳ ව්‍යාපෘති විස්තර:

කොන්ත්‍රාත් අංකය	වැඩ විස්තරය	කොටස	මුල් කොන්ත්‍රාත් අගය (රු.මිලි)	සංශෝධිත කොන්ත්‍රාත් අගය (රු.මිලි)	ආරම්භක දිනය	නිමකරන දිනය	අද දක්වා වියදම (රු.මිලි)	සමුච්චිත භෞතික ප්‍රගතිය (%)
RDA/RNIP/ PRP2/C2A	මහනුවර - මහියංගනය - පදියතලාව මාර්ගය	කි.මී.93.15-102.28	730.00	625.00	2011.12..07	2012.12.29	624.85	100%
RDA/RNIP/ PRP2/C2B	බදුල්ල - කරමැටිය - ආඳාඋල්පත මාර්ගය	කි.මී 0.0-48.0	3,370.00	5,078.00	2011.12..07	2015.05.15	4,801.70	100%
RDA/RNIP/ PRP2/PkgC/C5	මහියංගනය - දිඹුලාගල - දුළුක්කනේ මාර්ගය	කි.මී 0.0-24.10	2,202.00	1,777.00	2011.12..07	2014.06.10	1,746.31	100%
RDA/RNIP/ PRP2/PkgC/C5B	බිබිල - ඌරණිය - මහියංගනය මාර්ගය	කි.මී 22.0-39.58	1,620.00	1,600.00	2012.03.20	2014.03.19	1,575.47	100%
RDA/RNIP/ PRP2/PkgC/C6	ගල්කුලම - අනුරාධපුරය මාර්ගය	කි.මී 0.15 හා 16.0-16.64	1,434.00	1,491.00	2011.11.07	2014.02.28	1,484.82	100%
RDA/RNIP/ PRP2/PkgC/C7	කඩහපොල - රඹාව මාර්ගය	කි.මී 0.0-18.71	6,300.00	8,041.00	2012.06.18	2014.06.172014.06.17	6,521.54	100%
	කුරුණෑගල - නාරංවල - මාදුම්පේ මාර්ගය	කි.මී 0.0-22.36				2014.06.17		100%
	ගලගෙදර - රඹුක්කන මාර්ගය	කි.මී 0.0-18.50				2014.12.23		100%
RDA/RNIP/ PRP2/PkgC/C11	නැන්නෙකුඹුර - රිකිල්ලගස්කඩ - රාගල මාර්ගය	කි.මී 20.30-73.64	7,307.10	9,174.00	2012.03.20	2015.04.30	8,581.56	100%
RDA/RNIP/ PRP2/PkgC/C12	උස්වැටකෙයියාව - එපාමුල්ල - පමුණුගම මාර්ගය	කි.මී 0.0-8.05	1,490.00	1,700.00	2012.01.09	2013.09.10	1,602.19	100%
RDA/RNIP/ PRP2/PkgC/C13	පාලව්ය - කල්පිටිය මාර්ගය	කි.මී 14.0-40.60	2,974.00	3,080.00	2012.05.30	2014.05.29	3,053.91	100%
RDA/RNIP/ PRP2/PkgC/C15	මහියංගනය - දිඹුලාගල - දුළුක්කනේ මාර්ගය	කි.මී 24.10-72.8	5,020..00	4,225.00	2012.06.06	2014.06.13	4,234.20	100%
	මනම්පිටිය - අරලගංවිල - මාදුරුඔය මාර්ගය	කි.මී 0.0-3.0						
RDA/RNIP/ PRP2/PkgC/C17	නුවරඑළිය දිස්ත්‍රික්කයේ පළාත් මාර්ග	දික කි.මී 94.65	2,876.00	3,069.00	2012.03.20	2014.12.06	2,854.14	100%

5.16 ප්‍රමුඛතා මාර්ග ව්‍යාපෘති -3 (අදියර I)

චීන සංවර්ධන බැංකුව විසින් ව්‍යාපෘතිය 3 (1 අදියර) සඳහා එ.ජ.ඩො. මිලියන 300 ක් සපයනු ලැබීය.

ව්‍යාපෘතියේ අරමුණ වන්නේ දිවයින පුරා පැතිරී ඇති මාර්ග කොටස් ප්‍රමුඛතා පදනම මත තෝරා පුනරුත්ථාපනය කිරීම මගින් රටේ ජාතික මාර්ග ජාලයේ සංචලතාව වැඩි දියුණු කිරීම සහ ඒ මගින් තීරණාත්මක සේවා සඳහා ප්‍රවේශය සැපයීම හා ආර්ථික සංවර්ධන කටයුතු වලට දායකවීම සඳහා පහසුකම් සැලසීමයි.

ප්‍රමුඛතා මාර්ග ව්‍යාපෘතිය 3 (අදියර-1) යටතේ මධ්‍යම, දකුණු, සබරගමුව හා වයඹ පළාත්වල කොන්ත්‍රාත් දොලහක් ප්‍රදානය කළ අතර එහි වැඩ සිදු කෙරෙමින් පවතී.

මෙහි කොන්ත්‍රාත් දොලහ චීන කොන්ත්‍රාත්කරුවන් තිදෙනෙකු විසින් ලබා ගනු ලැබීය.

1. වයිනා නැෂනල් එයරෝ ටෙක්නොලොජී ඉන්ටර්නැෂනල් ඉංජිනියරින් කෝපරේෂන් ලිමිටඩ්. (කොන්ත්‍රාත් 8 කි - C1,C2,C3,C4,C5,C6,C10,C12)
2. හුනාන් කන්ස්ට්‍රක්ෂන් ඉංජිනියරින් කෝපරේෂන් (කොන්ත්‍රාත් 2 කි – C7,C8)
3. ෂියං ඩගැං කම්පනි ලිමිටඩ් (කොන්ත්‍රාත් 2 කි - C9,C13)

ව්‍යාපෘතිය ව්‍යාපෘති අධ්‍යක්ෂවරුන් 2 කු යටතේ ක්‍රියාත්මක කෙරේ. පහත දැක්වෙන පරිදි එක් අයෙකුට කොන්ත්‍රාත් 6 කි:

ව්‍යාපෘති අධ්‍යක්ෂ (ඒ) – C2, C4, C5, C6, C10 හා C13 (මා.සං.අ. යේ ව්‍යාපෘති උපදේශක ඒකකය විසින් අධීක්ෂණය කෙරේ)

ව්‍යාපෘති අධ්‍යක්ෂ (බී) – C1, C3, C7, C8, C9 & C12 (ස.ස.ස. හා ම.ප.අ. උපදේශකයන් විසින් අධීක්ෂණය කෙරේ)

ව්‍යාපෘති විෂය පථයට ඇතුළත් වන්නේ:

- සිරස් හා තිරස් එකෙල්ල වැඩි දියුණු කිරීම
- සම්මත මංතීරු දෙක සහිත රථ මාර්ගය දෙපැත්තේ දෘඩ උරිස් හා මෘදු උරිස් සහිතව මාර්ගය පුළුල් කිරීම
- වර්ෂා ජල බස්නා කාණු වැඩි දියුණු කිරීම.
- සියලු මාර්ග වලට මාර්ග භාණ්ඩ, මාර්ග සලකුණු හා සංඥා සහ W හැඩයේ ඝර්ෂණ බාධකයන් සැපයීම.

චීන සංවර්ධන බැංකුව අරමුදල් සැපයූ ප්‍රමුඛතා මාර්ග ව්‍යාපෘතිය -3 (අදියර-1)

මාර්ගයේ නම / පාලමේ අංකය	මාර්ගයේ දිග කි.මී.	සමස්ත ඇස්තමේන්තු පිරිවැය (රු.මිලි.)	ආරම්භක දිනය	නිමකරන දිනය	2015 අවසානයේ භෞතික ප්‍රගතිය	2015 අවසානයේ සමුච්චිත වියදම (රු.මිලි.)
C1 – කිරිඇල්ල - නැදුරන - ඇහැළියගොඩ මාර්ගය (කි.මී. 0.00 – 14.75)	14.75	3,422.00	2014.09.09	2016.09.08	73.31%	2,142.10
C2 - රත්නපුර - පලාවෙල - කරවිට මාර්ගය (කි.මී. 0.00 - 21.28)	21.28	4,301.00	2014.09.09	2016.09.08	46%	2,575.23
C3 – රත්නපුර - වේවැල්වත්ත මාර්ගය (කි.මී. 0.00 – 27.5)	27.5	4,626.28	2014.09.09	2016.09.08	75.13%	2,858.17
C4 - වේයන්ගොඩ - රුවන්වැල්ල මාර්ගය (කි.මී. 12.4 - 32.2) මාර්ග යෝජනාවලිය	19.8	3,174.00	2014.10.24	2017.04.23	44%	2,493.54
C4 - වේයන්ගොඩ - රුවන්වැල්ල මාර්ගය (කි.මී. 12.4 - 32.2) පාලම් යෝජනාවලිය		2,094.94			45%	
C5 - මීගහජඳුර - කුමාරගම මාර්ගය (කි.මී. 0.00 - 8.80)	8.8	1,172.00	2014.10.24	2015.10.23	100%	772.43
C6 - ගාල්ල - උඩුගම මාර්ගය (කි.මී. 0.00- 35.35)	35.35	4,641.36	2014.10.24	2017.04.23	41%	2,426.77
C7- මහනුවර - යාපනය මාර්ගය (කි.මී.1.65– 3.9)	2.25	1,998.03	03.06.2015	2016.06.02	2.10%	662.40
C8 – මාරවිල - උඩුබද්දාව මාර්ගය (කි.මී. 0.00 – 19.55)	19.55	*2,546.34*	2014.10.24	2016.10.23	40%	1,053.65
C9 – රඹුක්කන - කටුපිටිය මාර්ගය (කි.මී.0.00 – 9.81)	9.81	1,305.01	2014.10.24	2016.10.23	59.36%	1,462.73
C9 – දම්බොක්ක - කටුපිටිය මාර්ගය (කි.මී. 0.00 – 8.75)	8.75	1,588.50	2014.10.24	2016.10.23	83.97%	
C10 - හිනිදුම - ඕපාත - පිටබැද්දර මාර්ගය (කි.මී. 0.00 31.5) මාර්ග යෝජනාවලිය	31.5	4,642.73	2014.09.09	2017.03.08	43%	3,254.73
C10 - (හිනිදුම - ඕපාත - පිටබැද්දර මාර්ගය (කි.මී 0.00 - 31.5) පාලම් යෝජනාවලිය		1,620.93			38%	
C12 – අයගම - ඇගල්ඔය මාර්ගය (කි.මී. 0.00 – 23.00)	23	4,015.09	2014.09.09	2017.03.08	84.03%	2,686.17
C13 - මාවනැල්ල - හෙම්මාතගම - ගම්පොල මාර්ගය (කි.මී.0.00 - 26.00)	26	5,769.52	2015.08.18	2017.06.17	7%	1,681.07

ඉඩම් අත්පත්කර ගැනීම.

ප්‍ර.මා.ව්‍යා. 3 –1 වන අදියරේ සියලුම ව්‍යාපෘතිවල C7 කොන්ත්‍රාත්තුව හැර, ඉඩම් හිමියන්ගේ එකඟතාවය මත ඉඩම් සඳහා වන්දි ගෙවීමෙන් තොරව මාර්ග පුළුල් කිරීම සිදු කරන ලදුව, ඉඩම් අත්පත්කර ගැනීමේ කටයුතු සිදු කෙරෙමින් පවතී. ඉඩම් අත්පත්කර ගැනීම අවශ්‍ය නොවන ප්‍රදේශවල ඉදිකිරීම් වැඩ ආරම්භ කරන ලදි.



මීගහජඳුර - කුමාරගම මාර්ගය



හිනිදුම - ඕපාත - පිටබැද්දර මාර්ගය



මාවනැල්ල - හෙම්මාතගම - ගම්පොල මාර්ගය



මහනුවර - යාපනය මාර්ගය (කි.මී. 1.65 – 3.90) වම්පස



මාරවිල - උඩුබද්දාව මාර්ගය
(කි.මී. 0.00 – 19.5)




රඹුක්කන - කටුපිටිය මාර්ගය
(කි.මී. 0.00 – 9.81)

5.17 උතුරු මාර්ග සම්බන්ධතා ව්‍යාපෘතිය

උතුරු මාර්ග සම්බන්ධතා ව්‍යාපෘති ඒකකය උතුරු පළාතේ ජාතික මහාමාර්ග සහ සම්බන්ධතා මාර්ග ආසියානු සංවර්ධන බැංකුව විසින් සපයන ලද ණය මුදල් සහායෙන් පුනරුත්ථාපන හා වැඩි දියුණු කිරීමේ අරමුණෙන් නිර්මාණය කරන ලදි. මෙම ව්‍යා.ක.ඒ. විෂය පථය යටතේ ව්‍යාපෘති හතරක් වෙයි.

5.17.1 උතුරු මාර්ග සම්බන්ධතා ව්‍යාපෘතිය (NRCP)

සිතියම 18: උතුරු මාර්ග සම්බන්ධතා ව්‍යාපෘතිය



5.17.1.1 උතුරු මාර්ග සම්බන්ධතා ව්‍යාපෘතිය (NRCP) - හැඳින්වීම :

ශ්‍රී ලංකාවේ උතුරු කොටස දශක 3 ක් තිස්සේ අවි ගැටුම නිසා දැඩි ලෙස බලපෑම ලක්ව නැඟී සිටීමින් සිටින ප්‍රදේශයකි. ප්‍රාදේශිය යටිතල ව්‍යුහයට සිදුව ඇති හානිය බරපතල හා අති විශාල වන අතර, මාර්ග ජාලය බලාපොරොත්තු සුන් වූ තත්ත්වයක පවතී. මෙම ප්‍රදේශවල ජනතාවට සමාජමය අවශ්‍යතා සඳහා ප්‍රවේශයක් නොමැත. උතුරු කොටස හා රටේ සෙසු ප්‍රදේශ සමඟ සංචලතාවය රටේ ප්‍රධාන මහාමාර්ග ප්‍රමාණවත් තත්ත්වයක නොමැති වීම හේතුවෙන් අධික ගමන් කාලයක් අවශ්‍ය කෙරෙන නිසා එය ආර්ථික කටයුතු හා සංවර්ධනය පැතිරීමට බාධාවක් වී ඇත. එබැවින් ශ්‍රී ලංකා රජය උතුරු පළාතේ මාර්ග හා සම්බන්ධතා මාර්ග උතුරු මාර්ග සම්බන්ධතා ව්‍යාපෘතිය යටතේ පුනරුත්ථාපන හා වැඩි දියුණු කිරීම සඳහා ආසියානු සංවර්ධන බැංකුවෙන් ණය මුදලක් ලබා ගන්නා ලදි.

5.17.1.2 ව්‍යාපෘතියේ ප්‍රතිඵල

ව්‍යාපෘතියේ ප්‍රතිඵලය වන්නේ, ප්‍රාථමික වශයෙන් රටේ උතුරු පළාතට මාර්ග සම්බන්ධතාවය වැඩි දියුණු කිරීම හා මූලික සාමාජීය අවශ්‍යතාවලට පිවිසීමට උපකාරී වීමයි. තවද එය ශ්‍රී ලංකාවේ ප්‍රවාහන පද්ධතිය වැඩි දියුණු කිරීමට හා ප්‍රාදේශීයව තුලනාත්මක හා සාමාජීයව අඩංගු ආර්ථික සංවර්ධනයක් සඳහා පහසුකම් සැලසීමයි. ධාවන කාලය අඩුවීම හා වාහන මෙහෙයුම් පිරිවැය අඩුවීම ප්‍රදේශයේ රථවාහන ප්‍රමාණය 30% සීමාව තුල රැඳෙනු ඇත.

ව්‍යාපෘතියේ ප්‍රතිඵලය ලෙස උතුරු පළාතේ හා උතුරු මැද පළාතේ ඒ පංතියේ මාර්ග කි.මී. 151 ක් හා බී පංතියේ මාර්ග කි.මී. 41.4 සහිතව ජාතික මහාමාර්ග කි.මී. 191 ක් පුනරුත්ථාපනය කෙරිණි.

5.17.1.3 විධාන කිරීමේ හා ක්‍රියාත්මක කිරීමේ නියෝජිතායතනය

ව්‍යාපෘතිය සඳහා විධාන කිරීමේ ආයතනය වන්නේ මහාමාර්ග වරාය හා නාවික අමාත්‍යාංශය ක්‍රියාත්මක කිරීමේ ආයතනය මහාමාර්ග වරාය හා නාවික අමාත්‍යාංශය යටතේ මාර්ග සංවර්ධන අධිකාරියයි.

5.17.1.4 සමස්ත ඇස්තමේන්තු පිරිවැය

ජාතික මාර්ග සහභාගය යටතේ සමස්ත පිරිවැය එ.ජ.ඩො. මිලියන 145.85 කි. ආසියානු සංවර්ධන බැංකුව සමස්ත පිරිවැයෙන් 89% සඳහා මූල්‍යයනය කරන ලද අතර ඉතිරි 11% බදු හා ගාස්තු ආවරණය කිරීම සඳහා ඉතිරි 11% මූල්‍යයනය කරන ලද්දේ ශ්‍රී ලංකා රජය විසිනි. ව්‍යාපෘතිය සඳහා මෙම අරමුදල් වාර්ෂිකව මහාමාර්ග වරාය හා නාවික අමාත්‍යාංශය සඳහා අයවැය මගින් වෙන් කෙරේ.

5.17.15 ව්‍යාපෘති විස්තර.

2015 දෙසැම්බර් 31 දින වන විට උතුරු මාර්ග සම්බන්ධතා ව්‍යාපෘතියේ විස්තර ඊලඟ වගුවේ දැක්වේ.

මාර්ග කොටස	දිග (කි.මී.)	කොන්ත්‍රාත් අගය (රු.මිලි.)	ආරම්භක දිනය	නිමකරන දිනය හෝ නිම කිරීමට අපේක්ෂිත දිනය	2015 අවසානයේ සමුච්චිත වියදම (රු.මිලි.)	2015 අවසානයේ ප්‍රගතිය
A9 මාර්ගයේ දඹුල්ල සිට කෝනිගල දක්වා පුනරුත්ථාපනය / වැඩි දියුණු කිරීම (කි.මී. 74+650 සිට කි.මී. 98+000)	23.35	1,326.93	2011 ජුනි 7	2013 ජුනි 15	1,320.14	100.00%
A9 මාර්ගයේ කෝනිගල සිට ගල්කුලම දක්වා පුනරුත්ථාපනය හා වැඩි දියුණු කිරීම (කි.මී. 98+000 සිට 122+170 දක්වා)	24.17	1,577.75	2011 ජුනි 7	2013 අප්‍රේල් 17	1,651.84	100.00%
A020 මාර්ගයේ අනුරාධපුර සිට රඹෑව දක්වා පුනරුත්ථාපනය හා වැඩි දියුණු කිරීම (කි.මී. 0+000 සිට 14+500)	14.50	752.65	2011 ජුනි 7	2012 නොවැ. 21	741.06	100.00%
A032 මාර්ගයේ නාවක්කුලි සිට කේරතිවු ජැටිය දක්වා (කි.මී. 0+000 සිට 17+400)	17.40	1,387.42	2011 ජුනි 7	2013 මාර්තු 18	1,313.84	100.00%
B268 මාර්ගයේ මානිපායි සිට කයිතඩි දක්වා මාර්ග පුනරුත්ථාපනය හා වැඩි දියුණු කිරීම (කි.මී. 0+000 සිට 14+020)	14.02	654.17	2011 ජුනි 7	2012 නොවැ. 28	646.02	100.00%
B347 මාර්ගයේ වල්ලෙයි සිට අරාලි දක්වා පුනරුත්ථාපනය හා වැඩි දියුණු කිරීම (කි.මී. 0+000 සිට 27+400)	27.40	1,483.61	2011 ජුනි 7	2012 මැයි 27	1,192.94	100.00%
මාන්කුලම් - මුලතිවු මාර්ගයේ A034 කොටසක් පුනරුත්ථාපනය හා වැඩි දියුණු කිරීම කි.මී. 0+000 සිට 13+000 දක්වා	13.00	1,004.01	2011 ජුනි 7	2012 දෙසැ. 26	987.91	100.00%
මාන්කුලම් - මුලතිවු මාර්ගයේ A034 කොටසක් පුනරුත්ථාපනය හා වැඩි දියුණු කිරීම කි.මී. 13+000 සිට 24+000	11.00	586.57	2011 ජුනි 7	2013 ජුනි 30	593.89	100.00%
මාන්කුලම් - මුලතිවු මාර්ගයේ A034 කොටසක් පුනරුත්ථාපනය හා වැඩි දියුණු කිරීම කි.මී. 24+000 සිට 38+500	14.50	974.95	2011 ජුනි 7	2013 පෙබ. 28	988.45	100.00%
මාන්කුලම් - මුලතිවු මාර්ගයේ A034 කොටසක් පුනරුත්ථාපනය හා වැඩි දියුණු කිරීම කි.මී. 38+500 සිට 49+100	10.60	1,319.34	2011 ජුනි 7	2013 අප්‍රේල් 11	1,302.61	100.00%
නාවක්කුලි - කේරතිවු - මන්නාරම මාර්ගයේ A 032, "සංගුපිඩිඩි" පාලමේ මන්නාරම අන්තයේ ප්‍රවේශය කි.මී. 4.5	4.50	1,119.29	2014 මාර්තු 31	2015 මාර්තු 02	944.04	100.00%
A 029 වවුනියා - හොරොව්පතාන මාර්ගය පුනරුත්ථාපනය හා වැඩි දියුණු කිරීම කි.මී. 16+000 - 22+000	6.00	348.29	2015 අප්‍රේල් 3	2015 දෙසැ. 29	201.81	84.00%
A 029 වවුනියා - හොරොව්පතාන මාර්ගය පුනරුත්ථාපනය හා වැඩි දියුණු කිරීම කි.මී 5+000 සිට 16+000	11.00	374.72	2015 ජූලි 4	2015 දෙසැ.31	178.43	75.00%

ඡායාරූප


CP-4A: නාවක්කුලි - කේරතිවු - මන්නාරම මාර්ගය *A032* පුනරුත්ථාපනය හා වැඩි දියුණු කිරීම සංගුපිඩ්ඩි පාලමේ මන්නාරම අන්ත ප්‍රවේශය කි.මී. *4.5*





5.17.2. උතුරු මාර්ග සම්බන්ධතා ව්‍යාපෘතිය – අතිරේක මූල්‍යායනය (NRCP-AF)

සිතියම 19: උතුරු මාර්ග සම්බන්ධතා ව්‍යාපෘතිය – අතිරේක මූල්‍යායනය



5.17.2.1 හැඳින්වීම

අංක 2639-SRI. ණය මුදලෙන් එ.ජ.ඩො. මිලියන 20 ක අතිරික්තයක් පවතින බවට ඇස්තමේන්තු කර ඇත. එබැවින් අතිරේක භූගෝලීය ප්‍රදේශයක් ආවරණය කිරීමට හා සංවර්ධන ප්‍රතිඵලයන් වඩා ශක්තිමක් කිරීමට තථ්‍ය කොන්ත්‍රාත් ප්‍රදානයට හා අවශ්‍යතා ක්‍රියාත්මක කිරීමට මුල් ණය මුදලේ අතිරික්තය අතිරේක මූල්‍යායනය සමඟ නැවත වෙන් කරන ලෙස රජය විසින් ආ.සං.බැ. වෙතින් ඉල්ලා සිටින ලදි. අතිරේක මූල්‍යායනය සමඟ පුළුල් කරන ලද ව්‍යාපෘති නිමවුමට අනුව උතුරු පළාතේ හා උතුරුමැද පළාතේ ඒ පංති මාර්ග 61.2 ක් හා උතුරු හා උතුරුමැද පළාත්වල බී පංති මාර්ග කි.මී. 56.2 ක් ඇතුළු මාර්ග දළ වශයෙන් කි.මී.118 ක් පුනරුත්ථාපනය කළ යුතුව තිබේ. ව්‍යාපෘති ඇගයීමේදී අතිරේක මූල්‍යායනය සහිත ව්‍යාපෘති පිරිවැය (ඌ.මා.සං.ව්‍යා.) (ඩො.මී. 20 සහිතව) 135.5 ලෙස ඇස්තමේන්තු කර ඇත. ඌ.මා.සං.ව්‍යා. දූ.මු. ජාතික මාර්ග පහක් කොන්ත්‍රාත් යෝජනාවලි 9 කට බෙදා ඇත.

5.17.2.2 ව්‍යාපෘතියේ ප්‍රතිඵලය

ව්‍යාපෘතියේ සමස්ත බලපෑම උතුරු පළාතේ තුලනාත්මක හා සංයුක්ත වර්ධනය වනු ඇත. ව්‍යාපෘතියේ ක්ෂණික ප්‍රතිඵලය උතුරු ප්‍රදේශය තුල සහ දකුණු ප්‍රදේශය සමඟ වැඩි දියුණු වූ මාර්ග සම්බන්ධතාවයයි. ව්‍යාපෘතියේ නිමැවුම වන්නේ උතුරු හා උතුරුමැද පළාතේ ජාතික මහාමාර්ග කි.මී. 280 ක් පුනරුත්ථාපනය හා වැඩි දියුණු කිරීමයි.

5.17.2.3 විධාන කිරීමේ හා ක්‍රියාත්මක කිරීමේ ආයතනය

ව්‍යාපෘති විධානය කිරීමේ ආයතනය වන්නේ මහාමාර්ග වරාය හා නාවික අමාත්‍යාංශයයි. ක්‍රියාත්මක කිරීමේ ආයතනය වන්නේ මහාමාර්ග වරාය හා නාවික අමාත්‍යාංශය යටතේ මාර්ග සංවර්ධන අධිකාරියයි.

5.17.2.4 සමස්ත ඇස්තමේන්තු පිරිවැය.

ජාතික මහාමාර්ග සහභාගය සමස්ත පිරිවැය එ.ජ.ඩො. මිලියන 133.5 කි. සමස්ත පිරිවැයෙන් 87% ක් ආසියානු සංවර්ධන බැංකුව විසින් මූල්‍යායනය කරන ලද අතර බදු හා ගාස්තු පිරිවැය ආවරණය කිරීම සඳහා ඉතිරි 13% ක මුදල ශ්‍රී ලංකා රජය විසින් සපයන ලදි. මෙම අරමුදල් වෙන් කිරී මහාමාර්ග වරාය හා නාවික අමාත්‍යාංශයේ වාර්ෂික අයවැය මගින් ව්‍යාපෘතියට සෘජුවම ලබා දෙනු ලැබීය.

5.17.2.5 ව්‍යාපෘති විස්තර : 2015 දෙසැම්බර් 31 වන විට උතුරු මාර්ග සම්බන්ධතා ව්‍යාපෘතියේ අතිරේක මූල්‍යායනය මීලඟ වගුවේ දැක්වේ:

.

ව්‍යාපෘති විස්තර : 2015 දෙසැම්බර් 31 වන විට උතුරු මාර්ග සම්බන්ධතා ව්‍යාපෘතිය - අතිරේක මූල්‍යයනය පිළිබඳ විස්තර:

මාර්ගයේ නම හා කොන්ත්‍රාත් අංකය	දිග (කි.මී.)	කොන්ත්‍රාත් වටිනාකම (රු.මිලි.)	ආරම්භක දිනය	නිම කිරීමට අපේක්ෂිත දිනය	2015 අවසානයේ සමුච්චිත වියදම (රු. මිලි.)	2015 අවසානයේ ප්‍රගතිය
වවුනියාව - හොරොව්පතාන (A 029) මාර්ගයේ (කි.මී. 24+000 සිට 34+950) පුනරුත්ථාපනය හා වැඩි දියුණු කිරීම.	10.95	990.41	13 අගෝ. 28	15 අප්‍රේල් 28	888.27	100%
මැදවච්චිය - කැබිතිගොල්ලෑව මාර්ගයේ (B283) (කි.මී. 0+000 සිට 12+600) පුනරුත්ථාපනය හා වැඩි දියුණු කිරීම.	12.6	725.68	13 අගෝ. 28	8-Jul-15	531.76	100%
මැදවච්චිය - කැබිතිගොල්ලෑව මාර්ගයේ (B283) (කි.මී.12+600 සිට 25+400) පුනරුත්ථාපනය හා වැඩි දියුණු කිරීම.	12.8	721.61	13 අගෝ. 28	15 අප්‍රේල් 25*	497.43	100%
කැබිතිගොල්ලෑව - පදවිය මාර්ගයේ (B 211) (කි.මී. 0+000 සිට 15+500) පුනරුත්ථාපනය හා වැඩි දියුණු කිරීම.	15.5	885.27	13 අගෝ. 28	15 අප්‍රේල් 25*	658.48	100%
කැබිතිගොල්ලෑව - පදවිය මාර්ගයේ (B 211) (කි.මී.15+500 සිට 31+345) පුනරුත්ථාපනය හා වැඩි දියුණු කිරීම.	15.85	1020.29	13 අගෝ. 28	15 අප්‍රේල් 25*	760.62	100%
මැදවච්චිය - මන්නාරම මාර්ගයේ (A 014) (කි.මී.47+000 සිට 62+000) පුනරුත්ථාපනය හා වැඩි දියුණු කිරීම.	15.1	1183.78	13 දෙසැ. 12	15 අගෝස්තු 9	1186.8	100%
මැදවච්චිය - මන්නාරම මාර්ගයේ (A 014) (කි.මී. 62+000 සිට 76+600) පුනරුත්ථාපනය හා වැඩි දියුණු කිරීම.	14.4	1102.67	13 දෙසැ. 12	15 අගෝස්තු 9	870.99	100%
යාපනය - පන්නෙයි - කයිට්ස් මාර්ගයේ (AB 019) (කි.මී. 0+000 සිට 10+000) පුනරුත්ථාපනය හා වැඩි දියුණු කිරීම.	10	1655.17	13 දෙසැ. 12	15 අගෝස්තු 9	1419.17	100%
යාපනය - පන්නෙයි - කයිට්ස් මාර්ගයේ (AB 019) (කි.මී. 10+000 සිට 20+270) පුනරුත්ථාපනය හා වැඩි දියුණු කිරීම.	10.28	1210.09	13 දෙසැ. 12	15 ජූනි 10**	888.42	100%

සටහන: *- අභිතකර කාලගුණය නිසා කල් දිගු කිරීම ලබාදුන් අතර වැඩ ප්‍රමාණය වැඩිවීම ඇගයීම කරමින් පවතී. **-පස් හිඟය හා ප්‍රමාණ විචලනය හේතුවෙන් කල් දිගු කිරීම -ඇගයීම සිදු කෙරෙමින් පවතී.

වවුනියා - හොරොව්පතාන මාර්ගය වැඩි දියුණු කිරීම කි.මී. *22+000* සිට *34+950* දක්වා



පාලම් අංක *28/6*

මැදවච්චිය - කැබිතිගොල්ලෑව මාර්ගය වැඩි දියුණු කිරීම කි.මී. *0+000* සිට *12+600* දක්වා



කි.මී. *8+150* අසල මාර්ගය

මැදවච්චිය - කැබිතිගොල්ලෑව මාර්ගය වැඩි දියුණු කිරීම කි.මී. *12+600* සිට *25+400* දක්වා



කි.මී. *12+850* අසල මාර්ගය

මැදවච්චිය - මන්නාරම මාර්ගය වැඩි දියුණු කිරීම කි.මී. 47+000 සිට කි.මී. 62+100 දක්වා



67-3 බෝක්කුව

65+562 වාරි මාර්ගයේ මුව දකුණු පස

යාපනය - පන්නෙයි - කයිට්ස් මාර්ගය වැඩි දියුණු කිරීම කි.මී. 0+000 සිට 10+000 දක්වා



කි.මී. 0+000 අසල වටරවුම

යාපනය - පන්නෙයි - කයිට්ස් මාර්ගය වැඩි දියුණු කිරීම කි.මී. 10+000 සිට 20+275 දක්වා



කි.මී. 12+090 අරාලි හංදිය

5.17.3 මාර්ග ව්‍යාපෘති සැකසුම් පහසුකම (RPPF)

5.17.3.1 හැඳින්වීම.

මාර්ග ව්‍යාපෘති සැකසුම් පහසුකම ආසියානු සංවර්ධන බැංකු අරමුදල් සැපයූ තාක්ෂණික සහායක ණය ආධාර ව්‍යාපෘතියකි. මෙම ණය මුදලේ අරමුණ, ව්‍යාපෘති පිළියෙල කිරීමේදී අවධානය යොමු කරමින්, මාර්ග ජාලය කාර්යක්ෂමව සංවර්ධනය කිරීමට ශ්‍රී ලංකා රජයට සහාය දීමයි. මෙම ණය මුදල, (i) බාහිර ආයතනවල සහාය සඳහා රැඳී නොසිට, මාර්ග අංශයේ ආයතනවලට පූර්ව ඉදිකිරීම් සිදු කිරීමේ හා (ii) ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම පසු විපරම් කිරීමේ සූදානම සහතික කිරීමේ හැකියාව ලැබේ. තවද මෙම ණය මුදල, ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම සඳහා මාර්ග පිළිබඳ ආයතනවල ධාරිතාව නැංවීමට උපකාරී වනු ඇත. ණය මුදල රා.පු.හ. ව්‍යාපෘති ඇතුළුව ජාතික හා පළාත් මාර්ග හා අධිවේගී මාර්ග සඳහාය.

5.17.3.2 ව්‍යාපෘතියේ ප්‍රතිඵලය

ජාතික හා පළාත් මාර්ග පිළිබඳව ශක්‍යතා අධ්‍යයන, පාරිසරික හා සාමාජීය තක්සේරුව, ප්‍රතිස්ථාපන සැලසුම්, විස්තරාත්මක සැලසුම් හා ලංසු ලේඛන.

5.17.3.3 විධාන කිරීමේ හා ක්‍රියාත්මක කිරීමේ ආයතනය

විධාන කිරීමේ ආයතනය මහාමාර්ග චරාය හා නාවික අමාත්‍යාංශය වන අතර, මහාමාර්ග චරාය හා නාවික අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක කිරීමේ ආයතනය මාර්ග සංවර්ධන අධිකාරියයි.

5.17.3.4 සමස්ත ඇස්තමේන්තු පිරිවැය

මෙම පහසුකමේ එ.ජ.ඩො. මිලියන 20 කට සමාන මුදලකි. ආ.සං.බැ. විසින්, එ.ජ.ඩො. මිලියන 15 ක ණය මුදලක් සපයනු ඇත. ශ්‍රී ලංකා රජය විසින්, ප්‍රතිමුඛ කාර්ය මණ්ඩලයේ පාරිශ්‍රමිකයන්, ජාත්‍යන්තර හා දේශීය ගමන් බිමන්, සමීක්ෂණ කාර්යාල පහසුකම්, බදු හා ගාස්තු සහ වෙනත් විවිධ වියදම් ඇතුළුව සමස්ත පිරිවැයෙන් එ.ජ.ඩො. මිලියන 5 ක් ශ්‍රී ලංකා රජය විසින් සපයනු ලැබේ.

5.17.3.5 ව්‍යාපෘති විස්තර

යෝජනාවලි	වැඩ විස්තර	වර්තමාන තත්ත්වය
I	ජා.මා. කි.මී. 1500 ක ශක්‍යතා අධ්‍යයන හා විස්තරාත්මක සැලසුම්	අත්හිටුවන ලදි
I A	වාර්ෂික දීමනා පදනම් කරගෙන තෝරාගත් රා.පු.හ. නියමු ව්‍යාපෘතිය	අත්හිටුවන ලදි
I B	ජා.ම. කි.මී. 351.34 ක ශක්‍යතා අධ්‍යයන හා විස්තරාත්මක සැලසුම්	නිම කෙරිණි
IC	ජා.මා. කි.මී. 600 ක ශක්‍යතා අධ්‍යයන	නිම කෙරිණි

V	යාපනය අර්ධ ද්වීපයේ A009 මාර්ගය හා අනෙකුත් මාර්ග කි.මී. 267 ක ශක්‍යතා අධ්‍යයන හා විස්තරාත්මක සැලසුම්	නිම කෙරිණි
V A	උතුරු මාර්ග සම්බන්ධතා ව්‍යාපෘතියේ ශක්‍යතා අධ්‍යයනය හා විස්තරාත්මක සැලසුම් (කි.මී.170)	නිම කෙරිණි
V B	දකුණු සම්බන්ධතා මාර්ගවල ශ.අ. හා වි.සැ. සමාලෝචනය (කි.මී. 77)	නිම කෙරිණි
II	පළාත් මාර්ග කි.මී. 2400 පිළිබඳ ශක්‍යතා අධ්‍යයන හා විස්තරාත්මක සැලසුම්	නිම කෙරිණි
III	ජාතික මහාමාර්ග කි.මී. 800 සඳහා ශක්‍යතා අධ්‍යයන හා විස්තරාත්මක සැලසුම්.	න.ක. හා ඉ.අංශයට භාර දෙන ලදි.
IV	පළාත් මහාමාර්ග කි.මී. 1500 ක් සඳහා ශක්‍යතා අධ්‍යයන හා විස්තරාත්ක සැලසුම් ඉංජිනේරුමය සැලසුම් නිර්මාණ	කල් දමන ලදි.
IX	දක්ෂිණ මාර්ග දිගු කිරීම පිළිබඳ ශක්‍යතා අධ්‍යයන හා ප්‍රාථමික සැලසුම්	ප්‍රසම්පාදනය නිම කෙරිණි. දැනට ද.අ.මා.දි. ව්‍යාපෘතිය යටතේ ක්‍රියාත්මක කෙරේ.
X	අතිරේක ජාතික හා පළාත් මාර්ග පිළිබඳ ශක්‍යතා අධ්‍යයන හා විස්තරාත්මක ඉංජිනේරු සැලසුම්	ව්‍යාපෘතිය නිම කෙරිණි
XII	පුද්ගලික උපදේශකයන් ප්‍රසම්පාදනය	නිම කෙරිණි

5.17.3.6 2015 වර්ෂය තුල කටයුතු

කොන්ත්‍රාත් යෝජනාවලි IX - දක්ෂිණ අධිවේගී මාර්ගය දිගු කිරීම පිළිබඳ ශක්‍යතා අධ්‍යයනය හා ප්‍රාථමික සැලසුම් සඳහා උපදේශක සේවා.

උපදේශකයන් ප්‍රසම්පාදනය කිරීමේ වැඩ නිම කෙරිණි. ආසියානු සංවර්ධන බැංකුවේ එකඟතාවය ලබා ගැනීමෙන් පසුව, කොන්ත්‍රාත්තුව, එ.ජ.ඩො. 802,400.00 හා ශ්‍රීලංරු 46,037,712.00 අගයකට BCL ඇසෝසියේට්ස් ඇන් ඉංජිනියරින් කන්සල්ටන්ට් පුද්. සමාගම සමඟ තනහිරා ඇන් ඉංජිනියර්ස් ඉන්ටර්නැෂනල් සමාගමට ප්‍රදානය කරන ලදි. කොන්ත්‍රාත් ගිවිසුම, 2013 ජූලි 24 දින අත්පත්කර, කටයුතු කරගෙන යාමේ නිවේදනය නිකුත් කරනු ලැබීය. දක්ෂිණ මහාමාර්ග දකුණු දෙසට දිගු කිරීමේ ව්‍යාපෘතිය යටතේ, මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කෙරේ.


කොන්ත්‍රාත් යෝජනාවලිය XII - පෞද්ගලික උපදේශකයන් ප්‍රසම්පාදනය කිරීම.

ICS 003 – ජාත්‍යන්තර මාර්ග වත්කම් කළමනාකරණ උපදේශක
ICS 004 – ජාත්‍යන්තර නිමවුම් හා කාර්ය සාධනය පදනම් වූ කොන්ත්‍රාත් විශේෂඥ
ICS 005A – ජාත්‍යන්තර ග්‍රාමීය මාර්ග විශේෂඥ
ICS 005B – ජාතික ග්‍රාමීය මාර්ග විශේෂඥ
ICS 006 – ජාතික තොරතුරු තාක්ෂණ විශේෂඥ
ICS 007 – ජාතික ප්‍රසම්පාදන විශේෂඥ

ප්‍රසම්පාදනය සඳහා ඇගයීම් මිනුම් දඬු හා පිරිවැය ඇස්තමේන්තු පිළියෙල කර ජ.ප්‍ර.ක. හා ආ.සං.බැ. වෙත ඉදිරිපත් කරනු ලැබීය. ICS 005A – දරණ ජාත්‍යන්තර ග්‍රාමීය මාර්ග උපදේශක තනතුර සඳහා සුදුසු අපේක්ෂකයෙකු නොසිටි බැවින්, එය හැර ඉහත සඳහන් උපදේශක සේවා සඳහා පහත සඳහන් පුද්ගලයන් සමඟ කොන්ත්‍රාත් ගිවිසුම් අත්සන් තබන ලදි.

යෝජනාවලිය / උපදේශක සේවාව	සමාගම	පුද්ගල උපදේශක	කාලසීමාව	කොන්ත්‍රාත් මුදල
ICS 003 - ජාත්‍යන්තර වත්කම් කළමනාකරණ උපදේශක		ඉයන් ඩග්ලස් ග්‍රීන්වුඩ් මහතා	මාස 2 (කඩින්කඩ)	එ.ජ.ඩො. 78,000.00
ICS 004 – ජාත්‍යන්තර නිමැවුම් හා කාර්යසාධන පදනම් වූ මාර්ග කොන්ත්‍රාත් විශේෂඥ	ඔපස් ඉන්ටර්නැෂනල් කන්සල්ටන්ට් ලිමිටඩ් නවසීලන්තය	රොවන් ජේම්ස් කයිල් මහතා	මාස 2 (කඩින්කඩ)	එ.ජ.ඩො. 91,650.00
ICS 005B – ජාතික ග්‍රාමීය මාර්ග විශේෂඥ	රිසෝස් ඩිවලොප්මන්ට් කන්සල්ටන්ට් සමාගම	අයි.එච්.ඩී. සුමනරත්න මහතා	මාස 2 (කඩින්කඩ))	ශ්‍රීලංරු 1,590,000.00
ICS 006 – ජාතික තොරතුරු තාක්ෂණික විශේෂඥ		තුෂාන්ත ඉලංකෝන් මහතා	මාස 5 (කඩින්කඩ)	ශ්‍රීලංරු 1,720,000.00
ICS 007 – ජාතික ප්‍රසම්පාදන විශේෂඥ	ජාතික ප්‍රසම්පාදන විශේෂඥ	ජී. සුරේන් මහතා	මාස 03	ශ්‍රීලංරු 1,755,000.00

5.17.4 සිතියම 20: අධිවේගී මාර්ග සම්බන්ධතා වැඩි දියුණු කිරීමේ සැලැස්ම (ECIP)



5.17.4.1 හැඳින්වීම.

ශ්‍රී ලංකාවේ මාර්ග ජාලය විසින්, වර්තමාන ප්‍රවාහන පද්ධතියේ ආධිපත්‍යය දරනු ලබයි. වර්තමාන මාර්ග ජාලයට සිදු කරනු ලැබූ වැදගත් සාක්ෂාත් කිරීම වූයේ ඉහළ වාහන හිමිකම් අනුපාතයක් ඇති පළාත් දෙකක්, දක්ෂිණ අධිවේගී මාර්ගය විවෘත කිරීම මගින් සම්බන්ධ කිරීමයි. දක්ෂිණ අධිවේගී මාර්ගයේ සාර්ථකත්වය තිබියදී, දකුණු ප්‍රදේශයේ මාර්ග ප්‍රවාහන පද්ධතියේ අභියෝගයන් ගණනාවක් මතුවී ඇත. ඒවා අතර,

I. දක්ෂිණ අධිවේගී මාර්ගය සම්බන්ධවන ජාතික මහාමාර්ගවල අඩු ධාරිතාව විශේෂයෙන්ම බස්නාහිර පළාත,

II. ජාතික මහාමාර්ගවල දුර්වල තත්ත්වය හා

III. පද්ධතියට දිගු කාලීන පුළුල් සම්බන්ධතා වැඩ සටහනක් නොමැතිකම.

අධිවේගී මාර්ග සම්බන්ධතා අභියෝගවලට පිළිතුරු සඳහා මගීන් හා භාණ්ඩ ප්‍රවාහනයට කාර්යක්ෂම හා පිරිවැය කාර්යක්ෂම ලෙස පහසුකම් සැලසිය යුතුය. මේ සඳහා අංශ දෙකක වහා පියවර ගැනීම අවශ්‍ය වේ,

(අ) අධිවේගී මාර්ග ජාලය සම්බන්ධ කරන ප්‍රවේශ මාර්ගවල ධාරිතාව හා තත්ත්වය වැඩි දියුණු කිරීම හා,

(ආ) දිගුකාලීන සම්බන්ධතා වැඩි දියුණු කිරීමේ සැලසුමක් පිළියෙල කිරීම.

මෙම කාර්යයන් ඉටු කිරීම සඳහා, දක්ෂිණ මාර්ග සම්බන්ධතා ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමට මුදල් සැපයීමට ආ.සං.බැ. වෙන් ණය මුදලක් ඉල්ලා සිටින ලදි.

අධිවේගී මාර්ග සම්බන්ධතා සැලසුම, අධිවේගී මාර්ග සම්බන්ධතාවය වැඩි දියුණු කිරීමේ හා ක්‍රියාත්මක කිරීමේ සූදානම සහතික කිරීම සඳහා දක්ෂිණ මාර්ග සම්බන්ධතා ව්‍යාපෘති සහභාගය මා.සං.අ. යේ ධාරිතාවය නැංවීම සඳහාය.

5.17.4.2 ව්‍යාපෘතියේ ප්‍රතිඵලය.

ව්‍යාපෘතියේ බලපෑම වනුයේ දක්ෂිණ ප්‍රදේශයේ කාර්යක්ෂම මාර්ග ප්‍රවාහනයයි. ප්‍රතිඵලය වනුයේ දක්ෂිණ ප්‍රදේශයේ අධිවේගී මාර්ග ජාලය හා ප්‍රාදේශීය මාර්ග ජාලය අතර වැඩි දියුණු වූ සම්බන්ධතාවයයි. ආ.සං.බැ. ව්‍යාපෘතියේ ප්‍රධාන වශයෙන් පහත සඳහන් නිමැවුම් බිහිකරනු ඇත.

I. දකුණු ප්‍රදේශයේ අධිවේගී මාර්ග ජාලය සම්බන්ධ කරමින් ප්‍රධාන ජාතික මහාමාර්ග කි.මී.55 ක වර්ධනය වූ ධාරිතාව.

II. ක්‍රියාත්මක කිරීමේ වැඩ සටහනක් සහ ප්‍රමුඛතා මාර්ග ව්‍යාපෘතියේ කි.මී. 200 ක විස්තරාත්මක සැලසුම් සහිතව දිගු කාලීන අධිවේගී මාර්ග වැඩි දියුණු කිරීමේ සැලැස්මක් සම්පාදනය කිරීම.

5.17.4.3 විධාන කිරීමේ හා ක්‍රියාත්මක කිරීමේ ආයතනය

ව්‍යාපෘතිය සඳහා විධාන නිකුත් කිරීමේ ආයතනය මහාමාර්ග වරාය හා නාවික අමාත්‍යාංශය වන අතර, මහාමාර්ග වරාය හා නාවික අමාත්‍යාංශය යටතේ, මාර්ග සංවර්ධන අධිකාරිය ක්‍රියාත්මක කිරීමේ ආයතනය ලෙස කටයුතු කරයි.

5.17.4.4 සමස්ත ඇස්තමේන්තු පිරිවැය.

ව්‍යාපෘති ආයෝජන සැලැස්මෙන්, ඇස්තමේන්තු පිරිවැය ඩොං. මිලියන 100 ක් වන අතර එයින් මිලියන 5ක් ආ.සං.බැ. විශේෂ අරමුදල් සම්පත් උපදේශක සේවාවට මුදල් සැපයීමට වෙන් කෙරිණි.

5.17.4.5 ව්‍යාපෘති විස්තර

යෝජිත දක්ෂිණ අධිවේගි මාර්ග සම්බන්ධතා ව්‍යාපෘතිය යටතේ උපදේශක සේවාව සඳහා ණය මුදල ගෙවීමට පිළියෙල කරනු ලැබීය. මාර්ග ව්‍යාපෘති සැකසීමේ පහසුකම සඳහා පිහිටුවනු ලැබූ මාර්ග සංවර්ධන අධිකාරියේ ව්‍යාපෘති කළමනාකරණ ඒකකය විසින් අධිවේගි මාර්ග සම්බන්ධතා ව්‍යාපෘතිය යටතේ ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරනු ලැබේ. ප්‍රධාන උපදේශක සේවාව වන්නේ, මාර්ග කි.මී. 400 ක් පරීක්ෂාව, ජනතා මහාමාර්ග කි.මී. 250 ක් සඳහා ශක්‍යතා අධ්‍යයන හා ජාතික මහාමාර්ග 200 ක් සඳහා විස්තරාත්මක ඉංජිනේරු සැලසුම් ක්‍රියාත්මක කිරීමයි. මේ සඳහා පළාත් හයක මාර්ග කොටස් 25 ක් තෝරාගනු ලැබීය.

5.17.4.6 2015 වර්ෂය තුල කටයුතු.

දක්ෂිණ මාර්ග සම්බන්ධතා ව්‍යාපෘතිය යටතේ, ශක්‍යතා අධ්‍යයනය හා විස්තරාත්මක සැලසුම සඳහා උපදේශක සේවයට ගෙවීම් සඳහා ණය මුදලක් සූදානම් කරන ලදි. මාර්ග ව්‍යාපෘති සැකසීමේ පහසුකම සඳහා පිහිටුවනු ලැබූ මාර්ග සංවර්ධන අධිකාරියේ ව්‍යාපෘති කළමනාකරණ ඒකකය **අධිවේගි මාර්ග සම්බන්ධතා සැලසුම** යටතේ ක්‍රියාත්මක වෙයි. ප්‍රධාන උපදේශක සේවාව වන්නේ මාර්ග කි.මී. 400ක් පරීක්ෂාව, ජාතික මහාමාර්ග කි.මී. 250 ක් සඳහා ශක්‍යතා අධ්‍යයනය, හා ජාතික මහාමාර්ග කි.මී. 200 ක් සඳහා විස්තරාත්මක ඉංජිනේරු සැලසුම් වෙනුවෙන් පළාත් විස්තරාත්මක ඉංජිනේරු සැලසුම් සැකසීමයි. ඉතිරි ණය ශේෂයන් භාවිතා කරමින් වෙනස් තත්ත්වයක් යටතේ සමාන්තර ව්‍යාපෘති සඳහා ඒක පුද්ගල උපදේශක සේවාවක් ප්‍රදානය කරන ලදි.

අවසන් කාර්තුව වන විට අ.මා.ස.ව.සැ. යටතේ උපදේශක සේවා කොන්ත්‍රාත් පහක් ක්‍රියාත්මක කරමින් සිටින අතර තවත් ඒක පුද්ගල උපදේශක සේවා දෙකක් සඳහා ප්‍රසම්පාදන කටයුතු ක්‍රියාත්මක කෙරෙමින් පවතී. අ.මා.ස.ව.සැ. යටතේ, උපදේශක සේවාවල තත්ත්වය මීලඟට දැක්වෙන වගුවෙන් විස්තර කෙරේ.

යෝජනා වලිය	මාර්ගයේ / පාලමේ නම	ආරම්භක දිනය	ඉලක්ක නිම කරන දිනය	සමස්ත ඇස්තමේන්තු පිරිවැය (එ.ජ.ඩො. මිලි.)	තත්ත්වය
01	අධිවේගී මාර්ග ජාලය සම්බන්ධ කෙරෙන ජාතික මහා මාර්ග පිළිබඳ පරීක්ෂාව, ශක්‍යතා අධ්‍යයනය, ඉංජිනේරු සැලසුම් සඳහා උපදේශක සේවාව RDC සමඟ සම්බන්ධිත KCI-KECC JV උපදේශක	14 දෙසැ. 9	16 ජූනි 9	3.5	ප්‍රගතිය සිදු වෙමින් පවතී
දක්ෂිණ මහාමාර්ග කොළඹ දෙසට දිගු කිරීම සඳහා පුද්ගල උපදේශක සේවාව					
ICS-001	ද.ම.කොා.දෙ.දී. ICS-001 සඳහා ඒක පුද්ගල උපදේශක ප්‍රවාහන සැලසුම්කරු (ජාත්‍යන්තර)	14 දෙසැ. 16	16 මාර්තු 31	0.1	උපදේශක සේවා නිම කෙරිණි (මිනුම් වැඩ සිදු කෙරෙමින් පවතී)
ICS-002	ද.ම.කොා.දෙ.දී. ICS-002 සඳහා ඒක පුද්ගල උපදේශක මහාමාර්ග ඉංජිනේරු (ජාත්‍යන්තර)	14 දෙසැ. 16	16 මාර්තු 31	0.07	උපදේශක සේවා නිම කෙරිණි.
ICS 003	ද.ම.කොා.දෙ.දී. ICS 003 - පාලම් / ව්‍යුහ ඉංජිනේරු (ජාත්‍යන්තර)	14 දෙසැ. 16	16 මාර්තු 31	0.073	උපදේශක සේවා නිම කෙරිණි (මිනුම් වැඩ සිදු කෙරෙමින් පවතී)
මධ්‍යම අධිවේගී මාර්ග ව්‍යාපෘතිය සඳහා ඒක පුද්ගල උපදේශක සේවා (ම.අ.ව්‍යා.)					
ICS 004	ඒක පුද්ගල උපදේශක ඒ.පු.උ. -004 මහාමාර්ග ඉංජිනේරු (ජාත්‍යන්තර)	15 ඔක්. 01	16 මාර්තු 30	0.16	ක්‍රියාත්මක කෙරෙමින් පවතී
ICS 005	ඒක පුද්ගල උපදේශක ඒ.පු.උ.-005 ප්‍රවාහන ආර්ථික විද්‍යාඥ (ජාත්‍යන්තර)	-	-	0.054	සලකා බලන කොන්දේසි සංශෝධනය කෙරිණි
ICS 006	ඒක පුද්ගල උපදේශක ඒ.පු.උ. 006 - පාලම් / ව්‍යුහ ඉංජිනේරු (ජාත්‍යන්තර)	-	-	0.18	1වැනි ස්ථානයට එක් උපදේශකයකු අනුමත කරන ලද අතර, මූල්‍ය යෝජනාව ඉදිරිපත් කරන ලදි.
සමස්ත ඇස්තමේන්තු පිරිවැය				**4.137**	

5.18 එ.රා. වානේ පාලම් ව්‍යාපෘතිය

බ්‍රිතාන්‍ය රජයේ මූල්‍ය සහාය යොදා ගනිමින් පාලම් ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමට 2007 වර්ෂයේදී එ.රා. වානේ පාලම් ව්‍යාපෘති ඒකකය පිහිටුවන ලදි. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය නියෝජනය කරමින් මහාමාර්ග වරාය හා නාවික අමාත්‍යාංශය සංයුක්ත පාලම් කොටස් සැලසුම් නිර්මාණය නිෂ්පාදනය හා සැපයීමට අදාල භාණ්ඩ හා සේවා සැපයීමට 2007 සැප්තැම්බර් 20 දින මාබේ ඇන්ඩ් ජොන්සන් ලිමිටඩ් සමාගම සමඟ කොන්ත්‍රාත්තුවකට එළඹිනි. මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේ ප්‍රධාන අරමුණ ග්‍රාමීය හා ප්‍රධාන මාර්ග හරහා ප්‍රවේශය වැඩි දියුණු කිරීමයි.

5.18.1 එ.රා. වානේ පාලම් ව්‍යාපෘතිය – II අදියර

5.18.1.1 ව්‍යාපෘති විස්තර :

පාලම් 104 සඳහා මාබේ බ්‍රිජ් සමාගමෙන් ව්‍යාපෘති වාර්තාව ලැබුණු අතර, ණය මුදල පවුම් මිලියන 45 කි. ව්‍යාපෘති කාලසීමාව වසර 04 කි. සැපයුම්කරු සමඟ ණය ගිවිසුම 2012 අප්‍රේල් 26 දින අත්සන් තැබුණු අතර එය 2013 සැප්. 16 දින සිට ක්‍රියාත්මකය.

අරමුදල් ආයතනය	කොන්ත්‍රාත් අගය
එච්එස්බීසි බැංකුව	රු.මිලි. . 9542 (පවුම් මිලියන 45)
ශ්‍රීලංර	රු. මිලි. 2,500.0


වැඩ විස්තරය	අරමුදල් ආයතනය	කොන්ත්‍රාත් අගය (රු. මිලි.)
පාලම් සැපයීම	එච්එස්බීසි බැංකුව	(පවුම් මිලි. 35.005) රු.මිලි. 7423.0
සැලසුම් හා සමීක්ෂණ	එච්එස්බීසි බැංකුව	(පවුම් මි. 2.246) රු.මිලි. 476.0
එ.රා. තාක්ෂණික සහාය	එච්එස්බීසි බැංකුව	(පවුම් මිලි. 1.449) රු.මිලි. 307.0
දේශීය සේවා (ඉදිකිරීම්)	එච්එස්බීසි බැංකුව	(පවුම් මිලි 6.300) රු.මිලි. 1336.0

5.18.1.2 **අරමුදල් මූලාශ්‍රය** : එච්එස්බීසි බැංකුව හා ශ්‍රීලංර

5.18.1.3 **ව්‍යාපෘති කාලසීමාව** : 2013 සැප්. 16 සිට 2017. සැප්. 16 දක්වා

5.18.1.4 **ප්‍රතිලාභ** :

ග්‍රාමීය මාර්ග මගින් ප්‍රවේශය වැඩි දියුණු කිරීමට පාලම් ඉදිකිරීම හා ප්‍රධාන මාර්ගවල සිදුවන ප්‍රමාද පිරිවැය අඩු කිරීමට පාලම යළි ඉදිකිරීම.



පොල්දුව පාලම



කන්දෙහංදිය - අදිකාරිගම - රංදෙනිගල -
ලොග්ගල්ඔය මාර්ගයේ අංක *35/10* පාලම

5.18.2 2015 වර්ෂය තුල කටයුතුවල සමස්ත ප්‍රගතිය - එ.රා. වානේ පාලම් ව්‍යාපෘතිය - II අදියර

පාලම් වර්ගය	පාලම් ගණන					
	ස්ථිර ව්‍යා.ක.ඒ. පාලම්	ස්ථිර ව්‍යා.ක.ඒ. නොවන පාලම්	තාවකාලික අතුරු පාලම්	2015 දක්වා එකතුව	2014. දක්වා එකතුව	2015 වර්ෂය තුල
නියම කළ පාලම්	54	8	18	80*	88	
ලැබුණු පාලම්	45	8	12	65	42	23
වැඩබිම් වලට යවන ලද පාලම්	31	7	12	50	27	23
නිමකල පාලම්	22	7	12	41	14	27
ඉදිකෙරෙමින් පවතින පාලම්	21	1	0	22	30	

පාලම් ගණන 80 දක්වා අඩු කෙරුණු අතර කොන්ත්‍රාත් පැහැදිලි කිරීම් අංක 005 සඳහා පාර්ශව දෙක අතර අක්සන් තබනු ලැබිය.

5.18.2.1 එ.රා. වානේ පාලම් ව්‍යාපෘති - අදියර II කටයුතුවල ප්‍රගතිය ක්‍රියාත්මක කිරීම සෘජුවම ව්‍යාපෘති කළමනාකරණ ඒකකය විසිනි

අංකය	මාර්ගයේ / පාලමේ නම	දිග (මී)	සමස්ත ඇස්තමේන්තු පිරිවැය රු. මිලියන	ආරම්භක දිනය	ඉලක්ක නිම කරන දිනය	2014 අවසානයේ භෞතික ප්‍රගතිය	2014 දෙසැ. 31 දිනට වියදම රු. මිලියන	2015 දෙසැ. 31 දිනට සමුච්චිත වියදම රු.මිලි.	2015 අවසානයේ භෞතික ප්‍රගතිය	2015 වර්ෂය තුල වියදම රු.මිලියන
1	කොල්ලුපිටිය - ශ්‍රී ජයවර්ධන පුර මාර්ගයේ අංක 7/4 පොල්දූව පාලම	70.6	2,237	13 ඔක්. 10	14 දෙසැ. 10	100%	2,207	2,207	100%	-
2	සල්ගස් හංදිය - ගංඉවුර - මාර්ගය යාකරන ගල්ඔය හරහා පාලම	172.4	107	13 ඔක්. 25	15 අප්‍රේ. 24	30%	29	56	40%	27
3	සියඹලාණ්ඩුව - දමන - අම්පාර මාර්ගයේ 39/4 පාලම	21.3	27	13 ඔක්. 23	14 ජූලි 23	98%	15	25	100%	10
4	වෙන්නප්පුව - කිරිමැටියාන මාර්ගයේ අංක 3/3 පාලම	21.3	92	13 ඔක්. 22	14 දෙසැ. 17	95%	48	71	100%	23
5	අවිස්සාවේල්ල - හැටන් - නුවරඑළිය මාර්ගයේ අංක 71/1 පාලම	9.1	23	13 ඔක්. 28	14 ජූලි 25	90%	-	23	100%	23
6	පාලුගම - බොරලන්ද - හපුතලේ මාර්ගයේ අංක 18/6 පාලම	21.3	88	13 ඔක්. 28	14 ඔක්. 27	55%	34	71	100%	37
7	පාලුගම - බොරලන්ද - හපුතලේ මාර්ගයේ අංක 19/8 පාලම	21.3		13 ඔක්. 28	14 ඔක්. 27	25%			100%	
8	හම්මැලිය - අඟලිය - මුල්කඩ මාර්ගයේ ගිංගහ හරහා පාලම	104.8	135	14 පෙබ. 10	15 මැයි 11	35%	32	79	100%	47
9	ගාල්ල - දෙනියාය - මාදම්පේ මාර්ගයේ අංක 62/3 පාලම	21.3	51	14 පෙබ. 13	14 නොවැ.13	10%	8	25	100%	17
10	ගාල්ල - දෙනියාය - මාදම්පේ මාර්ගයේ අංක 62/3 කාවකාලික අතුරු පාලම	39.6				100%			100%	

අංකය	මාර්ගයේ / පාලමේ නම	දිග (මී)	සමස්ත ඇස්තමේන්තු පිරිවැය රු. මිලියන	ආරම්භක දිනය	ඉලක්ක නිම කරන දිනය	2014 අවසානයේ භෞතික ප්‍රගතිය	2014 දෙසැ. 31 දිනට වියදම රු. මිලියන	2015 දෙසැ. 31 දිනට සමුච්චික වියදම රු.මිලි.	2015 අවසානයේ භෞතික ප්‍රගතිය	2015 වර්ෂය තුල වියදම රු.මිලියන
11	පරන්තන් - මුලතිවු මාර්ගයේ අංක . 21/1 පාලම	15.2	56	14 පෙබ. 17	15 පෙබ. 15	87%	32	44	100%	12
12	පරන්තන් - මුලතිවු මාර්ගයේ අංක. 24/2 පාලම	18.3				82%			100%	
13	පරන්තන් - මුලතිවු මාර්ගයේ අංක 24/2 තාවකාලික අතුරු පාලම	33.5				100%			100%	
14	පරන්තන් - මුලතිවු මාර්ගයේ අංක. 11/3 පාලම	12.2	67	14 පෙබ. 11	15 ජන. 11	85%	29	34	93%	5
15	පරන්තන් - මුලතිවු මාර්ගයේ අංක. 15/3 පාලම	33.5		14 පෙබ. 11	15 ජන. 11	65%			86%	
16	පරන්තන් - මුලතිවු මාර්ගයේ අංක 15/3 තාවකාලික අතුරු පාලම	39.6				100%			100%	
17	අල්ලෙයි - කන්තලේ මාර්ගයේ අංක 25/2 පාලම	45.0	97	14 පෙබ. 17	15 පෙබ. 16	42%	42	62	95%	20
18	අල්ලෙයි - කන්තලේ මාර්ගයේ අංක 25/2 අතුරු පාලම	39.6				100%			100%	
19	අල්ලෙයි - කන්තලේ මාර්ගයේ අංක 25/5 පාලම	30.5		14 පෙබ. 17	15 පෙබ. 16	44%			85%	
20	දුනුකේවත්ත කුඩාඇල හරහා පාලම	15.2	33	14 මාර්තු 12	15 මාර්තු 31	62%	9	10	100%	1
21	කොස්පොතුඔය හරහා එපිටකන්ද පාලම	27.4	40	14 අප්‍රේල් 24	15 මාර්තු 13	85%	10	18	100%	8

අංකය	මාර්ගයේ / පාලමේ නම	දිග (මී)	සමස්ත ඇස්තමේන්තු පිරිවැය රු. මිලියන	ආරම්භක දිනය	ඉලක්ක නිම කරන දිනය	2014 අවසානයේ භෞතික ප්‍රගතිය	2014 දෙසැ. 31 දිනට වියදම රු. මිලියන	2015 දෙසැ. 31 දිනට සමුච්චිත වියදම රු.මිලි.	2015 අවසානයේ භෞතික ප්‍රගතිය	2015 වර්ෂය තුල වියදම රු.මිලියන
22	කල්එළිය - පල්ලෙවෙල හරහා මාර්ගයේ අංක. 4/1 පාලම	12.2	19	14 මැයි 16	14 නොවැ. 13	95%	9	13	100%	4
23	කල්එළිය - පල්ලෙවෙල මාර්ගයේ අංක. 4/1 තාවකාලික අතුරු පාලම	15.2				100%			100%	
24	කලුඅග්ගල - ලබුගම මාර්ගයේ අංක 12/8 පාලම	33.5	89	14 මැයි 14	15 මැයි 13	10%	26	26	14%	-
25	කලුඅග්ගල - ලබුගම මාර්ගයේ අංක 12/8 තාවකාලික අතුරු පාලම	39.6				100%			100%	
26	කලුඅග්ගල - ලබුගම මාර්ගයේ අංක 4/2 පාලම	33.5	98	14 ජුනි 05	15 නොවැ 25	12%	30	76	95%	46
27	කලුඅග්ගල - ලබුගම මාර්ගයේ අංක 4/2 තාවකාලික අතුරු පාලම	39.6				100%			100%	
28	නාවක්කුලි - කාරතිවු - මන්නාරම මාර්ගයේ කි.මී. 29+330 පාලම	12.2	59	14 ජූලි 01	15 ජන. 28	85%	26	46	100%	20
29	නාවක්කුලි - කාරතිවු - මන්නාරම මාර්ගයේ කි.මී. 29+259 පාලම	15.2				85%			100%	
30	සමන්තුරේ - මල්කම්පිටිය - දීසවාපිය මාර්ගයේ අංක 5/3	9.1	29	14 මැයි 14	14 නොවැ 12	92%	16	26	100%	10
31	කන්දෙහංදිය - අදිකාරිගම - රන්දෙනිගල - ලොග්ගල් ඔය මාර්ගයේ අංක 35/10	33.5	48	14 ජූලි 08	15 අප්‍රේ 7	37%	6	37	100%	31
32	කන්දෙහංදිය - අදිකාරිගම - රන්දෙනිගල - ලොග්ගල් ඔය මාර්ගයේ අංක 35/10 තාවකාලික අතුරු පාලම	39.6				100%			100%	

අංකය	මාර්ගයේ / පාලමේ නම	දිග (මී)	සමස්ත ඇස්තමේන්තු පිරිවැය රු. මිලියන	ආරම්භක දිනය	ඉලක්ක නිම කරන දිනය	2014 අවසානයේ භෞතික ප්‍රගතිය	2014 දෙසැ. 31 දිනට වියදම රු. මිලියන	2015 දෙසැ. 31 දිනට සමුච්චිත වියදම රු.මිලි.	2015 අවසානයේ භෞතික ප්‍රගතිය	2015 වර්ෂය තුල වියදම රු.මිලියන
33	ගුරුළුබැද්ද - අද්දරගොඩ මාර්ගයේ මගුරු ගඟ හරහා පාලම	51.8	50	14 ජූලි 7	15 ඔක්. 31	40%	8	31	100%	23
34	මහඔය - පොල්ලෙබැද්ද මාර්ගයේ මහඔය හරහා පාලම	79.8	42	14 ජූලි 28	15 අප්‍රේ 27	12%	11	17	39.5%	6
35	හුනුගම - කනෝගම මාර්ගයේ කොලමුණුඔය හරහා පාලම	39.6	45	14 දෙසැ.9	15 අගෝ. 9	0%	4	21	85%	17
36	ඇල්ලගාව කළුගඟ හරහා පාලම	45.7	7	14 දෙසැ.9	15 ජන. 8	95%	0	8	100%	8
37	ඇස්වත්ත - රංවල මාර්ගයේ කැලණිය හරහා පාලම	148	107	14 දෙසැ.10	16 ජූනි 8	0%	9	41	41%	32
38	කාරකිවු - අම්පාර මාර්ගයේ අංක .2/1 පාලම	63	89	15 පෙබ. 2	16 පෙබ. 1	0%	-	29	36%	29
39	කාරකිවු - අම්පාර මාර්ගයේ අංක .2/1 අතුරු පාලම	52				0%			100%	
40	ලේඩි මැකලම් බ්‍රයිව් අංක 1/1 පාලම	9.1	84	15 පෙබ. 2	16 ජන. 13	0%	-	8	90%	8
41	උලපනේ - පුස්සැල්ලාව මාර්ගයේ අංක .20/1 පාලම	9.1		15 පෙබ. 2	16 ජන. 13	0%			93%	
42	බිලැක්පූල් - අඹේවෙල - පට්ටිපොල - හෝටන්තැන්න මාර්ගයේ අංක.18/2 පාලම	9.1		15 පෙබ. 2	16 ජන. 13	0%			29%	
43	බිලැක්පූල් - අඹේවෙල - පට්ටිපොල - හෝටන්තැන්න මාර්ගයේ අංක.18/2 අතුරු පාලම	21.3		15 පෙබ. 2	16 ජන. 13	0%			100%	

අංකය	මාර්ගයේ / පාලමේ නම	දිග (මී)	සමස්ත ඇස්තමේන්තු පිරිවැය රු. මිලියන	ආරම්භක දිනය	ඉලක්ක නිම කරන දිනය	2014 අවසානයේ භෞතික ප්‍රගතිය	2014 දෙසැ. 31 දිනට වියදම රු. මිලියන	2015 දෙසැ. 31 දිනට සමුච්චිත වියදම රු.මිලි.	2015 අවසානයේ භෞතික ප්‍රගතිය	2015 වර්ෂය තුල වියදම රු.මිලියන
44	ඕලුගංතොට - පින්නවල - බොගවන්තලාව මාර්ගයේ අංක .1/1 පාලම	9.1	27	15 පෙබ. 9	15 නොවැ 21	0%	-	10	100%	10
45	ඇල්පිටිය - අවිත්තාව - ලෙව්වන්දුව මාර්ගයේ අංක 1/5 පාලම	12.2	107	15 පෙබ. 2	16 පෙබ 1	0%	-	12	65%	12
46	හොරවල - පැලවත්ත - පිටිගල මාර්ගයේ අංක .24/4 පාලම	24.4				0%			20%	
47	හොරවල - පැලවත්ත - පිටිගල මාර්ගයේ අංක.24/4 අතුරු පාලම	33				0%			100%	
48	කුරුගංමෝදර - කළුගහ හරහා පාලම	83.5	175	15 මාර්තු 3	16 ජුනි 1	0%	-	40	30%	40
49	කැරොලිනා - නෝර්ටන් - වනරාජ මාර්ගයේ අංක 7/13 පාලම	9.1	33	15 මැයි 17	15 නොවැ 12	0%	-	-	25%	-
50	ඔටප්පුව - ඉහළවැව මාර්ගයේ අංක. 10/2 පාලම	36.6	31	15 ජූලි 28	16 අප්‍රේ 26	0%	-	4	55%	4
51	රත්නපුර - පලාවෙල - කරවිට මාර්ගයේ අංක. 17/9 පාලම	33.5	33	15 ජූලි 22	16 ජූලි 20	0%	-	14	25%	14
52	කටුගස්තොට - මැදවල - බඹරැල්ල මාර්ගයේ අංක. 28/8 පාලම	21.3	48	15 දෙසැ. 11	16 දෙසැ 9	0%	-	-	0%	-

5.18.2.2 එ.රා. වානේ පාලම් ව්‍යාපෘතියේ II අදියර වෙනත් පාර්ශව විසින් ක්‍රියාත්මක කළ කටයුතුවල ප්‍රගතිය (උදා: ව්‍යාකල්, ඉදිකිරීම් අංශය ආදිය)

අංක	මාර්ග අංකය	මාර්ගයේ නම / පාලමේ නම	පාලමේ දිග (මී)	වගකීම	2014 දෙසැම්බර් අවසානයේ භෞතික ප්‍රගතිය	2015 දෙසැම්බර් අවසානයේ භෞතික ප්‍රගතිය	2015 දෙසැම්බර් 31 දිනට සමුච්චිත ප්‍රගතිය (රු. මිලි.)
1	මාසංඅ නොවන	වැලිපැන්න ගඟ හරහා පාලම (මීගම - ඉත්තෑපාන)	130	ප්‍ර.ඉං. ව්‍යාපෘති කළුතර	100%	100%	උපරිම ව්‍යුහය සැකසීම පමණි
2	මාසංඅ නොවන	දැදුරුඔය හරහා ගල්කඩුල්ල පාලම	49	ප්‍ර.ඉං. කුරුණෑගල	100%	100%	උපරිම ව්‍යුහය සැකසීම පමණි
3	මාසංඅ නොවන	ලංකා පටුන පාලම	148	ප්‍ර.ඉං. ත්‍රිකුණාමලය	65%	65%	උපරිම ව්‍යුහය සැකසීම පමණි
4	මාසංඅ නොවන	මාදම්පේ - තොඩුවාව මාර්ගයේ පාලම	86	ප්‍ර.ඉං. හලාවත	80%	100%	උපරිම ව්‍යුහය සැකසීම පමණි
5	මාසංඅ නොවන	මොරගල්ල - බේරුවල කඩොලාන දූව පාලම	33	ප්‍ර.ඉං. කළුතර	15%	100%	උපරිම ව්‍යුහය සැකසීම පමණි
6	B503	මාකඳුර - බඩල්ගම මාර්ගයේ අංක. 3/3 පාලම	30	ප්‍ර.ඉං. ගම්පහ	0%	100%	උපරිම ව්‍යුහය සැකසීම පමණි
7	A002	දිගරොල්ල පාලම	194	ව්‍යා.අ. (දේ.බැ.අ.මු.)	0%	100%	උපරිම ව්‍යුහය සැකසීම පමණි
8	මාසංඅ නොවන	කැලණි ගඟ හරහා තණකොළවත්ත පාලම	80	ප්‍ර.ඉං. ව්‍යාපෘති රත්නපුර	0%	100%	උපරිම ව්‍යුහය සැකසීම පමණි
9	A029	වවුනියාව - හොරොව්පතාන මාර්ගයේ අංක. 18/1 පාලම	21	ව්‍යා.අ. (උ.මා.සං.ව්‍යා.)	0%	100%	උපරිම ව්‍යුහය සැකසීම පමණි
10	B282	මැදවච්චිය - හොරොව්පතාන මාර්ගයේ අංක. 1/3 පාලම	24	ව්‍යා.අ. (දේ.බැ.අ.මු.)	0%	0%	උපරිම ව්‍යුහය සැකසීම පමණි

5.18.3 2015 වර්ෂය අවසානයේ එ.ජ. වානේ පාලම් ව්‍යාපෘතිය - අදියර II සමස්ත භෞතික ප්‍රගතිය

ව්‍යාපෘතියේ නම / මාසංඅ අංශය	කොන්ත්‍රාත් අංකය	වැඩ විස්තරය	කොටස	අරමුදල් ආයතනය	කොන්ත්‍රාත් අගය (රු.මිලි.)	ආරම්භක දිනය	නිමකරන දිනය	2015 දෙසැම්බර් අවසානය දක්වා විදයම (රු.මිලි.)	2015 දෙසැම්බර් අවසානය දක්වා භෞතික ප්‍රගතිය
එ.රා. වානේ පාලම් ව්‍යාපෘතිය - II අදියර	53M/FC 1207 (2007027/SL)			එ.රා. එව්එස්බීසි	9,542.00	16-Sep-13	16-Sep-17	7,821.94	84%
				ශ්‍රීලංර	2,500.00	16-Sep-13	16-Sep-17	1,113.93	72%
					12,042.00			**8,935.87**	82%
		ණය සහභාගයන්							
		පාලම් සැපයීම		එ.රා. එව්එස්බීසි	7,423	16-Sep-13	16-Sep-16	6,451.86	87%
		සැලසුම හා සමීක්ෂණ		එ.රා. එව්එස්බීසි	476	16-Sep-13	16-Sep-17	104.45	85%
		එ.රා. තාක්ෂණික සහාය		එ.රා. එව්එස්බීසි	307	16-Sep-13	16-Sep-17	212.88	72%
		දේශීය සේවා හා දේශීය දුව්‍යමය සහාය (ණය)		එ.රා. එව්එස්බීසි	1,336	16-Sep-13	16-Sep-17	1,052.75	72%
		උප ව්‍යුහයේ පිරිවැය ඉතිරි කොටස දේශීය කොන්ත්‍රාත්කරුවන් (ශ්‍රීලංර) ශ්‍රීලංර / දේශීය බදු හා සේවාවන් ප්‍රතිස්ථානගත කිරීම (ශ්‍රීලංර)		ශ්‍රීලංර	2,500	16-Sep-13	16-Sep-17	1,113.93	72%
					12,042			**8,935.87**	82%

5.19 බදුල්ල - චෙන්කලඩි මාර්ගය වැඩි දියුණු කිරීමේ ව්‍යාපෘතිය

5.19.1 හැඳින්වීම

ශ්‍රී ලංකා රජය A005 මාර්ගයෙහි චෙන්කලඩි අන්තයේ ප්‍රධාන පාලම් හා අවසන් කි.මී. 4 ක් හැර බදුල්ල සිට චෙන්කලඩි දක්වා කි.මී. 147 ක් පුනරුත්ථාපනය හා වැඩි දියුණු කිරීමට යෝජනා කර ඇත. සංවර්ධනය සඳහා සෞඳි අරමුදල හා ජාත්‍යන්තර සංවර්ධනය සඳහා ඔපෙක් අරමුදල, එ.ජ. ඩොලර් මිලියන 60 ක ණය මුදලක් ලබා දීමට එකඟ වී ඇති අතර ශ්‍රී ලංකා රජය එ.ජ.ඩො. මිලියන 20.0 ක් ලබා දෙයි.

5.19.2 ව්‍යාපෘතියේ ප්‍රතිඵලය

ව්‍යාපෘතියේ ප්‍රධාන ප්‍රතිඵලය වන්නේ මාර්ග භාවිතකරුවන්ට මධ්‍යම පළාත, සබරගමුව හා බස්නාහිර පළාත්වල සිට පහසුවෙන්, නැගෙනහිර පළාතේ ප්‍රධාන නගරයට ලඟා වීමේ හැකියාවය. අනෙක් කරුණ වන්නේ, හානි වූ ජාතික මහාමාර්ග අළුත්වැඩියාව නිසා ඇත ප්‍රදේශවල සිට අලෙවිය හා වෙළඳාම යළි ඇති කිරීමේ හැකියාවයි. විශේෂයෙන්ම, එය සංචාරකයින්ගේ ගමන් කාලය අඩු කරන අතර පහසුවෙන්ම නැගෙනහිර වෙරළට ලඟාවීමට උපකාරී වෙයි. අවසානයේ පුද්ගලික අංශයේ ආයෝජන ප්‍රදේශය වෙත ආකර්ශනය කෙරෙනු ඇත.


5.19.3 විධාන කිරීමේ හා ක්‍රියාත්මක කිරීමේ ආයතනය

ව්‍යාපෘතියේ විධාන කිරීමේ ආයතනය වන්නේ, ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යාංශයයි. ක්‍රියාත්මක කිරීමේ ආයතනය උසස් අධ්‍යාපන හා මහාමාර්ග අමාත්‍යාංශය යටතේ මාර්ග සංවර්ධන අධිකාරියයි.


5.19.4 සමස්ත ඇස්තමේන්තු පිරිවැය

මෙම ව්‍යාපෘතියේ සමස්ත පිරිවැය එ.ජ.ඩො. මිලියන 140.00 කි. සංවර්ධනය සඳහා සෞඳි අරමුදල හා ජාත්‍යන්තර සංවර්ධනය සඳහා ඔපෙක් අරමුදල එ.ජ.ඩො. මිලියන 60 බැගින් සමාන ණය මුදලක් ප්‍රදානය කරන අතර (සියල්ල එක්ව ඩො.මී. 120 කි) ඉතිරි එ.ජ.ඩො. මිලියන 20 ඉඩම් අත්පත් කර ගැනීමේ බදු හා ගාස්තු ශ්‍රී ලංකා රජය විසින් මූල්‍යයනය කරනු ලබයි.

සිතියම 21: බදුල්ල - චෙන්කලඩි මාර්ග සිතියම (බදුල්ල සිට බිබිල දක්වා)



සිතියම 22: බදුල්ල චෙන්කලඩි මාර්ග සිතියම (බිබිල සිට චෙන්කලඩි දක්වා)



5.19.5 ව්‍යාපෘති විස්තර

මාර්ග කොටස	දිග (කි.මී.)	සමස්ත ඇස්තමේන්තු පිරිවැය (එ.ජ.ඩො. මිලියන)	ආරම්භක දිනය	අපේක්ෂිත නිම කරන දිනය	2015 අවසානයේ ප්‍රගතිය	2015 වර්ෂය තුල වියදම
පේරාදෙණිය - බදුල්ල - වෙන්කලඩි මාර්ගය [A005] කි.මී. 130.80 සිට 277.55 දක්වා	147.00	140.00	ව්‍යා.ක.ඒ. 2014 අගොස්තු සිවිල් වැඩ - 2016 ජූනි	2019 දෙසැම්බර්	පූර්ව ඉදිකිරීම් කටයුතු සිදු කෙරෙමින් පවතී	රු.මිලියන 424.39

5.19.6 2015 වර්ෂය තුල කටයුතුවල ප්‍රගතිය

i. ඉඩම් අත්පත්කර ගැනීමේ කටයුතු සිදු කෙරෙමින් පවතී. බදුල්ල, බිබිල, රිදීමාලියද්ද, දියතලාව, ලුණුගල, මහඔය හා එරාවුර්පත්තු ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ සඳහා 38(a) වගන්තිය ප්‍රසිද්ධියට පත් කරන ලදි. පස්සර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය සඳහා 38(a) වගන්තිය ප්‍රසිද්ධ කිරීමට සඳහා ලේඛන ඉඩම් අමාත්‍යාංශයට භාර දෙනු ලැබීය. ව්‍යාපෘති සැලසුම් සඳහා සමීක්ෂණ හා තක්සේරු කිරීමේ වැඩ සිදු කෙරෙමින් පවතී.

ii. සිවිල් වැඩ - ලංසු ලේඛන පිළියෙල කර සවුදි අරමුදලේ එකඟතාවය සඳහා යවන ලදි. ප්‍රසම්පාදන වැඩ කරගෙන යාම සඳහා ජා.සං.ඔ.අ. යේ එකඟතාවය ලබාගනු ලැබීය.

iii. උපදේශකත්වය - උප්‍ර I ලේඛන පිළියෙල කර සෞදි අරමුදලේ එකඟතාවය සඳහා යවන ලදි. ඇගයීම් කර උපදේශකයන් විසින් ඉදිරිපත් කරන ලද උප්‍ර I ලේඛන අමාත්‍ය මණ්ඩලය පත්කළ උපදේශක ප්‍රසම්පාදන කමිටුව වෙත යවන ලදි.



ආරම්භක ලක්ෂය කි.මී. 132+800



කි.මී.168+000
අසල



කි.මී. 176+700
අසල



අවසන් ලක්ෂය

5.20 කැලණි ගඟ හරහා නව කැලණි පාලම ඉදිකිරීමේ ව්‍යාපෘතිය

ශ්‍රී ලංකා රජය විසින් කැලණි ගඟ හරහා නව පාලම ඉදිකිරීමේ ව්‍යාපෘතිය සඳහා ජපන් ජාත්‍යන්තර සහයෝගිතා ආයතනය වෙතින් ණය මුදලක් ලබා ගන්නා ලදි. මෙම ව්‍යාපෘතියේ අරමුණ වන්නේ අධි සංචලතා සම්බන්ධතාවක් වශයෙන් කැලණි ගඟ හරහා නව පාලම ඉදිකිරීමේ ව්‍යාපෘතියෙන් රථවාහන තදබදය පාලනය කිරීම හා විසුරුවා හැරීම හා ඒ මඟින්, කොළඹ නගරය තුල ප්‍රවාහන ජාලය වැඩි දියුණු කිරීම හා ආර්ථික සංවර්ධනය ප්‍රවර්ධනය කිරීමයි.

5.20.1 ව්‍යාපෘතියේ අරමුණ

මෙම ව්‍යාපෘතියේ අරමුණ වන්නේ, අධි සංචලතා මාර්ග සම්බන්ධතාවයක් වශයෙන් කැලණි ගඟ හරහා නව පාලම ඉදි කිරීමේ ව්‍යාපෘතියෙන් රථවාහන තදබදය පාලනය කිරීම හා විසුරුවා හැරීම හ ඒ මඟින් කොළඹ නගරය තුල ප්‍රවාහන ජාලය වැඩි දියුණු කිරීමත්, ආර්ථික සංවර්ධනය ඇති කිරීමත්ය. කොළඹ - කටුනායක අධිවේගි මාර්ගය විවෘත කිරීමත් සමඟ, අධිවේගි මාර්ගයෙන් කොළඹ නගරයට ඇතුළු වන රථවාහන සංඛ්‍යාවේ සැලකිය යුතු ඉහළ යාමක් පවතින අතර, පවත්නා නව කැලණි පාලමේ ධාරිතාව, එවැනි ඉහළ රථවාහන ප්‍රමාණයේ ඉල්ලුම සපුරාලීමට ප්‍රමාණවත් නොවේ. තවද මෙවැනි විශාල රථවාහන ප්‍රමාණයක් නව කැලණි පාලමේ ජීවිත කාලයට අහිතකර බලපෑමක් සිදු කරනු ඇත. කොළඹ වරාය නගර සංවර්ධන ව්‍යාපෘතිය ප්‍රදේශයේ රථවාහන තදබදය තවත් වැඩි කරනු ඇත. මෙම සාධක සැලකිල්ලට ගෙන නව කැලණි පාලමට යාම මංතීරු 06 ක අන්තරු මාරු සමඟ උස් කරන ලද වරාය පිවිසුම් මාර්ගයක් සහිතව නව පාලමක් නව කැලණි පාලමට යාබදව ඉදි කිරීමට රජය විසින් තීරණය කර ඇත.

5.20.2 ව්‍යාපෘති විස්තර.

ප්‍රධාන සිවිල් වැඩ කොන්ත්‍රාත්, යෝජනාවලි දෙකකට බෙදා ඇත.

යෝජනාවලි I - වානේ පාලම් කොටස

යෝජනාවලි II - අතිරේක යෙදවුම් පාලම් කොටස

යෝජනාවලි I : වානේ පාලම් කොටස

1) ප්‍රධාන පාලම ඉදිකිරීම (මංතීරු 4) : වානේ බාල්ක පාලම (L= මී 330)
2) ප්‍රධාන පාලම ඉදිකිරීම (මංතීරු 2): වානේ බාල්ක පාලම (L= මී 95)
3) වරාය පිවිසුම් මාර්ගය ඉදි කිරීම (මංතීරු 4): වානේ පෙට්ටි බාල්ක පාලම (L= මී 497)
4) අන්තර් මාරුව (I/C) හා මංසන්ධිය ඉදි කිරීම.
   4.1) ඔරුගොඩවත්ත අන්තර්මාරුව (I/C) (වානේ පෙට්ටි බාල්ක : මී 259, භූමි වැඩ : මී. 226)

4.2) ඉඟුරුකඩේ I C (වානේ පෙට්ටි බාල්ක: මී. 259, භූමි වැඩ : මී. 226)

4.3) කැලණිතිස්ස මංසන්ධිය (වානේ පෙට්ටි බාල්ක : මී. 663)

5) ඇටඉශ්ඩ් මාර්ගය වැඩි දියුණු කිරීම

5.1) ඔරුගොඩවත්ත අන්තර්මාරුව

5.2) ඉඟුරුකඩේ අන්තර්මාරුව

යෝජනාවලි II අධි යෙදවුම් පාලම් කොටස


1) ප්‍රධාන පාලම ඉදිකිරීම (L=1,185 m)

1.1) ප්‍රධාන පාලම ඉදි කිරීම (මංතීරු 6): අධි යෙදවුම් පාලම (L= මී 380)

1.2) ප්‍රවේශ පාලම (මංතීරු 6): පෙ.ස.තා. පෙට්ටි පාලම (L= මී 460)

1.3) ප්‍රවේශ පාලම (මංතීරු 5): පෙ.ස.තා. පෙට්ටි පාලම (L= මී 165)

කොන්ත්‍රාත් යෝජනාවලි දෙක පිළිබඳ වැදගත් ලක්ෂණ දැක්වෙන සිතියම පහත දැක්වේ. (යෝජනාවලි I හා යෝජනාවලි II).



5.20.3 ව්‍යාපෘතිය සඳහා අරමුදල් යෙදවීම.

ව්‍යාපෘතිය සඳහා ජපාසනි හා ශ්‍රීලර අරමුදල් යොදවනු ලබයි. ජපාසනි කොටස ජපාසනි හා ශ්‍රී ලංකා රජය අතර අත්සන් තබන ලද ණය මුදලක් මගින් සපයනු ලැබේ. (ණය අංක. SL-P111). සම්පූර්ණ ණය මුදල මගින් සපයන ලද ජපන් යෙන් මිලියන 35, 026 න්, සිවිල් වැඩ සඳහා ජපන් යෙන් 28, 032 ක් සහ උපදේශකත්වය සඳහා යෙන් මිලියන 4, 072 ක් වෙන් කෙරේ.

<u>ණය විස්තර :</u>

I.	ණය මුදල	:	ජපන් යෙන් මිලියන 35,020
II.	ණය මුදල අත්සන් කළ දිනය	:	2014 මාර්තු 28
III.	ක්‍රියාත්මක වන දිනය	:	2014 ජූලි 01
IV.	වය පැහැදම් කාලසීමාව	:	2023 ජූලි 01 දක්වා

5.20.3.1 ණය මුදල මගින් සපයන අරමුදල් යොදවනු ලබන්නේ,

අ) කොන්ත්‍රාත් යෝජනාවලි 2 (යෝජනාවලිය I හා යෝජනාවලිය II)

ආ) ප්‍රතිස්ථානගත පිරිවැය- ලවිම අධිසැර විදුලි රැහැන්

ඇ) ශ්‍රී ලංකා න්‍යෂ්ටික බල අධිකාරිය සහ ඔටෝ මෝබයිල් ඉංජිනේරු පුහුණු ආයතනය රැඳී සිටි ගොඩනැගිලි ඉවත් කිරීම.

ඈ) යෝජනාවලි I හා යෝජනාවලි II විස්තරාත්මක සැලසුම් ටෙන්ඩර් සහාය සහ ඉදිකිරීම් අධීක්ෂණය සඳහා උපදේශකයන් පත් කිරීම.

5.20.3.2 ශ්‍රී ලංකා රජය අරමුදල් යොදවනු ලබන්නේ,

අ අත්පත්පත් කර ගත් ඉඩම් සඳහා වන්දි ගෙවීම

ආ අත්පත් කර ගත් ඉඩම්වල පදිංචිකරුවන් ප්‍රතිස්ථානගත කිරීම.

ඇ කාර්ය මණ්ඩල වැටුප් ඇතුළු ව්‍යා.ක.ඒ. වල නඩත්තු වියදම

ඈ ශ්‍රීලපබම හා ඔඉඅආ සඳහා ඉදිකරනු ලබන ගොඩනැගිලි දෙකෙහි ඉදිකිරීම් අධීක්ෂණය.

5.20.4 2015 වර්ෂය තුල ක්‍රියාත්මක කළ වැඩ.

5.20.4.1 විස්තරය

ශ්‍රී ලංකා රජය සහ ජපන් ජාත්‍යන්තර සහයෝගිතා නියෝජිතායතනය අතර ඇති කර ගත් ගිවිසුමට අනුව 2017 ජනවාරි මාසයේදි නව කැලණි පාලමේ ඉදිකිරීම් වැඩ ආරම්භ කෙරිණි. මෙම ව්‍යාපෘති කළමනාකරණ ඒකකය විසින් 2015 වර්ෂයේ දි සිදු කරන ලද බොහොමයක් වැඩ ප්‍රධාන සිවිල් වැඩ කොන්ත්‍රාත්තුව ප්‍රදානය කිරීමට පෙර නිම කළ යුතු ප්‍රාථමික වැඩ විය.

5.20.4.2 2015 වර්ෂය තුල ඉටුකරන ලද ප්‍රධාන වැඩ පහත සඳහන් පරිදි වේ.

1. පාලම්, අන්තර්මාරු හා ප්‍රවේශයන් ඉදිකිරීම සඳහා අවශ්‍ය ඉඩම් අත්පත් කර ගැනීම.
2. ආසන්න වශයෙන් පවුල් 340 ක් සාලමුල්ල නිවාස යෝජනා ක්‍රමයේ පදිංචි කිරීම.
3. ශ්‍රීලපබම ා ඔඉතාඇා රැඳී සිටී ගොඩනැගිලි ඉවත් කිරීම.
4. ලංකා විදුලි බල මණ්ඩලයට හා ලංකා විදුලිබල සමාගමට අයත් විදුලිය රැහැන් ප්‍රතිස්ථානගත කිරීම.
5. විස්තරාත්මක සැලසුම් හා ප්‍රධාන සිවිල් කොන්ත්‍රාත්කරු ප්‍රසම්පාදනය කිරීම. සම්පූර්ණ ව්‍යාපෘතිය කොන්ත්‍රාත් යෝජනාවලි දෙකකට බෙදන ලදි. (යෝජනාවලි I හා යෝජනාවලි II)

5.20.4.2.1 පාලම්, අන්තර්මාරු හා පිවිසුම් සඳහා අවශ්‍ය ඉඩම් අත්පත්කර ගැනීම.

ඉදිකිරීම් වැඩ සඳහා ව්‍යාපෘති ප්‍රදේශය වශයෙන් කැලණිය, කොළොන්නාව සහ කොළඹ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශවල සමස්ත ඉඩම් කට්ටි 738 යුත් හෙක්ටයාර් 129,098 ක ඉඩම් ප්‍රමාණයක් අත්පත්කර ගැනීමට ඇත.

- තක්සේරුකරු දෙපාර්තමේන්තුව විසින් තක්සේරු වාර්තා පිළියෙල කිරීම.
- කැලණිය ප්‍රා. ලේ. ප්‍රදේශය තුල 10 (1) වගන්තිය අනුව නිවේදන නිකුත් කිරීම.

5.20.4.2.2 පවුල් 340 සාලමුල්ලේ නැවත පදිංචි කිරීම.

ඉඩම් අත්පත් කර ගත් ප්‍රදේශයේ ජීවත් වන ජනතාව සාලමුල්ල නිවාස යෝජනා ක්‍රමයේ නැවත පදිංචි කළ යුතුව ඇත. 2015 වන විට ඉදිකිරීම් වැඩවල ප්‍රගතිය 30% ලභා විය. ඉදිකිරීම් වැඩ 2016 සැප්තැම්බර් මස නිම කිරීමට නියමිතය.



සාලමුල්ල නිවාස යෝජනා ක්‍රමය

බලපෑමට ලක්වූ පාර්ශවයන්ගේ ආදායම ප්‍රතිසාධනය කිරීමේ වැඩ සටහන ක්ෂුද්‍ර මූල්‍ය විශේෂඥයෙකු යොදා ගෙන ආරම්භ කළ යුතුව ඇත. මෙම වැඩ සටහන යටතේ රජයේ ආයතනවලින් අවශ්‍ය සහාය ලබා දීම නිම කිරීම සඳහා සෑම පවුලක්ම සම්මුඛ පරීක්ෂණයට ලක්කර අවශ්‍ය විස්තර ලබාගනු ලැබේ.





ප්‍රාදේශීය ලේකම් කාර්යාල, බැංකු, පළාත් සභා, ආදි ආයතනවල නිලධාරීන්ගේ සහභාගිත්වය සහිතව 2015.12.04 දින ආදායම ප්‍රතිසාධන වැඩ සටහන පිළිබඳ වැඩ මුළුවක් පවත්වන ලද අතර, මෙම වැඩ සටහනට පහසුකම් සැපයීම සඳහා කෙටුම්පත් යෝජනා කීපයක් හඳුන්වා දෙන ලදි.

සාලමුල්ලට ප්‍රතිස්ථානගත කරන ලද පවුල්වල දරුවන් සඳහා පාසල් සොයා ගැනීමට පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ (බස්නාහිර) සමඟ සාකච්ඡා පවත්වන ලදි.

5.20.4.2.3 ඔ ඉ ප්‍ර අ සන්තක වූ ගොඩනැගිල්ල පිහිටි කාර්යාලය ප්‍රතිස්ථානගත කිරීම

කොන්ත්‍රාත්තුව 2015 දෙසැම්බර් මාසයේදී රු.මිලි. 1,435 ක මුදලකට තුඩාවේ බ්‍රදර්ස් සමාගම වෙත ප්‍රදානය කෙරිණි.

5.20.4.2.4 ශ්‍රී ල ප බ ම සන්තකවූ ගොඩනැගිල්ල පිහිටි කාර්යාලය ප්‍රතිස්ථානගත කිරීම.

ප්‍රතිස්ථානගත කළ යුතු කාර්යාල ගොඩනැගිලි.

I. කාර්යාල සංකීර්ණය

II. රසායනාගාර

III. අපද්‍රව්‍ය ගබඩා පහසුකම

ඉහත කී කාර්යාලය මාලබේ හල්බරාව වෙත ප්‍රතිස්ථාන ගත කරන ලදි. මහජන උද්ඝෝෂණ නිසා ගොඩනැගිල්ල ඉදිකිරීම අත්හිටුවන අවස්ථාව වන විට එහි ප්‍රගතිය 5.5% කි. අපද්‍රව්‍ය ගබඩාකරණ පහසුකම ඔරුගොඩවත්ත පරිශ්‍රයේම රඳවා තැබීමට තීරණය කරන ලදි. මෙම ව්‍යූහය එකම ස්ථානයේ රඳවා තබා ගැනීමට අතිරේක පාරිසරික බලපෑම් තක්සේරුවක් සිදු කිරීමට සිදු විය. මෙම අතිරේක පාරිසරික බලපෑම් තක්සේරුව පිළියෙල කිරීම ව්‍යාපෘති උපදේශකයන් වෙත පවරනු ලැබීය.

ශ්‍රී.ලං.ප.බ.ම. හල්බරාවේ ඉදි කිරීමට එරෙහිව විරෝධතාකරුවන් පිරිසක් විසින්, මානව හිමිකම් කොමිෂන් සභාවට පැමිණිල්ලක් ඉදිරිපත් කරනු ලැබීය.

මෙහි පළමුවැනි විභාගය 2015 දෙසැම්බර් මස 28 දින පවත්වන ලද අතර තීරණය නිකුත් කිරීමට නියමිතය.

5.20.4.2.5 ල.වි.ම. හා වෙනත් ආයතනවල අති ශක්ති සම්ප්‍රේෂණ රැහැන් ප්‍රතිස්ථානගත කිරීම (ල.වි.ස. හා ශ්‍රී ලංකා ටෙලිකොම්)

ල.වි.ම. විසින්, කැලණිතිස්ස - බියගම කි.වො.220 හා කැලණිතිස්ස - කොලොන්නාව කි.වො. 132 සම්ප්‍රේෂණ රැහැන් ප්‍රතිස්ථානගත කිරීමට ලංසු ආරාධනය කරන ලදි.

ල.වි.ස. හා ශ්‍රී ලංකා ටෙලිකොම් සමාගමට අයත් ප්‍රයෝජ්‍ය සේවා ප්‍රතිස්ථානගත කිරීම සඳහා ගෙවිම් බොහොමයක් 2015 වර්ෂය තුල කරනු ලැබීය. ප්‍රතිස්ථානගත කිරීමේ වැඩ ප්‍රගතිය සමීපව ආවේක්ෂණය කිරීමට සිදු විය.

5.20.4.2.6 විස්තරාත්මක සැලසුම් හා ප්‍රධාන සිවිල් වැඩ කොන්ත්‍රාත්කරු ප්‍රසම්පාදනය කිරීම.

විස්තරාත්මක සැලසුම් ටෙන්ඩර් හා ඉදිකිරීම් අධීක්ෂණ සඳහා පත් කරන ලද උපදේශකයන් (කන්සල්ටින් ඉංජිනියර්ස් ඇන්ඩ් ආකිටෙක්ස් ඇසෝසියේටඩ් පුද්. සමාගම, පොජෙක්ට් මැනේජ්මන්ට් ඇසෝසියේට් ඉන්ටර්නැෂනල් පුද්. සමාගම ආශ්‍රිතව ඔරියන්ටල් කන්සල්ටන්ට්ස් කම්පැනි ලිමිටඩ් හා කතහිරා ඉංජිනියර්ස් ඉන්ටර් නැෂනල්) විසින් විස්තරාත්මක සැලසුම් නිම කරනු ලැබීය.

උපදේශකයන් විසින් කෙටුම්පත් ටෙන්ඩර් ලේඛන පිළියෙල කර සමාලෝචනය සඳහා ව්‍යා.ක.ඒකකය වෙත භාරදී ඇත. දැනට, තා.ඇ.ක. සාමාජිකයන්ට හා මා.සං.අ. යේ අදාල අධ්‍යක්ෂවරුන්ට ලේඛන ලැබෙමින් පවතී. .

ශ්‍රීලංර හා ප්‍රදාන ආයතනය අතර එකඟ වූ ප්‍රසම්පාදන ක්‍රමවේදය වූයේ පූර්ව සුදුසුකම් වලින් තොරව ද්විත්ව යෝජනා පරිපාටියයි.

5.20.4 2015 වර්ෂය සඳහා ප්‍රතිපාදන හා වියදම්.


මීලඟ පිටුව බලන්න.

පාලමේ නම	දිග	තා.ඇ.ක. රු.මිලි.	ආරම්භක දිනය	නිම කිරීමට අපේක්ෂිත දිනය	2014 දක්වා ප්‍රගතිය	2014 දක්වා වියදම	2015 අවසානයේ ප්‍රගතිය	2015 තුල වියදම
කැලණි ගඟ හරහා නව පාලම ඉදිකිරීමේ ව්‍යාපෘතිය	1) වානේ පාලම කොටස අ ප්‍රධාන මංතීරුව ඉදිකිරීම මී 425 ආ වරාය පිවිසුම් මාර්ගය ඉදි කිරීම මී. 497 ඇ අන්තර්මාරුව, මංසන්ධිය, බෑවුම් දිග - මී 2089 2) අධි යෙදවුම් පාලම දිග මී. 1,185		ප්‍රාථමිකයන් 2015.01.05	ප්‍රාථමිකයන් 2016.12.31	ඉඩම් අත්පත්කර ගැනීම - 5%	ශ්‍රීලංර රු.මිලි. 135	ඉඩම් අත්පත්කර ගැනීම - 32%	ශ්‍රීලංර රු.මිලි 458.93 විදේශීය රු. මිලි. .1031.00
			පාලම ඉදිකිරීම 2017.01.01	පාලම ඉදිකිරීම 2019.12.31	විස්තරාත්මක සැලසුම් හා ටෙන්ඩර් සහාය සහ ඉදිකිරීම අධීක්ෂණය සඳහා උපදේශකත්වය – 0%		විස්තරාත්මක සැලසුම් සඳහා උප දේශක සේවා – 100% ටෙන්ඩර් සහාය – 14% ඉදිකිරීම් අධීක්ෂණය – 0%	
					බලපෑමට ලක්වූ පාර්ශව ප්‍රතිස්ථාපනය – 12%		බලපෑමට ලක්වූ පාර්ශවයන් ප්‍රතිස්ථාපනය – 30%	
					ශ්‍රීලපබම ප්‍රතිස්ථානගත කිරීම විස්තරාත්මක සැලසුම් – 100% ටෙන්ඩර් ලේඛන පිළියෙල කිරීම හා ටෙන්ඩර්කරණය – 75%		ශ්‍රීලපබම ප්‍රතිස්ථානගත කිරීම විස්තරාත්මක සැලසුම් 100% ටෙන්ඩර් ලේඛන පිළියෙල කිරීම හා ටෙන්ඩර්කරණය – 100% ඉදිකිරීම් අධීක්ෂණය – 55%	
					ඔඉපුආ ප්‍රතිස්ථාන ගත කිරීම – 100% ටෙන්ඩර් ලේඛන පිළියෙල කිරීම හා ටෙන්ඩර් කිරීම – 50%		ඔඉපුආ ප්‍රතිස්ථාන ගත කිරීම – 100% ටෙන්ඩර් ලේඛන පිළියෙල කිරීම හා ටෙන්ඩර් කිරීම – 100% ඉදිකිරීම් අධීක්ෂණය – 5%	
					ලංවිම විදුලි රැහැන් ප්‍රති ස්ථානගත කිරීම විස්තරාත්මක සැලසුම් – 100% ටෙන්ඩර්කරණය – 5%		ලංවිම විදුලි රැහැන් ප්‍රති ස්ථානගත කිරීම විස්තරාත්මක සැලසුම් 100% ටෙන්ඩර්කරණය – 30%	

5.21 නායයෑම් ආරක්ෂණ ව්‍යාපෘතිය - ජාතික මාර්ග ජාලය


ශ්‍රී ලංකා රජය විසින් ජාතික මහාමාර්ගවල නායයෑම් ආරක්ෂණ ව්‍යාපෘතිය වෙනුවෙන්, ජපන් ජාත්‍යන්තර සහයෝගිතා නියෝජිතායතනය වෙතින් ණය මුදලක් ලබා ගන්නා ලදි. ව්‍යාපෘතියේ අරමුණ වන්නේ, ඒ හා බි පංති ජාතික මාර්ග හා ප්‍රධාන යටිතල ව්‍යුහයන් ඉලක්ක කොට නායයෑම් ආපදා පාලනය කිරීම සඳහා උචිත ප්‍රතිකර්ම පියවර ගැනීම හා ඒ මගින්, මාර්ග ජාලයේ ආරක්ෂාව ඉහළ නැංවීම හා මාර්ග භාවිතකරුවන් හා පදිංචිකරුවන්ගේ ජීවිත ආරක්ෂා කිරීම සඳහා දායක වීමයි.

සිතියම 23: ජාතික මහාමාර්ග ජාලයේ ඉඩම් නායයෑම් ව්‍යාපෘති යෝජනාවලි 1 හා 2 වැඩබිම් (සී ශ්‍රේණි හා බී ශ්‍රේණි ප්‍රදේශ දැක්වීම



බී හා සී ශ්‍රේණි වැඩබිම්

සිතියම 24: ජාතික මාර්ග ජාලයේ නායයෑම් ආපදා ආරක්ෂණ ව්‍යාපෘතියේ සිතියම



5.22.1 ව්‍යාපෘතිය පිළිබඳ විස්තර

ව්‍යාපෘතියේ අරමුණ වන්නේ ඒ හා බි පංති ජාතික මාර්ග ප්‍රධාන යටිතල ව්‍යුහයන් ලෙස ඉලක්ක කොට නායයෑම් ආපදා පාලනය කිරීම සඳහා උචිත ප්‍රතිකර්ම පියවර ගැනීම හා ඒ මගින්, මාර්ග ජාලයේ ආරක්ෂාව ඉහළ නැංවීම හා මාර්ග භාවිතකරුවන් හා පදිංචිකරුවන්ගේ ජීවිත ආරක්ෂා කිරීම සඳහා දායක වීමයි.

යෝජනාවලි අංක 1 යටතේ ඉහළ ප්‍රමුඛතා ප්‍රදේශ 10 ක් පවතින අතර යෝජනාවලි 2 යටතේ ප්‍රදේශ 6 ක් මෙම ව්‍යාපෘතිය යටතේ ක්‍රියාත්මක කිරීමට ඇත. ඊට අමතරව පූර්ව සංඥා පද්ධතියක් ස්ථාපිත කිරීමට නිබේ.

නායයෑම් ආරක්ෂණ ව්‍යාපෘතිය උසස් අධ්‍යාපන හා මහාමාර්ග අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක කෙරේ. මෙම ව්‍යාපෘතියට මුදල් සපයනු ලබන්නේ ජඅාසනි වන අතර, සමස්ත පිරිවැය රු.බිලි. 14 කි.

ස්ථානය	ආපදාවේ ස්වභාවය	යෝජිත ප්‍රතිකර්ම පියවර	තා.ඇ.ක./ රු. මිලි.	ආරම්භක දිනය	අපේක්ෂිත නිම කරන දිනය	2015 අවසානයේ ප්‍රගතිය / %	2015 වර්ෂය තුල වියදම රු. මිලි.
මහනුවර බදුල්ල නුවරඑළිය කෑගල්ල රත්නපුර	1.කළුගල් ඇද වැටීම 2.කළුගල් නායයෑම 3.බෑවුම් දෝෂ 4.ඉඩම් නායයෑම	1.කළුගල් දැල 2.කළුගල් 3.තිර තාප්පය 4.ගොනු කිරීම් වැඩ 5.නැංගුරම සහිත ගැටි ඉදි කිරීම් වැඩ 6.නැංගුරම් වැඩ 7.තිරස් විදුම 8.ජලාපවහන ලිඳ ඉදිකිරීම	14,475	01-05-2014	31-03-2018	22	297

5.21.2 ව්‍යාපෘතියේ කොටස්

5.21.2.1 යෝජනාවලි 01

යෝජනාවලි–01 ට, යෝග්‍ය ප්‍රතිකර්ම පියවර සඳහා ඉදිකිරීම් හා තාක්ෂණ පැවරීම් පුහුණු වැඩ සටහන් විස්තර කෙරේ.

5.21.5.1.1 ප්‍රතිකර්ම පියවරයන් ලෙස ඉදිකිරීම්

ප්‍රතිකර්ම පියවර අනුව ඉදිකිරීම් කොටස් පහක් වගුවේ දැක්වේ.

ප්‍රතිකර්ම පියවරයන් ඉදිකිරීම්

මාර්ග කි.මී.	වැඩබිමේ නම	ආපදා වර්ගය	ප්‍රතිකර්ම පියවරයන්
A005-043	කොත්මලේගම -1	කළුගල් ඇද වැටීම	▪ කඹ දැල ▪ ප්‍රති ගල් වැටීම් දැල ▪ කළුගල් වැට
A005-044	කොත්මලේගම -2	කළුගල් ඇද වැටීම	▪ තඹ දැල ▪ ප්‍රති කළුගල් වැටීම් දැල
A005-046	රම්බොඩ	කළුගල් ඇද වැටීම	▪ කඹ දැල ▪ ප්‍රති ගල් වැටීම් දැල ▪ කළුගල් වැට
A005-063	ටොප් පාස්	බෑවුම් අසාර්ථකවීම්	▪ පෘෂ්ඨ කාණු ▪ ගේබියන් වැඩ ▪ සැහැල්ලු ඉවුරු තාප්ප

A005-091	කැප්පෙටිපොල	බැවුම් අසාර්ථකවීම්	▪ පෘෂ්ඨ කාණු ▪ තණ පිඩලි වැඩ ▪ ගැටි වැඩ ▪ ගැටි නැංගුරම් වැඩ
A007-031	තෙලිගම	බැවුම් අසාර්ථකවීම්	▪ පෘෂ්ඨ කාණු ▪ ගේබියන් වැඩ ▪ සැහැල්ලු ඉවුරු තාප්ප
A007-045	පිටවල	කළුගල් ඇද වැටීම	▪ තඹ දැල ▪ කළුගල් බෝල්ට් ▪ ගැටි වැඩ ▪ ප්‍රති ගල් වැටීම් දැල
A007-054	ගිනිගත්ගේන	බැවුම් අසාර්ථකවීම්	▪ පෘෂ්ඨ කාණු ▪ කළුගල් බෝල්ට් ▪ ගේබියන් වැඩ ▪ ගැටි වැඩ ▪ සැහැල්ලු ඉවුරු තාප්ප
A007-057	දියගල	බැවුම් අසාර්ථකවීම්	▪ පෘෂ්ඨ කාණු ▪ ගැටි වැඩ
A113-015	නාවලපිටිය	ඉඩම් නාය යෑම	▪ පෘෂ්ඨ කාණු ▪ භූගත තිරස් කාණු ▪ ජලාපවහන ලිඳ ▪ සැහැල්ලු ඉවුරු තාප්ප

5.21.2.1.2 කාක්ෂණ පැවරීම් පුහුණු වැඩ සටහන

දේශීය පුද්ගලයන් පුහුණු කිරීම ඉලක්ක කරනුයේ ඉඩම් නායයෑම් ප්‍රතිකර්ම පියවරයන් පිළිබඳව සේවායා විසින් නම් යෝජනා කරන දේශීය පිරිස් පුහුණු කිරීමයි. මෙම පුද්ගලයන් (ඉංජිනේරුවන් සහ වැඩ මූලිකයන්) සේවායා විසින් යෝජනා කර කොන්තාත්තුවේ සඳහන් කාලසීමාව සඳහා ව්‍යාපෘතියට අනුයුක්ත කරනු ලැබේ. කොන්ත්‍රාත්කරු මෙම පුද්ගලයන්ට පුහුණුව ලබාදිය යුතුය. පුහුණුවන්නන්ට සේවායා විසින් ගෙවීම් කරනු ලැබේ.

5.21.2.2 02 යෝජනාවලිය

02 යෝජනාවලිය, මෙයට පහත විස්තර වෙන උචිත ප්‍රතිකර්ම පියවර අනුව ඉදිකිරීම් ඇතුළත් වේ.

1.0 ප්‍රතිකර්ම පියවරයන් අනුව ඉදිකිරීම.
ප්‍රතිකරම පියවර අනුව ඉදිකිරීම් කොටස් පහත වගුවේ දැක්වේ.

ප්‍රතිකර්ම පියවරයන් සඳහා ඉදිකිරීම්.

මාර්ග කි.මී.	වැඩබිමේ නම	ආපදා වර්ගය	ප්‍රතිකර්ම පියවරයන්
A004-154	ඉඹුල්පේ	බෑවුම් අසාර්ථක වීම	▪ පෘෂ්ඨ කාණු ▪ ගේබියන් වැඩ ▪ සැහැල්ලු ඉවුරු තාප්ප
A004-173	පුස්සැල්ල	බෑවුම් අසාර්ථක වීම	▪ පෘෂ්ඨ කාණු ▪ භූමි නැංගුරම් වැඩ ▪ ගැටි වැඩ
A004-174	වල්හපුකැන්න	බෑවුම් අසාර්ථක වීම	▪ පෘෂ්ඨ කාණු ▪ ගල් බද ඇණ ▪ ගැටි වැඩ ▪ රැඳවුම් තාප්පය
A005-135	2වැනි සැතපුම් කණුව	ඉඩම් නායයෑම්	▪ පෘෂ්ඨ කාණු ▪ ජලාපවහන ලිඳ ▪ තිරස් භූගත කාණු ▪ පස් ඉවත්කිරීම් වැඩ ▪ ප්‍රතිබර ඉවුරු තාප්ප ▪ ගැටි වැඩ ▪ රැඳවුම් තාප්පය ▪ භූමි නැංගුරම් වැඩ
A005-167	ලුනුගල	ඉඩම් නායයෑම්	▪ පෘෂ්ඨ කාණු ▪ ජලාපවහන ලිඳ ▪ තිරස් භූගත කාණු ▪ පස් ඉවත් කිරීමේ වැඩ ▪ ප්‍රතිබර ඉවුරු තාප්ප ▪ ගේබියන් වැඩ ▪ ගැටි වැඩ
A016-010	කහගල්ල	ඉඩම් නායයෑම්	▪ පෘෂ්ඨ කාණු ▪ තිරස් භූගත කාණු ▪ ජලාපවහන ලිඳ ▪ වානේ පයිප්ප ටැම් වැඩ ▪ රැඳවුම් තාප්පය ▪ ප්‍රතිබර ඉවුරු තාප්ප

5.21.3 ව්‍යාපෘති යෝජනා පිළිබඳ දළ වැඩ සටහන

5.21.3.1 යෝජනාවලි 01 - වැඩබිම් තත්ත්ව

1. A005-043 කොත්මලේගම - 1

මෙම වැඩ බිම ලක්ෂණය ඉහළ රැඳී තිබෙන කඳු ප්‍රපාතයකින් සමන්විත වන අතර, කැපී පෙනෙන ලෙස විවෘත පැලුම් හා පරතරයන්ගෙන් යුක්තය. මෙම ප්‍රදේශය කළුගල් ඇද වැටීමේ උපද්‍රව සහිත ප්‍රදේශයක් ලෙස හඳුනා ගෙන තිබේ.

ඇතැම් ඇද වැටෙන ගල් මාර්ගයේ තිබෙනු නිරීක්ෂණය වන අතර ස්ථරවලට පිපිරීම් හා බොහෝ ස්ථානවල ගැලවී ඇති බවට සාක්ෂි ප්‍රධාන මාර්ගයේ සිට දෘශ්‍යමාන වේ (A005).

2. A005-044 කොත්මලේගම - 2

මෙම වැඩබිම ඉහළ රැඳී තිබෙන කඳු ප්‍රපාතයන් ලක්ෂණවලින් සමන්විත අතර, කැපී පෙනෙන ලෙස විවෘත පැලුම හා පරතරයන්ගෙන් යුක්තය. මෙම ප්‍රදේශය කළුගල් ඇද වැටීමේ උපද්‍රව සහිත ප්‍රදේශයක් ලෙස හඳුනාගෙන තිබේ.

ඇතැම් ඇද වැටෙන ගල් මාර්ගයේ දිගට තිබෙනු නිරීක්ෂණය වන අතර ස්ථරවලට පිපිරීම හා බොහෝ ස්ථානවල ගැලවී ඇති බවට සාක්ෂි ප්‍රධාන මාර්ගයේ සිට දෘශ්‍යමාන වේ. (A005).

3. A005-046 රම්බොඩ

මෙම වැඩබිමේ ලක්ෂණය ඉහළ රැඳි කඳු ප්‍රපාතය සමඟ තියුණු ලෙස වර්ධනය වූ ප්‍රපාතය, හා පරතරයන් මෙම වැඩබිම ගල් ඇද වැටීමේ උපද්‍රව ප්‍රදේශයක් ලෙස හඳුනාගෙන ඇත.

ඇද වැටෙන ඇතැම් ගල් මාර්ගය දිගට තිබෙනු නිරීක්ෂණය වන අතර ස්ථර වලට පිපිරීම හා බොහෝ ස්ථානවල ඒවා ගැලවුනු බවට සාක්ෂි ප්‍රධාන මාර්ගයෙ සිට දෘශ්‍යමාන වේ.

4. A005-063 ටොප් පාස්

A005 මාර්ගයේ මිටියාවත පැත්තේ මාර්ග උරිස් දිගට හානිය බෑවුම් අසාර්ථක වීමේ මුදුන් ස්ථානයයි. මාර්ගයට පහත බෑවුම, බෑවුම දිගට ඇති කාණු පද්ධතිය හානි වීමෙන්, ජලය ගලා යෑම නිසා බෑවුම් අසාර්ථක වීමෙන් හා සුළු ඉඩම් නාය යාමෙන් හානියට පත්වී ඇත.

මෙම ස්ථානයේ A005 මාර්ගයේ දිගම මාර්ග එකෙල්ලය කවාකාරය. තිරස් එකෙල්ලය තරමක් බෑවුම් සහිත හා මාර්ගය කඳු සීමාව දිගට ගමන් කරයි. මෙම ස්ථානයේ පුද්ගලික නිවාස හා හෝටල් කීපයක් පවතී.

5. A005-091 කැප්පෙටිපොල

බෑවුම හා විකැන් කැපී පෙනෙන ලෙස වර්ධනය වී ඇති අතර වර්ෂාව නිසා ඒවා වැඩි වෙමින් පවතී. නුවරඑළිය - වැලිමඩ මාර්ගයේ (A005) මෙම වැඩබිම බෑවුම් අසාර්ථක වීම ලෙස හඳුනාගෙන ඇත. A005 මාර්ගය මෙම බෑවුම් අසාර්ථක වීමේ පාද අසලින් දිවේ.

6. A007-031 තැලිගම

මෙම ස්ථානයේ A007 මාර්ගය ඍජු හා පැහැදිලිය. කඳු පැත්තේ බෑවුම සම ස්වභාවයේ වන අතර බෑවුම අසාර්ථක වීමකින් හානියක් සිදු නොවේ. කඳුකර දිය ධාරාවන් තිබේ යැයි තහවුරු කර නොමැත. බෑවුමේ ගලිය බාදනය සමඟ සුළු ප්‍රමාණයක් කඩා වැටීමක් වර්ධනය වී ඇත.

නිම්නය පැත්ත ගංගා තලය දක්වා බෑවුමකි. බෑවුමේ ඇතැම් ගලි නිරීක්ෂණය වුනු අතර විශාල ප්‍රමාණයේ කඩා වැටීම් දක්නට නොලැබුණි. බෑවුම් අසාර්තක වීම නිසා ඇතිවූ කුහරය

කොන්ක්‍රීට් ඇතුරුමට යටින් නිරීක්ෂණය වූ අතර, අස්ථාවරත්වයක් දක්නට ලැබේ. අනාගතයේ තවත් කුහරයක් ඇති වීමට හා මාර්ග උරිස් තවත් නරක තත්ත්වයට පත්වීමට ඉඩ තිබේ.

7. A007-045 පිටවල

මෙම වැඩබිම ඉහළින් රැඳුණු ගල්පරය විවෘත පැලුම් හා ඉහළ බෑවුමේ අස්ථාවර කළුගල් මත කලුගල් කුට්ටි සහිතවය. මෙම වැඩබිම ගල් කුට්ටි ඇද වැටීමේ උපද්‍රව ප්‍රදේශයක් ලෙස හඳුනා ගෙන ඇත.

ඇද වැටුණු ඇතැම් ගල් කුට්ටි මාර්ගය දිගට තිබෙනු නිරීක්ෂණය වන අතර, ස්ථර වලට පිපිරීම හා බොහෝ ස්ථානවල ඒවා ගැලවුණු බවට සාක්ෂි ප්‍රධාන මාර්ගයේ සිට දෘෂ්‍යමාන වේ.

8. A007-054 ගිනිගත්හේන

කඳුවැටිය පැත්තේ කපන ලද බෑවුමෙහි බෑවුම් අසාර්ථකවීම් 2 ක් දක්නට ලැබුණි. නිම්නය පැත්තේ තද බෑවුමක් වන නමුත් මාර්ග උරිස් තල ගිලා බැසීම් සමහරක් දක්නට ලැබුනි.

9. A007-057 දියගල

කඳුවැටිය පැත්තෙහි කපන ලද බෑවුම්වලින් කුඩා බෑවුම් අසාර්ථකවීම් ගණනක් හා පැරණි විශාල බෑවුම අසාර්ථක වීමක් දක්නට ලැබුණි.

10. A113-015 නාවලපිටිය

ඉඩම් නායයාමේ A113 මාර්ගයේ දිගට පිපිරීම් හා පෘෂ්ඨ ස්ථරය ගිලා බැසීම් සහ කොළඹ - බදුල්ල උඩ රට ප්‍රධාන දුම්රිය මාර්ගයේ ගිලා බැසීම්, විකෘති වීම්, අවතැන් වීම් හා රැඳවුම් තාප්ප ගිලීම්, ප්‍රදර්ශනය වෙයි. දුම්රිය මාර්ගයෙන් කොටසක් අතීතයේ නාය යෑම් නිසා, අතහැර දැමුණි. ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුවට අයත් නිවාස වලට පිටුපස ප්‍රධාන බෑවුම තහවුරු කර ඇත. පැරණි නායයෑම ප්‍රධාන බෑවුම දෙපස ඉක්මවා ඉහළට පැතිරීමට ඉඩ තිබේ.

උඩරට ප්‍රධාන දුම්රිය මාර්ගය, අතහැර දමන ලද දුම්රිය මාර්ගය හා කොන්ක්‍රීට් අතුරන ලද එහි ප්‍රවේශ මාර්ග නායයෑම්වල ඉහළ හා මැද කොටස විහිදී ඇත. මහනුවර සිට නාවලපිටිය දක්වා ප්‍රධාන මාර්ගය (A113) දුම්රිය මාර්ගයට පහළින් ඉඩම් නායයෑම් මැදින් ගමන් කරයි.

භූ අර්ථ විද්‍යාව අනුව ගිලා බැස්මේ සිට මැද කොටස දක්වා නායයෑම් දේහය හරහා මාර්ගය ගමන් කරන ස්ථානය සාමාන්‍යයෙන් දැඩි නොවන නමුත් ගඟට ඉහළින් වක්‍රාකාරව කැණීම දක්වා මහවැලි ගඟේ ඉවුරය. මහවැලි ගඟේ ඉවුර ඉඩම් නායයෑමට ඇතුළත් කර නොමැති බව සටහන් විය යුතුය.

A113 ප්‍රධාන මාර්ගයට ඔබ්බෙන් ඉහළ කොටස ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුවට අයත් වන අතර පහළ කොටස මාර්ග සංවර්ධන අධිකාරියට අයිතිය.

5.21.3.2 යෝජනාවලි 02 වැඩබිම් තත්ත්වයන්

1. A004-154 ඉඹුල්පේ

මාර්ග උරිස්වල පිරවුම් කරන කොටසේ ආතතිය හා විවෘත ඉරිතැලීම් හඳුනාගනු ලැබිණි. කොළඹ - බදුල්ල ප්‍රධාන මාර්ගය (A004) නායයෑම් මුදුන අසලින් ගමන් කරයි. මාර්ග ඉවුරු තුල තව දුරටත් අසාර්ථකවීම් වැළැක්වීමට, ඉවුරු පාදය අසල ගේබියන් තාප්ප ඉදිකරන ලදි.

2. A004-173 පුස්සැල්ල

මෙම වැඩබිම ඉහළ පැත්තේ, බාදනය වූ ගල්පරයන් හා පහත පැත්තේ බෑවුම් ව්‍යුහයන් බෑවුම් අසාර්ථක වීම ලෙස හඳුනා ගන්නා ලදි. මෙම වැඩබිමේ කැපී පෙනෙන අනෙකුත් ලක්ෂණය වන්නේ අටලු සහිත අධිශක්ම රැහැන් වේ. භූ විද්‍යා සමීක්ෂණ තුලදී බෑවුම පිටුපස ආතති සහිත ඉරිතැලීම් නිරීක්ෂණය නොවුනස මාර්ගයට හා අධිශක්ම රැහැන් වලට නැවත බෑවුම කඩා වැටීමේ අනතුර පවතී. කොළඹ - බදුල්ල (A004) මහාමාර්ගය අසාර්ථක බෑවුමට පහළින් ගමන් කරයි.

3. A004-174 වල්හපුතැන්න

ඉලක්කගත ප්‍රදේශයේ සියලු කොටස් තුල, කඳුවැටිය පැත්තෙහි කපන ලද බෑවුමක් දක්නට ලැබේ. කපන ලද බෑවුමෙහි තියුණු ගලි බාදනයක්, පත්‍ර න්‍යායසය හා බුරුල්වීම සහ උරිස්වල මැද බෑවුම් අසාර්ථකවීම් වලින් එකතු වූ සුන්බුන් නිසා ඇතිවූ විවෘත ඉරිතැලීම් කොළඹ - බදුල්ල ප්‍රධාන මාර්ගයේ (A004) සිට පැහැදිලිව නිරීක්ෂණය වේ. මෙම වැඩබිම බෑවුම් අසාර්ථකවීම් වශයෙන් වර්ගීකරණය වන අතර බෑවුම් අසාර්ථකවීම් තුනක් හඳුනා ගැණිනි. නිම්නය දෙසට වන්නට රැඳවුම් තාප්පය බෑවුම දෙසට වලනය වී තිබුණි.

4. A005-135 2වැනි සැතපුම් කණුම

පසු හා තිරස් වලනය නිසා ප්‍රදර්ශනය වන පුළුල්ව විතැන් වූ මෙම වැඩබිම, ආතති පැලුම්, මතුපිට විතැන්වීම්, ගිලා බැසීම්, සුන්බුන් රැස්වීම් හා තෙත් බිම්, එහි සිට පැහැදිලිව දර්ශනය වෙයි.

පේරාදෙණිය - බදුල්ල - වෙන්කලඩි මාර්ගය (A005) හා අධික ජනගහන ප්‍රදේශය මෙම නායයෑම් පාදයට ආසන්නව පවතී. භූ අර්ථ විද්‍යාවට අනුව, ප්‍රධාන නායයෑම් දේහය මී. 775 සිට මී. 845 දක්වා පැතිරෙයි. නායයෑම් දේහය මධ්‍යයේ දළ වශයෙන් මී. 10 ක තිරස් විතැන්වීමක් සහිතව ප්‍රධාන ගිලා බැසීමක් පවතී. ප්‍රධාන ගිලා බැසීමේ පහත් බෑවුම මෘදු නමුත්

කැළඹුන භූ තලය වැසි සමයේ, මතුවී පැතිරී ගිය තෙත් බිම් පවතී. A005 මාර්ගය ඉහළ ප්‍රදේශය ප්‍රධාන වශයෙන් වැවිල්ලට භාවිතා කළ ප්‍රදේශයකි.

5. A005-167 ලුනුගල

මෙම වැඩබිම ඉඩම් නායයාම පාදයේ ප්‍රධාන ගිලා බැස්ම, ආතතිය පැලුම්, විතැන් වූ කොටස් හා සුන්බුන් තැන්පත්ව තිබේ. පේරාදෙණිය - බදුල්ල - චෙන්කලඩි මාර්ගය (A005) නායයෑම් පාදයට පසෙකින් පිහිටා ඇත. නායයෑම් පාදයේම පහළින් ගිණිකොන දිගට හැරුණු දිය පහරක් A-005 මාර්ගය දිගට ගලා යයි. භූ අර්ථ විද්‍යා ඇතුළුව ප්‍රධාන බෑවුම් ගිලා බැසීම සමඟ ප්‍රධාන නායයෑම් දේහය මී. 740 සිට මී. 800 දක්වා පැතිරේ. ප්‍රධාන ගිලා බැසීම් පහක් බෑවුම මෘදු ලෙස පෙනෙන නමුත්, කැළඹුනු භූ තලය වැසි සමයේ පාදය වටා පැතිරී ගිය දිය උල්පත් පවතී.

6. A016-010 කඟගල්ල

සිරස් හා ප්‍රධාන ගිලා බැසීම් වැනි නායයෑම් ලක්ෂණ පිළිබඳ පැහැදිලි ලක්ෂණ වැඩබිමේ දක්නට නැති නමුත්, නායයෑම් පාදයේ හා මැද විතැන් වූ සුන්බුන් තැන්පත් වී ඇත. මෙම වැඩබිම A-016 මාර්ගය ඇතුරුම් ඇතුළුව හඳුනාගත් නායයෑම් ප්‍රදේශයේ ආතති පැලීම් ගණනාවක් පෙන්වා දෙයි. බෙරගල - හාලි ඇල මාර්ගය (A-016) නායයෑම් පාදය හරහා සර්පිලාකාර මාර්ගයක් ලෙස ගමන් කරයි. ප්‍රධාන නායයෑම් දේහය මී.650 ක් දිග හා පියවර ගණනක ගිලා බැසීමකින් යුක්ත මෘදු හා කැළඹුණු බෑවුම් වලින් යුක්තය. නායයෑමේ පාදයට A016 මාර්ගය අයත් වන අතර ඒ හේතුවෙන්, A-016 මාර්ගය නායයෑම් වලනයට ප්‍රති විරුද්ධව ඉතා බිඳී යන සුළුය. සාධකයක් ලෙස වැසි සමයේ A016 මාර්ගය නායයෑම් හේතුවෙන් නිතර විතැන් වීමට හා ගිලා බැසීම් වලට ලක් වේ. ඊට අමතරව නායයෑම් ඉඩම යාබදව නායයෑම් පාදය හෝ එහි පැතිවල ජල ධාරාවන් හා ජලාශ වහනයන් සහිතව ඇතැම් පොදු ගොඩනැගිලි හා යටිතල ව්‍යුහයන් පවතී.





A005 මාර්ගයේ කි.මී. 135+000





AB013 මාර්ගයේ කි.මී. 15+000



බෙරගල - හැලි ඇල මාර්ගයේ (A016) - කි.මී. 010 (කහගල්ල නායයෑම)



A005 මාර්ගයේ කි.මී. 168+000



ප්‍රජා සම්ප්‍රජානන වැඩ සටහන බදුල්ල



ප්‍රජා සම්ප්‍රජානන වැඩ සටහන ලුනුගල



විස්තරාත්මක සැලසුම් පිළිබඳ *13* වැනි වැඩමුළුව



ආවේක්ෂණ උපකරණ ස්ථාපනය කරමින්



ආවේක්ෂණ උපකරණ ස්ථාපනය කරමින්



A016 මාර්ගයේ කි.මී.-*010* අසල විදුම් විමර්ශන යන්ත්‍ර ප්‍රතිස්ථානගත කිරීම

5.22 ඒකාබද්ධ මාර්ග ආයෝජන වැඩ සටහන් ව්‍යාපෘතිය (i-ROAD) ව්‍යාපෘති කළමනාකරණ ඒකකය

5.22.1 ව්‍යාපෘතිය පිළිබඳ සංක්ෂිප්ත හැඳින්වීමක්

ඒකාබද්ධ මාර්ග ආයෝජන වැඩ සටහන් (i Road) ව්‍යාපෘති කළමනාකරණ ඒකකය, වැඩි වූ ප්‍රවාහන කාර්යක්ෂමතාවය හා වේගවත් ආර්ථික සංවර්ධනයක් සඳහා ග්‍රාමීය ප්‍රජාවට ආර්ථික මධ්‍යස්ථාන වලට ප්‍රවේශ වීම ඉහළ නැංවීමේ අරමුණ සහිතව පිහිටුවනු ලැබීය.

දකුණු, සබරගමු, මධ්‍යම, උතුරු, උතුරුමැද, වයඹ හා බස්නාහිර පළාත්වල තෝරා ගත් ජාතික හා ග්‍රාමීය මාර්ග මෙම ව්‍යාපෘතියට ඇතුළත් කෙරිණි. i-ROAD වැඩ සටහන මෙම පළාත්වල ජීවත් වන ජනතාවගේ ආර්ථික හා සාමාජීය තත්ත්වය නැංවීමේ කටයුතු පහසු කිරීමට මාර්ග ජාලය සංවර්ධනය කිරීමේ ප්‍රධාන අංගයක් ලෙස හඳුනා ගෙන ඇත. ඒ අනුව ඊට ශ්‍රී ලංකා රජයේ සංවර්ධන වැඩ සටහන් අතුරෙන් ඉහළ ප්‍රමුඛතාවය ලැබුණු අතර අරමුදල් සපයනු ලබන්නේ ආසියානු සංවර්ධන බැංකුව විසිනි. i-ROAD සංකල්පය ප්‍රදාන ආයතන විසින් රටට හඳුන්වා දුන් නව සංකල්පයකි. පුනරුත්ථාපනයට පසුව නිම කරන ලද පළාත් සහ ප්‍රාදේශීය මාර්ග අවුරුදු 3 ක කාලයක් සඳහා අනිවාර්ය නඩත්තු කරනු ලබන අතර, තෝරාගත් ජාතික මහාමාර්ග අවුරුදු 7 ක කාල සීමාවක නිමැවුම් හා කාර්ය සාධනය පදනම් වූ මාර්ග කොන්ත්‍රාත් සංකල්පය යටතේ නඩත්තු කෙරේ.

මෙම ව්‍යාපෘතියට බහු වාරික මූල්‍ය පහසුකම් හරහා ආ.සං.බැ. විසින් අරමුදල් සපයනු ලබයි. ඒ අනුව පහත දැක්වෙන පරිදි 2014 සිට 2020 දක්වා දර්ශක වාරික හයක් මගින් එ.ජ.ඩො. මිලියන 800 ක් නිදහස් කරනු ලැබේ.

වර්ෂය / මූලාශ්‍රය / වාරික	2014		2016	2017	2018	2020	
	1	2	3	4	5	6	එකතුව එ.ජ.ඩො. (මිලියන)
ආසංබැඑජඩො (මිලි.)	100.0	107.0	200.0	150.0	150.0	93.0	800.0
ශ්‍රීලර එජඩො (මිලි.)	18.0	12.5	25.0	18.0	18.0	14.5	106.0
සමස්ත මුදල එජඩො (මිලි.)	118.0	119.5	225.0	168.0	168.0	107.5	906.0

2015 වර්ෂය තුල, එ.ජ.ඩො. මිලියන 100 ක් හා එ.ජ.ඩො. මිලියන 107 ක ණය මුදල පිළිවෙලින් වාරික 1 හා වාරික 2 සඳහා ගෙවීමට නියමිත විය.

5.22.2 භෞතික නිමවුම් වලට අනුව 2015 වර්ෂයේ කටයුතු වල ප්‍රගතිය

5.22.2.1 සිවිල් වැඩ කොන්ත්‍රාත් - ග්‍රාමීය මාර්ග

ග්‍රාමීය මාර්ග සඳහා සිවිල් වැඩ වලට සම්බන්ධ පහත සඳහන් කොන්ත්‍රාත් පිරිනමන ලද අතර, වර්ෂය තුල වැඩ ආරම්භ කරන ලදි.

i) දකුණු පළාත

දිස්ත්‍රික්කය	කොන්ත්‍රාත් යෝජනාවලි අංකය	යෝජනාවලි විස්තර	වැඩ රහිත කොන්ත්‍රාත් මුදල (රු. මිලි..)
ගාල්ල (G1)	RDA/ADB/iROAD/(SP)/ICB/CP-RR(G1)	අවුරුදු 3 ක කාර්ය සාධනය පදනම් වූ නඩත්තුව ඇතුළු ගාල්ල දිස්ත්‍රික්කයේ කොන්ත්‍රාත් 1 කි.මී. 65 ග්‍රාමීය මාර්ග පුනරුත්ථාපනය / වැඩි දියුණු කිරීම.	1,458.06
ගාල්ල (G2)	RDA/ADB/iROAD/(SP)/ICB/CP-RR(G2)	අවුරුදු 3 ක කාර්ය සාධනය පදනම් වූ නඩත්තුව ඇතුළු ගාල්ල දිස්ත්‍රික්කයේ කොන්ත්‍රාත් 2 කි.මී. 63 ග්‍රාමීය මාර්ග පුනරුත්ථාපනය / වැඩි දියුණු කිරීම.	1,483.13
ගාල්ල (G3)	RDA/ADB/iROAD/(SP)/ICB/CP-RR(G3)	අවුරුදු 3 ක කාර්ය සාධනය පදනම් වූ නඩත්තුව ඇතුළු ගාල්ල දිස්ත්‍රික්කයේ කොන්ත්‍රාත් 3 කි.මී. 74 ග්‍රාමීය මාර්ග පුනරුත්ථාපනය / වැඩි දියුණු කිරීම.	1,733.44
මාතර (M1)	RDA/ADB/iROAD/(SP)/ICB/CP-RR(M1)	අවුරුදු 3 ක කාර්ය සාධනය පදනම් වූ නඩත්තුව ඇතුළු මාතර දිස්ත්‍රික්කයේ කොන්ත්‍රාත් 1 කි.මී. 98 ග්‍රාමීය මාර්ග පුනරුත්ථාපනය / වැඩි දියුණු කිරීම.	2,315.35
මාතර (M2)	RDA/ADB/iROAD/(SP)/ICB/CP-RR(M2)	අවුරුදු 3 ක කාර්ය සාධනය පදනම් වූ නඩත්තුව ඇතුළු මාතර දිස්ත්‍රික්කයේ කොන්ත්‍රාත් 2 කි.මී. 66 ග්‍රාමීය මාර්ග පුනරුත්ථාපනය / වැඩි දියුණු කිරීම.	1,803.30
මාතර (M3)	RDA/ADB/iROAD/(SP)/ICB/CP-RR(M3)	අවුරුදු 3 ක කාර්ය සාධනය පදනම් වූ නඩත්තුව ඇතුළු මාතර දිස්ත්‍රික්කයේ කොන්ත්‍රාත් 3 කි.මී. 56 ග්‍රාමීය මාර්ග පුනරුත්ථාපනය / වැඩි දියුණු කිරීම.	1,207.60
හම්බන්තොට (H1)	RDA/ADB/iROAD/(SP)/ICB/CP-RR(H1)	අවුරුදු 3 ක කාර්ය සාධනය පදනම් වූ නඩත්තුව ඇතුළු හම්බන්තොට දිස්ත්‍රික්කයේ කොන්ත්‍රාත් 1 කි.මී. 72 ග්‍රාමීය මාර්ග පුනරුත්ථාපනය / වැඩි දියුණු කිරීම.	1,583.60
හම්බන්තොට (H2)	RDA/ADB/iROAD/(SP)/ICB/CP-RR(H2)	අවුරුදු 3 ක කාර්ය සාධනය පදනම් වූ නඩත්තුව ඇතුළු හම්බන්තොට දිස්ත්‍රික්කයේ කොන්ත්‍රාත් 2 කි.මී. 60 ග්‍රාමීය මාර්ග පුනරුත්ථාපනය / වැඩි දියුණු කිරීම.	1,210.33
හම්බන්තොට (H3)	RDA/ADB/iROAD/(SP)/ICB/CP-RR(H3)	අවුරුදු 3 ක කාර්ය සාධනය පදනම් වූ නඩත්තුව ඇතුළු මාතර දිස්ත්‍රික්කයේ කොන්ත්‍රාත් 3 කි.මී. 42 ග්‍රාමීය මාර්ග පුනරුත්ථාපනය / වැඩි දියුණු කිරීම.	1,052.14
		එකතුව	13846.95

ii) සබඟමුව පළාත

දිස්ත්‍රික්කය	*කොන්ත්‍රාත් යෝජනාවලි අංකය*	*යෝජනාවලි විස්තර*	*වැට රහිත කොන්ත්‍රාත් මුදල (රු. මිලි..)*
කෑගල්ල (KE1)	RDA/ADB/iROAD/(SG)/NCB/CP-RR(KE1)	අවුරුදු 3 ක කාර්ය සාධනය පදනම් වූ නඩත්තුව ඇතුළු කෑගල්ල දිස්ත්‍රික්කයේ කොන්ත්‍රාත් 1 ග්‍රාමීය මාර්ග කි.මී. 75 පුනරුත්ථාපනය හා වැඩි දියුණු කිරීම	1,972.53
රත්නපුර (R1)	RDA/ADB/iROAD/(SG)/NCB/CP-RR(R1)	අවුරුදු 3 ක කාර්ය සාධනය පදනම් වූ නඩත්තුව ඇතුළු රත්නපුර දිස්ත්‍රික්කයේ කොන්ත්‍රාත් 1 ග්‍රාමීය මාර්ග කි.මී. 83 පුනරුත්ථාපනය හා වැඩි දියුණු කිරීම.	2,022.05
රත්නපුර (R2)	RDA/ADB/iROAD/(SG)/NCB/CP-RR(R2)	අවුරුදු 3 ක කාර්ය සාධනය පදනම් වූ නඩත්තුව ඇතුළු රත්නපුර දිස්ත්‍රික්කයේ කොන්ත්‍රාත් 2 ග්‍රාමීය මාර්ග කි.මී. 92 පුනරුත්ථාපනය හා වැඩි දියුණු කිරීම.	2,384.00
රත්නපුර (R3)	RDA/ADB/iROAD/(SG)/NCB/CP-RR(R3)	අවුරුදු 3 ක කාර්ය සාධනය පදනම් වූ නඩත්තුව ඇතුළු රත්නපුර දිස්ත්‍රික්කයේ කොන්ත්‍රාත් 3 ග්‍රාමීය මාර්ග කි.මී. 81 පුනරුත්ථාපනය හා වැඩි දියුණු කිරීම	2,021.00
		එකතුව	8,399.58

කෑගල්ල දිස්ත්‍රික්කයේ පහත සඳහන් කොන්ත්‍රාත් යෝජනාවලි දෙක සඳහා ප්‍රසම්පාදනය නිම කරන ලද අතර කොන්ත්‍රාත් ප්‍රදානය කිරීම සඳහා අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබා ගත යුතුව ඇත.

දිස්ත්‍රික්කය	*කොන්ත්‍රාත් යෝජනාවලි අංකය*	*යෝජනාවලි විස්තර*	*වැට රහිත කොන්ත්‍රාත් මුදල (රු. මිලි..)*
කෑගල්ල (KE2)	RDA/ADB/iROAD/(SG)/NCB/CP-RR(KE2)	අවුරුදු 3 ක කාර්ය සාධනය පදනම් වූ නඩත්තුව ඇතුළු කෑගල්ල දිස්ත්‍රික්කයේ කොන්ත්‍රාත් 2 ග්‍රාමීය මාර්ග කි.මී. 79 පුනරුත්ථාපනය හා වැඩි දියුණු කිරීම	1,816.99
කෑගල්ල (KE3)	RDA/ADB/iROAD/(SG)/NCB/CP-RR(KE3)	අවුරුදු 3 ක කාර්ය සාධනය පදනම් වූ නඩත්තුව ඇතුළු කෑගල්ල දිස්ත්‍රික්කයේ කොන්ත්‍රාත් 3 ග්‍රාමීය මාර්ග කි.මී. 64 පුනරුත්ථාපනය හා වැඩි දියුණු කිරීම	1,632.46
		එකතුව	3,449.45

iii) මධ්‍යම පළාත

දිස්ත්‍රික්කය	කොන්ත්‍රාත් යෝජනාවලි අංකය	යෝජනාවලි විස්තර	වැට රඟිත කොන්ත්‍රාත් මුදල (රු. මිලි..)
මහනුවර (KA1)	RDA/ADB/iROAD/(CP)/NCB/CP-RR(KA1)	අවුරුදු 3 ක කාර්ය සාධනය පදනම් වූ නඩත්තුව ඇතුළු මහනුවර දිස්ත්‍රික්කයේ කොන්ත්‍රාත් 1 ග්‍රාමීය මාර්ග කි.මී. 77 පුනරුත්ථාපනය හා වැඩි දියුණු කිරීම.	1,756.28
මහනුවර (KA2)	RDA/ADB/iROAD/(CP)/NCB/CP-RR(KA2)	අවුරුදු 3 ක කාර්ය සාධනය පදනම් වූ නඩත්තුව ඇතුළු මහනුවර දිස්ත්‍රික්කයේ කොන්ත්‍රාත් 2 ග්‍රාමීය මාර්ග කි.මී. 71 පුනරුත්ථාපනය හා වැඩි දියුණු කිරීම	1,923.67
මහනුවර (KA3)	RDA/ADB/iROAD/(CP)/NCB/CP-RR(KA3)	අවුරුදු 3 ක කාර්ය සාධනය පදනම් වූ නඩත්තුව ඇතුළු මහනුවර දිස්ත්‍රික්කයේ කොන්ත්‍රාත් 3 ග්‍රාමීය මාර්ග කි.මී. 74 පුනරුත්ථාපනය හා වැඩි දියුණු කිරීම	2,096.87
මාතලේ (MA1)	RDA/ADB/iROAD/(CP)/NCB/CP-RR(MA1)	අවුරුදු 3 ක කාර්ය සාධනය පදනම් වූ නඩත්තුව ඇතුළු මාතලේ දිස්ත්‍රික්කයේ කොන්ත්‍රාත් 1 ග්‍රාමීය මාර්ග කි.මී. 76 පුනරුත්ථාපනය හා වැඩි දියුණු කිරීම	1,622.37
මාතලේ (MA2)	RDA/ADB/iROAD/(CP)/NCB/CP-RR(MA2)	අවුරුදු 3 ක කාර්ය සාධනය පදනම් වූ නඩත්තුව ඇතුළු මාතලේ දිස්ත්‍රික්කයේ කොන්ත්‍රාත් 2 ග්‍රාමීය මාර්ග කි.මී. 57 පුනරුත්ථාපනය හා වැඩි දියුණු කිරීම	1,248.83
මාතලේ (MA3)	RDA/ADB/iROAD/(CP)/NCB/CP-RR(MA3)	අවුරුදු 3 ක කාර්ය සාධනය පදනම් වූ නඩත්තුව ඇතුළු මාතලේ දිස්ත්‍රික්කයේ කොන්ත්‍රාත් 3ග්‍රාමීය මාර්ග කි.මී. 62 පුනරුත්ථාපනය හා වැඩි දියුණු කිරීම	1,407.72
නුවරඑළිය (NE1)	RDA/ADB/iROAD/(CP)/NCB/CP-RR(NE1)	අවුරුදු 3 ක කාර්ය සාධනය පදනම් වූ නඩත්තුව ඇතුළු නුවරඑළිය දිස්ත්‍රික්කයේ කොන්ත්‍රාත් 1 ග්‍රාමීය මාර්ග කි.මී. 77 පුනරුත්ථාපනය හා වැඩි දියුණු කිරීම	2,297.89
නුවරඑළිය (NE2)	RDA/ADB/iROAD/(CP)/NCB/CP-RR(NE2)	අවුරුදු 3 ක කාර්ය සාධනය පදනම් වූ නඩත්තුව ඇතුළු නුවරඑළිය දිස්ත්‍රික්කයේ කොන්ත්‍රාත් 2 ග්‍රාමීය මාර්ග කි.මී. 39 පුනරුත්ථාපනය හා වැඩි දියුණු කිරීම	1,241.72
නුවරඑළිය (NE3)	RDA/ADB/iROAD/(CP)/NCB/CP-RR(NE3)	අවුරුදු 3 ක කාර්ය සාධනය පදනම් වූ නඩත්තුව ඇතුළු නුවරඑළිය දිස්ත්‍රික්කයේ කොන්ත්‍රාත් 3 ග්‍රාමීය මාර්ග කි.මී. 65 පුනරුත්ථාපනය හා වැඩි දියුණු කිරීම	2,069.69
		එකතුව	15,665.04

iv) වයඹ පළාත

දිස්ත්‍රික්කය	*කොන්ත්‍රාත් යෝජනාවලි අංකය*	*යෝජනාවලි විස්තර*	*ලංසු වර්ගය*
කුරුණෑගල (KU1)	RDA/ADB/iROAD/(NW)/ICB/CP-RR(KU1)	අවුරුදු 3 ක කාර්ය සාධනය පදනම් වූ නඩත්තුව ඇතුළු කුරුණෑගල දිස්ත්‍රික්කයේ කොන්ත්‍රාත් 1 ග්‍රාමීය මාර්ග කි.මී. 85 පුනරුත්ථාපනය හා වැඩි දියුණු කිරීම.	ජා.ත.ල.
කුරුණෑගල (KU2)	RDA/ADB/iROAD/(NW)/ICB/CP-RR(KU2)	අවුරුදු 3 ක කාර්ය සාධනය පදනම් වූ නඩත්තුව ඇතුළු කුරුණෑගල දිස්ත්‍රික්කයේ කොන්ත්‍රාත් 2 ග්‍රාමීය මාර්ග කි.මී. 100 පුනරුත්ථාපනය හා වැඩි දියුණු කිරීම	
කුරුණෑගල (KU3)	RDA/ADB/iROAD/(NW)/NCB/CP-RR(KU3)	අවුරුදු 3 ක කාර්ය සාධනය පදනම් වූ නඩත්තුව ඇතුළු කුරුණෑගල දිස්ත්‍රික්කයේ කොන්ත්‍රාත් 3 ග්‍රාමීය මාර්ග කි.මී. 99 පුනරුත්ථාපනය හා වැඩි දියුණු කිරීම.	ජා.ත.ල.
කුරුණෑගල (KU4)	RDA/ADB/iROAD/(NW)/ICB/CP-RR(KU4)	අවුරුදු 3 ක කාර්ය සාධනය පදනම් වූ නඩත්තුව ඇතුළු කුරුණෑල දිස්ත්‍රික්කයේ කොන්ත්‍රාත් 4 ග්‍රාමීය මාර්ග කි.මී. 97 පුනරුත්ථාපනය හා වැඩි දියුණු කිරීම.	
කුරුණෑගල (KU5)	RDA/ADB/iROAD/(NW)/ICB/CP-RR(KU5)	අවුරුදු 3 ක කාර්ය සාධනය පදනම් වූ නඩත්තුව ඇතුළු කුරුණෑගල දිස්ත්‍රික්කයේ කොන්ත්‍රාත් 5 ග්‍රාමීය මාර්ග කි.මී. 104 පුනරුත්ථාපනය හා වැඩි දියුණු කිරීම.	
පුත්තලම (PU1)	RDA/ADB/iROAD/(NW)/NCB/CP-RR(PU1)	අවුරුදු 3 ක කාර්ය සාධනය පදනම් වූ නඩත්තුව ඇතුළු පුත්තලම දිස්ත්‍රික්කයේ කොන්ත්‍රාත් 1 ග්‍රාමීය මාර්ග කි.මී. 93 පුනරුත්ථාපනය හා වැඩි දියුණු කිරීම	ජා.ත.ල.
පුත්තලම (PU2)	RDA/ADB/iROAD/(NW)/NCB/CP-RR(PU2)	අවුරුදු 3 ක කාර්ය සාධනය පදනම් වූ නඩත්තුව ඇතුළු පුත්තලම දිස්ත්‍රික්කයේ කොන්ත්‍රාත් 2 ග්‍රාමීය මාර්ග කි.මී. 73 පුනරුත්ථාපනය හා වැඩි දියුණු කිරීම	
පුත්තලම (PU3)	RDA/ADB/iROAD/(NW)/NCB/CP-RR(PU3)	අවුරුදු 3 ක කාර්ය සාධනය පදනම් වූ නඩත්තුව ඇතුළු පුත්තලම දිස්ත්‍රික්කයේ කොන්ත්‍රාත් 3 ග්‍රාමීය මාර්ග කි.මී. 54 පුනරුත්ථාපනය හා වැඩි දියුණු කිරීම	

v) උතුරුමැද පළාත

දිස්ත්‍රික්කය	කොන්ත්‍රාත් යෝජනාවලි අංකය	යෝජනාවලි විස්තර	ලංසු වර්ගය
අනුරාධපුර (AP1)	RDA/ADB/iROAD/(NC)/ICB/CP-RR(AP1)	අවුරුදු 3 ක කාර්ය සාධනය පදනම් වූ නඩත්තුව ඇතුළු අනුරාධපුර දිස්ත්‍රික්කයේ කොන්ත්‍රාත් 1 ග්‍රාමීය මාර්ග කි.මී. 83 පුනරුත්ථාපනය හා වැඩි දියුණු කිරීම	ජා.ත.ල.
අනුරාධපුර (AP2)	RDA/ADB/iROAD/(NC)/NCB/CP-RR(AP2)	අවුරුදු 3 ක කාර්ය සාධනය පදනම් වූ නඩත්තුව ඇතුළු අනුරාධපුර දිස්ත්‍රික්කයේ කොන්ත්‍රාත් 2 ග්‍රාමීය මාර්ග කි.මී. 77 පුනරුත්ථාපනය හා වැඩි දියුණු කිරීම	
අනුරාධපුර (AP3)	RDA/ADB/iROAD/(NC)/ICB/CP-RR(AP3)	අවුරුදු 3 ක කාර්ය සාධනය පදනම් වූ නඩත්තුව ඇතුළු අනුරාධපුර දිස්ත්‍රික්කයේ කොන්ත්‍රාත් 3 ග්‍රාමීය මාර්ග කි.මී. 84 පුනරුත්ථාපනය හා වැඩි දියුණු කිරීම	
අනුරාධපුර (AP4)	RDA/ADB/iROAD/(NC)/ICB/CP-RR(AP4)	අවුරුදු 3 ක කාර්ය සාධනය පදනම් වූ නඩත්තුව ඇතුළු අනුරාධපුර දිස්ත්‍රික්කයේ කොන්ත්‍රාත් 4 ග්‍රාමීය මාර්ග කි.මී. 88 පුනරුත්ථාපනය හා වැඩි දියුණු කිරීම	ජා.ත.ල.
පොළොන්නරුව (PO1)	RDA/ADB/iROAD/(NC)/NCB/CP-RR(PO1)	අවුරුදු 3 ක කාර්ය සාධනය පදනම් වූ නඩත්තුව ඇතුළු පොළොන්නරුව දිස්ත්‍රික්කයේ කොන්ත්‍රාත් 1 ග්‍රාමීය මාර්ග කි.මී. 49 පුනරුත්ථාපනය හා වැඩි දියුණු කිරීම	
පොළොන්නරුව (PO2)	RDA/ADB/iROAD/(NC)/NCB/CP-RR(PO2)	අවුරුදු 3 ක කාර්ය සාධනය පදනම් වූ නඩත්තුව ඇතුළු පොළොන්නරුව දිස්ත්‍රික්කයේ කොන්ත්‍රාත් 2 ග්‍රාමීය මාර්ග කි.මී. 74 පුනරුත්ථාපනය හා වැඩි දියුණු කිරීම	
පොළොන්නරුව (PO3)	RDA/ADB/iROAD/(NC)/NCB/CP-RR(PO3)	අවුරුදු 3 ක කාර්ය සාධනය පදනම් වූ නඩත්තුව ඇතුළු පොළොන්නරුව දිස්ත්‍රික්කයේ කොන්ත්‍රාත් 3 ග්‍රාමීය මාර්ග කි.මී. 47 පුනරුත්ථාපනය හා වැඩි දියුණු කිරීම	

vi) බස්නාහිර පළාත / කළුතර දිස්ත්‍රික්කය

දිස්ත්‍රික්කය	කොන්ත්‍රාත් යෝජනාවලි අංකය	යෝජනාවලි විස්තර	ලංසු වර්ගය
කළුතර (KL1)	RDA/ADB/iROAD/(WP)/NCB/CP-RR(KL1)	අවුරුදු 3 ක කාර්ය සාධනය පදනම් වූ නඩත්තුව ඇතුළු කළුතර දිස්ත්‍රික්කයේ කොන්ත්‍රාත් 1 ග්‍රාමීය මාර්ග කි.මී. 94 පුනරුත්ථාපනය හා වැඩි දියුණු කිරීම	ජා.ත.ල.
කළුතර (KL2)	RDA/ADB/iROAD/(WP)/NCB/CP-RR(KL2)	අවුරුදු 3 ක කාර්ය සාධනය පදනම් වූ නඩත්තුව ඇතුළු කළුතර දිස්ත්‍රික්කයේ කොන්ත්‍රාත් 2 ග්‍රාමීය මාර්ග කි.මී. 89 පුනරුත්ථාපනය හා වැඩි දියුණු කිරීම	
කළුතර (KL3)	RDA/ADB/iROAD/(WP)/NCB/CP-RR(KL3)	අවුරුදු 3 ක කාර්ය සාධනය පදනම් වූ නඩත්තුව ඇතුළු කළුතර දිස්ත්‍රික්කයේ කොන්ත්‍රාත් 3 ග්‍රාමීය මාර්ග කි.මී. 94 පුනරුත්ථාපනය හා වැඩි දියුණු කිරීම	

5.22.2.2 සිවිල් වැඩ කොන්ත්‍රාත් – ජාතික මාර්ග

සිවිල් වැඩ සඳහා පිළියෙල කල කොන්ත්‍රාත් යෝජනාවලි අනුව පුනරුත්ථාපනය / වැඩි දියුණු කිරීම සිදුකර අවුරුදු 7ක කාලයක් මාර්ග කළමනාකරණ කොන්ත්‍රාත් සංකල්ප යටතේ නඩත්තු කිරීමට ඇති ජාතික මහාමාර්ග විස්තර පහත දැක්වේ.

යෝජනාවලිය	දිස්ත්‍රික්කය	කාර්යයයේ ස්වභාවය	මාර්ග අංකය	මාර්ගයේ නම	වැඩ සටහන් කර ඇති දුර		
					වැඩි දියුණු කරන ප්‍රති නිර්මාණය (කි.මී.)	වාරික නඩත්තුව (කි.මී.)	සාමාන්‍ය නඩත්තුව සඳහා (කි.මී.)
යෝජනාවලි 1	ගාල්ල	යළි ඉදිකිරීම	B 248	ලබුදුව – වඳුරඹ	34.85		11.77
			B 429	උඩුගම – හිනිදුම			11.01
			B 303	නාගොඩ – ගෝනදෙනිය			3.57
			B 139	ගෝනදෙනිය – උඩුගම මාර්ගය (බාර් හංදිය)			4.43
			B 411	තවලම – නෙලුව – බටුවන්ගල			9.45
		වාරික නඩත්තුව	B 454	වඳුරඹ යටලමත්ත – නාගොඩ		20.55	10.76
			B 129	උඩුගම (බාර් හංදිය) – උඩුගම (බස් නැවතුම්පල)			2.68
			B 156*	හිනිදුම – තවලම			6.60
යෝජනාවලිය 1-උප එකතුව					34.85	20.55	60.27

යෝජනා වලිය	දිස්ත්‍රික්කය	කාර්යයයේ ස්වභාවය	මාර්ග අංකය	මාර්ගයේ නම	වැඩ සටහන් කර ඇති දුර		
					වැඩි දියුණු කරන ප්‍රකි නිර්මාණය (කි.මී.)	වාරික නඩත්තුව (කි.මී.)	සාමාන්‍ය නඩත්තුව සඳහා (කි.මී.)
යෝජනා වලි 2	මාතර	යළි ඉදිකිරීම	B 607	බෙංගමුව – මොලොක්ගමුව– ගල්දොල	9.24		9.24
		සාමාන්‍ය නඩත්තුව	B 415*	බෙංගමුව – හැගොඩ			7.12
	හම්බන්තොට	යළි ඉදිකිරීම	B 606	කිරම – වරාපිටිය – හුලංකන්ද - හැගොඩ	14.52		14.52
		එදිනෙදා වාරික නඩත්තුව	B 485	කිරම – වලස්මුල්ල		21.34	7.28
			B 450	වලස්මුල්ල – වීරකැටිය			7.76
			B 463	වීරකැටිය - මිද්දෙනිය			0.90
			B 623	වීරකැටිය – ගෝනදෙනිය			6.12
යෝජනාවලි 2 - උප එකතුව					**23.76**	**21.34**	**52.94**
යෝජනා වලි 3	ගම්පහ/ කෑගල්ල/ මහනුවර	යළි ඉදිකිරීම (මතුපිට ඇතුරුම උරිස් ඉදිකිරීම පුළුල් කිරීම) හා එදිනෙදා නඩත්තුව	A001	කොළඹ – මහනුවර	68.07	1.5	69.57
	මහනුවර	යළි ඉදිකිරීම (රථ මාර්ගය පුළුල් කිරීම උරිස් ඉදිකිරීම හා ඇතුරුම් පුනරුත්ථාපනය) හා එදිනෙදා නඩත්තුව	B365	පේරාදෙණිය – හල්ලොලුව – කටුගස්තොට	7.59	2.4	9.99
	මහනුවර/ කුරුණෑගල	යළි ඉදිකිරීම (උරිස් පුළුල් කිරීම ඇතිරීම හා ඇතුරුම් පුනරුත්ථාපනය)	A10	කටුගස්තොට – කුරුණෑගල - පුත්තලම	38.13		38.13
යෝජනාවලි 3- උප එකතුව					**113.79**	**3.9**	**117.69**
එකතුව					**172.40**	**45.79**	**230.90**

මෙම මාර්ග සඳහා මිනුම් හා ප්‍රාථමික ඉංජිනේරු කටයුතු 2015 වර්ෂය තුල නිම කරන ලදි.

කෙසේ නමුත් මෙම මාර්ග කළමනාකරණ ව්‍යාපෘති සඳහා අවුරුදු 7 ක කොන්ත්‍රාත් කාල සීමාව සලකා බැලෙන හෙයින්, වැඩ සටහන් කරන ලද පරිදි මෙම කොන්ත්‍රාත් සඳහා ප්‍රසම්පාදනය ආරම්භ නොකෙරිණි. මාසංඅ කෙටි කොන්ත්‍රාත් කාල සීමාවක් හා ප්‍රතිපත්තිමය තීරණයන් පදනම් වූ ක්‍රම වේදයක් අනුගමනය කිරීමට අදහස් කරයි.

5.22.2.2 ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම සඳහා උපදේශක සේවා.

ග්‍රාමීය මාර්ගවල සිවිල් වැඩ සඳහා පහත සඳහන් පරිදි උපදේශක සේවා ප්‍රසම්පාදනය කරනු ලැබිය.

ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේ උපදේශකත්වය	පළාත	උපදේශකයන්	උපදේශක කොන්ත්‍රාත් මුදල (රු. මිලි.)
PIC - 1	දකුණු	එම්ජීසි-ඊසිඑල් බද්ධ ව්‍යාපාර	472.21
PIC - 2	වයඹ / උමැප	යුන්ගාවා – ආර්ඩීසි බද්ධ ව්‍යාපාර	596.50
PIC - 3	මධ්‍ය/සබර./ බප	එගිස්- සිර්ඒඒ බද්ධ ව්‍යාපාර	821.55
එකතුව			1,890.26

5.22.2.2.1 2015 අවසානයේ ඒ.මා.ආ.වැ.ව්‍යාපෘතියේ ප්‍රගතිය :

මාර්ගයේ / පාලමේ නම	දිග (කි.මී.)	කා.ඇ.ක. (රු. මිලි.)	ආරම්භක දිනය	2015 අවසානයේ ප්‍රගතිය	2015 වර්ෂය තුල වියදම (රු. මිලි.)
දකුණු පළාතේ ග්‍රාමීය මාර්ග	582	13,846.95	18.05.2015	11.5%	4001.41
සබරගමු පළාතේ ග්‍රාමීය මාර්ග	330	8,399.58	16.12.2015	කොන්ත්‍රාත්කරු සම්පත් මෙහෙයවමින් පවතී.	839.95
මධ්‍යම පළාතේ ග්‍රාමීය මාර්ග	598	15,665.04	17.12.2015	කොන්ත්‍රාත්කරු සම්පත් මෙහෙයවමින් පවතී.	1566.50

6 වැනි පරිච්ඡේදය


මා.සං.අ. යේ සමස්ත මූල්‍ය කාර්ය සාධනය

2015 වර්ෂය තුල ජාතික මහාමාර්ග ජාලය සංවර්ධනය හා නඩත්තුව සහ මහාමාර්ග / අධිවේගී මාර්ග ඉදි කිරීමෙදි ව්‍යාපෘති සඳහා විදේශාධාර ණය, ප්‍රතිපූර්ණ විදේශාධාර ණය, විදේශාධාර ප්‍රදාන හා සම්බන්ධ දේශීය අරමුදල් හා දේශීය අරමුදල් පිළිබඳ මා.සං.අ. යේ මූල්‍ය කාර්ය සාධනය රු. බිලියන 191,214.20 කි. මූල්‍ය කාර්ය සාධනය පිළිබඳ විස්තර ඇමුණුම I හි සඳහන් වන අතර එහි සාරාංශය පහත දැක්වේ.

වගු අංක 113: 2015 වර්ෂයේ මා.සං.අ. යේ සමස්ත මූල්‍ය කාර්ය සාධනය

කාර්යය	ප්‍රතිපාදන (රු. මිලියන)	වියදම (රු. මිලියන)	වර්ෂයේ මූල්‍ය කාර්ය සාධනය (%)
අධිවේගී මාර්ග සංවර්ධනය	49,906.42	45,236.75	90.64
මහාමාර්ග සංවර්ධනය	84,300.46	76,475.37	90.72
මාර්ග පුළුල් කිරීම හා වැඩි දියුණු කිරීම	19,923.64	17,270.03	86.68
පාලම් හා ඉවන් පාලම් ඉදිකිරීම	11,181.27	8,669.19	77.53
ස්වාභාවික ආපදා බලපෑමට ලක් වූ මාර්ග පුනරුත්ථාපනය	451.87	398.15	88.11
ආයතනමය සහාය	25,450.53	25,324.12	99.50
එකතුව	**191,214.20**	**173,373.62**	**90.67**

සටහන් අංක 25: මාර්ග සංවර්ධන අධිකාරියේ සමස්ත මූල්‍ය කාර්ය සාධනය



7 වන පරිච්ඡේදය

පරමාර්ථ හා අරමුණු සාධනය

2015 වර්ෂය තුල මා.සං.අ. ඉටුකල සැලකිය යුතු සාධනයන් පිළිබඳ විස්තර පහත සඳහන් පරිදි පෙන්විය හැකිය.

වගු අංක 114: 2015 වර්ෂය තුල පරමාර්ථ හා අරමුණු සාධනය

පරමාර්ථ හා අරමුණු	සාධනයන්
ප්‍රමාණවත් ජාතික මහාමාර්ග ජාලයක් සාධනය කිරීම	මාර්ග කි.මී. *272.09* ක වැලි මුද්‍රිත තාර ආලේප කරන ලදි.
	ඒ හා බි පංති මාර්ග කි.මී. 12,210 හදිසි නඩත්තු වැඩ, අධිවේගී මාර්ග කි.මී. 169.85 හා පාලම් 4,456 වැඩ ඉටු කරන ලදි.
ජාතික මහාමාර්ග ජාලයේ පිළිගත හැකි මට්ටමේ සංචලතාවය සාධනය කිරීම	දුබල පාලම් 83 ක වැඩ දේශීය අරමුදල් වලින් නිම කරන ලදි.
	එ.රා. වානේ පාලම් ව්‍යාපෘතිය II අදියර මගින් නව වානේ පාලම් 28 ක් ඉදි කරන ලදි. ප්‍රංශ පාලම් ව්‍යාපෘතිය යටතේ පාලම් 12 ක් නිම කෙරිණි. වෙනත් පාලම් යටතේ තවත් පාලම් ගණනක් නිම කෙරිණි.
	දේශීය අරමුදල් වලින් පුළුල් කිරීමේ හා වැඩි දියුණු කිරීමේ ව්‍යාපෘති 116 ක් නිම කළ අතර ව්‍යාපෘති 342 ක්‍රියාත්මක වෙමින් පවතී.
	මාර්ග කි.මී. 1,001.17 ක් නිම කළ අතර කි.මී. 616.53 ක පුනරුත්ථාපනය ක්‍රියාත්මක කෙරෙමින් පවතී.
1364	කාර්ය මණ්ඩල ණය - ප්‍ර/කා	1,169,803.33	1,968,446.72
1365	පාරිභෝගික ද්‍රව්‍ය තොග හිඟය	3,446,727.89	3,446,727.89
		335,062,170.06	360,111,450.28

සටහන් 07 ස්කන්ධ ආයෝජන (සිරිවැයට):

11B1	නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථාව (සටහන් 07 .1)	8,052,000.00	7,932,000.00
12003	මඟනැඟුම් ඉමල්ෂන් නිෂ්පාදන (සුද්) සමාගම	1,000,000.00	1,000,000.00
12005	මඟනැඟුම් උපදේශක හා ව්‍යාපෘති කළමනාකරණ සේවා (සුද්) සමාගම	1,000,000.00	1,000,000.00
		10,052,000.00	9,932,000.00
	සටහන් 07.1		
	කොටස් ගණන	120,000.00	120,000
	කොටසක වෙළඳපල වටිනාකම් (රු.)	67.10	66.10
		8,052,000.00	7,932,000.00

සටහන් 8 වෙනත් ආයෝජන :

1344	සටහන් හා වෙනත් ආයෝජන	72,025,340.21	69,706,652.80
		72,025,340.21	69,706,652.80

		2015 (රු.)	2014 (රු.)
	පිටුව 10 ක්‍රියාත්මක කෙරෙමින් පවතින වැඩ		
11033	ක්‍රියාත්මක කෙරෙමින් පවතින වැඩ - ගොඩනැගිලි	123,736,702.79	33,080,914.36
11034	ක්‍රියාත්මක කෙරෙමින් පවතින වැඩ - අධිවෙගී මාර්ග	297,016,765.81	182,265,942.09
		420,753,468.60	215,346,856.45
	සටහන් 11 ස්පෘශ්‍ය වත්කම්		
11A1	පරිගණක මෘදුකාංග - පිරිවැය	3,409,846.41	3,409,846.41
11A2	පරිගණක මෘදුකාංග - ක්‍රමක්ෂය	2,562,236.24	2,221,251.60
		847,610.17	1,188,594.81
	සටහන් 12 දේශීය බැංකු අරමුදල් ව්‍යාපෘතිවල කල් දැමූ වියදම		
184A	කොමර්ෂල් බැංකුව	4,864,471,072.51	3,532,169,948.83
184B	මහජන බැංකුව	12,262,894,106.85	13,036,903,710.63
184C	ලංකා බැංකුව	28,966,331,270.63	23,387,308,308.57
184D	ජාතික ඉතිරි කිරීමේ බැංකුව	30,389,995,592.85	16,535,764,689.93
184E	හැටන් නැෂනල් බැංකුව	19,688,927,479.49	10,350,365,764.57
184F	ලංකා බැංකු සංවර්ධන මූල්‍යය සංස්ථාව	1,986,680,847.04	1,734,604,898.78
184G	ජාතික සංවර්ධන බැංකුව	5,844,696,736.89	3,444,922,134.20
		104,003,997,106.26	72,022,039,455.51
	සටහන් 13 වෙනත් ව්‍යාපෘතිවල කල් දැමූ වියදම		
181	කල්දැමූ වියදම් - අමාත්‍යාංශය	784,003,789.26	784,003,789.26
182	කල්දැමූ වියදම් - භාර අරමුදල	1,956,723,549.64	1,961,574,985.64
183	කල්දැමූ වියදම් - මාර්ග පුළුල් කිරීම් හා වැඩි දියුණු කිරීම	5,349,045,956.75	10,749,045,956.76
		8,089,773,295.65	13,494,624,731.66
	සටහන් 14 සේවා දායක හා වෙනත් තැන්පතු		
221CD	සේවා දායක තැන්පතු	900,582,969.46	853,629,596.71
221SD	ආරක්ෂණ තැන්පතු	2,278,159.31	2,303,159.31
221RD	ආපසු ගෙවන තැන්පතු	294,198,341.63	259,532,641.49
221DDF	තැන්පතු - බෙස්ලයින් මාර්ගයේ අවතැන්වූ පවුල්	5,041,360.00	4,711,360.00
221DLD	තැන්පතු - ඇවර කිරීමේ හානි	863,015,641.34	749,583,003.44
221PSD	කාර්ය සාධන ආරක්ෂණ තැන්පතු	666,233.78	804,233.78
		2,065,782,705.52	1,870,563,994.73
	සටහන් 15 ගෙවිය යුතු රදවාගත් මුදල්		
221 RM	රදවාගත් මුදල්	8,190,000,895.82	8,466,000,903.54
		8,190,000,895.82	8,466,000,903.54
	සටහන් 16 කොන්ත්‍රාත්කරුවන්ට ගෙවීම		
2221	ව්‍යාපෘති කොන්ත්‍රාත්කරුවන් - මා.පු.හා වැ. සහ වෙනත්	1,378,298,407.85	3,725,056,363.77
2222	වෙනත් කොන්ත්‍රාත්කරුවෝ	723,402,822.64	1,200,959,916.67
		2,101,701,230.49	4,926,016,280.44
	සටහන 16 A පොළී හා ප්‍රාග්ධන ප්‍රති ගෙවුම් දේශීය බැංකු ණය		
2221	පොළී හා ප්‍රාග්ධන ප්‍රති ගෙවුම් දේශීය බැංකු ණය	7,805,578,422.59	5,376,971,211.07
		7,805,578,422.59	5,376,971,211.07
	සටහන් 17 ජංගම ගිණුම් මගනැගුම් ඉමල්ෂන් නිෂ්පාදන (සුද්ද) සමාගම		
	මගනැගුම් ඉමල්ෂන් සමාගමෙන් ලැබීම්		
14106	යන්ත්‍රාගාර හා යන්ත්‍ර කුලී	970,185.33	14,683,885.80
220A1022	ඉමල්ෂන් තාර සැපයීම් සඳහා වැඩ ආරම්භක අත්තිකාරම්	-	43,043,600.08
220A1032	ඉමල්ෂන් තාර සැපයීම් සඳහා වැඩ ආරම්භක අත්තිකාරම් - ව්‍යාපෘති	-	27,117,617.26
		970,185.33	84,845,103.14

		2015 (රු.)	2014 (රු.)
	මගනැගුම ඉමල්ෂන් සමාගමට ගෙවීම		
220A1022	කාර සැපයුම් සඳහා ගෙවීම	13,694,984.16	17,027,778.01
		13,694,984.16	17,027,778.01
	මගනැගුම ඉමල්ෂන් සමාගමට ගෙවීම	12,724,798.83	(67,817,325.13)

සටහන් 18 ජංගම ගිණුම - මගනැගුම උපදේශක හා ව්‍යාපෘති කළමනාකරණ සුද්. සමාගම

	මගනැගුම් උපදේශක හා ව්‍යාපෘති කළමනාකරණ පද්. සමාගමෙන් ලැබීම්		
14306	කුලී යන්ත්‍රාගාර හා යන්ත්‍ර	519,988.15	1,261,759.10
		519,988.15	1,261,759.10
	මගනැගුම් උපදේශක හා ව්‍යාපෘති කළමනාකරණ සමාගමට ගෙවීම්		
220A3012	වැඩ බිල්පත්	10,923,082.64	11,542,517.11
220A3022	ශීත පෙරමුසු සැපයුම් සඳහා ගෙවීම	35,484,800.57	169,229,764.04
220A3032	ශීත පෙරමුසු සැපයුම් සඳහා ගෙවීම (ව්‍යාපෘති)	-	1,609,392.58
		46,407,883.21	182,381,673.73
	මගනැගුම උපදේශක හා ව්‍යාපෘති කළමනාකරණ සමාගමට ශුද්ධ ගෙවීම	45,887,895.06	181,119,914.63

සටහන් 19 උපචිත වියදම්

223301	දේශීය ආදායම් කොමසාරිස් ජනරාල් ආදායම් බද්ද	504,544,759.14	437,136,072.05
223302	දේශීය ආදායම් කොමසාරිස් ජනරාල් වැට් බද්ද	61,523,988.00	34,052,773.29
223303	දේශීය ආදායම් කොමසාර්ස් ජනරාල් ආ.සේ.බ.	-	17,956,729.00
223304	දේශීය ආදායම් කොමසාර්ස් ජනරාල් - ආදායක	3,398,813.69	7,119,796.50
223307	කල්දැමූ නිමැවුම් බද්ද	39,270,795.12	64,453,562.93
2233510	දේශීය ආදායම් කොමසාර්ස් ජනරාල් - මුද්දර ගාස්තු	468,675.00	592,695.00
2233511	දේශීය ආදායම් කොමසාර්ස් ජනරාල් කොං.ක.වි.බ.	214,833.61	19,475,141.38
2233512	දේශීය ආදායම් කොමසාර්ස් ජනරාල් - ජා.ගො.බ.	14,558,473.00	12,473,649.00
2231	පරිපාලක පොදු කාර්ය සිරිවැය	84,779,632.26	63,438,879.80
2234	සේවක අර්ථසාධක අරමුදල් 8%	67,588,580.13	59,194,100.91
2235	සේවක අර්ථසාධක අරමුදල් 12%	102,802,243.26	90,242,954.78
2236	සේවක භාරකාර අරමුදල 3%	25,562,443.50	22,281,395.24
22371	නොගෙවූ වැටුප්	-	23,886.64
22374	දිරි දීමනා	4,000,000.00	52,812,634.40
22375	වෛද්‍ය නිවාඩු දීමනා ගෙවීම	270,542,319.63	229,821,925.24
22410	විගණන ගාස්තු	6,850,849.00	4,898,627.00
		1,186,106,405.34	1,115,974,823.16

සටහන් 20 ණයකම්මෙයෝ හා වෙනත් දෑ

223201/02	ද්‍රව්‍ය සැපයුම් සඳහා ණයකම්මෙයෝ	150,095,721.21	518,254,026.98
223203A	ඇස්පල්ට් යන්ත්‍රාගාරයට වෙනත් සැපයුම් සඳහා ණයකම්මෙයෝ	69,671,564.41	49,593,275.01
223204	අන්තර් බැදුම් ද්‍රව්‍ය සැපයීම් සඳහා ණයකම්මෙයෝ	-	209,208.31
22401	කාර්ය මණ්ඩලයෙන් වෙනත් විවිධ අයකිරීම්	7,414,475.37	14,488,314.97
22403	වැටුප් පාලක ගිණුම්	79,014.28	148,140.00
2240702	කුලී මත ලැබුණු අක්තිකාරම්	5,007,666.99	6,619,315.28
2240704	වෙනත් ණයකම්මෙයෝ - ව්‍යාපෘති	-	23,653,110.24
2240705	වෙනත් ණයකම්මෙයෝ - ල.බ.නී.සං.	-	46,456,013.28
2240707	අවිනිශ්චිත මා.න.කොං. කැන්පතු පොලී	7,037,391.03	7,038,516.03
2240708	සුභසාධක අරමුදල් සඳහා සේවකයන්ගෙන් අත්තිකාරම්	1,521,036.59	1,521,036.59
22408	වෙනත් ගෙවිය යුතු මුදල්	5,190,359.74	1,947,918.37
22412	ස්වයං වෛද්‍ය රක්ෂණ යෝජනා ක්‍රමය	103,601,191.57	85,660,353.47
22413	සෘජු කම්කරු වැඩ සඳහා ණයකම්මෙයෝ	2,974,465.86	3,863,416.54
22418	සැපයුම්කරු පාලක ගිණුම	2,177,767.77	529,559.60
22421	අන්තර් බැදුම් කොන්ත්‍රාට් කුට්ටි පාලන ණයකම්මෙයෝ	2,047,743.88	2,047,743.88

		2015 (රු.)	2014 (රු.)
2240709	කල්බදු ඉඩම්වල අවිනිශ්චිත පොලිය	(411,216,759.00)	(415,928,613.00)
2240901	කල්බදු ගෙවීම් ඉඩම්	466,561,476.00	466,561,476.00
22422	ඉවත්කරන ලද වාහන සඳහා ගෙවිය යුතු මුදල	-	3,672,799.64
133071	පොදු කාර්ය පිරිවැය පාලන - වි.වි.ආ.ව්‍යා.	-	9,727.28
133071	පොදු කාර්ය පිරිවැය පාලන - ද.ප්‍ර.සං.ව්‍යා.	20,454.55	235,580.03
133071	පොදු කාර්ය පිරිවැය පාලන - වී.සං.බැ.	1,841,034.12	
		414,024,604.37	816,580,918.50

සටහන් 21.1 පුළුල් කිරීම හා වැඩි දියුණු කිරීම් සඳහා දේශීය බැංකු ණය - ජංගම වගකීම්

221U01	කොමර්ෂල් බැංකුව	413,988,288.39	360,836,000.00
221U02	ලංකා බැංකුව	2,143,273,115.17	1,792,666,000.00
221U03	මහජන බැංකුව	1,349,557,354.42	1,215,489,270.70
221U04	ජාතික ඉතිරි කිරීමේ බැංකුව	2,652,054,988.67	392,772,500.00
221U05	හැටන් නැෂනල් බැංකුව	929,211,398.81	306,043,000.00
221U06	ලංකා බැංකු සංවර්ධන මූල්‍ය සංස්ථාව	68,227,055.12	79,428,000.00
221U07	ජාතික සංවර්ධන බැංකුව	249,266,222.01	-
		7,805,578,422.59	4,147,234,770.70

සටහන් 21.2 පුළුල් කිරීමේ හා වැඩි දියුණු කිරීමේ ව්‍යාපෘති සඳහා දේශීය බැංකු ණය - ජංගම නොවන වගකීම්

221U01	කොමර්ෂල් බැංකුව	5,141,452,441.37	4,058,802,090.68
221U02	ලංකා බැංකුව	26,518,949,406.80	21,732,592,779.48
221U03	මහජන බැංකුව	10,792,239,248.72	11,584,099,450.56
221U04	ජාතික ඉතිරි කිරීමේ බැංකුව	51,354,413,501.36	48,876,190,575.25
221U05	හැටන් නැෂනල් බැංකුව	18,476,089,341.88	11,870,192,085.28
221U06	ලංකා බැංකු සංවර්ධන මූල්‍ය සංස්ථාව	1,096,331,899.65	821,073,426.65
221U07	ජාතික සංවර්ධන බැංකුව	5,733,454,766.88	4,214,128,839.99
		119,112,930,606.66	103,157,079,247.89
		126,918,509,029.25	107,304,314,018.59

		2015 (රු.)	2014 (රු.)
	සටහන් 22 නඩත්තු වැඩ සඳහා ලැබුණු වෙන් කල අරමුදල්		
4012	අමාත්‍යාංශ අරමුදල	1,426,200,677.64	1,319,422,812.70
4013	භාරකාර අරමුදල	3,638,600,000.00	3,725,430,000.00
4013A	සම මූල්‍ය අරමුදල	1,153,383,508.04	850,140,263.00
4014	මාර්ග පු. හා වැ. අරමුදල	11,870,000,000.00	14,554,427,184.40
4014	මා.පු.හා වැ. අරමුදල - ජා.ඉ.බැ. කල්ගතවූ	5,400,000,000.00	-
		23,488,184,185.68	20,449,420,260.10
	සටහන් 22.1 ජජසනි. ව්‍යාපෘතිය සඳහා ලැබුණු අරමුදල්		
4015/A	ජජසනි විදේශ හා දේශීය	-	983,220,944.06
		-	983,220,944.06
	සටහන් 23 ලැබුණු වෙන්කල අරමුදල් - දේශීය බැංකු ප්‍රාග්ධනය හා පොලි ගෙවීම		
4014B	දේශීය බැංකු අරමුදල් පොලි සඳහා ලැබුණු අරමුදල්	9,562,032,585.96	2,779,308,764.97
4014C	දේශීය බැංකු ප්‍රාග්ධන ප්‍රති ගෙවීම් සඳහා ලැබුණු අරමුදල්	2,469,379,603.66	953,348,841.03
		12,031,412,189.62	3,732,657,606.00
	සටහන් 24 සේවා දායක වැඩ		
412	ඉටුකරන ලද වැඩවල වටිනාකම - සේවාදායකයෝ	482,901,754.05	1,737,971,795.46
62	සංවර්ධන වියදම් - සේවා දායක	425,184,663.76	1,561,486,434.33
	සේවාදායක වැඩ වලින් අතිරික්තය	57,717,090.29	176,485,361.13
	සටහන් 25 අධිවේගී මාර්ග වලින් ආදායම		
	සටහන් 25.1 දක්ෂිණ අධිවේගී මාර්ගයේ ආදායම		
4901	භාවිත ගාස්තු	2,196,476,965.69	1,639,546,413.38
4902	මාර්ග හානි අධිවේගී මාර්ග	46,857,932.08	33,355,890.59
4903	ඇදගෙන යාමේ ආදායම	8,513,513.43	6,734,374.94
		2,251,848,411.20	1,679,636,678.91
614131	වියදම්	428,623,298.96	339,459,803.25
		1,823,225,112.24	1,340,176,875.66
	සටහන් 25.2 කොළඹ - කටුනායක මාර්ගයේ ආදායම		
4901B	භාවිත ගාස්තු	1,893,472,654.07	1,684,760,294.58
4901B1	භාවිත ගාස්තු - ඉ.ගා.කා.	61,057,972.98	-
4902B	මාර්ග හානි අධිවේගී මාර්ග	5,229,014.47	6,373,370.56
4903B	ඇදගෙන යාමේ ආදායම	1,747,747.45	2,171,875.10
4904B	ඉ.ගා.කා. ආදායම	66,666.65	-
		1,961,574,055.62	1,693,305,540.24
614131B	වියදම්	205,850,998.30	158,507,421.58
		1,755,723,057.32	1,534,798,118.66
	සටහන් 25.3 පිටත වටරවුම මාර්ගයේ ආදායම		
4901	භාවිත ගාස්තු	615,730,303.68	282,756,000.09
4902	මාර්ග හානි අධිවේගී මාර්ග	1,925,335.13	835,519.65
4903	ඇදගෙන යාමේ ආදායම	477,477.13	165,178.50
		618,133,115.94	283,756,698.24
61413A	වියදම්	24,478,913.74	2,288,767.50
		593,654,202.20	281,467,930.74
	අධිවේගී මාර්ගවලින් ශුද්ධ ආදායම	4,172,602,371.76	3,156,442,925.06
	සටහන් 26 සේවා සඳහා ගාස්තු		
4301	පස් පර්යේෂණ සඳහා ගාස්තු	77,560,234.72	122,463,174.74
4302	උපදේශක ගාස්තු	116,955.39	-
4303	අධීක්ෂණ සඳහා ගාස්තු	59,126,283.62	62,422,777.14
4305	මාර්ග ප්‍රතිස්ථාපන ගාස්තු	42,290,404.68	19,674.79
4308	සැලසුම් ගාස්තු	-	4,268,016.12
		179,093,878.41	189,173,642.79
	සටහන් 26.1		
4301	පස් පර්යේෂණ සඳහා ගාස්තු	77,560,234.72	122,485,630.74
5119	පරීක්ෂණ වියදම්	-	(22,456.00)
		77,560,234.72	122,463,174.74

		2015 (රු.)	2014 (රු.)
	සටහන් 26.2		
4303	අධීක්ෂණ ගාස්තු	73,471,087.52	140,682,547.68
5119A	අධීක්ෂණ වියදම්	-	(31,943,196.67)
6912	අධීක්ෂණය සඳහා පොදු කාර්ය වියදම්	(14,335,563.64)	(46,314,737.87)
6912A	අධීක්ෂණ වියදම් හා අනුමත නොකල වියදම් බද්ද	(9,240.26)	(1,836.00)
		59,126,283.62	62,422,777.14
	සටහන් 26.3		
4308	සැලසුම් ගාස්තු	-	4,288,016.12
5118	සැලසුම් ගාස්තු වියදම්	-	(20,000.00)
		-	4,268,016.12
	සටහන් 26.4		
4305	මාර්ග ප්‍රතිස්ථාපන ගාස්තු	64,357,428.77	61,654,313.08
6922	රු 100,000 අඩු සේවා දායක පොදු කාර්ය පිරිවැය	(22,039,693.91)	(61,619,481.68)
6922A	රු.100,000 අඩු අනුමත නොකරන ලද සේවා දායක පොදු කාර්ය පිරිවැය බද්ද	(27,330.18)	(15,156.61)
		42,290,404.68	19,674.79
	සටහන් 27 කුලී ගාස්තු හා බදු		
45011	යන්ත්‍රාගාර හා යන්ත්‍ර කුලී	33,002,028.79	61,706,817.77
45013	වෙනත් කුලී	899,593.20	8,394,768.17
4503	ප්‍රවාරණ පුවරු කුලී චාරික	47,421,051.61	40,548,150.29
4504	නිල නිවාස කුලී	10,288,410.50	8,846,440.89
4505	සංචාරක නිවාස	1,710,845.89	1,572,744.47
4506	කල්බදු ඉඩම්	2,490,977.19	1,926,105.23
4509	ලොතරැයි කුට්ටි ගාස්තු	255,256.33	317,436.43
4510	කල්බදු කුලී - මාර්ග තොරන්	29,918,792.50	37,413,265.31
4512	රූපවාහිනී රැහැන් ජාල කුලී	146,129,119.03	138,292,738.99
4513	දුරකථන කුට්ටි කුලී	-	971,412.61
4514	උමං මාර්ග කුලී	3,289,875.49	2,206,321.92
4515	ධජ ගාස්තු	2,020,210.89	1,816,110.02
		277,426,161.42	304,012,312.10
	සටහන් 28 පොලිය		
44012	තාවකාලික අතිරික්ත මුදල් මත පොලිය	214,499,845.01	100,433,831.58
44014	වෙනත් පොලි	2,371,810.82	2,200,538.72
4402	කාර්ය මණ්ඩල ණය පොලි	14,303,290.82	13,937,605.40
		231,174,946.65	116,571,975.70
	සටහන් 29 පොදු කාර්ය පිරිවැය අයකර ගැනීම		
421	පොදු කාර්ය පිරිවැය අය කිරීම් වි.ආ. ව්‍යාපෘති	33,104,700.18	33,305,353.56
		33,104,700.18	33,305,353.56
	සටහන් 30 වෑක්කු අංගනයේ ආදායම		
4A	විකුණුම්	2,389,901.82	9,950,812.64
	අඩුකලා		
70	විකුණුම් පිරිවැය	(1,986,442.87)	(8,292,343.86)
		403,458.95	1,658,468.78
	සටහන් 31 අන්තර් බැඳුම් කොන්ක්‍රීට් කුට්ටි වලින් ආදායම		
4D	විකුණුම්	799,810.73	1,263,496.89
	අඩුකලා		
72D	විකුණුම් පිරිවැය	(666,508.94)	(1,052,914.07)
		133,301.79	210,582.82
	සටහන් 32 වෙනත් ආදායම		
4801	ලේඛන විකුණුම්	1,529,090.61	1,780,691.83
4802	ගර්භිත භාණ්ඩ විකුණුම්	2,949,819.64	160,210.75
4803	ආපසු නොගෙවිය හැකි ටෙන්ඩර් තැන්පතුව	3,685,254.73	8,957,068.73
4806	හානි සඳහා අයකර ගැනීම්	14,618,795.65	9,995,595.34
4808	වත්කම් ඉවත් කිරීමෙන් ලාභය (**සටහන් 32 A)**	13,453,510.21	17,249,530.23
4810	අධිභාර හා දඩ	846,830.50	836,502.44
4811	භිස් කාර බැරල් විකිණීම්	16,724.47	311,131.96
4812	විවිධ ආදායම්	607,805.38	974,274.11

		2015 (රු.)	2014 (රු.)
4813	ආවර කරන ලද භානි	22,023,350.68	129,814.58
4814	ආපසු ලියන ලද තැන්පතු	572,219.03	-
4816	ආපසු ලියන ලද ණය හිමියෝ	-	114,284,932.92
4818	ගොඩනැගිලි සීමාව සඳහා බලපත්‍ර ගාස්තු	4,684,398.93	3,756,365.42
4820	කාර්ය සාධන බැඳුම්කරය අයකර ගැනීම	253,488.68	343,157.08
4821	මා.සං.න. සේවා දායකයන් සඳහා පොදු කාර්ය වියදම් අයකර ගැනීම (සටහන් 32 බී)	28,736,378.45	(18,743,136.68)
		93,977,666.96	140,036,138.71
	සටහන් 32 ඒ වත්කම් ඉවත් කිරීමෙන් ලාභය		
	අලෙවියෙන් ලද මුදල	13,469,447.35	17,262,331.21
	ලිඛිත අගය	(15,937.14)	(12,800.98)
		13,453,510.21	17,249,530.23
	සටහන් 32 බී මාසංන සේවා දායකයින් සඳහා පොදු කාර්ය වියදම් අයකර ගැනීම		
4821	මාසංන සේවා දායකයින් සඳහා පොදු කාර්ය වියදම් අයකර ගැනීම	45,415,371.88	15,471,693.37
	අඩුකලා		
6932	සේවාදායක පොදු කාර්ය වැය - මගනැගුම ප්‍රාදේශීය කාර්යාලය	(16,654,315.60)	(34,165,160.76)
6932A	අනුමත නොකල සේවා දායක පොදු කාර්ය වැය ප්‍රාදේශීය කාර්යාලය	(24,677.83)	(49,669.29)
		28,736,378.45	(18,743,136.68)
	සටහන් 33 කල්දැමූ ආදායම් මාරුකලා		
4021	කල්දැමූ ආදායම් මාරුකලා දේශීය ආදායම්	64,962,561.37	47,339,561.54
4021A	කල්දැමූ ආදායම් මාරුකලා ප්‍රාග්ධන ප්‍රදාන	-	6,923,041.57
4022	කල්දැමූ ආදායම් මාරුකලා ව්‍යාපෘති	6,039,630,463.52	5,509,996,530.59
4024	කල්දැමූ ආදායම් මාරුකලා දේශීය ආයතන	27,290,000.00	26,707,708.33
4025	කල්දැමූ ආදායම් මාරුකලා අන්තර් බැඳුම්	257,997.47	1,604,262.39
4026	කල්දැමූ ආදායම් මාරුකලා අභ්‍යන්තර අරමුදල්	7,368,327.68	6,701,688.35
		6,139,509,350.04	5,599,272,792.77
	සටහන් 34 සංවර්ධන හා නඩත්තු වියදම්		
61	සංවර්ධන වියදම් අමාත්‍යාංශය	2,238,961,039.27	6,521,252,522.59
65	සංවර්ධන වියදම් භාරය	2,800,566,923.36	3,232,262,538.61
63	සංවර්ධන වියදම් මාර්ග වැඩි දියුණු කිරීම හා පුළුල් කිරීම	10,181,958,411.20	11,172,705,633.98
63	සංවර්ධන වියදම් මා.පු. හා වැ. - ජා.ඉ.බැ. - හිඟ	5,400,000,000.00	-
637	සංවර්ධන වියදම් මාල දිවයින් ව්‍යාපෘතිය	-	208,181,068.02
654	සංවර්ධන වියදම් සම මූල්‍ය අරමුදල	1,121,964,652.50	1,619,122,973.05
		21,743,451,026.33	22,753,524,736.25
	සටහන් 34.1 සංවර්ධන හා නඩත්තු වියදම් - ජජාසනි		
634	සංවර්ධන හා නඩත්තු වියදම් - ජජාසනි ව්‍යාපෘතිය	-	1,117,336,054.79
		-	1,117,336,054.79
	සටහන් 35 පුද්ගලික වේතන		
5101 හා 81	වැටුප් හා වේතන	5,887,029,298.17	5,001,860,175.55
5102 හා 82,83	සේ.අ.අ. හා සේ.හා.අ.	907,903,701.30	788,142,900.37
51023 හා 85	පාරිතෝෂික දීමනා	376,004,711.61	591,576,468.04
51025	වන්දි	2,948,245.33	406,768.48
51032 හා 84	අතිකාල හා නිවාඩු දින දීමනා	201,627,587.61	329,499,788.09
5104හා5,86හා7	දිරි දීමනා හා වෛද්‍ය නිවාඩු දීමනා	401,321,122.40	263,634,268.84
		7,776,834,666.42	6,975,120,369.38
	සටහන් 35ඒ සෘජු කම්කරු සේවයේ පුද්ගලික වේතන විස්තර		
81	වැටුප් හා වේතන	2,121,563,075.92	1,883,987,346.39
82 හා 83	සේ.අ.අ. හා සේ.හා.අ.	314,649,939.65	296,195,134.21
84	අතිකාල දීමනා	68,368,915.15	102,017,362.39
85	පාරිතෝෂික දීමනා	202,900,640.16	232,188,669.74
86 හා 87	ප්‍රසාද දීමනා	74,406,139.37	55,633,889.37
		2,781,888,710.25	2,570,022,402.10
	සටහන් 36 සැපයුම් හා භාවිතා කළ පාරිභෝගික භාණ්ඩ		
512	ලිපිද්‍රව්‍ය හා කාර්යාල අවශ්‍යතා	50,894,104.76	68,101,204.06
		50,894,104.76	68,101,204.06

		2015 (රු.)	2014 (රු.)
	සටහන් 37 වෙනත් පරිපාලන වියදම්		
51052	වෛද්‍ය රක්ෂණය	8,414,088.05	12,211,617.51
5106	ගමන් හා ප්‍රවාහන	108,903,426.64	134,687,734.87
5107	මානව සම්පත් සංවර්ධනය	7,435,681.75	19,047,165.56
511	ගාස්තු හා වෙනත් දීමනා	6,288,971.93	18,580,510.14
515	සන්නිවේදනය	29,269,968.18	30,687,690.53
516	කුලී අනුපාත හා බදු	124,364,361.93	139,371,076.69
51701	ප්‍රයෝජ්‍ය හා වෙනත්	82,423,435.70	106,571,002.70
513	ඉන්ධන හා ලිහිසි ද්‍රව්‍ය	82,673,444.15	118,101,392.49
514	රක්ෂණ හා වාහන බලපත්‍ර	25,017,402.41	17,342,420.16
5185	මගී වාහන අළුත්වැඩියාව හා නඩත්තුව	75,682,729.68	91,013,825.21
5181-88	වෙනත් අළුත්වැඩියා හා නඩත්තු	22,944,975.28	36,702,609.57
519	විගණන ගාස්තු	1,758,759.00	703,111.76
521	බැංකු ගාස්තු	2,785,156.41	2,674,477.26
5232	අනුමත නොකල වැට බදු	23,911,668.66	134,589,899.94
5235	මුද්දර ගාස්තු	-	22,650.00
5237	කපා හරින ලද ආ.සේ.බ.	-	25,672,268.00
5238	ජාතිය ගොඩ නැඟීමේ බද්ද	108,606,240.00	88,491,327.00
5266	සම්පත් මෙහෙයවීමේ අත්තිකාරම්	13,035,890.85	-
5241	උත්සව ගාස්තු	-	788,644.43
5268	කපා හරින ලද අබලි අයිතම	-	1,900.00
5272	අධිභාර හා දඩ	980.64	183,851.20
		723,517,181.26	977,445,175.02
	සටහන් 38 ක්ෂය කිරීම් හා ක්‍රම ක්ෂය වියදම්		
53	ක්ෂය කිරීම්	768,497,618.93	629,894,352.83
54	ක්‍රම ක්ෂය කිරීම්	5,626,435,561.71	5,088,337,640.76
		6,394,933,180.64	5,718,231,993.59
	සටහන 39 මූල්‍ය පිරිවැය		
5224	කල්බදු ඉඩම් හා පොලිය	4,711,854.00	4,392,909.00
638	දේශීය බැංකු ණය හා පොලිය	10,949,410,363.24	6,777,644,775.99
		10,954,122,217.24	6,782,037,684.99
	සටහන 40 ආදායම් බදු වියදම්		
55	ආදායම් බදු හා S R L සටහන් (40 ඒ)	838,524,893.00	601,094,090.00
		838,524,893.00	601,094,090.00
	සටහන් 40 A		
	වර්තමාන බදු වියදම්	838,529,078.00	639,180,200.00
	අඩුකලා		
	2014/2015 වර්ෂවල අධි ප්‍රතිපාදන වෙනස් කිරීම්	(4,185.00)	(43,313,824.00)
	එකතු කලා		
	2013/2014 වර්ෂවල ඌණ ප්‍රතිපාදන වෙනස් කිරීම්	-	5,227,714.00
		838,524,893.00	601,094,090.00
	2015/2016 වර්ෂ සඳහා වර්තමාන බදු වගකීම්	838,529,078.00	639,180,200.00
	අඩුකලා		
	ගෙවන ලද ස්වයං තක්සේරු බද්ද	(466,218,580.34)	(170,320,195.00)
	බදු ණය ගිලවා කිරීම්		
	ජාතික බදු ණය	(21,449,984.50)	(73,202,065.00)
	ආර්ථික සේවා ගාස්තු	-	(69,039,403.00)
	පවත්නා වර්ෂයේ පොලී මත රඳවා ගැනීමේ බද්ද	(53,123.41)	(27,087.00)
	පෙර වර්ෂවල පොලිය මත රඳවා ගැනීමේ බද්ද නිසා කළ යුතු ප්‍රතිපූරණයන්	-	(2,475,571.00)
	2015/2016 ,2014/15 වර්ෂ සඳහා ගෙවිය යුතු බදු ශේෂය	350,807,389.75	324,115,879.00
	සටහන් 41 සමුච්චිත (හිඟය)		
3522	සමුච්චිත (හිඟය) ඉදිරියට ගෙන ගියා	(13,576,083,596.76)	(8,012,311,811.23)
		(13,576,083,596.76)	(8,012,311,811.23)

මාර්ග සංවර්ධන අධිකාරිය

තක්සේරු වර්ෂය 2015/2016

ව්‍යාපාරික වගකීම් ආදායමෙන් ඇලපුම් ලාභය ගණනය කිරීම

රු.

සේවා දායක වැඩවල ආදායම		
ඉටුකරන ලද වැඩවල අගය	482,901,754	
අඩුකලා - ඍජු වියදම්	(425,184,664)	
සේවා දායක වැඩවලින් දළ ලාභය		57,717,090
සේවා ගාස්තු වලින් දළ ලාභය		179,093,878
කුලී ආදායම් හා බදු		277,426,162
පොදු කාර්ය පිරිවැය අයකර ගැනීම්		33,104,700
වාත්තු අංගනයේ අතිරික්තය		403,459
අන්තර් බැදුම් කොන්ක්‍රීට් කුට්ටි වලින් ආදායම		133,302
වෙනත් ආදායම්	93,977,667	
අඩුකලා		
ණය භිමියන් ආපසු ලියන ලද බදු රහිත කටයුතු	(572,219)	
පොදු කාර්ය පිරිවැය අය කිරීම් සේවා දායක RDM බදු රහිත කටයුතු	(28,736,378)	
ඉවත් කළ වත්කම් ලාභය බදු රහිත කටයුතු සඳහා යෙදුවා	(13,453,510)	
		51,215,560
අධිවේගී මාර්ග ආදායම		
ද.ප්‍ර.සං.ව්‍යා.	2,251,848,411	
කොා.කා.අ.	1,961,574,056	
පි.ව.මා.	618,133,116	
	4,831,555,583	
අඩුකලා - ඍජු වියදම්		
වියදම්	(658,953,211)	
භාණ්ඩාගාර ඉක්මවූ ව්‍යා.කා.ඒ. පොදු කාර්යවියදම්	(233,460,128)	
		3,939,142,243
සමස්ත ව්‍යාපාර වගකීම් ආදායම		4,538,236,394
අඩුකලා - ජා.ඔගා.බ.		(108,606,240)
බදු සඳහා වගකීම් සහිත ව්‍යාපාර ආදායම		4,429,630,154
ක්ෂය කිරීම් දීමනාව		(20,521,280)
ව්‍යාපාර ආදායම් වගකීම් ආදායමෙන් ව්‍යාපාර ලාභය ගලපන ලදි.		**4,409,108,874**

විගණකාධිපති දෙපාර්තමේන්තුව

கணக்காய்வாளர் தலைமை அதிபதி திணைக்களம்

AUDITOR GENERAL'S DEPARTMENT

FINANCE DIVISION
01 AUG 2017
Road Development Authority
"Maga Neguma Mahamedura"
Battaramulla

මගේ අංකය எனது இல. My No. RCT/B/RDA/01/15/01

මඟේ අංකය உமது இல. Your No.

දිනය திகதி Date 26 July 2017

CHAIRMAN'S OFFICE
26 JUL 2017
42
R.D.A.

DIRECTOR GENERAL OFFICE
39
31 JUL 2017
ROAD DEVELOPMENT AUTHORITY

The Chairman,

Road Development Authority

Report of the Auditor General on the Financial Statements of the Road Development Authority for the year ended 31 December 2015 in terms of Section 14(2)(c) of the Finance Act, No.38 of 1971.

Reference to my letter of even number dated 18 April 2017 on the above subject.

02. The above mentioned report is sent herewith.

W.Premananda

Additional Auditor General

For Auditor General

① D/Finance

DG
F.n.a.pl.
29/7/17

Pl. make early arrangements to include this under Annual Report 2015.
01/08/17.

Copies : 1. Secretary, - Ministry of Higher Education and Highways

2. Secretary, - Ministry of Finance and Mass Media

② cc
f. n. a. pl
08/14

අංක 306/72, පොල්දූව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව. - இல. 306/72, பொல்துவ வீதி, பத்தரமுல்லை, இலங்கை. - No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka

+94-11-2887028-34 +94-11-2887223 oaggov@sltnet.lk www.auditorgeneral.gov.lk

විගණකාධිපති දෙපාර්තමේන්තුව
கணக்காய்வாளர் தலைமை அதிபதி திணைக்களம்
AUDITOR GENERAL'S DEPARTMENT

මගේ අංකය / எனது இல. / My No. } ආර්සීටී/බී/ආර්ඩීජී/01/15/01 මබේ අංකය / உமது இல. / Your No. } දිනය / திகதி / Date } 2017 අප්‍රේල් 18 දින

සභාපති
මාර්ග සංවර්ධන අධිකාරිය

මාර්ග සංවර්ධන අධිකාරියේ 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳ 1971 අංක 38 දරන මුදල් පනතේ 14 (2) (සී) වගන්තිය ප්‍රකාර විගණකාධිපති වාර්තාව

මාර්ග සංවර්ධන අධිකාරියේ 2015 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන, 1971 අංක 38 දරන මුදල් පනතේ 13 (1) වගන්තිය හා 1981 අංක 73 දරන මාර්ග සංවර්ධන අධිකාරිය පනතේ 16 (3) වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. මුදල් පනතේ 14 (2)(සී) වගන්තිය ප්‍රකාර අධිකාරියේ වාර්ෂික වාර්තාව සමඟ ප්‍රකාශයට පත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.රා.ගි.ප්‍ර) අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

1.3 විගණකගේ වගකීම

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබාගැනීම පිණිස විගණනය සැලසුම් කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි. මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට උපකාරී වන විගණන සාක්ෂි ලබාගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්,

අංක 306/72, පොල්දූව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව, . - இல. 306/72, பொல்துவ வீதி, பத்தரமுல்லை, இலங்கை. - No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka
+94-11-2887028-34 +94-11-2887223 oaggov@sltnet.lk www.auditorgeneral.gov.lk

වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් තක්සේරු කිරීම් ඇතුළත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම්වලදී, අවස්ථානෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම්කිරීම පිණිස අධිකාරියේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන්නා වූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් අධිකාරියේ අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීම ද විගණනයට ඇතුළත් වේ. විගණනයේ විෂය පථය සහ ප්‍රමාණය තීරණය කිරීම සඳහා 1971 අංක 38 දරන මුදල් පනතේ 13 වගන්තියේ (3) සහ (4) උප වගන්තිවලින් විගණකාධිපති වෙත අභිමතානුසාරී බලතල පැවරේ.

මාගේ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.4 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

2. මූල්‍ය ප්‍රකාශන

2.1 තත්ත්වාගණනය කළ මතය

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2015 දෙසැම්බර් 31 දිනට මාර්ග සංවර්ධන අධිකාරියේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.රා.ගි.ප්‍ර) අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම්

2.2.1 ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම.

සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේ දී මාර්ග සංවර්ධන අධිකාරියට සම්පූර්ණ අයිතිය ඇති පරිපාලිත සමාගම් වන මග නැගුම කන්ස්ට්‍රක්ෂන් ඇන්ඩ් ඉක්විප්මන්ට් කම්පැනි (ප්‍රයිවට්) ලිමිටඩ්, මග නැගුම කන්සල්ටන්සි ඇන්ඩ් ප්‍රෝජෙක්ට් මැනේජ්මන්ට් සර්විස් කම්පැනි (ප්‍රයිවට්) ලිමිටඩ්, ඉමල්ෂන් ප්‍රඩක්ෂන් කම්පැනි (ප්‍රයිවට්) ලිමිටඩ් සහ එක්ස්ප්‍රස්වේ ට්‍රාන්ස්පොර්ට් කම්පැනි (ප්‍රයිවට්) ලිමිටඩ් සමාගම්වල විගණනය කරන ලද මූල්‍ය ප්‍රකාශන ලබා ගෙන නොතිබුණි.

තවද සමාලෝචිත වර්ෂය තුළ පරිපාලිත සමාගම් සමඟ රු. බිලියන 1.9 ක් වටිනාකමැති ගණුදෙනු මාර්ග සංවර්ධන අධිකාරිය විසින් සිදුකර තිබුණද, එම ගණුදෙනු පිළිබඳ නොරතුරු සහ නොගෙවූ ශේෂයන් පිළිබඳව ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම් ප්‍රමිත අනුව මූල්‍ය වාර්තාවල හෙළිදරව් කර නොතිබුණි.

2.2.2 ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති (ශ්‍රී.ලං.රා.ගි.ප්‍ර) සමඟ අනුකූල වීම.

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) ශ්‍රී.ලං.රා.ගි.ප්‍ර 1- මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම.

(i) ගණුදෙනු හා සිද්ධි ඒවා සිදුවන අවස්ථාවේදී හඳුනාගෙන ඒවාට අදාළ කාලපරිච්ඡේදයට වාර්තාකල යුතු වුවත්, සමාලෝචිත වර්ෂයේදී දේශීය බැංකු මාර්ග පුනරුත්ථාපන ව්‍යාපෘතියට අදාළ අන්තර් ගෙවීම් සහතික සඳහා කරන ලද එකතුව රු.මිලියන 104,004 ක් වූ ගෙවීම් විලම්භිත වියදම් ලෙස ගිණුම්ගත කර තිබුණි. තවද, දේශීය බැංකු මාර්ග පුනරුත්ථාපන ව්‍යාපෘතියේ කොන්ත්‍රාත්කරුවන් විසින් ඉදිරිපත් කරන ලද එහෙත් මුදල් ගෙවා නොමැති රු.මිලියන 255.42 ක් වූ අන්තර් ගෙවීම් සහතික 2015 දෙසැම්බර් 31 වන විට උපචිත පදනම මත ගිණුම්ගත කර නොතිබුණි. එම නිසා, සමාලෝචිත වර්ෂය අවසානයේ දී උපචිත වියදම් එම අගයෙන් අඩුවෙන් දක්වා තිබුණි.

(ii) වාර්තා කරන දිනෙන් පසුව මාස 12 ක් තුළදී ලැබීමක් උපලබ්ධි වෙතැයි අපේක්ෂා කරන විට හෝ වගකීමක් නිරවුල් කිරීමට නියමිත නම්, එය ජංගම වත්කම් හෝ වගකීම් ලෙස වර්ගීකරණය කළ යුතුය. ඒ අනුව, 2016 වර්ෂය තුළ කොන්ත්‍රාත්කරුවන් විසින් ඉදිරිපත් කරනු ලබන බිල්පත්වලින් අයකර

ගතයුතු වැඩ ආරම්භ කිරීමේ අත්තිකාරම් ප්‍රමාණය හඳුනාගෙන ජංගම වත්කම් ලෙස දැක්විය යුතුය. කෙසේ වුවද, වැඩ ආරම්භ කිරීමේ අත්තිකාරම් අයකර ගතයුතු කාලපරිච්ඡේදය පිළිබඳ සැළකිල්ලට නොගෙන සමාලෝචිත වර්ෂය තුළදී ප්‍රාදේශීය කාර්යාල සහ ගෙවීම් අංශයට ලබාදුන් එකතුව රු. 59,598,529 ක් වූ වැඩ ආරම්භ කිරීමේ අත්තිකාරම් ජංගම වත්කම් ලෙස සළකා තිබුණි. එමෙන්ම ඉකුත් වර්ෂවලදී එම අංශවලට ලබාදුන් එකතුව රු. 12,237,389 ක් වූ අත්තිකාරම් සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනවල ජංගම නොවන වත්කම් ලෙස දක්වා තිබුණි.

(iii) නිරවුල් කළයුතු නියමිත දින වකවානු පිළිබඳ හඳුනා ගැනීමකින් තොරව කොන්ත්‍රාත්කරුවන්ගෙන් රඳවාගත් මුදල් ජංගම සහ ජංගම නොවන වගකීම් යටතේ පිළිවෙලින් රු. 4,858,982,805 ක් හා රු. 3,331,018,091 ක් ලෙස වර්ගීකරණය කර තිබුණි.

(ආ) ශ්‍රී.ලං.රා.ගි.ප්‍ර.3 - ගිණුම් ප්‍රතිපත්ති, ගිණුම්කරණ ඇස්තමේන්තුවල වෙනස්වීම් සහ වැරදි.

දේශීය බැංකු ණය මුදල් ව්‍යාපෘතියේ මාර්ග ඉදිකිරීම් වලට අදාළව කොන්ත්‍රාත්කරුවන් වෙත ගෙවන ලද අගය විලම්බිත වියදම් ලෙස ජංගම නොවන වත්කම් යටතේ දක්වන අතර, බැංකු මඟින් ලබාගත් ණය මුදලින් වර්ෂය තුළ බැංකුව වෙත ආපසු ගෙවන අගය විලම්බිත වියදම් වලින් අඩුකර ප්‍රවර්ථන වර්ෂයේ වියදම් ලෙස ගිණුම් ගතකර තිබුණි. මෙම ගිණුම්කරණ ප්‍රතිපත්තිය සම්බන්ධයෙන් මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කර නොතිබුණි.

(ඇ) ශ්‍රී.ලං.රා.ගි.ප්‍ර 7 - දේපල, පිරියත හා උපකරණ

(i) සෑම වාර්ෂික වාර්තාකරණ දිනකදීම හෝ වත්කමක ධාරණ අගය සහ ඵලදායී ජීව කාලය සමාලෝචනය කළ යුතු වුවද, අධිකාරිය විසින් තවදුරටත් භාවිතා කරන රු. මිලියන 972 ක් පිරිවැය වූ සම්පූර්ණයෙන් ක්ෂය කරන ලද ස්ථාවර වත්කම්වල ඵලදායී ජීවකාලය සමාලෝචනය කිරීමට පියවර ගෙන නොතිබුණි.

(ii) සමාන්‍යයෙන් අධිකාරියේ ස්ථාවර වත්කම්, මිලදී ගත් දිනයේ සිට ඉවත් කරන දිනය දක්වා ක්ෂය සිදු නොකරයි. වත්කම් අත්පත් කරගත් මාසයට පසු මාසයේ සිට ක්ෂය කරන අතර වත්කම් ඉවත් කරන මුළු මාසය සඳහාම ක්ෂය

කරනු ලබන බවට නිරීක්ෂණය විය. මේ සම්බන්ධයෙන් මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කර නොතිබුණි.

2.2.3 ගිණුම්කරණ අඩුපාඩු

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) දේශීය බැංකු අරමුදල් ව්‍යාපෘතියට අදාළ මාර්ග පුනරුත්ථාපනය කරනු ලබන ව්‍යාපෘති විසින් 2013 – 2015 වර්ෂවල ප්‍රසම්පාදනය කරන ලද රු.මිලියන 507 ක් වූ ස්ථාවර වත්කම් අධිකාරියේ මූල්‍ය ප්‍රකාශන වලට ඇතුළත් කර නොතිබුණි. ඒ අනුව සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් ස්ථාවර වත්කම්වල වටිනාකම එම අගයෙන්ම අඩුවෙන් දක්වා තිබුණු අතර ඒ සඳහා ක්ෂය රුපියල් මිලියන 219.51 ක් අඩුවෙන් දක්වා තිබුණි.

(ආ) මාර්ග පුනරුත්ථාපනය සහ වැඩිදියුණු කිරීම සඳහා වූ විදේශ මූල්‍යන ව්‍යාපෘති 05 ක් විසින් ප්‍රසම්පාදනය කළ රු. 69,800,000 ක් වටිනා මෝටර් වාහනවල හිමිකාරිත්වය සමාලෝචිත වර්ෂය තුළදී අධිකාරිය වෙත පවරා තිබුණි. කෙසේ වුවද, එම මෝටර් රථවල අගය ගිණුම්වලට ගෙන නොතිබුණි.

(ඇ) (i) ස්ථාවර වත්කම් අපහරණයෙන් ලද රු.11,981,954 ක් වූ විකුණුම් මුදල්, සමාලෝචිත වර්ෂය සඳහා මූල්‍ය ප්‍රකාශනවල වෙනත් ආදායම ලෙස දක්වා තිබුණද එම වත්කම්වල පිරිවැය අධිකාරිය විසින් අත්පත් කරගත් දිනයේ සිට ගිණුම්වලට ගෙන නොතිබුණි.

(ii) රු. 15,050,000 ක් වූ ගොඩනැගිලි 2015 වර්ෂයේ ක්ෂය කර නොතිබුණ අතර, ඒ අනුව 2015 වෂීයට අදාළ රු. 752,500 ක් වූ ක්ෂය පිරිවැය අඩුවෙන් දක්වා තිබුණි.

2.2.4 පැහැදිලි නොකළ වෙනස්කම්

පහත සඳහන් පැහැදිලි නොකළ වෙනස්කම් විගණනයේදී නිරීක්ෂණය විය.

(අ) 2015 දෙසැම්බර් 31 දිනට මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අධිකාරිය විසින් පවත්වා ගෙන යනු ලබන ජංගම ගිණුම් 46 කට අදාළ රු. 120,935,788,038 ක් වූ මුළු එකතු ණය ශේෂය අදාළ බැංකු විසින් සනාථ කරන ලද රු. 116,537,540,890 ක් වූ මුළු එකතු ශේෂයන් සමඟ එකඟ නොවීය.

(ආ) දක්ෂිණ ප්‍රවාහන සංවර්ධන ව්‍යාපෘතියේ මූල්‍ය ප්‍රකාශන වලට අනුව දක්ෂිණ අධිවේගී මාර්ගයේ පිරිවැය රු.මිලියන 114,166 ක අගයක් විය. කෙසේ වුවද, මාර්ග සංවර්ධන

අධිකාරියේ මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අධිවේගී මාර්ගවල අනුරූපී පිරිවැය රු.මිලියන 114,071 ක් විය.

(ඇ) පරිපාලිත සමාගම් වෙතින් ලැබිය යුතු / ගෙවිය යුතු ශේෂයන් සහ එම ලැබිය යුතු / ගෙවිය යුතු වලට අදාළ පාරිපාලිත සමාගම් විසින් ඉදිරිපත්කළ සනාථ කිරීම් අතර රු. 635,840,889 ක වෙනසක් නිරීක්ෂණය විය.

2.2.5 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්

රාජ්‍ය ආයතන මෙන්ම පුද්ගලික පාර්ශවයන්ගෙන් අයවිය යුතු මුදල් නැවත අයකරගැනීම සඳහා අධිකාරිය විසින් ඵලදායී ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. එයට අමතරව, ගෙවිය යුතු අගයන් තුළ ඇතුලත් බාහිර පාර්ශවයන් වෙත ගෙවිය යුතු අගයන් අධිකාරිය විසින් නිරවුල් කිරීමට ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. මේ සම්බන්ධයෙන් නිරීක්ෂණය වූ අවස්ථා පහත දැක්වේ.

(අ) ලැබිය යුතු ගිණුම්

	විස්තරය	මුදල	ගනුදෙනුකරු පිළිබඳ විස්තර	අයනොවූ කාලපරිච්ඡේදය / වර්ෂ
		(රු.)		
(i)	ණයගැතියෝ	7,368,162,377	ණයගැති ගිණුම් - 16	2012 සිට 2014 දක්වා සහ 1987 සිට 2014 දක්වා
(ii)	සේවා සහ කුලී අත්තිකාරම්	7,405,680	රාජ්‍ය ආයතන හා පුද්ගලයින් - 08	2001 - 2014
(iii)	කුලී අත්තිකාරම්	6,494,948	තැන්පතු - 18	2008 - 2014
(iv)	කොන්ත්‍රාත් අත්තිකාරම්	27,402,432	කොන්ත්‍රාත්කරුවන් - 28	2005- 2014 සහ වර්ෂ 08 ඉක්ම වූ
(v)	අනිකුත් අත්තිකාරම්	3,740,000,000	මහාමාර්ග හා ආයෝජන ප්‍රවර්ධන අමාත්‍යාංශය	2014 සිට 2015 දක්වා
(vi)	ණය කොන්දේසි අත්තිකාරම්	11,478,909	මගනැගුම මාර්ග ඉදිකිරීම් සහ යන්ත්‍රෝපකරණ (පුද්ගලික) සමාගම.	2013 සිට 2015 දක්වා
		71,100,621	කොන්ත්‍රාත්කරුවන් - 05	2013 සිට 2015 දක්වා
(vii)	වැඩ පූර්ව අත්තිකාරම්	2,000,000,000	ප්‍රාදේශීය මාර්ග සංවර්ධන අධිකාරිය	2014 සිට 2015 දක්වා
		1,119,966,845	කොන්ත්‍රාත්කරුවන් - 34	2001 සිට 2015 දක්වා

(viii)	මිළදී ගැනුම් අත්තිකාරම්	33,631,574	සැපයුම්කරුවන් - 92	2011 සිට 2015 දක්වා සහ වර්ෂ 05 ඉක්ම වූ
(ix)	ලැබිය යුතු කුලී	1,781,623	බොරැල්ල උමං මාර්ගයේ සාප්පු හිමිකරුවන් - 02	වර්ෂ 05 සිට වර්ෂ 08 දක්වා
		1,109,689	මහනුවර උමං මාර්ගයේ සාප්පු හිමිකරුවන් - 05	වර්ෂ 03 සිට වර්ෂ 04 දක්වා
(x)	අයකර නොමැති වැටුප් සහ අනිකුත් දීමනා	62,004,844	අධිකාරියේ කාර්ය මණ්ඩලය - 260	වර්ෂ 01
		62,757,658	අධිකාරියේ කාර්ය මණ්ඩලය - 94	වර්ෂ 02
		1,718,292	අමාත්‍යාංශ 07 කට නිදහස් කළ කාර්ය මණ්ඩලය	2013 සිට 2015 දක්වා
(xi)	අයනොවූ සේවක ණය	3,104,786	අධිකාරියේ විශ්‍රාමික කාර්ය මණ්ඩලය - 50	වර්ෂ 01 සිට වර්ෂ 12 දක්වා

(ආ) ගෙවිය යුතු ගිණුම්

	විස්තරය	මුදල	ගණුදෙනුකරුවන් පිළිබඳ විස්තර	නිරවුල් නොකළ කාලපරිච්ඡේදය
		(රු.)		
(i)	සේවාදායක තැන්පතු	494,608,295	සේවාදායක වැඩ - 200	වර්ෂ 1 සිට වර්ෂ 7 දක්වා
		227,865,985	සේවාදායකයින් - 119	2010 සිට 2014 දක්වා
(ii)	ආරක්ෂක තැන්පතු	2,278,159	කොන්ත්‍රාත්කරුවන් - 111	වර්ෂ 29 ට වැඩි
(iii)	ගෙවිය යුතු රඳවා ගැනීම් මුදල්	973,394,696	කොන්ත්‍රාත් - 1073	වර්ෂ 03 සිට වර්ෂ 10 දක්වා සහ වර්ෂ 10 ට වැඩි
(iv)	ගෙවිය යුතු ව්‍යාපෘති සහ අනිකුත් කොන්ත්‍රාත්කරුවෝ			
	- අසම්පූර්ණ වූ බිල්	205,861,302	කොන්ත්‍රාත් - 28	වර්ෂ 01 ට අඩු
	- අනුමත නොවූ විචලනයන්	135,099,370	කොන්ත්‍රාත් - 27	
(v)	ගෙවිය යුතු කොන්ත්‍රාත්කරුවන්	328,923,378	කොන්ත්‍රාත්කරුවන් - 06	වර්ෂ 01 ට අඩු
(vi)	ආදායමට මාරු නොකළ ප්‍රමාද ගාස්තු	676,846,546	කොන්ත්‍රාත් - 450	2010 වර්ෂයේ සිට 2015 වර්ෂය දක්වා

2.2.6 විගණනය සඳහා සාක්ෂි ඉදිරිපත් නොවීම

මුළු ඒකක ප්‍රමාණය, ඒකක මිල සහ මුළු වටිනාකම ඇතුළත් විස්තරාත්මක උපලේඛන ආදී සාක්ෂි නොමැති වීම හේතුවෙන් එකතුව රු. 552,044,028 ක් වූ උපකරණ, සෘජු අමුද්‍රව්‍ය, වක්‍ර අමුද්‍රව්‍ය, අමතර කොටස්, ලිපිද්‍රව්‍ය, මුද්‍රණ අයිතමයන් ආදී ඉන්වෙන්ට්‍රි අයිතමයන් විගණනයේ දී සතුටුදායක ලෙස සත්‍යාක්ෂණය කිරීමට නොහැකි විය.

2.3 නීති රීති,රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම

විගණනයේ දී නිරීක්ෂණය වූ අනුකූල නොවීම් අවස්ථා පහත දැක්වේ.

නීති රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට යොමුව	අනුකූල නොවීම්
(අ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය	
(i) මුදල් රෙගුලාසි 373 හා 2015 ඔක්තෝබර් 21 දිනැති අංක 336 දරණ කාර්යාල චක්‍රලේඛය	අධිකාරියේ උප කාර්යාල 02 කට හා අංශ 03 කට ලබා දෙන ලද එකතුව රු.31,651,973 ක් වූ සුළු මුදල් අග්‍රිම හා ඉන්ධන අග්‍රිම සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් නිරවුල් කර නොතිබුණි.
(ii) මුදල් රෙගුලාසි 396	නිකුත් කරන ලද එහෙත් මාස 06 කට වැඩි කාලයක උපලබ්ධි නොවූ රු. 3,903,709 ක් අගය ඇති චෙක්පත් 67 ක් අවලංගු කිරීමට අධිකාරිය විසින් කාලීනව පියවර ගෙන නොතිබුණි.
(ආ) 2003 ජුනි 02 දිනැති අංක පීඊඩී/12 දරණ රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය.	
(i) 9:4 වගන්තිය	චක්‍රලේඛයේ සඳහන් විධිවිධානවලට පටහැනිව අධිකාරියේ කාර්ය මණ්ඩලය 260 දෙනෙකු සමාලෝචිත වර්ෂය තුළ උසස් අධ්‍යාපන හා මහාමාර්ග අමාත්‍යාංශය වෙත මුදා හැර තිබුණි.
(ii) 9:3:1(viii) වගන්තිය	අධිකාරිය විසින් කළමනාකරණ මට්ටමේ තනතුරු පුරප්පාඩු ආවරණය කිරීම සඳහා අනුප්‍රාප්තික සැලැස්මක් පිළියෙල කර නොතිබුණි

3. මූල්‍ය සමාලෝචනය

3.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, සමාලෝචිත වර්ෂය සඳහා අධිකාරියේ මෙහෙයුම්වලින් වූ ප්‍රතිඵලය රු.මිලියන 1,674.93 ක බදු පූර්ව ශුද්ධ අතිරික්තයක් වූ අතර ඊට ප්‍රතිරූපීව ඉකුත් වර්ෂය සඳහා රු.මිලියන 4,962.68 ක බදු පූර්ව ශුද්ධ ඌනතාවයක් වූ හෙයින් සමාලෝචිත වර්ෂය සඳහා මූල්‍ය ප්‍රතිඵලයේ රු.මිලියන 6,637.61 ක වැඩිවීමක් දැක්වූණි. සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලයේ මෙම වැඩිවීම සඳහා රු. මිලියන 12,506 කින් මුළු ආදායම වැඩිවීම ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

කෙසේ වුවද, සමාලෝචිත වර්ෂයේ අධිකාරියේ මෙහෙයුම් වියදම රු.මිලියන 5,868.47 කින් වැඩි වී තිබුණි. මේ අතර දේශීය බැංකු අරමුදල් ව්‍යාපෘතිය ආරම්භ කිරීමත් සමඟ මාර්ග පුළුල් කිරීම් හා වැඩිදියුණු කිරීම් ණය සඳහා පොළිය වැඩි වී තිබුණි.

3.2 අධිකාරිය විසින් එකතු කළ අගය

සපයන ලද තොරතුරු අනුව, සමාලෝචිත වර්ෂය සඳහා අධිකාරියේ එකතු කළ අගය රු.මිලියන 21,307 ක් වූ අතර ඉකුත් වර්ෂය සමඟ සැසඳීමේදී එය සියයට 45 කින් වැඩි වීමකි. කෙසේ වුවද, මෙම වැඩිදියුණුව සඳහා ප්‍රධාන වශයෙන් රජයේ දායකත්වයන් සහ රු.මිලියන 1,016 කින් අධිවේගී මාර්ග ආදායම වැඩි වීම (රාජ්‍ය ආයෝජන මඟින් ඉපයීම) බලපා ඇති අතර අධිකාරිය විසින් ස්වයං එකතු කළ අගයක් නොවීය. එමෙන්ම, ඉදිරිපත් කරන ලද තොරතුරු වලට අනුව, ඉකුත් වර්ෂය සමඟ සැසඳීමේදී සමාලෝචිත වර්ෂය තුළ රජයේ දායකත්වයන් සහ අනුග්‍රහයන් සැලකිය යුතු පරිදි වැඩි වී ඇතත් මාර්ග පුළුල් කිරීම හා වැඩි දියුණු කිරීම, නව මාර්ග ඉදි කිරීම ආදී අධිකාරියේ ප්‍රධාන කටයුතුවල දියුණුවක් නොවීය.

3.3 විග්‍රහාත්මක මූල්‍ය සමාලෝචනය

2015 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ දැක්වෙන සැලකිය යුතු ශේෂයන් කිහිපයක් ඉකුත් වර්ෂය සමඟ සසඳා පහත දැක්වේ.

	දෙසැම්බර් 31 දිනට	
විස්තරය	2015	2014
	රු.මිලියන	රු.මිලියන
ශුද්ධ ජංගම වත්කම්	(855.55)	2,717
ශුද්ධ වත්කම්	161,409	170,633
සමුච්චිත ඌනතාවය	(12,740)	(13,576)

අධිකාරියේ සමුච්චිත ඌනතාවය ඉකුත් වර්ෂයේ රු.මිලියන 13,576 සිට සමාලෝචිත වර්ෂයේ රු.මිලියන 12,740 දක්වා අඩු වී ඇතත්, ශුද්ධ ජංගම වත්කම් සහ ශුද්ධ වත්කම් පිළිවෙලින් රු.මිලියන 3,572.55 කින් එනම් සියයට 131 කින් සහ රු.මිලියන 9,224 කින් එනම් සියයට 05 කින් අඩුවී තිබුණි.

4. මෙහෙයුම් සමාලෝචනය

4.1 කාර්යසාධනය

4.1.1 ජාතික මාර්ග හා පාලම්වල නඩත්තු වැඩ

මේ සම්බන්ධයෙන් පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) ජාතික මාර්ග නඩත්තු කටයුතු සඳහා රු. මිලියන 4,994.78 ක මුදලක් වෙන්කර තිබුණද එම මුළු වෙන් කිරීම් වලින් රු. මිලියන 1,996.81 ක මුදලක් එනම් සියයට 39.97 ක් පමණක් භාවිතයට ගෙන තිබුණි.

(ii) විධායක ඉංජිනේරු කාර්යාල 06 ක් මගින් ක්‍රියාත්මක ව්‍යාපෘති 23 ක් යටතේ ආවරණය වන මාර්ග නඩත්තු කටයුතු රු.මිලියන 161.37 ක පිරිවැයකට 2015 දෙසැම්බර් 31 දිනට නිම කිරීමට අපේක්ෂිත විය. කෙසේ වුවද, සමාලෝචිත වර්ෂය තුළදී එම කටයුතු නිමකර නොතිබූ අතර, 2015 දෙසැම්බර් 31 දක්වා දරන ලද තත්‍ය පිරිවැය රු.මිලියන 27.91 ක් පමණක් විය.

(ii) කාලීන නඩත්තු කිරීම, ජලකාණු හා ව්‍යුහ වැඩිදියුණු කිරීම, සංඥා ලාම්පු පද්ධති, වීදි ලාම්පු, මාර්ග සංඥා හා සලකුණු කිරීම් නඩත්තු කිරීම සහ සුළු මාර්ග ආරක්ෂණ වැඩිදියුණු කිරීම් සහ හදිසි නඩත්තු කිරීම්/ ආපදා වැඩ සඳහා වෙන්කල අරමුදල් භාවිතා කිරීම සියයට 50 ට වඩා අඩු විය. එහි ප්‍රතිඵලයක් ලෙස ජාතික මාර්ග ජාලයේ නඩත්තු කටයුතුවල ප්‍රමිතගත තත්ත්වය වෙන් කරන ලද ප්‍රතිපාදන ඌන උපයෝජනය මඟින් බලපා තිබුණි.

4.1.2 ඉංජිනේරු සේවා හා පාලම් සැලසුම් අංශයේ කාර්යසාධනය

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(i) 2015 වර්ෂය සඳහා මෙම අංශයේ වැඩ සැලැස්මක් පිළියෙල කර තිබුණද, එම සැලැස්ම සඳහා අවශ්‍ය අනුමැතිය ලබා ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ii) සමාලෝචිත වර්ෂය තුළ පාලම් 69 ක් සැලසුම් කිරීමට බලාපොරොත්තු වී තිබුණි. කෙසේ වුවද, සමාලෝචිත වර්ෂයේ ඉදිරිපත් කරන ලද ප්‍රගති වාර්තාවට අනුව පාලම් 39 කට අදාළ සැලසුම් පමණක් අවසන් කර තිබුණි.

(iii) අධිකාරියේ විෂය පථයට අයත් නොවුවද ආරක්ෂක මුලස්ථානයට පිවිසුම් මාර්ගයේ ඇති පාලම් සහ මරියන් ඩ්‍රයිව් දිගුවෙහි (Marine Drive extension) දෙනිවල ඇළ මාර්ගය හරහා ඇති පාලම, අධිකාරියේ පාලම් සැලසුම් අංශය මඟින් නිර්මාණය කර තිබුණි.

4.2 කොන්ත්‍රාත් පරිපාලනය

4.2.1 මාර්ග පුනරුත්ථාපනය කිරීම හා වැඩි දියුණු කිරීම

සමාලෝචිත වර්ෂයේ මාර්ග පුළුල් කිරීම හා වැඩිදියුණු කිරීමේ වැඩ ක්‍රියාත්මක කිරීමේදී පහත සඳහන් කරුණු නිරීක්ෂණය විය.

(අ) මාර්ග පුළුල් කිරීම හා වැඩිදියුණු කිරීම.

(i) ඇස්තමේන්තු ගත පිරිවැය රු. මිලියන 25,103 ක් වූ මාර්ග වැඩි දියුණු කිරීමේ වැඩ ව්‍යාපෘතීන් 259 ක වැඩ නිම කිරීමට බලාපොරොත්තු වී තිබුණි. කෙසේ වුවද, මෙම ක්‍රියාකාරකම්වල 2015 දෙසැම්බර් 31 දිනට භෞතික ප්‍රගතිය සියයට 50 කට අඩු විය. එයින් ව්‍යාපෘති 206 ක් මාර්ග සංවර්ධන අධිකාරියට අයත් නොවන (Non RDA) මාර්ග වලට අදාල ව්‍යාපෘතීන් වූ අතර එහි ඇස්තමේන්තුගත වටිනාකම සහ ඒ සඳහා වැයකළ පිරිවැය පිළිවෙලින් රු. මිලියන 17,928 ක් සහ රු. මිලියන 913 ක් විය. සියයට 50 කට අඩු භෞතික ප්‍රගතියක් ඇති ව්‍යාපෘති 53 ක් මාර්ග සංවර්ධන අධිකාරියට අයත් විය. එහි කොන්ත්‍රාත් පිරිවැය හා වැයකළ වටිනාකම පිළිවෙලින් රු. මිලියන 7,175 ක් සහ රු. මිලියන 581 ක් විය.

(iii) ඇස්තමේන්තුගත පිරිවැය රු. මිලියන 4,902 ක් වූ සමාලෝචිත වර්ෂයේ නිමකළ යුතු ව්‍යාපෘතීන් 84 ක් පැවති අතර එම ව්‍යාපෘතිවල කිසිදු කාර්යයක් සිදුකර නොතිබුණි. කෙසේ වුවද, එයින් එක් ව්‍යාපෘතියක් සඳහා රු. මිලියන 2.50 ක් පමණක් වැයකර තිබුණි. මෙම ව්‍යාපෘති 84 න් ව්‍යාපෘති 54 ක් මාර්ග සංවර්ධන අධිකාරියට අයත් නොවන මාර්ග වලට අදාල ව්‍යාපෘතීන් වූ අතර එහි කොන්ත්‍රාත් වටිනාකම රු. මිලියන 2,465 ක් විය.

(ආ) දේශීය බැංකු විසින් මූල්‍යනය කෙරෙන ව්‍යාපෘති (LBFP)

දිවයින පුරා කිලෝමීටර 1,433.85 ක දිගින් යුත් ප්‍රමුඛතා මාර්ග 64 ක් පුනරුත්ථාපනය කිරීම සඳහා දේශීය බැංකුවලින් රු.බිලියන 152 ක් වූ ණය මුදල් අධිකාරිය වෙත ලබා ගැනීමට අමාත්‍ය මණ්ඩලය වෙතින් අධිකාරිය ලැබී තිබුණි. ඒ අනුව මාර්ග 64 ක් පුනරුත්ථාපනය කිරීම සඳහා රු.බිලියන 152 ක් වටිනා කොන්ත්‍රාත්, අධිකාරිය විසින් ලබාදී තිබුණි.

වර්ෂ 2012 – 2015 කාලපරිච්ඡේදය තුළ දේශීය බැංකු 07 කින් එකතුව රු.මිලියන 131,441 ක් වූ ණය මුදල් අධිකාරිය විසින් ලබාගෙන තිබුණි. ඉන් රු.මිලියන 4,523 ක මුදලක් 2014 සහ 2015 වර්ෂ තුළදී නිරවුල් කර තිබුණි. ඒ අනුව 2015 දෙසැම්බර් 31 දිනට ණය මුදලේ ගෙවිය යුතු කොටස රු.මිලියන 126,918 ක් බව නිරීක්ෂණය විය. ලැබුණු ණය පිළිබඳ විස්තර හා සමාලෝචිත වර්ෂය අවසානයට හිඟ ණය මුදල් කොටස පිළිබඳ විස්තර පහත දැක්වේ.

බැංකුවේ නම	වර්ෂය සඳහා බැංකු වලින් ලැබුණු ණය				එකතුව	වර්ෂය තුළ ප්‍රාග්ධනය ආපසු ගෙවීම		එකතුව	2015 දෙසැම්බර් 31 දිනට ණය ශේෂය
	2012	2013	2014	2015		2014	2015		
	රු.මිලියන	රු.මිලියන	රු.මිලියන	රු.මිලියන	රු.මිලියන	රු.මිලියන	රු.මිලියන	රු.මිලියන	රු.මිලියන
කොමර්ෂල් බැංකුව	1,266	634	2,647	1,497	6,044	128	361	489	5,555
ලංකා බැංකුව	3,703	9,637	10,402	6,606	30,348	218	1,469	1,687	28,661
මහජන බැංකුව	3,369	5,234	4,806	562	13,971	607	1,220	1,827	12,144
ජාතික ඉතිරි කිරීමේ බැංකුව	384	4,953	43,931	5,076	54,344	-	339	339	54,005
සංවර්ධන මූල්‍ය සංස්ථාව	209	724	* (32)	309	1,210	-	45	45	1,165
හැටන් නැෂනල් බැංකුව	-	3,614	8,562	7,365	19,541	-	136	136	19,405
ජාතික සංවර්ධන බැංකුව	-	-	4,214	1,769	5,983	-	-	-	5,983
එකතුව	**8,932**	**24,796**	**74,530**	**23,184**	**131,441**	**953**	**3,570**	**4,523**	**126,918**

* 2013 වර්ෂයේදී සාවද්‍යව බැරකර 2014 වර්ෂයේදී නිවැරදි කර ඇත.

මේ සම්බන්ධයෙන් පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) ලබාගත හැකි වූ තොරතුරු අනුව ඉහත ව්‍යාපෘතිය (LBFP) යටතේ මාර්ග ඉදිකිරීම සඳහා කොන්ත්‍රාත්කරුවන් රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ විධිවිධාන ප්‍රකාරව තෝරාගෙන නොතිබුණි. ඒ වෙනුවට අදාළ මාර්ග 54 ක් සඳහා කොන්ත්‍රාත් යෝජනා කොන්ත්‍රාත්කරුවන් විසින්ම ලබා දී තිබුණි. ඉදිරිපත් කරන ලද යෝජනා අනුව මාර්ග 54 ක් සඳහා ඇස්තමේන්තුගත මුළු පිරිවැය රු.බිලියන 162 ක් වූවත්අමාත්‍ය මණ්ඩලය පත්කළ තාක්ෂණික ඇගයීම් කමිටුව (CATEC) මෙම කොන්ත්‍රාත් රු.බිලියන 146.5 කට පිරිනැමීම නිර්දේශ කර තිබුණි. කෙසේ වුවද, මිල වැඩිකිරීම පිළිබඳ හේතූන් ඉදිරිපත් නොකර අමාත්‍ය මණ්ඩලය පත්කළ ප්‍රසම්පාදන කමිටුව විසින් තාක්ෂණික ඇගයීම් කමිටුව (CATEC) නිර්දේශ කළ කොන්ත්‍රාත් වටිනාකම රු.බිලියන 155.79 දක්වා වැඩි කර තිබුණි.

(ii) කොන්ත්‍රාත්කරුවන්ගේ යෝජනා තාක්ෂණික ඇගැයීම් කමිටුව (TEC) විසින් විධිමත්ව ඇගයීම් කර නොතිබුණි. තවද එක් එක් මාර්ගය ඇගයීම් කිරීම සඳහා වැඩ විෂයයන්, ප්‍රමාණයන් හා රේටයන් ඇතුළත් ඉංජිනේරු ඇස්තමේන්තු පිළියෙල කර නොතිබුණි. එබැවින් තාක්ෂණික ඇගයීම් කමිටුව විසින් මහාමාර්ග සම්මත රේටය (Highway Standard Rate) යොදා ගනිමින් කොන්ත්‍රාත්කරුවන්ගේ යෝජනා ඇගයීම් කර තිබුණි. කෙසේ වුවද, ප්‍රමාණ පත්‍රවල (BOQ) කොන්ත්‍රාත්කරුවන් විසින් යෝජනා කරන ලද රේටයන් ඉංජිනේරු රේටයන්ට සාපේක්ෂව ඉතා වැඩි වී තිබූ අතර කොන්ත්‍රාත්කරුගෙන් කොන්ත්‍රාත්කරුට රේටයන් වෙනස් වී තිබුණි.

(iii) 2012 වර්ෂයේ මුල් භාගයේදී මාර්ග සංවර්ධන අධිකාරිය විසින් ඇස්පෝල්ට් අතුරන ලද මාර්ගයන්ගේ සමහර කොටස් දේශීය බැංකු මූල්‍යයන ව්‍යාපෘතිය යටතේ නැවත පුනරුත්ථාපනය කිරීම සඳහා ඇතුළත් කර තිබුණු බව අනාවරණය විය.

(iv) මාර්ග 28 ක් ඉදිකිරීම සඳහා මුළු ණය මුදලෙන් රු.මිලියන 55,392.2 ක් දේශීය බැංකු අරමුදල් ව්‍යාපෘතිය වෙත ලැබී තිබුණි. එයින් රු.මිලියන 28,000 ක් ව්‍යාපෘති කටයුතුවලට සම්බන්ධයක් නොමැති අධිකාරියේ අනෙකුත් කටයුතු වෙනුවෙන් වැයකර තිබූ අතර රු.මිලියන 21,238.98 ක් අත්තිකාරම් සහ කළ වැඩ සඳහා ගෙවා තිබුණි. එහි ප්‍රතිඵලයක් ලෙස, ණය මුදලේ ඉතිරිය රු. මිලියන 6,153.34 ක් විය. කෙසේ වුවද කළ යුතු ඉතිරි වැඩ සඳහා ලබාගත් ණය මුදලෙන් ගෙවිය යුතු වටිනාකම රු.මිලියන 34,153.34 ක් විය. ඒ අනුව, කිරීමට නියමිත ඉතිරි මාර්ගවල වැඩ සඳහා ගෙවීම් කිරීමේදී නුදුරු අනාගතයේදී මූල්‍යමය අර්බුදයක් හට ගැනීමේ හැකියාවක්

ඇති බව විගණනයේදී නිරීක්ෂණය වූ අතර එය ඉදිකිරීම් වැඩ කෙරෙහි අහිතකර ලෙස බලපානු ඇත.

(v) පැල්මඩුල්ල - ඇඹිලිපිටිය - නෝනාගම මාර්ග පුනරුත්ථාපනය කිරීමේ මාර්ග ව්‍යාපෘතියේ විෂය පථයට අදාළ නොමැති ව්‍යාපෘති කටයුතු වලින් බාහිර අතිරේක කාර්යයන් වූ ඇඹිලිපිටිය ජනාධිපති නිවාස ඉදිකිරීම සඳහා සහ අමතර මාර්ග 17 ක දුර කි.මී. 9.21 ඉදිකිරීම සඳහා රු.මිලියන 161.05 ක් ව්‍යාපෘතියේ මාර්ග පුනරුත්ථාපනය කිරීමට ජාතික ඉතිරි කිරීමේ බැංකුව වෙතින් ලබාගත් රු.මිලියන 2,172 ක් වූ ණය මුදලින් වැයකර තිබුණි.

(vi) මාර්ග 08 ක් පිළිබඳව සිදුකළ නියැදි පරීක්ෂා කිරීම්වලට අනුව, මාර්ගවල දිග, පළල, කොන්ක්‍රීට් කාණු පද්ධති, බෝක්කු, පැති බැම් සහ මාර්ගයේ මතුපිට ස්ථරයේ ඉදිකිරීම් යනාදී කළයුතු වැඩ කොටස් අඩුකර රු.මිලියන 3,333 ක් වූ ඉතිරිවීම් ලබාගෙන තිබූ අතර එම ඉතිරිවීම් මුල් ව්‍යාපෘතියේ ලේඛනගත විෂය පථය පිළිබඳ සැළකිල්ලට නොගෙන වෙනත් ඉදිකිරීම් කටයුතු සඳහා භාවිතා කර තිබුණි. වෙනත් කටයුතු පිළිබඳ විස්තර පහත දැක්වේ.

ක්‍රියාකාරකම	වැයකල වටිනාකම රුපියල් මිලියන
අනුමත මාර්ග පුනරුත්ථාපන ව්‍යාපෘති කටයුතු වලට පරිබාහිරව මාර්ග 59 ක ඉදිකිරීම් සඳහා	943.54
ව්‍යාපෘති වලින් පරිබාහිරව වෙනත් මාර්ග වල පාලම් ඉදිකිරීම් කටයුතු සඳහා	65.86
කෑගල්ල-ඩෙස්සන් බංගලාවේ ඉදිකිරීම්, පළාත්භාර අධ්‍යක්ෂ කාර්යාලයේ ඉදිකිරීම් සහ වෙනත් මාර්ග ඉදිකිරීම් කටයුතු	1,370.23
වෙනත් පරිබාහිර මාර්ග 07 ක ඉදිකිරීම් කටයුතු සඳහා	953.47
එකතුව	**3,333.10**

(ඇ) **නෝවූඩ් අප්කෝට් මාර්ගයේ පාලම ඉදිකිරීම**

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(i) නෝවූඩ් අප්කෝට් මාර්ගයේ අංක 9/12 පාලම ඉදිකිරීම සඳහා රු.3,456,682 ක පිරිවැයකට කොන්ත්‍රාත්කරුවකුට පිරිනමා තිබුණි. පාලමේ පළල මීටර් 4 සිට මීටර් 7 දක්වා වැඩි කිරීම හේතුවෙන් නව කොන්ත්‍රාත් වටිනාකම

රු.8,162,377 ක් දක්වා වැඩි වූ අතර අමතර වැඩ සඳහා අනුමැතියක් ලබාගෙන නොතිබුණි. ඉදිකිරීම් වැඩ සඳහා රු.3,425,378 ක මුදලක් ලබා ගැනීමෙන් පසු කොන්ත්‍රාත්කරු විසින් පාලමේ ඉදිකිරීම් වැඩ නවතා දමා තිබුණි.

(ii) පාලමේ මතුපිට කොටසක පමණක් කොන්ක්‍රීට් තට්ටුව ඇතිරීම සිදුකර තිබුණු අතර අනතුරු ඇඟවීම් සංඥා සවිකර ඇතත් පාලමේ අනිත් කොටස අත් වැටවල් හාවිතයෙන් ප්‍රමාණවත්ව ආවරණය කර නොතිබූ බැවින් අනතුරු සඳහා විශාල අවදානමක් ඇති වී තිබුණි.

(iii) පාලම ඉදිකිරීම් 2010 ඔක්තෝබර් 26 දින ආරම්භ කිරීමටත්, 2011 මාර්තු 25 ට පෙර අවසන් කිරීමටත් යෝජනා කර තිබුණද, ඉදිකිරීම 2016 ජුනි 30 වන විටත් සම්පූර්ණ කර නොතිබුණු බව නිරීක්ෂණය විය.

(ඇ) විජේබාහුකන්ද පාලම ඉදිකිරීම

(i) පාලම ඉදිකිරීම සඳහා ඉංජිනේරු ඇස්තමේන්තුව රු.මිලියන 30.83 ක්ව තිබියදී රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශයේ 7.9.11 ඡේදයේ සඳහන් අවශ්‍යතාවයන් අනුගමනය නොකර ඉංජිනේරු ඇස්තමේන්තුවට වඩා සියයට 25.31 කින් අඩු වූ රු.මිලියන 23.90 කට කොන්ත්‍රාත්තුව පිරිනමා තිබුණි. පාලම ඉදිකිරීම් වැඩ 2012 ජනවාරි 09 ට පෙර නිම කිරීමට යෝජනා කර ඇතත් මාස 04 ක කාලය දිර්ඝ කිරීමකින් පසුව 2014 දෙසැම්බර් වන විටත් ඉදිකිරීම් වැඩ නිමකර නොතිබුණි. කෙසේ වුවද, ප්‍රමාද කාලය සඳහා ප්‍රමාද කළ අලාභ අය කිරීම සිදු කර නොතිබුණු අතර, අතිරේක වැඩ හේතුවෙන් රු.11,992,423 කින් හෝ සියයට 50 කින් කොන්ත්‍රාත් වටිනාකම වැඩි කර තිබුණි.

(ii) පාලම ඉදිකර තිබුණද පාලම භාවිතා කරන්නන්ගේ ආරක්ෂව සඳහා එයට ඇතුල්වන ස්ථානයේ පැති බැම් (wing walls), අත් වැටවල්, මතුපිට ස්ථරය සඳහා පෙරමුසු යෙදීම සහ ඇතුළු වන ස්ථානයේ සිට පාලම අතර බැක් පිලින්ග්ස් (Back Fillings) ඉදිකිරීමට කටයුතු කර නොතිබුණි.

4.2.2 ත්‍රිකුණාමලය පිටත වටරවුම් මාර්ගය නැවත ඉදිකිරීම.

මඩකලපුව - තිරික්කොන්ඩායි ආරූ - ත්‍රිකුණාමලය (A-15) සහ අඹේපුස්ස - කුරුණෑගල - ත්‍රිකුණාමලය (A-6) මාර්ග, ත්‍රිකුණාමලය නගරයෙන් පිටත සම්බන්ධ වනසේ ඉදිකරන ලද පිටත වටරවුම් මාර්ගය සඳහා එක්සත් රාජධානි වානේ පාලම් ව්‍යාපෘතිය යටතේ 2009 සහ

2010 වසරවලදී රු.මිලියන 3,495 ක් වැයකර පාලම් 08 ක් ඉදිකර තිබුණි. කෙසේ වුවද, 2016 මැයි මස 31 දින වන විට වසර 5 ක් ගත වී ඇතත් මාර්ගය ඉදිකිරීම සඳහා අරමුදල් නොමැතිවීම හේතුවෙන් මෙම පාලම් සම්බන්ධ කෙරෙන මාර්ග ඉදිකිරීම් සම්පූර්ණ කර නොතිබුණි.

4.2.3 කතරගම සංචාරක නිවාසය ඉදිකිරීම

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(i) කතරගම සංචාරක බංගලාව ඉදිකිරීමේ කටයුතු පුද්ගලික සමාගමක් විසින් 2004 වර්ෂයේදී ආරම්භ කොට ඉදිකිරීමේ කටයුතු නිම කිරීමකින් තොරව අතරමග නවතා දමා තිබුණි. ඉන්පසු සෘජු කම්කරු ශ්‍රමය යොදා නැවතත් ඉදිකිරීම් කටයුතු ආරම්භ කර තිබුණි. පසුව කතරගම සංචාරක නිවාසයේ බිම් මහල ඉදිකිරීමේ වැඩ 2010 සැප්තැම්බර් 28 දින රු.12,352,242 කට කොන්ත්‍රාත්කරුවකුට පවරා තිබුණු අතර ඉදිකිරීම් කටයුතු සිදු කිරීම වෙනුවෙන් කොන්ත්‍රාත්කරු වෙත රු.11,771,448 ක් ගෙවා තිබුණි. කොන්ත්‍රාත්කරු සමඟ එළඹී ගිවිසුම අනුව 2011 ජුනි 07 දිනට පෙර වැඩ නිම කල යුතුව තිබුණි. නමුත් 2015 දෙසැම්බර් 31 වන විටත් වැඩ නිම කර නොතිබුණි.

(ii) කොන්ත්‍රාත්කරු විසින් බිම් මහලේ සිදුකරන ලද වැඩවල සැලකිය යුතු අඩුපාඩු තිබුණද, එම අඩුපාඩු පිළිබඳ සැලකීමෙන් තොරව පළමු මහලේ ඉදිකිරීමද 2014 දෙසැම්බර් 24 දින රු.7,922,316 කට මෙම කොන්ත්‍රාත්කරු වෙතම පවරා තිබුණි.

(iii) 2016 මැයි 31 දින විටද මෙම ගොඩනැගිල්ලේ ඉදිකිරීම් කටයුතු නියමිත පරිදි නිමකර සංචාරක නිවාසය භාවිතයට ගැනීමට කටයුතු කර නොතිබුණි.

4.4 නිෂ්ඵල ගනුදෙනු

මේ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(i) 2008 අගෝස්තු 20 දින නාගරික සංවර්ධන අධිකාරිය සමඟ මාර්ග සංවර්ධන අධිකාරිය විසින් අත්සන් කරන ලද බදු ගිවිසුමේ විධිවිධානවලට අනුව ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවතේ පිහිටි ඉඩමක් සඳහා වාර්ෂික බදු කුලිය රු.මිලියන 6 ක් ලෙස තීරණය කර තිබුණි. කෙසේ වුවද, 2009 නොවැම්බර් 19 දින අමාත්‍ය මණ්ඩලය විසින් ගන්නා ලද තීරණය අනුව, මාසික බදු කුලිය රු. 1,000 ක් ලෙස සංශෝධනය කරන ලදී. අමාත්‍ය මණ්ඩලය විසින් තීරණය කරන ලද පරිදි වාර්ෂික බදු කුලී ගෙවීම

අඩු කිරීමට හැකිවන පරිදි බදු කුලී ගිවිසුම සංශෝධනය කිරීමට කටයුතු කර නොතිබුණි.

(ii) විදේශ මූල්‍යයන ව්‍යාපෘතියක අරමුදල් යොදා ගනිමින් ඉදිකරන ලද මාර්ග සංවර්ධන අධිකාරියේ ප්‍රධාන කාර්යාලය 2014 නොවැම්බර් 21 දින මාර්ග සංවර්ධන අධිකාරියට භාරදී තිබුණද 2015 අප්‍රේල් වනතුරු ප්‍රධාන කාර්යාලය නව ගොඩනැගිල්ලට රැගෙන ගොස් නොතිබුණි. තවද, 2014 දෙසැම්බර් සිට 2015 අප්‍රේල් දක්වා රු.මිලියන 49.4 ක් වූ ගොඩනැගිලි කුලී නාගරික සංවර්ධන අධිකාරියට ගෙවා තිබුණි.

(iii) 2011 සිට 2015 දක්වා වර්ෂ තුළ ආරම්භ කරන ලද ඇස්තමේන්තුගත පිරිවැය රු.මිලියන 14,857.52 ක් වූ මාර්ග ව්‍යාපෘති 169 ක ඉදිකිරීම් වැඩ, අධිකාරියට අයත් නොවන මාර්ග ඉදිකිරීම්, අරමුදල් හිඟවීම ආදිය හේතුවෙන් අතරමඟ නවතා තිබුණි. 2015 දෙසැම්බර් 31 දක්වා ඒ වෙනුවෙන් වැය කළ වියදම රු. මිලියන 2,213.87 ක් විය. ඇස්තමේන්තුගත පිරිවැය රු.මිලියන 7,293.38 ක් වූ මාර්ග පුළුල් කිරීමේ හා වැඩි දියුණු කිරීමේ තවත් ව්‍යාපෘති 73 ක් 2015 වර්ෂය තුළ නැවත ආරම්භ කර තිබූ අතර නිමකර නොතිබුණි. 2015 දෙසැම්බර් 31 දක්වා වැය කළ මුළු පිරිවැය රු. මිලියන 1,689.63 ක් විය.

4.5 වත්කම් කළමනාකරණය

මේ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(i) වටිනාකම රු.32,139,477 ක් වූ උපයෝජනය නොකළ හා සෙමින් වලනය වන අමතර කොටස් තොගය 2012 වර්ෂයේ සිට භාවිතයට නොගෙන ගබඩාවේ රඳවා තිබුණි.

(ii) රු.4,746,349 ක් වූ යල් පැනගිය නිල ඇඳුම්, සපත්තු හා සැන්ඩ්ල්ස්, ටයර් හා ද්‍රව්‍ය තොගය - ඇස්පෝල්ට් පිරියත අපහරණය කිරීමට කටයුතු කිරීමෙන් තොරව 2008 වර්ෂයේ සිට ගබඩාවේ රඳවා තිබුණි.

4.6 මතභේදයට තුඩුදෙන ගණුදෙනු

ආශ්‍රිත සමාගම් සමඟ අධිකාරිය විසින් ක්‍රියාත්මක කරන ලද සමහර ගණුදෙනු මතභේදාත්මක විය. එම ගණුදෙනු පිළිබඳ විස්තර පහත දැක්වේ.

(අ) මග නැගුම සමාගම්වලින් ලැබිය යුතු මුදල්

(i) 2012 පෙබරවාරි 10 දින මග නැගුම මාර්ග ඉදිකිරීම් සහ යන්ත්‍රෝපකරණ සමාගම සමඟ එළඹී ගිවිසුම් අනුව එම සමාගම සඳහා කුලියට දෙන ලද වාහනවල කුලී ප්‍රමාදයකින් තොරව අයකර ගත යුතු වුවද 2010 සිට 2014 කාලපරිච්ඡේදය සඳහා අධිකාරියට ලැබිය යුතු රු.333,200,550 ක කුලී 2015 දෙසැම්බර් 31 වන විට ද අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ii) වත්කම්, පාරිභෝගික ද්‍රව්‍ය හා අමතර කොටස් මිලදී ගැනීම සඳහා 2004 සිට 2007 දක්වා කාලපරිච්ඡේදය තුළ මග නැගුම මාර්ග ඉදිකිරීම් හා උපකරණ සමාගමට ලබාදුන් රු.63,276,545 ක් වූ අයවිය යුතු මුදල එම සමාගමෙන් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ආ) 2012 වර්ෂයේ සිට අයකරගත යුතු රු. 10,923,083 ක් වූ වේතන සහ 2014 වර්ෂය තුළ සපයන ලද රු. 5,685,164 ක් වූ cold mix සම්බන්ධයෙන් මග නැගුම උපදේශන සහ ව්‍යාපෘති කළමනාකරණ සේවා සමාගම වෙත ගෙවීම් කිරීමට හෝ ලැබිය යුතු ශේෂවලට හිලව් කිරීමට ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.

(ඇ) අනුමත නොකරන ලද විවලතා නියෝග සහ වැඩ නියෝග.

(i) අංක 2011 – 01 හා 2011 මාර්තු 28 දින දරන මාර්ග සංවර්ධන අධිකාරියේ අධ්‍යක්ෂ ජනරාල් / වැඩ බලන සභාපතිගේ චක්‍රලේඛය අනුව, විවලතා නියෝග නිකුත් කිරීමට සහ බාහිර සහ අතිරේක වැඩ සඳහා නියෝග කිරීමට අධ්‍යක්ෂ ජනරාල්ගේ අනුමැතිය ලබා ගතයුතු වේ. කෙසේ වුවද, 2015 දෙසැම්බර් 31 දිනට පහත අතිරේක වැඩ සඳහා එවැනි අනුමැතියන් ලබාගෙන නොතිබුණි.

	අනුමැතිය සඳහා ඉදිරිපත් නොකරන ලද විචලතා නියෝගවල වටිනාකම	අනුමැතිය සඳහා ඉදිරිපත් කිරීමට නියමිත විචලතා නියෝගවල වටිනාකම	එකතුව
	රු.මිලියන	රු.මිලියන	රු.මිලියන
කොන්ත්‍රාත් වටිනාකම තුළ නිකුත් කරන ලද විචලතා නියෝග.	987.4	272.8	1,260.2
කොන්ත්‍රාත් වටිනාකම ඉක්මවා නිකුත් කරන ලද විචලතා නියෝග.	384.7	42.3	427.0
එකතුව	**1,372.1**	**315.1**	**1,687.2**

(ii) අංක 2013 - 01 හා 2013 මාර්තු 19 දින දරන මාර්ග සංවර්ධන අධිකාරියේ චක්‍රලේඛය අනුව, මග නැගුම මාර්ග ඉදිකිරීම සහ යන්ත්‍රෝපකරණ සමාගමට වැඩ නියෝග නිකුත් කිරීමට පෙර අධිකාරියේ අධ්‍යක්ෂ ජනරාල්ගේ පූර්ව අනුමැතිය ලබාගත යුතු වේ. කෙසේ වුවද, එම සමාගමට නිකුත් කරන ලද පහත වැඩ සඳහා පූර්ව අනුමැතියක් ලබා ගෙන නොමැති බව නිරීක්ෂණය විය.

	වැඩ නියෝගවල වටිනාකම	2015 ජූලි දක්වා ගෙවූ වටිනාකම
	රු.මිලියන	රු.මිලියන
2013 වසරේ සිට නිකුත් කරන ලද වැඩ නියෝග	17,093.4	2,898.7
2013 වසර දක්වා නිකුත් කරන ලද වැඩ නියෝග	587.8	197.2
එකතුව	**17,681.2**	**3,095.9**

(iii) තවද, පූර්ව අනුමැතිය ලබා නොගෙන මග නැගුම මාර්ග ඉදිකිරීම් සහ යන්ත්‍රෝපකරණ සමාගමට නිකුත් කරන ලද වැඩ නියෝගවල වටිනාකම සහ මාර්ග පුළුල් කිරීමේ සහ වැඩි දියුණු කිරීමේ කොන්ත්‍රාත් සඳහා අවශ්‍ය අනුමැතිය ලබා නොගෙන නිකුත් කරන ලද විවලතා නියෝගවල වටිනාකම රු.මිලියන 19,368.4 ක් වූ අතර 2015 දෙසැම්බර් 31 දිනට එයින් ගෙවූ අගය රු. මිලියන 3,281.9 ක් විය. ඒ අනුව නිමකළ වැඩවල වටිනාකම ගණනය කිරීමෙන් පසු 2015 දෙසැම්බර් 31 දිනට උපචිත බිල්පත්වල වටිනාකම අධිකාරියේ මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් කර නොතිබූ අතර මේ සම්බන්ධයෙන් මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කිරීමට ද ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.

4.7 මානව සම්පත් කළමනාකරණය

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) සේවක සංඛ්‍යාව

මේ සම්බන්ධයෙන් පහත සඳහන් කරුණු නිරීක්ෂණය විය.

(i) 2015 දෙසැම්බර් 31 දිනට අධිකාරියේ සේවක සංඛ්‍යා තත්ත්වය අනුව, තනතුරු 12 ක පුරප්පාඩු 710 ක් හා වෙනත් තනතුරු 08 ක අතිරික්ත 1080 ක් පැවති බව අනාවරණය විය.

(ii) ජ්‍යෙෂ්ඨ කළමනාකාර සේවයේ පුරප්පාඩු 06 ක්, තාක්ෂණික සේවයේ පුරප්පාඩු 144 ක් සහ ලිපිකරු හා සමාන්තර සේවාවල පුරප්පාඩු 28 ක් විගණනයේදී නිරීක්ෂණය විය. මෙම තත්ත්වය අධිකාරියේ කාර්යසාධනය කෙරෙහි අහිතකරව බලපා ඇති බව නිරීක්ෂණය විය.

(iii) අත්‍යවශ්‍ය තනතුරු සඳහා සුදුසුකම්ලත් නිලධාරීන්ගේ හිඟයක් සහිතව අධිකාරියේ පාලම් සැලසුම් අංශය ක්‍රියාත්මක වන බව නිරීක්ෂණය විය. ඒ අනුව 2015 දෙසැම්බර් 31 දිනට ප්‍රධාන කළමනාකාර තනතුරු 07 ක පුරප්පාඩු පැවතුණි.

(ආ) වෙනත් ආයතන සඳහා ලබාදුන් අධිකාරියේ සම්පත්

2003 ජුනි 02 දිනැති අංක පීඊඩී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍ර ලේඛයේ 8.3.9 වගන්තිය ප්‍රකාරව රේඛීය අමාත්‍යාංශය හෝ වෙනත් කිසිදු රාජ්‍ය ආයතනයක් වෙනුවෙන් රාජ්‍ය ව්‍යවසායයක් විසින් වියදම් දැරීම හෝ එහි සම්පත් යෙදවීම (මානව සම්පත් ඇතුළත්ව) සඳහා අවසර ලබා දී නොමැත. කෙසේ වුවද මෙයට පටහැනිව අධිකාරිය විසින් එහි කාර්ය මණ්ඩලයේ 260 දෙනෙකු උසස් අධ්‍යාපන සහ මහාමාර්ග අමාත්‍යාංශයට මුදා හැර තිබූ අතර පසුව එම සේවකයන් සමාලෝචිත වර්ෂය තුළදී නැවත මාර්ග සංවර්ධන අධිකාරියට අනුයුක්ත කර තිබුණි.

(ඇ) ප්‍රසම්පාදන අංශයේ කාර්යසාධනය

(i) මාර්ග සංවර්ධන අධිකාරියේ ප්‍රසම්පාදනයන් විධිමත් හා කාර්යක්ෂම ආකාරයෙන් සිදු කිරීමේ අරමුණ සහිතව ප්‍රසම්පාදන අංශය පිහිටුවා තිබුණි. කෙසේ වුවද, මෙම අංශයේ කාර්යයන් පිළිබඳ දුර්වල පාලනය හේතුවෙන් එහි අපේක්ෂිත කාර්යසාධනය සිදු වී නොමැති බව නිරීක්ෂණය විය.

(ii) එම අංශයේ අනුමත සේවක සංඛ්‍යාව 36 ක් වුවද, තථ්‍ය සේවක සංඛ්‍යාව 15 ක් විය. තවද ප්‍රධාන ඉංජිනේරු, තවත් ඉංජිනේරුවරයන් 03 දෙනෙකු සහ තාක්ෂණික නිළධාරියෙකු වැනි අත්‍යවශ්‍ය තනතුරු සඳහා 2014 වර්ෂයේ සිට පුරප්පාඩු පැවතුණි.

(iii) රු.මිලියන 31.32 ක් වූ ලිපිද්‍රව්‍ය ප්‍රසම්පාදනයන් පමණක් ප්‍රසම්පාදන අංශය විසින් සමාලෝචිත වර්ෂය තුළ සිදුකර තිබුණි. වෙනත් ප්‍රසම්පාදනයන්, ප්‍රසම්පාදන අංශයේ සේවය ලබා නොගෙන අදාළ වෙනත් අංශ මඟින් සිදුකර තිබුණි.

5. ගිණුම් කටයුතුභාවය හා යහපාලනය

5.1 සංයුක්ත සැලැස්ම

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) 2003 ජුනි 02 දිනැති "යහපාලනය සඳහා රාජ්‍ය ව්‍යාපාර සඳහා වූ මාර්ගෝපදේශ" අංක: පීඊඩී/12 දරන චක්‍රලේඛයේ 5.1.3 ඡේදයට අනුව, සංයුක්ත සැලැස්මේ යාවත්කාලීන කරන ලද පිටපත් එක් එක් මුදල් වර්ෂය ආරම්භ වීමට දින 15 ට පෙර විගණකාධිපතිවරයාට ඉදිරිපත් කළ යුතුය. කෙසේ වුවද 2014 – 2018 දක්වා

කාලපරිච්ඡේදය සඳහා සංයුක්ත සැලැස්ම විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කර තිබුණේ මාස 12 ක ප්‍රමාදයකින් පසු එනම් 2015 ජනවාරි 01 දිනදීය.

තවද, සංයුක්ත සැලැස්ම කාලීනව සමාලෝචනය කිරීම සඳහා පියවර ගෙන නොතිබුණි. 2015 – 2019 දක්වා කාලපරිච්ඡේදය සඳහා සංයුක්ත සැලැස්ම අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කර විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් තර තිබුණේ මාස 12 ක ප්‍රමාදයකින් පසු 2016 ජනවාරි 04 දින වන අතර 2016 - 2020 දක්වා කාලපරිච්ඡේදයට අදාළ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කළ සංයුක්ත සැලැස්ම මාස 02 ක ප්‍රමාදයක් සහිතව 2016 පෙබරවාරි 29 දින විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කර තිබුණි.

(ආ) ඉහත චක්‍රලේඛය අනුව, එක් එක් අංශයේ මානව සම්පත් අවශ්‍යතාවයන් සංයුක්ත සැලැස්මේ අන්තර්ගත කළයුතු වේ. කෙසේ වුවද, තථ්‍ය අවශ්‍යතාවන් ඇගයීමකට ලක්කර මානව සම්පත් අවශ්‍යතාවන් පිළිබඳ විස්තර සංයුක්ත සැලැස්මට අන්තර්ගත කිරීමට කටයුතු කර නොතිබුණි.

5.2 ක්‍රියාකාරී සැලැස්ම

2015 මුදල් වර්ෂය සඳහා ක්‍රියාකාරී සැලැස්මට අනුකූලව පිළියෙල කරන ලද කාර්යසාධන වාර්තාව අධිකාරියේ අධ්‍යක්ෂ මණ්ඩලය වෙත ඉදිරිපත් කර නොතිබුණි. තවද, වාර්ෂික කාර්යසාධන වාර්තාව අධ්‍යක්ෂ මණ්ඩලයේ සමාලෝචනය සඳහා ඉදිරිපත් කිරීමේ ක්‍රමවේදය අධිකාරිය විසින් අනුගමනය කර නොතිබුණි.

5.3 අයවැය පාලනය

2015 වර්ෂය සඳහා අයවැය ලේඛනය අවස්ථා 02 දී සංශෝධනය කර තිබුණු අතර අවසාන සංශෝධිත අයවැය ලේඛනය සඳහා 2015 දෙසැම්බර් 21 දින අධ්‍යක්ෂ මණ්ඩලයේ අනුමැතිය ලබාගෙන තිබුණි. සුදුසු සහ ඵලදායී අයවැය පාලන ක්‍රමයක් නොමැති වීම හේතුවෙන් අධිකාරියේ සංශෝධිත අයවැය සහ තථ්‍ය ආදායම සහ වියදම අතර සැළකිය යුතු විචලනයන් නිරීක්ෂණය විය. එම නිසා කළමනාකරණ පාලනයන් සඳහා ඵලදායී උපකරණයක් ලෙස අයවැය ක්‍රමය උපයෝගී කරගෙන නොතිබුණු බව නිරීක්ෂණය විය.

6 පද්ධති හා පාලනයන්

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන අඩුපාඩු අධිකාරියේ සභාපතිවරයාගේ අවධානයට වරින් වර යොමු කරන ලදී. පහත සඳහන් පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමු විය යුතු වේ.

පාලන ක්ෂේත්‍රය		විගණන නිරීක්ෂණයන්
(අ)	ගිණුම්කරණය	(i) ගිණුම් ප්‍රතිපත්ති හෙළිදරව් කිරීම, වගකීම් වර්ගීකරණය (ජංගම හා ජංගම නොවන) සහ උපචිත වියදම් ගිණුම්ගතකරණය.
		(ii) සම්බන්ධිත පාර්ශවයන් සමඟ ගණුදෙනු හෙළිදරව් කිරීම. (මගනැගුම් සමාගම් සහ එක්ස්ප්‍රස්වේ ට්‍රාන්ස්පෝර්ට් සමාගම සමඟ ගණුදෙනු).
		(iii) වත්කම් පැවරීම් සහ අපහරණය කිරීම් සම්බන්ධයෙන් ගිණුම්කරණ පිළියම් සහ ලෙජර් ගිණුම් සඳහා විස්තරාත්මක උපලේඛන පිළියෙල කිරීම.
(ආ)	කොන්ත්‍රාත් පරිපාලනය	(i) අදහස් කරනු ලැබූ අරමුණු සඳහා ඵලදායී අරමුදල් උපයෝජනය, මූල්‍ය යෝජනා ඇගයීම, වැඩ නියෝග සඳහා පූර්ව අනුමැතිය ලබා ගැනීම, වැඩ සටහනට අනුව ඉදිකිරීම් වැඩ නිම කිරීම.
		(ii) අදහස් කරනු ලැබූ අරමුණු සඳහා අරමුදල් උපයෝජනය.
(ඇ)	ඉන්වෙන්ට්‍රි පාලනය	යල්පැනගිය ඉන්වෙන්ට්‍රි අයිතමයන් අපහරණය.
(ඈ)	වත්කම් කළමනාකරණය	ඉඩම් උපයෝජනය.

ඇ/ක. එච්. එම්. ගාමිණී විජේසිංහ
විගණකාධිපති

එච්.එම්. ගාමිණී විජේසිංහ
විගණකාධිපති

RDA/DF/434/2015

2016.09.21

විගණකාධිපති,
විගණකාධිපති දෙපාර්තමේන්තුව,
අංක 306/72, පොල්දූව පාර,
බත්තරමුල්ල.

2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා මාර්ග සංවර්ධන අධිකාරියේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව1971 අංක 38 දරණ මුදල් පණතේ 14(2) වගන්තියට අනුව විගණකාධිපතිවරයාගේ වාර්තාව පිළිබඳව අදහස් දැක්වීම.

උක්ත විෂය පිළිබඳ ඔබේ අංක RT/D/RDA/01/15/01 දරණ ලිපිය පිළිබඳවයි.

ඔබගේ වාර්තාවේ සඳහන් නිරීක්ෂණ පිළිබඳව වෙන් වෙන් වශයෙන් අපගේ අදහස් මේ සමඟ අමුණා එවමි.

එන්.ආර්. සූරියාරච්චි,
සභාපති,
මාර්ග සංවර්ධන අධිකාරිය.

පිටපත : විගණන අධිකාරි,
රජයේ විගණන අංශය,
සෙන්සිරිපාය,
බත්තරමුල්ල.

2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා මාර්ග සංවර්ධන අධිකාරියේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව1971 අංක 38 දරණ මුදල් පණතේ 14(2) වගන්තියට අනුව විගණකාධිපතිවරයාගේ අදහස් දැක්වීම.

ඡේද අංකය	විගණන වාර්තාව	පිළිතුර
2.2 2.2.1	**මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස්.** **ශ්‍රී ලංකා රාජ්‍ය ආයතන ගිණුම් ප්‍රමිති (ශ්‍රීලරාඅගිප්‍ර)**	
a	පහත සඳහන් නිරීක්ෂණ සිදු කරන ලදි.	
i	**ශ්‍රීලරඅගිප්‍ර 1 - මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම:** ගණුදෙනු හා සිද්ධීන් ඒවා සිදුවන අවස්ථාවේදී හඳුනාගෙන අදාල කාලසීමාවේ වාර්තා කල යුතු වුවත්, දේශීය බැංකු අරමුදල් සැපයු මාර්ග ව්‍යාපෘතියට අදාල වර්ෂයේදී ගෙවීමේ අන්තර් ගෙවීම් සහතික සඳහා නොගෙවන ලද රු.මිලියන 104,004 ක මුදලක් කල් දමන ලද වියදම් ලෙස ගිණුම් ගත කරන ලද අතර, කොන්ත්‍රාත්කරුවන් විසින් ඉදිරිපත් කරන ලද රු.මිලියන 333.62ක ගෙවීම් සහතික මෙතෙක් ගෙවා නොමැති අතර, ගිණුම්ගත කර නොමැත. (RCT/B/RDA/2015/PA/AQ-37 - 29 April 2016)	I. අ.ගෙ.ස. NO 25 රු.මිලි. 89.6 මෙම බිල්පත 2016 ජනවාරි අවසානයේ දී ඉදිකිරීම් අංශයට ලැබී තිබුනි. අ.ගෙ.ස. ලැබුණු විට 2015 මුදල් අංශය මේ සම්බන්ධයෙන් අවශ්‍ය ගිණුම් කටයුතු කර ඇත. II. අ.ගෙ.ස. 11 රු.මිලි. 10.1 මෙම බිල්පත 2015 වර්ෂයේදී නිරවුල් කර ඇති අතර 2015 වර්ෂයේදී ගිණුම් ගත කරන ලදි. III. අ.ගෙ.ස. 19 රු.මිලි. 131 රු.මී. 131 න් රු.මී. 68.1 ක මුදලක් 2015 වර්ෂයේදීම ගිණුම්ගත කර ඇති අතර ශේෂය නිරවුල් කිරීම 2016 දී සිදු කරන ලදි. IV. අ.ගෙ.ස. 25 රු.මිලි. 49.3 මෙම බිල්පත ඉදිකිරීම් අංශයට 2016 ජනවාරි මාසය අවසානයේදී ලැබුණි. මුදල් අංශය විසින් 2015 දීම අ.ගෙ.ස. ලැබුණු විට ගිණුම් කටයුතු නිම කරන ලදි.
ii	වාර්තා කරන දිනට පසුව, මාස 12 ක කාලය තුල වත්කමක් උපචිත කිරීමට අපේක්ෂා කරන්නේ නම් හෝ වගකීමක් නිරවුල් කිරීමට නියමිතව තිබේ නම් මෙය ජංගම වත්කමක් හෝ වගකීමක් ලෙස වර්ගීකරණය කළ යුතුය. එබැවින්, කොන්ත්‍රාත්කරුවන් විසින් 2016 වර්ෂයේ ඉදිරිපත් කරන ලද බිල්පත් වලින් අඩු කල යුතු වත්කම්	ගෙවීම් කරන අවස්ථාවේදී සම්පත් මෙහෙවුම් අත්තිකාරම් අයකර ගන්නා ලද අතර වර්ෂය තුල මෙම ගෙවීම් නිරවුල් කිරීමට හැකි වේ යැයි අපේක්ෂා කිරීම දුෂ්කරය. එබැවින් මෙය ජංගම නොවන වත්කම් ලෙස වර්ගීකරණය කර ඇත.

	මෙහෙය වීමේ අත්තිකාරම් ජංගම වත්කම් ලෙස හඳුනාගෙන ගිණුම්ගත කළ යුතුව ඇත. ඒ කෙසේ නමුත්, පළාත් කාර්යාලවලට සහ ගෙවීම් ඒකක වලට ලබාදුන් රු.59,598,529 ක මුදලක් ජංගම වත්කම් යටතේ සඳහන් කර ඇති අතර, 2014 වර්ෂයේ හා අනුගාමී වර්ෂවල එම ඒකකවලට ගෙවන ලද රු.12,237,389 ක අත්තිකාරම් මුදලක් විමසුමට ලක්වූ වර්ෂයේ මූල්‍ය ප්‍රකාශවල ජංගම නොවන වත්කම් යටතේ සඳහන් කර ඇත. (RCT/B/RDA/2015/PO/AQ-44 – 16 මැයි 2016.	
iii	රු. 4,858,982,805 හා රු. 3,331,018,091 රඳවා ගැනීමේ මුදලක් පිළිවෙලින් ජංගම හා ජංගම නොවන වත්කම් වශයෙන් වර්ගීකරණය සඳහා ප්‍රමාණවත් තොරතුරු උපලේඛනවල ඉදිරිපත් කර නොතිබුණි. RCT/B/RDA/2015/NA/AQ-53- 2016 ජූනි 13	ඉදිරියේදී ප්‍රමාණවත් තොරතුරු සපයනු ලැබේ.
b	**<u>ශ්‍රීලරාඅගිප්‍ර - 3</u>** දේශීය බැංකු අරමුදල් ව්‍යාපෘතිය යටතේ කොන්ත්‍රාත්කරුවන්ට ගෙවන ලද මුදල් කල් දමන ලද වියදම් ලෙස සලකා තිබුණ ලද අතර ජංගම නොවන වත්කම් යටතේ, ගිණුම්ගත කරන ලදි. වර්ෂය සඳහා ණය මුදලින් ප්‍රාග්ධන කොටස නැවත ගෙවීම කල් දමන ලද වියදම් වලට හර කරන ලද අතර, වර්ෂයේ වියදම් වශයෙන් ගිණුම් ගත කරන ලදි. මෙම ගිණුම්කරණ මූල ධර්මය මූල්‍ය ප්‍රකාශවල හෙළිදරව් කර නොතිබුණි. RCT/B/RDA/2015/PA/AQ-37- 2016 අප්‍රේල් 29	දේශීය බැංකු අරමුදල් මෙහෙයුම් සඳහා ගිණුම්කරණ කටයුතු ශ්‍රීලංරාඅගිප්‍ර අනුකූලව සිදුකෙරේ. කෙසේ නමුත් මෙම භාවිතය වෙනම සටහන් මගින් අනාවරණය කල යුතු නම් එය අනාවරණය කිරීමට කටයුතු කරනු ලැබේ.
c	**<u>ශ්‍රීලරාඅගිප්‍ර - 6</u>** අධිකාරියේ නව ප්‍රධාන කාර්යාල ගොඩනැගිල්ල ඉදිකිරීම සඳහා නාගරික සංවර්ධන අධිකාරියෙන් රු.මිලි. 6 ක වාර්ෂික බදුකුලී මත ලබා ගත් ඉඩම සඳහා 2009 දී අමාත්ය මණ්ඩල තීරණයක් මත රු. 1000/- දක්වා අඩුකර ගත හැකි විය. එසේ වුවත් කුලී ගිවිසුම ඒ අනුව සංශෝධනය කිරීමට පියවර ගෙන නොතිබුණු අතර එහි ප්‍රතිඵලයක් වශයෙන් 2015 මූල්‍ය ප්‍රකාශවල ගෙවිය යුතු බදුකුලී හා පොලී පිරිවැය ලෙස පිළිවෙලින් රු. 466,561,476 සහ රු. 4,711,854 මුදලක් සඳහන් කර තිබුණි. කුලී ගිවිසුම සංශෝධනය කිරීමෙන් පසු මූල්‍ය ප්‍රකාශ වලට වන බලපෑම පිළිබඳව අනාවරණය කර නොතිබුණි. RCT/B/RDA/2015/NL/AQ-28- 2016 අප්‍රේල් 05	කුලී ගිවිසුම සංශෝධනය කිරීමට පියවර ගෙන ඇති අතර කුලී ගිවිසුම අත්සන් කිරීමේ අවසන් අදියරේ පවතී. සංශෝධිත කුලී ගිවිසුම සඳහා අවශ්‍ය ගැලපුම් 2016 මූල්‍ය ප්‍රකාශ වලදී සැලකිල්ලට ගනු ලැබේ.

d i	<u>ශ්‍රී ල රා අ ගි ප්‍ර - 7 - වත්කම් පිරියත හා උපකරණ</u> අධිකාරිය විසින් අඛන්ඩව භාවිතා කරන ලද රු. 972,518,740 වටිනා සම්පූර්ණයෙන් ක්ෂය කරන ලද ස්ථාවර වත්කම් ප්‍රමිතිවල විධි විධානයන්ට අනුව ප්‍රත්‍යාගණනය කර නොතිබුණි. RCT/B/RDA/2015/NL/AQ-42- 2016 මැයි 11	සම්පූර්ණයෙන් ක්ෂය කරන ලද වත්කම් පිළිබඳව තක්සේරු දෙපාර්තමේන්තුවට දැනුම් දී ඇති අතර, එම වත්කම් 2016 දී ප්‍රති තක්සේරු කිරීමට කටයුතු කරන ලදි.
ii	අධිකාරියේ වත්කම් මිලදී ගත් දින සිට ඉවත් කරන දිනය දක්වා ක්ෂය කර නොතිබුණි. අධිකාරියේ වත්කම් අත්පත් කර ගත් මාසයට පසු මාසයේ සිට ඉවත් කරන මාසය දක්වා ක්ෂය කරන ලද බවට නිරීක්ෂණය විය. මේ පිළිබඳව මූල්‍ය ප්‍රකාශවල අනාවරණය කර නොතිබුණි. RCT/B/RDA/2015/NL/AQ-42- 2016 මැයි 11	අප විසින් ශ්‍රී ල රා ගි ප්‍ර 7 හා ක්ෂය කිරීම් ප්‍රතිපත්තියට අනුකූලව කටයුතු කර ඇති අතර, ක්ෂය කිරීම් පිළිවෙතට අදාල විස්තර එකතු කිරීමට කටයුතු කරනු ලැබේ.
2.2.2 a	ගිණුම්කරණ ඌණතා පහත සඳහන් කරුණු නිරීක්ෂණය විය. 2013 – 2015 කාලය තුල දේශීය බැංකු අරමුදල් ව්‍යාපෘතියට සම්බන්ධ ව්‍යාපෘති විසින්, මිලදී ගන්නා ලද රු. 507,576,409 ක් වටිනා වත්කම්, අධිකාරියේ ගිණුම් වලට ගෙන නොතිබුණි. ඒ අනුව විමසුමට ලක්වූ වර්ෂය සඳහා මූල්‍ය ප්‍රකාශ වලට පහත සඳහන් පරිදි බලපා තිබුණි. i. ස්ථාවර වත්කම් අගය රු.මිලි. 507.58 අඩුවෙන් සඳහන් කර තිබුණි. ii. සමුච්චිත ක්ෂය කිරීම රු.මිලි. 219.51 අඩුවෙන් සඳහන් කර තිබුණි. iii. වාර්ෂික ක්ෂය කිරීම් පිරිවැය රු.මිලි. 66.56 ට අඩුවෙන් සඳහන් කර තිබුණි. iv. 2013 – 2015 කාලසීමාව තුල සමුච්චිත ක්ෂය කිරීම ගිණුම්ගත කිරීමට අපොහොසත් වීම නිසා සමුච්චිත පාඩුව රු.මිලි. 219.51 ක් අඩුවෙන් සඳහන් කර තිබුණි. v. ස්ථාවර වත්කම් මිලදී ගැනීමේ පිරිවැය කල්දැමූ වියදම්වලට එකතුකර (දේශීය බැංකු අරමුදල් ව්‍යාපෘතිය) (සටහන් 12) මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ කල් දැමුණු වියදම රු.මිලි. 507.58 ක් වැඩියෙන් සඳහන් කර තිබුණි.	අවශ්‍යතාවන්ට අනුකූලව කටයුතු කරන ලෙස දේශීය බැංකු අරමුදල් ව්‍යාපෘතියට දැනුම් දී ඇති අතර මූල්‍ය ප්‍රකාශ වලට ඇතුළත් කිරීමට පියවර ගනු ලැබේ.
b	දේශීය බැංකු ව්‍යාපෘතියට සම්බන්ධ රු.මිලි. 333.62 බිල්පත් වර්ෂය අවසානයේ නිරවුල් කොට නොතිබුණු අතර එහි ප්‍රතිඵලයක් වශයෙන්, උපචිත වියදම් හා කල් දැමුණු වියදම් රු.මිලි. 333.62 බැගින් අඩුවෙන් සඳහන් කර තිබුණි. RCT/B/RDA/2015/PA/AQ-37- 2016 අප්‍රේල් 29	රු.මි. 333.62 න් රු.මි. 78 ක් 2015 දී ගිණුම්ගත කරන ලද අතර ශේෂය 2016 දී ගිණුම් ගත කරනු ලැබේ.

c	කොන්ත්‍රාත්කරුවන්ට ගෙවීමේදී රු.1,637,301 ක වට්ටම් මුදලක් ගිණුම් ගතකර නොතිබුණි. එබැවින්, ලැබුණු වට්ටම් හා මූල්‍ය ප්‍රකාශවල සංවර්ධන හා නඩත්තු වියදම් රු. 1,637,301 බැගින් අඩුවෙන් සඳහන් කර තිබුණි. RCT/B/RDA/2015/NA/AQ-41- 2016 මැයි 11	වට්ටම් වශයෙන් ලැබුණු සම්පූර්ණ මුදල 2015 වෙනත් ආදායම් යටතේ ගිණුම්ගත කරන ලද අතර, එය සංවර්ධන හා නඩත්තු වියදම් වලට හිලව් නොකෙරිණි.
d	විදේශ අරමුදල් සැපයූ මාර්ග පුනරුත්ථාපනය කිරීමේ හා වැඩි දියුණු කිරීමේ ව්‍යාපෘති 05 කට අයත් රු. 69,800,000 වටිනාකමකට තක්සේරු කරන ලද වාහන විමසුමට ලක්වූ වර්ෂය තුලදී අධිකාරිය වෙත පවරා තිබුණු නමුත්, එම වාහනවල වටිනාකම ගිණුම් ගත කර නොතිබුණි. RCT/B/RDA/2015/NL/AQ-42- 2016 මැයි 11	ගිණුම් අවසන් කරන අවස්ථාවේදි මෙම තොරතුරු අප වෙත ලැබී නොතිබුණි. එබැවින්, අවශ්‍ය ගිණුම්කරණ ගැලපීම් සිදු කිරීමට නොහැකි විය. 2016 වර්ෂයේ මෙය ගිණුම් ගත කරනු ලැබේ.
e i	ස්ථාවර වත්කම් ඉවත් කිරීම සඳහා සිදු කරන ලද වෙන්දේසි මගින් ලැබුණු රු. 11,981,954 මුදලක් වෙනත් ආදායම් ලෙස විමසුමට ලක්වූ වර්ෂයේ මූල්‍ය ප්‍රකාශවල පෙන්වා ඇති නමුදු එවැනි වත්කම් අධිකාරිය විසින් අත්පත් කර ගත් දින සිට ඒවායේ පිරිවැය ගිණුම් ගත කොට නොතිබුණි. RCT/B/RDA/2015/NL/AQ-42- 2016 මැයි 11	මෙම විෂයාංකයන් සම්පූර්ණයෙන් ක්ෂය කර ඇත. එබැවින්, සම්පූර්ණ විකුණුම් ආදායම ඉවත් කිරීමේ ලාභ වශයෙන් ගිණුම්ගත කර ඇත.
ii	රු.15,050,000 මුදලකට තක්සේරු කරන ලද ගොඩනැගිලි 2015 වර්ෂය සඳහා ක්ෂය කර නොතිබුණි. ඒ අනුව, 2015 වර්ෂය සඳහා ක්ෂය කිරීම් පිරිවැය රු.752,500 ක් අඩුවෙන් සඳහන් කර තිබූ අතර ගොඩනැගිල්ලේ වටිනාකම රු. 752,500 ක් අඩුවෙන් මූල්‍ය ප්‍රකාශවල සඳහන් කර තිබුණු අතර ගොඩනැගිල්ලේ වටිනාකම 1,752,500 ක් වැඩියෙන් මූල්‍ය ප්‍රකාශවල සඳහන් කර තිබූ තිබුණි. RCT/B/RDA/2015/NL/AQ-42- 2016 මැයි 11	2016 දී නිවැරදි කිරීමට පියවර ගෙන ඇත.
f	මාස 06 ක් කල් ඉකුත්වූ චෙක්පත් 67 ක් අවලංගු කිරීමට පියවර ගෙන නොතිබුණු අතර, එහි ප්‍රතිඵලයක් වශයෙන් ගිණුම්වල මුදල් හා ණය හිමියන් රු. 3,903,709 බැගින් අඩුවෙන් සඳහන් කර තිබුණි. RCT/B/RDA/2015/NL/AQ-38- 2016 අප්‍රේල් 27	2016 දී අවශ්‍ය ගැලපුම් සිදුකර ඇත.
2.2.3 a	**<u>පැහැදිලි නොකරන ලද වෙනස්කම්</u>** විගණනයේදී පහත සඳහන් පැහැදිලි නොකළ වෙනස්කම් නිරීක්ෂණය විය 2018 දෙසැ. 31 දිනට මූල්‍ය ප්‍රකාශවල පෙන්වා ඇති ණය ශේෂයන් හා අදාල බැංකු විසින් තහවුරු කරන	**<u>ප්‍රාඉබැ</u>** ගිණුම් හා බැංකුව විසින් තහවුරු කරන ලද ශේෂයන් අතර වෙනසක් නොමැත. අනුකූලතාවය දැනටමත් විගණනය වෙත යවා ඇත.

<table>
<tr><td></td><td>ලද ශේෂයන් අතර, රු. 6,009,549,632 ක වෙනසක් නිරීක්ෂණය විය. තවද වෙනස්කම් වලට හේතු විගණනය වෙත පැහැදිලි කර නොතිබුණි. විස්තර පහත පෙන්වා ඇත.

<table><tr><th>ණය දෙන ආයතනය</th><th>ගිණුම් ගණන</th><th>මූල්‍ය ප්‍රකාශ වලට අනුව හා බැංකුවේ තහවුරු කිරීමට ඇති ශේෂය (රු.)</th></tr><tr><td>ජාතික ඉතිරි කිරීමේ බැංකුව</td><td>24</td><td>1,749,494,120</td></tr><tr><td>ලංකා බැංකුව</td><td>10</td><td>3,311,744,067</td></tr><tr><td>මහජන බැංකුව</td><td>04</td><td>609,140,000</td></tr><tr><td>හැටන් නැෂනල් බැංකුව</td><td>04</td><td>136,245,484</td></tr><tr><td>කොමර්ෂල් බැංකුව</td><td>03</td><td>180,467,216</td></tr><tr><td>ඩිඑෆ්සිසි බැංකුව</td><td>01</td><td>22,458,745</td></tr><tr><td>එකතුව</td><td>46</td><td>6,009,549,632</td></tr></table></td><td><u>ලංබැ</u>
මා.සං.අ. යේ ගිණුම් සහ බැංකුව විසින් තහවුරු කරන ලද ශේෂය අතර වෙනස රු.මී. 2,857.82 කි. මෙම වෙනස මතුව ඇත්තේ, බැංකුව විසින් ණය මුදල් 02 ක් තහවුරු නොකිරීම නිසාය.

<u>මහජන බැංකුව / හැටන් නැෂනල් බැංකුව / කොමර්ෂල් බැංකුව / ඩිඑෆ්සිසි බැංකුව.</u>

බැංකුව තහවුරු කල ශේෂය සහ ඉහත ගිණුම් අතර වෙනසක් නොමැත. විගණන වාර්තාවල සඳහන් වෙනස්කම් මූල්‍ය ප්‍රකාශනවල ඇති ජංගම වගකීම්වල පෙන්වා ඇත.</td></tr>
<tr><td>b</td><td>අධිවේගි මාර්ගවල පිරිවැය පෙන්වන අධිකාරියේ මූල්‍ය ප්‍රකාශ හ ව්‍යාපෘති ඒකක තුනක මූල්‍ය ප්‍රකාශවල අනුරූපි පිරිවැය අතර රු.533,003,370 ක වෙනසක් නිරීක්ෂණය විය.
RCT/B/RDA/2015/NL/AQ-42- 2016 මැයි 11</td><td>අපගේ ගිණුම්වලට අනුව ගිණුම්ගත නොකල අධිවේගි මාර්ග ව්‍යාපෘති පිරිවැය රු.මී. 95 ක් වන අතර එය 2016 වර්ෂයේදී ගිණුම් ගත කෙරේ.</td></tr>
<tr><td>c</td><td>අධිකාරියේ ප්‍රාදේශීය කාර්යාල 2 ක මූල්‍ය ප්‍රකාශ වල සහ බැංකු ශේෂයන් අතර රු. 8,828,617 වෙනසක් නිරීක්ෂණය විය.
RCT/B/RDA/2015/NL/AQ-38- 2016 අප්‍රේල් 27</td><td>බැංකු සැසඳුම් ගැලපීම සඳහා පසුව සටහන් යොදන ලදි.</td></tr>
<tr><td>e</td><td>මගනැගුම සමාගම විසින් මූල්‍ය ප්‍රකාශවල පෙන්වා ඇති ශේෂය හා අදාල සමාගම් විසින් තහවුරු කර ඉදිරිපත් කරන ලද ශේෂයන්ට අනුව රු. 635,840,889 ක වෙනසක් නිරීක්ෂණය විය.
RCT/B/RDA/2015/CH/AQ-52- 2016 ජුනි 13</td><td>මෙම සමාගම් තුන සම්බන්ධයෙන් සැලකිය යුතු කාලයක් සඳහා සැසඳුම් නොකරන ලද අතර, අවශ්‍ය ගැලපුම් සිදු කිරීම සඳහා සැසඳුම් සිදු කෙරෙමින් පවතී.</td></tr>
<tr><td>f</td><td>දේශීය බැංකු අරමුදල් ව්‍යාපෘතියෙන් ලබාගත් ණය මුදල් වලින් 2015 දෙසැ. 31 වන විට ශේෂය රු.මී. 126,950.94 වුවත් ප්‍රති ගෙවීම් අඩු කිරීමෙන් පසුව අධිකාරියේ මූල්‍ය ප්‍රකාශවල රු.මී. 126,918.51 ලෙස සඳහන් කර තිබුණි. ඒ අනුව ගෙවිය යුතු ණය ශේෂයේ රු.මී. 32.43 ක වෙනසක් නිරීක්ෂණය විය.
RCT/B/RDA/2015/PA/AQ-32- 2016 අප්‍රේල් 26</td><td>ඩිඑෆ්සිසි බැංකුවේ නිවැරදි ණය ශේෂය වන රු.1,209.48 වැරදීමකින් රු. 1,241.94 ලෙස කියැවෙන අතර එහි ප්‍රතිඵලයක් ලෙස මෙම ශේෂය කැපී පෙනෙන ලද අතර, එය ගිණුම්වල යථා වෙනසක් නොවේ.</td></tr>
<tr><td>2.2.4</td><td><u>ලැබීම් හා ගෙවීම් පිළිබඳ ගිණුම්</u>
පහත සඳහන් නිරීක්ෂණයන් සිදු කරන ලදි.</td><td></td></tr>
</table>

	<u>සේවා දායක තැන්පතු</u> සේවා දායක වැඩ 200 කට සම්බන්ධ රු.494,608,295 ක සේවා දායක තැන්පතු අවු. 1 සිට 7 කාලසීමාවක නිරවුල් කර නොතිබුණි. තවද 2010 සි 2014 දක්වා කාලය තුල තැන්පත් කල දින සිට සේවා දායක ගිණුම් 119 කට සම්බන්ධ රු.227,865,985 මුදලක් නොවෙනස්ව තිබුණි. RCT/B/RDA/2015/NA/AQ-30- 2016 අප්‍රේල් 11	සේවා දායක තැන්පතු ගිණුම් සැසඳුම් කිරීමට අදාල නිලධාරීන්ට උපදෙස් දුන් අතර, කිසියම් අරමුදලක් මා.න.හා.අ.න් විසින් භාවිතා කර තිබුණි නම් එය ආපසු ආදායමට ලියා තැබීම සඳහා නිවැරදි කිරීම් පියවර ගනු ලැබේ.
b	**<u>ආරක්ෂණ තැන්පතු</u>** 1986 වර්ෂයේදී කොන්ත්‍රාත්කරුවන් 111 දෙනෙකුගෙන් ලබාගත් රු. 2,278,159 වන ආරක්ෂණ තැන්පතු 2018 දෙසැම්බර් දක්වා නිරවුල් කිරීමට පියවර ගෙන නොතිබුණි. RCT/B/RDA/2015/NA/AQ-29 2016 අප්‍රේල් 08	මෙම ආරක්ෂණ තැන්පතු කොන්ත්‍රාත් ප්‍රදානය කරන අවස්ථාවේ කොන්ත්‍රාත් කරුවන්ගෙන් ලබාගෙන ඇත. කෙසේ නමුත්, මෙම ආරක්ෂණ තැන්පතු නිදහස් කිරීම කොන්ත්‍රාත්කරුවන්ගේ ඉල්ලීම මත සිදු කෙරෙමින් පවතී. ඇතැම් කොන්ත්‍රාත්කරුවන් මොවුන්ගේ තැන්පතු මුදල් ඉල්ලා නොමැති අතර, ඇතැම් කොන්ත්‍රාත්කරුවන් පොලි භාගය සමඟ ගෙවන ලෙස විවාදාත්මකව ඉල්ලා ඇත.
c i	**<u>ණයගැතියන්</u>** 2012, 2013, 2014 හා 1987 වර්ෂ වලට සම්බන්ධ ජංගම වත්කම් වලට ඇතුළත් කර තිබුණු රු. 7,368,162,377 ක ණය මුදලක් ණයගැතියා ගෙන් අයකර ගැනීමට කඩිනම් පියවර ගෙන නොතිබුණි.	රු. 7,368,162,377 මුදලට වෑ.ක.ඒ. ලැබිය යුතු ජා.ඉ.බැ. ණය හා ආර්ථික සංවර්ධන අමාත්‍යාංශයෙන් ලැබීම් ද අයත් වේ. වෑ.ක.ඒ. යෙන් ලැබිය යුතු මුදල් නිරවුල් කිරීම ජා.ඉ.බැ. අරමුදල සඳහා ප්‍රතිපාදන ලැබුණු අවස්ථාවේදී සිදු කරනු ලැබේ. ආර්ථික සංවර්ධන අමාත්‍යාංශයෙන් වන ලැබීම් පිළිබඳ විස්තර ගෙවීම් කිරීම සඳහා අමාත්‍යාංශ යෙන් ලැබුනු උපදෙස් මත විශේෂ කමිටුවකට යොමු කරන ලදි. ඉතිරිව පවත්නා රු.බි. 7.3 ක ශේෂය වෑ.ක.ඒ. ජංගම ගිණුමට සම්බන්ධ අතර, එය නොකඩවා ක්‍රියාකාරීව පවතී.
ii	රජයේ අමාත්‍යාංශ හා මණ්ඩලවල ඉදිකිරීම් කටයුතු වලට සම්බන්ධව 2012 සිට 2014 කාලය සඳහා අධිකාරියට ලැබිය යුතු රු. 1.175,083,319 මුදල අයකර ගැනීමට කඩිනම් පියවර ගෙන නොතිබුණි. RCT/B/RDA/2015/PO/AQ-34 - 2016 අප්‍රේල් 26	අදාල අධිකාරියෙන් ලැබිය යුතු මුදල් අයකර ගැනීමට පියවර ගෙන තිබේ.
d i	**<u>තැන්පතු හා අත්තිකාරම් ගෙවීම්</u>** **<u>සේවා හා කුලී අත්තිකාරම්</u>** විමසුමට භාජනය වූ වර්ෂය අවසානයේ 2001-2014	ප්‍රධාන වශයෙන් මෙම තැන්පතු

	කාලය තුල රජයේ ආයතන 8 ක් හා පුද්ගලයන්ගේ රු. 7,405,680 ක තැන්පත් මුදල් නිරවුල් කිරීමට පියවර ගෙන නොතිබුණි. RCT/B/RDA/2015/PO/AQ-56 - 2016 ජුනි 14 2009 – 2014 හා 2008 ට පෙර කාලසීමාව තුල සිදු කරන කුලී තැන්පතු මුදල් රු. 6,494,948 වෙනුවෙන් අදාල කාර්යාල අවශ්‍යතාව හඳුනා ගෙන නොතිබුණු අතර, 2015 දෙසැ. 31 වන තුරුත් අයකර ගැනීමට පියවර ගෙන නොතිබුණි. RCT/B/RDA/2015/PO/AQ-56 - 2016 ජුනි 14	වටිනාකම් ල.වි.බ. හා ජජභාජමට අයත් වේ. දැනට මෙම තැන්පතු විශ්ලේෂණය කිරීමේ ක්‍රියාවලියක යෙදී සිටින අතර දිගුකාලීන ස්වභාවයේ තැන්පතු හැර අනෙකුත් තැන්පතු අයකර ගැනීමට කටයුතු කරනු ලැබේ. පහත සඳහන් පියවරයන් ගන්නා ලදි • රු. 937,380 ක මුදල දැනටමත් නිරවුල් කර ඇත. • රු. 2,802,000/- මුදල සඳහා ගිවිසුම් ක්‍රියාත්මක වෙමින් පවතී • රු. 2,755,568 ක මුදල සඳහා නීතිමය පියවර ගනු ලැබේ.
ii	**<u>කොන්ත්‍රාත් අත්තිකාරම්</u>** 1987 මාර්ග නඩත්තුව හා ඉදි කිරීමට අදාලව දෙන ලද රු. 80,000 ක අත්තිකාරම් මුදලක් නිරවුල් කිරීමට 2015 දෙසැ. 31 වන තුරුත් පියවර ගෙන නොතිබුණි. RCT/B/RDA/2015/PO/AQ-56 - 2016 ජුනි 14 සැපයුම්කරුවන්ට හෝ කොන්ත්‍රාත්කරුවන්ට ලබා දෙන අත්තිකාරම් අදාල කොන්තාත් කාලසීමාව තුලදී අයකර ගත යුතු වුවද, 2005- 2014 යන කාලසීමාව තුල සැපයුම්කරුවන්ට හෝ කොන්ත්‍රාත්කරුවන්ට දෙන ලද රු.27,402,432 අත්තිකාරම් මුදල් විමසුමට ලක්වූ වර්ෂය දක්වා අවු. 8 කට වැඩි කාලයක් තුල අයකර ගෙන නොතිබුණි. RCT/B/RDA/2015/PO/AQ-48 - 2016 මැයි 27	මේවා කොන්ත්‍රාත් අත්තිකාරම් නොවේ. මා න කො. විසින් තබන ලද තැන්පතු වේ. මා.න.කො. 04 දෙනෙකුගෙන් 02 ක් තැන්පතු පොලී ඉල්ලා නඩු පවරා ඇති බැවින් උසාවිය නඩු පවරා ඇති අතර, උසාවිය විසින් අවසාන තීරණය දෙන තුරු සිටින අතර, අනෙකුත් අය විසින් හිමිකම් ඉල්ලා නොමැත. රු.මි. 27.4 න් ර්.මි.15.8 ජානිසංඅ ට නිවාස ව්‍යාපෘති සඳහා ගෙවන ලද අත්තිකාරම් මුදලට සම්බන්ධය. මා.සං.අ. විසින් මෙම අත්තිකාරම් ආපසු ලබා ගැනීම සඳහා අදාල නිලධාරීන් සමඟ ගත් පියවර අසාර්ථක වුවද අඛන්ඩව පියවර ගනිමින් සිටී. මෙම මුදල් ආපසු ලබා ගැනීම සඳහා අදාල අධිකාරින් සමඟ ලිපි ගණුදෙනු කරමින් පවතී. මා.සං..අ. අඹන්පොල් ගල් ඇඹරුම් යන්ත්‍රාගාරය වෙනුවෙන් රු.මි. 2 ක මුදලක් වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව වෙත 2015 දී ගෙවන ලදි. කෙසේ නමුත් මෙම ගල් ඇඹරුම් යන්ත්‍රාගාරයෙන් අපේක්ෂිත නිමැවුම් නොලැබුණි. එහි ප්‍රතිඵලයක් ලෙස මෙම තැන්පතුව නොවෙනස්ව පවතී. අනෙකුත් අත්තිකාරම් ක්‍රමිකව නිරවුල් කිරීමට පියවර ගෙන ඇත.
iii	**<u>වෙනත් අත්තිකාරම්</u>** දේශීය බැංකු ව්‍යාපෘතිය විසින් ජා.ඉ.බැ. වෙන් ලබා	දේශීය බැංකු අරමුදල් ව්‍යාපෘතියේ ඉතිරි

	ගන්නා ලද ණය මුදලක් මහාමාර්ග හා ආයෝජන ප්‍රවර්ධන අමාත්‍යාංශය (දැන් උසස් අධ්‍යාපන හා මහාමාර්ග) වෙත දෙන ලද රු. 3,740,000,000 මුදල 2015 දෙසැම්බර් 31 දින වන තෙක් අයකර ගැනීමට පියවර ගෙන නොතිබුණි. RCT/B/RDA/2015/PO/AQ-56 - 2016 ජුනි 14	වැඩ නිම කිරීමට වෙන්කර තිබුණු මුදල් වෙනත් වැඩ සඳහා භාවිතා කිරීම නිසා භාණ්ඩාගාරය විසින් වෙනම වැය ශීර්ෂයක් වෙන්කර තිබුණු අතර 2015 සිට අද දක්වා රු.බි. 10.4 ක මුදලක් අධිකාරියට ලැබුණි. ජා.ඉ.බැ. ණය මුදල සම්පූර්ණයෙන් ලැබුණු විට මා.සං.අ. යෙන් මෙම අත්තිකාරම් හිලව් කිරීමට අවශ්‍ය පියවර ගනු ලැබේ.
iv	**<u>වැඩ ආරම්භක අත්තිකාරම්</u>** "මගනැගුම" මාර්ග ඉදිකිරීම් හා උපකරණ සමාගම වෙත 2013 හා 2014 වර්ෂවල ප්‍රදානය කරන ලද රු. 11,478,909 වන අත්තිකාරම් මුදල් විමසුමට ලක්වූ වර්ෂය තුලද අයකර ගෙන නොතිබුණි. RCT/B/RDA/2015/CH/AQ-33 - 2016 අප්‍රේල් 20 2014 වර්ෂය තුල කොන්ත්‍රාත්කරුවන් 05 දෙනෙකුට 2013 සහ 2014 වර්ෂවලදී ප්‍රදානය කරන ලද රු. 71,100.621 වැඩ ආරම්භක අත්තිකාරම් මුදලක් කාර්ය නිම කිරීමෙන් පසුව වහාම නිරවුල් කල යුතුව තිබුණද 2015 දෙසැ. 31 වන විටත් නිරවුල් කර නොතිබුණි. RCT/B/RDA/2015/PO/AQ-56 - 2016 ජුනි 14	ශේෂ සැසඳීමෙන් පසුව 2016 වර්ෂය තුල මෙම අත්තිකාරම් නිරවුල් කිරීමට කටයුතු කරනු ලැබේ. නිරවුල් කිරීමේ ක්‍රියාවලිය සිදු කරමින් පවතී. කෙසේ නමුත් රු.මි.71 ක මුදලින් රු.මි. 70 ක්ම මාර්ග පුළුල් කිරීමේ හා වැඩි දියුණු කිරීමේ අත්තිකාරම් වලට අයත්ය. ප්‍රගතියට අනුව ගෙවීම් කරන අතර නිරවුල් කිරීම් කරන ලෙස අදාල නිලධාරින්ට උපදෙස් දී ඇත.
v	**<u>සම්පත් මෙහෙයවීමේ අත්තිකාරම්</u>** 2014 වර්ෂයේ දැයට කිරුළ ව්‍යාපෘතිය වෙනුවෙන් පළාත් මාර්ග සංවර්ධන අධිකාරියට ප්‍රදානය කරන ලද රු.මි. 2000 ක සම්පත් මෙහෙයවීමේ අත්තිකාරම් මුදල අය කිරීමට 2016 ජුනි 30 වන විටත් කඩිනම් පියවර ගෙන නොතිබුණු බවට අනාවරණය විය. RCT/B/RDA/2015/PO/AQ-44 - 2016 මැයි 16 2001 සිට 2013 දක්වා කාලය තුල කොන්ත්‍රාත් 34 ක් සඳහා ගෙවන ලද රු. 1,119,966,845 ක සම්පත් මෙහෙයවීමේ අත්තිකාරම් මුදල කඩිනම් පියවර ගෙන නොතිබුණි. අත්තිකාරම් අයකර ගැනීම කොන්ත්‍රාත්කරු විසින් අතහැර දැමීම අනුමත නොකරන ලද විවිධාන් හා බිල්පත් ඉදිරිපත් කිරීම ප්‍රමාදය වැනි හේතු මත ප්‍රමාද වී තිබුණි.	නිරවුල්කිරීමේ බිල්පත් ලබා ගැනීම සඳහා ප.මා.සං.අ. යේ අදාල නිලධාරීන් සමඟ සාකච්ඡා කීපයක් පවත්වා ඇත. සම්පූර්ණ මුදලින් රු.මි. 800 ක් නිරවුල් කිරීමට කටයුතු කර ඇත. ශේෂය නිරවුල් කිරීමට 2016 දී කටයුතු කරනු ලැබේ. ර්.මි. 717 ක අත්තිකාරම් මුදලින් බි.1.1 දැනටමත් නිරවුල් කර ඇත. රු.මි. 19.6 ක් අයකර ගැනීමට නීතිමය කටයුතු කර ඇති අතර, ඉදිරිපත් කරන ලද බිල්පත් වලින් රු.මි. 383 ක් අයකර ගනිමින් පවතී.
Vi	**<u>මිලදී ගැනීමේ අත්තිකාරම්</u>** සැපයුම්කරුවන්ට ලබාදෙන ලද අත්තිකාරම් මුදල්	මෙම අත්තිකාරම් විවිධ දෙපාර්තමේන්තු

	කාර්ය සම්පූර්ණ වීමෙන් පසුව අයකර ගෙන තිබිය යුතු නමුදු, 2011 සිට 2014 දක්වා කාලය තුල සැපයුම්කරුවන්ට ගෙවන ලද රු. 33,631,574 ක අත්තිකාරම් මුදල්, අවු. 5 ක් තුල සහ විමසුමට භාජනය වූ අවුරුද්ද තුලද අයකර ගෙන නොතිබුනි. RCT/B/RDA/2015/PO/AQ-48 - 2016 මැයි 27	වල නිලධාරීන් විසින් ඉල්ලා ඇති අතර මුදල් නිරවුල් කරන ලෙස ඔවුන් වෙත දැනුම් දී ඇත.
i	**<u>ගෙවිය යුතු රඳවා ගන්නා මුදල්</u>** කොන්ත්‍රාත් 1073 කට සම්බන්ධ රු.973,394,696 රඳවා ගැනීමේ මුදලක් අවු. 3 ක සිට අවු. 10 ක කාලයක් තුල නිරවුල් කර නොතිබුණි. RCT/B/RDA/2015/NA/AQ-53 - 2016 ජුනි 13	මෙම සමස්ත මුදලෙන් රු.මි. 47 ක් දැනටමත් මුදා හැර ඇත. කොන්ත්‍රාත් කරුවන් ඉල්ලා සිටින අවස්ථාවේදි එම මුදල නිදහස් කිරීමට අදාල නිලධාරීන්ට උපදෙස් දී ඇත. අවසාන ශේෂය විශ්ලේෂණය කිරීමෙන් පසුව ඉතිරි කිසිවක් වේ නම් එය ආපසු ලියා ගැනීමට පියවර ගනු ලැබේ.
ii	රු.මිලි. 107.71 ක රඳවාගත් මුදලක් අධි ගෙවීම පිළිබඳ උප ලේඛන සහිතව ප්‍රමාණවත් තොරතුරු ඉදිරිපත් කර නොතිබුණි. RCT/B/RDA/2015/NA/AQ-53 - 2016 ජුනි 13	මුදල් රඳවා ගැනීමේ යාන්ත්‍රණයට අනුව අද දක්වා සමුච්චිත රඳවාගත් මුදල මත පදනම්ව නිදහස් කරනු ලැබේ. ඒ අනුව කිසිදු අධි ගෙවීමක් දක්නට නොලැබේ.
f I	**<u>උපචිත වියදම් හා ගෙවිය යුතු කොන්ත්‍රාත් මුදල්</u>** ව්‍යාපෘති වලට හා අනෙකුත් කොන්ත්‍රාත්කරුවන්ට මාර්ග වැඩි දියුණු කිරීම වෙනුවෙන් අසම්පූර්ණ බිල්පත් නිසා නොගෙවන ලද මුදලට රු. 205,861,302 හා වියදම් විවල්‍ය වියදම අනුමත නොවීම නිසා නොගෙවන ලද රු. 135,099,370 මුදලද අයත් විය.	විවාදිත බිල්පත් පරීක්ෂා කර නිගමන ගැනීම සඳහා ඉහළ මට්ටමේ කමිටුවකට ඉදිරිපත් කරන ලදි. කෙසේ නමුත් සමස්ත විවාදිත බිල්පත් වලින් රු.මි. 42.2 ක් දැනට නිරවුල් කර ඇත. කමිටුවේ නිර්දේශ වලට අනුව ශේෂය නිරවුල් කිරීමට පියවර ගනු ලැබේ.
ii	2014 වර්ෂයට අදාලව කොන්ත්‍රාත් අගය ඉක්මවා කරන ලද වැඩ වෙනුවෙන් කොන්ත්‍රාත්කරුවන් 06 දෙනෙකුට ගෙවිය යුතු රු. 328,923,378 ක මුදල විමසුමට භාජනය වූ වර්ෂයේදි ගෙවීමට පියවර ගෙන නොතිබුණි. RCT/B/RDA/2015/NA/AQ-40 - 2016 මැයි 11	සම්පූර්ණ මුදලින් රු.මි. 47 ක් ගෙවීමට හැකි තත්ත්වයේ පවතී. විවලන කමිටුවේ අවසන් තීරණය ලැබීමෙන් පසුව අනෙකුත් බිල්පත් ඉතිරි බිල්පත් ගෙවීමට කටයුතු කරනු ලැබේ.
iii	කොන්ත්‍රාත්කරුවන් විසින් ගිවිසුමට අනුව නියමිත දිනට වැඩ අවසන් කිරීමට අපොහොසත් වීම නිසා 2010-2014 කාලය තුල කොන්ත්‍රාත් 450 කට අදාල රු. 676,846,540 ක ඇවර කරන ලද හානිය අයකිරීම පිළිබඳ පරීක්ෂා කර ආදායම අධිකාරියට පැවරීමට කටයුතු කර නොතිබුණි. RCT/B/RDA/2015/NA/AQ - 2016 අප්‍රේල් 27	කල් දිගුකිරීම් ලබා නොගත් කොන්ත්‍රාත්කරුවන් ඇවර හානි ආදායම ආපසු ලියා හැරීමට කටයුතු කරනු ලැබේ.

<table>
<tr>
<td>g</td>
<td><u>කුලී ආදායම හා ලැබිය යුතු කුලී මුදල්</u>
බොරැල්ල උමං මාර්ගයෙන් අවු. 5 සිට 8 දක්වා කාලයක රු. 1,781,623 හා මහනුවර උමං මාර්ගයේ රු. 1,109,689 අවු. 3 සිට 4 දක්වා කාලයක කුලී ආදායම අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.
RCT/B/RDA/2015/PO/AQ-31 - 2016 අප්‍රේල් 19</td>
<td>මහනුවර උමං මාර්ගයේ ලැබිය යුතු කුලිය සඳහා නීතිමය පියවර ගෙන ඇති අතර, බොරැල්ල උමං මාර්ගයේ කුලී නොගෙවන්නන්ට එරෙහිව නීතිමය පියවර ගනිමින් පවතී. කෙසේ නමුත් 2016 වර්ෂය තුල බොරැල්ල උමං මාර්ගය කුලී මුදල් රු.544,250.55 ක් නිරවුල් කර ඇත.</td>
</tr>
<tr>
<td>I</td>
<td><u>සේවකයන්ගෙන් වෙනත් ලැබීම්</u>
කාර්ය මණ්ඩලයේ ණය හා අධි ගෙවීම් වශයෙන් රු. 487,915ක මුදලක් අයකර ගැනීමට නිසි පියවර ගෙන නොතිබුණි.
<table>
<tr><th>විස්තරය</th><th>අය නොකල කාල සීමාව වර්ෂය</th><th>කාර්ය මණ්ඩල ගණන</th><th>මුදල (රු.)</th></tr>
<tr><td>උත්සන අත්තිකාරම්</td><td>01-08</td><td>121</td><td>291,800</td></tr>
<tr><td>පොත් අත්තිකාරම්</td><td>01-09</td><td>49</td><td>41,000</td></tr>
<tr><td>කාර්ය මණ්ඩල ණය - වෙනත් ගෙවීම්</td><td>07</td><td>02</td><td>127,702</td></tr>
<tr><td>විශ්‍රාමික සේවකයින්ට වැඩිපුර ගෙවන ලද වැටුප්</td><td>03-04</td><td>05</td><td>21,218</td></tr>
<tr><td>පාඨමාලා ගාස්තු</td><td>10</td><td>01</td><td>6,195</td></tr>
<tr><td>එකතුව</td><td></td><td></td><td>487,915</td></tr>
</table>
RCT/B/RDA/2015/RO/AQ-39 - 2016 අප්‍රේල් 29</td>
<td>වගකිව යුතු නිලධාරීන්ගෙන් අයකර ගැනීමට දැනටමත් පියවර ගෙන ඇත.</td>
</tr>
<tr>
<td>ii</td>
<td>2014 වර්ෂයේදී මා.සං.අ. කාර්ය මණ්ඩලයේ 260 ක් සඳහා රු. 62,004,844 මුදලක්ද 2015 වර්ෂයේ මා.සං.අ. යේ කාර්ය මණ්ඩලයේ 94 ක් සඳහා රු. 62,757,658 මුදලක්ද වශයෙන් උසස් අධ්‍යාපන හා මහාමාර්ග අමාත්‍යාංශයේ සේවය කිරීම වෙනුවෙන් ගෙවා ඇති වැටුප් හා අනෙකුත් දීමනා ප්‍රතිපූර්ණය කිරීම සඳහා විමසුමට භාජනය වූ වර්ෂය වන විටත් කටයුතු කිරීමට අපොහොසත් වී තිබුණි.
RCT/B/RDA/2015/HA/AQ-45 - 2016 මැයි 23</td>
<td>මා.සං.අ. යේ කාර්ය මණ්ඩලයේ වැටුප් ප්‍රතිපූර්ණය කිරීමට අපොහොසත් වීම නිසා කාර්ය මණ්ඩලය මා.සං.අ. වෙත නිදහස් කිරීමට දැනටමත් උසස් අධ්‍යාපන හා මහාමාර්ග අමාත්‍යාංශය වෙත දැනුම් දී ඇත.</td>
</tr>
<tr>
<td>iii</td>
<td>වෙනත් අමාත්‍යාංශ 9 කට 2013, 2014 වර්ෂවල මාස 03 සිට 12 කට පෙර වෙනත් අමාත්‍යාංශ 9 කට නිදහස් කරන ලද කාර්ය මණ්ඩලය වෙනුවෙන් රු. 1,718,292 වැටුප් අයකර ගැනීමට කඩිනම් පියවර</td>
<td>සම්පූර්ණ රු. 75,535 මුදලක් අදාල අධිකාරියෙන් අයකර ගත් අතර අදාල සේවකයන්ගෙන් රු.මී. 1.2 ක මුදලක් වාරික පදනම මත අයකර ගැනීමට</td>
</tr>
</table>

	ගෙන නොතිබුණි. RCT/B/RDA/2015/PO/AQ-34 - 2016 අප්‍රේල් 26	කටයුතු කරමින් පවතී. ප්‍රමාදයකින් තොරව මෙම මුදල් නිරවුල් කරන ලෙස අනෙකුත් අය වෙත සිහි කැඳවීම් යවන ලදි.
iv	මා.සං.අ. විශ්‍රාමලත් සේවකයන් 50 දෙනෙකුගෙන් අයවිය යුතු රු. 3,104,786 ක ණය මුදල 2015 දෙසැ. 31 වන විටත් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. RCT/B/RDA/2015/RO/AQ-55 - 2016 ජුනි 14	හිඟ මුදල් නිරවුල් කරන ලෙසත් එසේ කිරීමට අපොහොසත් වුවහොත් ඇපකරුවන්ගෙන් අයකර ගැනීමට කටයුතු කරන බවත් අදාල සේවකයන් වෙත දැනුම් දී ඇත.

<u>විගණනය සඳහා සාක්ෂි නොමැති වීම</u>

පහත සඳහන් සාක්ෂි විගණනය සඳහා ඉදිරිපත් කර නොතිබුණි.

විස්තරය	මුදල (රු.)	සාක්ෂි නොමැතිකම	
තොග	552,044,028	විස්තරාත්මක උප ලේඛන සමස්ත ඒකක, (ඒකක මිල හා සමස්ත වටිනාකම් ඇතුළුව) RCT/B/RDA/2015/NL/AQ-47 - 2015 මැයි 25	අදාල තොරතුරු ඉදිරිපත් කිරීමට නිවැරදි කිරීම් පියවර ගනු ලැබේ.
තොග	763,882,476	වාර්ෂික තොග සමීක්ෂණ RCT/B/RDA/2015NL/AQ-47 - 2015 මැයි 15	මෙම තොරතුරු දැනටමත් යවා ඇත.
තැන්පතු හා අත්තිකාරම් (මිලදි ගැනුම් අත්තිකාරම්)	675,500	උපලේඛන RCT/B/RDA/2015/PO/AQ-48 - 2015 මැයි 27	මෙම තොරතුරු දැනටමත් යවා ඇත.
මාර්ග පුළුල් කිරීම සඳහා දේශීය බැංකු වලින් ණය හා වැඩි දියුණු කිරීමේ ව්‍යාපෘති	5,982,720,989	බැංකු ණය 5 ක් තහවුරු කිරීම	තහවුරු කිරීම් දැනටමත් ඉදිරිපත් කර ඇත.

	අවු. 15 කට සම්බන්ධ ශූන්‍ය ශේෂය සහිත බැංකු සැසඳුම් ඉදිරිපත් කර නොතිබුණි. මෙම ගිණුම් පිළිබඳ බැංකුවල තහවුරු කිරීම් වලට අනුව සමස්ත ශේෂය රු. 3,860,708,090 RCT/B/RDA/2015/NL/AQ-38 - 2016 අප්‍රේල් 27	බැංකු සැසඳුම් ඊළඟ මාසයේ 15 දිනට පෙර අධ්‍යක්ෂ මුදල්ට පිටපත් සහිතව රජයේ විගණන අංශයට හා අභ්‍යන්තර විගණන අංශයට ඉදිරිපත් කරන ලෙස අදාල නිලධාරීන්ට උපදෙස් දී ඇත.
2.3	**<u>නීති රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණ වලට අනුකූල නොවීම.</u>** විගණනයේදී නිරීක්ෂණය වූ අනුකූල නොවූ	

	අවස්ථාවන් පහත දැක්වේ.		
	නීති රීති රෙගුලාසි වලට හා කළමනාකරණ තීරණ වලට ගොමුව අනුකූල නොවීම.		
a	ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මූල්‍ය රෙගුලාසි.		
i	මූල්‍ය රෙගුලාසි 396	බැංකු 7 කට සම්බන්ධ රු.3,903,709 මුදලකට අදාල චෙක්පත් 67 ක් නිකුත් කල දිනයේ සිට මාස 06 කල් ඉකුත් වී තිබුනද අවලංගු කර නොතිබුණි. RCT/B/RDA/2015/NL/AQ-38 - 2016 අප්‍රේල් 27	
ii	මූල්‍ය රෙගුලාසි අංක 373 හා 2015 ඔක්තොම්බර් 21 දිනැති අංක 376 දරණ කාර්යාලීය චක්‍රලේඛය	උප කාර්යාල හතකට හා අංශ 3 කට ලබාදුන් රු. 31,651,973 මුදලක සුළු මුදල් අග්‍රිමය හා ඉන්ධන අග්‍රිමය විමසමට ලක්වූ වර්ෂය අවසාන වන තෙක්ම නිරවුල් කර නොතිබුණි. RCT/B/RDA/2015/NL/AQ-38 - 2016 අප්‍රේල් 27	
b	අංක PED/12 හා 2003 ජුනි 02 දිනැති රාජ්‍ය ව්‍යවසාය චක්‍රලේඛය (i) අංක 9:4	විමසුමට ලක්වූ වර්ෂය තුල අධිකාරියේ කාරය මණ්ඩලයේ 260 දෙනෙක් අමාත්‍ය මණ්ඩලයේ අනුමැතියකින් තොරව උසස් අධ්‍යාපන හා මහාමාර්ග අමාත්‍යාංශය වෙත නිදහස් කර තිබුනි. RCT/B/RDA/2015/HA/AQ-45 - 2016 මැයි 23	අමත්‍යාංශය වෙත නිදහස් කරන ලද නිලධාරින් ආපසු කැඳවීමට දැනටමත් පියවර ගෙන ඇති අතර අනාගතයේදී අමාත්‍ය මණ්ඩල අනුමැතිය මත කාර්ය මණ්ඩලය නිදහස් කිරීමට පියවර ගනු ලැබේ.
	අංක 9:3:1 vi හා vii වගන්ති	වැඩ බලන පත්වීමක වලංගු කාලය මාස 03 ක් වුවද වැඩ බලන අධ්‍යක්ෂ (පරිපාලන) ගේ සේවය 2015 මාර්තු 27 දින සිට අද දක්වා මාස 15 ක කාලයක් ලබා ගෙන ඇත. RCT/B/RDA/2015/HA/AQ-14 - 2016 ජනවාරි 18	දැනටමත් පාලන අධ්‍යක්ෂවරයා ස්ථිරව පත්කර ඇත.

	(iii) අංක 9:3:1 (viii) වගන්තිය	කළමනාකාරීත්ව මට්ටමේ තනතුරු සඳහා අනුප්‍රාප්තික සැලසුමක් පිළියෙල කළ යුතු වුවද, එකී පුරප්පාඩු සඳහා නිලධාරීන් නම්කල යුතු වුවද එවැනි පියවර ගෙන නොතිබුණි. RCT/B/RDA/2015/HA/AQ-14- 2016 ජනවාරි 18	නිසි අනුප්‍රාප්තික සැලැස්මක් පිළියෙල කිරීමට කටයුතු කරනු ලැබේ.
3	මූල්‍ය සමාලෝචනය		
3.1	**<u>මූල්‍ය ප්‍රතිඵල</u>** ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශ වලට අනුව විමසුමට භාජනය වූ වර්ෂයේ අධිකාරියේ මෙහෙයුම් වලදී අනුගාමී වර්ෂයේ රු.මි.4,962.68 බදු පූර්ව ශුද්ධ හිඟයට ප්‍රති විරුද්ධ බදු පූර්ව රු.මි.1,674.93 ක අතිරික්තයක් ඇතිවී තිබේ. එය විමසුමට ලක්වූ වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලය රු.මි.6,637.61 ක වැඩිවීමක් පෙන්වයි. සමස්ත ආදායම රු.මි. 12,506කින් වැඩිවීම හා වියදම රු.මි. 5,868,47 කින් වැඩිවීම විමසුමට ලක්වූ වර්ෂයේ ප්‍රතිඵලවල වැඩි දියුණු වීමට ප්‍රධාන වශයෙන් හේතු වී ඇත.	
3.2	**<u>විශ්ලේෂණාත්මක මූල්‍ය සමාලෝචනය</u>** 2015 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශයේ පෙන්වා ඇති ඇතැම් වැදගත් ශේෂයන් පසුගිය වර්ෂය සමඟ සැසඳීම පහත දක්වා ඇත. දෙසැම්බර් 31 දිනට 2015 රු.මිලි. / 2014 රු.මිලි. ශුද්ධ ජංගම වත්කම් 2015: (855.55) / 2014: 2,717 ශුද්ධ වත්කම් 2015: 161,409 / 2014: 170,633 සමුච්චිත හිඟය 2015: (12,740) / 2014: (13,576) ඒ අනුව 2015 වර්ෂයේ ශුද්ධ ජංගම වත්කම් හා ශුද්ධ වත්කම් 2014 වර්ෂය සමඟ සැසඳීමේදි පිළිවෙලින් 131.49% කින් සහ 5.4% කින් අඩුවී ඇති අතර, සමුච්චිත හිඟයද 6.16% කින් අඩුවී ඇත.	
4 4.1	**<u>මෙහෙයුම් සමාලෝචනය</u>** **<u>කාර්ය සාධනය</u>**		
4.1.1	**<u>ජාතික මහාමාර්ග හා පාලම් නඩත්තු වැඩ</u>** 2015 වර්ෂය සඳහා අධ්‍යක්ෂ සැලසුම් විසින්		

	පිළියෙල කරන ලද ප්‍රගති වාර්තාවට අනුව, විමසුමට ලක්වූ වර්ෂය සඳහා ජාතික මාර්ග හා පාලම් නඩත්තුව සඳහා වෙන් කරන ලද අරමුදල් හා තථ්‍ය වියදම පහත දැක්වෙන පරිදි වේ.	

		ප්‍රතිපාදන රු.මිලියන	තථ්‍ය වියදම රු.මිලියන	ප්‍රතිපාදන උපයෝජනය ප්‍රතිශතයක් වශයෙන්.
i	එදිනෙදා නඩත්තුව	1,200	935,93	77.99
ii	වාරික නඩත්තුව	1,476.57	340.72	23.08
iii	ජලාපවාහන හා ව්‍යුහ වැඩි දියුණු කිරීම.	438	119.84	27.37
iv	සංඥා ආලෝක පද්ධති, වීදි ආලෝක, මාර්ග සංඥා හා සලකුණු කිරීම හා සුළු මාර්ග ආරක්ෂණ වැඩි දියුණු කිරීම.	623	252	40.38
v	හදිසි නඩත්තුව / ආපදා වැඩ	1,251	343	27.41
vi	මෙහෙයුම් හා පාරු නඩත්තුව	6.21	6.21	85.67
	එකතුව	4,994.78	1,996.81	

i	ජාතික මහාමාර්ග නඩත්තු කටයුතු සඳහා රු.මි. 4,994.78 මුදලක් සපයා තිබුනද උපයෝග කර තිබුන මුදල ප්‍රතිපාදන වලින් 39.97% ක් වන රු.මි. 1996.81 ක් පමණක් උපයෝජනය කර තිබුණි.	අපගේ සංඛ්‍යා ලේඛන වලට අනුව 2015 වර්ෂය තුල 70 % ක ප්‍රමාණයක් උපයෝගි කර ඇත. අදාල සංඛ්‍යා ලේඛන 2016 සැප්. 13 දින රජයේ විගණන අංශය වෙත ඉදිරිපත් කර ඇත.
ii	විධායක ඉංජිනේරු කාර්යාල 6 කට අදාල ව්‍යාපෘති 23 කට අදාල මාර්ග නඩත්තු කටයුතු 2015 දෙසැ. 31 දිනට නිමකර නොතිබුණි. ඒවායේ ඇස්තමේන්තු පිරිවැය හා තථ්‍ය පිරිවැය පිළිවෙලින් රු.මිලි. 161.37 හා 27.91 කි.	පහත සඳහන් හේතු නිසා මාර්ග නඩත්තු කටයුතු නිම කළ නොහැකි විය: • බිල්පත් ගෙවීම සඳහා වර්ෂයේ පළමු මාස 3 තුල ප්‍රමාණවත් අරමුදල් නොලැබීම. • බිල්පත් ගෙවීම ප්‍රමාද වීම නිසා ඉදිකිරීමේ වැඩවල ප්‍රගතිය අඩුවිය.
iii	වාරික නඩත්තුව, ජල ප්‍රවාහන හා ව්‍යුහ වැඩි දියුණු කිරීම සංඥා ආලෝක පද්ධති, වීදි ආලෝක, මාර්ග සංඥා හා සලකුණු කිරීම නඩත්තු කිරීම හා සුළු ආරක්ෂණ වැඩි දියුණු කිරීම්, හදිසි නඩත්තුව / ආපදා වැඩ සඳහා ප්‍රතිපාදන උපයෝගි කර ගැනීම 50 % අඩුය. ඒ අනුව ජාතික මහාමාර්ග ජාලයේ නඩත්තු කටයුතු වල සැලකිය යුතු අඩු ප්‍රගතියක් ඒ අනුව නිරීක්ෂණය විය.	ප්‍රතිපාදන වලට ප්‍රතිමුඛව තථ්‍ය පිරිවැය පහත සාරාංශ කර දක්වා ඇත. වාරික නඩත්තුව 69% ජල පවාහන හා ව්‍යුහ වැඩි දියුණුකිරීම 50% සංඥා ආලෝක පද්ධති, වීදි ආලෝක, මාර්ග සංඥා හා සලකුණු කිරීම නඩත්තුව හා මාර්ග සුළු ආරක්ෂණ වැඩි දියුණු කිරීම 56% හදිසි නඩත්තුව ආපදා වැඩ 59%

4.1.2 i	**<u>ඉංජිනේරු සේවා හා පාලම් සැලසුම් අංශය</u>** පහත සඳහන් කරුණු නිරීක්ෂණය විය. 2015 වර්ෂය සඳහා මෙම අංශය සඳහා වැඩ සැලසුමක් පිළියෙල කළද ඉහළ කළමනාකාරිත්වය විසින් එය අනුමත කිරීමට ක්‍රමවේදයක් ක්‍රියාත්මක කර නොතිබිණි.	දැනට 2016 දහා වැඩ සැලැස්ම නියමිත පරිදි අනුමත කර ඇත.
ii	විමසුමට භාජනය වූ වර්ෂයේ ප්‍රගති වාර්තාව අනුව, පාලම් 20 ක් සඳහා සැලසුම් නිර්මාණය කිරීමේ ප්‍රගතිය 50% ට අඩුය.	ඇතැම් පාලම් ඉදිකිරීම් වැඩ දැනටමත් ආරම්භ කර ඇති අතර, 2016 දී පාලම් සැලසුම් වැඩ නිම කිරීමට පියවර ගෙන ඇත.
iii	පාලම් සැලසුම් අංශය හා පාලම් කළමනාකරණය හා තක්සේරු ඒකකයේ පුරප්පාඩු 10 ක් නිරීක්ෂණය වූ අතර එයින් පුරප්පාඩු 7 ක් අංශයේ අත්‍යාවශ්‍ය රාජකාරි ඉටු කිරීමට සම්බන්ධය. ඒ අනුව මෙම තත්ත්වය අංශයේ කාර්ය සාධනයට අහිතකර ලෙස බලපා ඇති බවට නිරීක්ෂණය විය.	පාලම් සැලසුම් අංශයේ අත්‍යවශ්‍ය තනතුරු දෙකක් පුරප්පාඩු පිරවීමට පියවර ගනු ලැබේ.
iv	විමසුමට භාජනය වූ වර්ෂය තුල සැලැස්මට පරිබාහිරව පාලම් හතරක් සැලසුම් කර තිබුණි.	හදිසි අවශ්‍යතාව මත පදනම්ව පාලම් දෙකක සැලසුම් වැඩ සැලසුමට බාහිරව 2015 දී නිර්මාණ කරන ලදි.
4.2 4.2.1	**<u>කොන්ත්‍රාත් පරිපාලනය</u>** **<u>මාර්ග පුනරුත්ථාපනය හා වැඩි දියුණු කිරීම</u>** පහත සඳහන් නිරීක්ෂණයන් කරන ලදි.	
a	**<u>මාර්ග පුළුල් කිරීම හා වැඩි දියුණු කිරීම</u>** 2014 වර්ෂය තුල නිම නොකෙරුණු ව්‍යාපෘති පිළිබඳව ඉදිකිරීම් අංශය විසින් ඉදිරිපත් කරනු ලැබූ තොරතුරු හා 2015 වර්ෂය තුල අධ්‍යක්ෂ ජනරාල් විසින් අනුමත කර ක්‍රියාත්මක කරන ලද ව්‍යාපෘති පිළිබඳව පහත සඳහන් කරුණු නිරීක්ෂණය විය.	
i	2015 දෙසැම්බර් 31 දිනට භෞතික ප්‍රගතිය 50%ට අඩු මිලියන 25,103 ඇස්තමේන්තු පිරිවැය සහිත ව්‍යාපෘති 259 ක් විය. මෙයින් මිලියන 17,928 ක කොන්ත්‍රාත් වටිනාකමින් යුතු මා.සං.අ. නොවන ව්‍යාපෘති 206 ක් වූ අතර, 2015 දෙසැ. 31 දිනට වැයවූ මුදල රු.මි. 913 කි. භෞතික ප්‍රගතිය 50% ට අඩුවූ ව්‍යාපෘති 53 ක් මා.සං.අ. ට අයත් විය. එහි කොන්ත්‍රාත් අගය රු.මිලි. 7,175 ක් වූ අතර වැයවූ මුදල රු.මි. 581 කි.	පහත සඳහන් හේතු නිසා භෞතික ප්‍රගතිය 50% ක් අඩුවිය. • ඉඩම් අත්පත් කර ගැනීමේ වැඩ වල ප්‍රමාදය • පැවති කාලගුණික තත්ත්වයන් • මහජන අපහසුතාව සැලකිල්ලට ගනිමින් ඇතැම් ව්‍යාපෘති මූලික විෂය පථයට අනුව සම්පූර්ණ නොකර අතහැර දමන ලදි.
ii	2015 දෙසැ. 31 වන විට ඇස්තමේන්තුගත පිරිවැය රු.මි. 4,902 ක් වූ ව්‍යාපෘති 84 ක් පැවති අතර, වැඩ කිසිවක් ඉටුකර නොතිබුණු අතර, මෙයින් එක් ව්‍යාපෘතියක් සඳහා රු.මි. 2.50 ක් වැයකර තිබුණි.	ප්‍රමුඛතාව සැලකිල්ලට ගෙන අරමුදල් නොමැතිකම නිසා මා.සං.අ. නොවන ව්‍යාපෘති අතහැර දමන ලදි. කෙසේ නමුත් අත්හිටුවන ලද මා.සං.අ. ව්‍යාපෘති

	මෙම ව්‍යාපෘති 84 න් 54 ක් මා.සං.අ. නොවන ව්‍යාපෘති වූ අතර, කොන්ත්‍රාත් අගය රු.මි. 2,465 ක් විය.	අනාගතයේදී ක්‍රියාත්මක කරනු ලැබේ.
b	**<u>දේශීය බැංකු අරමුදල් ව්‍යාපෘති</u>** දිවයින පුරා කි.මී. 1433.85 දිගැති ප්‍රමුඛතා මාර්ග 64 ක් පුනරුත්ථාපනය කිරීම සඳහා දේශීය බැංකු වලින් රු.බිලි. 152 ක් ලබා ගැනීමට මාර්ග සංවර්ධන අධිකාරිය අනුමැතිය දී තිබුනි. ඒ අනුව රු.බිලි. 152 ක් අගය සහිත ව්‍යාපෘති 64 ක කොන්ත්‍රාත් ප්‍රදානය කරන ලදි. ඒ අනුව මාර්ග සංවර්ධන අධිකාරිය විසින් රු.බිලියන 152 ක් වටිනා මාර්ග 64 ක් පුනරුත්ථාපනය කිරීමේ කොන්ත්‍රාත් ප්‍රදානය කර තිබුණි. අධිකාරිය විසින් 2012, 2013, 2014 හා 2015 වර්ෂවල මාර්ග ඉදි කිරීම වෙනුවෙන් කොන්ත්‍රාත්කරුවන්ට ගෙවීම සඳහා දේශීය බැංකු 7 කින් රු.මි. 131,442 මුදලක් ලබාගෙන තිබුණි. එයින්, 2014 හා 2015 වර්ෂ වලදී රු.මි. 4,523 ක් නිරවුල් කර තිබුණි. ඒ අනුව 2015 දෙසැම්බර් 31 වන දිනට ගෙවිය යුතු ණය මුදලේ කොටස රු.මි. 126,918 ක් බවට නිරීක්ෂණය විය. විමසුමට භාජනය වූ වර්ෂය අවසානයේ ලැබුණු ණය මුදල් හා ගෙවීමට ඇති ණය මුදලේ කොටස පිළිබඳ විස්තර පහත පෙන්වා ඇත.	

බැංකුවේ නම	වර්ෂය සඳහා බැංකු වලින් ලැබුණු ණය			වර්ෂය තුල ප්‍රාග්ධක ප්‍රති ගෙවුම්			2015 දෙසැ. 31 දිනට ණය ශේෂය
	2012 රු.මිලි.	2013 රු.මිලි.	2014 රු.මිලි.	2015 රු.මිලි.	2014 රු.මිලි.	2015 රු.මිලි.	රු.මිලි.
කොමර්ෂල් බැංකුව	1,266	634	2,647	1,497	128	361	5,555
ලංකා බැංකුව	3,703	9,637	10,402	6,606	218	1,469	28,662
මහජන බැංකුව	3,369	5,234	4,806	562	607	1,220	12,142
ජාතික ඉතිරි කිරීමේ බැංකුව	384	4,953	43,931	5,076	-	339	54,006
සංවර්ධන මුල්‍ය සංස්ථාව	209	724	*(32)	309	-	45	1,165
හැටන් නැෂනල් බැංකුව	--	3,614	8,562	7,365	-	136	19,405
ජාතික සංවර්ධන බැංකුව	--	--	4,214	1,769	-	-	5,983
	8,932	24,796	74,530	23,184	953	3,570	126,918

2013 දී වැරදී ලෙස හර කර තිබුණු අතර 2014 දී නිවැරදී කර තිබුණි.

I	මේ සම්බන්ධයෙන් පහත දැක්වෙන කරුණු නිරීක්ෂණය විය. 2010 වර්ෂයේ මාර්ග කොන්ත්‍රාත් 54 ක් පුනරුත්ථාපන වැඩ ආරම්භ කිරීම සඳහා තාක්ෂණික ඇගයීම් කමිටුව රු.මි. 146,553 නිර්දේශ කර තිබුණු අතර කොන්ත්‍රාත්කරුවන් විසින් සම්පූර්ණ	තාක්ෂණ ඇගයීම් කමිටුව විසින් මහා මාර්ග උපලේඛනයට අනුපාත + පොදු කාර්ය වියදම් හා ලාභ හා පවත්නා වෙළඳ පොල අනුපාත, යෝජකගේ ප්‍රමාණයන් ඇගයීම පදනම් කරගෙන කොන්ත්‍රාත් මිල හා ඉංජිනේරු ඇස්තමේන්තුවට අනුව සාකච්ඡා කරන

	කොන්ත්‍රාත් පිරිවැය වශයෙන් රු.මී.162,192 ඉදිරිපත් කරන ලදි. නමුත් අමාත්‍ය මණ්ඩලය විසින් පත්කළ ප්‍රසම්පාදන කමිටුව විසින් එය රු.බි. 155,79 දක්වා රු.බි.9,242 කින් වැඩි කර තිබුණි.	ලෙස නිර්දේශ කරන ලදි. සාමාන්‍යයෙන් ඉංජිනේරු ඇස්තමේන්තුව කොන්ත්‍රාත් මිල තීරණය කිරීම හා මාර්ගෝපදේශයන් ලෙස භාවිතා කෙරේ. මෙම මිලට කොන්ත්‍රාත්කරු එකඟ නොවන්නේ නම් අමාත්‍ය මණ්ඩලය පත්කල ස්ථාවර ප්‍රසම්පාදන කමිටුව විසින් කාර්යයේ අවශ්‍යතාව හා හදිසි භාවය සැලකිල්ලට ගෙන කොන්ත්‍රාත් කරු සමඟ සාකච්ඡා කර ඉංජිනේරු ඇස්තමේන්තුවට ආසන්න සාධාරණ මිලකට ආසන්න එකඟතාවයට පැමිණේ. සාමාන්‍යයෙන් මෙම මිල ගණන් තා.ඇ.ක. නිර්දේශ කල මිල හා කොන්ත්‍රාත්කරු විසින් දන්වන ලද මිල අතර සම්මුතියක් ඇති කරනු ලබයි.
ii	තාක්ෂණ ඇගයීම් කමිටුවේ ක්‍රමවේදයට අනුව කොන්ත්‍රාත්කරුවන්ගේ මූල්‍ය යෝජනා ඇගයීමට ලක්කර නොතිබුණි. එවැනි ඇස්තමේන්තුවලට අනුව සෑම මාර්ගයක් සඳහාම වැඩ විෂයාංක, වැඩ ප්‍රමාණ ඇතුළු ඉංජිනේරු ඇස්තමේන්තු හා අදාල අනුපාත කොන්ත්‍රාත් කරුවන්ගේ මූල්‍ය යෝජනා ඇගයීම සිදු කිරීම සඳහා සූදානම් කර නොතිබුණි. කොන්ත්‍රාත් කරුවන්ගේ මූල්‍ය යෝජනාවල අනුපාත මහාමාර්ග අනුපාත උපලේඛන හා සැසඳීමේදි කොන්ත්‍රාත් කරුවන් විසින් අනුපාත සියයට 50 සිට සියයට 334 මට්ටමකින් වැඩිකර තිබූ බව අනාවරණය විය. සෑම කොන්ත්‍රාත්තුවකට අනුපාතවල ප්‍රමාණාත්මක වෙනස්කම් නිරීක්ෂණය විය.	තාක්ෂණික ඇගයීම් කමිටුව විසින් කොන්ත්‍රාත්කරුගේ යෝජනා, යෝජනාවන්, ප්‍රමාණ සැලකිල්ලට ගනිමින් තා.ඇ.ක. විසින් මහාමාර්ග අනුපාත උපලේඛනයට අනුව 20% පොදු කාර්ය වියදම් හා ලාභ සහ පවත්නා වෙළඳපොල අනුපාත යෝජනාකරුගේ ප්‍රමාණයන් සමඟ සන්සන්දනය දරන ලදි. කොන්ත්‍රාත් අනුපාතයන්, වැඩ බිම් ස්ථාන, පවත්නා මාර්ග තත්ත්වය, ප්‍රවාහන ද්‍රව්‍ය වලට ඇති දුර, කොන්තාත්කරුගේ පහසුකම්, වැඩබිමේ කාලගුණික තත්ත්වය, කොන්ත්‍රාත් ප්‍රදානය කල වර්ෂය යන හේතු මත කොන්ත්‍රාත්තුවකින් කොන්ත්‍රාත්තුවකට අනුපාත වෙනස් විය හැකිය. සුදුසු ද්‍රව්‍ය ව්‍යාපෘතිය ආසන්නයේ හිඟ බව නිරීක්ෂණය විය. ඒනිසා කොන්ත්‍රාත්කරුගේ අනුපාත ඉහල යා හැකිය. කෙසේ නමුත් ඉංජිනේරු ඇස්තමේන්තුව සමඟ සැසඳීමේදි ඇතැම් විෂයාංකවල මිල අනුපාත වැඩි හා අඩු බව තා.ඇ.ක. විසින් පෙන්වා දී ඇත. කෙසේ වුවද තා.ඇ.ක. විසින් සමස්ත කොන්ත්‍රාත් මුදල සඳහා වැඩි සැලකිල්ලක් යොමුකර ඇති අතර, තා.ඇ.ක. විසින් ඉංජිනේරු ඇස්තමේන්තුවට ආසන්න කොන්ත්‍රාත් මුදලක් දක්වා ප්‍රමන්ත්‍රණය කරන ලෙස

		අමාත්‍යාංශ ලේකම් පත්කල ප්‍රසම්පාදන කමිටුවට නිර්දේශ කර ඇත. කෙසේ නමුත් මේ අමාත්‍යාංශයේ ලේකම් විසින් ඉංජිනේරු ඇස්තමේන්තුව නිර්දේශ කර වරාය හා මහාමාර්ග ලේකම් විසින් අනුමත කර ඇත.
iii	මෙම ව්‍යාපෘතියට අදාල මාර්ග 64 න් මාර්ග 28 ක් ඉදිකිරීම සඳහා ජාතික ඉතිරි කිරීමේ බැංකුව සමඟ එකඟ වූ ණය මුදල රු.මි. 55,392 කි. අනුමත කල ණය මුදලෙන් රු.මි. 21,239 ක් 2014 දෙසැම්බර් 31 දින ඉටුකල වැඩ හා අත්තිකාරමක් වශයෙන් ලබාදී තිබුණි. ඒ අනුව ණය මුදලෙන් තවත් රු.මි. 34,153 ක මුදලක් ඉතිරිව පවතී. ශේෂ මුදලෙන් රු.මි.28,000 ක මුදලක් ණය ගිවිසුමට ප්‍රතිවිරුද්ධ ලෙස වෙනත් කටයුතු සඳහා ලබගෙන තිබුණි. ඒ අනුව ණය මුදලෙන් රු.මි. 6,153.34 මුදලක් පමණක් කොන්ත්‍රාත්කරුවන්ට ගෙවීම් කිරීම සඳහා ඉතිරිව තිබුණි. ණය ගිවිසුමට පටහැනි ලෙස ලබාගත් රු.මි. 28,000 ක මුදල් අධිකාරියේ මාර්ග ඉදි කිරීමට වරාය හා මහාමාර්ග අමාත්‍යාංශය සඳහා සහ විදේශ අරමුදල් වලින් ක්‍රියාත්මක කරන වෙනත් ව්‍යාපෘති හා පරිපාලන වියදම් හා අනෙකුත් කටයුතු සඳහා භාවිතා කර තිබුණි.	මාර්ග සංවර්ධන අධිකාරිය විසින් ක්‍රියාත්මක කරන ලද මාර්ග ඉදිකිරීම් වැඩවල මාසික ගෙවීම් සඳහා නිරවුල් කිරීමට සහ වරාය හා මහාමාර්ග අමාත්‍යාංශය ක්‍රියාත්මක කරන ලද වෙනත් විදේශ අරමුදල් ව්‍යාපෘතිවල පරිපාලන වියදම් හා වෙනත් කටයුතු සඳහා ජාතික ඉතිරි කිරීමේ බැංකුවෙන් ලබාගත් රු.මිලි. 28,000/- භාවිතා කරන ලදි. ගිවිසුමට පරස්පර ලෙස ණය මුදල උපයෝගි කර ගැනීම සඳහා පහත සඳහන් හේතු පැන නැගුණි. • මා.සං.අ. විසින් ලෝක බැංකුව, ආසියානු සංවර්ධන බැංකුව, ජපන් ජාත්‍යන්තර සහයෝගිතා සංගමය, චීන සංවර්ධන බැංකුව චීන එක්සිම් බැංකුව ආදි විදේශ ප්‍රදාන ආයතනවල මූල්‍යයනය කරන ලද ප්‍රධාන මාර්ග ඉදි කිරීම් ව්‍යාපෘති ගණනාවක් ක්‍රියාත්මක කරන ලදි. රජය විසින් මෙම ව්‍යාපෘති බොහොමයකට ඉහල ප්‍රමුඛතාව ලබාදී තිබුණු අතර ඒවා නියමිත ඉලක්ක අනුව නිම කළ යුතුව තිබුණි. විවිධ ණය ගිවිසුම් වලට අනුව, මෙම ප්‍රදාන අරමුදල් කොන්ත්‍රාත් යටතේ, අදාල ණය ගෙවීම් වලින් ප්‍රධාන කොටස් එක්කර ගෙවනු ලැබේ. සෑම ගෙවීමකටම රජයේ දායකත්වය මා.සං.අ. විසින් දේශීය අරමුදලින් කල යුතු විය. කෙසේ නමුත් ක්‍රියාත්මක වෙමින් පැවති ව්‍යාපෘති සඳහා 2014 වර්ෂයේදී භාණ්ඩාගාරය විසින් වෙන් කරන ලද මුදල ගෙවීම් කිරීම සඳහා භාණ්ඩාගාරය විසින් නිදහස් නොකරන ලදි. මෙම වැඩ සටහන විධිමත් කිරීම සඳහා

		කලට විදේශීය අරමුදල් විය පැහැදම් කිරීම සහතික කිරීම සඳහා වහාම ශේෂ මුදල ගෙවීමට මා.සං.අ. ට සිදුවිය. • ශ්‍රී ලංකා රජය අරමුදල් සැපයූ ව්‍යාපෘති ක්‍රියාත්මක කරන ලදි. • ඉහත සඳහන් ක්‍රියාත්මක කෙරෙමින් පැවති වැඩ සඳහා භාණ්ඩාගාරය විසින් වෙන් කල මුදල් ගෙවීම් කිරීම සඳහා නිදහස් නොකරන ලදි. • එබැවින් ගෙවීම් නිරවුල් කිරීමට ජා.ඉ.බැ. වෙන් කෙටිකාලීන ණය මුදලක් ලබා ගැනීමට තිරණය කරන ලදි.
iv a	පැල්මඩුල්ල - ඇඹිලිපිටිය - නෝනාගම මාර්ග ව්‍යාපෘතිය සඳහා ව්‍යාපෘතියේ ප්‍රමාණ බිල්පත් වලට අමතරව, පහත සඳහන් අතිරේක වැඩ සඳහා එම මාර්ග පුනරුත්ථාපන ව්‍යාපෘතිය සඳහා ලබාගත් ණය මුදලක් වියදම් කර තිබුණි. ජනාධිපති මන්දිරය ඉදිකිරීම ඇඹිලිපිටිය රු.මී. 18.45 අතිරේක මාර්ග 17 ක කි.මී. 9.21න් ඉදි කිරීම රු.මී. 142.6	ඇඹිලිපිටියේ ජනාධිපති මන්දිරය ඉදි කිරීම සඳහා ද්‍රව්‍ය නිකුත් කිරීමට වරාය හා මහාමාර්ග අමාත්‍යාංශයේ ලේකම් විසින් අනුමැතිය දී තිබුණි. එකල නේවාසික ඉංජිනේරු විසින් 10 වන ඉංජිනේරු සේවා රෙජිමේන්තුවට ද්‍රව්‍ය නිකුත් කර ඇත. කෙසේ නමුත් මේ තත්ත්වය සමාලෝචනය සඳහා ලේකම් වරයා විසින් පත්කල ප්‍රසම්පාදන කමිටුව විසින් ගෙවන ලද මුදල බිල්පතින් අඩුකර ගැනීමට උපදෙස් දුන් අතර, ඒ අනුව මාසික අන්තර් ගෙවීම් වලින් රු.මී. 18.45 අඩුකර ගන්නා ලදි. තවද අතිරේක මාර්ග 17 ක මාර්ග කි.මී. 9.21 ක් ඉදිකිරීම, ලේ.ප.ප්‍ර.ක. විසින් අනුමත කරන ලදි.
b	මෙම ව්‍යාපෘතියේ සමස්ත කොන්ත්‍රාත් පිරිවැය රු.මී. 2,172 වන අතර 2014 දෙසැ. 31 දින දක්වා ජාතික ඉතිරි කිරීමේ බැංකුවෙන් ලබාගත් රු.මී.2,096 මුදල සමස්ත ව්‍යාපෘති පිරිවැයෙන් 96% ක් නියෝජනය කරයි. එතේ ව්‍යාපෘතියෙන් බැහැරව ක්‍රියාත්මක කල ඉදිකිරීම් වැඩ වෙනුවෙන් රු.මී. 596 ක මුදලක් පමණ ගෙවා තිබුණි.	පැල්මඩුල්ල - ඇඹිලිපිටිය - නෝනාගම මාර්ග ව්‍යාපෘතිය සඳහා දෙසැම්බර් මස දක්වා ලබාගෙන තිබුණු මුදල රු.මී. 2096 ක් ලෙස දක්වා ඇත. කෙසේ වෙතත් කොන්ත්‍රාත්තුවේ අත්තිකාරම් ලෙස රු.මී. 596 ක ගෙවා ඇත. ඉතිරි රු.මී. 1500 ක මුදල විෂයාංක 3 යටතේ පෙන්වා ඇති වෙනත් කටයුතුවල බිල්පත් නිරවුල් කිරීම සඳහා ජා.ඉ.කි. බැංකුව වෙතින් ලබා ගන්නා ලදි.

		එබැවින් මූල්‍ය ප්‍රගතිය භෞතික ප්‍රගතියට වඩා වෙනස් වී ඇත.
v	**<u>විවලන නියෝග යටතේ වියදම්</u>** වරාය හා මහාමාර්ග අමාත්‍යවරයා විසින් 2011 ජනවාරි 28 දින ඉදිරිපත් කරන ලද අමාත්‍ය මණ්ඩල සංදේශය හා 2011 පෙබරවාරි 09 දින අනුමැතියට අනුව, මාර්ග සංවර්ධන අධිකාරිය විසින් සෑම ව්‍යාපෘතියකටම අයත් පිරිවිතර හා විෂයාංක තෝරාගත් කොන්ත්‍රාත්කරුවන්ට සැපයිය යුතුය. එහෙත් එසේ සැපයීම් කර නොතිබුණි. මාර්ග 8 ක භෞතික පරීක්ෂාවන්ට අනුව එම මාර්ගවල දිග හා පළල, කොන්ක්‍රීට් කාණු, බෝක්කු, පැති බැම් හා මාර්ග පෘෂ්ඨය මත ඉදිකිරීම් වැනි ඇතැම් අංග අඩු කරමින් ඉදිකර ඇති බවට අනාවරණය විය. ඒ අනුව මාර්ග පුනරුත්ථාපන ව්‍යාපෘති 25 ක් සඳහා ලබාගත් රු.මි.3,333.09 අරමුදලින් ඉතුරුම් යැයි සඳහන් කල අරමුදල්, අදාල කොන්ත්‍රාත්කරුවන්ට විවලන නියෝග යටතේ අමතර වැඩ සඳහා භාවිතා කර තිබුණි.	ව්‍යාපෘතියේ හදිසි කාර්යයන්හි ප්‍රමුඛතාවය නිසා මෙම ඉතුරුම් භාවිතා කරන ලදි.
	විස්තර පහත දැක්වේ.	
	අනුමත පුනරුත්ථාපන ව්‍යාපෘතිවලට අමතරව මාර්ග 59 ක් ඉදිකිරීම 943.54 ව්‍යාපෘති වලට අමතරව වෙනත් මාර්ගවල පාලම් ඉදිකිරීම 65.86 කෑගල්ල ඩෝසන් බංගලාව ඉදිකිරීම, පළාත්භාර අධ්‍යක්ෂ කාර්යාලය හා අනෙකුත් මාර්ග ඉදිකිරීම 1,370.23 වෙනත් අමතර මාර්ග 07 ක් ඉදිකිරීම 953.47	
vi	**<u>ගලිගමුව - රුවන්වැල්ල - කරවනැල්ල මාර්ගය ඉදිකිරීම.</u>** ගලිගමුව - රුවන්වැල්ල - කරවනැල්ල දක්වා මාර්ගය (කි.මී. 000+0 සිට 210 + 29) රු.මි.2,472 ක පිරිවැයකට ඇස්පල්ට් අතුරා නවීකරණය කිරීමට කොන්ත්‍රාත්කරුවෙකුට පවරා තිබුණි. ඒ පිළිබඳව පහත සඳහන් කරුණු නිරීක්ෂණය විය.	
a	තාක්ෂණික ඇගයීම් කමිටුව විසින් කොන්ත්‍රාත්කරු ඉදිරිපත් කර ප්‍රමාණ බිල්පත්වල වැඩ විෂයන් ප්‍රමාණ, මිල අනුපාතයන් ඇගයීම පදනම් කර නොගෙන, කොන්ත්‍රාත් මිල පමණක් තක්සේරු කර තිබුණි. ඒ අනුව පස්වැඩ, පාලම් හා කාණු ඇතුළත් කොන්ත්‍රාත්කරු විසින් ඉදිරිපත් කර තිබුණු අන්තර් ගෙවීම් සහිත රු.මි. 439.49 වැඩි වීමක් ප්‍රමාණ බිල්පත්වල තිබෙන බව නිරීක්ෂණය විය. මෙම හේතුව නිසා ප්‍රමාණ බිල්පත්වල වෙනත් වැඩවල අඩුවීමක් නිරීක්ෂණය විය.	භෞතික සම්භාවිතාවන් 10% ක් මගින් වැඩිවූ රු.මි.439 මුදල ආවරණය වී ඇති අතර, විස්තරාත්මක සැලසුම් නිර්මාණය කරන අවස්ථාවේ මෙම ඉතුරුම් සිදු කෙරිණි. එබැවින් ප්‍රමාණ බිල්පත් වල අනෙක් වැඩ අඩුවීමේ හැකියාවක් නොමැත.

b	කොන්ත්‍රාත්කරුගේ බිල්පත්වල පස් කඩා වැටීම් වැළැක්වීමට රැඳවුම් තාප්ප ඉදිකිරීම සඳහා ප්‍රතිපාදන වෙන්කර නොතිබුණි. කෙසේ නමුදු මෙම මාර්ගයේ ස්ථාන 87 ක මී.1763 ක පැතිරුණු රැඳවුම් තාප්ප ඉදිකිරීමේ අවශ්‍යතාවය හඳුනා ගෙන ඇත.	මුල් ප්‍රමාණ බිල්පත්වල මී.10 පළලට රැඳවුම් තාප්ප ඉදිකිරීම සඳහා ප්‍රතිපාදන සපයා නොතිබුණි. කෙසේ නමුත්, මී. 16 ක් දක්වා මාර්ග පුළුල් කිරීම නිසා ඉවුරු තාප්පය අසමතුලිත දැඩි බෑවුම සහිත වැඩ බිම් තත්ත්වය නිසා කපා දැමීම සිදු විය. එබැවින්, ස්ථාන 87 ක දළ වශයෙන් මී. 1700 ක රැඳවුම් තාප්ප ඉදි කිරීමට සිදු විය.
c	මෙම මාර්ගයේ එක් පාලමක් පමණක් ඉදි කිරීමට පියවර ගෙන තිබුණි. ඉංජිනේරු කාර්යාලය විසින් දුර්වල තත්ත්වයේ තිබුණු පාලම් 5 ක් යළි ඉදි කිරීමටත් මාර්ගයට ගැලපෙන පරිදි තවත් පාලම් 2 ක් පුළුල් කිරීමටත් හඳුනාගෙන තිබුණි.	අංක 22/1 දරණ ඉතාමත් දුර්වල තත්ත්වයේ තිබුණු පටු පාලම හඳුනාගෙන යළි ඉදිකිරීමේ යෝජනාවේ ඇතුළත් කරන ලදි. කෙසේ නමුත් මාර්ගයේ ඇති තවත් පාලම් 07 ක් පටු හා මංතීරු දෙකක් මාර්ග සඳහා ප්‍රමාණවත් නොවන බව හඳුනා ගෙන මා.සං.අ. යේ වෙනත් වැඩ සටහනකට ඇතුළත් කරන ලදි.
c i	**<u>නෝර්වුඩ් - අප්කෝට් මාර්ගයේ අංක 9/12 පාලම ඉදි කිරීම.</u>** පහත සඳහන් නිරීක්ෂණ සිදු කරන ලදි. නෝර්වුඩ් - අප්කෝට් මාර්ගයේ අංක 09/12 පාලම ඉදිකිරීමට රු. 3,456,682 ක මුදලක් කොන්ත්‍රාත් කරුවෙකුට ප්‍රදානය කරන ලදි. නව කොන්ත්‍රාත් වටිනාකම රු. 8,162,377 ක් වන අතර පාලමේ පළල මී.4 සිට 7 දක්වා වැඩි කරන ලදි. අමතර වැඩ සඳහා අනුමැතිය ලබා නොදුන් අතර කොන්ත්‍රාත්කරු රු. 3,425,378 මුදලක් ලබා ගැනීමෙන් පසුව කොන්ත්‍රාත්තුව අතහැර තිබුණි.	මෙය සෘජු කම්කරු ක්‍රමය යටතේ ක්‍රියාත්මක කිරීමට 2010 වර්ෂයේ වැඩ සටහනට ඇතුළත් කර ඇත.
ii	පාලම් පෘෂ්ඨයේ එක් කොටසක පමණක් කොන්ක්‍රීට් ස්ථරයන් අතුරා ඇති අතර අනෙක් කොටසේ පිලි ආවරණ යොදා ප්‍රමාණවත් ලෙස ආවරණය කර නොමැති බැවින් අනතුරු හැඟවීමේ සංඥා යොදා තිබුණත් අනතුරු සිදුවීමේ ඉහළ අවදානමක් තිබුනි.	මේ සම්බන්ධව පියවර ගනු ලැබේ.
iii	පාලම ඉදිකිරීම 2010 ඔක්තොම්බර් 26 දින ආරම්භ කිරීමටත් 2011 මාර්තු 25 දින නිම කිරීමටත් යෝජනා කර තිබුණත්, 2016 ජුනි 30 වන විටත් ඉදි කිරීම් නිමකර නොතිබුණි.	2015 වර්ෂයේ ක්‍රියාත්මක කිරීමට අරමුදල් නොමැතිකම නිසා 2016 වැඩ සටහනට ඇතුළත් කරන ලදි. කෙසේ නමුත්, ලැබීමට නියමිත අරමුදල් වලින් කාර්යය ඉටුකල හැකිය.
d	**<u>විජේබාහුකන්ද පාලම ඉදිකිරීම.</u>** මෙම කොන්ත්‍රාත්තුව ඉදිකිරීම සඳහා ඉංජිනේරු ඇස්තමේන්තුව රු. 30,833,502 ක්ව තිබියදී ඊට 25.32% වඩා අඩුවෙන් රු. 23,907,253 මුදලකට	ප්‍රසම්පාදන මාර්ගෝපදේශ වලට අනුව ඉංජිනේරු ඇස්තමේන්තුවට වඩා අඩු

	කොන්ත්‍රාත්කරුට ප්‍රදානය කර තිබුණ අතර ඒ අනුව ප්‍රසම්පාදන කමිටුව, තාක්ෂණික ඇගයීම් කමිටුව විසින් තක්සේරු කරන ලද හා නිර්දේශ කරන ලද ප්‍රමාණ බිල්පත්වල ප්‍රධාන විෂයාංකවල වැඩ ප්‍රමාණ හා අනුපාත සැලකිල්ලට ගෙන ක්‍රියා කර නොතිබුණි. එබැවින් අපේක්ෂිත කාර්ය සාධනය හා ඉදිකිරිම්වල තත්ත්වය සැලකිල්ලට නොගත් බව නිරීක්ෂණය විය.	මිලකට ප්‍රදානය කරන කල ලංසු ප්‍රතික්ෂේප කිරීමට දැඩි හා කඩිනම් නීති නොමැත. තවද මෙය සංකීර්ණ ඉදි කිරීම් ව්‍යාපෘතියක් නොවන අතර ගෙවන මිල අඩුවවද තත්ත්වය ඊට ඇතුළත් නොවීය.
ii	පාලම ඉදිකිරීමේ වැඩ 2011 අප්‍රේල් 04 ආරම්භ කිරීමටත් එය 2012 ජනවාරි 09 ට පෙර නිම කිරීමටත් යෝජනා වූ අතර 2012 සැප්තැම්බර් 02 දක්වා කල් දිගු කිරීමක්ද ලබා දුනි. 2014 දෙසැ. 15 දින වන විටත් එය නිමකර නොතිබුණු අතර කල් දිගු කිරීමක් ලබා තිබුනේද ඇවර හානි අයකර තිබුනේද නැත.	කල් දිගු කිරීම් ලබා නොදුන්නද ව්‍යාපෘති ප්‍රමාද වීම වෙනුවෙන් ඇවර හානි අයකර ගෙන ඇත.
iii	කොන්ත්‍රාත් වටිනාකම අවස්ථා 2 කදී අතිරේක වැඩ නිසා රු. 11,992,423 ක් හෝ 50% කින් වැඩි කර තිබුණි.	කොත්මලේ ජලාශයේ මෙහෙයුම් අංශයන් නිසා ඉදිකිරීම් සැලසුම් වෙනස් කිරීමට සිදුවිය. එහි ප්‍රතිඵලයක් වශයෙන් රු.මි. 11.9 ක අතිරේක මුදලක් වියදම් කිරීමට සිදුවිය.
iv	පාලම ඉදිකර තිබුනද පාලම දෙපැත්තේ මාර්ග මෙතෙක් ඉදිකර නොමැත. තවද පාලමේ ආරක්ෂාව සඳහා පැති බැම්, අත්පිලි, පාලමේ මතුපිට දැරීම් ස්ථරය සහ පාලම හා ප්‍රවේශය අතර නැවත පිරවීම හා ප්‍රවේශය ඉදි කිරීමට තිබුණි.	පාලමට ප්‍රවේශ මාර්ගයන් ඒකාබද්ධ ග්‍රාමීය මාර්ග ආයෝජන ව්‍යාපෘතියට ඇතුළත් කරන ලදි.
4.2.2	**<u>ත්‍රිකුණාමලය පිටත වටරවුම් මාර්ගය ඉදිකිරීම සම්පූර්ණ නොකිරීම.</u>** මඩකලපුව - ත්‍රිකොන්ඩෙයිආරු - ත්‍රිකුණාමලය (A-15) හා අඹේපුස්ස - කුරුණෑගල - ත්‍රිකුණාමලය මාර්ගය සම්බන්ධ කරන පිටත වටරවුම් මාර්ගයේ පාලම් 8 ක් රු.මි. 3,495 ක් වැය කරමින් එ.රා. වානේ පාලම් ව්‍යාපෘතිය යටතේ 2009 හා 2010 තුල ඉදිකර තිබුණද මෙම පාලම් යාකෙරෙන මාර්ග අරමුදල් නොමැතිකම නිසා අවුරුදු 5 ක් ඉක්මවා තිබුණද වාහන ගමනා ගමනයට හැකිවන පරිදි නිමකර නොතිබුණි. RCT/B/RDA/2015/NA/AQ - 58 2016 ජුනි 30	මෙය එ.රා. වානේ පාලම් ව්‍යාපෘතියට සම්බන්ධය.
4.2.3 i	**<u>කතරගම සංචාරක නිවාසය ඉදි කිරීම.</u>** පහත දැක්වෙන නිරීක්ෂණයන් සිදු කරන ලදි. මගනැගුම මාර්ග ඉදිකිරීම් හා උපකරණ (පුද්) සමාගම විසින් ආරම්භ කරන ලද කතරගම සංචාරක නිවාසයේ ඉදිකිරීම් 2004 දී අඩ වශයෙන් නිමකර	ඉතිරි වැඩ නිම කිරීම සඳහා ඉංජිනේරු වරයා විසින් දෙන ලද ඇස්තමේන්තුවට අනුව රඳවා ගන්නා මුදලින් රු.මී. 2.19 ක් අඩුකර ගන්නා ලදි.

	නතර කර තිබුණි. ඉන්පසුව ඉදිකිරීම් වැඩ සෘජු ශ්‍රමය මගින් බිම් මහලේ බිත්ති මට්ටමට සිදුකර තිබුණි. පසුව කතරගම සංචාරක නිවාසයේ ඉදිකිරීම් 2010 වර්ෂයේදී රු.12,352,242 මුදලකට කොන්ත්‍රාත්කරුවෙකුට පවරා තිබුණු අතර එයින් රු. 11,771,448 ක් ඉටුකරන ලද වැඩ වෙනුවෙන් කොන්ත්‍රාත්කරුට ගෙවා තිබුණි. කොන්ත්‍රාත්කරු සමඟ එළඹුනු ගිවිසුමට අනුව 2011 ජුනි 7 ට පෙර නිමකල යුතුව තිබුණි. එහෙත් 2015 දෙසැම්බර් 31 වන තුරු වැඩ නිමකර නොතිබුණි.	
ii	කොන්ත්‍රාත්කරුවෙකු විසින් ඉටු කරන ලද වැඩවල සැලකිය යුතු ඌණතාවයක් තිබුණද එවැනි ඌණතා තිබියදී 2014 දෙසැම්.24 දින පළමුවැනි හල ඉදිකිරීම රු. 7,922,316.21 මුදලකට එම කොන්ත්‍රාත්කරුටම පවරා තිබුණි.	ඇවර හානි අයකර ගැනීමට පියවර ගනු ලැබේ.
iii	2016 මැයි 31 වන විටත් ගොඩනැගිල්ල ඉදිකිරීම නිම කිරීමේදී හා ගොඩනැගිල්ල භාවිතයට ගැනීමට පියවර ගෙන නොතිබුණි.	කොන්ත්‍රාත්තුවේ ඉතිරි වැඩ නව කොන්ත්‍රාත්තුවක් ලෙස ප්‍රදානය කිරීමට පියවර ගනු ලැබේ.
4.4	**<u>ඵලදායී නොවන ගණුදෙනු</u>** මේ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් සිදු කරන ලදි. 2009 නොවැම්බර් 19 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණයට අනුව ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවතේ ඉඩම සඳහා වාර්ෂික කුලිය වශයෙන් නාගරික සංවර්ධන අධිකාරියට රු.1000 ක් ගෙවිය යුතුය. කෙසේ නමුත් 2008 අගෝස්තු 20 දින මාර්ග සංවර්ධන අධිකාරිය හා නාගරික සංවර්ධන අධිකාරිය අත්සන් තබන ලද කුලී ගිවිසුමේ විධිවිධාන වලට අනුව අවු. 50 ක කාලයක් සඳහා වාර්ෂික කුලිය රු.මිලි. 6 ක් ලෙස තීරණය කර තිබුණි. අමාත්‍ය මණ්ඩලයේ අනුමැතිය පරිදි කුලී ගිවිසුම සංශෝධනය කර වාර්ෂික කුලිය අඩු කිරීමට අවශ්‍ය පියවර ගෙන නොතිබුණි. (RCT/B/RDA/2015/NL/AQ-28 - 2016 අප්‍රේල් 05)	කුලී ගිවිසුම දැනටමත් අත්සන් කර ලියා පදිංචි කිරීම සඳහා පියවර ගෙන ඇත. එය නීත්‍යානුකූල වූ වහාම වැඩිපුර ගෙවීම ආපසු අයකර ගැනීමට කටයුතු කරනු ලැබේ.
ii	2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වන මූල්‍ය ප්‍රකාශවල ප්‍රතිපාදනවල මූලික ගෙවීම් වෙනුවට රු. 466,561,476 ක කුලී මුදලක් ගෙවන ලද බවට සඳහන් වුවත්, මූලික ගෙවීම් හැර වෙනත් මුදලක් ගෙවා නොතිබුණි. කුලී ගිවිසුමේ සඳහන් විධි විධාන වලට අනුව නොගෙවන ලද ශේෂය සඳහා දඩ මුදල් පනවනු ලැබේ. එබැවින් හිඟ කුලී වාරික වෙනුවෙන්	කුලී වාරිකය රු. 1000 වශයෙන් සංශෝධනය කිරීමට 2009 දී අමාත්‍ය මණ්ඩල තීරණයක් ගන්නා ලදි. මීට පෙර 2008 අමාත්‍ය මණ්ඩල තීරණයට අනුව වසරකට රු.මී. 6 ක් ගෙවා ඇති අතර නව තීරණයට අනුව එය වැඩිපුර ගෙවීමක් ලෙස සලකනු ලැබේ.

	රු. 41,449,985/- දඩ අය කරනු ඇත. (RCT/B/RDA/2015/NL/AQ-28 - 2016 අප්‍රේල් 05)	එබැවින් පූර්ව ගෙවීම තත්‍ය ගෙවීමට අඩුවූ නිසා ගෙවීම සිදු කිරීම නොකරන ලදි. එබැවින් යම් දඩ මුදලක් පැනවුව හොත් තත්ත්වය පිළිබඳ පාර්ශවයන් දෙකම දන්නා බැවින් ඉන් නිදහස් කිරීමට ඉල්ලා සිටිය හැකිය.
iii	ප්‍රධාන කාර්යාල ගොඩනැගිල්ල විදේශ අරමුදල් ව්‍යාපෘතියක් විසින් ඉදිකරන ලද නමුත් 2014 නොවැම්බර් 14 අධිකාරිය වෙත භාරදී ඇති අතර 2015 අප්‍රේල් වන තුරුත් ප්‍රධාන කාර්යාලය නව ගොඩනැගිල්ල වෙත ගෙනැවිත් නොතිබුණි. එබැවින් 2014 දෙසැම්බර් සිට 2015 අප්‍රේල් දක්වා ගොඩනැගිලි කුලී වශයෙන් රු.මි. 49.4 ක් නාගරික සංවර්ධන අධිකාරිය වෙත ගෙවා තිබුණි.	ගොඩනැගිල්ල ඉදිකිරීම ප්‍රමාද වීම නිසා කාර්යාලය සෙත්සිරිපායේ සිට ගෙන ඒම ප්‍රමාද විය. එහි ප්‍රතිඵල ලෙස නා.සං.අ. වෙත ගොඩනැගිලි කුලී ගෙවීමට සිදු වූ අතර දැනට ගොඩනැගිල්ල සම්පූර්ණයෙන් ඉදිකර එය කාර්යාලය සඳහා පූර්ණව භාවිතා කරයි.
iv	2011 සිට 2015 දක්වා කාලය තුල රු.මිලි. 14,857.52 ඇස්තමේන්තුගත පිරිවැයකට මාර්ග ව්‍යාපෘති 169 ක ඉදිකිරීම් වැඩ ආරම්භ කළත් එය මාර්ග සංවර්ධන අධිකාරියේ විෂය පථයට අයත් නොවන බැවින් හා අරමුදල් නොමැතිකම නිසා අත්හිටුවන ලදි. 2015 දෙසැම්බර් 31 වන විට මේ සඳහා වැයවූ මුදල රු.මිලි. 2,213.87 කි. 2015 වර්ෂය තුල රු.මිලි. 7,293.38 ඇස්තමේන්තු පිරිවැයකට තවත් මාර්ග 73 ක පුළුල් කිරීමේ හා වැඩි දියුණු කිරීමේ ව්‍යාපෘති ආරම්භ කරන ලද නමුත්, මෙතෙක් නිමකර නොමැත. 2015 දෙසැ. 31 තෙක් වැයකර ඇති මුදල රු.මිලි. 1,68963 කි.	පහත සඳහන් හේතු මත ව්‍යාපෘතිය නියමිත කාලයට නිමකළ නොහැකි විය. • ඉඩම් අත්පත් කර ගැනීමේ ප්‍රමාදය • පැවති කාලගුණික තත්ත්වයන් • අරමුදල් හිඟකම හා මෙම ව්‍යාපෘති නිම කිරීම සඳහා තවමත් ක්‍රියාත්මක කරමින් තිබීම.
4.5 a	**<u>වත්කම් කළමනාකරණය</u>** මේ සම්බන්ධයෙන් පහත දැක්වෙන නිරීක්ෂණයන් සිදු කරන ලදි. **<u>අක්‍රීය වත්කම්</u>** 2012 සිට ඉදිරියට ගෙන එන ලද රු.32,139,477 වටිනා භාවිතා නොකල හා අක්‍රීය අමතර කොටස් 2015 දෙසැම්බර් 31 වන විටත් ගබඩාවල ඉතිරිව තිබුණි. (RCT/B/RDA/2015/NL/AQ-47 - 2016 මැයි 25)	මෙම අමතර කොටස් විකල්ප ලෙස භාවිතා කිරීම පිළිබඳව හා ඉදිරියේ ගත යුතු පියවර පිළිබඳ විමර්ශනය කිරීමට කමිටුවක් පත් කරන ලදි.
ii	රු.4,746,349 ක අතිරික්ත නිල ඇඳුම් තොග, සපත්තු හා සෙරෙප්පු, ඇස්පල්ට් පෙරමුසු යන්ත්‍රාගාරවල ද්‍රව්‍ය තොග ඉවත් කිරීම සැලකිල්ලට නොගෙන 2008 සිට ඉදිරියට ගෙන ගොස් තිබුණි.	මෙම භාණ්ඩයන් පිළිබඳව පරීක්ෂා කර බලා, විකල්ප භාවිතය පිළිබඳ යෝජනා කිරීමට කමිටුවක් පත් කරන ලදි. ඇතැම් අයිතමයන් භාවිතා කිරීම සඳහා නිකුත් කරමින් පවතී.

	(RCT/B/RDA/2015/NL/AQ-47 - 2016 මැයි 25)	
4.6	**<u>විවාදාත්මක ස්වභාවයේ ගණුදෙනු.</u>** අධිකාරිය ආශ්‍රිත සමාගම් සමග ඉටු කරන ලද ගණුදෙනු විවාදාත්මක ස්වභාවයේ තිබුණි. එවැනි ගණුදෙනුවල විස්තර පහත දැක්වේ.	
a i	**<u>මගනැගුම සමාගම් වලින් ලැබිය යුතු මුදල්</u>** අධිකාරිය විසින් අදාල සමාගම් සමඟ 2012 පෙබරවාරි 12 දින එළඹ තිබුණු ගිවිසුමට අනුව මගනැගුම ඉදිකිරීම් හා උපකරණ සමාගමට ලබාදී තිබුණු වාහන වෙනුවෙන් කුලී අයකර ගත යුතුව තිබුනද 2015 දෙසැම්බර් 31 වන තුරුත් අදාල සමාගමෙන් 2010 – 2014 කාලය සඳහා ලැබිය යුතු රු. 333,200,550 ක මුදලක් අයකර ගෙන නොතිබුණි.	මෙම මුදලේ ප්‍රමාණය විශාල වන බැවින් ණය මුදල සම්පූර්ණයෙන් නිරවුල් කිරීම ප්‍රායෝගික නොවේ. එබැවින් මෙම ලැබීම් වාරික වශයෙන් අයකර ගැනීමට ක්‍රියා කරමින් පවතී. 2016 වර්ෂය තුල මෙතෙක් රු.මි. 43.47 ක් අයකර ගෙන ඇත.
ii	2012 පෙබරවාරි 10 දින එළැම් ගිවිසුමට අනුව මගනැගුම සමාගම් වලට කුලියට ලබාදී තිබුණු යන්ත්‍ර, යන්ත්‍රාගාර හා වාහනවල කුලී මුදල් සඳහා කුලී අගය සංශෝධනය කිරීමට 2015 දෙසැම්බර් 31 දින වන විටත් පියවර ගෙන නොතිබුණි. ගිවිසුමේ 7 වන වගන්තිය අනුව 2015 දෙසැ. 31 වන විටත් ආදායම ගණනය කිරීමේදී මෙම යන්ත්‍ර සූත්‍ර පරීක්ෂාවක් සිදු කර නොතිබුණි.	කුලී මුදල්, ම.උ.අ. අනුපාතවලට අනුව, කුලී මුදල් තීරණය කර ඇත. කෙසේ නමුත්, අලුත්වැඩියා පිරිවැය ඉහළ බැවින් හා එය ම.මා.ඉ. හා උ. සමාගම විසින් දැරිය යුතු බැවින් අනුපාත සංශෝධනය කල නොහැකිය.
iii	2004 – 2007 කාලසීමාව තුල මගනැගුම මාර්ග ඉදිකිරීම් හා උපකරණ සමාගමට, වත්කම් හා පාරිභෝගික ද්‍රව්‍ය මිලදී ගැනීමට ලබාදී තිබුණු මුදල වෙනුවෙන් ලැබිය යුතු රු. 63,276,545 මුදල අදාල සමාගමෙන් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. (RCT/B/RDA/2015/CH/AQ-33 - 2016 අප්‍රේල් 20)	මගනැගුම මාර්ග ඉදිකිරීම් හා උපකරණ සමාගමට අයත් ණය ශේෂයන් හිඟ ණය මුදල් නිරවුල් කිරීමේ අරමුණින් යුතුව සැසඳුම් කිරීමට පියවර ගනු ලැබේ.
b	**<u>මගනැගුම සමාගම් වලට ගෙවිය යුතු මුදල්</u>** මගනැගුම සමාගමේ චේතන සඳහා 2012 සිට 2015 දෙසැම්බර් 31 වන විට ගෙවිය යුතු මුදල රු.10.923,083 ක් වූ අතර, 2014 වර්ෂයේ සිට පෙරමුසු සැපයුම් වෙනුවෙන් ගෙවීමට ඇති මුදල රු.5,685,164 කි. මෙම ගෙවීම් ශේෂයන් නිරවුල්	වැඩ බිල්පත් සඳහා 2016 ජූලි මස රු.මි. 10 ක් නිරවුල් කර ඇති අතර, අද දක්වා සීත පෙරමුසු සැපයුම වෙනුවෙන් රු.මිලි. 1.8 ක කොටසක් නිරවුල් කරන ලදි. ශේෂය 2016 දී අයකර ගැනීමට කටයුතු

	කිරීමට හෝ ලැබීම් වෙනුවෙන් හිලව් කිරීමට විමසුමට ලක්වූ වර්ෂය අවසන් වන විටත් පියවර ගෙන නොතිබුණි. (RCT/B/RDA/2015/CH/AQ-35 - 2016 අප්‍රේල් 27)	කරනු ලැබේ.
c i	**<u>විචලන නියෝග හා වැඩ නියෝග අනුමත නොකිරීම.</u>** අධ්‍යක්ෂ ජනරාල් / වැ.බ. සභාපතිගේ 2011 මාර්තු 28 දිනැති අංක 2011/01 දරණ චක්‍රලේඛයට අනුව, විචලන නියෝග හා අතිරේක වැඩ නියෝග අධ්‍යක්ෂ ජනරාල් ගෙන් ලබාගත යුතුව තිබුණි. එහෙත් පහත සඳහන් අතිරේක වැඩ සඳහා 2015 දෙසැම්බර් 31 වන විටත් අනුමැතිය ලබා ගෙන නොතිබුණි.	ක්‍රියාවලිය ක්‍රමික කිරීම සඳහා පහත සඳහන් පියවර මාලාව ගනු ලැබීය. • කොන්ත්‍රාත් වටිනාකමින් 10% අඩු විචලන නියෝග අධ්‍යක්ෂ ජනරාල්ගේ ටෙන්ඩර් මණ්ඩල යට යොමු කර ඇත. මා.සං.අ. යේ ටෙන්ඩර් මණ්ඩලයේ නිර්දේශයට අනුව ගෙවීම් සිදු කරමින් පවතී. • උසස් අධ්‍යාපන හා මහාමාර්ග අමාත්‍යාංශයේ ලේකම්ගේ උපදෙස්වලට අනුව කොන්ත්‍රාත් වටිනාකමින් 10% කට වැඩි විචලන නියෝග ගෙවීම් නිර්දේශ කිරීම සඳහා කැබිනට් අනු කමිටුවකට යොමු කර ඇත. කමිටුවේ අනුමැතියට අනුව ගෙවීම් සිදු කරමින් පවතී.

	අනුමැතිය සඳහා ඉදිරිපත් නොකරන ලද විචලන නියෝග මුදල (රු.මිලි)	අනුමැතිය සඳහා ඉදිරිපත් කළ යුතු විචලන නියෝග මුදල (රු.මිලි.)	එකතුව (රු.මිලි.)
කොන්ත්‍රාත් මුදල තුල විචලන නියෝග මුදල	987.4	272.8	1,262.2
කොන්ත්‍රාත් මුදල ඉක්මවමින් නිකුත් කරන ලද් විචලන නියෝග මුදල	384.7	42.3	427.0
එකතුව	1,372.1	315.1	1,687.2

ii	2013 මාර්තු 19 දිනැති අංක 2013-1 දරණ චක්‍රලේඛයට අනුව මගනැගුම මාර්ග ඉදිකිරීම් හා යන්ත්‍රෝපකරණ සමාගම වෙත වැඩ නියෝග නිකුත් කිරීමට මා.සං.අ. යේ අධ්‍යක්ෂ ජනරාල්වරයාගෙන් පූර්ව අනුමැතිය ගත යුතුය. කෙසේ නමුත් එම සමාගම වෙත නිකුත් කරන ලද පහත සඳහන් වැඩ නියෝග සඳහා පූර්ව අනුමැතිය ලබාගෙන නොතිබුණි.	වැඩ නියෝග නිකුත් කිරීමට අපගේ ලිඛිත නියෝග ලබා නැතත්, මෙය අධ්‍යක්ෂ ජනරාල්ගේ වාචික නියෝග මත ක්‍රියාත්මක කරන ලදි. පසුව අනුමැතිය අපේක්ෂිත වැඩ නියෝග, අ.ජ. ගේ අනුමැතිය සඳහා නිර්දේශ කිරීමට, අ.අ.වි. ගේ සහභාගිත්වයෙන් යුතු කමිටුවකට ඉදිරිපත් කරන ලදි. අ.ජ. ගේ අනුමැතිය පදනම් කරගෙන ගෙවීම් සිදු

		කරමින් පවතී.
	වැඩ නියෝගවල අගය (රු.මිලි.) දක්වා 2015 ජූලි ගෙවන ලද මුදල (රු.මි) 2013 සිට ඉදිරියට නිකුත් කරන ලද වැඩ නියෝග 17,093.4 2,898.7 2013 දක්වා නිකුත් කරන ලද වැඩ නියෝග 587,8 197,2 එකතුව 17,681,2 3,095.9	
iii	ප්‍රතිඵල ලෙස රු.මිලි. 18,7806 මාර්ග පුළුල් කිරීමේ හා වැඩි දියුණු කිරීමේ කොන්ත්‍රාත් සඳහා මගනැගුම මාර්ග ඉදිකිරීම් හා උපකරණ සමාගම වෙත පූර්ව අනුමැතිය හා අවශ්‍ය අනුමැතියෙන් තොරව රු.මිලි.18,780.6 මුදලක් සඳහා විවලන නියෝග නිකුත් කර තිබුණ අතර 2015 දෙසැ. 31 දින වන විට එයින් ගෙවා තිබුණු මුදල රු.මිලි. 186 කි. ඒ අනුව 2015 දෙසැ. 31 වන දිනට උපචිත අගය බිල්පත් අගය ගණනය කිරීමෙන් හා ඉටු කරන ලද වැඩවල අගය ගණනය කිරීමෙන් පසු අධිකාරියේ මූල්‍ය ප්‍රකාශවල සඳහන් කර නොතිබුණු අතර, මේ පිළිබඳ අනාවරණය කිරීමට පවා පියවර ගෙන නොතිබුණි.	මගනැගුම මාර්ග ඉදිකිරීම් හා උපකරණ සමාගමට රු.මිලි. 18 ක කොන්ත්‍රාත් ලබාදී තිබුණු නමුදු 2015 දෙසැ. 31 දින දක්වා සහතික කළ බිල්පත් ලැබී නොතිබුණි. එබැවින් මා.සං.අ. යේ මූල්‍ය ප්‍රකාශවල උපචිත අගය ගණනය කිරීමට නොහැකි විය.
4.7 A i	**<u>මානව සම්පත් කළමනාකරණය</u>** පහත සඳහන් දෑ නිරීක්ෂණය කරන ලදි. **<u>සේවක සංඛ්‍යාව</u>** මේ සම්බන්ධයෙන් පහත සඳහන් දෑ නිරීක්ෂණය කරන ලදි. 2015 දෙසැ. 31 වන විට අධිකාරියේ සේවක සංඛ්‍යාවට අනුව තනතුරු 12 ක පුරප්පාඩු 710 ක් හා තවත් තනතුරු 8 ක 1080 ක අතිරික්තයක් තිබුණි. (RCT/B/RDA/2015/HA/AQ-59 - 2016 ජූනි 30)	තනතුරු කාණ්ඩ 8 කට අයත්, 1080 ක අතිරේක සේවක සංඛ්‍යාවක් බඳවා ගැනීමට සිදු වුයේ දිවයින පුරා මාර්ග වැඩි දියුණු කිරීමේ හා පුනරුත්ථාපනය කිරීමේ වැඩ සටහන ක්‍රියාත්මක කිරීම නිසාය. මේ සඳහා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවෙන් අනුමැතිය ඉල්ලන ලද නමුත් නොලැබුණි. එබැවින් අතිරික්ත සේවා කාණ්ඩ වලට අයත් තනතුරු සඳහා නව බඳවා ගැනීම් අත්හිටුවන ලද කාණ්ඩ 12 කට අයත්

		තනතුරු 710 ක් පිරවීමට පියවර ගන්නා ලදි.
ii	අධිකාරියේ සමස්ත සේවක සංඛ්‍යාව 10,699 ක් වුවද 2015 මාර්තු 27 දින සිට මාස 15 ක කාලයක් අධ්‍යක්ෂ පාලන තනතුර සඳහා ස්ථීර නිලධාරියෙකු පත්කර නොතිබුණි. (RCT/B/RDA/2015/HA/AQ-14- 2016 ජනවාරි 18)	ස්ථීර පාලන අධ්‍යක්ෂවරයෙකු පත් කිරීම සඳහා පියවර ගන්නා ලදි.
iii	අත්‍යවශ්‍ය ජ්‍යෙෂ්ඨ කළමනාකරණ මට්ටමේ තනතුරු 6 ක් තාක්ෂණික සේවයේ තනතුරු 144 ක් හා ලිපිකරු හා සමාන්තර සේවයේ තනතුරු 28 ක් පුරප්පාඩු ඇති බවට නිරීක්ෂණය විය.මෙම තත්ත්වය අධිකාරියේ කාර්ය සාධනයට අහිතකර ලෙස බලපා ඇති බව තව දුරටත් නිරීක්ෂණය විය. (RCT/B/RDA/2015/HA/AQ-59 - 2016 ජුනි 30)	ජ්‍යෙෂ්ඨ කළමනාකරණ මට්ටමේ පුරප්පාඩු 6 න් 2 ක් සඳහා අයදුම්පත් කැඳවන ලදි. තාක්ෂණික සේවයේ තනතුරු 68 ක් සඳහා අයදුම්පත් කැඳවීමට පියවර ගන්නා ලදි.
b	**<u>වෙනත් ආයතනවලට මා.සං.අ. යේ සම්පත් ලබාදීම.</u>** 2003 ජුනි 02 දිනැති අංක PED/12 හා පොදු ව්‍යාපාර චක්‍රලේඛ 8.3.9 වගන්තියට අනුව පොදු ව්‍යාපාර වලට කවර තත්ත්වයන් යටතේ වුවද, රේඛීය අමාත්‍යාංශය හෝ වෙනත් රජයේ ආයතන වෙනුවෙන් වියදම් කිරීමට හෝ සම්පත් යෙදවීමට (මානව සම්පත් ඇතුළුව) අවසර දී නොමැත. කෙසේ නමුත්, මෙයට පටහැනිව විමසුමට ලක්වූ අවුරුද්ද තුල අධිකාරිය විසින් කාර්ය මණ්ඩලයේ 260 දෙනෙකු උසස් අධ්‍යාපන හා මහාමාර්ග අමාත්‍යාංශයට මුදා හැර පසුව මා.සං.අ. ට අනුයුක්ත කර තිබුණි. (RCT/B/RDA/2015/HA/AQ-45 - 2016 මැයි 23)	අනාගතයේ අමාත්‍ය මණ්ඩල අනුමැතිය මත කාර්ය මණ්ඩලය නිදහස් කිරීමට පියවර ගනු ලැබේ.
c i	**<u>ප්‍රසම්පාදන අංශයේ කාර්ය සාධනය</u>** මාර්ග සංවර්ධන අධිකාරියේ ප්‍රසම්පාදන කටයුතු මනාව හා කාර්යක්ෂමව ක්‍රියාත්මක කිරීමේ අරමුණෙන් ප්‍රසම්පාදන අංශය ස්ථාපිත කර තිබුණි. එසේ නමුත් අවුරුදු ගණනාවක සිට ප්‍රසම්පාදන අංශයේ කටයුතු අනුක්‍රමයෙන් අඩුවී තිබුණි.	ප්‍රසම්පාදන අංශය විමධ්‍යගත කිරීම නිසා අදාල අංශ ඔවුන්ගේ අවශ්‍යතා ප්‍රධාන ප්‍රසම්පාදන අංශය මගින් නොව ඔවුන් විසින් ප්‍රසම්පාදනය කර ගන්නා ලදි.
ii	අංශයට අනුමත සේවක සංඛ්‍යාව 36 ක් වුවද තථ්‍ය සංඛ්‍යාව 15 ක් වූ අතර ප්‍රධාන ඉංජිනේරු තනතුර හා කාර්මික නිලධාරි තනතුර සඳහා පුරප්පාඩු 1 බැගින්	ප්‍රසම්පාදන අංශය විමධ්‍යගත කිරීම නිසා ඒ අනුව සේවක සංඛ්‍යා අවශ්‍යතා ගැලපුම් කරන ලදි. දැනට පවත්නා

	හා ඉංජිනේරු තනතුරු සඳහා පුරප්පාඩු 3 ක් නිරීක්ෂණය විය.	සේවක සංඛ්‍යාවට අමතරව 2015 දී තවත් ඉංජිනේරුවන් දෙදෙනෙකු බඳවා ගන්නා ලදි.
iii	ප්‍රසම්පාදන අංශය විමසුමට ලක්වූ වර්ෂයේදී රු.මිලි. 31.32 ක ලිපිද්‍රව්‍ය පමණක් මිලදී ගැනීම සිදුකර තිබුණු අතර, වෙනත් ප්‍රසම්පාදන වෙනත් අංශ මගින් සිදු කර තිබුණි.	ප්‍රසම්පාදන අංශය ක්‍රමානුකූලව සිය කාර්යයන් අත්පත් කර ගනිමින් පවතී.
5 5.1 a	**<u>වගවීම හා යහපාලනය.</u>** **<u>සංයුක්ත සැලැස්ම.</u>** අංක PED /12 හා 2003 ජුනි 02 දිනැති චක්‍රලේඛයේ 5.1.3 වගන්තියේ යහපාලනය පිළිබඳ පොදු ව්‍යාපාර මාර්ගෝපදේශ වලට අනුව සෑම මුදල් වර්ෂයක්ම ආරම්භ වීමට දින 15 කට පෙර සංයුක්ත සැලැස්ම විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතුය. එපමණක් නොව 2014 - 2018 සඳහා සංයුක්ත සැලැස්ම 2015 ජනවාරි 1 දින, මාස 12 ප්‍රමාදයකට පසුව ඉදිරිපත් කර ඇත. සංයුක්ත සැලැස්ම නියමිත කාලයට සමාලෝචනය සඳහා පියවර ගෙන නොතිබුණි. 2015 සිට 2019 දක්වා සංයුක්ත සැලැස්ම මාස 12 කට පසුවී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කර 2016 ජනවාරි 4 දින විගණකාධිපති වෙත ඉදිරිපත් කර තිබුණු අතර 2006 සිට 2020 දක්වා සංයුක්ත සැලැස්ම අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කර මාස 02 කට ප්‍රමාදයෙන් පසු 2016 පෙබරවාරි 29 දින ඉදිරිපත් කර තිබුණි.	මෙය විශේෂ තත්ත්වයක් යටතේ සිදුවී ඇති අතර, අනාගතයේදී සංයුක්ත සැලැස්ම ඉදිරිපත් කිරීමට පියවර ගනු ලැබේ.
b	2013 ජුනි 02 දිනැති අංක PED /12 දරණ පොදු ව්‍යාපාර කාරක සභා චක්‍රලේකයට අනුව සෑම අංශයකම සේවක අවශ්‍යතාවය පිළිබඳ මානව සම්පත් අයවැය ආකෘතිය සංයුක්ත සැලැස්මේ ඇතුළත් කළ යුතුය. කෙසේ නමුත්, ඒ අනුව අධිකාරිය විසින් පිළියෙල කරන ලද සංයුක්ත සැලැස්මේ සේවක සංඛ්‍යා විස්තර ඇතුළත්ව නොතිබුණි.	අනාගතයේ සෑම අංශයකම සේවක අවශ්‍යතාවයන් සංයුක්ත සැලැස්මට ඇතුලත් කිරීමට පියවර ගනු ලැබේ.
5.2 i	**<u>ක්‍රියාකාරී සැලැස්ම.</u>** විමසුමට භාජනය වූ වර්ෂය සඳහා මා.සං.අ. යේ යළි සංශෝධිත අයවැය, අධ්‍යක්ෂ මණ්ඩලයේ අනුමැතිය සහිතව 2015 දෙසැ. 21 දින විගණකාධිපති වෙත ඉදිරිපත් කරන ලදි. කෙසේ නමුත් සංශෝධිත	අනාගත අනුකූලතාවය සඳහා සටහන් කර ගන්නා ලදි.

	අයවැයට අනුව මා.සං.අ. ක්‍රියාකාරී සැලැස්ම සංශෝධනය කිරීමට පියවර ගෙන නොතිබුණි.	
ii	2015 මුදල් වර්ෂය සඳහා ක්‍රියාකාරී සැලැස්මට අනුව සකස් කරන ලද ප්‍රගති වාර්තාව අධිකාරියේ අධ්‍යක්ෂ මණ්ඩලයට ඉදිරිපත් කර නොතිබුණි. තවද අධ්‍යක්ෂ මණ්ඩලයේ සමාලෝචනය සඳහා වාර්ෂික ප්‍රගති වාර්තා ඉදිරිපත් කිරීමේ ක්‍රමවේදය අධිකාරිය විසින් අනුගමනය කර නොතිබුණි.	අනාගතයේදී කාර්තුමය ප්‍රගති වාර්තාව අධ්‍යක්ෂ මණ්ඩලයට ඉදිරිපත් කිරීමට කටයුතු කරනු ලැබේ.
5.3 i	**<u>අයවැය පාලනය</u>** අවස්ථා 2 කදී 2015 වර්ෂයසඳහා අයවැය සංශෝධනය කර තිබුණු අතර අධ්‍යක්ෂ මණ්ඩලයේ අනුමැතිය පිළිවෙලින් 2014 දෙසැම්බර් 31 දින හා 2015 දෙසැම්බර් 21 දින ලබා තිබුණි. තවද සංශෝධිත අයවැය හා ආදායම හා වියදම අතර සැලකිය යුතු විචලනයන් නිරීක්ෂණය විය.	මෙය ප්‍රධාන වශයෙන් සිදුව ඇත්තේ සාමුහික ගිවිසුමේ වරප්‍රසාද වෙනුවට අන්තර් දීමනා ගෙවීම නිසාය. 2015 දී අන්තර් දීමනා ගෙවීමේ වැඩ පිළිවෙල පෙර සැලසුම් කිරීමට අපහසු කාර්යයක් වනුයේ එය සේවක ඉල්ලුම මත තීරණය වන නිසාය. තවද පිටත වටරවුම් මහාමාර්ගය ජාතික මහමාර්ග පද්ධතියට එකතු වීම නිසා අධිවේගී මාර්ගවල මුදල් එකතු කිරීම් ඉහල ගිය අතර එයද අයවැය සංශෝධන අවස්ථාවේදී පුරෝකථනය කිරීමට දුෂ්කර විය.
ii	2015 වර්ෂය සඳහා පිළියෙල කල වාර්ෂික අයවැය වර්ෂයේ පසු සමාලෝචනය කර සංශෝධනය හා වෙනස්කම් සිදු කර තිබුන බැවින් අයවැය කාර්යක්ෂම කළමනාකරණ පාලන උපකරණයක් ලෙස භාවිතා කර නොතිබුණි.	අයවැය පාලනය ශක්තිමක් කළ යුතු වේ.
6	**<u>පද්ධති හා පාලන</u>** විගණන ක්‍රියාවලිය තුල නිරීක්ෂණය වුනු පද්ධති හා පාලන ඌණතා වරින්වර අධිකාරියේ සභාපති වරයාගේ දැන ගැනීම සඳහා යොමු කරන ලදි. පහත සඳහන් පාලන ක්ෂේත්‍ර පිළිබඳ විශේෂ අවධානය යොමු කිරීමට අවශ්‍ය කෙරේ. අ) මූල්‍ය ප්‍රකාශ ඉදිරිපත් කිරීම. ආ) ලෙජර් ගිණුම් හා උපලේඛන නඩත්තුව. ඇ) වෙනත් අදාල පාර්ශවයන් සමඟ ගණුදෙනු අනාවරණය කිරීම.	

	ඈ) කොන්ත්‍රාත් පාලනය ඉ) මාර්ග නඩත්තුව හා සේවා දායක වැඩ ඊ) ප්‍රාදේශීය කාර්යාල කළමනාකරණය උ) රථවාහන භාවිතය ඌ) ඉඩම් භාවිතය එ) තොග පාලනය	

සභාපති,
මාර්ග සංවර්ධන අධිකාරිය.

මාර්ග සංවර්ධන අධිකාරිය

වාර්ෂික වාර්තාව - 2015

මාර්ග සංවර්ධන අධිකාරියේ කාර්ය සාධනය

මාර්ග සංවර්ධන අධිකාරිය - වාර්ෂික වාර්තාව - 2015

1 **<u>මා.සං.අ. යේ කාර්ය සාධනය</u>**

2015 වර්ෂය තුල මා.සං.අ. යේ කාර්ය සාධනය පිළිබඳ සියලුම විස්තරාත්මක තොරතුරු ඉහත සඳහන් වාර්තාවේ 3 – 7 දක්වා පරිච්ඡේදවල දක්වා ඇත. පහත දැක්වෙන්නේ මා.සං.අ. යේ වැදගත් ක්ෂේත්‍රවල කාර්ය සාධනය පිළිබඳ සාරාංශයකි.

1 **මාර්ග නඩත්තුව ක්‍රියාත්මක කිරීම :** 2015 වර්ෂය තුල ඒ හා බි පංති මාර්ග කි.මී. 12,210 කින් අධිවේගි මාර්ග කි.මී. 169,85 කින් හා පාලම් 4,456 කින් සමන්විත ජාතික මහාමාර්ග ජාලය සාමාන්‍ය ලෙස පවත්වා ගෙන යාම හා නඩත්තු කිරීම සිදු කරන ලදි. ඊට අමතරව මාර්ග කි.මී. 272.09 ක දේශීය අරමුදල් භාවිතා කර වැලි මුද්‍රිත තාර ආලේපනය සිදු කරන ලදි.

2 **දේශීය අරමුදල් යටතේ මහාමාර්ග සංවර්ධනය :** මාර්ග පුනරුත්ථාපනය හා වැඩි දියුණු කිරීම දේශීය අරමුදල් මෙන්ම විදේශ අරමුදල් මගින් ක්‍රියාත්මක කරනු ලැබේ. දේශීය අරමුදල් වලින් මහාමාර්ග සංවර්ධනය කිරීම පළාත්භාර අධ්‍යක්ෂ කාර්යාල විසින් රටපුරා ක්‍රියාත්මක කෙරේ. 2015.12.31 දින වන විට දේශීය අරමුදල් වලින් පුළුල් කිරීම් හා වැඩි දියුණු කිරීම් ව්‍යාපෘති යටතේ, ව්‍යාපෘති 116 ක් නිම කරන ලද අතර ව්‍යාපෘති 342 ක් ක්‍රියාත්මක කරමින් පැවතුණි. ඊට අමතරව, 2015 වාර්ෂික වාර්තාවේ 5 වැනි ඡේදයේ විස්තර කර ඇති පරිදි විදේශ අරමුදල් මගින්, මාර්ග සැලකිය යුතු ප්‍රමාණයක් පුනරුත්ථාපනය හා වැඩි දියුණු කර තිබුණි.

3 **පාලම් ඉදිකිරීම :** 2015 වර්ෂය අවසානයේදී දේශීය අරමුදල් යටතේ ආරම්භ කරන ලද දුබල පාලම් යලි ඉදිකිරීමේ වැඩ සටහන යටතේ දුබල පාලම් 83 ක් යලි ඉදි කරන ලදි. එ.රා. අරමුදල් සැපයූ වානේ පාලම් ව්‍යාපෘතිය II අදියර යටතේ පාලම් 28 නිමකළ අතර, 2015 අවසානය වන විට පාලම් 23 ක් ඉදි කෙරෙමින් පැවතිණි. ඊට අමතරව විදේශාධාර ව්‍යාපෘති කළමනාකරණ ඒකකය යටතේ පාලම් ඉදිකිරීම් ව්‍යාපෘති කීපයක් නිම කෙරිණි.

4 **මාර්ග හා පාලම් සැලසුම් කිරීම :** 2015 වර්ෂය අවසානය වන විට වර්ෂය තුල රටපුරා ජාතික මාර්ග ජාලයේ කි.මී. 152 ක් සැලසුම් පාලම් 70 ක පාලම් සැලසුම් හා අන්තර් ඡේදන 37 ක සැලසුම් සැලසුම් නිමකරනු ලැබීය. මාර්ග කි.මී. 391 ක මාර්ග සැලසුම්, අධිවේගි මාර්ග කි.මී. 178 ක සැලසුම් පාලම් 42 ක සැලසුම් හා අන්තර් ඡේදන 31 ක සැලසුම් නිර්මාණය

කෙරෙමින් පැවතිණි. මෙම සැලසුම් වැඩ කොළඹ, රත්නපුර, මහනුවර හා කුරුණෑගල ස්ථාපිත කර ඇති සැලසුම් කාර්යාල 4 ක් මගින් ක්‍රියාත්මක කරන ලදි.

5 **මාර්ග හා පාලම් වැඩවල තත්ත්ව පාලන වැඩ :** 2015 වර්ෂය තුල මා.සං.අ. යේ පර්යේෂණ හා සංවර්ධන අංශය, පළාත් රසායනාගාර 9 මගින්, මාර්ග ඉදිකිරීම හා නඩත්තුව සඳහා අඛණ්ඩව උපදෙස් හා සහාය ලබා දීමට කටයුතු කරන ලදි.

6 **ඉඩම් අත්පත්කර ගැනීම හා ප්‍රතිස්ථාපනය :** 2015 වර්ෂය තුල ඉඩම් අත්පත්කර ගැනීම් හා ප්‍රතිස්ථාපන අංශය, මා.සං.අ. විසින් ක්‍රියාත්මක කරන ලද මාර්ග හා පාලම් ව්‍යාපෘති සඳහා ප්‍රාදේශීය ලේකම්වරුන් මගින් ඉඩම් අත්පත්කර ගැනීම සම්බන්ධීකරණය කරන ලදි.

7 **පාරිසරික හා සාමාජීය ආරක්ෂණ පියවර ක්‍රියාත්මක කිරීම :** මා.සං.අ. යේ පාරිසරික හා සාමාජීය අංශය විසින් පා.බ.ත. හා ආ.පා.ත. වාර්තාව පිළියෙල කිරීම ඇතුළුව විවිධ මාර්ග සංවර්ධන ව්‍යාපෘතිවල පාරිසරික හා සාමාජීය ආරක්ෂණ පියවර ක්‍රියාත්මක කිරීම සඳහා අඛන්ඩව සහාය දෙන ලදි.

8 **අධිවේගි මාර්ග සංවර්ධනය :** ශ්‍රී ලංකාවේ ප්‍රථම අධිවේගි මාර්ගය වන දක්ෂිණ අධිවේගි මාර්ගය කොට්ටාව සිට පින්නදූව දක්වා නිමකර 2011 නොවැම්බර් මස මහජනයා සඳහා විවෘත කරන ලදි. දක්ෂිණ අධිවේගි මාර්ගයේ 2 අදියර පින්නදූව සිට මාතර ගොඩගම දක්වා කොටස (කි.මී. 34.54) නිමකර 2014 මාර්තු මස මහජනයා සඳහා විවෘත කරනු ලැබීය.

කොළඹ නාගරික ප්‍රදේශය මග හරිමින් දක්ෂිණ අධිවේගි මාර්ගය හා කොළඹ - කටුනායක අධිවේගි මාර්ගය සම්බන්ධ කරන පිටත වටරවුම් මාර්ගය ලංකාවේ අධිවේගි මාර්ග ජාලයේ ප්‍රධානතම කොටසක් ලෙස හඳුනාගෙන ඇත. පිටත වටරවුම් මාර්ගය කොට්ටාව සිට කඩුවෙල (කි.මී. 11) කඩුවෙල සිට කඩවත (කි.මී. 8.9) සහ කඩවත සිට කෙරවලපිටිය (කි.මී. 9.3) දක්වා යන කොටස් තුනකින් සමන්විතය. කොට්ටාව සිට කඩුවෙල දක්වා පි.ව.මා. 1 කොටස ඉදි කිරීම 2014 මාර්තු මස නිම කෙරිණි. පි.ව.මා. කඩවත සිට කෙරවලපිටිය දක්වා 2 කොටස 2015 ජූලි මස නිමකර 2015 සැප්තැම්බර් 17 දින මහජනයා සඳහා විවෘත කරන ලදි. 2015 අවසානය වන විට පි.ව.මා. 3 කොටස සඳහා ඉඩම් අත්පත්කර ගැනීම් ක්‍රියාත්මක කෙරෙමින් පැවතුණු අතර, පූර්ව ඉදිකිරීම් ආරම්භ කර තිබුණි.

සමස්ත කාර්ය සාධනය : 2015 වර්ෂය සඳහා විදේශ හා දේශීය අරමුදල් ඇතුළුව මා.සං.අ. යේ සමස්ත ප්‍රතිපාදන රු.මිලි. 191,214.20 ක් හා 2015 වර්ෂය සඳහා වියදම රු.මිලි. 173,373.62 ක් විය.

කාර්යය	ප්‍රතිපාදන (රු.මිලි.)	වියදම (රු.මිලි.)
අධිවේගී මාර්ග සංවර්ධනය	49,906.42	45,236.75
මහාමාර්ග සංවර්ධනය	84,300.46	76,475.37
මාර්ග පුළුල් කිරීම් හා වැඩි දියුණු කිරීම්	19,923.64	17,270.03
පාලම් හා ගුවන් පාලම් ඉදිකිරීම	11,181.27	8,669.19
ස්වාභාවික ආපදා බලපෑ මාර්ග පුනරුත්ථාපනය	451.87	398.15
ආයතනමය සහාය	25,450.53	25,324.12
එකතුව	**191,214.20**	**173,373.62**

1971 අංක 38 දරණ මුදල් පණතේ

අංක 14(2) (c) වගන්තියට අනුව

මාර්ග සංවර්ධන අධිකාරියේ

2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ

වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳ

විගණකාධිපතිවරයාගේ වාර්තාවේ

මතුකර ඇති කරුණු පිළිබඳව

ගන්නා ලද පියවරයන්

1971 අංක 38 දරණ මුදල් පණතේ 14(2) (C) දරණ වගන්තියට අනුව, 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා මාර්ග සංවර්ධන අධිකාරියේ මූල්‍ය ප්‍රකාශ ගැන විගණකාධිපතිවරයා විසින්, මතු කරන ලද කරුණු පිළිබඳව අනුගමනය කරන ලද පියවර.

2.2 **මූල්‍ය ප්‍රකාශය පිළිබඳ අදහස්**

2.2.1 **ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශ පිළියෙල කිරීම**

2017 සිට අනුකූල වීමට සටහන් කර ගන්නා ලදි.

2.2.2. **ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම් ප්‍රමිති (SLPSAS) සමඟ අනුකූල වීම.**

(අ) ශ්‍රීලංරාඅගිප්‍ර 1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම:

i. 2016 වර්ෂය සඳහා ගිණුම් අවසන් කිරීම සඳහා මූල්‍ය චක්‍රලේඛ අංක 346 මගින් දැනටමත් පැහැදිලි උපදෙස් දී ඇත.

ii. 2016 වර්ෂය සඳහා ගිණුම් අවසන් කිරීම සඳහා මූල්‍ය චක්‍රලේඛ අංක 346 මගින් දැනටමත් පැහැදිලි උපදෙස් දී ඇත.

iii. 2016 වර්ෂය සඳහා ගිණුම් අවසන් කිරීම සඳහා මූල්‍ය චක්‍රලේඛ අංක 346 මගින් දැනටමත් පැහැදිලි උපදෙස් ලබාදී ඇත.

(ආ) ශ්‍රීලංරාඅගිප්‍ර 3 හා ගිණුම් ප්‍රතිපත්ති ඇස්තමේන්තු හා දෝෂ ගිණුම්කරණයේදි වෙනස්කම්:

ගිණුම්කරණ ශ්‍රීලංරාඅගිප්‍ර - 3 ට අනුකූල වන අතර 2017 වර්ෂයෙන් සිට වෙනම සිටහන් මගින් අනාවරණය කරනු ලැබේ.

(ඇ) ශ්‍රීලංරාඅගිප්‍ර 7 වත්කම් පිරියත හා උපකරණ

i. වත්කම් ප්‍රති තක්සේරු සඳහා දැනටමත් පියවර ගෙන ඇත. කෙසේ නමුත්, තක්සේරු දෙපාර්තමේන්තුව විසින් ප්‍රති තක්සේරු වාර්තා මෙතෙක් ඉදිරිපත් කර නොමැත.

ii. 2017 සිට අනුකූල වීමට සටහන් කර ගන්නා ලදි.

2.2.3 **ගිණුම්කරණ ඌනතා**

අ) 2016 වර්ෂය තුල රු.මිලි. 271.4 ක් වටිනා වත්කම් ප්‍රාග්ධන ගතකරන ලදි. තවද, 2017 ජුනි මාසය තුල රු.මිලි. 248.1 වටිනා වත්කම් ප්‍රාග්ධනගත කරන ලදි.

ආ) 2016 වර්ෂයේදි මේවා ගිණුම් වලට ගෙන එනු ලැබීය.

ඇ) i විගණකාධිපතිවරයාට විස්තරාත්මක පැහැදිලි කිරීම් ලබාදුනි.

Ii 2016 වර්ෂය තුල ගිණුම්වල අවශ්‍ය ගැලපුම් සිදු කරන ලදි.

2.2.4 **පැහැදිලි නොකල වෙනස්කම්**

අ) මෙම වෙනස්කම ලංකා බැංකුවට සම්බන්ධ ණය මුදල් දෙකක් තහවුරු නොකිරීම නිසා මතු වූවකි.

ආ) මෙම වෙනස 2016 වර්ෂයේ ගිණුම් ගත කරන ලදි.

ඇ) ගිණුම් සැසඳුම් සිදු කෙරෙමින් පවතී.

2.2.5 **ලැබීම් හා ගෙවීම් පිළිබඳ ගිණුම්**

අ) ලැබීම් පිළිබඳ ගිණුම්.

i 2016 වර්ෂය තුල රු. 448,442,337.06 ක මුදලක් නිරවුල් කරන ලද අතර, ඉතිරි ශේෂයන් නිරවුල් කිරීමට අදාල නිලධාරීන්ට උපදෙස් දෙන ලදි.

ii දීර්ඝ කාලීන හිඟයක් සැසඳීමට හා නිරවුල් කිරීමට අදාල නිලධාරීන්ට උපදෙස් දෙනු ලැබීය.

iii 2016 වර්ෂය තුල රු. 834,870/- ක මුදලක් නිරවුල් කරන ලද අතර, වෙනත් තැන්පතු සැසඳුම් කරමින් පවතී.

iv 2016 වර්ෂය තුල රු. 4,853,344/- මුදලක් අයකර ගෙන ඇත.

v ජා.ඉ.බැ. අරමුදල් ව්‍යාපෘතිවල බිල්පත් නිරවුල් කිරීමට 2017 දී භාණ්ඩාගාරය විසින් වෙනම වැය ශීර්ෂයක් සඳහා දෙන ලද අග්‍රිමයෙන් සමස්ත අත්තිකාරම් මුදලට රු.460,226,704/- ක මුදලක් 2017 ජූනි මසදී හිලව් කරන ලදි.

vi මෙම කරුණු නිරාකරණය කිරීම සඳහා ගිණුම් සැසඳුම් සිදු කෙරෙමින් පවතී. රු.40,625,664.09 ක මුදලක් මේ වන විට අයකර ගෙන ඇති අතර, රු.මිලි.14.3ක මුදලක් අයකර ගැනීමට නෛතික පියවර ගෙන ඇත. ඉතිරි ශේෂය මෙම කොන්ත්‍රාත්කරුවන්ට ඇති ගෙවීම්වලින් අයකර ගැනීමට පියවර ගනිමින් පවතී.

vii 2016 වර්ෂය තුල රු. 961,388,296.63ක මුදලක් නිරවුල් කරන ලද අතර, අත්තිකාරම් නිරවුල් කිරීම සඳහා 2017 ජූනි මස රු. 811,796,343.54 වටිනා බිල්පත් ඉදිරිපත් කෙරිණි. 2017 ජූනි 30 දක්වා රු.1,119,966,845/- ක මුදලින් රු.902,462,476.51 ක මුදලක් නිරවුල් කරන ලදි.

viii 2016 වර්ෂය තුල රු.18,435,626.16 ක මුදලක් නිරවුල් කරනු ලැබීය.

ix 2016 වර්ෂය තුල රු. 576,439.65 ක මුදලක් අයකර ගෙන තිබුණු අතර එය නීති උපදෙස් සඳහා නීතිපතිවරයා වෙත යොමු කරන ලදි.
පදිංචිකරුට එරෙහිව නීති කෘත්‍යයක් ආරම්භ කරන ලද අතර 2016 වර්ෂය තුල රු.536,206.83 ක මුදලක් අයකර ගන්නා ලදි.

x අදාල සේවකයන්ගෙන් රු.මි.1.2 ක් වාරික පදනම මත අයකර ගැනීමට පියවර ගනිමින් සිටින අතර, සෙසු මුදල් දැනටමත් අයකර ගෙන ඇත.

xi රු.395,544/- මුදලක් දැනටමත් අයකර ගෙන ඇත. ඇපකරුගෙන් රු.408,140/- මුදලක් අයකර ගැනීමට පියවර ගෙන තිබේ. රු. 632,184.23 ක මුදලක් කපා හැරීම සඳහා අනුමැතිය ලබා ගැනීමට අධ්‍යක්ෂ මණ්ඩලයට යොමුකර තිබේ. ඉතිරි ශේෂය වන රු. 1,668,917.50 ක මුදල අදාල සේවකයන්ගේ එකඟතාවය ඇතිව ඔවුන්ගේ පාරිතෝෂික ගෙවීම් වලින් අයකර ගැනීමට කටයුතු කරමින් පවතී.

ආ) ගෙවීම් පිළිබඳ ගිණුම්

i. වෙනත් අරමුදල් වලින්, වැඩ නිමකර ඇති තැන්වල 2016 දී රු.මිලියන 154 ක මුදලක් ආපසු ලියන ලදි.

ii. විගණකාධිපතිවරයාට පැහැදිලි කිරීම් ලබාදී ඇත.

iii. රු.මිලි.160.2 ක මුදලක් නිදහස් කර ඇති අතර, 2016 වර්ෂය තුල ගිණුම් වලට රු.මිලි. 12 ක මුදලක් ආපසු ලියන ලදි. අනෙකුත් දිගු කාලයක් නොගෙවා ඇති ශේෂයන් ආපසු ලිවීම හෝ මුදා හැරීම කළ යුතු දැයි සමාලෝචනය කිරීමට කමිටුවක් පත් කිරීම සඳහා පියවර ගනිමින් සිටියි.

iv. ගැටුම් සහිත බිල්පත් ඉහළ මට්ටමේ කමිටුවකට ඉදිරිපත් කරනු ලැබීය. මේ පිළිබඳව කටයුතු කරමින් පවතින අතර එය කමිටු තීරණයට අනුව නිරවුල් කෙරෙනු ඇත.

v. ප්‍රමාණ ඉක්මවූ විචලනයන් සහිත මුදල වූ රු.මිලි. 47 හැර ඉතිරි ශේෂයන් සම්පූර්ණයෙන් නිරවුල් කරන ලදි.

vi. 2016 වර්ෂය තුල රු. 341,143,715.75 ක මුදලක් ආදායමට හර කරන ලද අතර රු.32,223,592.51 මුදලක් අදාල කොන්ත්‍රාත්කරුවන්ට මුදා හරින ලදුව, අවශ්‍ය පියවර ගැනීම සඳහා ශේෂය සමාලෝචනය කරමින් පවතී.

2.2.6 **<u>විගණනය සඳහා සාක්ෂි නොමැතිකම.</u>**

විගණන අවශ්‍යතාවය සම්පූර්ණ කිරීම සඳහා පූර්ණ තොරතුරු සහිතව උපලේඛන පිළියෙල කිරීමට මූල්‍ය චක්‍රලේඛ 346 මගින් පැහැදිලි උපදෙස් ලබාදී තිබේ.

2.3 **<u>නීති නියමයන් රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම.</u>**

අ) i මෙය අනාගතයේ නැවත නොකරන ලෙස අදාල නිලධාරීන්ට උපදෙස් ලබාදී ඇත.

ii මෙම චෙක්පත් 2016 දී අවලංගු කෙරිණි. රු. 124,973.20 මුදලක් සඳහා අළුතින් චෙක්පත් නිකුත් කරන ලද අතර, රු. 2,862,161.07 මුදලක් ආදායමට හර කරන ලදි.

ආ) i සේවකයන් 204 ක් ආපසු මා.සං.අ. වෙත අනුයුක්ත කරන ලදි.

ii අනුකූල වීම සඳහා සටහන් කර ගන්නා ලදි.

4 **මෙහෙයුම් සමාලෝචනය**

4.1 **කාර්ය සාධනය**

4.1.1 **ජාතික මහාමාර්ග හා පාලම් නඩත්තු වැඩ**

i. 2016 වර්ෂය තුල මා.සං.අ. විසින් මාර්ග නඩත්තු වැඩ සඳහා රු.මිලි. 4,259.8 ක් වැය කළ අතර එය සමස්ත ප්‍රතිපාදන වලින් 85% කි.

ii. මෙම ව්‍යාපෘති 2015 අවසානයේදි නිම කරන ලද නමුත් බිල්පත් කල් පසුවී ලැබුණි.

iii. ප්‍රතිපාදන භාවිතය සඳහා නියමිත වේලාවට අග්‍රිමය නොලැබුණි.

4.1.2 **ඉංජිනේරු සේවා හා පාලම් සැලසුම් අංශයේ කාර්ය සාධනය**

i. අනුකූලවීම සඳහා සටහන් කර ගන්නා ලදි.

ii. 2016 දී පාලම් පාලම් 18 ක් නිමකළ අතර ජ්‍යාමිතික සැලසුම් සඳහා මූල්‍යනය ප්‍රමාද වීම නිසා පාලම් 2 ක් නිම කිරීමට නොහැකි විය.

iii. දැනටමත්, විගණකාධිපතිවරයාට පැහැදිලි කිරීම් ලබා දී ඇත.

4.2 **කොන්ත්‍රාත් පරිපාලනය.**

4.2.1 **මාර්ග පුනරුත්ථාපනය හා වැඩි දියුණු කිරීම.**

(අ) **මාර්ග පුළුල් කිරීම හා වැඩි දියුණු කිරීම**

i. තත්ත්වය වෙනස් කිරීම සඳහා සමාලෝචනය කරමින් පවතී.

ii. අරමුදල් නොමැතිකම නිසා ඇතැම් ව්‍යාපෘති අඩු කරන ලද විෂය පථය සහිතව නිම කරන ලදි. අනෙකුත් ව්‍යාපෘති අරමුදල් පැවතීම සැලකිල්ලට ගෙන 2017 වර්ෂයේදි සලකා බලනු ඇත.

(ආ) **දේශීය බැංකු අරමුදල් ව්‍යාපෘති**

i. අනාගතයේදි නොකැඳවන ලද ව්‍යාපෘති පිළිබඳ කටයුතු කිරීමේදි "ස්විස් චැලේන්ජ් පරිපාටිය" නම් ප්‍රසම්පාදන මාර්ගෝපදේශ අතිරේකය 30 අනුගමනය කිරීමට උපදෙස් නිකුත් කර ඇත.

ii. "ස්විස් චැලේන් පරිපාටිය" අනුගමනය කිරීමෙන් රජයට උපරිම ප්‍රතිලාභ ලබා ගැනීම සඳහා වඩා අඩු මිල ගණන් තෝරා ගත හැකිය.

iii. මෙම මාර්ග අවු. 10 කට පෙර ඉදි කරන ලද අතර, මාර්ගවල තත්ත්වය ප්‍රමිතියකට නොමැති බැවින්, දේ.බැ.අ. ව්‍යාපෘතිය යටතේ පුනරුත්ථාපන වැඩ සටහනට ඇතුළත් කිරීම අවශ්‍ය වේ.

iv. දැනට ව්‍යාපෘති 18 ක් නිමකර ඇත. ව්‍යාපෘති 3 ක් නිම කිරීමට ආසන්න අතර ක්‍රියාත්මක කෙරෙමින් පවතින ව්‍යාපෘති 7 ක් ඉදිරි මාස 3 තුල නිම කිරීමට හැකිය. 2017 ජුනි 25 දක්වා ඒ සඳහා සකස් කළ වැය ශීර්ෂයෙන් රු.මිලි. 13.9 ක් ලැබුනි. එබැවින් කිසිදු මූල්‍ය අර්බුදයක් නොමැත.

v. මෙම මුදල මාසික අන්තර් ගෙවීම් වලින් අඩුකර ගෙන ඇත.

vi. විගණකාධිපතිවරයා වෙත දැනටමත් පැහැදිලි කිරීම් ලබාදී ඇත.

(ඇ) **<u>නෝර්වුඩ් - අප්කොට් මාර්ගයේ පාලම ඉදිකිරීම.</u>**

i. ඉතිරි වැඩ නිම කෙරිණි.

ii. ඉතිරි වැඩ නිම කෙරිණි.

iii. වැඩ නිම කෙරිණි.

(ඇ) **<u>විජේබාහු කන්ද පාලම ඉදිකිරීම.</u>**

i. වැඩ නිම කෙරිණි.

ii. වැඩ නිම කෙරිණි.

4.2.2. **<u>ත්‍රිකුණාමලය පිටත වටරවුම් මාර්ගය යලි ඉදිකිරීම.</u>**

ඉඩම් අත්පත්කර ගැනීමේ පරිපාටියට අනුව ඉඩම් අත්පත්කර ගැනීමෙන් පසුව මාර්ගය ඉදි කිරීමට තීරණය කරන ලදි.

4.2.3 **<u>කතරගම සංචාරක නිවාසය ඉදිකිරීම.</u>**

111 රු.මිලි. 15 ක ඉතිරි වැඩ සඳහා කොන්ත්‍රාත්තුව කොන්ත්‍රාත් අංක RDA/MM/SP/GOSL/2016/55 යටතේ තරඟකාරී ලංසු මගින් ප්‍රදානය කරන ලදි.

4.4 **<u>ඵලදායි නොවන ගණුදෙනු</u>**

i. සංශෝධිත කුලී යටතේ නව බදු ගිවිසුමක් අත්සන් කර තබන ලද අතර, 2016 දී ගිණුම්වල අවශ්‍ය ගැලපුම් සිදු කරනු ලැබීය.

ii. ප්‍රධාන කාර්යාලය දැනටමත් නව ගොඩනැගිල්ලකට ගෙන ගොස් ඇත.

iii. ඇතැම් ව්‍යාපෘති අඩුකරන ලද විෂය පථය යටතේ ක්‍රියාත්මක කරන ලදි.

4.5 **වත්කම් කළමනාකරණය**

අ) මෙම විෂයාංකයන් ඉවත් කිරීමට කටයුතු කරන ලදි.

ආ) නිල ඇඳුම් ද්‍රව්‍ය දැනටමත් නිකුත් කර ඇති අතර, වෙනත් ද්‍රව්‍යයන් ඉවත් කිරීමට පියවර ගෙන තිබේ.

4.6 **විවාදාත්මක ස්වභාවයේ ගණුදෙනු**

අ) i. රු.මිලියන 143.5 ක මුදලක් අයකර ගන්නා ලදි.

ii. මේ පිළිබඳව මගනැගුම සමාගම වෙත රැස්වීමක් පවත්වන ලද අතර, ශේෂය සසඳා බලා ලැබීම් අයකර ගැනීමට තීරණය කෙරිණි.

ආ) i මෙය 2016 වර්ෂයේදී නිරාකරණය කරන ලදි.

ඇ) අනුමත නොකල විචලන නියෝග හා වැඩ නියෝග

i. ගැටළු 37 කින් 10 ක් හැර අනිකුත් සියල්ල නිරාකරණය කරන ලදි.

ii. ගැටළු 468 කින් 30 ක් හැර අනෙකුත් සියල්ල නිරාකරණය කරන ලදි.

iii. අනාගතයේ අනුකූල වීමට දැනුම් දෙනු ලැබීය.

4.7 **මානව සම්පත් කළමනාකරණය**

අ) අනුමත කාර්ය දර්ශකය

i. පුරප්පාඩු පිරවීමට අයදුම්පත් කැඳවනු ලැබීය.

ii. අ.අ.ජ. මුදල් හා පරිපාලන තනතුර හැර ජ්‍යෙෂ්ඨ කළමනාකාරිත්වයට අයත් තනතුරුවල පුරප්පාඩු සම්පූර්ණ කරන ලදි. තාක්ෂණික සේවා පුරප්පාඩු පිරවීමට අයදුම්පත් කැඳවන ලදි.

අ) ප්‍රසම්පාදන අංශයේ කාර්ය සාධනය

i. ප්‍රසම්පාදන අංශයේ කාර්යයන් ඉහළ නැංවීම සඳහා අංක 1785/2016 දරණ මණ්ඩලීය පත්‍රිකාව අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කරනු ලැබීය.

ii. ප්‍රසම්පාදන අංශයේ ප්‍රධාන තනතුරු පුරප්පාඩු දැනටමත් සම්පූර්ණ කර තිබේ.

Iii 2016 වර්ෂය තුල රු.මිලි. 535 ක් වටිනා ඉදිකිරීම්, සැපයුම් හා සේවා ප්‍රසම්පාදනය කරන ලදි.

මීට අමතරව 2017 වර්ෂය තුල ප්‍රසම්පාදනය සම්බන්ධව වෙනත් විවිධ කාර්යයන් සිදු කරන ලදි.

5 **වගවීම හා යහ පාලනය**

5.1 **සංයුක්ත සැලැස්ම**

අ) 2018 – 2027 මාර්ග අංශ මධ්‍ය සැලැස්ම යාවත්කාලීන කෙරෙමින් පවතී. එය රාජ්‍ය ප්‍රතිපත්තිවලට අනුකූලව, අනාගත මාර්ග අංශ ව්‍යාපෘති හා ප්‍රවාහන අංශයේ මතුවෙමින් පවතින අවශ්‍යතා හඳුනා ගැනීමට සංයුක්ත සැලැස්මට මග පෙන්වනු ඇත. මධ්‍ය සැලැස්ම නිම කිරීමෙන් පසුව සෑම අවුරුද්දකම අවසානයට පෙර සංයුක්ත සැලැස්ම නිම කෙරෙනු ඇත.

ආ) 2017 - 2021 සංයුක්ත සැලැස්මෙහි සෑම අංශයකම සේවක අවශ්‍යතා ඇතුළත් කිරීමට පියවර ගෙන තිබේ. සෑම අංශයකින්ම ලබාගත් දත්ත සාරාංශ ගත කරමින් පවතී.

5.2 **ක්‍රියාකාරී සැලැස්ම**

අනුකූල වීම සඳහා සටහන් කර ගන්නා ලදි.

5.3 **අයවැය පාලනය.**

විගණකාධිපතිවරයාට දැනටමත් පැහැදිලි කිරීම් ලබාදී ඇත.

අධ්‍යක්ෂ (මුදල්),
මාර්ග සංවර්ධන අධිකාරිය.

මාර්ග සංවර්ධන අධිකාරියේ කාර්ය සාධනය වැඩි දියුණු කිරීමට අනුගමනය කරන ලද මධ්‍යම කාලීන පියවරයන්.

1 මා.සං.අ. වැඩවල තත්ත්වය හා කාර්යක්ෂමතාවය වැඩි දියුණු කිරීම සඳහා නව අංශයක් ස්ථාපිත කරන ලදි. මෙම අංශය තත්ත්ව ආරක්ෂණ හා ප්‍රගති ආවේක්ෂණ අංශය යනුවෙන් හැඳින්වේ.

2 ඉඩම් අත්පත්කර ගැනීමේ ක්‍රියාවලිය හා වන්දි ගෙවීම සඳහා භාණ්ඩාගාරයෙන් අරමුදල් ලබා ගැනීම කඩිනම් කිරීමට අදාල ආයතන සමඟ සාකච්ඡා කිරීමට පියවර ගනු ලැබීය.

3 භාණ්ඩාගාරය විසින් වෙන්කළ ප්‍රතිපාදන සීමාවන් තුල වැඩ කිරීමට අධ්‍යක්ෂවරුන්ට හා පළාත්භාර අධ්‍යක්ෂවරුන්ට උපදෙස් දෙන ලදි.

4 ධාරිතාව නැංවීමේ අරමුණෙන් දේශීය විශ්ව විද්‍යාල / ආයතනවල පශ්චාත් උපාධි අධ්‍යයනයන් සඳහා නිලධාරීන් තිස් තුන් දෙනෙකුට අනුග්‍රහ සයයනු ලැබීය.

5 මා.සං.අ. යේ කාර්ය මණ්ඩලයේ ධාරිතාව නැංවීම සඳහා දේශීය හා විදේශීය පුහුණු වැඩ සටහන් අඛන්ඩව පවත්වන ලදි.

6 මා.සං.අ. යේ කාර්යක්ෂමතාවය වැඩි දියුණු කිරීම සඳහා පුරප්පාඩු පිරවීමට පියවර ගන්නා ලදි.

7 මා.සං.අ. විසින්, අභ්‍යන්තරව මාර්ග හා පාලම්වල ශක්‍යතා අධ්‍යයනයන් විස්තරාත්මක ඉංජිනේරු සැලසුම් හා කොන්ත්‍රාත් ලේඛන පිළියෙල කිරීම අඛණ්ඩව සිදු කරනු ලබයි. මෙය කාර්යක්ෂමතාවය නැංවීමට, පිරිවැය අඩු කිරීමට හා ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේ ප්‍රමාදයන් අවම කිරීමට පහසුවක් වී ඇත. තවද, මෙකී ක්ෂේත්‍ර පිළිබඳ කාර්ය මණ්ඩලයේ තාක්ෂණ දැනුම වර්ධනය වීමට උපකාරී විය.



මාර්ග සංවර්ධන අධිකාරිය